# දෙවැනි කොටස

# දෙවැනි කොටස
# ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් සහ කටයුතු

**පිටුව**


| | | |
|---|---|---|
| 1. | ගිණුම්කරණ සහ මූල්‍ය | 1 |
| 2. | බැංකු අධීක්ෂණ | 77 |
| 3. | බැංකු විදු පියෙස | 83 |
| 4. | සන්නිවේදන | 83 |
| 5. | ව්‍යවහාර මුදල් | 86 |
| 6. | දේශීය මෙහෙයුම් කටයුතු | 89 |
| 7 | ආර්ථික පර්යේෂණ | 93 |
| 8. | සේවක අර්ථසාධක අරමුදල | 97 |
| 9. | පහසුකම් කළමනාකරණ | 102 |
| 10. | මූල්‍ය කටයුතු | 102 |
| 11. | මූල්‍ය බුද්ධි ඒකකය | 104 |
| 12. | විදේශ විනිමය | 107 |
| 13. | මානව සම්පත් | 111 |
| 14. | තොරතුරු තාක්ෂණ | 114 |
| 15. | අභ්‍යන්තර විගණන | 117 |
| 16. | ජාත්‍යන්තර මෙහෙයුම් | 117 |
| 17. | නීති හා අනුකූලතා | 120 |
| 18. | සාර්ව විචක්ෂණතා අධ්‍යයන | 121 |
| 19. | ගෙවීම් සහ පියවීම් | 123 |
| 20. | ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ | 126 |
| 21. | රාජ්‍ය ණය | 127 |
| 22. | ප්‍රාදේශීය සංවර්ධන | 129 |
| 23. | ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ | 136 |
| 24. | නිරාකරණ හා බලගැන්වීම් | 137 |
| 25. | අවදානම් කළමනාකරණ | 138 |
| 26. | ලේකම් දෙපාර්තමේන්තුව | 140 |
| 27. | ආරක්ෂක සේවා | 140 |
| 28. | කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ | 141 |
| 29. | සංඛ්‍යාන | 142 |
| 30. | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය | 146 |
| 31. | පුහුණු හා සංවර්ධන | 151 |

# I. ගිණුම්කරණ සහ මූල්‍ය

## 2019 මූල්‍ය වර්ෂය තුළ සහ ඊට අදාළ, මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ක්‍රියාකාරී වාර්තාව

### 1. හැඳින්වීම

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව යනු මුදල් මණ්ඩලයේ අනු කමිටුවකි. මෙම කමිටුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන, අභ්‍යන්තර විගණන, බාහිර විගණන සහ මුදල් මණ්ඩලය විසින් පැවරූ වෙනත් කරුණු පිළිබඳව මුදල් මණ්ඩලයට උපදේශන ලබා දීම සිදු කරයි. කමිටුවේ නිර්දේශ සහ ක්‍රියාකාරිත්වය කාර්තුමය වශයෙන් මුදල් මණ්ඩලයට වාර්තා කරන ලදී.

### 2. මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සංයුතිය

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සභාපති ලෙස මුදල් මණ්ඩලයට පත් කරන ලද සාමාජිකයෙකු කටයුතු කරන අතර සෙසු සාමාජිකයන් ලෙස බාහිර විගණන වෘත්තීයවේදීහු දෙදෙනෙකු කටයුතු කරති. 2019.12.31 දිනට කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

i) ඒ.එන්. ෆොන්සේකා මහතා, සභාපති

ii) එච්.එම්.ඒ. ජයසිංහ මහතා, සාමාජික

iii) ඒ.අයි. මොහොට්ටි මහත්මිය, සාමාජිකා

මුදල් මණ්ඩයේ ලේකම්, මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ද ලේකම් ධූරය දරනු ලබන අතර අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක කමිටුවේ සහකාර ලේකම් ධූරය දරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව කමිටුවේ ලේකම් කටයුතු සඳහා පහසුකම් සපයයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණන කටයුතු මෙහෙයවන ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී, අනුකූලතා නිළධාරී සහ ප්‍රධාන අවදානම් නිළධාරී නිරීක්ෂකයන් ලෙස කමිටු රැස්වීම් වලට සහභාගි වෙති. කමිටු සභාපති විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් අවශ්‍යතා පරිදි රැස්වීම්වලට කැඳවනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සාකච්ඡා කිරීමේදී විගණකාධිපති විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණනය සඳහා පත් කළ විගණන ආයතනයේ හවුල්කරු ද කමිටු රැස්වීම්වලට සහභාගි වේ.

කමිටුව අවම වශයෙන් වර්ෂයකට හය (06) වරක් රැස්විය යුතුය. ඊට අමතරව සභාපතිගේ තීරණ මත හෝ මුදල් මණ්ඩයේ අවශ්‍යතාවන්ට අනුව රැස්විය හැකිය. කමිටුවේ ලේකම් විසින් කමිටු රැස්වීම් කැඳවනු ලබයි. රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය වනුයේ සභාපති ඇතුළුව සාමාජිකයන් දෙදෙනෙකි.

### 3. 2019 වසර තුළ සහ ඊට අදාළව ක්‍රියාත්මක කළ කාර්යයන්

කමිටුව 2019 වර්ෂය තුළ රැස්වීම් දහයක් (10) පැවැත් වූ අතර ඉටු කළ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

**(අ) මූල්‍ය වාර්තාකරණය සහ බාහිර විගණනය**

කමිටුව විසින්,

i) 2018.12.31 අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණනය මත නිකුත් කරන ලද අතුරු නීරීක්ෂණ පත්‍රිකාව, බාහිර විගණකගේ කළමනාකාරිත්ව ලිපිය සහ ඒ සඳහා වූ කළමනාකාරිත්වයේ ප්‍රතිචාර,

ii) 2018 වර්ෂය සඳහා වූ මහ බැංකු මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව සහ ඒ සඳහා වූ කළමණාකාරිත්වයේ ප්‍රතිචාර,

iii) 2019 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා KPMG ආයතනයේ විගණන සැලසුම,

iv) 2019 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකු මූල්‍ය ප්‍රකාශන විගණනය මත නිකුත් කරන ලද අතුරු නිරීක්ෂණ පත්‍රිකාව සහ ඒ සඳහා වූ කළමණාකාරිත්වයේ ප්‍රතිචාර,

v) විගණකාධිපති විසින් විගණනය කරන ලද 2018.12.31 න් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා වූ සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ

vi) විගණකාධිපති විසින් විගණනය කරන ලද 2019.12.31 න් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා වූ සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරන ලදී.

**(ආ) අභ්‍යන්තර පාලනයන්**

කමිටුව විසින්,

i) ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර පාලනයන් සමාලෝචනය කර අවශ්‍ය උපදේශයන් සපයන ලදී.

ii) අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට කරනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

**(ඇ) අභ්‍යන්තර විගණනය**

කමිටුව විසින්,

i) 2019 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණනයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය කාර්තුමය වශයෙන් ද,

ii) අභ්‍යන්තර විගණන නිරීක්ෂණයන් සහ ඒ සඳහා ගත් ප්‍රතිශෝධන ක්‍රියාමාර්ග ද,

iii) 2020 - 2022 කාලපරිච්ඡදය සඳහා වන උපායමාර්ගික අභ්‍යන්තර විගණන සැලසුම සහ 2020 වර්ෂය සඳහා වන වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම සහ

iv) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ මානව සම්පත් අවශ්‍යතාවයන් සමාලෝචනය කරන ලදී.

**2019 මූල්‍ය වර්ෂය තුළ හා ඊට අදාළව, මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ ක්‍රියාකාරකම් වාර්තාව**

**1. හැඳින්වීම**

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව (BROC) යනු මුදල් මණ්ඩලය (MB) විසින් පත් කරන ලද අනු කමිටුවකි. මුදල් මණ්ඩලයේ (MB) විධිමත් නියෝජනයක් හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවය යන කාර්යයන් අධීක්ෂණය කිරීම එමගින් සිදු කෙරේ. බැංකුවේ අවදානම් කළමනාකරණ හා අනුකූලතා කාර්යයන් සඳහා පුළුල් උපායමාර්ග හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ වගකීම් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව සතු වන අතර, බැංකුවේ අවදානම් කළමනාකරණ හා අනුකූලතා කර්තව්‍යයන් කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කිරීම තුළින් ඒ පිළිබඳ සහතික වීමක් මුදල් මණ්ඩලය වෙත ලබා දීමට ද කටයුතු කරනු ලැබේ.

**2. මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ සංයුතිය**

මෙම කමිටුවේ මුලසුන හොබවනු ලබන්නේ මුදල් මණ්ඩලය විසින් නම් කරන ලද ස්වාධීන මුදල් මණ්ඩල සාමාජිකයෙකු විසිනි. (මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සභාපතිවරයා හැර) මෙහි අනෙකුත් සාමාජිකයන් දෙපල වන්නේ අවම වශයෙන් ආසන්න එක් වසරක්වත් මූල්‍ය සේවා අංශයෙන් බැහැරව කටයුතු කරන ලද, විශේෂ නිපුණතාවයෙන් හෙබි ස්වාධීන වූත්, බාහිර වූත් අවදානම් කළමනාකරණ විෂයෙහි මනා පලපුරුද්දක් සහිත වූත් විශේෂඥයන්ය.

2019.12.31 දින වන විට මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ සංයුතිය පහත දැක්වෙන පරිදි වේ.

i) සී.පී.ආර් පෙරේරා මහතා, මුදල් මණ්ඩල සාමාජික (සභාපති)
ii) ප්‍රියාන් ප්‍රනාන්දු මහතා (ස්වාධීන බාහිර සාමාජික)
iii) නයෝමාල් ගුණවර්ධන මහතා (ස්වාධීන බාහිර සාමාජික)

මුදල් මණ්ඩල ලේකම්, මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ ලේකම් ලෙස ක්‍රියාකරන අතර, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා එහි සහකාර ලේකම් වේ. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව (RMD) මෙම කමිටුව වෙත සියළු ලේකම් පහසුකම් සලස්වනු ලබයි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයා සහ සියලුම නියෝජ්‍ය අධිපතිවරුන්ද නීති හා අනුකූලතා දෙපාර්මේන්තුවේ අධ්‍යක්ෂවරයා ද අභ්‍යන්තර විගණන දෙපාර්මේන්තුවේ අධ්‍යක්ෂවරයාද මෙහි නිරීක්ෂකයන් ලෙස ක්‍රියාකරමින් රැස්වීම සඳහා සහභාගි වේ.

සභාපති විසින් තීරණය කරනු ලබන පරිදි හෝ මුදල් මණ්ඩලය විසින් නියම කරනු ලබන පරිදි අවම වශයෙන් සෑම කාර්තුවකට එක් වරක් හෝ ඊට වැඩි වාර ගණනක් මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටු රැස්වීම් පැවැත්වීම අවශ්‍ය වේ. කමිටුවේ ලේකම් විසින් රැස්වීම් කැඳවනු ලබන අතර, රැස්වීමක් සඳහා වන ගණ පූර්ණය සභාපති ද ඇතුළුව සාමාජිකයන් දෙදෙනෙකු වේ.

**3. 2019 වසර තුළ මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටු රැස්වීම් පහක් පවත්වා ඇති අතර එමගින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වේ.**

i) මහ බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශය (RMPS) වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම ලබා දීම.

ii) මහ බැංකුව තුළ අවදානම් යහපාලනය සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමු වැඩිදියුණු කිරීම සඳහා ලෝක බැංකු තාක්ෂණික සහය ලබා ගනු පිණිස අවශ්‍ය මග පෙන්වීම ලබා දෙමින්, මෙහි පළමු අදියර සාර්ථකව නිම කිරීමට ක්‍රියාකාරීව සම්බන්ධ වීම.

iii) මහ බැංකුව තුළ අවදානම් පිළිබඳ දැනුවත් සංස්කෘතියක් පෝෂණය කිරීමේ අරමුණින්, ලෝක බැංකු නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සලසනු වස් මූලික පියවර ගැනීම.

iv) මහ බැංකුවෙහි ස්වයංක්‍රීය සිදුවීම් වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට පෙර, ඊට අවැසි මාර්ගෝපදේශයන් සමාලෝචනය කිරීම.

v) මෙහෙයුම් අවදානම් මාර්ගෝපදේශ, අවදානම් වර්ගීකරණය සහ අවදානම් තක්සේරු කිරීමේ පරිමාණයන්ට අදාළ මාර්ගෝපදේශයන් ලබා දෙමින් එම ලේඛණ සමාලෝචනය කිරීම.

vi) අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන, ජාත්‍යන්තර සංචිත අභ්‍යන්තර ආයෝජන අරමුදල සහ සේවක අර්ථසාධක අරමුදල යන අරමුදල් ත්‍රිත්වයට අදාළ අවදානම් කළමනාකරණ හා අනුකූලතා තොරතුරු කාර්තුමය පදනමකින් සමාලෝචනය කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශන, උපායමාර්ගික වත්කම් ප්‍රතිපාදන හා ආයෝජන මාර්ගෝපදේශයන්හි දක්වා ඇති ප්‍රමිතීන්ට අනුකූලතාවය තහවුරු කිරීම.

vii) ඉහත අරමුදල් ත්‍රිත්වයේ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම්වලට අදාළ ආයෝජන ප්‍රතිපත්ති අවදානම් කළමනාකරණ දෘෂ්ටි කෝණයකින් සමාලෝචනය කර, අවදානම් අභිරුචිය තිතීක්ෂාව හා වෙනත් වෙළඳපොළ ණය අවදානම් පරාමිතීන් හා සම්බන්ධව මෙම ප්‍රතිපත්ති තවදුරටත් වැඩිදියුණු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2019 දෙසැම්බර් 31 දිනට කළමනාකාරිත්ව ප්‍රකාශය**

**ස්වකීය අරමුණුවලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්කටයුතු භාවය සහ මූල්‍ය කාර්යසාධනය**

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස මහ බැංකුව මුදල් නීති පනත යටතේ ස්ථාපිත කරන ලදී. එම පනතේ විධිවිධාන පරිදි ප්‍රධාන පරමාර්ථයන් වන ආර්ථික සහ මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධති ස්ථායිතාවය සාක්ෂාත් කර ගැනීමේ වගකීම බැංකුව වෙත පැවරී ඇත.

එබැවින්, මහ බැංකුවේ ගිණුම්කටයුතුභාවය සහ එකී මෙහෙයුම් වල සාර්ථකත්වය වන්නේ එම ප්‍රධාන පරමාර්ථයන් කරා ළඟාවීම සඳහා වන ප්‍රතිපත්ති හා මෙහෙයුම් වල සඵලතාවය විනා එහි ලාභදායීත්වය නොවන්නේය. මහ බැංකුව, වෙනත් පුද්ගලික හෝ රාජ්‍ය ආයතනවලින් වෙන් කොට හඳුනා ගැනෙන මූලික ලක්ෂණය නම් මෙම ව්‍යවස්ථාපිත පරමාර්ථයන්ය. පොළී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය කෙරෙහි බලපාන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මගින් ලාභ ජනනය කිරීමේ අද්විතීය හැකියාවක් මහ බැංකුව සතු බැවින් බැංකුව විසින් ලාභදායිත්ව ප්‍රවේශයක් අනුගමනය කළේ නම් ලාභ ජනනය වන අතර ප්‍රධාන පරමාර්ථ නොසලකා හැරීමක් වනු ඇත. එබැවින් මහ බැංකුවේ ආර්ථික සහ මිල ස්ථායිතා හා මූල්‍ය පද්ධති ස්ථායිතා පරමාර්ථයන්, ලාභදායිතා අරමුණු වලින් වියුක්ත කළයුතු අතර එය හුදෙක් ආනුශාංගික අරමුණක් වියයුතු වන්නේය.

මහ බැංකුවේ ප්‍රතිපත්ති මෙහෙයුම්, විනිමය අනුපාත කළමනාකරණය, මුදල් නෝට්ටු නිකුතුව ආදිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල, උපලබ්ධි වටිනාකම් මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූලව සටහන් කරන අතර, මෙය සමස්ත රාජ්‍ය ගිණුම්කරණ කටයුතුභාවයෙන් කොටසක් සාක්ෂාත් කර ගැනීමක් ලෙස මූල්‍ය ගිණුම්කරණ කටයුතුභාවය සඳහා පදනම සපයනු ලබන අතර, මෙම ප්‍රකාශයන්හි වාර්තා කර ඇති මූල්‍ය කාර්යසාධනය සහ අවබෝධ කර ගැනීම එම පසුතලයේ පිහිටා කළයුතුය.

මුදල් නීති පනතේ 42 හා 43 වගන්ති ප්‍රකාර විගණකාධිපති විසින් කරනු ලබන බාහිර විගණනයකට ශ්‍රී ලංකා මහ බැංකුව භාජනය වේ. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූල බවට සහතික වීම සඳහා ජාත්‍යන්තර විගණක ප්‍රමිතයන්ට අනුකූලව විගණනයක් කිරීම සඳහා කේපීඑම්ජී වරලත් ගණකාධිකාරීවරුන්ගේ සේවය විගණකාධිපතිතුමා විසින් ලබාගෙන ඇත.

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } බීජ්එෆ්/එච්/සීබීඑස්එල්/1/19/1 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 මාර්තු 30 දින

ගරු මුදල් අමාත්‍යතුමා,

**ශ්‍රී ලංකා මහ බැංකුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය සහ මුදල් නීති පනතේ 42(2) වගන්තිය (422 අධිකාරිය) ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තියේ සහ මුදල් නීති පනතේ 42(2) වගන්තියේ (422 අධිකාරිය) ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැළී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ සියලු ප්‍රමාණාත්මක කරුණුවලින් සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRSs) අනුකූලව සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

### 1.2 මතය සඳහා පදනම

මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මුදල් මණ්ඩලයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්මෙන් යුතුව පවත්වා ගැනීම සඳහා අඛණ්ඩ පැවැත්මට අදාළවන කරුණු අදාළ වන පරිදි හෙළිදරව් කිරීම සහ ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පදනම යොදාගනිමින් පවත්වා ගැනීම සඳහා බැංකුවේ හැකියාව ඇගයීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය වගකිව යුතු වේ.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, බැංකුව විසින් බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබාගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ තහවුරුවක් යන්න, ඉහළ මට්ටමේ, තහවුරුවක් වන නමුත් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව විගණනයන් ක්‍රියාත්මක කිරීමේදී සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගැනීම සඳහා තහවුරුවක් නොවේ. සාවද්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් පැන නැගිය හැකි අතර එය තනිකර හෝ සමස්තයක් ලෙස ගත්කල ප්‍රමාණාත්මක ලෙස සැලකේ නම්, භාවිතා කරන්නන්ට මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්ව ආර්ථික තීරණ ගැනීම සඳහා බලපානු ලබන බවට සාධාරණව අපේක්ෂා කළ හැකිය.

ජාත්‍යන්තර විගණන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව විගණනයේ කොටසක් ලෙස සමස්ත විගණනය තුළ මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය විචක්ෂණභාවය පවත්වා ගෙන යන ලදී. එසේම මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පරිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ප්‍රමාණාත්මක සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම, වංචාවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් සොයා නොගැනීම වැරදි හෙළිදරව් නොකිරීමට වඩා වැඩි අවදානමකට හේතු වන අතර දූස්සන්ධානය, කූට රචනය, අභිප්‍රායික අත්හැරීම්, වරදවා දැක්වීම් හෝ අභ්‍යන්තර පාලනය අක්‍රීය කරන වංචා, මෙයට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළවන අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකෙරේ.
- යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා ගිණුම්කරණ ඇස්තමේන්තු සහ මුදල් මණ්ඩලය විසින් කරන ලද අදාළ හෙළිදරව් කිරීම්වල සාධාරණබව ඇගයීම.
- අඛණ්ඩ පැවැත්ම පදනම් කරගත් ගිණුම්කරණය පිළිබඳ මුදල් මණ්ඩලයේ යොදාගැනීම පිළිබඳ අදාළත්වය නිගමනය කිරීම සහ ලබාගත් විගණන සාක්ෂි පදනම් කරගෙන, අඛණ්ඩ පැවැත්මක් සහිතව පවත්වා ගෙන යාමට බැංකුවේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයකට හේතුවන සිද්ධිවලට හෝ කරුණුවලට අදාළවන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න නිගමනය කිරීම. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා විසින් නිගමනය කෙරේ නම් හෝ මාගේ මතය විකරණය කිරීම සඳහා එම හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මක නොවේ නම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් පිළිබඳ මාගේ විගණන වාර්තාවට අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධි හෝ තත්වයන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම නතර කිරීමට හේතු විය හැක.
- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය හා අන්තර්ගතය ඇගයීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම ඉටු කරගැනීමට පාදක වූ ගනුදෙනු හා සිද්ධි මූල්‍ය ප්‍රකාශනවලින් නියෝජනය වේද යන්න ඇගයීම.

මාගේ විගණනයේදී හඳුනාගත් අනෙකුත් කරුණු අතර සැලසුම් කරන ලද විෂය පථය, විගණනයේ කාලය සහ අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු යම් අඩුපාඩු ඇතුළත් සැලකිය යුතු සොයාගැනීම් සම්බන්ධයෙන් පාලනය කරන පාර්ශවයන් වෙත මා විසින් සන්නිවේදනය කරනු ලැබේ.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව විසින් පවත්වාගෙන ගොස් ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද ප්‍රමාණාත්මක නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ප්‍රමාණාත්මක කරුණුවලට සීමා වෙමින් ලබා ගන්නා ලද සාක්ෂි මත පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට බැංකුව සමඟ සම්බන්ධවී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව;
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට, බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු සහ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව;
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව;
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

අත්සන්කළේ :

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2019 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | සටහන | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|---|
| වත්කම් | | | |
| විදේශීය මූල්‍ය වත්කම් | | | |
| මුදල් සහ මුදල් සමානයන් | 9 | **420,709,469** | 372,175,176 |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 10 | **38,493,268** | 37,467,239 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 10 | **729,801,009** | 694,876,394 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 11 | **2,021,917** | 750 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම් | 12 | **147,159,174** | 147,427,452 |
| අනිකුත් ලැබිය යුතු දෑ | | **-** | 961,284 |
| මුළු විදේශීය මූල්‍ය වත්කම් | | **1,338,184,837** | 1,252,908,295 |
| දේශීය මූල්‍ය වත්කම් | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 13 | **76,511,883** | 45,031,157 |
| නැවත විකිණීමේ ගිවිසුම මත මිලදී ගත් සුරැකුම්පත් | 14 | **50,354,879** | 229,454,409 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 15 | **236,608,971** | 198,632,571 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | 16 | **1,500,487** | 1,381,879 |
| අනිකුත් වත්කම් | 17 | **17,601,747** | 14,879,268 |
| මුළු දේශීය මූල්‍ය වත්කම් | | **382,577,967** | 489,379,284 |
| මුළු මූල්‍ය වත්කම් | | **1,720,762,804** | 1,742,287,579 |
| විදේශීය මූල්‍ය නොවන වත්කම් | | | |
| රන් | 18 | **173,438,430** | 149,683,439 |
| මූල්‍ය නොවන වත්කම් | | | |
| තොගය | 19 | **7,298,392** | 6,568,935 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | | **1,069,076** | 1,914,087 |
| දේපල පිරියත සහ උපකරණ | 20 | **16,810,691** | 16,955,854 |
| අස්පෘශ්‍ය වත්කම් | 21 | **38,046** | 30,437 |
| මුළු මූල්‍ය නොවන වත්කම් | | **198,654,635** | 175,152,752 |
| මුළු වත්කම් | | **1,919,417,439** | 1,917,440,331 |
| බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය | | | |
| විදේශීය මූල්‍ය බැරකම් | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 22 | **958,248** | 19,301,160 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 11 | **989,958** | 14,056,460 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 23 | **82,995,147** | 79,158,977 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) | 24 | **471,975,073** | 416,988,246 |
| අනිකුත් | 25 | **57,091,538** | 134,730,933 |
| මුළු විදේශීය මූල්‍ය බැරකම් | | **614,009,964** | 664,235,776 |
| දේශීය මූල්‍ය බැරකම් | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 26 | **254,581,620** | 320,106,183 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 27 | **499,639** | 348,718 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 28 | **43,298,325** | 28,311,221 |
| සංසරණයෙහි පවතින මුදල් | 29 | **677,967,150** | 640,942,510 |
| අනිකුත් ගෙවිය යුතු දෑ | 30 | **12,702,888** | 12,624,764 |
| මුළු දේශීය මූල්‍ය බැරකම් | | **989,049,622** | 1,002,333,396 |
| මුළු මූල්‍ය බැරකම් | | **1,603,059,586** | 1,666,569,172 |
| අනිකුත් බැරකම් | | | |
| විලම්භිත ප්‍රදාන | 31 | **5** | 11 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 32 | **11,990,647** | 12,016,804 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 33 | **181,809** | 85,945 |
| මුළු අනිකුත් බැරකම් | | **12,172,461** | 12,102,760 |
| මුළු බැරකම් | | **1,615,232,047** | 1,678,671,932 |
| හිමිකරු ප්‍රාග්ධනය | | | |
| ප්‍රාග්ධන අරමුදල | | **50,000,000** | 50,000,000 |
| සංචිත | | **254,185,392** | 188,768,399 |
| මුළු හිමිකරු ප්‍රාග්ධනය | | **304,185,392** | 238,768,399 |
| මුළු බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය | | **1,919,417,439** | 1,917,440,331 |

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2020 මාර්තු 24 වැනි දින මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් - අධිපති

යූ.එල්.මුතුගල - ප්‍රධාන ගණකාධිකාරී

පිටු අංක 14 සිට 76 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### ආදායම් ප්‍රකාශය

| | සටහන | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම:** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 36 | **32,950,560** | 25,556,932 |
| උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/ (පාඩුව) | 37 | **42,900,897** | (18,259,956) |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය/ (පාඩුව) | | **1,057,273** | (4,092,390) |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් මුළු ආදායම** | | **76,908,730** | 3,204,586 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | | | |
| පොළී වියදම | 38 | **(8,338,019)** | (5,350,155) |
| විදේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ | 39 | **(187,639)** | (19,121) |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත මුළු වියදම** | | **(8,525,658)** | (5,369,276) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය/ (පාඩුව) | | **(14,557,283)** | 146,854,048 |
| **විදේශීය මූල්‍ය ආයෝජන ආදායම** | | **53,825,789** | 144,689,358 |
| **ශුද්ධ දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 36 | **17,886,803** | 8,956,322 |
| මිල වෙනස්කම් මත උපලබ්ධි ලාභය/ (පාඩුව) | | **(117,565)** | 117,771 |
| පොළී වියදම | 38 | **(3,763,302)** | (2,880,220) |
| දේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ | 39 | **(27,241)** | (10,966) |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ශුද්ධ ආදායම** | | **13,978,695** | 6,182,907 |
| අනිකුත් ආදායම් | 40 | **1,702,535** | 1,692,994 |
| **මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම** | | **69,507,019** | 152,565,259 |
| **මෙහෙයුම් වියදම් :** | | | |
| සේවක මණ්ඩල වියදම් : | 41 | | |
| - වැටුප් සහ වේතන | | **(5,544,943)** | (5,409,137) |
| - නිශ්චිත දායක සැලසුම් පිරිවැය | | **(1,103,233)** | (1,536,049) |
| - පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය සඳහා වූ දායකත්වය | | **(1,120,381)** | (205,147) |
| | | **(7,768,557)** | (7,150,333) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | **(439,918)** | (498,189) |
| තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය) | | **(3,234,336)** | (3,999,000) |
| පරිපාලන සහ අනිකුත් වියදම් | 42 | **(2,168,481)** | (1,850,083) |
| වත්කම් මත හානිකරණ ගාස්තු | | **-** | (20,650) |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **(13,611,292)** | (13,518,255) |
| **බදු වලට පෙර ලාභය** | | **55,895,727** | 139,047,004 |
| බදු | 43 | **(290,888)** | (1,119,286) |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය** | | **55,604,839** | 137,927,718 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 14 සිට 76 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|---|
| වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය | | **55,604,839** | 137,927,718 |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | | |
| **පසු කාලපරිච්ඡේදයකදී ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය වන හෝ විය හැකි අයිතම** | | | |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය/ (අලාභය) | 34 | **10,628,206** | (877,778) |
| විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන රජයේ සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය | 34 | **113,231** | 5,259 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගය මත ගණනය කරන ලද ආයෝජන සඳහා අපේක්ෂිත ණය ආපසු හැරවීම්/ (අලාභ) | 10.2 | **37,245** | (1,939) |
| | | **10,778,682** | (874,458) |
| **පසු කාලපරිච්ඡේදයකදී ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය නොවන අයිතම** | | | |
| විස්තීරණ ආදායමට ගලපන ලද පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වියදම | 32 | **(873,926)** | (11,823,458) |
| විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන ස්කන්ධ ආයෝජන මත වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය | 34 | **115,859** | 122,747 |
| | | **(758,067)** | (11,700,711) |
| අනෙකුත් විස්තීරණ ආදායම | | **10,020,615** | (12,575,169) |
| **මුළු විස්තීරණ ආදායම** | | **65,625,454** | 125,352,549 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 14 සිට 76 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය

| | අයක ප්‍රාග්ධනය රු. 000 | අනිකුත් සංචිත (සටහන 34) රු. 000 | රඳවාගත් ලාභ රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|
| **2018 ජනවාරි 1 දිනට ශේෂය** | 50,000,000 | 52,708,582 | 25,879,432 | 128,588,014 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | 137,927,718 | 137,927,718 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | - | 291,983 | (291,983) | - |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | - | - | (11,823,458) | (11,823,458) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය මාරු කිරීම (IRR) | - | 146,854,048 | (146,854,048) | - |
| තාක්ෂණික අභිවර්ධන සංචිතයට අරමුදල් මාරු කිරීම | - | 2,000,000 | (2,000,000) | - |
| ශ්‍රී.ලං.ම.බැ. අභ්‍යන්තර අරමුදල්වලට මාරු කිරීම | - | - | (171,843) | (171,843) |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට වූ සුරැකුම්පත්වල ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ අලාභය | - | (877,778) | - | (877,778) |
| රඳවාගත් ලාභයෙන් වෙළඳපොල ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම | - | 24,337,841 | (24,337,841) | - |
| පොදු සංචිතයට මාරු කිරීම | - | 5,013,869 | (5,013,869) | - |
| 2017 වර්ෂයට අදාළ ලාභයන් රජයට පැවරීම - මහ බැංකුව වෙත ඇති රජයේ බැඳීම් යළි පියවා ගැනීම | - | - | (15,000,000) | (15,000,000) |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - | (321) | (321) |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ මූල්‍යනය සඳහා වූ සංචිතයට අරමුදල් මාරු කිරීම | - | 5,372,178 | (5,372,178) | - |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද ස්කන්ධ ආයෝජන බැහැර කිරීමේ ලාභ | - | (16,289) | 16,289 | - |
| විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ රජයේ සුරැකුම්පත් මත මිල වෙනස්වීමේ ලාභ | - | 5,259 | - | 5,259 |
| විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ ස්කන්ධ ආයෝජන මත වෙළෙඳපොල ප්‍රත්‍යාගණන ලාභ | - | 122,747 | - | 122,747 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ගණනය කරන ලද ආයෝජන සඳහා අපේක්ෂිත ණය අලාභ | - | (1,939) | - | (1,939) |
| රඳවාගත් ලාභයට අරමුදල් මාරු කිරීම | - | (21,154,178) | 21,154,178 | - |
| **2018 දෙසැම්බර් 31 දිනට** | 50,000,000 | 214,656,323 | (25,887,924) | 238,768,399 |
| **2019 ජනවාරි 1 දිනට ශේෂය** | 50,000,000 | 214,656,323 | (25,887,924) | **238,768,399** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | 55,604,839 | **55,604,839** |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | - | 333,334 | (333,334) | - |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | - | - | (873,926) | **(873,926)** |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය මාරු කිරීම (IRR) | - | (14,557,283) | 14,557,283 | - |
| ශ්‍රී.ලං.ම.බැ. අභ්‍යන්තර අරමුදල්වලට මාරු කිරීම | - | - | (208,445) | **(208,445)** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ගණනය කරන ලද සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ ලාභය | - | 10,628,206 | - | **10,628,206** |
| රඳවාගත් ලාභයෙන් වෙළඳපොල ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම | - | 1,166,517 | (1,166,517) | - |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - | (16) | **(16)** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කල රජයේ සුරැකුම්පත් වල වෙළෙඳපොල වටිනාකම මත වූ ලාභය | - | 113,231 | - | **113,231** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කල ප්‍රාග්ධන ආයෝජන වල වෙළෙඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය | - | 115,859 | - | **115,859** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කල ආයෝජනවල අපේක්ෂිත ණය අලාභය | - | 37,245 | - | **37,245** |
| **2019 දෙසැම්බර් 31 දිනට** | 50,000,000 | 212,493,432 | 41,691,960 | **304,185,392** |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 14 සිට 76 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

### මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| ලැබීම්: | | | |
| ලැබුණු පොළිය - විදේශීය මුදල් | | **32,610,501** | 25,346,571 |
| ලැබුණු පොළිය - දේශීය මුදල් - අනිකුත් | | **1,219,056** | 821,348 |
| ද්‍රවශීලතා කළමනාකරණ සහ වෙළෙඳ ආදායම් | | **939,708** | (3,974,618) |
| උපලබ්ධි වූ විනිමය අලාභය | | **(17,363,660)** | (9,065,597) |
| ලැබුණු අනිකුත් ආදායම් | | **1,676,979** | 1,605,833 |
| | | **19,082,584** | 14,733,537 |
| විය පැහැදම්: | | | |
| ගෙවන ලද පොළිය - විදේශීය මුදල් | | **8,452,517** | 4,855,646 |
| ගෙවන ලද පොළිය - දේශීය මුදල් | | **3,094,863** | 2,368,605 |
| සේවකයින්ට ගෙවීම් | | **7,312,048** | 6,765,420 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | | **6,768,262** | 3,380,162 |
| ගෙවන ලද බදු | | **290,888** | 1,100,219 |
| | | **25,918,578** | 18,470,052 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රවාහය** | 44 | **(6,835,994)** | (3,736,515) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| ලැබීම් : | | | |
| අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම | | **(2,093,732)** | (2,487,565) |
| මූල්‍ය සහ අනෙකුත් ආයතනවල ආයෝජන බැහැර කිරීම්/ නිදහස් කිරීම් | | **-** | 19,789 |
| අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් - ප්‍රාග්ධන අයකරගැනීම් | | **56,793** | 127,584 |
| ණයකර ආයෝජන බැහැර කිරීම්/ නිදහස් කිරීම් | | **-** | 15,178 |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීම් | | **36,821** | 10,284 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | | **14,987,104** | (12,340,173) |
| | | **12,986,986** | (14,654,903) |
| විය පැහැදම් : | | | |
| විදේශ මුදල් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම | | **27,507,003** | 5,592,252 |
| අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | | **1,308,261** | (263,842) |
| අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | | **90,905,310** | (34,064,176) |
| අනිකුත් දේශීය තැන්පතු සහ ගෙවිය යුතු මුදල්වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | | **10,735** | (14,311) |
| දේපල, පිරියත හා උපකරණ මිලට ගැනීම් (ප්‍රදානයන් අඩු කිරීමෙන් පසු) | | **215,654** | 104,362 |
| අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම් | | **22,227** | 25,484 |
| රන් සංචිතයේ ශුද්ධ අඩුවීම | | **(2,663,074)** | (19,060,015) |
| අනෙකුත් ආයතන වෙත ලබා දුන් ණය හා අත්තිකාරම් | | **2,750** | - |
| | | **117,308,866** | (47,680,246) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද/ (සඳහා භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(104,321,880)** | 33,025,343 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| ලැබීම් : | | | |
| සංසරණ මුදල් නිකුතුව | | **777,061,814** | 796,515,572 |
| සංසරණ මුදල් ආපසු ගැනීම් | | **(740,037,174)** | (753,626,964) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව | | **37,024,640** | 42,888,608 |
| විය පැහැදම් : | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව/ (ආපසු ගැනීම්) | 45 | **(126,565,213)** | 233,216,924 |
| බැංකු සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව/ (ආපසු ගැනීම්) | 46 | **65,524,563** | 23,010,511 |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව/ (ආපසු ගැනීම්) | | **(61,040,650)** | 256,227,435 |
| **සංසරණ මුදල් ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)** | | **98,065,290** | (213,338,827) |
| විය පැහැදම් : | | | |
| විදේශීය මුදල් කාලීන බැරකම් ආපසු ගෙවීම | | **(58,497,399)** | (39,813,671) |
| අනිකුත් අරමුදල් සඳහා ගෙවීම | | **16** | 321 |
| විශ්‍රාම අරමුදල සඳහා ගෙවීම | | **1,344,579** | - |
| රජයේ ඒකාබද්ධ අරමුදල සඳහා ලාභ පැවරීම | | **-** | 14,227,097 |
| | | **(57,152,804)** | (25,586,253) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද/ (සඳහා භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **155,218,094** | (187,752,574) |
| **මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)** | | **44,060,220** | (158,463,746) |
| මුදල් සහ මුදල් සමානයන් මත වන විනිමය අනුපාතයන්ගේ බලපෑම | | **4,624,467** | 70,882,845 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමානයන් | | **372,246,740** | 459,827,641 |
| **දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමානයන්** | 9 | **420,931,427** | 372,246,740 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 14 සිට 76 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්ගේ කොටසක් ලෙස කියවිය යුතු සටහන

### 1. වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ("බැංකුව" හෝ "ශ්‍රී.ලං.ම.බැ.") ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍යව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටුවා ඇති අතර, කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටා ඇත.

මුදල් මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් මෙම මූල්‍ය ප්‍රකාශනයන්, 2019 මාර්තු 29 වැනි දින අනුමත කරන ලදී.

### 1.1 ප්‍රාථමික ක්‍රියාකාරකම්

1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් සහ කර්තව්‍යයන් පැවරෙන අතර, බැංකුවේ කළමණාකාරීත්වය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිවයුතු වන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා පොදුවේ වගකිවයුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- මුදල් නිකුත් කිරීම.
- නිල විදේශ සංචිතය කළමනාකරණය කිරීම.
- මූල්‍ය පද්ධතිය අධීක්ෂණය කිරීම.
- බැංකු හා තෝරාගත් බැංකු නොවන මූල්‍ය ආයතනවලට බලපත්‍ර ලබා දීම, නියාමනය සහ අධීක්ෂණය.
- පියවීම් පහසුකම් සඳහා ප්‍රතිපාදන හා ගෙවීම් පද්ධතිය නියාමනය කිරීම.
- ආර්ථික දත්ත සම්පාදනය, බෙදාහැරීම සහ විශ්ලේෂණය.
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකුවලට සහ මූල්‍ය ආයතන වලට ණය සහ අත්තිකාරම් සැපයීම.
- රජයේ හා එහි නියෝජිතයන් හෝ බැංකුකරු ලෙස කටයුතු කිරීම, රාජ්‍ය සුරැකුම්පත් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ වාණිජ බැංකු නොවන ප්‍රාථමික වෙළෙඳුන්ට ජංගම ගිණුම් පහසුකම් සැලසීම.

ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය, දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සපුරාගැනීම සඳහා පවත්වාගෙන යන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් ක්‍රියාකාරකම් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස පුළුල්ව වෙන්කර දැක්විය හැකිය. මෙම ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල ආදායම් ප්‍රකාශනයට අදාලව මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.

### 2. මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ පදනම

### 2.1. අනුකූලතා ප්‍රකාශනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා.මූ.වා.ප්‍ර.) ප්‍රකාර පිළියෙල කර තිබේ.

ජා.මූ.වා.ප්‍ර. 16 කල්බදු යන නව වාර්තාකරණ ප්‍රමිත අදාළ කර ගැණුනු ප්‍රථම මූල්‍ය ප්‍රකාශන කට්ටලය මෙය වන අතර, එම නිසා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වූ වෙනස්කම් සටහන 4 හි විස්තර කර ඇත.

### 2.2 මිනුම් කිරීමේ පදනම

පහත අයිතමයන් හැරුණු කොට මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය මත පදනම්ව පිළියෙල කරනු ලබයි.

(1) රන්, ආදායම් ප්‍රකාශය තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම.

(2) ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ, ලාභ අලාභ හා අනෙකුත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මිණුම් කරන ව්‍යුත්පන්න නොවන මූල්‍ය උපකරණ සාධාරණ අගයට මිනුම් කිරීම.

(3) අත්පත් කර ගැනීමේදී පිරිවැයට මිනුම් කරන එහෙත් අනතුරුව ප්‍රත්‍යාගණනය කරනු ලබන වටිනාකමින් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරන වෙන්කිරීම් අඩුකරන ලද වටිනාකමට මිණුම් කරන ඉඩම් හා ගොඩනැගිලි.

(4) සේවා නියුක්තිකයන්ගේ නිශ්චිත ප්‍රතිලාභ බැදියාව, අදාළ නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන අගයෙන් ප්‍රතිලාභ යෝජනා ක්‍රම වල වත්කම්හි සාධාරණ අගය අඩුකර මිනුම් ගත කිරීම.

### 2.3 වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාල ආදායම් සහ වියදම් මාර්ග ද විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේදී පුළුල් වශයෙන් එක් එක් වර්ගයන් යටතේ ද්‍රවශීලතාවයේ පිළිවෙළට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය මගින්, අංක 7 දරණ සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

### 2.4 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය බැංකුවේ ක්‍රියාකාරී මුදල් ඒකකයද වේ. වාර්තා කර ඇති සියලු අගයන් ආසන්නතම දහස් සංඛ්‍යාවට දක්වා ඇති අතර බැංකුවේ ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකයන්හි කිසිදු වෙනසක් සලකා බලන කාලපරිච්ඡේදය තුළදී සිදුවී නැත.

**2.5 ප්‍රමාණාත්මකභාවය හා සමාහාරය**

ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර එක් එක් ප්‍රමාණාත්මක කාණ්ඩයන්හි සමාන අයිතම හා අසමාන ස්වභාවයක් හා කාර්යයයන් සහිත අයිතමයන් මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

**2.6 හිලව් කිරීම**

මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කොට ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශ වල ඉදිරිපත් කළ හැක්කේ බැංකුවට හඳුනාගත් අගයන් හිලව් කිරීමට නෛතික අයිතියක් හා ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට හෝ වත්කම් උපලබ්ධි කිරීමට සමගාමීව වගකීම් නිරවුල් කිරීමට අපේක්ෂා කරයි නම් පමණි.

**2.7 සංසන්දනාත්මක තොරතුරු**

අවශ්‍ය විටක වර්තමාන කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලබයි.

## 3. ගිණුම් විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මත, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම්වල හෙළිදරව් කිරීම්වලට බලපාන්නා වූ විනිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙම උපකල්පනයන්, ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතතාවය, වත්කම් හා බැරකම්හි ධාරණ අගයන්වලට අනාගත කාලපරිච්ඡේදවලදී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැක.

ඇස්තමේන්තු සහ ඒ සඳහා පාදක වූ උපකල්පන යාවත්කාලීන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුවල සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ වල හඳුනාගෙන ඇති ප්‍රමාණාත්මක බලපෑමක් සහිත අයිතමයන් සඳහා පදනම් කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා වූ විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන් මගින් පැහැදිලි කෙරේ.

**3.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය හා හානිකරණය (2018 ජනවාරි 1 දින සිට අදාල වේ)**

බැංකුව විසින් මූල්‍ය වත්කම් වල ව්‍යාපාර ආකෘතිය හා ඒවාහි ගිවිසුම්ගත කොන්දේසි වලින් ඇතිවන මුදල් ප්‍රවාහ, මූලික මුදල හා ඒ මත වන පොලිය පමණක්ද යන්න තක්සේරු කිරීම සඳහා විනිශ්චයන් භාවිතා කරයි. තවද, බැංකුව විසින් මුල් වරට හඳුනාගැනීමෙන් පසු මූල්‍ය වත්කමක ණය අවධානමෙහි සැලකිය යුතු වර්ධනයක් වී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා වන නිර්නායකයන් ස්ථාපිත කිරීමේදී හා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා ඉදිරි දැක්මක් සහිත තොරතුරු ඇතුලත් කිරීමේදී භාවිතා කරන ක්‍රමවේදය හා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා වූ ආකෘති (Model) තෝරා ගැනීමේ හා අනුමත කිරීමේදී ද විනිශ්චයන් භාවිතා කරයි.

**3.2 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයුගණන ඇගයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීමක දී වට්ටම් අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. ආයුගණන ඇගයීමේදී භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 34 හි දැක්වේ.

**3.3 මූල්‍ය උපකරණවල සාධාරණ අගය**

මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගයන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ වාර්තාගත කරන විට එම අගයන් සක්‍රීය වෙළඳපළ තුළින් ලබාගත නොහැකි අවස්ථාවලදී, එම අගයන් ලබා ගැනීම සඳහා විවිධ ආකාරයේ ආගණනය කරනු ලබන ගණිතමය ආකෘතිවලින් යුතු ශිල්පීය ක්‍රම උපයෝගී කරගෙන ඇත. මෙම ආකෘති තුළට යොදාගන්නා යෙදවුම් හැකි සෑම විටම නිරීක්ෂිත වෙළඳපොළ දත්ත මත ලබාගන්නා අතර, එවැනි දත්ත නොමැති අවස්ථාවන්හිදී විනිශ්චයන් මගින් සාධාරණ අගය ලබාගනු ලබයි. නිගමනවලට එළඹීමේදී ද්‍රවශීලතාවය සහ දීර්ඝ කාලීන ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල (longer-dated derivatives) වෙනස්වීම වැනි ආකෘතිවලට යොදාගන්නා යෙදවුම් සැලකිල්ලට ගෙන ඇත.

## 4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම

පහත විස්තර කර ඇති ශ්‍රී.මූ.වා.ප්‍ර. 16 කල්බදු හා සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්ති හැර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට යොදාගත් අනෙකුත් ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව පවතින අතර ඒවා පූර්ව කාලපරිච්ඡේදයේදී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ස්ථාවරව පවතී.

**4.1 ශ්‍රී.මූ.වා.ප්‍ර. 16 - කල්බදු**

බැංකුව, සංශෝධිත අතීතානුයෝගී ක්‍රමය (ආ විකල්පය) (Modified retrospective appoach - option B) භාවිතයෙන් ශ්‍රී.මූ.වා.ප්‍ර. 16 "කල්බදු" ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුගත වන ලදී. එබැවින් සංසන්දනාත්මක තොරතුරු වෙනස් කිරීමකින් තොරව පූර්ව කාලපරිච්ඡේදයේදී භාවිතා කරන ලද ශ්‍රී.ගි.ප්‍ර. 17 "කල්බදු" හා IFRIC 4 "එකගවීමක් කල්බද්දක්ද යන්න නිශ්චය කිරීම" යන ප්‍රමිතීන්ට අනුකූලව අනාවරණය කර ඇත.

මෙම ගිණුම්කරණ ප්‍රමිතියට පළමුවරට අනුගත වීම පහත කරුණු මත පදනම් කරගන්නා ලදී.

- වත්කම භාවිතා කිරීමේ හිමිකම හඳුනාගැනීම.
- අනුරූප කල්බදු වගකීම හඳුනාගැනීම.

ශ්‍රී.මූ.වා.ප්‍ර. 16 ට අනුගත වීම හේතුවෙන් කල්බදු වර්ගීකරණය හා මැනීම තුළින් වන බලපෑම සටහන 8 හි අනාවරණය කර ඇත. පහත දැක්වෙන වෙනස්වීම් හැරුණු කොට, බැංකුව විසින්, සටහන 5 හි දක්වා ඇති පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය වාර්තාවේ ඇතුළත් වන සියලුම කාල සීමාවන් සඳහා අඛණ්ඩව යොදාගෙන ඇත.

**කල්බදු අර්ථ දැක්වීම.**

පෙර කාලපරිච්ඡේදයන්හිදී ජා.ගි.ප්‍ර. 17 ට අනුකූලව බැංකුව විසින් එකඟවීමක් කල්බද්දක්ද යන්න හෝ එකඟවීමක් තුළ කල්බද්දක් අන්තර්ගත වේද යන්න නිශ්චය කරන ලදී. ජා.මූ.වා.ප්‍ර. 16 හි කල්බදු අර්ථ දැක්වීමට අනුකූලව එකඟවීමක් කල්බද්දක්ද යන්න හෝ එකඟවීමක් තුළ කල්බද්දක් අන්තර්ගත වේද යන්න නිශ්චය කරන අන්දම සටහන 5.22 හි පැහැදිලි කර ඇත.

ජා.මූ.වා.ප්‍ර. 16 ට මුල්වරට අනුගත වීමේදී කල්බදු හඳුනාගැනීම සඳහා බැංකුව විසින් ප්‍රමිතයේ සඳහන් වන ප්‍රායෝගික භාවිත ක්‍රමය අනුගමනය කළ බැවින් කලින් හඳුනාගත් කල්බදු සඳහා පමණක් ජා.මූ.වා.ප්‍ර. 16 අදාළ කර ගන්නා ලදී.

**කල්බදු ගැණුම්කරුවෙකු අනුගමනය කලයුතු ගිණුම්කරණ ක්‍රමය**

බැංකුව විසින් පෙර කාලපරිච්ඡේදයන්හිදී කල්බදු ගැණුම්කරුවෙකු ලෙස, යම් කල්බද්දක් මෙහෙයුම් කල්බද්දක් හෝ මූල්‍ය කල්බද්දක්ද යන්න නිර්ණය කිරීමට කල්බද්ද සඳහා පාදක වූ වත්කම හා බැඳුණු අවදානම් හා ප්‍රතිලාභයන් සැලකිය යුතු මට්ටමකින් බැංකුව වෙත මාරුවේද යන්න සලකා බලන ලදී. නමුත් ජා.මූ.වා.ප්‍ර. 16 යටතේ සියලුම කල්බදු සඳහා වත්කම භාවිතා කිරීමේ හිමිකමක් හා කල්බදු වගකීමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

**අ) ජා.ගි.ප්‍ර. 17 යටතේ පෙර කාල පරිච්ඡේදයන්හිදී මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කරන ලද කල්බදු**

පෙර කාලපරිච්ඡේදයන්හිදී, ජා.ගි.ප්‍ර. 17 ට අනුකූලව බැංකුව විසින් දේපල කල්බදු, මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කරන ලදී. ජා.මූ.වා.ප්‍ර. 16 ට පළමුවරට අනුගත වීමේදී, බැංකුවේ ඉතිරි කල්බදු ගෙවීම් 2019 ජනවාරි 1 දින පැවති වර්ධනය වන ණය අනුපාතිකය භාවිතයෙන් වට්ටම් කළවිට ලැබෙන වර්තමාන අගය කල්බදු වගකීම ලෙස හඳුනාගන්නා ලදී. කලින් ගෙවන ලද හා උපචිත කල්බදු ගෙවීම්, කල්බදු වගකීමට ගැලපීමෙන් වත්කම භාවිතා කිරීමේ හිමිකම ගණනය කරනු ලැබේ. බැංකුව විසින් මෙම ක්‍රමය සියලුම කල්බදු සඳහා යොදාගන්නා ලදී.

බැංකුව විසින් පළමුවරට අනුගත වන දිනයේදී වත්කම භාවිතා කිරීමේ හිමිකම හානිකරණය වී ඇද්ද යන්න පරීක්ෂා කරන ලද අතර එවන් හානිකරණයක් නිරීක්ෂණය නොවුණ බැවින් වත්කම භාවිතා කිරීමේ හිමිකම හානිකරණය වී නොමැති බවට තහවුරු කරන ලදී.

ජා.ගි.ප්‍ර. 17 යටතේ මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කර තිබූ කල්බදු වලට ජා.මූ.වා.ප්‍ර. 16 අදාල කරගැනීමේදී පහත දැක්වෙන ප්‍රායෝගික භාවිත ක්‍රමයන් බැංකුව විසින් අනුගමනය කරන ලදී.

- සමාන ලක්ෂණ සහිත කල්බදු කළඹකට එකම වට්ටම් අනුපාතිකයක් යොදාගන්නා ලදී.
- පළමුවරට අනුගත වන දිනයට වත්කම භාවිත කිරීමේ හිමිකම මැනීමේදී ආරම්භක සෘජු පිරිවැය නොසලකන ලදී.
- ගිවිසුම් කල්බද්ද දීර්ඝ කිරීමට හෝ අවසන් කිරීමට විකල්පයන් ඇති අවස්ථාවලදී කල්බදු වාරය නිශ්චය කිරීම සඳහා පසු දැක්ම භාවිතා කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශයන් සඳහා බලපෑම**

ජා.මූ.වා.ප්‍ර. 16 ට පළමුවරට අනුගත වීමේදී බැංකුව විසින් අතිරේක වත්කම් භාවිතා කිරීමේ හිමිකම් හා අතිරේක කල්බදු වගකීම් හඳුනාගන්නා ලදී. ඒවායේ 2019 ජනවාරි 1 දිනට ප්‍රමාණාත්මක වටිනාකම සටහන 8 හි දක්වා ඇත.

## 5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

සටහන 4හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම් හැරුණුකොට පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව සෑම කාලයකම යොදාගෙන ඇත.

### 5.1 විදේශීය මුදල් පරිවර්තනය හා ශේෂයන්

විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතික ප්‍රකාර බැංකුවේ භාවිතා වන මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල්වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, වාර්තාකරන දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වාර්තා කරන දිනට වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේ දී, ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට වූ පහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

| මුදල් වර්ගය | 2019 රු. | 2018 රු. |
|---|---|---|
| ඕස්ට්‍රේලියානු ඩොලර් 1 | **127.5343** | 128.8113 |
| කැනේඩියානු ඩොලර් 1 | **139.8206** | 134.0153 |
| යුරෝ 1 | **203.6571** | 209.5593 |
| ජපන් යෙන් 1 | **1.6724** | 1.6661 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1 | **250.7887** | 253.5111 |
| ස්ටර්ලින් පවුම් 1 | **240.7922** | 233.0792 |
| ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1 | **181.6340** | 182.7499 |
| චීන යුවාන් 1 (අක්වෙරළ) | **26.0905** | 26.5988 |

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදුවූන දින තිබූ විදේශීය මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වලට සටහන් කර ඇත.

### 5.2 සාධාරණ අගය මිනුම් කිරීම

බැංකුව විසින් විදේශීය සුරැකුම්පත්, ව්‍යුත්පන්න උපකරණ වැනි මූල්‍ය උපකරණයන් සහ රන් ආදී වූ මූල්‍ය නොවන උපකරණයන් එකී වාර්තාකරණ දිනයන්හි දී සාධාරණ අගයන්ට මිනුම්ගත කර ඇත. මීට අමතරව, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්ගත කරන ලද මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් අංක 53 සටහනෙහි හෙළිදරව් කර ඇත.

සාධාරණ අගය යනු වෙළෙඳපොළ ගණුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම්ගත කරන ලද දිනයට, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදල ය.

මෙම සාධාරණ අගය මිනුම් කිරීම සඳහා පදනම් වන පූර්ව නිගමනය වනුයේ වත්කමක් විකිණීම හෝ වගකීමක් හුවමාරු කිරීම යන ගනුදෙනුවක්:

- වත්කම හෝ වගකීම අදාළ ප්‍රධාන වෙළෙඳපොළෙහි දී සිදුවීම හෝ,
- එවැනි ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති අවස්ථාවකදී එම වත්කම හෝ වගකීම සඳහා වඩාත් ම වාසි සහගත වෙළෙඳපොළෙහි දී සිදුවීමය.

මෙම ප්‍රධාන වෙළෙඳපොළ හෝ වඩාත් වාසිසහගත වෙළෙඳපොළ බැංකුවට පිවිසිය හැක්කක් විය යුතු ය.

වෙළඳපොළ ගණුදෙනුකරුවන්, ඔවුන්ට උපරිම ආර්ථික වාසි සැලසෙන ආකාරයට කටයුතු කිරීමේදී යොදාගනු ලබන උපකල්පනයක් මත පදනම්ව වත්කමක සාධාරණ අගය මිනුම් ගත කරයි. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම් කිරීමේදී එම වත්කම වෙළඳපොළ ගනුදෙනුකරුවෙක්ට එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කොට හෝ එම වත්කම් එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කිරීමට හැකියාව ඇති වෙනත් වෙළඳපොළ ගනුදෙනුකරුවෙක්ට විකිණීමෙන් ආර්ථික වාසි ජනනය කිරීමට ඇති හැකියාව සලකා බලනු ලැබේ.

බැංකුව විසින් සාධාරණ අගයන් මිනුම් කිරීමේ ක්‍රියාවලිය උදෙසා අවස්ථාවට ඉතාමත් උචිත සහ සාධාරණ අගයන් මිනුම්ගත කිරීම අදාළ නිරීක්ෂණ යෙදවුම් හි උපරිම භාවිතය සහ අපරීක්ෂාකාරී යෙදවුම් භාවිතය අවම කිරීම යන කාර්යයන් සඳහා ප්‍රමාණවත් දත්ත අගය කිරීමේ ක්‍රමවේදයන් යොදා ගනු ලබයි. මූල්‍ය වාර්තාවන්හි සාධාරණ අගය මිනුම්ගත කළ හෝ හෙළිදරව් කළ සියළු වත්කම් හා වගකීම් සාධාරණ අගයන් ධුරාවලිය තුළ පහත දැක්වෙන පරිදි වර්ගීකරණයට ලක් කර ඇති අතර එය සමස්තයක් වශයෙන් සාධාරණ අගයන් නිශ්චය කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම් වේ.

| | |
|---|---|
| පළමුවන මට්ටම | - අනන්‍ය වත්කම හා වගකීම සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළ තුළ හිමි ප්‍රකාශිත (නො සැකසූ) මිළ ගණන් |
| දෙවන මට්ටම | - ඍජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කළ හැකි, සාධාරණ අගයන් මිනුම් කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන් |
| තෙවන මට්ටම | - නිරීක්ෂණය කළ නොහැකි, සාධාරණ අගයන් මිනුම්ගත කිරීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්. |

පුනරාවර්තන පදනම මත හඳුනාගත් වත්කම් හා වගකීම් වල ඉහත ධූරාවලි මට්ටම් අතර මාරුවීම් සිදු වී ඇත්දැයි, වර්ගීකරණයේ නැවත තක්සේරු කිරීම (සාධාරණ අගයට මිණුම් කිරීම උදෙසා සමස්තයක් වශයෙන් වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව) සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම බැංකුව තහවුරු කරනු ලබයි.

**5.3 මූල්‍ය වත්කම් සහ බැරකම්**

බැංකුව, මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන්ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන්ගෙන්ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතු සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

**5.3.1 හඳුනාගැනීම හා මූලික මිනුම් කිරීම**

සියළු මූල්‍ය වත්කම් හා වගකීම් මූලිකව පිරිවැය මත හඳුනාගනු ලබන අතර ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළුව, ඉදිරිපත් වන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව එක් එක් මූල්‍ය වත්කම් සඳහා වන මිනුම් කිරීමේ පදනම 2018 ජනවාරි 01 දින සිට අදාළ ප්‍රතිපත්ති වලට පසුව විස්තර කර ඇත. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණනු ලබන සියළු මූල්‍ය වත්කම් හා වගකීම් වෙළෙඳාම් දිනයේ දී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වූ කලි සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළෙඳපොළේ පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළ දී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ මූල්‍ය වත්කම් වන්නේය.

**5.3.2 වර්ගීකරණය**

**මූල්‍ය වත්කම්**

මූලික මිනුම් හඳුනාගැනීමේදී බැංකුව විසින් මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරනු ලබයි.

- මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට
- විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම්කරණ මූල්‍ය වත්කම්
- ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිණුම්කරණ මූල්‍ය වත්කම්

පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව යන ලාභ අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටතේ වර්ගීකරණය නොකළ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ.

- එම මූල්‍ය වත්කම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් රැස්කිරීමේ පරමාර්ථය සහිත ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම.

- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ, මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොලියෙන් පමණක් සමන්විත වීම.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි වලට අනුකූල නම් සහ ලාභ හෝ පාඩු තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටතේ වර්ග කළ නොහැකි නම් එම මූල්‍ය වත්කම් අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය කළ හැක.

- යම් කිසි මූල්‍ය වත්කමක් ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ රැස්කිරීමේ හා මූල්‍ය වත්කම් විකිණීම යන පරමාර්ථ ද්විත්වයෙන් ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම.

- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ මුල් මුදල හා මුල් මුදල මත නොවන පොලියෙන් පමණක් සමන්විත වීම.

වෙළඳාම සඳහා තබා නොගත් ස්කන්ධ ආයෝජන වල සාධාරණ අගයෙන් පසුව සිදුවන වෙනස්වීම් විස්තීරණ ආදායම තුළින් හඳුනාගැනීමේ අවලංගු කළ නොහැකි තෝරා ගැනීමක් එම ආයෝජනය මූලික හඳුනාගැනීමේදී බැංකුවට කළ හැකිය. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම සඳහා වර්ගීකරණය කොට ඇත.

**ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීම**

බැංකුව විසින් ව්‍යාපාර ආකෘතියේ අරමුණු තක්සේරු කිරීමේදී මූල්‍ය වත්කම් අන්තර්ගත වන ආයෝජන කළඹ අරමුණු කොට එය සිදු කරනු ලබයි. ව්‍යාපාරය කළමණාකරණය කරන ආකාරය හා කළමණාකාරීත්වයට තොරතුරු ලබාදෙන ආකාරය මෙමගින් හොඳින්ම නිරූපනය වීම එයට හේතුවයි.

එසේ සලකා බලන තොරතුරු වලට පහත ඒවා ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

- ව්‍යාපාරික ආකෘතියේ කාර්ය සාධනය සහ ව්‍යාපාරික අකෘතිය තුළ රඳවා ඇති මූල්‍ය වත්කම් අගය කිරීම හා ප්‍රධාන කළමණාකාරීත්වයට වාර්ථා කරන ආකාරය

- ව්‍යාපාරික ආකෘතියේ කාර්ය සාධනයට බලපෑ හැකි අවදානම් (සහ එම ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවාගෙන ඇති මූල්‍ය වත්කම්) සහ විශේෂයෙන් අවදානම් කළමණාකරණය කරන ආකාරය.

- පූර්ව කාලපරිච්ඡේදයේ විකුණුම්වල වාර ගණන, වටිනාකම්, එම විකුණුම්වල කාල නිර්ණය විකිණීමට බලපෑ හේතු සාධක සහ අනාගත විකුණුම්වල අපේක්ෂාවන් සලකා බැලීම අවශ්‍ය වේ. කෙසේ වෙතත් විකුණුම් මගින්ම ව්‍යාපාරික ආකෘතිය නිර්ණය නොවන බැවින් එය හුදෙකලාව සැලකිල්ලට ගත නොහැක. ඒ වෙනුවට එය බැංකුවේ මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම හා මුදල් ප්‍රවාහ උපලබ්ධි කරගන්නේ කෙසේද යන සමස්ථ තක්සේරුවේ කොටසක් ලෙස යොදා ගත යුතුවේ.

වෙළඳාම සඳහා තබාගත් හෝ සාධාරණ අගය වෙනස්වීම මත පදනම්ව කාර්ය සාධනය මනිනු ලබන මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මනිනු ලැබේ. එයට හේතුව ඒවා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම හා මූල්‍ය වත්කම් විකිණීමට හෝ රඳවාගෙන නොමැති නිසාය.

**ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ යනු, මූලික මුදල හා ඒ මත වන පොළිය (SPPI) පමණක්දැයි විමසීම පිළිබඳව වන තක්සේරුවයි.**

බැංකුව විසින් මූලික හා මූලික මුදල මත පොළිය පමණක් යන කොන්දේසිය (SPPI Test) තහවුරු කර ගැනීම සඳහා මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත කොන්දේසි තක්සේරු කරනු ලැබේ. මේ සඳහා මූල්‍ය වත්කමක් පළමු වරට හඳුනාගැනීමේදී ඇති සාධාරණ අගය "මූලික මුදල" ලෙසද කිසියම් කාලසීමාවක් තුළ ගෙවීමට ඇති මුල් මුදල හා බැඳි ණය අවධානමත් අනෙකුත් මූලික ණය දීමේ අවධානම හා පිරිවැයත් මුදලේ කාලීන වටිනාකමෙහි අගයන් "මූලික මුදල මත වන පොළිය" ලෙස අර්ථ දැක්වේ.

මූලික ණය දීමේ එකගතාවයකදී පොළියේ ඇති වඩාත් වැදගත් මූලිකාංගයන් ලෙස මුදලේ කාලීන අගය හා ණය අවධානම සඳහා ගෙවනු ලබන අගය හැඳින්විය හැකිය.

SPPF තක්සේරුව කිරීම සඳහා බැංකුව විසින් විනිශ්චයන් අදාළ කර ගන්නා අතර මූල්‍ය වත්කම් නිරූපනය කරන මුදල් ඒකකය හා පොළී අනුපාතය නියම කර ඇති කාලපරිච්ඡේදය යනාදිය අදාළ සාධක ලෙස සලකා බලනු ලබයි.

කෙසේ වුවද ණයදීම පිළිබඳ මූලික එකගතාවයන් හා සම්බන්ධ නැති ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි අවධානම හෝ විචලනය වන ස්වභාවයට අනාවරණය වීම් හඳුන්වාදෙන ආකාරයේ ගිවිසුම්ගත කොන්දේසි, මූලික මුදල හා ඒ මත වන පොළිය (SPPF) පමණක් වූ මුදල් ප්‍රවාහ වලට හේතු නොවේ. එවන් අවස්ථාවන්හිදී, එකී මූල්‍ය වත්කම ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කරනු ලැබේ.

**ප්‍රතිවර්ගීකරණය**

මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා වූ ව්‍යාපාර ආකෘතිය වෙනස් කිරීමේ දී හැර, මූල්‍ය වත්කම් පළමුවරට හඳුනාගත් පසු ප්‍රතිවර්ගීකරණය නොකරයි.

### 5.3.3. ඉවත් කිරීම්

**මූල්‍ය වත්කම්**

බැංකුවට මූල්‍ය වත්කමෙහි මුදල් ප්‍රවාහ සඳහා ඇති ගිවිසුම්ගත අයිතිවාසිකම් අවසන්වීමේදී හෝ මූල්‍ය වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයක් වෙනත් පාර්ශ්වයකට පවරන්නේ නම් හෝ මූල්‍ය වත්කමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැහෙන දුරට පැවරුම් කර හෝ රඳවාගෙන නොමැති විට හා වත්කමේ පාලනය රඳවාගෙන නොමැති විට එය පොත් වලින් ඉවත් කළ යුතුය.

මූල්‍ය වත්කමක් ඉවත් කිරීමේදී,

(i) එහි ධාරණ අගය හා ප්‍රතිශ්ඨාව අතර වෙනස සහ

(ii) විස්තීරණ ආදායම් තුළ කලින් හඳුනා ගන්නා ලද සම්මුච්චිත ලාභය හෝ අලාභය යන දෙකම ආදායම ප්‍රකාශය තුළ නිරූපණය විය යුතුය.

2018 ජනවාරි 01 දින සිට, විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන ස්කන්ධ ආයෝජන පොත් වලින් ඉවත් කිරීමේදී ඊට අදාළව විස්තීරණ ආදායම තුළ හඳුනාගත් සමුච්චිත ලාභ අලාභ ආදායම් ප්‍රකාශය තුළ ඇතුළත් නොකෙරේ.

පැවරුම කිරීමකින් පොත්වලින් ඉවත් කරන ලද මූල්‍ය වත්කමකට අදාළව ජනනය කරන ලද හෝ රඳවා ගත් පොලිය වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනා ගැනේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මත හඳුනාගෙන පවරන ලද එහෙත් සියළු අවදානම් හා ප්‍රතිලාභයන් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් රඳවාගත් වත්කම් ඉවත් කරනු නොලබයි. සුරැකුම්පත් ණයට දීම, විකිණීම සහ ප්‍රතිමිලදී ගැනීම් ගණුදෙනු මේ සඳහා උදාහරණයන් වේ. මෙබඳු ගණුදෙනු වලදී බැංකුව අදාළ මූල්‍ය වත්කමෙහි හිමිකාරීත්වයේ අවදානම් හා ප්‍රතිලාභ සම්පූර්ණයෙන් හෝ කොටසක් රඳවා ගැනීම හෝ මාරු කිරීම සිදු කරනු නොලබන අතර වත්කමෙහි පාලනය බැංකුව සතුව රඳවා ගනී. අදාළ වත්කම කෙරෙහි බැංකුව දක්වන අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණය අනුව එම වත්කම හඳුනා ගැනේ.

**මූල්‍ය බැරකම්**

මූල්‍ය බැරකමක් ඉවත් කරනු ලබනුයේ එහි ගිවිසුම්ගත බැඳීම නිදහස් කිරීම, අවලංගු කිරීම හෝ කල් පිරීම සිදු වූ විටය.

### 5.3.4. මූල්‍ය වත්කම් හානිකරණය

බැංකුව විසින් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට අගය නොකළ පහත මූල්‍ය උපකරණ වෙනුවෙන් අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරන අලාභ හඳුනා ගනී.

- අනෙකුත් විස්තීරණ අදායම තුළින් සාධාරණ අගයට නිරූපිත මූල්‍ය වත්කම්
- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්
- ණය ඇපකර ගිවිසුම්

ස්කන්ධ ආයෝජන මත හානිකරණ අලාභ හඳුනා නොගැනේ.

බැංකුව විසින් ඉහළ ආයෝජන ශ්‍රේණියෙහි පිහිටි (Baa3/ BBB- සහ ඉහළ ශ්‍රේණිගත) ආයෝජන සඳහා මාස 12 ක අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයන් හඳුනා ගනී. අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට හෝ ක්‍රමක්ෂය පිරිවැයට වර්ගීකරණය කරන ලද බැංකුවේ බහුතරයක් ආයෝජන Baa3/BBB- අගයට ඉහලින් ශ්‍රේණිගතය. මාස 12 ක අපේක්ෂිත ණය අලාභයක් හඳුනාගන්නා මූල්‍ය උපකරණ “පළමු අදියරේ මූල්‍ය උපකරණ” ලෙස හඳුනා ගැනේ.

මුල්වරට හඳුනාගැනීමේදී පහළ ආයෝජන ශ්‍රේණිගත හෝ මුල්වරට හඳුනාගැනීමෙන් පසුව ණය ශ්‍රේණිය පහළ හෙළන ලද (Baa3/BBB- අගයට වඩා පහළ ශ්‍රේණිගත) ආයෝජන උපකරණ සඳහා හෝ මුල්වරට හඳුනා ගැනීමෙන් පසු ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවය දෙගුණයක් දක්වා වර්ධනය වූ ජීවකාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයක් ගණනය කරයි. ජීවකාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරන අලාභයන් හඳුනාගනු ලබන, එහෙත් මුළුමනින්ම ණය හානිකරණය නොකරන ලද ණය උපකරණ “දෙවන අදියරේ මූල්‍ය උපකරණ” ලෙස හඳුනා ගැනේ. ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයක් ගණනය කරනු ලබන විට ඒවා (මුළුමනින්ම ණය හානිකරණය කරන ලද ණය උපකරණ) “තෙවන අදියරේ මූල්‍ය උපකරණ” ලෙස හැඳින්වේ.

**අපේක්ෂිත ණය අලාභ මැනීම**

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ යාන්ත්‍රණය පහත ප්‍රධාන මූලිකාංගයන් සමඟ විස්තර කර ඇත.

**ණය පැහැර හරීමේ සම්භාවිතාව**

පැහැර හැරීමේ සම්භාවිතාව යනු දෙන ලද කාල සීමාවක් තුළ ගෙවීම් පැහැර හැරීමට ඇති නැඹුරුව සම්බන්ධ ඇස්තමේන්තුවයි. අදාළ පහසුකම (ආයෝජනය/ණය) පොත්වලින් ඉවත් කොට නොමැතිනම් හා තවමත් ආයෝජන කළඹෙහි ඇතුළත් නම් පමණක් තක්සේරු කරන කාලපරිච්ඡේදය තුළදී ගෙවීම් පැහැර හැරීම, යම් නිශ්චිත කාලයක් තුළ සිදුවිය හැක.

බැංකුව විසින් සියලු විදේශ ආයෝජන (ක්‍රමක්ෂය පිරිවැයට හා විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම් කරන වත්කම්) සඳහා නිකුත් කරන්නන්ගේ හා ප්‍රතිපාර්ශ්වයන්ගේ නිශ්චිත ස්කන්ධ කොටස් මත වන පැහැර හැරීමේ සම්භාවිතයන් බ්ලූම්බර්ග් (Bloomberg) තොරතුරු පද්ධතිය තුළින් ලබා ගනී. එවන් නිශ්චිත ස්කන්ධ කොටස් මත වන පැහැර හැරීමේ සම්භාවිතයන් නැතිවිට බැංකුව විසින් අදාළ නිකුත් කරන්නන්ගේ හා ප්‍රතිපාර්ශ්වයන්ගේ ශ්‍රේණිගත කිරීම් සඳහා බ්ලූම්බර්ග් තොරතුරු පද්ධතියේ ඇති පොදු පැහැර හැරීමේ සම්භාවිතා වගුව (Common PD Table) මගින් වාර්තා කරන දිනට ඇති පැහැර හැරීමේ සම්භාවිතාවය ලබා ගනු ලැබේ.

**ගෙවීම් පැහැර හැරීමේදී ඇති නිරාවරණය**

ගෙවීම් පැහැර හැරීමේදී ඇති නිරාවරණය යනු අනාගත ගෙවීම් පැහැර හරින දිනයකදී බැංකුව නිරාවරණය වන මූල්‍ය වත්කමෙහි වටිනාකම පිළිබඳ ඇස්තමේන්තුවයි. එම ඇස්තමේන්තුව මූලික මුදල හා ඒ මත වන පොලිය ආපසු ගෙවීම, කොන්ත්‍රාත්තුවකින් හෝ වෙනත් ආකාරයකින් නියම කරනු ලබන ණය බැඳියාවන්ගේ අනාගත නිකුත් කිරීම හා මගහැරුණු ගෙවීම් සඳහා වන උපචිත පොලිය ඇතුළත්ව අනාගත නිරාවරණ ප්‍රමාණය මත වන අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් සිදු කරනු ලබයි.

**පැහැර හැරීමකදී වන අලාභය**

පැහැර හැරීමකදී වන අලාභය යනු දී ඇති දිනයකදී ගෙවීම් පැහැර හැරීම නිසා බැංකුවට සිදුවන අලාභය පිළිබඳ ඇස්තමේන්තුවයි. එය ලැබීමට නියමිත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හා බැංකුව ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහය අතර වෙනසට ඇප වශයෙන් තබා ඇති වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ප්‍රමාණයද ඇතුළත් කිරීමෙන් ගණනය කෙරේ. බැංකුවට එක් එක් වෙන්වූ මූල්‍ය වත්කමෙන් වන අවදානම් නිරාවරණය මත පදනම්ව යොදාගත යුතු පැහැර හැරීමකදී වන අලාභ ප්‍රතිශතය තීරණය කිරීමට අභ්‍යන්තරව අනුමත කරන ලද ප්‍රතිපත්තියක් ඇත.

**ආර්ථික සාධක ගැලපීම**

යම් කාලපරිච්ඡේදයක් සඳහා බලපැවැත්වෙන පැහැර හැරීමේ සම්භාවිතාව, යම් මොහොතක පවතින (වාර්තා කරන දිනට) පැහැර හැරීමේ සම්භාවිතාවයකට පරිවර්තනය කිරීම සඳහා බැංකුව විසින් ආර්ථික සාධක ගැලපීම යොදා ගනී.

බැංකුව, පැහැර හැරීමේ සම්භාවිතාව වෙනස් කිරීම සඳහා ප්‍රධාන ආර්ථික සාධකයක් ලෙස දළ දේශීය නිෂ්පාදිත දත්ත යොදා ගනී.

**ණය අවධානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇත්දැයි ඇගයීම**

මූල්‍ය වත්කම්/ උපකරණ මුල් වරට හඳුනාගැනීමේ දිනට පසු සිදුවන ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවේ දෙගුණයක වර්ධනයක් හෝ අදාළ මූල්‍ය වත්කම/ උපකරණ නිකුත් කරන්නන්ගේ හෝ ප්‍රතිපාර්ශ්වයේ ශ්‍රේණිගත කිරීම BBB - වලට වඩා පහළ යාමක් සිදුවේ නම් එය අදාළ මූල්‍ය උපකරණයේ ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ලෙස බැංකුව සලකා බලනු ලැබේ.

ඉහත කරුණු ඉහළ ආයෝජන ශ්‍රේණියක සිට පහළ ආයෝජන ශ්‍රේණියක් දක්වා වන සියලු ශ්‍රේණිගත කිරීම්වල පහළ වැටීමත් (Baa3 සිට Ba1 දක්වා වූ සුළු පහත වැටීමක්ද ඇතුළත්ව) ගෙවීම පැහැර හැරීමේ සම්භාවිතාවය දෙගුණයක වැඩිවීමට තුඩුදෙන බවට වන නිරීක්ෂණය මත පදනම් වේ.

**ණය හානිකරණය වූ මූල්‍ය වත්කම්**

ක්‍රමක්ෂය පිරිවැයට හා විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම් කළ මූල්‍ය වත්කම් හා ණය ඇපකර යනාදිය ණය හානිකරණය වී ඇත්දැයි (අදියර 3 ලෙස සඳහන් කර ඇති මූල්‍ය වත්කම්) සෑම වාර්තා කරන දිනකදීම බැංකුව විසින් අගයනු ලබයි. මූල්‍ය වත්කම් එහි ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ වලට අවාසිදායක බලපෑමක් වී ඇති එකක් හෝ ඊට වැඩි සිද්ධීන් ඇති වූ විට එම මූල්‍ය වත්කම ණය හානිකරණය වී ඇත. මූල්‍ය වත්කම ණය හානිකරණය වී ඇති බවට නිරීක්ෂණය කළ හැකි සාක්ෂි වලට පහත සිද්ධීන් පිළිබඳව දත්ත ඇතුළත් වේ.

- නිකුත් කරන්නාගේ හෝ ණය ගන්නාගේ සැලකිය යුතු අන්දමේ මූල්‍ය දුෂ්කරතා
- ගෙවීම් පැහැර හැරීමක් හෝ කල් ඉකුත් වූ සිද්ධීන් වැනි ගිවිසුම් කඩ කිරීමක්
- ණය ගැණුම්කරුවන් බුන්වත් බවට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිව්‍යුහගත කිරීමකට පත්වීම අපේක්ෂා කළ හැකි බව

**අපේක්ෂිත ණය අලාභ සඳහා වන වෙන්කිරීම් මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ ඉදිරිපත් කිරීම**

අපේක්ෂිත ණය අලාභ සඳහා වන වෙන්කිරීම්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ පහත අයුරින් ඉදිරිපත් කර ඇත.

- ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම් : අදාළ මූල්‍ය වත්කමේ දළ ධාරණ වටිනාකමෙන් අඩු කොට දැක්වීම.
- විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම් : මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ මෙවැනි දළ ධාරණ වටිනාකම සාධාරණ අගය වන හෙයින් ණය අලාභ වෙන් කිරීම් කිසිවක් මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ හඳුනාගනු නොලබයි. කෙසේ වෙතත් අදාළ ණය අලාභ වෙන් කිරීම් විස්තීරණ ආදායම තුළ හඳුනාගෙන අනාවරණය කර ඇත.
- ණය ඇපකර ගිවිසුම : වෙන්කිරීමක් ලෙස,

**ලියා හැරීම**

ණය දීමක් හෝ ණය සුරැකුම්පතක් නැවත අය කර ගැනීමට (සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන්) බැංකුවට සාධාරණ අපේක්ෂාවන් නොමැති විට ඒවා ලියා හරිනු ලබයි. ලියා හැරීමට යටත් ණයගැතියන්ට ණය ආපසු ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ රැස්කර ගැනීමට හැකි වත්කම් හෝ ආදායම් මූලාශ්‍ර නොමැති විට මෙසේ ණය ලියා හරිනු ලබයි. මෙම ඇගයීම එක් එක් වත්කම සම්බන්ධයෙන් සිදුකරන අතර, කලින් ලියා හරින ලද ප්‍රමාණයන් ආපසු අයකර ගැනීමකදී එම මුදල ආදායම් ප්‍රකාශයේ හා විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ "මූල්‍ය උපකරණ මත වන හානිකරණ අලාභ" යන මැයෙන් ඇතුළත් කරනු ලැබේ.

**5.4 ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්**

වෙළෙඳාම සඳහා ගැනෙන මූල්‍ය වත්කම්, "ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගයට ඇති වත්කම්" යටතේ වර්ග කර ඇතුළත් කර ඇත. මූලික හඳුනාගැනීමේදී ආරෝපණය කළ ගනුදෙනු පිරිවැය ලාභය හෝ පාඩුව තුළ දරන ලද ලෙස හඳුනාගනු ලැබේ. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළෙඳපොළ මිල ප්‍රකාර අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි සුරැකුම්පත් යටතේ වටිනාකම් වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස හඳුනා ගන්නා අතර එයින් උද්ගත වන වාසිය/අවාසිය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ඇත.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් අදාල වාසිය/අවාසිය "උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(පාඩුව)" ලෙස වාර්තා කරනු ලැබේ. සුරැකුම්පත් විකිණීම මගින් වාසියක් හෝ අවාසියක් උද්ගත වන්නේ නම්, එය "මිල වෙනස්වීමේ උපලබ්ධි වාසිය/(පාඩුව)" ලෙස වාර්තා කරනු ලැබේ.

**5.5 අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්**

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් වනුයේ ව්‍යුත්පන්න නොවන ආයෝජන හා අනෙකුත් මූල්‍ය වත්කම් කාණ්ඩයකට වාර්තා නොකරන ලද ආයෝජනයි. මෙයට ස්කන්ධ සුරැකුම්පත් හා ණය සුරැකුම්පත් ඇතුළත් වේ.

මෙම ආයෝජන පසුව වෙළඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් වල වටිනාකම වැඩිවීම හෝ අඩුවීම වශයෙන් හඳුන්වනු ලැබේ.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති ස්කන්ධ ආයෝජන, වෙළඳපොළ අගයන් නොමැතිවීම හේතුවෙන් ඒ ඒ ආයෝජන පවතින ආයතනයන්ගේ ශුද්ධ වත්කම් මත පදනම්ව අගය කර ඇත.

මෙම වර්ගීකරණයට අදාළ දේශීය හා විදේශීය ණය සුරැකුම්පත් හා ස්කන්ධ ආයෝජන වල වෙළඳපොළ අගයෙහි වෙනස්වීම් නිසා උද්ගතවන වාසි හෝ අවාසි එම වත්කම් විකිණීම, ප්‍රතිග්‍රහණය, ඉවත් කිරීම හෝ හානිකරණය වන තෙක් කෙලින්ම බැංකුවේ හිමිකරු ප්‍රාග්ධනය (විස්තීරණ ආදායම) හි ඇති අනෙකුත් සංචිත තුළ පෙන්වන අතර ඉහත සඳහන් ක්‍රමවලින් වත්කම පොත් වලින් ඉවත් කරන විට අදාළ ලාභ හා පාඩු, ආදායම් ප්‍රකාශය තුළ වාර්තා කරනු ලබයි.

කෙසේ වෙතත් ස්කන්ධ ආයෝජන පොත් වලින් ඉවත් කිරීමේදී එයට අදාළ වෙළඳපොළ අගයන්ගේ වෙනස්වීමෙන් ලද ලාභ හා පාඩු, ආදායම් ප්‍රකාශනය තුළින් ප්‍රතිචක්‍රණය නොකෙරේ.

මෙම වත්කම් වලට අදාළ පොලී ආදායම සඵල පොලී ක්‍රමය භාවිතා කර ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනු ලැබේ.

**5.6 මූල්‍ය උපකරණ ක්‍රමක්ෂය පිරිවැයට**

ජා.මූ.ප්‍ර. 39 යටතේ ණය හා ලැබීම් සහ කල්පිරෙන තෙක් රඳවාගත් ලෙස වර්ගීකරණය කරන ලද අයිතම, ජා.මූ.වා.ප්‍ර. 9 යටතේ ක්‍රමක්ෂය පිරිවැයට වූ උපකරණ ලෙස වර්ගීකරණය කර ඇති අතර ඊට කල් පිරෙන තෙක් තබා ගැනීමට ධනාත්මක අපේක්ෂාවක් සහ හැකියාවක් ඇති ස්ථිර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහ ස්ථිර කල් පිරීමක් ඇති ආයෝජන සහ බැංකු/රජය සඳහා දෙන ලද ණය ඇතුළත් වේ. කල් පිරෙන තෙක් රඳවා ගෙන ඇති ආයෝජන සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යනු ලැබේ.

**5.7 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ**

මුදල් හුවමාරු, ඉදිරි විදේශ විනිමය ගිවිසුම් සහ පොලී අනුපාත හුවමාරු වැනි ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ බැංකු විසින් භාවිතා කරනු ලබන අතර ඒවා භාවිතා කරනුයේ අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණු සඳහා මිස සමපේක්ෂාත්මක අරමුණු සඳහා නොවේ. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ එහි සාධාරණ අගයට වාර්තා කරන අතර එහි සාධාරණ අගය ධන අගයක් ගන්නා විට වත්කමක් ලෙසත් එම අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙසත් වාර්තා කරයි. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගයෙහි ඇතිවන චලනයන් "උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/(පාඩුව)" යටතේ වාර්තා කරනු ලැබේ.

ගනුදෙනුවක මිල ඒ හා සමාන ගණුදෙණු පවතින්නා වූ නිරීක්ෂණය කළ හැකි වර්ථමාන වෙළෙඳපළක සාධාරණ අගයෙන් වෙනස් වේ නම් හෝ මිල නිරීක්ෂණය කල හැකි වර්ථමාන වෙළෙඳපළෙහි දත්ත පමණක් විචල්‍යන් ලෙස යොදාගත් ඇගයීම් ශිල්ප ක්‍රමයක් භාවිතයෙන් ලබාගත් මිලෙන් වෙනස් වේ නම්, බැංකුව විසින් එම ගණුදෙණුවේ මිල හා සාධාරණ අගය අතර වෙනස (දිනට වෙනස) "උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු)" ලෙස හඳුනාගනු ලබයි. ගණුදෙණුවක සාධාරණ අගය නිරීක්ෂණය කළ නොහැකි දත්ත මත පැනවිම තිරණය කළ අවස්ථාවක එම ගණුදෙණුවේ මිල හා අදාල ඇගයීම් රාමුවේ මිල අතර වෙනස, අදාළ යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වූ විට හෝ එම උපකරණ මූල්‍ය ප්‍රකාශන මත ඉවත් කල විට පමණක් අදායම් ප්‍රකාශනය තුළ ගලපනු ලබයි.

**5.8 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන් (IMF)**

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු ලෙස නොව, තම බලතල ප්‍රකාර සිදුකරනු ලැබේ. බැංකුව විසින් ජා.මූ.අ. සමග සිදුකෙරෙන සියළු ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා.මූ.අ. සමග වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර, එම පංගුව සඳහා ජා.මූ.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මූ.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මූ.අ. සමග වූ පංගුව හා විශේෂ ගැනුම් හිමිකම් දැරීම වත්කම් ලෙස ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගය ලෙස වර්ගීකරණය කර ඇති අතර අනෙකුත් ජා.මූ.අ. හා අදාල වන සියලුම වත්කම් සහ වගකීම් සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනු ලැබේ. ජා.මූ.අ. විසින් වාර්තාකරණ දිනට ප්‍රකාශයට පත්කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මූ.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ජා.මූ.අ. සමඟ වූ ශේෂයන්ට අදාළ සියළුම ගාස්තු සහ පොළිය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**5.9 මුදල් සහ මුදල් සමානයන්**

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල්, කෙටිකාලීන තැන්පතු සහ පරිණත කාලය මාස තුනකට අඩු, සාධාරණ අගය වෙනස්වීමේ සැලකිය යුතු අවදානමක් නොමැති සහ බැංකුව මගින් එහි කෙටිකාලීන බැඳීම් කළමණාකරණය සඳහා යොදා ගන්නා ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු මූල්‍ය වත්කම් මුදල් සහ මුදල් සමානයන්ට අයත් වේ.

මුදල් සහ මුදල් සමානයන් ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඇතැම් ආදායම් ඉපැයීම් ද ඇතැම් වියදම් දැරීම ද සිදුකරන නමුත්, එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර එයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමග සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමග ගනුදෙනු අදාළ වේ. ශ්‍රී ලංකා රජය සමග වන ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති කාරකයක් ලෙස රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල ආයක නොවූ කොටසක් සහ රජය විසින් නිකුත් කරනු ලබන බැඳුම්කර අයත් වේ. එවැනි මිලට ගැනීම්, බැහැර කිරීම් හෝ ඒ මත පොලිය හුදෙක් පොත් සටහන් වශයෙන් පමණක් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල සටහන් කරනු ලැබේ. මේවා මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් 47 සහ සටහන් 48 යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාර, ව්‍යවස්ථාපිත අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නා වෙනුවෙන් බැංකුව මගින් හිමිකමක් පවතී.

මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ. සංසරණ මුදල්වල චලනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන අතර, මහ බැංකු අතර පවත්නා පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන චෙක්පත් මගින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සහ මූල්‍ය ආයතන සමග වන තැන්පතු ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහයට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි, මුදල් සහ මුදල් සමානයන්ට මුදල්/මුදල් විධානයන්ගේ ශුද්ධ ගලායෑම් හා ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් ද අඩංගු වේ.

**5.10 ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු**

ප්‍රතිමිලදී ගැනීම සඳහා ගිවිසුම් යටතේ විකුණනු ලබන සුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වූ වගකීම් (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම් සහ ප්‍රතිමිලදී ගැනීමේ මිල සහ ප්‍රතිවර්තන මිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදී ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර, එය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණීම සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු නිසා උපචිත ආදායමක් හෝ උපචිත වියදමක් උද්ගත වුයේ නම්, එය ද ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු වටිනාකම සමග වාර්තා කරනු ලැබේ.

**5.11 නිත්‍ය තැන්පතු සහ ණයදීමේ පහසුකම්**

2014 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම (පෙර නිත්‍ය ප්‍රතිමිලදී ගැනුම් පහසුකම) සුරැකුම් රහිත තැන්පතු පහසුකමක් බවට පරිවර්තනය කරන ලදී. එබැවින් සහභාගී වන ආයතන තම අතිරේක අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාත යටතේ දෛනිකව ආයෝජනය කරනු ලබයි.

නිත්‍ය ණය පහසුකම, පෙර නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම හා සර්ව සම අතර මෙය මූල්‍ය තත්ව ප්‍රකාශයේ ක්‍රමක්‍ෂය පිරිවැයට හඳුනාගනී.

**5.12 ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්**

වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවය අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීම් යටතේ බැංකුව විසින් කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරනු ලබයි.

නිකුත් කරනු ලබන සුරැකුම්පත් වගකීමක් ලෙස වාර්තා කරන අතර මුහුණත අගය සහ නිකුතු මිල අතර වෙනස ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස වාර්තා කරනු ලබයි.

**5.13 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්**

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්හි ආයෝජන මූල්‍ය තත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය ලෙස වාර්තා කරනු ලැබේ.

**5.14 රජයට දෙන ලද කාලීන අත්තිකාරම්**

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත සෘජුව දෙන ලද කාලීන අත්තිකාරම්වලින්, රජයට දෙන ලද අත්තිකාරම් නියෝජනය වේ. මෙම අත්තිකාරම් පසුව ක්‍රමක්ෂය පිරිවැයට දක්වා ඇත.

**5.15 අනිකුත් ආයතනවලට දෙන ලද ණය**

අනිකුත් ආයතනවලට දෙන ලද ණය ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගෙන දක්වා ඇත.

**5.16 සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම**

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්ව අවශ්‍යතා සඳහා ප්‍රධාන සංස්ථාපිත ආයෝජකයින් වෙතින් රාජ්‍ය සුරැකුම්පත් ණයට ගැනීම සිදු කරයි. මෙම ණයට ගත් සුරැකුම්පත්, බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරිත්වය මත වෙළෙඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට යොදා ගනී.

සුරැකුම්පත් ණයට ගැනීම යනු නැවත බාරදීම අතපසු වන විටක දී, සුරැකුම්පත් නැවත භාරදීම, එකඟ වූ ගාස්තු ගෙවීම සහ වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ගෙවීම (බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ සහභාගීවන්නන්ට දැනුම් දී ඇති වෙළෙඳපොළ මිල) සඳහා වන කොන්දේසි විරහිත ඇපවීමකි. ණයට ගත් සුරැකුම්පත් වෙළෙඳපොළ වටිනාකමින් කිසියම් අවස්ථාවක දී ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා යොදා නොගත් සුරැකුම්පත් අසම්භාව්‍ය වගකීම් ලෙස වාර්තා කරනු ලැබේ. අදාළ ගාස්තු ගෙවීම උපචිත පදනම මත වර්තාකරණු ලබයි.

ණයට දීමේ ගනුදෙනුවක් යටතේ ප්‍රතිපාර්ශ්වයකට සුරැකුම්පත් මාරු කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්නුම් කරෙනුයේ හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභයන්ද මාරු වූයේ නම් පමණි.

**5.17 සේවක ණය**

සහනදායී පොළී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ට හිමිකම ලැබේ. 2008 වසරේ සිට නිකුත් කල මෙම ණය, ජා.මු.වා.ප්‍ර. 9 අනුව, වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් ඒවායේ සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.

**වට්ටම් අනුපාතය** - මෙම අනුපාතය ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් ඉලක්ක කරගත් දිගුකාලීන උද්ධමනය පදනම් කොට ශ්‍රී ලංකා මහ බැංකු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

මගින් සම්පාදනය කරන ලදී. විගණන කමිටුව මගින් එකඟ වී ඇති පරිදි වාණිජ්‍ය පොළී නිර්දේශිත අනුපාතය (CIRR) සඳහා සියයට 1 ක අවදානම් අධිකයක් ද එකතු කරමින් වට්ටම් අනුපාතය භාවිත කොට ඇති අතර එය ණයවල කාලපරිච්ඡේදය සමඟ වෙනස් වේ.

මෙම ණය සහනදායී පොළී අනුපාතයන් යටතේ ලබාදීම නිසා බැංකුව විසින් දරණ ලද වියදම වාර්තා කිරීමට සේවක ණයවල වර්ෂ ආරම්භ දිනට සහ වර්ෂ අවසාන දිනට වර්තමාන අගයන්ගේ වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර බැංකුව විසින් මෙම ණය, වෙළෙඳපොළ අනුපාතිකයන්ට දෙනු ලැබුවේ නම්, බැංකුව විසින් උපයනු ලබන ආදායම වාර්තා කිරීමට සමාන අගයක්, අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

**සාධාරණ අගය කිරීම ගණනය සඳහා යොදාගනු ලබන උපකල්පනයන්:**

- සේවක ණය ලබාදුන් දිනය ලෙස ජනවාරි 01 දින සලකන ලදී.
- මෙම ණය සඳහා කිසිදු ආකාරයක ගැලපීමක් හෝ කලින් පියවීමක් සිදුවී නොමැත.

### 5.18 රන්

මුදල් නීති පනතේ 67(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවට තම ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස, රන් දැරිය හැක. මුදල් නීති පනතේ 67(2) වගන්තිය ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් රන් න්‍යෂ්ටික සංචිතයක් ලෙසින් හෝ රන්වලට නිදහසේ ඍජුව හෝ වක්‍රව පරිවර්තනය කළ හැකි විනිමයක් ලෙස පවත්වාගත යුතුයි. මෙම රන් තොගය ජාත්‍යන්තර සංචිතයේ කොටසක් වන බැවින් සහ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී වෙළෙඳ භාණ්ඩයක් ලෙස හුවමාරු නොවන බැවින් රන් සාධාරණ අගයට අගය කොට ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ. රන්වලින් උපලබ්ධි නොවූ ලාභය හෝ අලාභය ලාභාලාභ විසර්ජනයට පෙර අදාළ සංචිත ගිණුමට මාරු කරනු ලැබේ.

### 5.19 මුදල් තොග

බැංකුවේ තොගය තුළ, සංසරණය සඳහා නිකුත් කර නොමැති නව ව්‍යවහාර මුදල් අන්තර්ගත වේ. නව මුදල් නෝට්ටු සහ කාසිවලට අදාල නිෂ්පාදන සහ නිර්මාණ පිරිවැය, මුල්වරට පිරිවැයට හඳුනාගනු ලැබේ. සංසරණය සඳහා නිකුත් කරනු ලබන නව මුදල් නෝට්ටු සහ කාසිවල අදාල පිරිවැය බර තබන ලද සාමාන්‍ය පදනමක් මත තීරණය කරන අතර, නිකුත් කරන අවස්ථාවේදී එය ආදායම් ප්‍රකාශනයට ගලපනු ලැබේ. සෙමෙන් චලනය වන තොගය සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.

### 5.20 අනෙකුත් තොග

අනෙකුත් තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම් වන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනම්ව පිරිවැය නිශ්චය කරනු ලැබේ.

### 5.21 දේපළ, පිරියත සහ උපකරණ

ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපළ, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය එය දරන අවස්ථාවේදී හඳුනා ගැනීම සඳහා වූ නිර්ණායකයන් සපුරන ලද්දේ නම්, එකී වියදම් ද එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත.

ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන දිනට එහි සාධාරණ අගය වන ප්‍රත්‍යාගණන අගයට අගය කර ඉන් සමුච්චිත ක්‍ෂයවීම් සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකර දක්වනු ලැබේ.

සින්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීවකාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ජීවකාලය |
|---|---|
| සින්නක්කර ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50 ක් තුළ |
| කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | කල්බදු කාල පරිච්ඡේදය තුළ හෝ වසර 50 යන දෙකෙන් අවමය |
| පිරියත සහ පිරියත කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලී බඩු සහ උපකරණ | වර්ෂ 10 ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| 2014 වර්ෂයේ සිට මිලදී ගත් මෝටර් රථ | වර්ෂ 10 ක් තුළ |
| පරිගණක දෘඪාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරගත නොහැකි බවට සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් හෝ මගින් පෙන්නුම් කරන විටක දේපල, පිරියත හා උපකරණවල සාධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කළ යුතුය.

බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සඳහා වූ ප්‍රතිපත්තිය වන්නේ අවම වශයෙන් වසර 5කට වරක් හෝ සැලකිය යුතු තක්සේරු ගැලපීමක් ඊට අඩු කාලසීමාවක් තුළදී ප්‍රත්‍යක්ෂ වූ විටය.

ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, මූල්‍ය තත්ව ප්‍රකාශයේ හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මීට පෙර එම වත්කමෙහි හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම් ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන්ම වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම්, ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමග ගලපනු ලැබේ. වත්කමක් බැහැර කිරීමේදී, කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙතොත් එය

රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් භාවිතා කිරීමෙන් හෝ ඉවත්කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැතිනම් එය දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගත වන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල සහ ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීවකාලය සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරුව ගැලපීම් කරනු ලැබේ.

ප්‍රාග්ධන නොනිමි වැඩ එහි පිරිවැයට දක්වා ඇත. මෙම වියදම් ප්‍රාග්ධන ස්වභාවයේ වන අතර ගොඩනැගිලි ඉදිකිරීමේ දී ප්‍රධාන පිරියත සහ යන්ත්‍ර සහ පද්ධති සංවර්ධනයේදී සෘජුව දරා ඇති අතර ප්‍රාග්ධනීකරණය කිරීමට සූදානමින් පවතින වියදම් වේ.

### 5.22 කල්බදු

**2019 ජනවාරි 1 දින සිට අදාල වන ප්‍රතිපත්ති**

යම් ගිවිසුමක් ආරම්භයේදී එම ගිවිසුම කල්බදු ගිවිසුමක්ද යන්න හෝ ගිවිසුමෙහි කල්බද්දක් අන්තර්ගත වේද යන්න බැංකුව විසින් නිර්ණය කරනු ලැබේ. ප්‍රතිෂ්ඨාව සඳහා හුවමාරුවේදී යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතා කිරීමේ අයිතිය ගිවිසුමකින් පවරා දෙන්නේනම් එවන් ගිවිසුමක් කල්බද්දකින් සමන්විත වේ. යම් ගිවිසුමක් මගින් හඳුනාගත් වත්කමක් භාවිතා කිරීමේ අයිතියක් ලබාදේද යන්න නිර්ණය කිරීම සඳහා බැංකුව විසින් ජා.මු.වා.ප්‍ර. 16 හි ඇතුළත් වන කල්බදු සඳහා වන නිර්වචනය යොදා ගනු ලැබේ.

**බැංකුව කල්බදු ගැණුම්කරුවෙකු ලෙස ක්‍රියා කිරීම.**

බැංකුව විසින් කල්බද්ද ආරම්භ වන දිනයේදී වත්කම භාවිතා කිරීමේ හිමිකමක් හා කල්බදු වගකීමක් හඳුනාගනු ලැබේ. වත්කම භාවිතා කිරීමේ හිමිකම ආරම්භයේදී පිරිවැයට මනිනු ලැබේ. මෙහිදී පිරිවැය ලෙස සලකනුයේ කල්බද්ද ආරම්භ වන දින හෝ ඊට පෙර කරන ලද කල්බදු ගෙවීම් ගලපන ලද ආරම්භක කල්බදු වගකීමට බැංකුව විසින් දරන ලද මූලික සෘජු පිරිවැය හා අදාල කල්බදු ඉඩම් හා කාර්යාල පරිශ්‍රයන් සඳහා කරන ලද නවීකරණයන් ඉවත්කිරීමට අවශ්‍ය වන ඇස්තමේන්තුගත පිරිවැය එකතු කළ විට ලැබෙන අගයයි.

වත්කම භාවිතා කිරීමේ හිමිකම, කල්බද්ද ආරම්භ කළ දිනයේ සිට කල්බදු වාරය අවසන් වන දිනය තෙක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. මීට අමතරව වත්කම භාවිතා කිරීමේ හිමිකමෙන් හානිකරන අලාභ අඩුකරන අතර කල්බදු වගකීමේ නැවත මැනීම් ගැළපීමද සිදුකරනු ලැබේ.

කල්බදු වාරය ආරම්භ කළ දිනට, නොගෙවූ කල් බදු ගෙවීම් වල වර්තමාන වටිනාකමට කල්බදු වගකීම මනිනු ලැබේ. මේ සඳහා කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතිකය භාවිතයෙන් කල්බදු ගෙවීම් වට්ටම් කරනු ලබන අතර එම පොලී අනුපාතිකය නිශ්චය කළ නොහැකි විට ඒ සඳහා බැංකුවේ වර්ධක ණය අනුපාතිකය භාවිතා කරනු ලැබේ.

කල්බදු වගකීම් මැනීමේදී පහත සඳහන් කල්බදු ගෙවීම් සලකා බලනු ලැබේ.

- ප්‍රධාන ස්ථාවර ගෙවීම් ඇතුළත් වන ස්ථාවර ගෙවීම්;
- දර්ශකයක් හෝ අනුපාතිකයක් මත රඳා පවතින, කල්බද්ද ආරම්භක දිනට දර්ශකයක් හෝ අනුපාතිකයක් භාවිතයෙන් මනිනු ලැබූ විචල්‍ය කල්බදු ගෙවීම්;
- අවශේෂ වටිනාකම සහතික කිරීම් යටතේ බැංකුව විසින් ගෙවීමට අපේක්ෂා කරන අගය; හා
- බැංකුව විසින් මිලදී ගැනීමේ විකල්පයක් ක්‍රියාත්මක කිරීම සාධාරණ පමණින් නිශ්චිත නම් එම විකල්පය ක්‍රියාත්මක කිරීමේ මිල, බැංකුව විසින් කල්බදු වාරය දීර්ඝ කිරීමේ විකල්පයක් ක්‍රියාත්මක කිරීම සාධාරණ පමණින් නිශ්චිත නම් එම දීර්ඝ කිරීමට අපේක්ෂිත කාලය තුළදී ගෙවීමට අපේක්ෂිත කල්බදු ගෙවීම් හා කල්බදු වාරය අවසන් වීමට පෙර බැංකුව විසින් කල්බද්ද අවසන් කිරීමට ක්‍රියාත්මක වේ නම් ඒ සඳහා අදාල වන දඩ ගෙවීම්.

කල්බදු වගකීම සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ. එනමුදු යම් දර්ශකයක හෝ අනුපාතිකයක වෙනස්වීමක් මත වන අනාගත කල්බදු වාරිකවල වන වෙනසක්, අවශේෂ වටිනාකම සහතික කිරීම යටතේ බැංකුව විසින් ගෙවීමට අපේක්ෂිත අගයේ සිදුවන වෙනසක්, කල්බදු වාරය දීර්ඝ කිරීමේ විකල්පයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ බැංකුවේ අදහස වෙනස්වීමක්, කල්බදු වාරය අවසන් වීමට පෙර කල්බද්දක් අවසන් කිරීම වෙනුවෙන් බැංකුව විසින් ගෙවිය යුතු දඩයක් හා ප්‍රධාන ස්ථාවර ගෙවීම්වල සිදුවන වෙනස්වීම් හේතුවෙන් කල් බදු වගකීම් නැවත මැනීමට සිදු වේ.

ඉහත අයුරින් නැවත මනින ලද කල්බදු වගකීමෙහි වන වෙනස්වීම අදාළ වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ධාරණ අගයට ගලපනු ලැබේ. අදාල වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ධාරණ අගය ශුන්‍ය වේ නම් එම කල්බදු වගකීමෙහි වෙනස් වීම ආදායම් ප්‍රකාශයට ගලපනු ලැබේ.

බැංකුව විසින් වත්කම භාවිතා කිරීමේ හිමිකම හා කල්බදු වගකීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි පිළිවෙලින් දේපල, පිරියත හා උපකරණ (සටහන 20) හා විවිධ බැරකම් හා උපචිතයන් (සටහන 33) තුළ දක්වා ඇත.

**2019 ජනවාරි 1 ට පෙර යොදාගත් ප්‍රතිපත්ති**

2019 ජනවාරි 1 දිනට පෙර ඇතුළත් වූ ගිවිසුම් හෝ එකඟතාවල කල්බද්දක් ඇතුළත් වේ ද යන්න තක්සේරු කිරීම.

- අදාළ එකඟවීම නිශ්චිත වත්කමක් හෝ වත්කම් මත පදනම් වීම හා
- වත්කම් භාවිතා කිරීමේ හිමිකම අදාළ එකඟවීම මගින් පවරාදීම යන කරුණු මත පදනම් වේ.

**බැංකුව කල්බදු ගැණුම්කරුවෙකු ලෙස ක්‍රියා කරන විට.**

බැංකුව ජා.ගි.ප්‍ර. 17 යටතේ කිසිදු මූල්‍ය කල්බද්දක් වර්ගීකරණය කොට නොතිබුණි.

අනෙකුත් කල්බදු යටතේ තිබූ වත්කම්, මෙහෙයුම් කල්බදු යටතේ වර්ගීකරණය කොට තිබූ අතර ඒවා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ හඳුනාගෙන නොතිබුණි. අදාළ මෙහෙයුම් කල්බදු සඳහා ගෙවන ලද කල්බදු වාරික සරල මාර්ග ක්‍රමය යටතේ ආදායම් ප්‍රකාශය තුළ කල්බදු කාලසීමාව තුළ හඳුනාගනු ලැබීය. බැංකුවට ලද කල්බදු සහන මුළු කල්බදු වියදමේ ඇතුළත් අයිතමයක් ලෙස කල්බදු කාලසීමාව තුළ හඳුනාගන්නා ලදී.

### 5.23 අස්පෘශ්‍ය වත්කම්

පරිගණක දෘඩාංගවල සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග, අස්පෘෂ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මෙම අස්පෘෂ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අඩුකළ ධාරණ අගයකට පවත්වා ගෙන යනු ලැබේ.

මෘදුකාංග වත්කම් සඳහා පසුකාලීනව ඇතිවන වියදම් ප්‍රාග්ධනීකරණය කරන්නේ එමගින් ඊට අදාල නිශ්චිත වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළ යන්නේ නම් පමණි. අනෙකුත් සියලු වියදම් දරන ලද අවස්ථාවේදී ම වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ අපේක්ෂිත පරිභෝජන රටාව මැනවින් පිළිබිඹු වන බැවින් අදාල වත්කම පාවිච්චිය සඳහා සූදානම් දිනයේ සිට වසර 4ක එලදායී ජීව කාලයක් තුළ ඍජු පදනමක් යටතේ ක්‍රමයෙන් ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

### 5.24 අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම් අපේක්ෂිත උපලබ්ධි වටිනාකමට පවත්වාගෙන යනු ලැබේ.

### 5.25 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට භාජනය වීමේ සලකුණු දක්වන්නේ නම් හෝ පවත්නා සිද්ධීන් හෝ වෙනත් තත්ත්වයක් හේතුවෙන් ධාරණ අගය හානි විය හැකි බව පෙන්නුම් කරන්නේ නම් බැංකුව විසින් ඒවා එක් එක් වාර්තා කිරීමේ දිනයේ දී සමාලෝචනය කරනු ලැබේ. එවැනි ඉගියක් පවතී නම්, බැංකුව විසින් වත්කමෙන් අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය අයකරගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණය වූ ලෙස සලකා, අයකර ගත හැකි වටිනාකමට ගිණුම් තබනු ලැබේ. හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

### 5.26 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇතිවිටෙක දී වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍යවීමත්, එම වගකීම පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීමත් මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූර්ණය කිරීමට බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූර්ණය නිසැකවම තහවුරු වන්නා වූ අවස්ථාවලදී, එය වෙන ම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

### 5.27 සංසරණයේ පවතින මුදල්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයේ පවතින මුදල් සඳහා බැරකම, ඒවායේ මුහුණත වටිනාකම මත මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

### 5.28 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනාක්‍රම

බැංකුව විසින් මෙහෙයවනු ලබන විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම 34 වැනි සටහනෙහි හෙළිදරව් කර ඇත.

### 5.29 නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම

නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රමයන් යනු නිශ්චිත දායක යෝජනා ක්‍රමයක් නොවන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි.

බැංකුව විසින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම පවත්වා ගෙන යනු ලබයි. ඉන් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන පළමු යෝජනා ක්‍රම 3 ට බැංකුව සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකීය බැර ආයුගණන ක්‍රමයක් මත එක් එක් යෝජනා ක්‍රමයට වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ.

එක් එක් නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා බැංකුවේ බැඳීම් වෙන වෙනම ගණනය කරන අතර එහිදී සේවා නියුක්තිකයින්ගේ වර්තමාන හා පෙර කාලසීමාවන් හි සපයන ලද සේවාවන්ට ඉපැයූ ප්‍රතිලාභවල අනාගත ප්‍රතිලාභ වටිනාකම ඇස්තමේන්තු කිරීමේදී ප්‍රතිලාභ වට්ටම් කර එහි වර්තමාන අගය තීරණය කරයි. මෙහිදී හඳුනානොගත් අතීත සේවා පිරිවැය සහ යෝජනා ක්‍රමයේ වත්කම්වල සාධාරණ අගය අඩුකරනු ලැබේ. වට්ටම් අනුපාතය වනුයේ ඉදිරියට ඇති සේවා කාලයේ සාමාන්‍යයට ආසන්න කල්පිරීම් දිනයන් සහිත රජයේ බැඳුම්කර තක්සේරු දිනට ඉපැයීම් අනුපාතයයි. සටහන් අංක 34 හි හෙළිදරව් කල සියළුම ප්‍රධාන ආයුගණන උපකල්පන, සම්පූර්ණ ආයුගණන තක්සේරුවක් කල අවස්ථාවකදී පමණක් සංශෝධනය කරනු ලැබේ.

### 5.30 නිශ්චිත දායක යෝජනා ක්‍රම

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකමක් ලැබේ. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදලේ නිශ්චිත දායක සැලසුම් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

නිශ්චිත දායක යෝජනා ක්‍රමයේ දායකත්ව වගකීම් ඒවා පැන නගින අවස්ථාවන්හිදී ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනී.

**5.31 ප්‍රදානයන්**

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇතිවිට ඒවා හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානයන් වියදම් විෂයකට අදාල වන අවස්ථාවක දී වියදමට සරිලන කාල පරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත එය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදානයක් වත්කමට අදාල වන අවස්ථාවක දී එහි සාධාරණ අගය රජයේ විලම්භීත ප්‍රදාන ගිණුමකට බැරකර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ ආදායම් ප්‍රකාශනයට මුදාහරිනු ලැබේ.

**5.32 අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්**

ආර්ථික ප්‍රතිලාභ මාරුවීම නිශ්චිත නොවන හෝ විශ්වසනීය ලෙස අගය කළ නොහැකි සිදුවීමක් හෝ වර්තමාන බැඳීමක් මගින් පමණක් පැවැත්ම තහවුරු කෙරෙන පැන නැගිය හැකි බැඳීමක් අසම්භාව්‍ය වගකීමක් ලෙස හැඳින්වේ. ණය ගැතිකම් සහතිකවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් සියල්ල මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනා නොගන්නා අතර අදාල ශීර්ෂ යටතේ අසම්භාව්‍ය වගකීම් හා බැඳීම් අයිතම ලෙස හෙලිදරව්කර ඇත. අවශ්‍යවන අවස්ථාවන්හිදී මෙම ප්‍රමාණ වඩාත් උචිත ඇස්තමේන්තු අනුව මිනුම් කර ඇත.

**ආදායම් ප්‍රකාශය සහ විස්තීරණ ආදායම් ප්‍රකාශය**

**5.33 ආදායම සහ වියදම**

බැංකුව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ හැකියාව සහ ආදායම නිසැකව ම මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම්ගත කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදායම අතර සෘජු සම්බන්ධතාවය පදනම් කරගෙන ආදායම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත, උපකරණ කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීම පිණිස ආදායමට එරෙහිව සටහන් කර ඇත.

ආදායම් හා වියදම් හඳුනාගැනීමට පෙර පහත දැක්වෙන ගිණුම්ගත කිරීම් හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලිය යුතුය.

**5.33.1 පොළී ආදායම් සහ වියදම්**

පොළිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම්, මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව, සඵල ඵලදායිත්ව ක්‍රමයට, උපචිත පදනම මත පොළී ආදායම සහ වියදම, ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදායම් ආයෝජන, සුරැකුම්පත් මත උපයන කූපන්, භාණ්ඩාගාර බිල්පත්, අනිකුත් වට්ටම් උපකරණ මත උපචිත වට්ටම් සහ අධිමිල පොළී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවල දී පොළී ආදායම අත්හිටුවන අතර, ඒවා ලැබෙනතුරු පොළී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

**5.33.2 ලාභාංශ**

ලාභාංශ ආදායම කොටස්හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

**5.33.3 විවිධ**

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීමේදී උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, වත්කම් ධාරණ අගය සහ විකුණුම් වියදම්, බැහැර කිරීමේදී දරණ ලද වියදම් අඩුකොට ආදායම් ප්‍රකාශනයෙහි ගිණුම්ගත කර ඇත. ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකරකම්වලට අනුෂාංගික ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතුකොට ශුද්ධ පදනම මත වාර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

**5.33.4 සේවක මණ්ඩල වියදම්**

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම්, අනිකුත් දේශීයව ගෙවිය යුතු ශේෂයන් යටතේ දක්වනු ලැබේ.

**5.33.5 ආදායම් බදු වියදම**

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 118 වගන්තිය, 2006 අංක 10 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනතේ 7 බී (xvi) වගන්තිය සහ 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව බැංකුවේ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වේ. 2017 අංක 7 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත අනුව 2017 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකුව විසින් ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වේ. එහෙත් 2018 අංක 33 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත අනුව 2018 ඔක්තෝබර් මස සිට උපලබ්ධි නොවූ ලාභ සහ විදේශ මූල්‍ය වත්කම්වල මිල වෙනස්වීමෙන් වන උපලබ්ධි නොවූ ලාභ ආර්ථික සේවා ගාස්තුවලින් නිදහස් වේ. තවද 2013 අංක 17 දරණ එකතු කල අගය මත බදු (සංශෝධිත) පනත යටතේ මූල්‍ය සේවා සැපයීම මත එකතු කල අගය මත බද්දෙන් බැංකුව නිදහස් වේ.

**5.34 වාර්තාකරණ කාලපරිච්ඡේදටය පසු සිද්ධීන්**

වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදු වූ සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට ගෙන අදාල පරිදි, මූල්‍ය ප්‍රකාශයන්හි නියමිත සටහන් තුළ සංශෝධන හෝ හෙළිදරව් කිරීම් ලෙස දක්වා ඇත.

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ජා.මූ.ප්‍ර. 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශන සමග අනුකූලව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීම සඳහා වන “සෘජු ක්‍රමය” භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා ඉහත නිර්වචනය කර ඇති පරිදි මුදල් හා මුදල් සමානයන් යන්නට මුදල්/ගෙවීම් නියෝග ශුද්ධ ගලායාම් ඇතුලත් වේ.

**6. ප්‍රකාශිත නමුත් වාර්තා කරන දිනට බල සහිත නොවූ ප්‍රමිතීන්**

2020 ජනවාරි 01 වන දිනට පසු එළඹෙන වාර්ෂික කාලපරිච්ඡේදවලට බලාත්මක වන පරිදි FASB විසින් පහත ප්‍රමිත හා ඒ හා බැඳුනු නිර්වචනයන් නිකුත් කර ඇත.

කෙසේ වෙතත් පහත දක්වා ඇති සංශෝධිත ප්‍රමිත බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි බැංකුව බලාපොරොත්තු නොවේ.

- ජා.මූ.වා. ප්‍රමිතවල සංකල්පීය රාමුවට කරන ලද සංශෝධන
- "ව්‍යාපාරය" නිර්වචනය (ජා.මූ.වා.ප්‍ර. 3 ට වන සංශෝධන)
- ජා.මූ.වා.ප්‍ර. 17 - රක්ෂණ ගිවිසුම්

**7. ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය**

**7.1 විදේශීය මුදල් ක්‍රියාකාරකම්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ජනිත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ, විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳ කටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වර්ගවලින් පවත්වා ගනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ඔස්ට්‍රේලියානු ඩොලර්, යුරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපන් යෙන් සහ නවසීලන්ත ඩොලර් වලින් පවතී.

මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් ස්වෛරී සුරැකුම්පත්, ප්‍රතිවිකුණුම් ගනුදෙනු යටතේ රඳවා ගත් සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන සමඟ පවත්නා වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම්වලින් උද්ගත වන්නා වූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

**7.2 දේශීය මුදල් ක්‍රියාකාරකම්**

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ.

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම්/ගලාඒම් හිලව් කරනු ලැබේ. මෙම කටයුතු බොහොමයක් දෛනික විවට වෙළෙඳපොළ මෙහෙයුම් මගින් සිදුකරනු ලැබේ.

(ii) විවෘත වෙළෙඳපොළ කටයුතු සඳහා ආධාරකයක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් සමන්විත ආයෝජන කළඹක් බැංකුව පවත්වා ගනී. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

**7.3 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්**

භාරකාරත්ව සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන අගයන්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංගයන්ට අයත් කොටසක් නොවන බැවින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් කර නොමැත.

**8. සංක්‍රාන්ති හෙළිදරව් කිරීම**

ජා.මූ.වා.ප්‍ර. 16 ට පළමු වරට අනුගත වීමේදී බැංකුව විසින් අතිරේක වත්කම් භාවිතා කිරීමේ හිමිකම් හා අතිරේක කල්බදු වගකීම් හඳුනාගන්නා ලදී. ඒවායේ ප්‍රමාණාත්මක වටිනාකම පහතින් සාරාංශ කර ඇත.

| | 2019 ජනවාරි 01 දිනට ශේෂය රු. 000 |
|---|---|
| දේපල, පිරියත හා උපකරණ තුළ පෙන්වා ඇති වත්කම් භාවිතා කිරීමේ හිමිකම | **66,287** |
| කල්බදු වගකීම | **47,411** |

මෙහෙයුම් කල්බදු ලෙස වර්ග කර තිබූ කල්බදුවල, කල්බදු වගකීම නිර්ණය කිරීමට බැංකුව විසින් ඉදිරියේදී ගෙවිය යුතු කල්බදු ගෙවීම්, එම කල්බදුවල, කල්බදු කාලපරිච්ඡේදයට සමාන කල්පිරීමේ කාලයක් සහිත භාණ්ඩාගාර බැඳුම්කරයකට 2019 ජනවාරි 1 දින තිබූ ගැණුම් එළදා අනුපාතිකය භාවිතයෙන් වට්ටම් කරන ලදී. බැංකුවේ කල්බදු සඳහා ගම්‍ය පොලී අනුපාතිකයක් හෝ බැංකුව සඳහා වර්ධක ණය ගැණුම් අනුපාතිකයක් නොතිබීම නිසා භාණ්ඩාගාර බැඳුම්කරයක එළදා අනුපාතිකය මෙහිදී භාවිතා කරන ලදී.

| | 2019 ජනවාරි 01 දිනට ශේෂය රු. 000 |
|---|---|
| ජා.ගි.ප්‍ර. 17 ට අනුකූලව 2018 දෙසැම්බර් 31 දිනට වන මෙහෙයුම් කල්බදු වගකීම | **145,540** |
| 2019 ජනවාරි 1 දිනට පැවැති භාණ්ඩාගාර බැඳුම්කරයක ගැණුම් එළදා අනුපාතිකය භාවිතයෙන් වට්ටම් කළ විට | **47,411** |
| 2019 ජනවාරි 1 දින හඳුනාගත් කල්බදු වගකීම | **47,411** |

**9. මුදල් සහ මුදල් සමානයන්**

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| බැංකු සමග ඇති ශේෂයන් | **278,004,505** | 117,035,257 |
| බැංකු සමග ඇති කාලීන තැන්පතු | **79,519,728** | 92,862,673 |
| එක්දින ස්ථාපනය කිරීම් | **63,353,939** | 162,300,186 |
| මුදල් සහ මුදල් සමානයන් සඳහා ලැබිය යුතු පොලී | **53,255** | 48,624 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මුදල් සහ මුදල් සමානයන් | **420,931,427** | 372,246,740 |
| අඩුකළා: මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 9.1) | **(221,958)** | (71,564) |
| **එකතුව** | **420,709,469** | 372,175,176 |

**9.1 මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභයන්ගේ චලනය**

| | 2019 | | | 2018 |
|---|---|---|---|---|
| | අදියර I රු. 000 | අදියර II රු. 000 | එකතුව රු. 000 | අදියර I රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **71,564** | **-** | **71,564** | - |
| ජා.මු.වා.ප්‍ර. 9 පළමු වරට යොදාගැනීමේ ගැලපීම | - | - | - | 50,505 |
| ජනවාරි 01 දිනට ගැලපුම් කළ ශේෂය | **71,564** | **-** | **71,564** | 50,505 |
| වර්ෂය සඳහා අය කිරීම | **147,767** | **2,627** | **150,394** | 21,059 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **219,331** | **2,627** | **221,958** | 71,564 |

**10. විදේශීය සුරැකුම්පත්වල අයෝජනයන්**

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | | |
| - විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන් (සටහන 10.1) | **38,493,268** | 37,467,239 |
| | **38,493,268** | 37,467,239 |
| **අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්** | | |
| - විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන් | **729,801,009** | 694,876,394 |
| | **729,801,009** | 694,876,394 |
| **විදේශ සුරැකුම්පත් ආයෝජනවල එකතුව** | **768,294,277** | 732,343,633 |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 10.2) | **100,894** | 63,649 |

**10.1** ලාභ හෝ පාඩුව තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද විදේශීය සුරැකුම්පත් ආයෝජන තුළ ශ්‍රී ලංකා මහ බැංකුව, ලෝක බැංකුව මගින් පාලනය කරනු ලබන සංචිත කළමනාකරණය සහ උපදේශන වැඩසටහන (RAMP)හි කරන ලද ආයෝජන ඇතුළත් වේ. එම RAMP ආයෝජනයේ 2019 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.මි. 38,493.27 වේ (2018 - රු.මි. 37,467.24).

**10.2 වෙනත් විස්තීරණ අදායම් තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභවල චලනය**

| | 2019 | | | 2018 |
|---|---|---|---|---|
| | අදියර I රු. 000 | අදියර II රු. 000 | එකතුව රු. 000 | අදියර I රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **63,649** | **-** | **63,649** | - |
| ජා.මු.වා.ප්‍ර. 9 පළමු වරට යොදාගැනීමේ ගැලපීම | - | - | - | 65,588 |
| ජනවාරි 01 දිනට ගැලපුම් කළ ශේෂය | **63,649** | **-** | **63,649** | 65,588 |
| වර්ෂය සඳහා අය කිරීම/ (ආපසු හැරවුම) | **17,610** | **19,635** | **37,245** | (1,939) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **81,259** | **19,635** | **100,894** | 63,649 |

**11. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ**

**11.1** පහත දක්වා ඇති වගුව මගින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් එහි කාල්පනික අගයන් සමග වත්කම් හෝ බැරකම් වශයෙන් වාර්තා කර ඇත. දළ අගයන් වශයෙන් වාර්තා කර ඇති කාල්පනික අගයන් ලෙස හඳුනා ගනුයේ ව්‍යුත්පන්නයට පාදක වූ වත්කමෙහි නිර්දේශ අනුපාතයෙහි හෝ දර්ශකයෙහි අගය වන අතර ව්‍යුත්පන්න උපකරණයන්ගේ අගයන්හි සිදුවන වෙනස්වීම් මිනුම් කිරීමේ පදනම ද වේ. කාලපරිච්ඡේදයේ අවසාන දිනට හිඟව පවතින ගනුදෙණුවල පරිමාව කාල්පනික අගයන්ගෙන් නිරූපණය වන අතර එමගින් වෙළඳපල අවදානම හෝ ණය අවදානම නොහැඟවේ.

| | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | වත්කම් රු. 000 | වගකීම් රු. 000 | කාල්පනික අගය රු. 000 | වත්කම් රු. 000 | වගකීම් රු. 000 | කාල්පනික අගය රු. 000 |
| මුදල් හුවමාරු (Currency SWAPS) | **2,021,917** | **923,039** | **284,757,444** | - | 13,590,145 | 203,257,715 |
| ඉදිරියෙහි වූ හුවමාරු (Forward Forex) | - | - | - | 750 | - | 548,250 |
| අන්තර්ගත ව්‍යුත්පන්න - විනිමය විකල්පයන් (Embedded Derivatives - Currency Options) | - | **66,919** | **3,087,778** | - | 466,315 | 5,299,747 |
| එකතුව | **2,021,917** | **989,958** | **287,845,222** | 750 | 14,056,460 | 209,105,712 |

**11.2** ඉහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සමන්විත වනුයේ මුදල් හුවමාරු, මුදල් විකල්ප, ඉදිරි විදේශ විනිමය ගිවිසුම්, සහ පොලී අනුපාත හුවමාරුවලිනි. මෙවැනි උපකරණ යොදා ගනුයේ බැංකුවේ ව්‍යවස්ථාපිත අරමුණක් වන ජාත්‍යන්තර අරමුදල් පවත්වා ගැනීමේ දී පැන නගින්නා වූ වෙළඳපොල සහ ද්‍රවශීලතා අවදානම්

කළමනාකරණය කිරීම සඳහාය. මීට අමතරව මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ විදේශ මහ බැංකු සමඟ හුවමාරු ගිවිසුම්වලට එළඹීම මගින් ශ්‍රී ලංකා රුපියල අන්තර්ජාතිකව ස්ථාවරව පවත්වා ගැනීමත්, දේශීය මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමත්, විදේශ මුදල් රට තුළට ගෙන ඒමට එම බැංකු දිරිමත් කිරීමත් අපේක්ෂා කෙරේ.

**11.3** ව්‍යුත්පන්නයන් යනු පොලී අනුපාත, මූල්‍ය උපකරණවල වටිනාකම, භාණ්ඩ මිල ගණන්, විදේශ විනිමය අනුපාත, ණය අවදානම් සහ දර්ශක වෙනස්වීම්වලට අනුව අගය තීරණය වන මූල්‍ය ගිවිසුම්ය.

**11.4** විනිමය අනුපාත අවදානම සහ කෙටිකාලීන ද්‍රවශීලතාවය පාලනය කිරීම සඳහා වූ උපායමාර්ග යක් ලෙස එළඹුණු මුදල් හුවමාරු (Currency SWAP) බැංකුවේ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ කළඹයෙහි වැදගත් කොටසක් වශයෙන් අඩංගු වී ඇත. මුදල් හුවමාරුවකදී බැංකුව, නියමිත දින දෙකකදී එක් මුදල් වර්ගයකින් නිශ්චිත ප්‍රමාණයක් තවත් මුදල් වර්ගයක් සමඟ එකඟ වූ අනුපාතයන් යටතේ හුවමාරු කර ගනී.

**11.5** ඉදිරි විදේශ විනිමය ගිවිසුම් මගින් බැංකුව, එකඟ වූ අනුපාතයකට, එකඟ වූ ඉදිරි දිනයකදී නිශ්චිත විදේශ මුදල් ප්‍රමාණයක් මිලදී ගැනීමට හෝ විකිණීමට බැඳී සිටී.

**11.6** සමස්ථ අවදානම් කළමනාකරණයෙහි කොටසක් ලෙස ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් අපේක්ෂිත ප්‍රතිලාභ බැංකුව වෙත ලැබීම තහවුරු කිරීමට, බැංකුව විසින් ව්‍යුත්පන්න ගිවිසුම් වෙත නිරාවරණය වීම සමීප වශයෙන් අධීක්ෂණය කරනු ලබයි.

## 12. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| විශේෂ ගැනුම් හිමිකම් දැරීම (සටහන 12.1) | **1,319,576** | 217,126 |
| ජා.මූ.අ. පංගුව (සටහන 12.2) | **145,156,517** | 146,732,242 |
| ජා.මූ.අ. පංගුව මත ලැබිය යුතු පොළිය | **8,711** | 9,667 |
| ජා.මූ.අ. තැන්පතු (සටහන 12.3) | **189,326** | 199,965 |
| කලින් ගෙවීම් - ජා.මූ.අ. ණය | **485,048** | 268,456 |
| අඩුකළා: ජා.මූ.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 12.4) | **(4)** | (4) |
| | **147,159,174** | 147,427,452 |

### 12.1 විශේෂ ගැනුම් හිමිකම් දැරීම

විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) දැරීම වූ කලී ජා.මූ.අ. සමාජිකයන් හට බාධාවකින් තොරව පාවිච්චි කළ හැකි මුදල් වර්ග සඳහා පවතින විභව්‍ය හිමිකමකි. එනම්, වි.ගැ.හි. දරන්නන් විසින් එම මුදල් සඳහා අනෙකුත් සංචිත මුදල් හුවමාරු කරගත හැකිවීමය. එකී සාමාජිකයන් එම මුදල් වි.ගැ.හි. දැරීමට සහ පිළිගැනීමට බැඳී සිටිම සහ වි.ගැ.හි. පද්ධතියේ මෙහෙයුම්වලට අදාලව විවිධ වගකීම්වලට ගරු කිරීමට බැඳී සිටීම නිසා සංචිත වත්කමක් ලෙස වි.ගැ.හි. විශේෂ වේ. අබාධව පාවිච්චි කළ හැකි මුදල් මත වි.ගැ.හි. වල පවතින හිමිකම දෙයාකාරයකින් ගරු කිරීම ජා.මූ.අ. විසින් තහවුරු කරනු ලැබේ. එනම්, දුර්වල විදේශීය තත්ත්වයන්හි පවතින සාමාජිකයන්ගෙන් වි.හැ.ගි. මිලට ගැනීම සඳහා බලවත් විදේශීය තත්ත්වයන් පවත්නා සාමාජිකයන් නම් කිරීම මගින් සහ කළමනාකරණය කළ වෙළෙඳපොළක් තුළ සාමාජිකයන් අතර, ස්වෙච්ඡා හුවමාරු කිරීම මගින් ය. අදාළ වාර්තාකරණ දිනයේ දී බැංකුව විසින් දරන ලද මුළු ප්‍රමාණය ඉහත සංඛ්‍යාවන්ගෙන් දැක්වේ.

### 12.2 ජා.මූ.අ. පංගුව

ජා.මූ.අ. හි වත්කම් වල ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ එහි සාමාජික රටවලින් ලබා ගන්නා ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් පංගුව හෙවත් ප්‍රග්ධන දායකත්වයයි. එක් එක් රටවල පංගුව, පුළුල් වශයෙන්, එම රටෙහි සාපේක්ෂ ආර්ථික වටිනාකම පදනම් කර ගනිමින් තීරණය කරනු ලබයි. ජා.මූ.අරමුදලෙහි සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු තම පංගුවෙන් 25%ක ප්‍රමාණයක් පුළුල්ව පිළිගත් විදේශ මුදලකින් හෝ විශේෂ ගැනුම් හිමිකම මගින්ද ඉතිරි 75%ක මුදල එම රටෙහි දේශිය මුදලින්ද ගෙවිය යුතුය. ජා.මූ. අරමුදලේ කොන්දේසිවලට අනුව රජය වෙනුවෙන් බැංකුව සිය ගිණුමෙන්ම ගනුදෙනු සිදුකරනු ලබන හෙයින් ජා.මූ.අ. පංගුව බැංකුවේ වත්කමක් ලෙස නියෝජනය වේ.

ජා.මූ අරමුදලේ පොදු පංගු සමාලෝචන ගිවිසුම යටතේ, 2016 ජනවාරි මස දී 189ක් වූ ජා.මූ.අ සාමාජිකයන්ගේ පංගුව වැඩි කිරීමට තීරණය කරන ලදී.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ජා.මූ.අ. පංගුව වි.ගැ.හි. මිලියන 413.40 ක් වූ පෙර පංගු ප්‍රමාණයේ සිට 2016 පෙබරවාරි 17 වන දිනට වි.ගැ.හි. මිලියන 578.80 දක්වා වර්ධනය විය.

ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල 24 වන සටහනේ පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත. සාමාජික පංගුව මගින් ජා.මූ.අ. සමඟ රටක පවතින මූල්‍යමය සහ සංවිධානාත්මක සම්බන්ධතාවය තහවුරුකරනු ලබන අතර පහත පහසුකම් ද මේ සඳහා ඇතුළත් වේ.

**i.)** **දායකය** - ජා.මූ.අ. වෙත සාමාජිකයකුගේ දායකය සාමාජිකයාගේ පංගුවට සමාන වේ. එමගින් සාමාජිකයා විසින් ජා.මූ.අ. වෙත ලබාදීමට බැඳී ඇති උපරිම මූල්‍ය සම්පත් ප්‍රමාණය නිශ්චය කරනු ලැබේ. සාමාජිකයකු විසින් දායකය සම්පූර්ණයෙන් ම ගෙවිය යුතු අතර, සියයට 25 ක් ජා.මූ.අ. විසින් නියම කරනු ලබන සංචිත වත්කම්වලින් (වි.ගැ.හි. හෝ පාවිච්චි කළ හැකි මුදල්) ගෙවිය යුතුය. ඉතිරි ප්‍රමාණය සාමාජිකයාගේ ව්‍යවහාර මුදලින් ගෙවිය යුතුය.

**ii.)** **ඡන්දය දීමේ බලතල** - ජා.මූ.අ. තීරණවලදී සාමාජිකයාගේ ඡන්දය දීමේ බලතල පංගුව මගින් නිර්වචනය වේ. එක් එක් ජා.මූ.අ. සාමාජිකයාට මූලික ඡන්දයක් ද පංගුවෙහි සෑම වි.ගැ.හි. 100,000 ක් සඳහා එක් අතිරේක ඡන්දයක් ද බැගින් හිමි වේ. 2008 ප්‍රතිසංස්කරණ මගින් මූලික ඡන්ද සංඛ්‍යාව මුළු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 5.50 ක් ලෙස ස්ථාවර කරන ලදී.

**iii.)** **මූල්‍යකරණයට පිවිසීම** - ජා.මූ.අ. මගින් සාමාජිකයෙකුට ලබාගත හැකි මූල්‍ය පහසුකම් ප්‍රමාණය (එහි පිවිසීමේ සීමා) සාමාජිකයාගේ පංගුව මත තීරණය වේ. සම්පස්ථ සහ ව්‍යාප්ත කළ සැලසුම් ප්‍රකාර සාමාජිකයෙකුට වාර්ෂිකව පංගුවෙන් සියයට 145 ක් ද සමුච්චිත වශයෙන් සියයට 435 ක් ද දක්වා ණය ලබාගත හැකිය. අසාමාන්‍ය අවස්ථාවකදී ප්‍රවේශය මීට වැඩිවිය හැකිය.

**iv.)** **වි.ගැ.හි. වෙන්කිරීම්** - සාමාජිකයන්ගේ පංගුවලට සමානුපාතිකව ඔවුන්ගේ වි.ගැ.හි. වෙන්කිරීම් ප්‍රමාණය නියම කරනු ලැබේ.

### 12.3 ජා.මූ. අරමුදලේ තැන්පතු - දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම - (PRGF - HIPC) භාර තැන්පතුව

දැඩි ණයගැති භාවයට පත්වී සිටින රටවල් වෙනුවෙන් දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම (PRGF - HIPC) වෙනුවෙන්, 2000 අප්‍රේල් 21 වන දින, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන (පරිපාලිත -Administered) වි.ගැ.හි. 788,783 ක ශේෂයකින් යුත් විශේෂ විලම්භිත ගිණුම (SCA 2) පැවරීමෙන් අරඹන ලදී. මෙම ගිණුම අරඹන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මග පෙන්වීම මත SCA 2 ගිණුම වසා දැමීමට තීරණය කිරීමේ දී SCA 2 ගිණුමෙහි පැවැති ශේෂය මාරු කිරීමෙනි.

මෙම ගිණුමෙහි ශේෂයන් ඇති රටවලින් ජා.මූ.අ. පහත දැක්වෙන ඉල්ලීම් කරන ලදී. උක්ත ගිණුමෙහි සඳහන් ශේෂයන් (PRGF-HIPC) භාර ගිණුම වෙත ප්‍රතිපාදන කිරීම කළ යුත්තේ එකවර දෙනු ලබන පැවැරුමක් ලෙසින් හෝ සහනාධාරයක් ලෙසිනි. මෙය PRGF-HIPC ණය වෙනුවෙන් සපයා දිය යුතුය. ඒ අනුව SCA 2 ගිණුමේ ශේෂය PRGF-HIPC භාර ගිණුම වෙත පවරා දීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. මෙය පවරා දෙනු ලබන්නේ එකවර මුදාහරිනු ලබන සහනාධාරයක් ලෙසින් නොව 2018 වසර දක්වා බල පැවැත්වෙන පොළී රහිත තැන්පතුවක් වශයෙනි. පසුව මෙය 2024 දක්වා දීර්ඝ කරන ලදී.

### 12.4 ජා.මූ.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| අදියර 1 | | |
| ජනවාරි 1 දිනට ශේෂය | **4** | - |
| ජා.මූ.වා.ප්‍ර. 9 පළමු වරට යොදාගැනීමේ ගැලපීම | - | 3 |
| ජනවාරි 01 දිනට ගැලපුම් කළ ශේෂය | **4** | 3 |
| වර්ෂය සඳහා අයකිරීම් | - | 1 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **4** | 4 |

### 13. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

මුදල් ප්‍රතිපත්ති යටතේ විවට වෙළෙඳපොළ කටයුතු පවත්වාගෙන යාම සඳහා මුදල් නීති පනතේ 90(2) වගන්තිය අනුව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලබාගත් සහ පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සුරැකුම්පත් කළඹ මේ යටතට ගැනේ.

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | **25,125,790** | 43,443,802 |
| භාණ්ඩාගාර බැඳුම්කර | **50,177,084** | 1,542,796 |
| ලැබිය යුතු පොළී | **1,209,009** | 44,559 |
| | **76,511,883** | 45,031,157 |

### 14. ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් | **50,275,000** | 229,333,000 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් මත ලැබිය යුතු පොළී | **79,879** | 121,409 |
| | **50,354,879** | 229,454,409 |

### 15. රජයට දෙන ලද කාලීන අත්තිකාරම්

රජයේ ඒකාබද්ධ අරමුදලින් දැරීම සඳහා අවසර ලබාදී ඇති වියදම් මූල්‍යනය සඳහා වූ නියමයන්හි සඳහන් කර ඇති තත්ත්වයන්ට යටත්ව මුදල් නීති පනතේ 89 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජයට ලබාදෙන අත්තිකාරම් මෙමගින් නියෝජනය කරයි.

### 16. මූල්‍ය සහ අනිකුත් ආයතන වල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන

මුදල් නීති පනතේ 105 (අ) වගන්තිය යටතේ මෙම ආයෝජන සිදු කරනු ලබයි. මෙය යටතේ මුදල් මණ්ඩලයේ අභිමතය පරිදි බැංකු සහ මූල්‍ය අංශයේ මානව සම්පත් සහ තාක්ෂණික සංවර්ධනය, දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවල ගනුදෙනු නිශ්කාෂණය කිරීම පහසු කිරීම සඳහා පිහිටුවන ලද සමාගමක කොටස් අත්පත්කර ගැනීමට බැංකුව වෙත බලතල පවරා තිබේ.

**16.1 ආයෝජන තත්ත්වය**

| ආයතනය | ව්‍යාපාර කටයුතුවල ස්වභාවය | 2019 කොටස් ගණන | 2019 ධාරණ අගය රු.000 | 2018 කොටස් ගණන | 2018 ධාරණ අගය රු.000 |
|---|---|---|---|---|---|
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය | **2,950,000** | 498,268 | **2,950,000** | 417,128 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | ස්වයංක්‍රීය අරමුදල් හුවමාරුව | **500,000** | 81 | **225,000** | 1,396 |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | ණය තොරතුරු සම්පාදනය | **48,244** | 1,002,138 | **48,244** | 963,355 |
| | | | 1,500,487 | | 1,381,879 |

**16.2** ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්කන්ධ ආයෝජන 2019 දෙසැම්බර් 31 දිනට පැවති සාධාරණ අගයට වාර්තා කර ඇත. එම ආයෝජිත සමාගම්වල සාධාරණ අගය, බැංකුවේ මූල්‍ය වාර්තා පිළියෙළ කරන දිනට ආයෝජිත සමාගම් විසින් හෙළිදරව් කරන ලද විගණනය නොකල නවතම මූල්‍ය වාර්තාවල සඳහන් කොටසකට ශුද්ධ වත්කම් අගය අනුව ගණනය කරනු ලැබේ. ඒ අනුව ආයෝජිත සමාගම්වල පහත දැක්වෙන දිනයන්ට පැවති කොටසකට ශුද්ධ වත්කම් අගය ඉහත ගණනයට භාවිතා කරන ලදී.

| | |
|---|---|
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | - 2019 දෙසැම්බර් 31 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | - 2019 නොවැම්බර් 30 |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | - 2019 දෙසැම්බර් 31 |

**17. අනිකුත් වත්කම්**

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | |
| අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | **10,180,258** | 7,955,537 |
| අඩුකළා: වත්කම් මත හානිකරණ වෙන්කිරීම් (සටහන 17.1) | **(190,908)** | (163,144) |
| ශුද්ධ අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | **9,989,350** | 7,792,393 |
| බැංකුවලට දෙන ලද ණය (සටහන 17.2) | **39,324** | 96,117 |
| බැංකුවලට ලබාදුන් ණය මත අපේක්ෂිත ණය අලාභ (සටහන 17.3) | **(35)** | (154) |
| | **39,289** | 95,963 |
| ක්‍රමක්ෂය පිරිවැයට කාර්ය මණ්ඩල ණය | **5,447,883** | 5,780,754 |
| භාණ්ඩාගාර සහ අනෙකුත් අමාත්‍යංශ වලින් ලැබිය යුතු දෑ | **11,763** | 18,785 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | **56,615** | 126,086 |
| | **5,516,261** | 5,925,625 |
| **මූල්‍ය නොවන වත්කම්** | **15,544,900** | 13,813,981 |
| කාර්ය මණ්ඩල ණය මත වූ විලම්භිත වත්කම් | **2,056,847** | 1,065,287 |
| | **17,601,747** | 14,783,305 |

**17.1 වත්කම් මත හානිකරණ ගාස්තුවල චලනය**

| | 2019 අදියර 1 රු. 000 | 2019 අදියර 2 රු. 000 | 2019 අදියර 3 රු. 000 | 2019 එකතුව රු. 000 | 2018 අදියර 1 රු. 000 | 2018 අදියර 3 රු. 000 | 2018 එකතුව රු. 000 |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | **92** | **-** | **163,052** | **163,144** | - | 151,674 | 151,674 |
| ජා.මු.වා.ප්‍ර. 9 පළමු වරට යොදාගැනීමේ ගැලපීම | - | - | - | - | 8 | - | 8 |
| ජනවාරි 01 දිනට ගැලපුම් කළ ශේෂය | **92** | **-** | **163,052** | **163,144** | 8 | 151,674 | 151,682 |
| වර්ෂය සඳහා අයකිරීම් | **15,525** | **16** | **12,223** | **27,764** | 84 | 11,378 | 11,462 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **15,617** | **16** | **175,275** | **190,908** | **92** | **163,052** | **163,144** |

**17.2. බැංකුවලට දෙන ලද ණය**

මුදල් නීති පනතේ 5 වන පරිච්ඡේදයේ III (අ) කොටසට අනුව ළලදායීතා කටයුතු සඳහා ලබාදෙනු ලබන ණය වේ.

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| **මධ්‍යම සහ දිගුකාලීන ණය යෝජනා ක්‍රමය** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **24,757** | 26,951 |
| **සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **-** | 13,122 |
| - අනෙකුත් | **-** | 8,345 |
| **නැගෙනහිර ආර්ථික කටයුතු නැවත නඟා සිටුවීම (අදියර III)** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **50** | 12,358 |
| - අනෙකුත් | - | 16,403 |
| **උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **14,517** | 18,830 |
| **පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය (අදියර II)** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | - | 108 |
| | **39,324** | 96,117 |

**17.3 බැංකුවලට ලබා දුන් ණය මත අපේක්ෂිත ණය අලාභවල චලනය**

| | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | අදියර 1 | අදියර 2 | එකතුව | අදියර 1 | අදියර 2 | එකතුව |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | 15 | 139 | 154 | - | - | - |
| ජා.මු.වා.ප්‍ර. 9 පළමු වරට යොදාගැනීමේ ගැලපීම (සටහන 8.2.2) | - | - | - | 26 | 616 | 642 |
| ජනවාරි 01 දිනට ගැලපුම් කළ ශේෂය | 15 | 139 | 154 | 26 | 616 | 642 |
| වර්ෂය තුළදී ආපසු හැරවුම් | (15) | (104) | (119) | (11) | (477) | (488) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** | **35** | **35** | **15** | **139** | **154** |

## 18. රන්

මුදල් නීති පනතේ 67(1) සහ 67(2) වගන්ති ප්‍රකාරව බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස බැංකුව සතුව ඇති රන්වල වටිනාකම මෙයින් අදහස් වේ. තවද මුදල් නීති පනතේ වගන්ති 67(2) ප්‍රකාරව, අවම වශයෙන් රන් න්‍යෂ්ටික සංචිතයක් ලෙසින් හෝ රන්වලට නිදහසේ ඍජුව හෝ වක්‍රව පරිවර්ථනය කළ හැකි විනිමයක් ලෙසින් පවත්වාගැනීමට මුදල් මණ්ඩලයට සිදු වේ.

## 19. තොග

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| සංසරණය සඳහා ඇති නෝට්ටු | **2,912,568** | 2,495,222 |
| සංසරණය සඳහා ඇති කාසි | **4,028,748** | 2,194,055 |
| මාර්ගස්ථ කාසි | - | 613,432 |
| මාර්ගස්ථ නෝට්ටු | **345,954** | 1,253,694 |
| | **7,287,270** | 6,556,403 |
| අඩුකළා : සෙමින් චලනය වන අයිතමයන් සඳහා වෙන්කිරීම් | **(45,000)** | (45,000) |
| | **7,242,270** | 6,511,403 |
| ලිපි ද්‍රව්‍ය සහ විවිධ තොග | **55,890** | 57,318 |
| වෛද්‍ය මධ්‍යස්ථාන තොගය | **232** | 214 |
| මුළු තොගය | **7,298,392** | 6,568,935 |

2019 දී තොගයන්හි වටිනාකමින් රුපියල් මිලියන 3,234.34 (2018 - රු.මි. 3,999.00) තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය) ලෙස සටහන් කර ඇත.

## 20. දේපළ පිරියත සහ උපකරණ

| පිරිවැය | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | වත්කම් භාවිතා කිරීමේ හිමිකම | අනිකුත් | නොනිමි ඉදිකිරීම් | එකතුව 2019 | එකතුව 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට අගය | 16,009,028 | 1,576,664 | 1,311,372 | 601,263 | 895,550 | - | 56,739 | 16,322 | **20,466,938** | 21,157,497 |
| වත්කම් භාවිත කිරීමේ හිමිකම පළමුවරට හඳුනා ගැනීම | - | - | - | - | - | 66,287 | - | - | **66,287** | - |
| ජනවාරි 01 දිනට ගළපන ලද ශේෂය | 16,009,028 | 1,576,664 | 1,311,372 | 601,263 | 895,550 | 66,287 | 56,739 | 16,322 | **20,533,225** | 21,157,497 |
| එකතු කිරීම් | - | 1,355 | 42,951 | - | 54,389 | - | 715 | 116,244 | **215,654** | 104,514 |
| බැහැර කිරීම් | - | (277) | (7,943) | (39,970) | (1,852) | - | - | - | **(50,042)** | (772,671) |
| මාරු කිරීම්/ලියා හැරීම | 97,418 | - | - | - | - | - | - | (97,418) | **-** | (22,402) |
| දෙසැම්බර් 31 දිනට අගය | 16,106,446 | 1,577,742 | 1,346,380 | 561,293 | 948,087 | 66,287 | 57,454 | 35,148 | **20,698,837** | 20,466,938 |

| ක්ෂය | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | වත්කම් භාවිතා කිරීමේ හිමිකම | අනිකුත් | නොනිමි ඉදිකිරීම් | එකතුව 2019 | එකතුව 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට අගය | 376,087 | 938,641 | 932,954 | 423,064 | 803,039 | - | 37,299 | - | **3,511,084** | 3,196,980 |
| වර්ෂය සඳහා ක්ෂය | 188,423 | 78,652 | 80,602 | 25,923 | 44,101 | 6,240 | 1,068 | - | **425,009** | 421,451 |
| බැහැර කිරීම් | - | (127) | (6,088) | (39,970) | (1,762) | - | - | - | **(47,947)** | (107,347) |
| දෙසැම්බර් 31 දිනට අගය | 564,510 | 1,017,166 | 1,007,468 | 409,017 | 845,378 | 6,240 | 38,367 | - | **3,888,146** | 3,511,084 |
| ශුද්ධ පොත් අගය | 15,541,936 | 560,576 | 338,912 | 152,276 | 102,709 | 60,047 | 19,087 | 35,148 | **16,810,691** | 16,955,854 |

ඉඩම් සහ ගොඩනැගිලිවල ධාරණ වටිනාකම, සාධාරණ වටිනාකම අනුව සටහන් කරනු ලැබේ. ඉතා ආසන්නම ස්වාධීන තක්සේරුව 2016 දෙසැම්බර් 31 දිනට එෆ්.එම්. වැලුවර්ස් විසින් සිදු කරන ලද අතර 2016 දෙසැම්බර් 31 දිනට එය වාර්තාගත කර තිබුණි. එදිනට සාධාරණ අගය රුපියල් බිලියන 16.67 ක් විය.

2018 මැයි මස දී බැංකුවේ දේපලක් වූ නිව්යෝර්ක් සහ බ්‍රසිල් දේපල ඒවායේ පිරිවැයට, විදේශ කටයුතු අමාත්‍යාංශයට පවරන ලදී.

මෙම මූල්‍ය වර්ෂය තුළදී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු. මිලියන 215.65 (2018 - රු.මිලියන 104.36) මුළු වටිනාකමින් යුත් දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගන්නා ලදී.

2019 දෙසැම්බර් 31 දිනට මුළුමනින්ම ක්ෂය කරන ලද නමුත් භාවිතයේ ඇති වත්කම්වල වටිනාකම රු. මිලියන 1,660.12 ක් වේ (2018 රු. මිලියන 1,611.38).

### බැංකුවේ සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි හා කල්බදු ඉඩම්වල ඇති ගොඩනැගිලිවල තක්සේරු තොරතුරු

| දේපළ | වරලත් තක්සේරුකරුවන්ගේ නම | තක්සේරු ප්‍රවේශය | පර්චස් එකක ඇස්තමේන්තුගත මිල (රු.) | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල (රු.) | ඇස්තමේන්තුගත මාසික (රු.) | පිටතට යන වියදම් | වසර මිලදී ගැනීම් |
|---|---|---|---|---|---|---|---|
| **ඉඩම් හා ගොඩනැගිලි** | | | | | | | |
| ප්‍රධාන කාර්යාලය - කොළඹ 01 | ඒ.ඒ.එම්. ෆාතිහු | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 12,500,000 | 9,000 - 15,000 | - | - | - |
| වයිට්(අ)වේස් ගොඩනැගිල්ල -කොළඹ - 01 | - එම - | ආදායම් ප්‍රවේශය | 13,500,000 | - | 6,000,000 | 40% | 16.66 |
| ලොයිඩ්ස් ගොඩනැගිල්ල -කොළඹ - 01 | - එම - | ආදායම් ප්‍රවේශය | 13,500,000 | - | 6,750,000 | 40% | 16.66 |
| සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල කොළඹ - 01 | - එම - | ආදායම් ප්‍රවේශය | 14,000,000 | - | 7,500,000 | 35% | 16.66 |
| බැංකු විදු පියස - රාජගිරිය | - එම - | වෙළෙඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 2,500,000 - 3,500,000 | 2,500 - 9,500 | - | - | - |
| අධිපති නිල නිවස - කොළඹ 07 | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 7,500,000 | 3,500 - 8,500 | - | - | - |
| ප්‍රාදේශීය කාර්යාලය - මාතර | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 1,500,000 - 3,000,000 | 4,000 - 7,500 | - | - | - |
| ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 100,000 - 500,000 | 2,500 - 7,500 | - | - | - |
| නිවාඩු නිකේතනය - නුවරඑළිය | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 1,000,000 | 2,000 - 7,000 | - | - | - |
| නිවාඩු නිකේතනය - කතරගම | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 200,000 | 4,500 - 10,000 | - | - | - |
| **කල්බදු ඉඩම්වල ඇති ගොඩනැගිලි** | | | | | | | |
| ප්‍රාදේශීය කාර්යාලය - අනුරාධපුරය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 3,500 - 7,500 | - | - | - |
| නිවාඩු නිකේතනය - අනුරාධපුරය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 5,500 | - | - | - |
| ප්‍රාදේශීය කාර්යාලය - කිලිනොච්චි | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 1,500 - 7,000 | - | - | - |
| නිවාඩු නිකේතනය - සෝමාවතිය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 10,000 | - | - | - |

### ඉඩම් සහ ගොඩනැගිලිවල සංයුතිය

| | ධාරණ අගය 2019 රු. 000 | ධාරණ අගය 2018 රු. 000 |
|---|---|---|
| සින්නක්කර ඉඩම් | **8,930,375** | 8,930,375 |
| සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි | **6,366,871** | 6,449,206 |
| කල්බදු ඉඩම්වල ගොඩනැගිලි | **244,690** | 253,360 |
| | **15,541,936** | 15,632,941 |

ප්‍රත්‍යාගණනය කළ ඉඩම් සහ ගොඩනැගිලි, මූල්‍ය ප්‍රකාශනයන්හි ක්ෂය අඩුකළ පිරිවැයට දැක්වූයේ නම් ඒවායේ ධාරණ වටිනාකම රු.මි. 7,751.14 ක් වේ (2018 - රු.මි. 7,796.82).

### 21. අස්පෘෂ්‍ය වත්කම්

| පරිගණක මෘදුකාංග : | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| **පිරිවැය:** | | |
| ජනවාරි 01 දිනට අගය | **982,688** | 957,204 |
| එකතු කිරීම් | **22,227** | 25,484 |
| දෙසැම්බර් 31 දිනට අගය | **1,004,915** | 982,688 |
| **ක්‍රමක්ෂය** | | |
| ජනවාරි 01 දිනට අගය | **952,251** | 876,581 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය ගාස්තුව | **14,618** | 75,670 |
| දෙසැම්බර් 31 දිනට අගය | **966,869** | 952,251 |
| **ශුද්ධ පොත් අගය:** | | |
| දෙසැම්බර් 31 දිනට අගය | **38,046** | 30,437 |

වර්ෂය තුළ දී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු.මි. 22.23 (2018 - රු.මි. 25.48) මුළු වටිනාකමකින් යුතු අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගන්නා ලදී.

2019 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්‍රම ක්ෂය කරන ලද එහෙත් තව දුරටත් ප්‍රයෝජනයට ගන්නා අස්පෘෂ්‍ය වත්කම්වල ප්‍රමාණය රු. මි. 948.65 (2018 රු. මි. 927.38)ක් වේ.

### 22. බැංකු සහ මූල්‍ය ආයතන

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් | **609,483** | 16,864,115 |
| අනිකුත් විදේශීය මූල්‍ය ආයතනයන්ට ගෙවිය යුතු මුදල් | **348,765** | 2,437,045 |
| | **958,248** | 19,301,160 |

### 23. ආසියානු නිශ්කාෂණ සංගමය

සහභාගිවන රටවල මහ බැංකු අතර ගෙවීම් බේරුම් කිරීමේ ආයතනයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ ආසියානු සහ පැසිෆික් කලාපයේ ආර්ථික සහ සාමාජික කටයුතු කොමිසමේ මූලිකත්වය යටතේ ආසියානු නිශ්කාෂණ සංගමය (ආ.නි.ස.) 1974 වර්ෂයේ දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාව, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, ඉරානය, මාලදිවයින, මියන්මාරය, නේපාලය සහ පකිස්ථානය එහි සහභාගි රටවල් වේ. මෙය සහභාගි වන රටවල් අතර ප්‍රවර්තන ජාත්‍යන්තර ගනුදෙනු බහුපාර්ශ්වීය පදනමක් මත බේරුම් කිරීම සඳහා වූ නිශ්කාෂණ ක්‍රමයකි. එක් එක් මාසය අවසානයේ දී පවත්නා ශුද්ධ තත්ත්වය මාස දෙකක ණය කාල පරිච්ඡේදයකින් පසුව බේරුම් කිරීම හෝ ලබාගැනීම සිදුකරනු ලැබේ. ශුද්ධ ණයගැතියන් විසින් 1.60% ක සිට 2.51% ක් දක්වා වූ පොලියක් ඇ.එ.ජ. ඩොලර් සඳහා (2018 දී එය 1.45% ක් සහ 2.28% ක් විය) ශුද්ධ ණය හිමියන් වෙත දෛනික පරිශේෂ ශේෂයන් මත 2019 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා ගෙවන ලදී.

### 24.ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| පොලිය දරන ණය | **238,808,553** | 181,318,765 |
| වි.ගැ.හි. වෙන්කිරීම් | **99,176,963** | 100,253,563 |
| පංගු බැරකම් | **67,332,745** | 68,063,665 |
| ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් | **66,656,812** | 67,352,253 |
| | **471,975,073** | 416,988,246 |

**24.1** පොලී දරණ ණය, ජා.මූ. අරමුදලෙන් ලබාගන්නා විස්තිර්ණ ණය පහසුකම් (EFF) වලින් සමන්විත වේ.

**24.2** **විස්තිර්ණ ණය පහසුකම** යනු රජයේ ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යායාය පත්‍රයට සහය දීමට හා ශේෂය පියවීම සඳහා සහය දීමට ජා.මූ.අ. විසින් දෙන ලද තුන් අවුරුදු පහසුකමකි. ජා.මූ.අ. 2016 ජුනි හිදි විස්තිර්ණ ණය පහසුකම් වි.ගැ.හි බිලියන 1.10 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.බිලියන 1.50 ක්) ලබා දීමට අනුමැතිය දී තිබේ. මෙම මුදල ජා.මූ. අරමුදලේ රටවල්වල වර්තමාන පංගුවෙන් සියයට 185 කට සමාන වේ. 2016 ජුනි මස විස්තිර්ණ ණය පහසුකම යටතේ පළමුවැනි වාරිකය ලෙස වි.ගැ.හි මිලියන 119.89 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.මිලියන 168.10) ලබා දෙන ලදී. විස්තීර්ණ ණය පහසුකම යටතේ දෙවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 119.89 (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 162.56), තෙවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 119.89 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 167.2), හතරවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 177.77 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 251.4), පස්වන වාරිකය ලෙස වි.ගැ.හි මිලියන 177.77 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 252.00) හයවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 118.50 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 164.10) සහ හත්වන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 118.50 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 164.00) පිළිවෙලින් 2016 ජුනි, 2017 ජූලි, දෙසැම්බර්, 2018 ජුනි සහ 2019 මැයි, නොවැම්බර් යන මාස වලදී ලබාදී ඇත. හත්වන වාරිකය නිදහස් කිරීමත් සමඟ විස්තීරණ ණය පහසුකම යටතේ ඇ.ඩො. බිලියන 1.31 ක් ශ්‍රී ලංකාව වෙත ලැබී ඇත. ඉතිරි මුදල 2020 දී බෙදා හැරීමට නියමිතය. විස්තීරණ ණය පහසුකම සඳහා අදාල වන පොලී අනුපාතය භාර මූලික අනුපාතය වේ. මෙය වි.ගැ.හි. පොලී අනුපාතයට (වර්තමානයේ දී වාර්ෂිකව 0.05%) පදනම් අංක 100 ක එකතුවට සමාන වේ.

| | සඵල පොලී අනුපාතිකය % | පරිණත වර්ෂය | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|---|---|
| විස්තිර්ණ ණය පහසුකම (EFF) | **0.74** | **2029** | **238,808,553** | 181,318,765 |
| පොලී දරණ මුළු ණය මුදල | | | **238,808,553** | 181,318,765 |

**24.3** **විශේෂ ගැණුම් හිමිකම (වි.ගැ.හි.)** යනු පවත්නා සංචිත වත්කම්වලට පරිපූරණයන් වශයෙන් දිගුකාලීන ගෝලීය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජා.මූ.අ. විසින් පිහිටුවන ලද සංචිත වත්කමකි. සාමාජික රටවලට ඒවායේ ජා.මූ.අ. පංගු ප්‍රකාර වි.ගැ.හි. වෙන්කිරීම් සිදු කරයි. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුවට (ජා.මූ.අ. තුළ පිහිටි ගිණුම් ඒකකයකි), සහභාගී වන රටවලට පමණක් වි.ගැ.හි. වෙන් කළ හැකිය. ජා.මූ.අ. සතු රන්, විදේශ විනිමය සහ සංචිත තත්වයන් ආදී වූ නිල සංචිත වත්කම්වලට පරිපූරක වශයෙන් ජා.මූ.අ. විසින් වි.ගැ.හි. බිහි කරන ලදී. බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන් ඇතැම් කොන්දේසි ප්‍රකාර, ජා.මූ.අ. විසින් සාමාජිකයන්ට ඔවුන්ගේ ජා.මූ.අ. පංගු ප්‍රමාණය අනුව වි.ගැ.හි. වෙන් කළ හැකි වන්නේය. ජා.මූ.අ. විසින් වි.ගැ.හි. වෙන්කිරීම මගින් එක් එක් සාමාජිකයාට පිරිවැය රහිත වත්කමක්

උද්ගත වන අතර ඒ සඳහා පොළී ඉපැයීමක් හෝ ගෙවීමක් සිදු නොවේ. වි.ගැ.හි. අවලංගු කිරීමට ද ගිවිසුමේ කොන්දේසිවලින් විධිවිධාන සලසා තිබෙන නමුත් මෙතෙක් එම විධිවිධාන ක්‍රියාත්මක කර නොමැත. වි.ගැ.හි. වෙන් කිරීම් වැඩි වීමෙන් 12 වැනි සටහනේ විස්තර කර ඇති පරිදි වි.ගැ.හි. දැරීම් වැඩි වේ. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුව අවසන් කරන හෝ ඇවර කරන අවස්ථාවක දී සාමාජිකයන් විසින් ශුද්ධ සමුච්චිත වෙන්කිරීම්වලට සමාන මුදලක් සහ වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට සහභාගී වීම හේතුවෙන් ගෙවිය යුතු අනෙකුත් යම් මුදලක් වෙතොත් එය ද ජා.මූ.අ. වෙත ගෙවීමට බැඳී සිටී.

**24.4** ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් මෙහෙයුම් සහ පරිපාලන ගනුදෙනු වෙනුවෙන් බැංකුව ජා.මූ.අ. වෙත ගෙවිය යුතු ප්‍රමාණය මෙයින් දැක්වේ.

**24.5** පංගු බැරකම: අංක 12.2 දරණ සටහනේ විස්තර කර ඇති ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

## 25. අනෙකුත්

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘති ණය (සටහන 25.1) | **640,278** | 1,577,068 |
| DST එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III (සටහන 25.2) | **2,458,292** | 5,968,519 |
| DST - එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II (සටහන 25.3) | **2,527,891** | 6,242,573 |
| DST ඩොලර් ගිණුම හම්බන්තොට වරාය ව්‍යාපෘතිය (සටහන 25.4) | **-** | 91,374,950 |
| DST විශේෂ ඩොලර් ගිණුම 2 (සටහන 25.5) | **51,409,578** | 29,493,915 |
| අනෙකුත් විදේශීය බැරකම් | **55,499** | 73,908 |
| | **57,091,538** | 134,730,933 |

### 25.1 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘති ණය

ඇ.එ.ජ.ඩො. මිලියන 214.20 සඳහා වූ මෙම ණය ගිවිසුම චීන සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය අතර 2012 ජූනි 28 දින අත්සන් කර ඇත. මෙම ණය ගිවිසුමේ අරමුණ වන්නේ මොරගහකන්ද ජල විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා පහසුකම් සැපයීමයි. ජල සම්පාදන හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ගිවිසුමෙහි බැංකුකරු වශයෙන් ණය ලැබීමට හා බෙදා හැරීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි බැංකුව විසින් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී. 2019 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 5.10 ක් බෙදා හරින ලද අතර 2019 දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ ශේෂය ඇ.එ.ජ.ඩොලර් මිලියන 3.53 කි.

### 25.2 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III

ඇ.එ.ජ. ඩොලර් මිලියන 300 ක් සඳහා වූ මෙම පහසුකම් ගිවිසුම චීන සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය අතර 2014 මාර්තු 11 වන දින අත්සන් කර ඇත. ප්‍රමුඛතා මාර්ග III වන ව්‍යාපෘතියේ I වන අදියර තවදුරටත් දියුණු කිරීම සහ යළි නගා සිටුවීම සඳහා වන වියදම් මූල්‍යනය කිරීම මෙම ණය මුදලේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුමට අනුව රජයේ බැංකුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව පත් කරගන්නා ලදී. ඒ අනුව, හුදෙක් ණය මුදල් තැන්පත් කිරීම සහ එවැනි ලැබුනු මුදල් මාර්ග ව්‍යාපෘති වෙත බෙදා හැරීම සඳහා පමණක් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කෙරිණි. 2019 වර්ෂය තුළදී ඇ.එ.ජ ඩොලර් මිලියන 19.13 ක් බෙදාහරින ලදී. 2019 දෙසැම්බර් 31 වන විට ඉතිරි වී ඇති ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 13.53 කි.

### 25.3 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II

එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන II වන අදියර සඳහා වන ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 ක් 2014 නොවැම්බර් 24 වන දින හිමි විය. 2019 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 20.24 ක් බෙදාහරින ලද අතර 2019 දෙසැම්බර් 31 දින වන විට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 13.92 කි

### 25.4 DTS ඩොලර් ගිණුම - හම්බන්තොට වරාය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ China Merchant Port Holdings Co Ltd අතර හම්බන්තොට වරායේ මෙහෙයුම් කටයුතු පැවරීම වෙනුවෙන් ලද මුදල් බැර කර ආරම්භ කල මෙම විශේෂ ඩොලර් ගිණුම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙනුවෙන් පවත්වාගෙන යනු ලබයි. 2017 දෙසැම්බර් 22 දින මූලිකව ලත් මුදල වන ඇ.එ.ජ. ඩොලර් මිලියන 292.1ක මුදල 2017 වර්ෂ අවසානය වන විටද ශේෂය ලෙස පැවතුණි. දෙවනුව සහ තෙවනුව ඇ.එ.ජ. ඩොලර් මිලියන 97.37ක් සහ ඇ.එ.ජ. ඩොලර් මිලියන 584.19ක මුදලක් පිළිවෙලින් 2018 ජනවාරි 24 සහ 2018 ජූනි 25 දිනයන්හි ලැබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විට ඉතිරි ශේෂය වන ඇ.එ.ජ. ඩොලර් මිලියන 500, 2019 ජනවාරි 11 වන දින ගිණුමේ පැවැති ශේෂය අවසන් කරමින් DTS විශේෂ ඩොලර් ගිණුම 2 ට මාරු කරන ලදී.

### 25.5 DST විශේෂ ඩොලර් ගිණුම 2

මෙම ඩොලර් ගිණුම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙනුවෙන් පවත්වාගෙන යන අතර ඇ.එ.ජ. මුදලින් භාණ්ඩාගාරයට බැර කරනු ඇත. 2019 වර්ෂය තුළදී SLDB, FCBU ණය සහ දිගුකාලීන මූල්‍ය පහසුකම් බැර කර ඇති අතර, එය රජය වෙනුවෙන් ණය ආපසු ගෙවීම සඳහා භාවිත කර ඇත. 2019 දෙසැම්බර් 31 දින වන විට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 283.04 කි.

## 26. බැංකු සහ මූල්‍ය ආයතනයන් විසින් තැන්පතු

මුදල් නීති පනතේ 93 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා සපුරාලීම පිණිස බලපත්‍රලාභී වාණිජ බැංකු පවත්වාගෙන යන තැන්පතු සහ මුදල් නීති පනතේ විධිවිධාන යටතේ තත්කාලීන දළ පියවුම් ක්‍රමය යටතේ (RTGS) සහභාගීවන්නන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික වෙළෙඳුන් සහ සේවක අර්ථසාධක අරමුදල් යන ආයතනවල තැන්පතු මේ යටතේ වේ. මෙම ක්‍රමය යටතේ, පියවුම් පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා සහභාගී පාර්ශ්වයන්ට අදාල ගෙවීම් අවශ්‍යතාවයන් දිනක් තුළදී සපුරාලීමට රජය විසින් සම්පූර්ණයෙන්ම සුරැකුම් සහිත, පොලී රහිත එක් දින ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීමේ හැකියාව ඇත. ගිණුම්කරණ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් මත මෙම තැන්පතු, සම්බන්ධිත පාර්ශ්ව සහ අනෙකුත් ලෙස වර්ග කළද, එය බැංකුව හා සඳහන් කළ ආයතන අතර වූ විශේෂ ව්‍යාපාර සම්බන්ධතා නිසා හටගන්නක් නොවේ.

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| බැංකුව විසින් තැන්පත් කිරීම්: | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **148,823,686** | 192,367,084 |
| - අනිකුත් | **95,155,405** | 127,555,665 |
| | **243,979,091** | 319,922,749 |
| මූල්‍ය ආයතන විසින් තැන්පත් කිරීම්: | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **67** | 177 |
| - අනිකුත් | **10,602,462** | 183,257 |
| | **10,602,529** | 183,434 |
| බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද මුළු තැන්පතු | **254,581,620** | 320,106,183 |

## 27. රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| රජයේ තැන්පතු | **160,442** | 167,537 |
| රජයේ නියෝජිතයන් සහ අරමුදල් | **339,197** | 181,181 |
| | **499,639** | 348,718 |

රජයේ සහ/හෝ රජයේ නියෝජිතයන්ගේ හෝ ආයතනවල නිල තැන්පතුධාරී වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නීති පනතේ අංක 106 (1) දරන වගන්තියට යටත්ව මෙම තැන්පතු පවත්වාගෙන යනු ලබයි.

## 28. ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත්

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම | **43,298,325** | 28,311,221 |
| | **43,298,325** | 28,311,221 |

මූල්‍ය ප්‍රතිපත්තිය හැසිරවීමේ අංගයක් ලෙස මුදල් නීති පනතේ වගන්ති 90 හා 91 යටතේ මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය නියාමනයට විවෘත වෙළඳපල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවන් නිර්මාණය කරනු ලබයි. මෙම ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවයන් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන වෙළෙඳපළ ද්‍රවශීලිතා ප්‍රතිපත්තිය මත රඳා පවතිමින් එක් දිනක් සඳහා වන පදනම් මත හෝ කාලීන පදනම මත රජයේ සුරැකුම්පත් පමණක් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

## 29. සංසරණයේ ඇති මුදල්

ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීමේ එකම බලධාරියා වශයෙන් බැංකුව විසින් අඛණ්ඩව නීතියෙන් වලංගු මුදල් නිකුත් කිරීම සිදු කරනු ලැබේ. වාර්තාකරණ දිනට නිකුත්කර සංසරණයේ තිබූ මුදල් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි විය.

| වර්ගය | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| කාසි | | |
| සත 1 | **3,631** | 3,631 |
| සත 2 | **5,709** | 5,707 |
| සත 5 | **23,266** | 23,260 |
| සත 10 | **39,236** | 39,232 |
| සත 25 | **121,247** | 121,046 |
| සත 50 | **185,149** | 185,247 |
| රුපියල් 1 | **963,796** | 929,905 |
| රුපියල් 2 | **1,477,366** | 1,414,466 |
| රුපියල් 5 | **4,695,714** | 4,408,327 |
| රුපියල් 10 | **6,721,241** | 6,101,195 |
| සමරු කාසි | **591,386** | 590,240 |
| | **14,827,741** | 13,822,256 |
| නෝට්ටු | | |
| රුපියල් 1 | **4,981** | 4,981 |
| රුපියල් 2 | **26,694** | 26,694 |
| රුපියල් 5 | **37,191** | 37,192 |
| රුපියල් 10 | **1,259,975** | 1,271,474 |
| රුපියල් 20 | **5,876,733** | 5,607,149 |
| රුපියල් 50 | **5,720,916** | 5,456,882 |
| රුපියල් 100 | **23,662,737** | 22,612,502 |
| රුපියල් 200 | **127,820** | 128,307 |
| රුපියල් 500 | **41,697,085** | 40,093,478 |
| රුපියල් 1,000 | **134,367,933** | 136,787,726 |
| රුපියල් 2,000 | **4,044,172** | 5,331,902 |
| රුපියල් 5,000 | **446,313,172** | 409,761,967 |
| | **663,139,409** | 627,120,254 |
| සංසරණයේ ඇති මුළු මුදල් ප්‍රමාණය | **677,967,150** | 640,942,510 |

## 30. අනෙකුත් ගෙවිය යුතු දෑ

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| වෙන්කිරීම් සහ අයකිරීම් | **1,392,762** | 1,706,541 |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කළ තැන්පතු | **1,924,674** | 2,082,061 |
| අත්හරින ලද දේපළ ලැබීම් සඳහා වූ වගකීම් (සටහන 30.1) | **7,645,575** | 6,188,502 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල වූ ශේෂයන් (සටහන 30.2) | **7,599** | 18,333 |
| අනෙකුත් ගෙවිය යුතු මුදල් | **1,732,278** | 2,629,327 |
| | **12,702,888** | 12,624,764 |

**30.1** අත්හරින ලද දේපලවලට අදාළව ගෙවිය යුතු මුදලින් නියෝජනය වන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකුවල අත්හරින ලද දේපළ හඳුනාගැනීම, වාර්තා කිරීම, මාරු කිරීම හා පවත්වාගෙන යෑමට අදාළ 2009 අංක 05 දරණ බැංකු පනතේ විධානයට අනුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් සහ මූල්‍ය ආයතනවලින් රැස් කරගත් අරමුදල වේ. අත්හරින ලද දේපල වලට හිමිකම් පාන අවස්ථාවකදී බැංකුව තැන්පතු මුදල හා එයට අදාල පොළිය ගෙවීමට වගකීමෙන් බැඳේ. එම නිසා මුළු තැන්පතු මුදල හා බරතැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතය අනුව ගණනය කරන ලද පොළිය බැංකුවෙහි වගකීමක් ලෙස වාර්තා කරයි.

### 30.2. සේවක ප්‍රතිලාභ සැලසුම්වල වූ ශේෂයන්

බැංකුව විසින්, බැංකුවේ සාමාන්‍ය කාර්යයන් ලෙස එහි සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා ජංගම ගිණුම් පහසුකම් සපයනු ලැබේ. වෙනමම පරිපාලනය කරනු ලබන බැංකුවේ සේවක ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ ජංගම ගිණුම්වල සහ අන්තර් ඒකක ගිණුම්වල ශේෂයන් මෙසේය.

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| ශ්‍රී.ලං.ම.බැ. අර්ථසාධක අරමුදල, ශ්‍රී.ලං.ම.බැ. විශ්‍රාම යෝජනා ක්‍රමය සහ වැන්දඹු/ වැන්දඹු, පුරුෂ හා අනත්දරු විශ්‍රාම යෝජනා ක්‍රමයෙන් හි ශේෂය | 7,599 | 18,333 |
| | 7,599 | 18,333 |

## 31. විලම්භිත ප්‍රදානයන්

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| ජනවාරි 01 වන දිනට | **11** | 45 |
| වර්ෂය තුළ ක්‍රමක්ෂය | **(6)** | (34) |
| දෙසැම්බර් 31 දිනට | **5** | 11 |

විලම්භිත ප්‍රදානයන් අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙතට සරිලන පරිදි කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ගෙවීමක් නොමැතිව බැංකුවට හිමි වූ වත්කම් මෙහි ඇතුලත් වේ. වත්කමෙහි සාධාරණ අගය විලම්භිත ප්‍රදානයන් ගිණුමට බැර කරන ලද අතර අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙත හා සංගත වන පරිදි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා අනෙකුත් ආදායම් වෙත ලියා හරින ලදී.

## 32. විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

සියළුම සුදුසුකම්ලත් සේවකයින් ආවරණයවන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හතක් බැංකුව විසින් මෙහෙයවනු ලැබේ. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (පැරණි) යටතේ, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවට බැඳුනු සේවකයින්, වර්ෂ 10 ක සේවා කාලයක් නිම කිරීමෙන් අනතුරුව එයට සුදුසුකම් ලබති. 1998 ජනවාරි 01 දිනට පසු බැංකු සේවයට එක්වී වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කල සේවකයන් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලබයි. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ආයක මුදල් නොගෙවන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් වන අතර, එහි ප්‍රතිලාභ පිරිවැය සම්පූර්ණයෙන්ම බැංකුව විසින් දරනු ලැබේ. පිරිමි සේවකයන් සඳහා වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, කාන්තා සේවිකාවන් සඳහා වූ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවේ සේවයට බැඳුනු සේවකයින්ට විවෘතය. 1998 ජනවාරි 01 දිනට පසුව එකතු වූ සේවකයින් සඳහා නව වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය විවෘතව පවතී. වැන්දඹු සහ අනත්දරු (පැරණි) සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු (පැරණි) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා 1994 අගෝස්තු 01 දිනට පෙර බඳවා ගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5% ක ප්‍රමාණයකින් දායක වන අතර, 1994 අගෝස්තු 01 දින හෝ ඊට පසු බඳවාගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 10% කින් දායක වෙයි. තවද නව වැන්දඹු අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අයත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5.5% කින් දායක වෙයි.

අවුරුදු 5 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවක වැටුප් විශ්‍රාම ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සේවකයන් සඳහා පාරිතෝෂික ප්‍රතිලාභ ද බැංකුව විසින් සලසනු ලැබේ. මෙම බැරකම පියවීම සඳහා ආයුගණන අගය කිරීමට අනුකූලව ගණනය කළ බැරකමට සමාන ප්‍රතිපාදනයක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරියට ගෙනයනු ලැබේ.

පශ්චාත් වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාමලත් බැංකු සේවකයන් හට තමා හා තම කාලත්‍රයන් සහ වැන්දඹුවන්/වැන්දඹු පුරුෂයන් විසින් දරන ලද ඇතැම් වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කරගත හැක.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු හා වැන්දඹු පුරුෂ සහ අනත්දරු නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රමවල වර්ෂය තුළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් හා ප්‍රවර්ථන සේවා පිරිවැය නැවත තක්සේරු කිරීම සඳහා කේ. ඒ. පණ්ඩිත් උපදේශකයන් හා ආයුගණකයන්ගේ (මුම්බායි) සේවය ලබාගෙන ඇත.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන්හි අරමුදල් වෙන්ව කළමනාකරණය කරන අතර, වෙන් වූ පොත් පවත්වාගෙන යනු ලබයි. කෙසේ හෝ පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රම බැංකුවේ ගිණුම් පොත්වලින් වෙන්ව පවත්වාගෙන යනු නොලැබේ. තවදුරටත්, ආයෝජන හා ආයෝජන ආදායම්, බැංකු පොත්වල මෙම අරමුදල්වලට පරිබාහිරව වාර්තා කරනු ලැබේ. තවද, ආයෝජන ආදායම් නැවත මෙම අරමුදල්වලට මාරු කරන අතර බෙදාහැරීමකින් තොරව නැවත ආයෝජනය කරනු ලැබේ.

මුළු සැලසුම් වත්කම් හි සාධාරණ අගය රු.මි. 43,931.50 (2018 - රු.මි. 38,884.03) වන අතර එය ප්‍රතිලාභ බැරකමෙහි වර්තමාන අගය වන රු.මි. 52,461.11 (2018 - රු.මි. 48,245.66) ඉක්මවා රු.මි. 8,529.61 (2018 - රු.මි. 9,361.63) ක අතිරික්තයක් අවසානයේ දී වාර්තා වේ.

2019 දෙසැම්බර් 31 දිනට

| ප්‍රතිලාභ බැරකම/ (වත්කම) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2019 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම | 37,116,752 | 1,376,825 | 7,840,685 | 1,343,408 | 693,189 | 373,017 | 3,717,231 | 52,461,107 |
| සැලසුම් වත්කම්/ ආයෝජනවල සාධාරණ වටිනාකම | (28,458,298) | (4,450,843) | (5,550,824) | (2,466,612) | (667,087) | (284,777) | (2,053,059) | (43,931,500) |
| **ශුද්ධ ප්‍රතිලාභ බැරකම්/(වත්කම්)** | 8,658,454 | (3,074,018) | 2,289,861 | (1,123,204) | 26,102 | 88,240 | 1,664,172 | 8,529,607 |

මූල්‍ය තත්ව ප්‍රකාශයේ විශ්‍රාම සේවක හා අනෙකුත් සේවක පශ්චාත් ප්‍රතිලාභ සැලසුම් යටතේ දක්වා ඇති බැරකම් ශේෂය ස්වාධීන ආයුගණනය කරන්නා විසින් දෙනු ලැබූ ශුද්ධ බැරකම් ශේෂයෙන් වෙනස් වීමට පහත හේතු බලපා ඇත.

(අ) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම යටතේ ආයුගණනය කරන්නා විසින් දෙන ලද ශුද්ධ වත්කම් ප්‍රමාණය ගිණුම්ගත කොට නැත්තේ, එකී අරමුදල් වල ඉතිරි වන්නා වූ යම් ශේෂයක් වෙතොත් එය බැංකුවට ලබා ගැනීමට ඇති සම්භාවිතාව ඉතා අඩු බැවිනි.

(ආ) පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ගිණුම් ගත කොට ඇත්තේ, ආයුගණනය කරන්නාට අනුව ඇති ශුද්ධ බැරකම් ප්‍රමාණය නොව දළ බැරකම් ප්‍රමාණය වන අතර එයට හේතු වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එකී යෝජනා ක්‍රමවලට අදාල වත්කම් අභ්‍යන්තරව කළමණාකරණය වන ස්වාධීන අරමුදලක් යටතේ පවත්වා නොගැනීමයි.

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | **8,658,454** | 9,851,097 |
| සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | **(3,074,018)** | (2,463,637) |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | **2,289,861** | 903,848 |
| වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | **26,102** | 665,884 |
| පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | **373,017** | 290,932 |
| වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | **3,717,231** | 2,768,680 |
| | **11,990,647** | 12,016,804 |

| ප්‍රතිලාභ බැරකම/(වත්කම) වෙනස් වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2019 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2019 ජනවාරි 01 දිනට | 9,851,097 | (2,463,637) | 903,848 | (978,132) | 665,884 | 47,765 | 1,334,808 | 9,361,633 |
| ප්‍රතිලාභ වියදම් | 1,182,132 | (245,782) | 71,561 | (127,165) | (177,540) | 36,512 | 194,747 | 934,465 |
| අනෙකුත් විස්තීරණ ආදායම් හි හඳුනාගත් අගය | (1,135,396) | (92,561) | 1,314,452 | (17,907) | 24,120 | 3,963 | 777,255 | 873,926 |
| දායක ගෙවීම් | (1,239,379) | (272,038) | - | - | (486,362) | - | (642,638) | (2,640,417) |
| 2019 දෙසැම්බර් 31 දිනට | 8,658,454 | (3,074,018) | 2,289,861 | (1,123,204) | 26,102 | 88,240 | 1,664,172 | 8,529,607 |

| පුරෝකථනය කළ ප්‍රතිලාභ බැඳීම්හි වර්තමාන වටිනාකම්වල වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2019 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2019 ජනවාරි 01 දිනට | 35,971,523 | 1,055,695 | 6,241,591 | 1,199,154 | 718,088 | 290,932 | 2,768,680 | 48,245,663 |
| පොළී පිරිවැය | 4,316,583 | 126,683 | 748,991 | 143,898 | 86,171 | 34,912 | 332,242 | 5,789,480 |
| ප්‍රවර්තන සේවා පිරිවැය | - | 49,855 | - | - | - | 30,780 | 42,080 | 122,715 |
| අතීත සේවා පිරිවැය | - | - | - | - | (205,335) | - | - | (205,335) |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (2,798,205) | (988) | (502,519) | (32,405) | - | (13,609) | (291,406) | (3,639,132) |
| බැඳීම් මත ආයුගණන (ලාභ) අලාභ | (373,149) | 145,580 | 1,352,622 | 32,761 | 94,265 | 30,002 | 865,635 | 2,147,716 |
| **2019 දෙසැම්බර් 31 දිනට** | 37,116,752 | 1,376,825 | 7,840,685 | 1,343,408 | 693,189 | 373,017 | 3,717,231 | 52,461,107 |

| **සැලසුම් වත්කම්/ ආයෝජනවල සාධාරණ අගයේ වෙනස්වීම** | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2019 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2019 ජනවාරි 01 දිනට | 26,120,425 | 3,519,332 | 5,337,743 | 2,177,286 | 52,204 | 243,167 | 1,433,872 | 38,884,029 |
| පොළී ආදායම | 3,134,451 | 422,320 | 640,529 | 261,274 | 6,264 | 29,180 | 172,065 | 4,666,083 |
| සේවායෝජක දායකත්වය | 1,239,379 | 272,038 | - | - | 486,362 | - | 642,638 | 2,640,417 |
| සේවාදායක දායකත්වය | - | - | 36,901 | 9,789 | 52,112 | - | 7,510 | 106,312 |
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (2,798,204) | (988) | (502,519) | (32,405) | - | (13,609) | (291,406) | (3,639,131) |
| සැලසුම් වත්කම් මත ප්‍රතිලාභ, පොළී ආදායම හැර | 762,247 | 238,141 | 38,170 | 50,668 | 70,145 | 26,039 | 88,380 | 1,273,790 |
| **2019 දෙසැම්බර් 31 දිනට** | 28,458,298 | 4,450,843 | 5,550,824 | 2,466,612 | 667,087 | 284,777 | 2,053,059 | 43,931,500 |

විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනත්දරු, වැන්දඹු පුරුෂ හා අනත්දරු, පාරිතෝෂික හා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනාක්‍රම අරමුදල් යටතේ රු.මි. 522.23 ක වටිනාකමින් යුත් සුරැකුම් රහිතව පවත්නා ආයෝජනයන් සඳහා 100% ක වෙන් කිරීම් සිදු කර ඇති බැවින් සැලසුම් වත්කම්වල වටිනාකම්හි ඇතුලත් කර නොමැත. මෙම ආයෝජනවල වටිනාකම නොමැතිව වුවද, ආයුගණන තක්සේරුව අනුව විශ්‍රාම වැටුප් වගකීම් යටතේ බැංකුවට ශුද්ධ වත්කම් තත්ත්වයක් පවතී.

| **2019 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායම්හි හඳුනාගත් වියදම්** | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2019 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| කාලපරිච්ඡේදය සඳහා බැඳීම් මත ආයුගණන (ලාභ)/ අලාභ | | | | | | | | |
| මූල්‍ය උපකල්පනවල වෙනස්වීම් මත | 2,958,314 | 146,525 | 372,103 | 75,815 | 75,881 | 14,411 | 154,256 | 3,797,305 |
| පලපුරුද්ද මත | (3,331,463) | (945) | 980,519 | (43,054) | 18,384 | 15,591 | 711,379 | (1,649,589) |
| සැලසුම් වත්කම් මත ප්‍රතිලාභ, පොළී ආදායම හැර | (762,247) | (238,141) | (38,170) | (50,668) | (70,145) | (26,039) | (88,380) | (1,273,790) |
| **කාලපරිච්ඡේදය සඳහා අනෙකුත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් ශුද්ධ (ආදායම)/ වියදම** | (1,135,396) | (92,561) | 1,314,452 | (17,907) | 24,120 | 3,963 | 777,255 | 873,926 |

| **2019 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ප්‍රතිලාභ වියදම** | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2019 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය | 4,316,583 | 126,683 | 748,991 | 143,898 | 86,171 | 34,912 | 332,242 | 5,789,480 |
| සැලසුම් වත්කම් මත පොළී ආදායම | (3,134,451) | (422,320) | (640,529) | (261,274) | (6,264) | (29,180) | (172,065) | (4,666,083) |
| ප්‍රවර්තන සේවා පිරිවැය | - | 49,855 | - | - | - | 30,780 | 42,080 | 122,715 |
| අතීත සේවා පිරිවැය | - | - | - | - | (205,335) | - | - | (205,335) |
| සේවාදායක දායකත්වයන් | - | - | (36,901) | (9,789) | (52,112) | - | (7,510) | (106,312) |
| **ප්‍රතිලාභ වියදම** | 1,182,132 | (245,782) | 71,561 | (127,165) | (177,540) | 36,512 | 194,747 | 934,465 |

| සැලසුම් වත්කම්වල සංයුතිය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2019 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන | 21,339,406 | 3,899,255 | 3,932,975 | 1,983,543 | 657,190 | 258,908 | 1,218,959 | 33,290,236 |
| ප්‍රතිවිකුණුම්වල ආයෝජන | 2,975,118 | 55,066 | 343,015 | 127,180 | 5,348 | - | 346,217 | 3,851,944 |
| ණයකරවල ආයෝජන | 593,468 | 146,543 | 448,893 | 42,288 | - | 8,509 | - | 1,239,701 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | 3,548,628 | 349,170 | 823,951 | 312,782 | 4,062 | 17,360 | 487,883 | 5,543,836 |
| ජංගම ගිණුම්වල ඉතිරි ශේෂය | 1,678 | 809 | 1,990 | 819 | 487 | - | - | 5,783 |
| 2019 දෙසැම්බර් 31 දිනට සැලසුම් වත්කම්හි එකතුව | 28,458,298 | 4,450,843 | 5,550,824 | 2,466,612 | 667,087 | 284,777 | 2,053,059 | 43,931,500 |

| 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභ බැරකම/(වත්කම) වෙනස් වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| | 892,685 | (2,533,060) | (424,605) | (1,279,273) | - | (22,218) | 942,158 | (2,424,313) |
| ප්‍රතිලාභ වියදම් | 283,821 | (294,427) | (88,343) | (176,350) | 665,884 | 14,991 | 145,554 | 551,130 |
| අනෙකුත් විස්තීරණ ආදායම් හි හඳුනාගත් අගය | 9,059,635 | 567,448 | 1,416,796 | 477,491 | - | 54,992 | 247,096 | 11,823,458 |
| දායක ගෙවීම් | (385,044) | (203,598) | - | - | - | - | - | (588,642) |
| 2018 දෙසැම්බර් 31 දිනට | 9,851,097 | (2,463,637) | 903,848 | (978,132) | 665,884 | 47,765 | 1,334,808 | 9,361,633 |

| පුරෝකථනය කළ ප්‍රතිලාභ බැඳීම්හි වර්තමාන වටිනාකම්වල වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2018 ජනවාරි 01 දිනට | 29,232,145 | 718,032 | 5,218,411 | 912,262 | - | 153,167 | 2,158,269 | 38,392,286 |
| පොළී පිරිවැය | 3,800,179 | 93,344 | 678,393 | 118,594 | - | 19,912 | 280,575 | 4,990,997 |
| ප්‍රවර්තන සේවා පිරිවැය | 167,772 | 34,871 | - | - | - | 17,879 | 30,481 | 251,003 |
| අතීත සේවා පිරිවැය | - | - | - | - | 718,088 | - | - | 718,088 |
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (2,365,843) | (966) | (479,098) | (30,040) | - | (5,570) | (218,416) | (3,099,933) |
| බැඳීම් මත ආයුගණන අලාභ | 5,137,270 | 210,414 | 823,885 | 198,338 | - | 105,544 | 517,771 | 6,993,222 |
| 2018 දෙසැම්බර් 31 දිනට | 35,971,523 | 1,055,695 | 6,241,591 | 1,199,154 | 718,088 | 290,932 | 2,768,680 | 48,245,663 |

| සැලසුම් වත්කම්/ ආයෝජනවල සාධාරණ අගයේ වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2018 ජනවාරි 01 දිනට | 28,339,459 | 3,251,092 | 5,643,016 | 2,191,535 | - | 175,385 | 1,216,111 | 40,816,598 |
| පොළී ආදායම | 3,684,130 | 422,642 | 733,592 | 284,900 | 14,346 | 22,800 | 158,094 | 5,320,504 |
| සේවායෝජක දායකත්වය | 385,044 | 203,598 | - | - | - | - | - | 588,642 |
| සේවාදායක දායකත්වය | - | - | 33,144 | 10,044 | 37,858 | - | 7,408 | 88,454 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (2,365,843) | (966) | (479,098) | (30,040) | - | (5,570) | (218,416) | (3,099,933) |
| සැලසුම් වත්කම් මත ප්‍රතිලාභ, පොළී ආදායම හැර | (3,922,365) | (357,034) | (592,911) | (279,153) | - | 50,552 | 270,675 | (4,830,236) |
| 2018 දෙසැම්බර් 31 දිනට | 26,120,425 | 3,519,332 | 5,337,743 | 2,177,286 | 52,204 | 243,167 | 1,433,872 | 38,884,029 |

| **2018 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායමහි හඳුනාගත් වියදම්** | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| කාලපරිච්ඡේදය සඳහා බැඳීම් මත ආයුගණන (ලාභ)/ අලාභ | | | | | | | | |
| මූල්‍ය උපකල්පනවල වෙනස්වීම් මත | 3,809,336 | 200,760 | 638,640 | 156,561 | - | 76,750 | 460,701 | 5,342,748 |
| පළපුරුද්ද මත | 1,327,934 | 9,654 | 185,245 | 41,777 | - | 28,794 | 57,070 | 1,650,474 |
| සැලසුම් වත්කම් මත ප්‍රතිලාභ, පොළී ආදායම හැර | 3,922,365 | 357,034 | 592,911 | 279,153 | - | (50,552) | (270,675) | 4,830,236 |
| **කාලපරිච්ඡේදය සඳහා අනෙකුත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් ශුද්ධ (ආදායම)/ වියදම** | 9,059,635 | 567,448 | 1,416,796 | 477,491 | - | 54,992 | 247,096 | 11,823,458 |

| **2018 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ප්‍රතිලාභ වියදම** | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය | 3,800,179 | 93,344 | 678,393 | 118,594 | - | 19,912 | 280,575 | 4,990,997 |
| සැලසුම් වත්කම් මත පොළී ආදායම | (3,684,130) | (422,642) | (733,592) | (284,900) | (14,346) | (22,800) | (158,094) | (5,320,504) |
| ප්‍රවර්තන සේවා පිරිවැය | 167,772 | 34,871 | - | - | - | 17,879 | 30,481 | 251,003 |
| අතීත සේවා පිරිවැය | - | - | - | - | 718,088 | - | - | 718,088 |
| සේවාදායක දායකත්වයන් | - | - | (33,144) | (10,044) | (37,858) | - | (7,408) | (88,454) |
| **ප්‍රතිලාභ වියදම** | 283,821 | (294,427) | (88,343) | (176,350) | 665,884 | 14,991 | 145,554 | 551,130 |

| **සැලසුම් වත්කම්වල සංයුතිය** | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන | 18,951,019 | 3,138,194 | 3,665,611 | 1,682,559 | 43,131 | 214,815 | 1,150,734 | 28,846,063 |
| ප්‍රතිවිකුණුම්වල ආයෝජන | 219,425 | 21,471 | 44,950 | 26,096 | 3,883 | - | 4,013 | 319,838 |
| ණයකරවල ආයෝජන | 761,114 | 43,004 | 449,408 | 20,335 | - | 6,633 | - | 1,280,494 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | 6,173,983 | 315,885 | 1,176,978 | 448,149 | 4,848 | 21,719 | 279,125 | 8,420,687 |
| ජංගම ගිණුම්වල ඉතිරි ශේෂය | 14,884 | 778 | 796 | 147 | 342 | - | - | 16,947 |
| 2018 දෙසැම්බර් 31 දිනට සැලසුම් වත්කම්හි එකතුව | 26,120,425 | 3,519,332 | 5,337,743 | 2,177,286 | 52,204 | 243,167 | 1,433,872 | 38,884,029 |

සියලුම සේවක ප්‍රතිලාභ බැඳීම් නිශ්චය කිරීමේ දී යොදාගන්නා ලද ප්‍රධාන උපකල්පනයන් පහත දැක්වේ.

| | 2019 | 2018 |
|---|---|---|
| වට්ටම් අනුපාතිකය | 11.50% | 12.00% |
| වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකය | 11.50% | 12.00% |
| අනාගත වැටුප් වැඩිවීම් අනුපාතය - පාරිතෝෂික වැන්දඹු හා අනත්දරු හා වැන්දඹු පුරුෂ හා අනත්දරු, විශ්‍රාම (පැරණි) | 11.50% | 11.50% |
| අනාගත වැටුප් වැඩිවීම් අනුපාතය - විශ්‍රාම (නව), වැන්දඹු හා අනත්දරු, වැන්දඹු පුරුෂ හා අනත්දරු (නව) | 6.50% | 6.50% |
| අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම අනුපාතය | 7.50% | 7.50% |
| සේවය හැරයාමේ අනුපාතය | 2.00% | 2.00% |
| වෛද්‍ය පිරිවැයෙහි උද්ධමන අනුපාතය | 4.50% | 4.50% |
| ඉතිරි සාමාන්‍ය සේවා කාලය | | |
| ශ්‍රී ලං.ම.බැ. විශ්‍රාම වැටුප් | අවුරුදු 26 | අවුරුදු 26 |
| ශ්‍රී ලං.ම.බැ. විශ්‍රාම වැටුප් - නව | අවුරුදු 38 | අවුරුදු 38 |
| වැන්දඹු හා අනත්දරු | අවුරුදු 26 | අවුරුදු 26 |
| වැන්දඹු පුරුෂ හා අනත්දරු | අවුරුදු 26 | අවුරුදු 26 |
| වැන්දඹු හා අනත්දරු හා වැන්දඹු පුරුෂ හා අනත්දරු - නව | අවුරුදු 38 | අවුරුදු 38 |
| පාරිතෝෂික විශ්‍රාම වැටුප් | අවුරුදු 18 | අවුරුදු 19 |
| වෛද්‍ය ප්‍රතිලාභ | අවුරුදු 26 | අවුරුදු 26 |
| විශ්‍රාමික වයස | අවුරුදු 60 | අවුරුදු 60 |

| **0.5% දී සංවේදීතා විශ්ලේෂණය (2019 දෙසැම්බර් 31 දිනට)** | **සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය** | **සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව** | **වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය** | **වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය** | **වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව** | **පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය** | **වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය** |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **පුරෝකථනය කරන ලද ප්‍රතිලාභ සඳහා වන බැඳීම් මත ඇති වත්මන් උපකල්පනයන්** | **37,116,752** | **1,376,825** | **7,840,685** | **1,343,408** | **693,189** | **373,017** | **3,717,231** |
| "+" වට්ටම් අනුපාතිකය වෙනස්වීමේ බලපෑම | (1,534,175) | (146,525) | (372,103) | (75,815) | (75,881) | (14,411) | (154,256) |
| "-" වට්ටම් අනුපාතිකය වෙනස්වීමේ බලපෑම | 1,655,617 | 148,060 | 406,180 | 82,979 | 87,994 | 15,437 | 168,217 |
| "+" සේවය හැර යාමේ සීග්‍රතාවය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | - | 72,688 | - |
| "-" සේවය හැර යාමේ සීග්‍රතාවය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | - | (80,042) | - |
| "+" වැටුප් වැඩි වීමේ සීග්‍රතාවය වෙනස්වීමේ බලපෑම | 148,673 | 110,617 | 12,930 | 4,733 | 50,118 | 15,366 | - |
| "-" වැටුප් වැඩි වීමේ සීග්‍රතාවය වෙනස්වීමේ බලපෑම | (145,067) | (101,264) | (12,633) | (4,615) | (46,053) | (14,473) | - |
| "+" වෛද්‍ය පිරිවැයෙහි උද්ධමනය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | - | - | 177,741 |
| "-" වෛද්‍ය පිරිවැයෙහි උද්ධමනය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | - | - | (164,884) |
| "+" විශ්‍රාම වැටුප් ඉහළ යාමේ ප්‍රතිශතය වෙනස්වීමේ බලපෑම | 1,549,844 | - | 405,358 | 80,520 | - | - | - |
| "-" විශ්‍රාම වැටුප් ඉහළ යාමේ ප්‍රතිශතය වෙනස්වීමේ බලපෑම | (1,452,462) | - | (375,008) | (74,400) | - | - | - |

## 33. විවිධ බැරකම් හා උපචිතයන්

විවිධ බැරකම් හා උපචිතයන්හි ශේෂය තුළ, ගෙවීමට ඇති කල්බදු හා අනෙකුත් ගෙවිය යුතු ගිණුම්, කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් හා නැවත ලබාදිය යුතු ටෙන්ඩර් තැම්පතු අන්තර්ගතය.

### 33.1 කල්බදු

බැංකුව විසින් ඉඩම් හා ගොඩනැගිලි කිහිපයක් කල්බදු පදනම මත ලබාගෙන ඇති අතර එවැනි කල්බදු කාල පරාසය වසර 2ත් 30ත් අතර වේ. අදාළ කාල සීමාවෙන් පසු ගිවිසුම් නැවත අලුත් කිරීමේ විකල්ප මින් ගිවිසුම් කිහිපයක ඇතුළත්ය. වෙළෙඳපොළ මිල ගණන්වල වෙනස්වීම් වලට අනුරූපව කල්බදු වාරිකය නැවත සලකාබැලීම ඉහත කල්බදු කිහිපයක් සඳහා සිදුකරනු ලබයි. මීට ඉහතදී මෙකී කල්බදු සියල්ල ජා.ගි.ප්‍ර. 17 යටතේ මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කොට තිබිණි. බැංකුව කල්බදු ගැණුම්කරුවෙකු වන කල්බදු සම්බන්ධ තොරතුරු පහත ඉදිරිපත් කර ඇත.

#### 33.1.1 වත්කම් භාවිතා කිරීමේ හිමිකම

වත්කම් භාවිතා කිරීමේ හිමිකම, දේපළ, පිරියත හා උපකරණ (සටහන 20) යටතේ දක්වා ඇති කල්බදු පදනම මත ලබාගත් ඉඩම් හා ගොඩනැගිලි අදාළ වේ.

#### 33.1.2 ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් ප්‍රමාණය

| | 2019<br>රු. 000 |
|---|---|
| කල්බදු වගකීම් මත පොළිය | 5,291 |
| වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ක්‍රමක්ෂය | 6,240 |

#### 33.1.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ හඳුනාගත් ප්‍රමාණය

| | 2019<br>රු. 000 |
|---|---|
| කල්බදු මත මුළු මුදල් පිටතට ගලා යෑම් | 3,765 |

#### 33.1.4 කල්බදු වගකීම්

| | 2019<br>රු. 000 |
|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | - |
| ජා.මු.වා.ප්‍ර. 16 පළමු වරට යොදාගැනීමේ ගැලපීම | 47,411 |
| ජනවාරි 01 දිනට ගැලපුම් කළ ශේෂය | 47,411 |
| වර්ෂය තුළ පොළී වියදම | 5,292 |
| වර්ෂය තුළ කල්බදු වාරික ගෙවීම් | (3,765) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 48,938 |

#### 33.1.5 කල්බදු වගකීම් කල්පිරීම් විශ්ලේෂණය

| | 2019<br>රු. 000 |
|---|---|
| දිගුකාලීන | 44,449 |
| කෙටිකාලීන | 4,489 |
| | 48,938 |

#### 33.1.6 වට්ටම් නොකළ ගිවිසුම් ගත කල්බදු මුදල් ප්‍රවාහ මත පදනම් වූ කල්පිරීම් විශ්ලේෂණය

| | 2019<br>රු. 000 |
|---|---|
| වර්ෂ 1 ට අඩු | 7,827 |
| වර්ෂ 1 සිට 5 දක්වා | 17,769 |
| වර්ෂ 5 ට වැඩි | 114,409 |
| මුළු වට්ටම් නොකළ කල්බදු වගකීම් | 140,005 |

## 34. හිමිකරු ප්‍රාග්ධනය

**හිමිකරු ප්‍රාග්ධන විෂයයන්ගේ ස්වභාවය**

### 34.1 ප්‍රාග්ධන අරමුදල්

ආයක ප්‍රාග්ධනය : මුදල් නීති පනතේ 6 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ගිණුමෙන් පෙන්නුම් කරයි. 2014 අංක 15 දරණ මුදල් නීති පනතෙහි (සංශෝධිත) 6 වන වගන්තියට අනුව බැංකුවේ ආයක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50 ක් දක්වා ඉහළ නංවන ලදී. ඒ අනුව බැංකුව විසින් මුදල් ඇමතිගේ එකඟතාවය ඇතිව 2014 සැප්තැම්බර් මස බැංකුවේ සංචිත ප්‍රාග්ධනිත කරමින් ආයක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50 තෙක් වැඩි කරන ලදී.

### 34.2 අනෙකුත් සංචිත පහත සඳහන් දේ වලින් සමන්විත වේ;

i. **ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය (IRR) :** ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය වූ කලී මුදල් නීති පනතේ 41 වැනි වගන්තිය ප්‍රකාර පිහිටුවන ලද සංචිතයකි. මෙම වගන්තිය ප්‍රකාර, රන් සහ විදේශ මුදල්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු බැංකුවේ ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා සැලකිල්ලට නොගත යුතු අතර, ඒ වෙනුවට එම ලාභ හෝ පාඩු ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කළ යුතුය.

ii. **වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතය (MRR) :** ජාත්‍යන්තර වෙළඳපල තුළ සිදුවන අහිතකර චලන ප්‍රතිවිපාකයන් හි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය වත්කම් වල වෙළඳපල මිල ගණන් හි සිදුවන අහිතකර වෙනස් වීම්වලට මුහුණ දීමේ පරමාර්ථයෙන් ජාත්‍යන්තර වත්කම් වෙළඳපල මිල මත ඇගැයීමේ ලාභ මාරු කිරීම සඳහා 2003 ජනවාරි 30 දින ලබා දුන් මුදල් මණ්ඩල තීරණයට අනුව වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතය පිහිටුවන ලදී. මුදල් මණ්ඩලය විසින් මෙම සංචිතය ශ්‍රී.ලං.ම.බැ. දළ විදේශ සංචිත වලින් සියයට දහයක ප්‍රමාණයක් දක්වා ගොඩනැගීමට තීරණය කරන ලදී.

තවද, 2016 පෙබරවාරි 29 වන දින MB/DG(W)/7/1/2016 දරන මුදල් මණ්ඩලයේ යෝජිත සංශෝධිත බැංකුවේ ලාභ බෙදා දීමේ ප්‍රතිපත්තියට

අනුව, මුදල් මණ්ඩලයට අවශ්‍යයැයි සලකන ඕනෑම අවස්ථාවකදී උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නා වූ පාඩු වැඩිවීම නිසා රඳවාගත් ලාභයන් ඍණ අගයක් ගන්නා අවස්ථාවකදී වෙළෙඳපොල ප්‍රත්‍යාගණන සංචිතයේ සිට රඳවාගත් ලාභයන් වෙත හුවමාරු කිරීමක් සිදු කල හැක.

2018 දී වාර්තා වුණු පසුකාලීන වෙළඳපල ප්‍රත්‍යාග ණන ලාභ සැලකිල්ලට ගෙන 2019 පෙබරවාරි 27 දිනැති MB/F/8/3/2019 දරන මුදල් මණ්ඩල තීරණය පරිදි රු. බිලියන 1.17 ක් රඳවාගත් ලාභයෙන් වෙලඳපල ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කරන ලදී.

**iii.** **අනෙකුත් සංචිත** : පොදු සංචිතය, ගොඩනැගිලි සංචිතය හා ණය ඇපකර සංචිතයන් අනෙකුත් සංචිතයන් තුළ ඇතුලත් වේ. මුදල් මණ්ඩලය විසින් රඳවාගත් ලාභයන්ගෙන් වෙන්කල ප්‍රමාණයන්ගෙන් පොදු සංචිතය සමන්විත වේ.

**iv.** **අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන සුරැකුම්පත් මත ශුද්ධ සාධාරණ ලාභය/(පාඩු)** : අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් සහ ඒකක ආයෝජනයන් ප්‍රත්‍යාගණනයෙන් උපලබ්ධි නොවූ ලාභ සහ පාඩු මෙම සංචිතයට මාරු කරන ලදී.

**v.** **තත්කාලීන දළ පියවුම් නිධන් අරමුදල** : තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා සහභාගිවන්නන්ගේ අයකිරීම්වලින් මෙම අරමුදල ගොඩනගා ඇත.

**vi.** **විශ්‍රාම ප්‍රතිලාභ සංචිතය** : මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් රුපියල් බිලියන 3 ක් මාරු කිරීමෙන් ආරම්භ කරන ලද අතර, බාහිර අවදානම් තත්ත්වයන් යටතේ බැංකුවේ ආදායම් ඉපැයීමේ ධාරිතාවයේ වන උච්ඡාවචනයන් හමුවේ විශ්‍රාම අරමුදලේ වන හිඟතාවයන් සඳහා යොදාගැනීමට අපේක්ෂා කෙරේ. 2011 ලාභවලින් තවත් රුපියල් බිලියන 1 ක් මෙම සංචිතයට මාරු කරන ලදී. MB/HR/11/12/2015 දරණ මුදල් මණ්ඩල පත්‍රිකාව අනුව නව විශ්‍රාම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 2015 ජූනි මාසය තුළදී විශ්‍රාම ප්‍රතිලාභ සංචිතයෙන් රුපියල් බිලියන 2ක් නව විශ්‍රාම ගිණුමට මාරු කරන ලදී.

**vii.** **තාක්ෂණික අභිවර්ධන සංචිතය** : මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් ගොඩනගා ඇති අතර මහ බැංකුවේ දැනට භාවිතා කරන පොදු ලෙජර පද්ධතිය, තත්කාලීන ගෙවුම් පියවුම් පද්ධතිය, භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය හා නිර්ලේඛනගත සුරැකුම්පත් පියවීම් ක්‍රමය යන පද්ධතීන්වල සිදු කළ යුතු නවීකරණ කටයුතු හෝ වැඩි දියුණු කිරීම් සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා මෙය යොදා ගැනීමට අපේක්ෂා කෙරේ. 2018 මාර්තු මසදී 2018 වර්ෂයේ ලාභයෙන් රු. බිලියන 2 ක අමතර මුදලක් මෙම සංචිතයට මාරු කරන ලදී.

**viii.** **පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රම අරමුදල** : 2010 වර්ෂය තුළ බැංකුවේ ලාභවලින් රුපියල් බිලියන 2.90 ක අරමුදලක් ගොඩනගා, එමගින් කලාපවල මධ්‍ය හා දිගුකාලීන සංවර්ධන අරමුණු සඳහා, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. එම ණය ප්‍රදානයන් ලංකා බැංකුව හා මහජන බැංකුව හරහා සිදුවිය. පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රම අරමුදල සම්පූර්ණ කිරීම නිසා 2019 අප්‍රේල් මාසය තුළදී රු. බිලියන 2.90 ක ශේෂයක් මධ්‍යම හා දිගුකාලීන ණය සංචිතයට මාරුකරන ලදී.

**ix.** **විශේෂිත ණය ඇප ක්‍රම අරමුදල** : මධ්‍යම හා දීර්ඝකාලීන ණය අරමුදලින් රුපියල් බිලියන 2 ක් මාරු කිරීමෙන් 2014 දී මෙම අරමුදල පිහිටුවන ලද අතර ඉන් රුපියල් බිලියන 1 ක් බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන සෞභාග්‍යා ණය ක්‍රමය, පිබිදෙන උතුර අදියර II, නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු ප්‍රතිස්ථාපනය කිරීම II සහ උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීම යන ණය ක්‍රමයන් ප්‍රති ව්‍යුහගත කිරීම සඳහා වෙන්කර ඇත. අනෙක් රුපියල් බිලියන 1 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවලට ණය දීම සඳහා වානිජ බැංකු මගින් විශේෂිත ණය ඇප ක්‍රමයක් ක්‍රියාවට නැංවීමට වෙන් කර ඇත.

**x.** **පශ්චාත් සේවක ප්‍රතිලාභ මූල්‍යනය සඳහා වූ සංචිතය** : 2016 දෙසැම්බර් 16 දිනැති මුදල් මණ්ඩල තීරණ MB/F/39/20/2016 ට අනුව ප්‍රමාණවත් රඳවා ගැනීමේ ලාභ පවතින්නේනම් යම් වසරක (2016 න් ආරම්භ වන) ආයුගණනයේ ප්‍රතිලාභ වියදමින් සියයට 50 ක් වෙනම සංචිතයකට මාරු කිරීමට යෝජනා කර ඇත. මෙය ආයුගණනයේ අලාභ හා ප්‍රතිලාභ වියදම්වලින් බැංකුවේ ප්‍රාග්ධනය මත වන අහිතකර බලපෑම අවම කිරීමේ අරමුණ ඇතිව සිදු කරයි. 2018 වර්ෂයේ දී බැංකුවේ බෙදාහැරීමේ ලාභ ඍණ අගයක් ගැනීම හේතුවෙන් කිසිදු වෙන් කිරීමක් මෙම සංචිතය සිදු කර නැත. කෙසේවෙතත්, 2019 වර්ෂයේ දී රු. මිලියන 742.48 ක් බෙදාහැරීමේ ලාභවලින් මෙම අරමුදලට වෙන්කර ඇත.

**xi.** **ප්‍රත්‍යාණන සංචිතය** : ජා.ගි.ප්‍ර. 16 අනුව, දේපළ පිරියත සහ උපකරණවල ප්‍රත්‍යාගණන අතිරික්තය මගින් මෙම සංචිතය ගොඩනගා ඇත.

අනෙකුත් සංචිතවල වෙනස් වීම පහත පරිදි වේ.

| | මධ්‍ය සහ දිගු කාලීන ණය සංචිතය | වෙළෙඳපල ප්‍රත්‍යාගණන සංචිතය | අනෙකුත් සංචිත | විශේෂිත ණය ඇප ක්‍රම සංචිතය | තත් කාලීන දළ පියවුම් නිධන් අරමුදල | ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය | ප්‍රත්‍යාගණන සංචිතය | අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්වල ශුද්ධ සාධාරන ලාභය/අලාභය | විශ්‍රාම අරමුදල් සංචිතය | තාක්ෂණික අභිවර්ධන සංචිතය | පළාත් සංවර්ධන ණය යෝජනාක්‍රම අරමුදල | පශ්චාත් සේවක ප්‍රතිලාභ සැළසුම් මූල්‍යනය සඳහා වූ සංචිතය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2019 ජනවාරි 01 දිනට | 1,925,000 | 18,940,161 | 15,966,402 | 2,000,000 | 2,118,801 | 155,427,777 | 9,022,907 | (2,978,222) | 2,000,000 | 3,000,000 | 2,900,000 | 4,333,497 | 214,656,323 |
| තත්කාලීන දළ පියවුම් නිධන් අරමුදලට මාරු කිරීම | - | - | - | - | 333,334 | - | - | - | - | - | - | - | 333,334 |
| විදේශ විනිමය ප්‍රත්‍යාගණන ශුද්ධ අලාභ මාරු කිරීම | - | - | - | - | - | (14,557,283) | - | - | - | - | - | - | (14,557,283) |
| අනෙකුත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට වූ සුරැකුම්පත්වල ශුද්ධ ලාභය | - | - | - | - | - | - | - | 10,628,206 | - | - | - | - | 10,628,206 |
| වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම | - | 1,166,517 | - | - | - | - | - | - | - | - | - | - | 1,166,517 |
| වෙළඳපල ඇගයීම් සංචිතය - අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති රජයේ සුරැකුම්පත් | - | - | - | - | - | - | - | 113,231 | - | - | - | - | 113,231 |
| වෙළඳපල ඇගයීම් සංචිතය - අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති ස්කන්ධ ආයෝජන | - | - | - | - | - | - | - | 115,859 | - | - | - | - | 115,859 |
| පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රම අරමුදල් සංචිතයට මාරු කිරීම් | 2,900,000 | - | - | - | - | - | - | - | - | - | (2,900,000) | - | - |
| අනෙකුත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගයට වන ආයෝජන මත අපේක්ෂිත ණය අලාභයන් | - | - | - | - | - | - | - | 37,245 | - | - | - | - | 37,245 |
| 2019 දෙසැම්බර් 31 දිනට | 4,825,000 | 20,106,678 | 15,966,402 | 2,000,000 | 2,452,135 | 140,870,494 | 9,022,907 | 7,916,319 | 2,000,000 | 3,000,000 | - | 4,333,497 | 212,493,432 |

## 35. ලාභ බෙදාහැරීම

මුදල් නීති පනතට අනුව සහ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ලාභ බෙදාහැරීමේ ප්‍රතිපත්තියට අනුකූලව, (2018 වසරේ සිට බලපැවැත්වෙන පරිදි) බෙදිය හැකි ලාභය ගණනය කිරීමේදී ජා.මු.වා.ප්‍ර. ප්‍රකාර වසර සඳහා වන ශුද්ධ ලාභය/අලාභය සඳහා පහත දැක්වෙන ගැලපීම් කරනු ලැබේ.

(අ) විදේශ විනිමය ලාභ ඉවත්කරනු ලැබේ. විදේශ විනිමය අලාභ, සමුච්චිත ලාභයන්ගෙන් අවශෝෂණය කිරීමට ප්‍රමාණවත් වන තෙක් පමණක් ඉවත් කෙරේ. ඉතිරි විදේශ විනිමය අලාභය ආදායම් ප්‍රකාශයට ගලපනු ලැබේ. (ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ බෙදාහැරීමේ ප්‍රතිපත්තියට අනුකූලව)

(ආ) විදේශ වත්කම්වල උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නාවූ පාඩු ගලපනු ලබන අතර උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නාවූ වාසි ඉවත් කෙරේ (ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ බෙදා හැරීමේ ප්‍රතිපත්තියට අනුකූලව).

(ඇ) මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි මුදල් නීති පනතේ වගන්නි අංක 38 අනුව සංචිතයන්ට සිදු කරනු ලබන වෙනත් ඕනෑම මාරු කිරීමක් සහ මුදල් නීතිපනතේ වගන්ති අංක 39 අනුව කළ යුතු ගැලපුම් කරනු ලැබේ.

තවද ගිණුම්කරණ ප්‍රමිති සහ කළමණාකාරීත්වයේ තීරණ අනුව කළ යුතු ගැලපුම් ද බෙදිය හැකි ලාභය ගණනය කිරීමේ දී ගලපනු ලැබේ.

ඉහත සඳහන් ගැලපුම් වලට අනුව ගණනය කරන ලද 2019 දෙසැම්බර් 31 දිනට බෙදිය හැකි අලාභය පහත පරිදි වේ.

| අයිතමය | 2019 රු. 000 |
|---|---|
| **වර්ෂයේ ලාභය** | 55,604,839 |
| **අඩුකළා :** | |
| විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම. (මුදල් නීති පනත ප්‍රකාරව) | (14,557,283) |
| විදේශ වත්කම්වල උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නා වූ ලාභ වෙළෙඳපොළ ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම | 43,356,467 |
| අනෙකුත් ගිණුම්කරණ ගැලපුම් | 541,921 |
| අනෙකුත් විස්තීරණ ආදායමට මාරු කිරීම් (ජා.ගි.ප්‍ර. 19 සේවක ප්‍රතිලාභ අනුව) | 873,926 |
| මුදල් නීති පනතට, බැංකුවේ ලාභ බෙදාහැරීමේ ප්‍රතිපත්තියට සහ අනෙකුත් ගැලපීම්වලට අනුකූලව බෙදිය හැකි ලාභය - උපලබ්ධි ලාභය | **25,389,808** |
| **අඩුකළා :** සංචිතවලට මාරුකිරීම් (මුදල් නීති පනතේ 38 වන වගන්තියට අනුව) | |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් මූල්‍යනය සඳහා වූ සංචිතයට මාරු කිරීම් | 742,476 |
| පොදු සංචිතවලට මාරු කිරීම් | 638,355 |
| රජයෙන්, ශ්‍රී.ලං.ම.බැ. වෙත ලැබිය යුතු බැඳීම් පියවා ගැනීම (මුදල් නීති පනතේ 39 වන වගන්තියට අනුව) | 8,977 |
| **ඒකාබද්ධ අරමුදලට බැරකළ අගය (මුදල් නීති පනතේ 39 වන වගන්තියට අනුව)** | **24,000,000** |

## 36. මූල්‍ය වත්කම්වලින් පොළී ආදායම

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොළී ආදායම** | | |
| මුදල් හා කෙටිකාලීන තැන්පතු | **3,107,387** | 3,889,162 |
| මූල්‍ය වත්කම් | **14,245,223** | 13,588,824 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **15,597,950** | 8,078,946 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදායම** | **32,950,560** | 25,556,932 |
| **දේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොළී ආදායම** | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **16,658,658** | 7,941,274 |
| අනිකුත් ණය සහ අත්තිකාරම් | **1,228,145** | 1,015,048 |
| **දේශීය මූල්‍ය වත්කම් වලින් ඉපැයූ මුළු පොළී ආදායම** | **17,886,803** | 8,956,322 |
| **මුළු මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදායම** | **50,837,363** | 34,513,254 |

## 37. උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් ලද ලාභ/ (අලාභ)

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| විදේශ සුරැකුම්පත් | **295,181** | 214,157 |
| රන් | **27,613,441** | (4,103,042) |
| විදේශ විනිමය සහ මුදල් හුවමාරු | **14,672,223** | (14,882,288) |
| විනිමය විකල්පයන් | **320,052** | 511,217 |
| උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් ලද සම්පූර්ණ ලාභය/ (අලාභය) | **42,900,897** | (18,259,956) |

## 38. මූල්‍ය බැරකම් මත පොළී වියදම

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| **විදේශීය මූල්‍ය බැරකම් මත වූ පොළී වියදම** | | |
| ආසියානු නිශ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල | **1,638,792** | 991,982 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ වගකීම් | **4,937,068** | 3,862,093 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **1,722,776** | 486,325 |
| අනෙකුත් ගෙවිය යුතු මුදල් - විදේශීය | **39,383** | 9,755 |
| **විදේශීය මූල්‍ය බැරකම් මත වූ මුළු පොළී වියදම** | **8,338,019** | 5,350,155 |
| **දේශීය මූල්‍ය බැරකම් මත වූ පොළී වියදම** | | |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම මත අලෙවිකරණ ලද සුරැකුම්පත් | **795,441** | 925,379 |
| නිත්‍ය තැන්පතු පහසුකම | **2,301,163** | 1,409,287 |
| ණයට ගත් බැඳුම්කර | **-** | 15,882 |
| අත්හල දේපල | **666,335** | 529,672 |
| විවිධ පොළී වියදම් | **363** | - |
| **දේශීය මූල්‍ය බැරකම් මත වූ මුළු පොළී වියදම** | **3,763,302** | 2,880,220 |
| **මූල්‍ය බැරකම් මත වූ සම්පූර්ණ පොළී වියදම** | **12,101,321** | 8,230,375 |

බැංකුව විසින් මුදල් වෙළෙඳපොල තුළ ඇති වූ ඌණ ද්‍රවශීලීතාවය මඟ හැරවීමට රුපියල් මුදා හැරීම තුළින් රු.මි. 17,080.98 ක ශුද්ධ නිවාරණ ලාභයක් 2019 වර්ෂය තුළදී උපයාගෙන ඇත (2018 රු.මි. 10,041.78 කි). පහත විස්තර කර ඇති පරිදි මෙම නිවාරණ ලාභය, ප්‍රති මිලදීගැනුම් ගිවිසුම් යටතේ සුරැකුම්පත් විකිණීම මත වූ පොළී වියදම, බැඳුම්කර ණයට ගැනීම මත වූ පොළී වියදම, නිත්‍ය තැන්පතු පහසුකම් මත පොළී වියදම සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වලින් ලද පොළී ආදායමෙහි අඩංගු නැවත විකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්වලින් ලද පොළී ආදායම සහ විදේශ මූල්‍ය වත්කම් මත වූ පොළී ආදායමෙහි අඩංගු ඇ.එ.ජ. ඩොලර්/රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ලාභයන්ගේ ශුද්ධ අගයෙන් සමන්විත වේ.

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් මත විකුණූ සුරැකුම්පත් වෙනුවෙන් දරණ ලද පොළී වියදම් | **795,441** | 925,379 |
| බැඳුම්කර ණයට ගැනීම වෙනුවෙන් ගෙවූ පොළී වියදම | **-** | 15,882 |
| නිත්‍ය තැන්පතු පහසුකම මත පොළී වියදම | **2,301,163** | 1,409,287 |
| අඩු කළා : | | |
| ප්‍රති විකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත් වෙනුවෙන් ලද පොළී අදායම | **4,579,630** | 4,313,387 |
| ඇ.එ.ජ.ඩොලර්/රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල ලාභය | **15,597,950** | 8,078,946 |
| | **17,080,976** | 10,041,785 |

## 39. මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| **විදේශීය මූල්‍ය වත්කම්** | | |
| ක්‍රමක්‍ෂය පිරිවැයට වූ මූල්‍ය වත්කම් | | |
| මුදල් සහ මුදල් සමානයන් (සටහන 9.1) | **(150,394)** | (21,059) |
| ජා.මු.අ. සම්බන්ධ වත්කම් (සටහන 12.4) | **-** | (1) |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් (සටහන 10.2) | **(37,245)** | 1,939 |
| **විදේශීය මූල්‍ය වත්කම් මත මුළු අපේක්ෂිත ණය අලාභ අය කිරීම්** | **(187,639)** | (19,121) |
| **දේශීය මූල්‍ය වත්කම්** | | |
| ක්‍රමක්ෂය පිරිවැයට වූ මූල්‍ය වත්කම් | | |
| බැංකු සඳහා වූ ණය (සටහන 17.3) | **119** | 488 |
| අනෙකුත් වත්කම් (සටහන 17.1) | **(27,764)** | (11,462) |
| ණය ඇපකර සඳහා වෙන්කිරීම් | **404** | 8 |
| **දේශීය මූල්‍ය වත්කම් මත මුළු අපේක්ෂිත ණය අලාභ අය කිරීම්** | **(27,241)** | (10,966) |
| **මූල්‍ය වත්කම් මත මුළු අපේක්ෂිත ණය අලාභ අය කිරීම්** | **(214,880)** | (30,087) |

## 40. අනෙකුත් ආදායම්

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| ලාභාංශ ආදායම | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **149,686** | 126,111 |
| දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමෙන් ලද ලාභය/(අලාභ) | **33,915** | 79,373 |
| විලම්භිත ප්‍රදානය ක්‍රමක්ෂය වීම | **6** | 34 |
| මූල්‍ය ආයතනයන්ට අදාල බලපත්‍ර ගාස්තු | **624,100** | 580,950 |
| කුලී ආදායම් | **346,790** | 402,429 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතියෙහි සහභාගීකරුවන්ගෙන් අයකරන ලද ගාස්තු | **121,576** | 123,361 |
| විවිධ ආදායම් | **426,462** | 380,736 |
| මුළු අනිකුත් ආදායම් | **1,702,535** | 1,692,994 |

## 41. සේවක මණ්ඩල වියදම්

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| වේතන සහ වැටුප් | **5,544,943** | 5,409,137 |
| නිශ්චිත දායක සැලසුම් පිරිවැය | **1,103,233** | 1,536,049 |
| පශ්චාත් සේවක නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | **1,120,381** | 205,147 |
| මුළු සේවක මණ්ඩල වියදම් | **7,768,557** | 7,150,333 |

## 42. පරිපාලන හා අනිකුත් වියදම්

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| අලුත්වැඩියා සහ නඩත්තු | **910,949** | 831,201 |
| රොයිටර්, බ්ලූම්බර්ග්, SWIFT ආදිය වෙනුවෙන් මෙහෙයුම් වියදම් | **188,605** | 162,735 |
| ගමනාගමන වියදම් | **138,243** | 131,033 |
| බදුකුලී වියදම් | **69,664** | 3,004 |
| මුද්‍රණ වියදම් | **35,015** | 36,412 |
| විගණන ගාස්තු | **247,435** | 11,199 |
| මුදල් මණ්ඩලයේ/ අනුකමිටු සාමාජිකයිනට පාරිශ්‍රමිකය | **6,420** | 4,510 |
| ශ්‍රී ලංකා මහ බැංකු අර්ථසාධක අරමුදල් පොළී සහනාධාර වියදම් | **-** | 85,383 |
| ප්‍රචාරණ වියදම් | **82,686** | 104,930 |
| උපදේශාත්මක, සන්නිවේදන සහ වෘත්තිමය ගාස්තු | **124,220** | 102,718 |
| කල්බදු වගකීම් සඳහා පොළී වියදම් | **5,292** | - |
| විවිධ වියදම් | **359,952** | 376,958 |
| මුළු පරිපාලන හා අනිකුත් වියදම් | **2,168,481** | 1,850,083 |

## 43. බදු

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ වගන්ති 9 (i) ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවට ආදයම් බදු ගෙවීම සඳහා වගකීමක් නොමැත.

බැංකුව විසින් 2018 මාර්තු 31 තෙක් ගෙවූ රඳවා ගැනීමේ බදු සහ ගෙවනු ලබන ආර්ථික සේවා ගාස්තු අවසාන බද්දක් ලෙස සැලකේ. 2017 අංක 24 දරන ආදායම් බදු පනත අනුව, 2018.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සුරැකුම්පත් මත වන රඳවා ගැනීමේ බදු ගෙවීමේ අවශ්‍යතාවය ඉවත් කර ඇත.

රු.මි. 290.89 ක් (2018 රු.මි. 851.20) ක් වූ ආර්ථික සේවා ගාස්තු හේතුවෙන් 2019 වර්ෂය තුළදී, බැංකුව විසින් ගෙවූ මුළු බදු ප්‍රමාණය රු.මි. 290.89 (2018 - රු.මි. 1,119.29) ක් වූ අතර 2019 දී රඳවා තබාගැනීමේ ගාස්තු කිසිවක් ගෙවා නැත. (2018 - රු.මි. 268.08).

## 44. මෙහෙයුම් ලාභය මෙහෙයුම් මුදල් ප්‍රවාහය සමග සැසඳීම

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වාර්තා කෙරුණු ශුද්ධ ලාභය | **55,604,839** | 137,927,718 |
| මුදල් නොවන අයිතමයන් එකතුකළා/(අඩුකළා) | | |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂය | **439,918** | 498,189 |
| දේශීය මුදල් ආයෝජන කළඹ මගින් ලැබිය යුතු පොලිය | **(16,658,660)** | (7,941,272) |
| නිශ්චිත සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා වන ශුද්ධ වෙන්කිරීම් | **467,211** | 390,483 |
| උපලබ්ධි නොවූ දළ විදේශ විනිමය ලාභය | **(3,012,872)** | (149,861,582) |
| දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලාභය | **(33,915)** | (79,381) |
| වෙන් කිරීම් හා උපචිතයන් | **(805,841)** | 2,288,287 |
| මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ වෙන් කිරීම | **214,880** | 30,086 |
| විලම්භිත ප්‍රදාන | **(6)** | (34) |
| PRGF තැන්පතු ක්‍රමක්ෂය | **8,368** | (7,747) |
| නොනිමි ඉදිකිරීම් ඉවත් කිරීම | **-** | 22,402 |
| ස්ථාවර ආදායම් සුරැකුම්පත් ක්‍රමක්ෂය වියදම් | **5,674** | 109,525 |
| **එකතුකළා / (අඩුකළා) අනෙකුත් කාරක ප්‍රාග්ධන අයිතමයන්ගේ වෙනස්වීම්** | | |
| තොගවල (වැඩිවීම)/අඩුවීම | **(729,457)** | 306,597 |
| ලැබිය යුතු පොළිය (වැඩිවීම)/අඩුවීම | **(354,822)** | 2,558,796 |
| විවිධ බැරකම්වල වැඩිවීම/(අඩුවීම) | **323,129** | (21,325) |
| ගෙවිය යුතු පොළිය වැඩිවීම | **627,537** | 1,075,371 |
| අනෙකුත් ලැබීම් වැඩිවීම | **(237,576)** | (3,234,520) |
| **එකතුකළා/(අඩුකළා) ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම්** | | |
| ශුද්ධ උපලබ්ධි නොවූ වෙළෙඳපොළ අගය වෙනස්වීම | **(42,694,401)** | 12,201,892 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(6,835,994)** | (3,736,515) |

## 45. රජයේ ගනුදෙනු මත සංසරණ මුදල් ශුද්ධ නිකුතු/(ආපසු ගැනීම්)

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම/(විකිණීම) | **(147,771,168)** | 241,803,062 |
| ලැබුණු පොළිය - දේශීය මුදල් - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **(16,619,525)** | (7,393,636) |
| ශ්‍රී ලංකා රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් වැඩිවීම/(අඩුවීම) | **37,976,400** | (1,168,300) |
| රජය සහ රජයේ ආයතන සමග ශේෂ (වැඩිවීම)/අඩුවීම | **(150,920)** | (24,202) |
| | **(126,565,213)** | 233,216,924 |

## 46. බැංකු සහ මූල්‍ය ආයතනයන්ගේ ගනුදෙනු මත සංසරණ මුදල් ශුද්ධ නිකුතු/(ආපසු ගැනීම්)

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| බැංකු හා මූල්‍ය ආයතනයන්ගේ තැන්පතු අඩුවීම | **65,524,563** | 23,010,511 |
| | **65,524,563** | 23,010,511 |

## 47. අරමුදල්කරණයේ සංකේන්ද්‍රණය වීම

**47.1** වර්ෂ අවසානයට බැංකුවේ අරමුදල්කරණයේ සැලකිය යුතු සංකේන්ද්‍රණය වීම පහත පරිදිය.

| 2019 දෙසැම්බර් 31 දිනට | ශ්‍රී ලංකා රජය රු. 000 | ශ්‍රී ලංකා මහජනයා රු. 000 | ශ්‍රී ලංකා වාණිජ බැංකු රු. 000 | අධි ජාතික මූල්‍ය ආයතන රු. 000 | අනිකුත් රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|---|---|
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල් | - | - | - | 830,677 | 127,571 | **958,248** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | - | 197,014 | - | 792,944 | **989,958** |
| ආසියානු නිශ්කාෂණ සංගමය | - | - | - | 82,995,147 | - | **82,995,147** |
| ජා.මූ.අ. | - | - | - | 471,975,073 | - | **471,975,073** |
| අනිකුත් | 57,036,040 | - | - | 50,408 | 5,090 | **57,091,538** |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | 57,036,040 | - | 197,014 | 555,851,305 | 925,605 | **614,009,964** |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | - | - | 243,979,091 | - | 10,602,529 | **254,581,620** |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 499,447 | 192 | - | - | - | **499,639** |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අළෙවි කළ සුරැකුම්පත් | - | - | 40,663,818 | - | 2,634,507 | **43,298,325** |
| සංසරණයේ ඇති මුදල් | - | 677,967,150 | - | - | - | **677,967,150** |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 83,678 | - | 1,924,674 | - | 10,694,536 | **12,702,888** |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | 583,125 | 677,967,342 | 286,567,583 | - | 23,931,572 | **989,049,622** |
| **මුළු මූල්‍ය බැරකම්** | 57,619,165 | 677,967,342 | 286,764,597 | 555,851,305 | 24,857,177 | **1,603,059,586** |
| **අනිකුත් බැරකම්** | | | | | | |
| විලම්භිත ප්‍රදානයන් | - | - | - | - | 5 | **5** |
| විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | - | - | - | - | 11,990,647 | **11,990,647** |
| විවිධ බැරකම් සහ උපචිතයන් | - | - | - | - | 181,809 | **181,809** |
| **මුළු අනිකුත් බැරකම්** | - | - | - | - | 12,172,461 | **12,172,461** |
| **මුළු බැරකම්** | 57,619,165 | 677,967,342 | 286,764,597 | 555,851,305 | 37,029,638 | **1,615,232,047** |

**47.2** 2018 දෙසැම්බර් 31 දිනට සංසන්දනාත්මක සංඛ්‍යා පරිදි පරිදිය.

| 2018 දෙසැම්බර් 31 දිනට | ශ්‍රී ලංකා රජය රු. 000 | ශ්‍රී ලංකා මහජනයා රු. 000 | ශ්‍රී ලංකා වාණිජ බැංකු රු. 000 | අධි ජාතික මූල්‍ය ආයතන රු. 000 | අනිකුත් රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|---|---|
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල් | - | - | - | 811,552 | 18,489,608 | 19,301,160 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | - | 12,156,003 | - | 1,900,457 | 14,056,460 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | - | - | - | 79,158,977 | - | 79,158,977 |
| ජා.මූ.අ. | - | - | - | 416,988,246 | - | 416,988,246 |
| අනිකුත් | 134,657,025 | - | - | 68,817 | 5,091 | 134,730,933 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | 134,657,025 | - | 12,156,003 | 497,027,592 | 20,395,156 | 664,235,776 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | - | - | 319,922,749 | - | 183,434 | 320,106,183 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 348,681 | 37 | - | - | - | 348,718 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අළෙවි කළ සුරැකුම්පත් | - | - | 16,741,679 | - | 11,569,542 | 28,311,221 |
| සංසරණයේ ඇති මුදල් | - | 640,942,510 | - | - | - | 640,942,510 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 103,736 | - | 2,082,061 | - | 10,438,967 | 12,624,764 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | 452,417 | 640,942,547 | 338,746,489 | - | 22,191,943 | 1,002,333,396 |
| **මුළු මූල්‍ය බැරකම්** | 135,109,442 | 640,942,547 | 350,902,492 | 497,027,592 | 42,587,099 | 1,666,569,172 |
| **අනිකුත් බැරකම්** | | | | | | |
| විලම්භිත ප්‍රදානයන් | - | - | - | - | 11 | 11 |
| විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | - | - | - | - | 12,016,804 | 12,016,804 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 2,562 | - | - | - | 83,383 | 85,945 |
| **මුළු අනිකුත් බැරකම්** | 2,562 | - | - | - | 12,100,198 | 12,102,760 |
| **මුළු බැරකම්** | 135,112,004 | 640,942,547 | 350,902,492 | 497,027,592 | 54,687,297 | 1,678,671,932 |

## 48. අවදානම් කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති අරමුණු කරා ළඟා වීමේ දී විවිධාකාර වූ මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් රැසකට මුහුණ දෙනු ලබයි. මෙම අවදානම්වලින් ඇතිවිය හැකි බරපතල වූ හානිකර බලපෑම් පාලනය කරනු වස් ශ්‍රී ලංකා මහ බැංකුව තුළ නිසි පරිදි සැලසුම් කළ අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වේ. ඒකාබද්ධ වූ ප්‍රවේශයක් මඟින් අවදානම් කළමනාකරණය කිරීමේ උපායමාර්ගික වැදගත්කම හා සම්ප්‍රදායික ඒකපාර්ශ්වීය අවදානම් දැක්මේ පවත්නා වූ දුර්වලතාවයන් අවධාරණය කර ගැනීමත් සමගම 2015 වසරේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීමට කටයුතු යෙදුණි. ඒ අනුව 2018 - 2020 වර්ෂයක් සඳහා මහ බැංකුවේ උපාය මාර්ගික ප්‍රමුඛතාවයක් ලෙස අවදානම් කළමනාකරණය පිළිගනු ලැබූ අතර මහ බැංකුව සඳහා ආයතනගත අවදානම් කළමනාකරණ රාමුවක් (Enterprise-wide Risk Management Framework) ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක් දැනට සිදුවෙමින් පවතී. මෙම රාමුවෙහි මූලික අරමුණ වන්නේ බැංකුවේ සියලු ස්ථරයන් තුළ අවදානම පිළිබඳ දැනුවත්ව තීරණ ගැනීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමයි.

2018 ජනවාරි මාසයේ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් යහපාලන රාමුව, අවදානම් යහපාලනය හා අවදානම් කළමනාකරණ ව්‍යුහයන්ගෙන් සමන්විත වන අතර බැංකු විසින් මුහුණ දෙනු ලබන මූල්‍යමය හා මූල්‍යමය නොවන අවදානම් මෙමගින් ආවරණය වේ. අවදානම් යහපාලන ව්‍යුහය, මුදල් මණ්ඩලයෙන්ද මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාව සහ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව

යන අනුකමිටු වලින්ද සමන්විත වේ. මුදල් මණ්ඩලය විසින් බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ මූලිකත්වය ද අවසාන වගකීම ද දරනු ලැබේ. තවද, බැංකුවේ අවදානම් අභිරුචිය සහ විතක්ෂාව (Risk Appetite and Risk Tolerance) තීරණය කිරීමත් අනුමත කිරීමත් මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම වේ.

2018 වසරේ අගෝස්තු මස මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාව ස්ථාපිත කරන ලද අතර එය මුදල් මණ්ඩලයේ ස්වාධීන සාමාජිකයෙකු වන ක්‍රිෂාන්ත පෙරේරා මහතාගේ සභාපතිත්වයෙන් ද, බාහිර විශේෂඥ දෙපළකගේ සාමාජිකත්වයෙන් ද (2018 ඔක්තෝබර් 05 සිට අද දක්වා බ්‍රැන්ඩික්ස් සමාගමේ සභාපති බොස්ටන් උපදේශක සමූහයේ ජ්‍යේෂ්ඨ උපදේශක ප්‍රියාන් ප්‍රනාන්දු මහතා සහ 2019 මාර්තු 01 සිට අද දක්වා "නිත්‍ය හවුල්කරුවන්ගේ", හවුල්කරු නයෝමාල් ගුණවර්ධන මහතා) ක්‍රියාත්මක වේ. මෙම කාරක සභාවේ මූලික වගකීම වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ සහ අනුකූලතා කාර්යයන් අධීක්ෂණය කරනු ලැබීමත්, ඒ සඳහා පුළුල් ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමත්ය. මීට අමතරව බැංකුව තුළ අවදානම් කළමනාකරණය හා අනුකූලතාවය කෙරෙහි විශේෂ අවධානයක් පවත්වාගෙන යාමටද මණ්ඩල අවදානම් අධික්ෂණ කමිටුව විසින් මුදල් මණ්ඩලය වෙත සහාය ලබාදෙයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් කළමනාකරණය තෙවැදෑරුම් ආරක්ෂණ පිළිවෙතක් (Three Lines of Defence) අනුව සිදු කෙරේ. මෙහි ප්‍රථම පෙළ ආරක්ෂණ කටයුතු සඳහා වගකීම දරනු ලබන මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අවදානම් හඳුනා ගැනීම, ඇගයීම, පාලනය කිරීම, අවම කිරීම සහ බැංකුවේ අරමුණු සමග ගැලපෙන පරිදි අභ්‍යන්තර ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි. දෙවන පෙළ ආරක්ෂණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මෙහෙයුම් අවදානම් කළමනාකරණය වඩාත් සුමට කරනු ලබයි. දෙපාර්තමේන්තු මගින් සිදුකරන මෙහෙයුම් අවදානම් කළමනාකරණ කටයුතු අධීක්ෂණය කිරීමටත්, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති මනාව ක්‍රියාත්මක කිරීමටත් සහාය වෙමින්, ස්වාධීනව අවදානම් සංසිද්ධීන් වාර්තාකරණය සිදු කිරීම මගින් අවදානම් කළමනාකරණය හා යහපාලන රාමු අතර මනා තොරතුරු සංනිවේදනයක් සහ සම්බන්ධතාවක් ගොඩනැගීමට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. තෙවන පෙළ ආරක්ෂණ ක්‍රමවේදය ලෙස ක්‍රියාකරන අභ්‍යන්තර විගණනය මගින් යහපාලනය, අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලනයන් හිදී කාර්යක්ෂමතාවය ද, ප්‍රථම හා දෙවන පෙළ ආරක්ෂක ක්‍රමවේද මගින් අවදානම් කළමනාකරණ සම්බන්ධතා අරමුණු නිසියාකාරව සපුරාලන බව ද තහවුරු කිරීමක් සිදු කරන අතර, තෙවැදෑරුම් ආරක්ෂණ ක්‍රමවේදය බැංකුවේ අවදානම් යහපාලන රාමුව තුළ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

තුන් පෙළ ආරක්ෂක උපක්‍රම ආකෘතිය යටතේ සියලුම දෙපාර්තමේන්තු වල මූල්‍යමය නොවන අවදානම් කළමනාකරණයට පහසුකම් සැලසීමට අමතරව, ජාත්‍යන්තර සංචිත (IR), අභ්‍යන්තර ආයෝජන අරමුදල් (IIF) සහ රජය සඳහා නියෝජිතායතන කාර්යයක් ලෙස සිදු කරනු ලබන සේවක අර්ථ සාධක අරමුදලේ (EPF) අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් වල මූල්‍ය අවදානම් කළමනාකරණය කිරීමේ වගකීම ද, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සතුය. මෙම වර්ෂය තුළදී ඉහත අරමුදල් කළමනාකරණ කටයුතු තුනම සඳහා ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශන (IPS), ආයෝජන මාර්ගෝපදේශයන් (IG) සහ උපාය මාර්ගික වත්කම් විභජනයන් (SAA) අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරන ලදී. මෙම අරමුදල් කළමනාකරණ කටයුතු වලට අදාල වෙළෙඳපොල සහ ණය අවදානම් ද ස්වාධීනව නිරීක්ෂණය කර ඒවායින් ඇතිවන අවදානම් අදාළ ආයෝජන අභිප්‍රේක්ෂණ කමිටුවලට (IOC) මාසිකව සහ අවදානම් අධීක්ෂණ කමිටුව වෙත කාර්තුමය වශයෙන් වාර්තා කරන ලදී.

නව අවදානම් කළමනාකරණ රාමුවට සමගාමීව මහ බැංකුව පුරාම අවදානම් කළමනාකරණය, ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රතිපත්ති දක්වමින් මහ බැංකුව සඳහා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශයක් සකස් කිරීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙම ක්‍රියාවලියේදී, මහ බැංකුව අවදානම් කළමනාකරණයට අදාළ පිළිගත් ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ අනුගමනය කරමින් විවිධ පාර්ශ්ව සඳහා අවදානම් හිමිකාරත්වය හා කළමනාකරණයට අදාළ ව පැහැදිලි වගකීම් පවරන ලදී.

සමස්තයක් ලෙස මහ බැංකුවටම මේ වන විට බලපාන ප්‍රධාන මෙහෙයුම් අවදානම් හඳුනාගැනීම සඳහා මහ බැංකුවේ කළමනාකාරිත්වය අතර වාර්ෂික අවදානම් සමීක්ෂණයක් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල මහ බැංකුවේ මෙහෙයුම් අවදානම් වර්ගීකරණය සංශෝධනය කිරීමට උපයෝගී කරගනු ලබන අතර, මෙය ආයතනයට බලපාන මූලික මෙහෙයුම් අවදානම් සඳහා ප්‍රමුඛතාවන් ලබාදීමට මෙන්ම, එමගින් කළමනාකාරිත්වයේ වැඩි අවධානයක් එවැනි අවදානම් සඳහා යොමු කිරීමට ද සහාය වේ.

බැංකුව තුළ අවදානම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සහ බාහිර සම්පත්දායකයින් යොදා ගනිමින් වසර පුරාම විවිධ අවස්ථාවලදී මහ බැංකුවේ කාර්ය මණ්ඩලය සඳහා අවදානම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

මෙහෙයුම් අවදානම් කරන කාර්යය ශක්තිමත් කිරීමේ අරමුණින් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ලෝක බැංකුවේ මෙහෙයුම් අවදානම් කණ්ඩායම සමග සමීපව කටයුතු කළ අතර, මෙමගින් දැනට පවතින අවදානම් යහපාලන ව්‍යුහය හා මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීමේ රාමුව සමාලෝචනය කිරීම, අවදානම් ලේඛනය සකස් කිරීම මෙන්ම අවදානම් ශ්‍රේණිගත කිරීම හා මූල්‍ය නොවන අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම හා වාර්තා කිරීමට අදාළ නිශ්චිත පියවර කිහිපයක් ස්ථාපිත කිරීම සිදු කරන ලදී. මහ බැංකුවේ තෝරාගත් නියමු කාර්යයන් දෙකක

මෙහෙයුම් අවදානම් තක්සේරු කිරීමත් ලෝක බැංකුව විසින් සිදුකළ අතර මහ බැංකුවේ සියලුම ප්‍රධාන කාර්ය මණ්ඩලය සඳහා මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීම පිළිබඳ පුහුණු කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලදී.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අනිකුත් දෙපාර්තමේන්තුවල අවදානම් ලේඛන පිළියෙළ කිරීමට මෙන්ම මෙම excel පදනම් කරගත් අවදානම් ලේඛන ආකෘතිය තවදුරටත් විධිමත් කිරීමට ද පහසුකම් සලසන ලදී. මෙම ක්‍රියාවලිය අවසන් වූ පසු කළමනාකරණයට දෙපාර්තමේන්තුමය කටයුතු පිළිබඳව ප්‍රමුඛතා පදනමක් යටතේ ඉතා දැනුම්වත් වූ ද අවදානම පිළිබඳ සවිඥානික වූ ද තීරණ ගැනීමට හැකි වේ.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව 2019 ඔක්තෝම්බර් මස පළමුවන දින ස්වයංක්‍රීය සිදුවීම් වාර්තා කරන පද්ධතියක් ක්‍රියාත්මක කරන ලද අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවය කරන සියලු මට්ටම් වල කාර්ය මණ්ඩලයට භාවිතා කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත. මෙම ක්‍රමවේදය මගින් සිදුවීම් වාර්තා කිරීම, දිරිගැන්වීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම, සිදුවිය හැකි සිදුවීම් හා අවදානම් ප්‍රවණතා හඳුනාගැනීම මෙන්ම අවදානම් අවම කිරීමේ පියවර වැඩිදියුණු කිරීම යන කරුණු සාක්ෂාත් කරගනිමින් කේන්ද්‍රගත සිදුවීම් දත්ත ගබඩාවක් ගොඩනැගීමට ඉඩ හසර සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

මූල්‍ය අවදානම් කළමනාකරණ යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන එක් එක් අරමුදල් (IR, IIF සහ EPF) සඳහා වන ආයෝජන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශන වාර්ෂිකව සමාලෝචනය කිරීමේ ක්‍රියාවලිය තුළින් අවදානම් කළමනාකරණ රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉහත අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් හා සම්බන්ධ ප්‍රතිපාර්ශ්වකරුවන්, නිකුතුකරුවන් සහ භාරකරුවන් ආවරණය වන පරිදි ණය අවදානම් කළමනාකරණ රාමුව (credit risk management framework) වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියක් සිදුකරමින් පවතී. මේ අතර එක් එක් අරමුදල්වල ආයෝජන, මූල්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික වත්කම් විභජනයයන් (SAA), ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයන් (IPS) සහ ආයෝජන මාර්ගෝපදේශයන් (IG) තුළින් දක්වා ඇති නිශ්චිත සීමාවන් තුළ පවතින බව සහතික කිරීම සඳහා ආයෝජන වලට අදාළ ණය හා වෙළඳපොළ අවදානම් අඛණ්ඩව නිරීක්ෂණය කිරීම සහ හඳුනාගත් අවදානම් මහ බැංකු කළමනාකාරිත්වය වෙත ඉස්මතු කිරීමට සෑම විටම සිදු කරන ලදී.

### 48.1 ණය අවදානම

**(අ) භූගෝලීය ප්‍රදේශ අනුව ණය සංකේන්ද්‍රණය**

බැංකුවේ වර්ෂය අවසානයේ දී සැලකිය යුතු ණය සංකේන්ද්‍රණයන් භූගෝලීය ප්‍රදේශ අනුව (ආයතනයේ අයිතිකාරත්ව රටවල් පදනම් කරගෙන) පහත දැක්වේ.

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| ශ්‍රී ලංකාව | **384,424,472** | 489,380,034 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | **527,800,817** | 665,241,791 |
| ජපානය | **249,868,714** | 95,625,902 |
| බ්‍රිතාන්‍යය | **21,960,920** | 9,869,079 |
| යුරෝපය | **131,542,095** | 118,939,171 |
| අධි ජාතික මූල්‍ය ආයතන | **274,053,375** | 266,277,984 |
| වෙනත් | **131,112,411** | 96,953,618 |
| **මුළු මූල්‍ය වත්කම්** | **1,720,762,804** | 1,742,287,579 |

**(ආ) ආයතනය අනුව ණය සංකේන්ද්‍රණය වීම**

බැංකුවේ වර්ෂය අවසානයට වන සැලකිය යුතු ණය සංකේන්ද්‍රණය වීම ආයතන වර්ගයන් අනුව පහත දැක්වේ.

| | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| රජයන් | **1,284,462,212** | 1,340,399,127 |
| අධි ජාතික මූල්‍ය ආයතන | **274,053,375** | 266,277,984 |
| විදේශීය බැංකු සහ මූල්‍ය ආයතන | **145,340,379** | 121,789,777 |
| ශ්‍රී ලංකා බැංකු හා මූල්‍ය ආයතන | **3,585,399** | 1,353,647 |
| අනිකුත් | **13,321,439** | 12,467,044 |
| **මුළු මූල්‍ය වත්කම්** | **1,720,762,804** | 1,742,287,579 |

**(ඇ) ණය ශ්‍රේණිගත කිරීම මගින් ණය අවදානම මැනීම**

ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් සහ ෆිච් රේටින්ග්ස් සමාගමට අනුව ණය ශ්‍රේණිගත කිරීම සිදුකළ බැංකුවේ මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් නිකුතුකරුවන් පහත වගුවෙන් දැක්වේ. ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් සහ ෆිච් රේටින් සමාගමේ ශ්‍රේණිගත කිරීම් අනුව AAA සංකේතය ඉතා ඉහළම ශ්‍රේණිගත කිරීම හා අවම අපේක්ෂිත ණය අවදානම පෙන්නුම් කරන අතර, යම්කිසි ආයතනයකට පොළිය සහ මුල් මුදල් ගෙවීමට හැකි ශක්තිමත් තත්වයක් තිබෙන බව දක්වයි. AA සංකේතයෙන් ඉතා ඉහළ ශ්‍රේණිගත කිරීමක් හා ඉතා අඩු අපේක්ෂිත ණය අවදානමක් දැක්වෙන අතර, ශක්තිමත් තත්වයක් දක්වයි. A සංකේතයෙන් ඉහළ මධ්‍යම ශ්‍රේණියන් දක්වන අතර ශක්තිමත් තත්ත්වයක් හා ණය අවදානමේ පහළ තත්වයක් දක්වයි. BBB සංකේතයෙන් පහළ ම ආයෝජන ශ්‍රේණිගත කිරීමක් හා පහළ මට්ටමේ ණය අවදානමක් බවතින බව දක්වන අතර, ප්‍රමාණවත් ආරක්ෂක පරාමිති පෙන්නුම් කරයි. AAA සංකේතයට පහළ ශ්‍රේණි ප්‍රධාන ප්‍රභේදයන් අතර පවත්නා තත්ත්වය දැක්වීම පිණිස + හෝ - ලකුණු මගින් කාණ්ඩකරණය කළ හැකිය. ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් හා ෆිච් රේටින්ග් සමාගම් විසින් ණය ශ්‍රේණිගත නොකළ බව NR සංකේතයෙන් දැක්වේ.

| ණය ශ්‍රේණිගත කිරීම මගින් ණය අවදානම මැනීම | ණය ශ්‍රේණිය | 2019 රු. 000 | % | 2018 රු. 000 | % |
|---|---|---|---|---|---|
| **මුදල් හා මුදල් සමානයන්** | | | | | |
| ෆෙඩරල් රිසව් බැන්ක් - ඇ.එ.ජ./ රිසව් බැන්ක් ඔෆ් ඕස්ට්‍රේලියා /බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්/බැන්ක් ඔෆ් ජැපෑන්/ඩොයිෂ් බුන්ඩෙස් බැන්ක්/බැන්ක් ඔෆ් ඉන්ග්ලන්ඩ්/සෙවරීග්ස් රික්ස් බැන්ක්/බැන්ක් ඔෆ් කැනඩා/රිසව් බැන්ක් ඔෆ් නිව්සීලන්ඩ් | | **354,721,018** | **20.61%** | 327,240,508 | 18.78% |
| | AA | **633,850** | **0.04%** | 79,844 | 0.00% |
| | AA- | **32,167,823** | **1.87%** | 15,894,101 | 0.91% |
| | A+ | **32,434,119** | **1.88%** | 28,154,296 | 1.62% |
| | A | **260,070** | **0.02%** | 544,841 | 0.03% |
| | A- | **275,673** | **0.02%** | 51,131 | 0.00% |
| | BBB- | **1,126** | **0.00%** | 1,572 | 0.00% |
| | NR | **215,790** | **0.01%** | 208,883 | 0.01% |
| | | **420,709,469** | **24.45%** | 372,175,176 | 21.36% |
| **අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්** | | | | | |
| | AAA | **173,323,411** | **10.07%** | 137,844,494 | 7.91% |
| | AA+ | **476,808,494** | **27.71%** | 508,501,483 | 29.19% |
| | AA | **22,814,258** | **1.33%** | 3,892,615 | 0.22% |
| | AA- | **29,937,637** | **1.74%** | 26,115,880 | 1.50% |
| | A+ | **19,964,131** | **1.16%** | 13,325,830 | 0.76% |
| | A | **562,329** | **0.03%** | 196,616 | 0.01% |
| | BBB+ | **-** | **0.00%** | 134,539 | 0.01% |
| | NR | **6,390,749** | **0.37%** | 4,864,937 | 0.28% |
| | | **729,801,009** | **42.41%** | 694,876,394 | 39.88% |
| **ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්** | | | | | |
| | AAA | **31,442,202** | **1.83%** | 26,605,392 | 1.53% |
| | AA+ | **1,750,732** | **0.10%** | 2,335,172 | 0.13% |
| | AA | **4,072,209** | **0.24%** | 4,861,898 | 0.28% |
| | AA- | **309,103** | **0.02%** | 1,385,016 | 0.08% |
| | A+ | **369,944** | **0.02%** | 367,606 | 0.02% |
| | A- | **-** | **0.00%** | (596,292) | -0.03% |
| | BBB+ | **-** | **0.00%** | 671,554 | 0.04% |
| | NR | **549,078** | **0.03%** | 1,836,893 | 0.11% |
| | | **38,493,268** | **2.24%** | 37,467,239 | 2.15% |
| **ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ** | | | | | |
| | AA- | **49,364** | **0.00%** | - | 0.00% |
| | A+ | **34,141** | **0.00%** | - | 0.00% |
| | A | **13,119** | **0.00%** | - | 0.00% |
| | A- | **78,789** | **0.00%** | - | 0.00% |
| දේශීය ශ්‍රේණිගත කිරීම | AA | **772,254** | **0.05%** | - | 0.00% |
| | AA- | **67,564** | **0.00%** | 750 | 0.00% |
| | A+ | **430,063** | **0.03%** | - | 0.00% |
| | A- | **113,046** | **0.01%** | - | 0.00% |
| | NR | **463,577** | **0.03%** | - | 0.00% |
| | | **2,021,917** | **0.12%** | 750 | 0.00% |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | | **147,159,174** | **8.55%** | 147,427,452 | 8.46% |
| | | **147,159,174** | **8.55%** | 147,427,452 | 8.46% |
| **අනෙකුත් ලැබිය යුතු දෑ** | NR | **-** | **0.00%** | 961,284 | 0.06% |
| | | **-** | **0.00%** | 961,284 | 0.06% |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **1,338,184,837** | **77.77%** | 1,252,908,295 | 71.91% |

| | | | | | |
|---|---|---|---|---|---|
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | B | **76,511,883** | **4.45%** | 45,031,157 | 2.58% |
| නැවත විකිණීමේ ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත් | B | **50,354,879** | **2.93%** | 229,454,409 | 13.17% |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | B | **236,608,971** | **13.75%** | 198,632,571 | 11.40% |
| මූල්‍ය සහ අනෙකුත් ආයතනවල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | NR | **1,500,487** | **0.09%** | 1,381,879 | 0.08% |
| අනෙකුත් වත්කම් | AAA | **-** | **0.00%** | 198,899 | 0.01% |
| | AA+ | **1,126,217** | **0.08%** | 1,035,550 | 0.06% |
| | AA- | **2,058** | **0.00%** | 1,233 | 0.00% |
| | AA | **58,092** | **0.00%** | 55,313 | 0.00% |
| | A+ | **186,384** | **0.01%** | 6,904 | 0.00% |
| | A | **6,617** | **0.00%** | 6,620 | 0.00% |
| | A- | **345,045** | **0.02%** | 2,816 | 0.00% |
| | BBB+ | **14,288** | **0.00%** | - | 0.00% |
| | BBB- | **-** | **0.00%** | 523 | 0.00% |
| | BB+ | **194** | **0.00%** | 17,704 | 0.00% |
| | B | **8,301,507** | **0.48%** | 6,458,108 | 0.37% |
| | NR | **7,561,345** | **0.44%** | 7,095,598 | 0.41% |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **382,577,967** | **22.23%** | 489,379,284 | 28.09% |
| **මුළු මූල්‍ය වත්කම්** | | **1,720,762,804** | **100.00%** | 1,742,287,579 | 100.00% |

| **(ඇ) ප්‍රධාන ණය ශ්‍රේණිවල සාරාංශය** | **ණය ශ්‍රේණිය** | **2019 රු. 000** | **%** | **2018 රු. 000** | **%** |
|---|---|---|---|---|---|
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | |
| ෆෙඩරල් රිසව් බැන්ක් - ඇ.එ.ජ./රිසව් බෑන්ක් ඔෆ් ඕස්ට්‍රේලියා/ බෑන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්/බෑන්ක් ඔෆ් ජැපෑන්/ ඩොයිෂ් බුන්ඩෙස් බෑන්ක්/බෑන්ක් ඔෆ් ඉංග්ලන්ඩ්/ සෙවරීග්ස් රික්ස් බෑන්ක්/බෑන්ක් ඔෆ් කැනඩා/රිසව් බෑන්ක් ඔෆ් නිව්සීලන්ඩ් | | **354,721,018** | **20.61%** | 327,240,508 | 18.78% |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | | **147,159,174** | **8.55%** | 147,427,452 | 8.46% |
| | AAA | **204,765,613** | **11.90%** | 164,449,886 | 9.44% |
| | AA+/- | **568,543,470** | **33.04%** | 563,066,009 | 32.32% |
| | A+/- | **53,992,315** | **3.14%** | 42,044,028 | 2.41% |
| | BBB+/- | **1,126** | **0.00%** | 807,665 | 0.05% |
| | NR | **7,155,617** | **0.42%** | 7,871,997 | 0.45% |
| දේශීය ශ්‍රේණිගත කිරීම | AA | **772,254** | **0.05%** | - | 0.00% |
| | AA- | **67,564** | **0.00%** | 750 | 0.00% |
| | A+/- | **543,109** | **0.03%** | - | 0.00% |
| | NR | **463,577** | **0.03%** | - | 0.00% |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **1,338,184,837** | **77.77%** | 1,252,908,295 | 71.91% |
| **දේශීය මූල්‍ය වත්කම්** | AAA | **-** | **0.00%** | 198,899 | 0.01% |
| | AA+ | **1,126,217** | **0.07%** | 1,035,550 | 0.06% |
| | AA | **58,092** | **0.00%** | 55,313 | 0.00% |
| | AA- | **2,058** | **0.00%** | 1,233 | 0.00% |
| | A+ | **186,384** | **0.01%** | 6,904 | 0.00% |
| | A | **6,617** | **0.00%** | 6,620 | 0.00% |
| | A- | **345,045** | **0.02%** | 2,816 | 0.00% |
| | BBB+ | **14,288** | **0.00%** | - | 0.00% |
| | BBB- | **-** | **0.00%** | 523 | 0.00% |
| | BB+ | **194** | **0.00%** | 17,704 | 0.00% |
| | B | **371,777,240** | **21.60%** | 479,576,245 | 27.53% |
| | NR | **9,061,832** | **0.53%** | 8,477,477 | 0.49% |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **382,577,967** | **22.23%** | 489,379,284 | 28.09% |
| **මුළු මූල්‍ය වත්කම්** | | **1,720,762,804** | **100.00%** | 1,742,287,579 | 100.00% |

**48.2 පොළී අනුපාතික අවදානම**

(අ) විදේශීය මුදල් පොළී අනුපාත සංවේදීතාවය

**පොළී අනුපාත අවදානම යනු පොළී අනුපාතයේ වෙනස්වීම නිසා ඇතිවන පාඩු විඳීමේ අවදානමයි.**

සංචිත කළමණාකරන සහ උපදේශක වැඩසටහනෙහි (RAMP) ආයෝජන හැර අනෙකුත් ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹෙහි පොළී අනුපාත සංවේදීතාවය, පොළී අනුපාතය පදනම් අංක 10 කින් වෙනස්වීමෙන් විය හැකි ලාභය/ පාඩුව මගින් මනිනු ලැබේ. සංචිත කළමනාකරණය සහ උපදේශක වැඩසටහනෙහි පොළී අනුපාත සංවේදීතාවය, පොළී අනුපාතය පදනම් අංක 1 කින් වෙනස්වීමේදී සිදුවිය හැකි ලාභය හෝ පාඩුව මගින් මනිනු ලැබේ.

බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් ආයෝජන කළඹෙහි අවදානම් නිරාවරණ සංවේදීතාවය පහත දැක්වේ.

| බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ | විය හැකි පාඩුව (ඇ.එ.ජ. ඩොලර් මිලියන) | |
|---|---|---|
| | **2019** | **2018** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති ආයෝජන | **8.14** | 7.86 |
| **RAMP** | **0.03** | 0.03 |

අවදානම් කළමණාකරණ දෙපාර්තමේන්තුව විසින් විදේශ වත්කම් ආයෝජන කළඹෙහි පොළී අනුපාත අවදානම කළමනාකරණය කිරීම සඳහා පහත දැක්වෙන උපාය මාර්ගයන් අනුගමනය කරනු ලැබේ.

**(i)** පොළී අනුපාත වෙනස්වීම මත විදේශ වත්කම් ආයෝජන කළඹට ඇතිවන බලපෑම පොළී අනුපාත සංවේදීතාවය මගින් මනිනු ලබන අතරම පොළී අනුපාතය මෙන්ම ආයෝජනයේ කාල සීමාව සැලකිල්ලට ගනු ලබන විකරිත කාලච්ඡේදය පොළී අනුපාත අවදානම මැනීම සඳහා බැංකුව විසින් යොදා ගනු ලැබේ. විකරිත කාලච්ඡේදය මගින් 1% ක පොළී අනුපාත (ඵලදාව) වෙනස්වීම් මත සුරැකුම්පත්වල මිල වෙනස්වීම් මනිනු ලැබේ. ඉහළ විකරිත කාලච්ඡේදයක් මගින් ඉහළ අවදානමක් පෙන්නුම් කෙරේ. එමනිසා මූල්‍ය වෙළෙඳපොලවල් තුළ ඇති වන සංවර්ධනයන්, ආයෝජන කළඹේ ඇති සංලක්ෂණයන් හා බැඳුම්කර ආයෝජන කළඹේ ඇති අවදානම් අභිරුචිය යන කරුණු සලකා බැලීමෙන් අනතුරුව මහ බැංකුව විසින් උචිත විකරිත කාලච්ඡේදයන් කලින් කලට සකස් කරනු ලැබේ. විදේශ වත්කම් ආයෝජන කළඹේ විකරිත කාලච්ඡේදය පහත ආකාර වේ.

| ආයෝජන බණ්ඩය | විකරිත කාලච්ඡේදය | |
|---|---|---|
| | **2019** | **2018** |
| ප්‍රාග්ධන වෙළෙඳපොළ (ස්ථාවර ආදායම් සුරැකුම්පත්) | **2.03** | 2.08 |
| **RAMP** | **1.38** | 1.41 |

**(ii)** විකරිත කාලච්ඡේදය මගින් විශාල වශයෙන් වන මිල වෙනස්වීම් ගණනය නොවන නිසා, විදේශ සංචිත ආයෝජන කළඹේ පොළී අනුපාත අවදානම මැනීම සඳහා භාවිතා කරන තවත් මිනුමක් ලෙස උත්තලතාවය (convexity) දැක්විය හැකිය. උත්තලතාවය මගින් බැඳුම්කර මිල ඵලදා වක්‍රය සරල රේඛීය සඵල කාල පරිච්ඡේදයට සාපේක්ෂව වෙනස්වීම මනිනු ලබයි. මෙමගින් ස්ථාවර සුරැකුම්පත් මිල, පොළී අනුපාතයට දක්වන සංවේදීතාවය තවදුරටත් නියමිත අගයට ආසන්න කිරීමට ඉඩකඩ ලබාදේ. කාලච්ඡේදයේ වෙනස සඳහා ඵලදා අනුපාතයේ වෙනස උත්තලතාවයයි. ඉන් විකරිත කාලච්ඡේදයේ පුරෝකතනය කළ දෝෂය මනිනු ලබයි. මෙය ඵලදා අනුපාතය සම්බන්ධයෙන් සුරැකුම්පත්වල මිලයන්හි දෙවන අවකලනයයි.

**බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹේ උත්තලතාවය**

| බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ | විය හැකි පාඩුව (ඇ.එ.ජ.ඩොලර් මිලියන) | |
|---|---|---|
| | **2019** | **2018** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති ආයෝජන | **0.07** | 0.07 |
| **RAMP** | **0.04** | 0.04 |

**(iii) අවදානම් වටිනාකම (Value at Risk)**

සාමාන්‍ය වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ මූල්‍ය වෙළෙඳපොළ චලනයන් මගින් ආයෝජන කළඹක අයහපත් දිසාවට අවදානම තනි අගයකට සාරාංශ කිරීමක් අවදානම් වටිනාකම මගින් සිදුකරයි. එම නිසා අවදානම් වටිනාකම ඉලක්ක කාල සීමාව පුරාවට වන උපරිම අලාභය වන අතර එහි දී සත්‍ය අලාභය ඉහළ වීමේ සම්භාවිතාව පහළ හා කලින් සඳහන් මට්ටමේ විය හැක. අවදානම් වටිනාකම මගින්, අවදානම සහ තත්ත්වය හරහා සමාහාරය කළ හැකි මුදලින් ප්‍රකාශ කරනු ලබන සංඛ්‍යාවක් ලබා දේ.

සංචිත කළමනාකරණ සහ උපදේශක වැඩසටහනෙහි (RAMP) ආයෝජන හැර අනෙකුත් ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹෙහි අවදානම් වටිනාකම, 99% ක විශ්‍රම්භ ප්‍රාන්තරයක් හා දින 10 ක කාල සීමාවක් උපයෝගී කරගනිමින් මොන්ටෙ කාර්ලෝ (Monte Carlo) ක්‍රමය ඔස්සේ තක්සේරු කරනු ලබන අතර, RAMP ආයෝජනවල අවදානම් වටිනාකම 99% ක විශ්‍රම්භ ප්‍රාන්තරයක් හා මාසයක කාල සීමාවක් උපයෝගී කරගෙන තක්සේරු කරනු ලැබේ.

| බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ | අවදානම් වටිනාකම (ඇ.එ. ජ.ඩොලර්.මිලියන) | |
|---|---|---|
| | **2019** | **2018** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති ආයෝජන | **25.30** | 19.94 |
| **RAMP** | **1.17** | 0.78 |

### (iv) වෙළෙඳ හා විවෘත තත්ත්වයන් (Open Positions) හි සීමා

බැංකුව විසින් අන්තර් දින කටයුතු සඳහා නිශ්චිත ගණුදෙනුකරු සීමා (Specific Dealer Limit) ද එක්දින තත්ත්ව සීමා (Overnight Position Limit) ද බැංකුවේ ගණුදෙනුකරුවන් (Dealers) සඳහා පනවනු ලබයි.

විදේශීය සංචිත කළමනාකරණ කමිටුවට අඛණ්ඩ ව වාර්තා කිරීම පිණිස පොළී අනුපාතික අවදානම, සංචිත කළමනාකරණය හා උපදේශක වැඩසටහනෙහි ආයෝජනවලට අදාළව මනිනු ලැබේ.

### (ආ) දේශීය මුදල් පොළී අනුපාත සංවේදීතාවය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තත්ව ප්‍රකාශයේ දක්වා ඇති දේශීය භාණ්ඩාගාර බිල්පත් කළඹ, ජා.මු.වා.ප්‍ර. 9 යෙහි ඇති ව්‍යාපාරික ආකෘතික තක්සේරුව පරිදි අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට, මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි වාර්තා කරනු ලබයි. බැංකුව පොළී ආදායම ඉපැයීම අරමුණු කර නොගෙන රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම සිදු කරන හෙයින් රජයේ සුරැකම්පත් කළඹ, ආයෝජන කළඹක් ලෙස නොසැලකේ. බැංකුවේ මූලික අරමුණුවලින් එකක් වන, ආර්ථික හා මිල ස්ථායිතාවය රැකීම සම්බන්ධ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය වෙළෙඳපොළට ද්‍රවශීලතාවය විදීමට හෝ දේශීය වෙළෙඳපොළින් ද්‍රවශීලතාවය උකහා ගැනීමට බැංකුව රජයේ සුරැකම්පත් මිලදී ගැනීම හෝ විකිණීම සිදු කරනු ලබයි. එහෙයින් බැංකු ආයෝජන කළඹෙහි රජයේ සුරැකම්පත්වල ප්‍රමාණය, එහි මූල්‍ය ප්‍රතිපත්තිය විසින් තීරණය කරනු ලැබේ. ඊට අමතරව, රුපියල් වෙළෙඳපොළේ මූලික පොළී අනුපාත එනම්, ප්‍රතිමිලදී ගැනීමේ අනුපාතය හා ප්‍රතිවිකුණුම් අනුපාත, මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් තීරණය කරනු ලබයි. වැඩිදුරටත්, රුපියල් ද්‍රවශීලතාවය විදීම් හෝ වෙළෙඳපොළින් රුපියල් ද්‍රවශීලතාවය උකහා ගැනීම් සඳහා වූ බැංකුවේ ක්‍රියාමාර්ග පොදු රුපියල් වෙළෙඳපොළේ පොළී අනුපාතයන් කෙරෙහි බලපානු ලබයි. ඒ අනුව රජයේ සුරැකම්පත් කළඹ මගින් උද්ගත වන පොළී ආදායමේ වෙනස්වීම් කෙරෙහි ආයෝජන තීරණවලට වඩා බැංකුවෙහි රජයේ සුරැකම්පත් කළඹෙහි ප්‍රමාණය මෙන් ම මූලික වශයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග බලපානු ලබයි. එම නිසා බැංකුව දේශීය මූල්‍ය වත්කම්වල පොළියේ වන සංවේදීතාවය ගැන නොසලකනු ලැබේ.

### (ඇ) වත්කම් සහ වගකීම් කල් පිරීම හෝ ප්‍රතිමිල කිරීම පහත සඳහන් කාලච්ඡේදවලදී සිදුවේ.

| විදේශ මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරය: | හරිත සාමාන්‍ය පොළී අනුපාතය | 2019 එකතුව | හය මසක් හෝ අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| | % | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 0.5951 | **420,709,469** | 420,709,469 | - | - | - | - |
| ලාභ/අලාභ තුළින් සාධාරණ වටිනාකමට ඇති හා අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් | 1.6638 | **768,294,277** | 121,361,607 | 107,692,880 | 200,227,307 | 336,808,900 | 2,203,583 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | 0.7382 | **13,321,144** | 13,321,144 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්** | | **1,202,324,890** | 555,392,220 | 107,692,880 | 200,227,307 | 336,808,900 | 2,203,583 |
| **පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | | **133,838,030** | 8,712 | - | - | 189,322 | 133,639,996 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | **2,021,917** | 2,021,917 | - | - | - | - |
| **මුළු පොළී සංවේදි නොවන විදේශීය මූල්‍ය වත්කම්** | | **135,859,947** | 2,030,629 | - | - | 189,322 | 133,639,996 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **1,338,184,837** | 557,422,849 | 107,692,880 | 200,227,307 | 336,998,222 | 135,843,579 |
| **පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| ජා.මූ.අ. | 1.7430 | **238,808,553** | - | 2,505,672 | - | 148,177,305 | 88,125,576 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 1.5974 | **82,995,147** | 82,995,147 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්** | | **321,803,700** | 82,995,147 | 2,505,672 | - | 148,177,305 | 88,125,576 |
| **පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | | **958,248** | 958,248 | - | - | - | - |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | **989,958** | 792,944 | 130,095 | 66,919 | - | - |
| ජා.මූ.අ. | | **233,166,520** | - | - | - | - | 233,166,520 |
| අනෙකුත් විදේශීය වගකීම් | | **57,091,538** | 57,091,538 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්** | | **292,206,264** | 58,842,730 | 130,095 | 66,919 | - | 233,166,520 |
| **මුළු විදේශීය මූල්‍ය වගකීම්** | | **614,009,964** | 141,837,877 | 2,635,767 | 66,919 | 148,177,305 | 321,292,096 |
| **විදේශීය මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරය** | | **880,521,190** | 472,397,073 | 105,187,208 | 200,227,307 | 188,631,595 | (85,921,994) |

| **දේශීය මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය :** | **හරිත සාමාන්‍ය පොළී අනුපාතය** | **2019 එකතුව** | **හය මසක් හෝ අඩු** | **මාස 6 සිට 12 දක්වා** | **වර්ෂ 1 සිට 2 දක්වා** | **වර්ෂ 2 සිට 5 දක්වා** | **වර්ෂ 5 ට වැඩි** |
|---|---|---|---|---|---|---|---|
| | % | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 8.6555 | **76,511,883** | 5,919,706 | 19,206,084 | 47,364,717 | 3,700,911 | 320,465 |
| ප්‍රතිවිකිණීමේ ගිවිසුම් යටතේ මිළදී ගත් සුරැකුම්පත් | 8.0000 | **50,354,879** | 50,354,879 | - | - | - | - |
| අනිකුත් වත්කම් - සේවක ණය | 3.7969 | **7,504,730** | 207,586 | 210,149 | 434,744 | 1,396,201 | 5,256,050 |
| - බැංකුවලට දෙන ලද ණය | 4.1046 | **39,289** | 26,562 | 1,743 | 3,336 | 7,648 | - |
| - අනෙකුත් | 9.8528 | **9,989,349** | 1,406,078 | 798,551 | 427,503 | 2,062,387 | 5,294,830 |
| **මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්** | | **144,400,130** | 57,914,811 | 20,216,527 | 48,230,300 | 7,167,147 | 10,871,345 |
| **පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | | **236,608,971** | 236,608,971 | - | - | - | - |
| අනෙකුත් වත්කම් - අනෙකුත් | | **68,379** | 68,379 | - | - | - | - |
| හිමිකරු ප්‍රාග්ධන අයෝජන - අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති | | **1,500,487** | - | - | - | - | 1,500,487 |
| **මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්** | | **238,177,837** | 236,677,350 | - | - | - | 1,500,487 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **382,577,967** | 294,592,161 | 20,216,527 | 48,230,300 | 7,167,147 | 12,371,832 |
| **පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් | 7.0000 | **43,298,325** | 43,298,325 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්** | | **43,298,325** | 43,298,325 | - | - | - | - |
| **පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | | **254,581,620** | 254,581,620 | - | - | - | - |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | | **499,639** | 499,639 | - | - | - | - |
| සංසරණයෙහි පවතින මුදල් | | **677,967,150** | 677,967,150 | - | - | - | - |
| අනිකුත් ගෙවිය යුතු දෑ | | **12,702,888** | 12,702,888 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්** | | **945,751,297** | 945,751,297 | - | - | - | - |
| **මුළු දේශීය මූල්‍ය වගකීම්** | | **989,049,622** | 989,049,622 | - | - | - | - |
| **දේශීය මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය** | | **101,101,805** | 14,616,486 | 20,216,527 | 48,230,300 | 7,167,147 | 10,871,345 |

2018 දෙසැම්බර් 31 දිනට සංසන්දනාත්මක සංඛ්‍යා පහත පරිදි වේ.

| **විදේශ මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරයඃ** | **හරිත සාමාන්‍ය පොළී අනුපාතය** | 2018 එකතුව | හය මසක් හෝ අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| | % | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 1.9645 | 372,175,176 | 372,175,176 | - | - | - | - |
| ලාභ/අලාභ තුළින් සාධාරණ වටිනාකමට ඇති හා අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 2.4936 | 732,343,633 | 121,625,585 | 51,601,808 | 223,725,010 | 329,351,259 | 6,039,971 |
| ජා. මූ. අ. සම්බන්ධ වත්කම් | 1.0991 | 12,348,975 | 12,348,975 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්** | | 1,116,867,784 | 506,149,736 | 51,601,808 | 223,725,010 | 329,351,259 | 6,039,971 |
| **පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | | 135,078,477 | 9,667 | - | - | 199,961 | 134,868,849 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | 750 | 750 | - | - | - | - |
| අනෙකුත් ලැබිය යුතු දෑ | | 961,284 | 961,284 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්** | | 136,040,511 | 971,701 | - | - | 199,961 | 134,868,849 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | 1,252,908,295 | 507,121,437 | 51,601,808 | 223,725,010 | 329,551,220 | 140,908,820 |
| **පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| ජා.මූ.අ. | 2.1080 | 181,318,765 | - | - | - | 99,568,098 | 81,750,667 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 2.2345 | 79,158,977 | 79,158,977 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්** | | 260,477,742 | 79,158,977 | - | - | 99,568,098 | 81,750,667 |
| **පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | | 19,301,160 | 19,301,160 | - | - | - | - |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | 14,056,460 | 11,736,595 | 1,853,550 | - | 466,315 | - |
| ජා.මූ.අ. | | 235,669,481 | - | - | - | - | 235,669,481 |
| අනෙකුත් විදේශ වගකීම | | 134,730,933 | 134,730,933 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්** | | 403,758,034 | 165,768,688 | 1,853,550 | - | 466,315 | 235,669,481 |
| **මුළු විදේශීය මූල්‍ය වගකීම්** | | 664,235,776 | 244,927,665 | 1,853,550 | - | 100,034,413 | 317,420,148 |
| **විදේශීය මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරය** | | 856,390,042 | 426,990,759 | 51,601,808 | 223,725,010 | 229,783,161 | (75,710,696) |

| **දේශීය මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරය :** | හරිත සාමාන්‍ය පොළී අනුපාතය | 2018 එකතුව | හය මසක් හෝ අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| **පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්** | % | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 12.8451 | 45,031,157 | 43,443,802 | 407,078 | - | 886,336 | 293,941 |
| ප්‍රතිවිකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් | 8.9950 | 229,454,409 | 229,454,409 | - | - | - | - |
| අනිකුත් වත්කම් - සේවක ණය | 4.2160 | 6,846,041 | 269,780 | 275,058 | 563,545 | 1,810,962 | 3,926,696 |
| - බැංකුවලට දෙන ලද ණය | 7.7395 | 95,963 | 65,057 | 16,347 | 3,571 | 9,499 | 1,489 |
| - අනෙකුත් | 9.7553 | 7,792,394 | 470,308 | 1,012,421 | 1,417,860 | 1,105,413 | 3,786,392 |
| **මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්** | | 289,219,964 | 273,703,356 | 1,710,904 | 1,984,976 | 3,812,210 | 8,008,518 |
| **පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | | 198,632,571 | 198,632,571 | - | - | - | - |
| අනෙකුත් වත්කම් - අනෙකුත් | | 144,870 | 144,870 | - | - | - | - |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති ප්‍රාග්ධන ආයෝජන | | 1,381,879 | - | - | - | - | 1,381,879 |
| **මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්** | | 200,159,320 | 198,777,441 | - | - | - | 1,381,879 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | 489,379,284 | 472,480,797 | 1,710,904 | 1,984,976 | 3,812,210 | 9,390,397 |
| **පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම | 8.0000 | 28,311,221 | 28,311,221 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්** | | 28,311,221 | 28,311,221 | - | - | - | - |
| **පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | | 320,106,183 | 320,106,183 | - | - | - | - |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | | 348,718 | 348,718 | - | - | - | - |
| සංසරණයේ පවතින මුදල් | | 640,942,510 | 640,942,510 | - | - | - | - |
| අනිකුත් ගෙවිය යුතු දෑ | | 12,624,764 | 12,624,764 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්** | | 974,022,175 | 974,022,175 | - | - | - | - |
| **මුළු දේශීය මූල්‍ය වගකීම්** | | 1,002,333,396 | 1,002,333,396 | - | - | - | - |
| **දේශීය මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරය** | | 260,908,743 | 245,392,135 | 1,710,904 | 1,984,976 | 3,812,210 | 8,008,518 |

### 48.3 විදේශීය මුදල් අවදානම

බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යය යටතේ දරන්නා වූ විදේශීය වත්කම් තුළින් බැංකුවෙහි විදේශ මුදල් කටයුතු නිරූපණය වේ. විදේශ විනිමය වෙළෙඳපොළේ වෙනස්වීම හේතුවෙන් බැංකුව, විනිමය අවදානමට විවෘත වේ. මුදල් මණ්ඩලය සහ විදේශ සංචිත කළමනාකරණ කමිටුව විසින් බැංකුවේ ජාත්‍යන්තර සංචිතයෙහි විවිධ මුදල් වර්ගවලින් දැරිය යුතු ප්‍රතිශත ප්‍රමාණයක් නියම කර තිබේ. මුදල් වෙන්කිරීම පිළිබඳව තීරණය කිරීමේ දී රාජ්‍ය ණය ආපසු ගෙවීමේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනු ලැබේ. එබැවින් බැංකුව විසින් ප්‍රධාන මුදල් වර්ග බොහොමයක්, එනම් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ස්ටර්ලිං පවුම්, ජපන් යෙන්, යුරෝ, ඕස්ට්‍රේලියන් ඩොලර් හා නවසීලන්ත ඩොලර් රඳවා ගනු ලබයි. විදේශීය මුදල් මත පනවා ඇති සීමාවන්ට අනුකූලවීම සුපරීක්ෂණයට භාජනය වේ.

**විදේශ මුදල් සඳහා ශුද්ධ නිරාවරණය**

2019 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මුදල්වලට ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ නිරාවරණය පහත පරිදි වේ.

| | මුදල් වර්ගය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් | යුරෝ | ජපන් යෙන් | ස්ටර්ලිං පවුම් | විගැහි | ඕස්ට්‍රේලියානු ඩොලර් | කැනේඩියානු ඩොලර් | නවසීලන්ත ඩොලර් | අනිකුත් මුදල් | සියළුම මුදල් වර්ගවල එකතුව |
| 2019 දෙසැම්බර් 31 දිනට | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 298,441,454 | 29,837,438 | 25,036,846 | 494,431 | - | 384,072 | 40,968 | 574,817 | 66,121,401 | 420,931,427 |
| ලාභ/අලාභ තුළින් සාධාරණ වටිනාකමට ඇති හා අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරකුම්පත් | 692,861,144 | - | 5,058,431 | 6,666,792 | - | 33,173,454 | - | 18,046,158 | 12,488,298 | 768,294,277 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 175,413 | - | - | - | - | - | - | - | 1,846,504 | 2,021,917 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | - | - | - | - | 147,159,178 | - | - | - | - | 147,159,178 |
| මුළු විදේශීය මූල්‍ය වත්කම් | 991,478,011 | 29,837,438 | 30,095,277 | 7,161,223 | 147,159,178 | 33,557,526 | 40,968 | 18,620,975 | 80,456,203 | 1,338,406,799 |
| සමානුපාතය | 74.08% | 2.23% | 2.25% | 0.54% | 10.99% | 2.51% | 0.00% | 1.39% | 6.01% | 100% |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 957,119 | 17 | - | 1,050 | - | 62 | - | - | - | 958,248 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 792,943 | - | - | - | - | - | - | - | 197,015 | 989,958 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 82,995,147 | - | - | - | - | - | - | - | - | 82,995,147 |
| ජා.මූ.අ. | - | - | - | - | 471,975,073 | - | - | - | - | 471,975,073 |
| අනෙකුත් | 57,036,040 | - | - | - | - | - | - | - | 55,498 | 57,091,538 |
| මුළු විදේශීය මූල්‍ය බැරකම් | 141,781,249 | 17 | - | 1,050 | 471,975,073 | 62 | - | - | 252,513 | 614,009,964 |
| සමානුපාතය | 23.09% | 0.00% | 0.00% | 0.00% | 76.87% | 0.00% | 0.00% | 0.00% | 0.04% | 100% |
| ශුද්ධ විදේශීය මුදල් නිරාවරණය | 849,696,762 | 29,837,421 | 30,095,277 | 7,160,173 | (324,815,895) | 33,557,464 | 40,968 | 18,620,975 | 80,203,690 | 724,396,835 |

වත්මන් මූල්‍ය වර්ෂයට අදාල වෙළෙඳ දිනයන් සහිත හා තක්සේරු දිනයන් මීලඟ මුල්‍ය වර්ෂයට අදාලව සිදුවීමට නියමිත විදේශ විනිමය ගණුදෙනු මුදල් හා මුදල් සමානයන් තුළ අඩංගු වේ. එම ගණුදෙනු පහත පරිදි වේ.

| | ශ්‍රී ලංකා රුපියල් | ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් | ජපන් යෙන් |
|---|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට | රු. 000 | රු. 000 | රු. 000 |
| මිලදී ගැනුම් | 67,267,470 | 219,385,125 | - |
| විකුණුම් | - | (64,843,338) | (219,914,105) |
| ඉදිරි ප්‍රති ගිණුම | (1,895,152) | - | - |

2018 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මුදල්වලට ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ නිරාවරණය පහත පරිදි වේ.

| | මුදල් වර්ගය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් | යුරෝ | ජපන් යෙන් | ස්ටර්ලිං පවුම් | විශේෂ ගැනුම් හිමිකම් (විගැහි) | ඕස්ට්‍රේලියානු ඩොලර් | කැනේඩියානු ඩොලර් | නවසීලන්ත ඩොලර් | අනිකුත් මුදල් | සියළුම මුදල් වර්ගවල එකතුව |
| 2018 දෙසැම්බර් 31 දිනට | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 192,721,396 | 23,570,165 | 17,512,023 | 1,004,533 | - | 1,470,823 | 56,163 | 962,564 | 134,949,073 | 372,246,740 |
| ලාභ/අලාභ තුළින් සාධාරණ වටිනාකමට ඇති හා අනිකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 658,211,280 | - | 5,303,481 | 6,251,413 | - | 32,289,309 | - | 17,069,668 | 13,218,482 | 732,343,633 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | - | - | - | - | - | - | - | 750 | 750 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | - | - | - | - | 147,427,456 | - | - | - | - | 147,427,456 |
| අනිකුත් ලැබිය යුතු දෑ | 961,284 | - | - | - | - | - | - | - | - | 961,284 |
| මුළු විදේශීය මූල්‍ය වත්කම් | 851,893,960 | 23,570,165 | 22,815,504 | 7,255,946 | 147,427,456 | 33,760,132 | 56,163 | 18,032,232 | 148,168,305 | 1,252,979,863 |
| සමානුපාතය | 67.99% | 1.88% | 1.82% | 0.58% | 11.77% | 2.69% | 0.00% | 1.44% | 11.83% | 100% |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 19,299,921 | 444 | 1 | 57 | - | 737 | - | - | - | 19,301,160 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | - | 1,900,457 | - | - | - | - | - | 12,156,003 | 14,056,460 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 79,158,977 | - | - | - | - | - | - | - | - | 79,158,977 |
| ජා.මූ.අ. | 811,552 | - | - | - | 416,176,694 | - | - | - | - | 416,988,246 |
| අනෙකුත් | 43,282,075 | - | - | - | - | - | - | - | 91,448,858 | 134,730,933 |
| මුළු විදේශීය මූල්‍ය බැරකම් | 142,552,525 | 444 | 1,900,458 | 57 | 416,176,694 | 737 | - | - | 103,604,861 | 664,235,776 |
| සමානුපාතය | 21.46% | 0.00% | 0.29% | 0.00% | 62.65% | 0.00% | 0.00% | 0.00% | 15.60% | 100% |
| ශුද්ධ විදේශීය මුදල් නිරාවරණය | 709,341,435 | 23,569,721 | 20,915,046 | 7,255,889 | (268,749,238) | 33,759,395 | 56,163 | 18,032,232 | 44,563,444 | 588,744,087 |

වත්මන් මූල්‍ය වර්ෂයට අදාල වෙළෙඳ දිනයන් සහිත හා තක්සේරු දිනයන් මීලඟ මූල්‍ය වර්ෂයට අදාලව සිදුවීමට නියමිත විදේශ විනිමය ගණුදෙනු මුදල් හා මුදල් සමානයන් තුළ අඩංගු වේ. එම ගණුදෙනු පහත පරිදි වේ.

| 2018 දෙසැම්බර් 31 දිනට | ශ්‍රී ලංකා රුපියල් රු. 000 | ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් රු. 000 | ජපන් යෙන් රු. 000 |
|---|---|---|---|
| මිලදී ගැනුම් | 123,164,315 | 71,072,884 | - |
| විකුණුම් | - | (132,733,080) | (72,973,340) |
| ඉදිරි ප්‍රති ගිණුම | 11,469,221 | - | - |

## 48.4 මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම්

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම් පහත පරිදි වේ.

| | මාස 6ට අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2019 දෙසැම්බර් 31 දිනට | | | | | | |
| විදේශීය මූල්‍ය වත්කම් | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | **420,709,469** | **-** | **-** | **-** | **-** | **420,709,469** |
| ලාභ/අලාභ මගින් සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **8,659,736** | **3,439,276** | **22,442,101** | **12,641,807** | **-** | **47,182,920** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | **86,547,759** | **116,095,513** | **207,638,126** | **342,541,454** | **2,148,610** | **754,971,462** |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | **13,329,855** | **-** | **-** | **189,322** | **133,639,997** | **147,159,174** |
| මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වත්කම් | **529,246,819** | **119,534,789** | **230,080,227** | **355,372,583** | **135,788,607** | **1,370,023,025** |
| දේශීය මූල්‍ය වත්කම් | | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **19,124,135** | **11,819,359** | **49,530,248** | **3,938,496** | **350,990** | **84,763,228** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| නැවත විකිණීමේ එකඟතාවය මත මිලදීගත් සුරැකුම්පත් | **50,401,892** | - | - | - | - | **50,401,892** |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | **236,608,971** | - | - | - | - | **236,608,971** |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | - | - | - | **1,500,487** | **1,500,487** |
| අනෙකුත් වත්කම් | **2,531,816** | **1,656,834** | **1,997,187** | **6,312,460** | **14,360,202** | **26,858,499** |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වත්කම්** | **308,666,814** | **13,476,193** | **51,527,435** | **10,250,956** | **16,211,679** | **400,133,077** |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වත්කම්** | **837,913,633** | **133,010,982** | **281,607,663** | **365,623,539** | **152,000,286** | **1,770,156,102** |
| **විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | **958,248** | - | - | - | - | **958,248** |
| ආසියානු නිශ්කාෂන සංගමය | **82,995,147** | - | - | - | - | **82,995,147** |
| ජා.මූ.අ. | **2,449,181** | **4,962,312** | **14,832,012** | **110,510,673** | **373,148,819** | **505,902,997** |
| අනෙකුත් | **57,091,538** | - | - | - | - | **57,091,538** |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වගකීම්** | **143,494,114** | **4,962,312** | **14,832,012** | **110,510,673** | **373,148,819** | **646,947,930** |
| **දේශීය මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | **254,581,620** | - | - | - | - | **254,581,620** |
| රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු | **499,639** | - | - | - | - | **499,639** |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | **43,298,325** | - | - | - | - | **43,298,325** |
| සංසරණයෙහි පවත්නා මුදල් | **677,967,150** | - | - | - | - | **677,967,150** |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | **12,702,888** | - | - | - | - | **12,702,888** |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වගකීම්** | **989,049,622** | - | - | - | - | **989,049,622** |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්** | **1,132,543,736** | **4,962,312** | **14,832,012** | **110,510,673** | **373,148,819** | **1,635,997,552** |
| **ශුද්ධ වට්ටම් නොකළ මූල්‍ය වත්කම් / (වගකීම්)** | **(294,630,103)** | **128,048,670** | **266,775,651** | **255,112,865** | **(221,148,533)** | **134,158,550** |

| | මාස 6ට අඩු | මාස 6 සිට 12 දක්වා |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| **2019 දෙසැම්බර් 31 දිනට** | | |
| ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් | 221,766,015 | 7,671,870 |
| ව්‍යුත්පන්න මූල්‍ය වගකීම් | 219,914,106 | 7,628,628 |

## විදේශීය මුදල් පරිවර්තනය

විදේශීය මූල්‍ය වත්කම් හා වගකීම්වලට සම්බන්ධ සියලුම අනාගත මූල්‍ය ප්‍රවාහ වාර්තාගත කරන මුදල් ඒකකයට පරිවර්තනය කර ඇත්තේ වාර්තාකරණ දිනයට අදාළ විනිමය අනුපාතිකයටයි.

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වත්කම් හා වගකීම්හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල්පිරීම් පහත පරිදි වේ.

| 2018 දෙසැම්බර් 31 දිනට | මාස 6ට අඩු<br>රු. 000 | මාස 6 සිට 12 දක්වා<br>රු. 000 | වර්ෂ 1 සිට 2 දක්වා<br>රු. 000 | වර්ෂ 2 සිට 5 දක්වා<br>රු. 000 | වර්ෂ 5 ට වැඩි<br>රු. 000 | එකතුව<br>රු. 000 |
|---|---|---|---|---|---|---|
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 372,175,176 | - | - | - | - | 372,175,176 |
| ලාභ/අලාභ තුළින් සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 5,841,047 | 4,480,121 | 17,820,925 | 10,335,966 | - | 38,478,059 |
| අනිකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 86,972,038 | 58,347,392 | 236,273,635 | 341,808,636 | 9,636,712 | 733,038,413 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | 12,358,642 | - | - | 199,961 | 134,868,849 | 147,427,452 |
| අනිකුත් ලැබිය යුතු දෑ | 961,284 | - | - | - | - | 961,284 |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වත්කම්** | 478,308,187 | 62,827,513 | 254,094,560 | 352,344,563 | 144,505,561 | 1,292,080,384 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 42,861,171 | 1,928,480 | 128,960 | 1,150,405 | 384,130 | 46,453,146 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් | 229,504,446 | - | - | - | - | 229,504,446 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 198,632,571 | - | - | - | - | 198,632,571 |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | - | - | - | 1,381,879 | 1,381,879 |
| අනෙකුත් වත්කම් | 14,783,147 | 1,746,023 | 2,781,355 | 4,497,531 | 11,526,581 | 35,334,637 |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වත්කම්** | 485,781,335 | 3,674,503 | 2,910,315 | 5,647,936 | 13,292,590 | 511,306,679 |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වත්කම්** | 964,089,522 | 66,502,016 | 257,004,875 | 357,992,499 | 157,798,151 | 1,803,387,063 |
| **විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 19,301,160 | - | - | - | - | 19,301,160 |
| ආසියානු නිශ්කාශන සංගමය | 79,158,977 | - | - | - | - | 79,158,977 |
| ජා.මූ.අ. | 2,429,189 | 2,481,530 | 7,459,381 | 80,131,608 | 363,326,740 | 455,828,448 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනෙකුත් | 134,730,933 | - | - | - | - | 134,730,933 |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වගකීම්** | 235,620,259 | 2,481,530 | 7,459,381 | 80,131,608 | 363,326,740 | 689,019,518 |
| **දේශීය මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | 320,106,183 | - | - | - | - | 320,106,183 |
| රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු | 348,718 | - | - | - | - | 348,718 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 28,311,221 | - | - | - | - | 28,311,221 |
| සංසරණයේ පවත්නා මුදල් | 640,942,510 | - | - | - | - | 640,942,510 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 12,624,764 | - | - | - | - | 12,624,764 |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වගකීම්** | 1,002,333,396 | - | - | - | - | 1,002,333,396 |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්** | 1,237,953,655 | 2,481,530 | 7,459,381 | 80,131,608 | 363,326,740 | 1,691,352,914 |
| **ශුද්ධ වට්ටම් නොකළ මූල්‍ය වත්කම්/(වගකීම්)** | (273,864,133) | 64,020,486 | 249,545,494 | 277,860,891 | (205,528,589) | 112,034,149 |

| | **මාස 6ට අඩු** | **මාස 6 සිට 12 දක්වා** |
|---|---|---|
| **2018 දෙසැම්බර් 31 දිනට** | රු. **000** | රු. **000** |
| ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් | 103,671,375 | 18,943,940 |
| ව්‍යුත්පන්න මූල්‍ය වගකීම් | 114,165,546 | 19,919,739 |

### 48.5 ද්‍රවශීලතා අවදානම

මූල්‍ය ලියවිලි ආශ්‍රිත බැදීම් සපුරාලීමට අවශ්‍යවන අරමුදල් කෙටි දැනුම්දීමක දී සපයා ගැනීම සඳහා ඒකකයක් විසින් මුහුණපානු ලබන දුෂ්කරතා, ද්‍රවශීලතා අවදානම වේ. ඒකකයකට තම මූල්‍ය වත්කම් ඉක්මණින්, සාධාරණ අගයට වඩා ඉතා අඩු මිලකට විකිණීමට සිදුවීම ද ද්‍රවශීලතා අවදානමකි.

(අ) බැංකුවේ විදේශීය මුදල් වත්කම් සංයුතිය නිශ්චය කිරීමේදී ද ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වන්නේ ද්‍රවශීලතාවය සම්බන්ධයෙනි. අවශ්‍ය අවස්ථාවන්හි දී මැදිහත්වීමේ කාර්යයන් ද රාජ්‍ය ණය සහ ජා.මූ.අ. ණය ආපසු ගෙවීම වැනි වූ බැදීම් බේරුම් කිරීම සඳහා ද විදේශීය සංචිත ඇවර කිරීමේ විභව අවශ්‍යතාවය මෙයින් ගම්‍ය වේ. අරමුදල්වලට ඉක්මණින් ප්‍රවේශවීම තහවුරු කර ගැනීම සඳහා බැංකුව පහත සඳහන් මිනුම් යොදා ගනී.

- රඳවාගෙන ඇති සුරැකුම්පත්වල ද්‍රවශීලතා ලක්ෂණයන් පදනම් කළ ද්‍රවශීලතා වත්කම් අනුපාත.
- එක් එක් මුදල් වර්ගයෙන් සහ එක් එක් ප්‍රතිපාර්ශ්වය සමග රඳවා ගත හැකි සංචිතවල උපරිම සංකලනය වන සීමාවන්.

(ආ) විවට වෙළෙඳපොල කටයුතු වැනි දේශීය මුදල් ඒකකයන් භාවිතා කරමින් කරන කටයුතුවල ද්‍රවශීලතා අවදානම අඩු කිරීම සඳහා ඉතා ද්‍රවශීලී වෙළෙඳපොළ උපකරණ වන භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර, ඇප සුරැකුම් ලෙස භාවිතා කර ඇත. මහ බැංකු සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනීම්/විකිණීම් හා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මත ශ්‍රී ලංකා රුපියල් හුවමාරු වැනි උපකරණ භාවිතයෙන්, විදීම් හා උකහා ගැනීම් ඔස්සේ බැංකු පද්ධතියේ දෛනික ද්‍රවශීලතා තත්වය කළමනාකරණය කරනු ලබයි.

## 49. වත්කම් හා බැරකම්හි කල්පිරීම් විශ්ලේෂණය

| 2019 දෙසැම්බර් 31 දිනට | මාස 12ට අඩු | මාස 12ට වැඩි | එකතුව |
|---|---|---|---|
| **වත්කම්** | රු.000 | රු.000 | රු.000 |
| මුදල් හා මුදල් සමානයන් | **420,709,469** | **-** | **420,709,469** |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **11,679,449** | **26,813,819** | **38,493,268** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | **79,359,748** | **650,441,261** | **729,801,009** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **2,021,917** | **-** | **2,021,917** |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | **13,329,855** | **133,829,319** | **147,159,174** |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **26,334,798** | **50,177,085** | **76,511,883** |
| නැවත විකිණීමේ එකඟතාවය මත මිලදීගත් සුරැකුම්පත් | **50,354,879** | **-** | **50,354,879** |
| රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම් | **236,608,971** | **-** | **236,608,971** |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | **-** | **1,500,487** | **1,500,487** |
| අනෙකුත් වත්කම් | **3,191,431** | **14,410,316** | **17,601,747** |
| රන් | **-** | **173,438,430** | **173,438,430** |
| තොගය | **-** | **7,298,392** | **7,298,392** |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | **953,887** | **115,189** | **1,069,076** |
| දේපළ පිරියත සහ උපකරණ | **-** | **16,810,691** | **16,810,691** |
| අස්පෘශ්‍ය වත්කම් | **-** | **38,046** | **38,046** |
| **මුළු වත්කම්** | **844,544,404** | **1,074,873,035** | **1,919,417,439** |

| | | | |
|---|---|---|---|
| **බැරකම්** | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | **958,248** | **-** | **958,248** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **989,958** | **-** | **989,958** |
| ආසියානු නිශ්කාෂණ සංගමය | **82,995,147** | **-** | **82,995,147** |
| ජා.මූ.අ. | **-** | **471,975,073** | **471,975,073** |
| අනිකුත් | **51,409,578** | **5,681,960** | **57,091,538** |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | **254,581,620** | **-** | **254,581,620** |
| රජය සහ රජයේ ආයතනවල තැන්පතු | **499,639** | **-** | **499,639** |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කල සුරැකුම්පත් | **43,298,325** | **-** | **43,298,325** |
| සංසරණයෙහි පවත්නා මුදල් | **677,967,150** | **-** | **677,967,150** |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | **12,702,888** | **-** | **12,702,888** |
| විලම්භිත ප්‍රදාන | **1** | **4** | **5** |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | **-** | **11,990,647** | **11,990,647** |
| විවිධ බැරකම් සහ උපචිතයන් | **145,842** | **35,967** | **181,809** |
| **මුළු බැරකම්** | **1,125,548,396** | **489,683,651** | **1,615,232,047** |
| **ශුද්ධ වත්කම්/(බැරකම්)** | **(281,003,992)** | **585,189,384** | **304,185,392** |

| 2018 දෙසැම්බර් 31 දිනට | මාස 12ට අඩු | මාස 12ට වැඩි | එකතුව |
|---|---|---|---|
| **වත්කම්** | රු.000 | රු.000 | රු.000 |
| මුදල් හා මුදල් සමානයන් | 372,175,176 | - | 372,175,176 |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 9,975,116 | 27,492,123 | 37,467,239 |
| වෙනත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් | 80,991,450 | 613,884,944 | 694,876,394 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 750 | - | 750 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | 12,358,642 | 135,068,810 | 147,427,452 |
| අනෙකුත් ලැබිය යුතු දෑ - විදේශීය | 961,284 | - | 961,284 |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 43,874,997 | 1,156,160 | 45,031,157 |
| නැවත විකිණීමේ එකඟතාවය මත මිලදීගත් සුරැකුම්පත් | 229,454,409 | - | 229,454,409 |
| රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම් | 198,632,571 | - | 198,632,571 |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | 1,381,879 | 1,381,879 |
| අනෙකුත් වත්කම් | 2,595,128 | 12,284,140 | 14,879,268 |
| රන් | - | 149,683,439 | 149,683,439 |
| තොගය | - | 6,568,935 | 6,568,935 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | 1,789,376 | 124,712 | 1,914,088 |
| දේපළ පිරියත සහ උපකරණ | - | 16,955,853 | 16,955,853 |
| අස්පෘශ්‍ය වත්කම් | - | 30,437 | 30,437 |
| **මුළු වත්කම්** | 952,808,899 | 964,631,432 | 1,917,440,331 |
| **බැරකම්** | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 19,301,160 | - | 19,301,160 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 14,056,460 | - | 14,056,460 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 79,158,977 | - | 79,158,977 |
| ජා.මූ.අ. | - | 416,988,246 | 416,988,246 |
| අනිකුත් | 134,730,933 | - | 134,730,933 |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | 320,106,183 | - | 320,106,183 |
| රජය සහ රජයේ ආයතන වල ශේෂයන් | 348,718 | - | 348,718 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කල සුරැකුම්පත් | 28,311,221 | - | 28,311,221 |
| සංසරණයෙහි පවත්නා මුදල් | 640,942,510 | - | 640,942,510 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 12,624,764 | - | 12,624,764 |
| විලම්භිත ප්‍රදාන | 6 | 5 | 11 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | - | 12,016,804 | 12,016,804 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 49,224 | 36,721 | 85,945 |
| **මුළු බැරකම්** | 1,249,630,156 | 429,041,776 | 1,678,671,932 |
| **ශුද්ධ වත්කම්/(බැරකම්)** | (296,821,257) | 535,589,656 | 238,768,399 |

# 50. මූල්‍ය වත්කම් හා වගකීම්

## 50.1 මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ පේළි අයිතම සහ මූල්‍ය උපකරණ කාණ්ඩයන් අතර සැසඳුමක් පහත සටහනින් සපයයි.

| 2019 දෙසැම්බර් 31 දිනට | ලාභ/අලාභ මගින් සාධාරණ අගය | අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ණය උපකරණ | අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ස්කන්ධ උපකරණ | ක්‍රමක්ෂය පිරිවැය | එකතුව |
|---|---|---|---|---|---|
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | - | - | - | **420,709,469** | **420,709,469** |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **38,493,268** | - | - | - | **38,493,268** |
| අනිකුත් විස්තීරණ ආදායම මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | - | **729,801,009** | - | - | **729,801,009** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **2,021,917** | - | - | - | **2,021,917** |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම් | **146,484,804** | - | - | **674,370** | **147,159,174** |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | **186,999,989** | **729,801,009** | - | **421,383,839** | **1,338,184,837** |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | - | **76,511,883** | - | - | **76,511,883** |
| නැවත විකිණීමේ එකඟතාවය මත මිලදීගත් සුරැකුම්පත් | - | - | - | **50,354,879** | **50,354,879** |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | - | - | - | **236,608,971** | **236,608,971** |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | - | **1,500,487** | - | **1,500,487** |
| අනිකුත් වත්කම් | - | - | - | **17,601,747** | **17,601,747** |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | - | **76,511,883** | **1,500,487** | **304,565,597** | **382,577,967** |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | - | - | - | **958,248** | **958,248** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **989,958** | - | - | - | **989,958** |
| ආසියානු නිශ්කාශන සංගමය | - | - | - | **82,995,147** | **82,995,147** |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) | - | - | - | **471,975,073** | **471,975,073** |
| අනිකුත් | - | - | - | **57,091,538** | **57,091,538** |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | **989,958** | - | - | **613,020,006** | **614,009,964** |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | - | - | - | **254,581,620** | **254,581,620** |
| රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු | - | - | - | **499,639** | **499,639** |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | - | - | - | **43,298,325** | **43,298,325** |
| සංසරණයේ පවත්නා මුදල් | - | - | - | **677,967,150** | **677,967,150** |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | - | - | - | **12,702,888** | **12,702,888** |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | - | - | - | **989,049,622** | **989,049,622** |

| | ලාභ/අලාභ මගින් සාධාරණ අගය | අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ණය උපකරණ | අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ස්කන්ධ උපකරණ | ක්‍රමක්ෂය පිරිවැය | එකතුව |
|---|---|---|---|---|---|
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| 2018 දෙසැම්බර් 31 දිනට | | | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | - | - | - | 372,175,176 | 372,175,176 |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 37,467,239 | - | - | - | 37,467,239 |
| අනිකුත් විස්තීරණ ආදායම මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | - | 694,876,394 | - | - | 694,876,394 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 750 | - | - | - | 750 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම් | 146,959,035 | - | - | 468,418 | 147,427,452 |
| අනිකුත් ලැබිය යුතු දෑ | - | - | - | 961,284 | 961,284 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | 184,427,024 | 694,876,394 | - | 373,604,878 | 1,252,908,295 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | - | 45,031,157 | - | - | 45,031,157 |
| නැවත විකිණීමේ එකඟතාවය මත මිලදීගත් සුරැකුම්පත් | - | - | - | 229,454,409 | 229,454,409 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | - | - | - | 198,632,571 | 198,632,571 |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | - | 1,381,879 | - | 1,381,879 |
| අනෙකුත් වත්කම් | - | - | - | 14,879,268 | 14,879,268 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | - | 45,031,157 | 1,381,879 | 442,966,248 | 489,379,284 |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | - | - | - | 19,301,160 | 19,301,160 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 14,056,460 | - | - | - | 14,056,460 |
| ආසියානු නිශ්කාශන සංගමය | - | - | - | 79,158,977 | 79,158,977 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) | - | - | - | 416,988,246 | 416,988,246 |
| අනෙකුත් | - | - | - | 134,730,933 | 134,730,933 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | 14,056,460 | - | - | 650,179,316 | 664,235,776 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | - | - | - | 320,106,183 | 320,106,183 |
| රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු | - | - | - | 348,718 | 348,718 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | - | - | - | 28,311,221 | 28,311,221 |
| සංසරණයේ පවත්නා මුදල් | - | - | - | 640,942,510 | 640,942,510 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | - | - | - | 12,624,764 | 12,624,764 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | - | - | - | 1,002,333,396 | 1,002,333,396 |

## 51. සාධාරණ අගය පිළිබඳ හෙළිදරව් කිරීම්

### 51.1 වත්කම් හා වගකීම් වල සාධාරණ අගය

සාධාරණ අගය යනු වෙළඳපල ගණුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම් ගත කරනු ලබන දිනයට, ප්‍රධාන වෙළඳපොළෙහි දී හෝ එවැනි ප්‍රධාන වෙළඳපොළක් නොමැති අවස්ථාවක දී එම දිනයේ දී ලගා විය හැකි වඩාත් වාසිසහගත වෙළඳපොළෙහි දී, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදලයි. වගකීමක සාධාරණ අගය මගින් එම වගකීම ඉටු නොවීමේ අවදානම පිළිඹිබු වේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් 5.2 හි විස්තර කර ඇති පරිදි නිරීක්‍ෂණය කල හැකි වෙළඳපොළ මිල ගණන් නොමැති අවස්ථාවක දී මූල්‍ය වත්කම් හා වගකීම් වල සාධාරණ අගය තීරණය කිරීම සඳහා තක්සේරු ශිල්පයම භාවිතා කරයි.

නිරන්තර වෙළඳාම් සිදු නොවන සහ ඉතා අඩු මිල විනිවිදභාවයක් සහිත, විශය මූලික බවින් අඩු සාධාරණ අගයක් ඇති සහ ද්‍රවශීලතාවය, සංකේන්ද්‍රණය, වෙළඳපොළ සාධකයන් හි අවිනිශ්චිත බව, මිල උපකල්පන සහ විශේෂිත උපකරණයන්ට බලපාන අනෙකුත් අවදානම් මත පදනම් වූ මූල්‍ය උපකරණ සඳහා විවිධ මට්ටම්වල විනිශ්චයන් අවශ්‍ය වේ. මූල්‍ය උපකරණ සඳහා වූ සාධාරණ අගය ධූරාවලිය පහත දැක්වේ.

**පළමුවන මට්ටම** : අනන්‍ය වත්කම හෝ වගකීම සඳහා ක්‍රියාකාරී වෙළඳපල තුළ හිමි ප්‍රකාශිත (නොගලපන ලද) මිල ගණන් භාවිතයෙන් සාධාරණ අගය මැනීම;

**දෙවන මට්ටම** : පළමුවන මට්ටමේ සඳහන් ප්‍රකාශිත මිල ගණන් නොවන, එහෙත් ඍජුව (උදා:- මිල ගණන්) හෝ වක්‍රව (උදා:- මිල මගින් නිරීක්ෂිත) වත්කම් හා වගකීම් සඳහා නිරීක්ෂිත යෙදවුම් භාවිතයෙන් සාධාරණ අගය මැනීම, සහ

**තෙවන මට්ටම** : නිරීක්ෂණය කළ හැකි වෙළඳපල දත්ත මත පදනම් නොවූ (උදා:- නිරීක්ෂණය කළ නොහැකි) යෙදවුම් භාවිතයෙන් වත්කම් හා වගකීම්හි සාධාරණ අගය මැනීම.

පහත දැක්වෙන වගුව මගින් සාධාරණ අගය ධූරාවලිය අනුව වාර්තා කරන ලද වත්කම් හා වගකීම්වල විශ්ලේෂණයක් පෙන්නුම් කරයි.

| 2019 දෙසැම්බර් 31 දිනට | පළමුවන මට්ටම<br>රු. 000 | දෙවන මට්ටම<br>රු. 000 | තෙවන මට්ටම<br>රු. 000 | එකතුව<br>රු. 000 |
|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | |
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **38,493,268** | - | - | **38,493,268** |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් | **729,801,009** | - | - | **729,801,009** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | **2,021,917** | - | **2,021,917** |
| | **768,294,277** | **2,021,917** | - | **770,316,194** |
| **මූල්‍ය නොවන විදේශ වත්කම්** | | | | |
| රන් | **173,438,430** | - | - | **173,438,430** |
| | **173,438,430** | - | - | **173,438,430** |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **76,511,883** | - | - | **76,511,883** |
| මූල්‍ය සහ රජයේ ආයතනයන්හි ස්කන්ධ ආයෝජන | - | - | **1,500,487** | **1,500,487** |
| **අනෙකුත් මූල්‍ය නොවන වත්කම්** | **76,511,883** | - | **1,500,487** | **78,012,370** |

| | | | | |
|---|---|---|---|---|
| ඉඩම් | - | - | **8,930,375** | **8,930,375** |
| ගොඩනැගිලි | - | - | **6,611,561** | **6,611,561** |
| | - | - | **15,541,936** | **15,541,936** |
| **මූල්‍ය වගකීම්** | | | | |
| අන්තර්ගත ව්‍යුත්පන්න - විනිමය විකල්ප | - | - | **66,919** | **66,919** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | **923,039** | - | **923,039** |
| | - | **923,039** | **66,919** | **989,958** |

| 2018 දෙසැම්බර් 31 දිනට | පළමුවන මට්ටම | දෙවන මට්ටම | තෙවන මට්ටම | එකතුව |
|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **මූල්‍ය වත්කම්** | | | | |
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 37,467,239 | - | - | 37,467,239 |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් | 694,876,394 | - | - | 694,876,394 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 750 | - | 750 |
| | 732,343,633 | 750 | - | 732,344,383 |
| **මූල්‍ය නොවන විදේශ වත්කම්** | | | | |
| රන් | 149,683,439 | - | - | 149,683,439 |
| | 149,683,439 | - | - | 149,683,439 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 45,031,157 | - | - | 45,031,157 |
| මූල්‍ය සහ අනෙකුත් ආයතනයන්හි ස්කන්ධ ආයෝජන | - | - | 1,381,879 | 1,381,879 |
| | 45,031,157 | - | 1,381,879 | 46,413,036 |
| **අනෙකුත් මූල්‍ය නොවන වත්කම්** | | | | |
| ඉඩම් | - | - | 8,930,375 | 8,930,375 |
| ගොඩනැගිලි | - | - | 6,702,566 | 6,702,566 |
| | - | - | 15,632,941 | 15,632,941 |
| **මූල්‍ය වගකීම්** | | | | |
| අන්තර්ගත ව්‍යුත්පන්න - විනිමය විකල්ප | - | - | 466,315 | 466,315 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 13,590,145 | - | 13,590,145 |
| | - | 13,590,145 | 466,315 | 14,056,460 |

**මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි ස්කන්ධ ආයෝජන**

කොටසක ශුද්ධ වත්කම් තක්සේරු ශිල්ප ක්‍රමය භාවිතයෙන්, ස්කන්ධ ආයෝජනයන්හි සාධාරණ අගය ගණනය කරන ලදී.

**නිරීක්ෂණය කළ නොහැකි සුවිශේෂී යෙදවුම්**

කොටසක ශුද්ධ වත්කම් අගය

**සංවේදීතා විශ්ලේෂණය**

කොටසක ශුද්ධ වත්කම් අගයේ 10% ක වැඩිවීම හේතුවෙන් සාධාරණ අගය 10% කින් ඉහල යයි.

| | 2019 | 2018 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **1,381,879** | 41,095 |
| එකතු කිරීම | **2,749** | - |
| අනෙකුත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් සාධාරණ අගයට වූ ලාභය | **115,859** | 1,360,573 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | - | (19,789) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,500,487** | 1,381,879 |

**ඉඩම් හා ගොඩනැගිලි**

**අගය කිරීමේ ක්‍රමය**

ඍජු සන්සන්දනාත්මක ක්‍රමය සමඟ වෙළඳපොළ ප්‍රවේශය භාවිතා කරමින් ඉඩම් අගය කරනු ලබන අතර එහිදී වත්කම නුදුරේදී සිදුකරන ලද සමාන වත්කමක විකුණුම් අගය සමඟ සංසන්දනය කොට එකී අගයට එකතු කළ හෝ නාමිකව එකතු කළ වැඩිදියුණු අගයක් ගැලපුම් කිරීමකින් තොරව ස්ථානීය වෙනස්වීම් (Points of Difference) සඳහා පමණක් ගැලපුම් කිරීමෙන් සාධාරණ අගය ගණනය කරනු ලබයි.

පොදු මහජනතාවට සේවා සපයන රාජ්‍ය අංශ ඒකකයන් විසින් පාලනය කරනු ලබන වත්කම්, විවෘත ද්‍රවශීල වෙළඳපොලෙහි හුවමාරු නොවන බැවින් සෙන්ට්‍රල් පොයින්ට්, වයිට් අවේස්, ලොයිඩ්ස් ගොඩනැගිලි හැර අනෙකුත් සියළුම ගොඩනැගිලි ක්ෂය කරන ලද ප්‍රවර්තන ප්‍රතිස්ථාපන පිරිවැය (DRC) ක්‍රමයට තක්සේරු කර ඇත.

අනෙකුත් ගොඩනැගිලි අගය කිරීම සඳහා, තනි වර්තමාන අගයකට හැර වූ (වට්ටම් කල) ඇස්තමේන්තුගත අනාගත ආදායම, ලාභය හෝ මුදල් ප්‍රවාහයන් මත පදනම්ව දේපල අගය කරනු ලබන ආදායම් ප්‍රවේශය යොදා ගන්නා ලදී.

පහත සඳහන් දෑ හේතුවෙන් වෙළඳපොල ප්‍රවේශය යටතේ ඇස්තමේන්තු කරන ලද සාධාරණ අගය වැඩිවීම/(අඩුවීම) සිදුවිය හැක.

- පර්චසයක ඒකක මිල වැඩිවීම/(අඩුවීම)
- වර්ග අඩියක ඒකක මිල වැඩිවීම/(අඩුවීම)
- ගොඩනැගිලි සඳහා වන ක්ෂය අනුපාතය අඩුවීම/(වැඩිවීම)

පහත සඳහන් දෑ හේතුවෙන් ආදායම් ප්‍රවේශය යටතේ ඇස්තමේන්තු කරන ලද සාධාරණ අගය වැඩිවීම/(අඩුවීම) සිදුවිය හැක.

- දළ වාර්ෂික කුලිය වැඩිවීම/(අඩුවීම)
- වසර මිලදී ගැනීම (years purchase) වැඩිවීම/(අඩුවීම)

**ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ**

වෙළෙඳපොලහි ඇති ඉදිරි ලක්ෂ්‍ය බහිර් නිවේෂණය (extrapolation) කිරීමෙන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ අගය කිරීමේ ආකෘති සඳහා අවශ්‍ය ඉදිරි මිල ගණන් සහ අගය කරන දිනට අදාල එක් එක් මුදල් වර්ගයන්හි ශුන්‍ය පොළී එලදා වක්‍ර මත පදනම් ව ගණනය කල වට්ටම් සාධක යොදා ගැනේ. අගය කරන ලද උපකරණයේ ආන්තිකයක් අඩංගු වේ නම්, ආන්තික අනුපාතයන් හි බලපෑම ඉදිරිපත් කිරීමටත් ඉදිරි මිල ගණන්වලට හා/හෝ පොළී අනුපාතයන්වලට ගැලපීම සිදුකරනු ලබයි.

**අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ - මූල්‍ය විකල්පයන්**

අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල අගය බ්ලැක්ෂෝල්ස් (Black-scholes) ආදර්ශකය භාවිතා කරමින් ගණනය කර ඇති අතර එහි වෙනස් වීම පහත පරිදි වේ.

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | **466,316** | 1,244,582 |
| ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් සාධාරණ අගයට වූ අලාභ | **(399,397)** | (778,266) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **66,919** | 466,316 |

**භාවිතා කරන ලද නිරීක්ෂණය කල නොහැකි සුවිශේෂී යෙදවුම්**

| | |
|---|---|
| වට්ටම් අනුපාතය | 10% |
| උච්චාවචනය | 4% |

| **සංවේදීතා විශ්ලේෂණය** | **වට්ටම් අනුපාතය** | | **උච්චාවචනය** | |
|---|---|---|---|---|
| | 9% | 11% | 3% | 5% |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| අන්තර්ගත ව්‍යුත්පන්න උපකරණ - මූල්‍ය විකල්පයන් | 68,085 | 65,882 | 66,833 | 67,679 |

| **අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මත විලම්භිත වත්කම්** | **2019**<br>රු. 000 | **2018**<br>රු. 000 |
|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | **102,406** | 369,455 |
| වසර තුළදී ක්‍රමක්ෂය කරන ලද අධිමිල | **(79,344)** | (267,049) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **23,062** | 102,406 |

## 51.2 ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම්

ගිවිසුම්වල කෙටිකාලීන ස්වභාවය නිසා, ආසන්න සාධාරණ අගයක් ලබා ගැනීමට ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල වාර්තා කළ අගය සලකා බලනු ලැබේ. 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමිලදී ගැනීම් යටතේ වන ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් නොමැත (2018 - ශේෂයක් නොමැත). 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ පවතින ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ධාරණ වටිනාකම රු.මි. 50,354.88 (2018 - රු.මි. 229,454.41) ක් වන අතර නිත්‍ය තැන්පතු පහසුකම් රු.මි. 43,298.32 (2018 - රු.මි. 28,311.22) කි.

## 51.3 සංසරණයේ ඇති මුදල්

සංසරණයේ ඇති මුදල්වල සාධාරණ අගය, මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකර ඇති පරිදි ඒවායේ මුහුණත වටිනාකමය.

## 51.4 තැන්පතු වටිනාකම

ඉල්ලූ විටෙක දී ගෙවිය යුතු බැවින් තැන්පතුවල ධාරණ අගය ආසන්න සාධාරණ අගය ලෙස සලකනු ලැබේ.

## 51.5 සාධාරණ වටිනාකමට මනිනු නොලබන මූල්‍ය උපකරණ

සාධාරණ වටිනාකමට මනිනු නොලබන මූල්‍ය උපකරණ පහත වතුවෙන් දැක්වේ.

| | ධාරණ වටිනාකම් | | සාධාරණ වටිනාකම් | |
|---|---|---|---|---|
| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | |
| මුදල් සහ මුදල් සමානයන් | **420,709,469** | 372,175,176 | **420,709,469** | 372,175,176 |
| ජා.මු.අ. සම්බන්ධ වත්කම් | **674,369** | 468,418 | **677,113** | 457,745 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | **-** | 961,284 | **-** | 961,284 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිළදී ගත් සුරැකුම්පත් | **50,354,879** | 229,454,409 | **50,354,879** | 229,454,409 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | **236,608,971** | 198,632,571 | **236,608,971** | 198,632,571 |
| අනිකුත් වත්කම් | **17,601,747** | 14,879,268 | **14,841,261** | 13,040,368 |
| **විදේශීය මූල්‍ය වගකීම්** | | | | |
| බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන | **958,248** | 19,301,160 | **958,248** | 19,301,160 |
| ආසියානු නිශ්කාෂන සංගමය | **82,995,147** | 79,158,977 | **82,995,147** | 79,158,977 |
| ජා.මු.අ. | **471,975,073** | 416,988,246 | **471,975,073** | 416,988,246 |
| අනෙකුත් | **57,091,538** | 134,730,933 | **57,091,538** | 134,730,933 |
| **දේශීය මූල්‍ය වගකීම්** | | | | |
| බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවල තැන්පතු | **254,581,620** | 320,106,183 | **254,581,620** | 320,106,183 |
| රජයේ සහ රජයේ ආයතනවල තැන්පතු | **499,639** | 348,719 | **499,639** | 348,719 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අළෙවිකල සුරැකුම්පත් | **43,298,325** | 28,311,221 | **43,298,325** | 28,311,221 |
| සංසරණයේ පවතින මුදල් | **677,967,150** | 640,942,510 | **677,967,150** | 640,942,510 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | **12,702,888** | 12,624,764 | **12,702,888** | 12,624,764 |

ජා.මු.අ. සම්බන්ධ වත්කම්, බැංකු වෙත ලබා දී ඇති ණය හා අභ්‍යන්තර අරමුදල්වලින් කරන ලද ආයෝජනවල සාධාරණ වටිනාකම ඒවායේ ධාරණ වටිනාකමෙන් වෙනස් වේ.

විදේශ මූල්‍ය වත්කම් යටතේ දක්වා ඇති මුදල් හා මුදල් සමානයන් හා අනෙකුත් ලැබිය යුතු දෑ, දේශීය මූල්‍ය වත්කම් යටතේ දක්වා ඇති ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත් හා රජයට දෙන ලද කාලීන අත්තිකාරම්, විදේශීය මූල්‍ය වගකීම් යටතේ දක්වා ඇති බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන, ආසියානු නිෂ්කාශන සංගමය, ජා.මු.අ. සහ අනෙකුත් විදේශීය මූල්‍ය වගකීම් සහ දේශීය මූල්‍ය වගකීම් යටතේ දක්වා

ඇති බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනවල තැන්පතු, රජය හා රජයේ ආයතනවල තැන්පතු, ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත්, සංසරණයේ පවත්නා මුදල් හා අනෙකුත් ගෙවිය යුතු දෑ හි සාධාරණ වටිනාකම හා ඒවායෙහි ධාරණ වටිනාකම් සමාන වේ.

## 52. සන්සන්දනාත්මක තොරතුරු

| පෙරාතුව ඉදිරිපත් කළ ආකාරයට: | 2018 රු. 000 |
|---|---|
| **දේශීය මූල්‍ය වත්කම්** | |
| බැංකුවලට දෙනු ලැබූ ණය | 95,963 |
| අනෙකුත් වත්කම් | 14,783,305 |
| **දේශීය මූල්‍ය වගකීම්** | |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 18,333 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 12,606,431 |

| වත්මන් ඉදිරිපත් කිරීම | සටහන | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|---|
| **දේශීය මූල්‍ය වත්කම්** | | | |
| අනෙකුත් වත්කම් | 52.1 | **17,601,747** | 14,879,268 |
| **දේශීය මූල්‍ය වගකීම්** | | | |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 52.2 | **12,702,888** | 12,624,764 |

**52.1** 2018 වසරේ දී මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි බැංකුවලට දෙන ලද ණය යටතේ දක්වන ලද රු.මි. 95.56 ක අගය මෙම වසරේ දී වඩා හොඳ ඉදිරිපත් කිරීමක් උදෙසා අනෙකුත් වත්කම් යටතේ දක්වා ඇත.

**52.2** 2018 වසරේ දී මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සේවක ප්‍රතිලාභ සැලසුම්හි ශේෂයක් ලෙස දක්වන ලද රු.මි. 18.33 ක අගය මෙම වසරේ දී වඩා හොඳ ඉදිරිපත් කිරීමක් උදෙසා අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ දක්වා ඇත.

## 53. සම්බන්ධිත පාර්ශවයන්

### 53.1 රජය සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමග ගනුදෙනු

බැංකුව විසින් සාමාන්‍ය මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ගණුදෙනුවලට පිවිසෙනු ලැබේ. ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ම.බැ. පරම අයිතිකරු වශයෙන්), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන සම්බන්ධිත පාර්ශ්වයන්ට ඇතුළත් වේ. අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත 24 (සංශෝධිත) සම්බන්ධිත පාර්ශ්වයන් පිළිබඳ හෙළිදරව් කිරීමේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව, තනිව ගත් කළ සැළකිය යුතු මට්ටමේ වන හා අනෙකුත් ගණුදෙනුවලදී සාමූහිකව සැළකිය යුතු මට්ටමේ වන, රජය සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන සමඟ එළැඹි ගණුදෙනු සහ විධිවිධානයන් පහත පරිදි වේ.

| ගනුදෙනු වල ස්වභාවය | 2019 රු. 000 | 2018 රු. 000 |
|---|---|---|
| ගනුදෙනු: | | |
| මිලදී ගත් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **42,559,699** | 20,458,308 |
| විකිණූ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | - | 58,674,669 |
| ප්‍රතිවිකිණීමේ හා ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් හෝ විකුණූ ශ්‍රී.ලං.ම.බැ. සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **5,895,258,629** | 4,800,410,194 |
| ප්‍රතිවිකිණීමේ හා ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් හෝ විකුණූ ශ්‍රී.ලං.ම.බැ. සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් සඳහා පොලී ආදායම් හෝ වියදම් | **2,832,113** | 2,426,510 |
| රජය වෙනුවෙන් ලද අරමුදල් (සටහන 25.1 - 25.5) | **1,040,676,718** | 1,188,003,197 |
| රජය වෙනුවෙන් දරන ලද විය පැහැදම් (සටහන 25.1 - 25.5) | **1,118,006,037** | 1,144,407,670 |
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ පිරිවැය (සටහන 53.1.3) | **1,459,560** | 1,605,463 |
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ, සේවා සහ බදු සඳහා ගෙවීම් (සටහන 53.1.4) | **2,050,704** | 2,234,657 |
| වර්ෂය තුළදී දළ විදේශ විනිමය ගනුදෙනු (සටහන 53.1.6) | | |
| - විකුණුම් | **7,242,180** | 89,011,978 |
| - මිලට ගැනීම් | **41,331,290** | 25,078,570 |
| - ඇ.එ.ජ.ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **193,142,524** | 221,347,285 |
| වර්ෂය තුළදී අත්හල දේපල වෙනුවෙන් ලද අරමුදල් | **361,297** | 118,989 |
| කුලී ආදායම් | **346,790** | 395,682 |
| ලාභාංශ ආදායම් | **149,686** | 126,111 |
| අනෙකුත් ගනුදෙනු (සටහන 53.1.9) | **938,056** | 1,266,674 |

| | | |
|---|---|---|
| ශේෂයන් : | | |
| ශ්‍රී ලං.ම.බැ. විසින් අයිතිකාරීත්වය දරන ලද ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් (සටහන 53.1.7) | **76,511,883** | 45,031,157 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් (සටහන 15) | **236,608,971** | 198,632,571 |
| නිශ්චිත අරමුණු සඳහා මිලදීගත් රජයේ සුරැකුම්පත් | **9,710,804** | 7,524,488 |
| බැංකු හා මූල්‍ය ආයතනවල තත්කාලීන දළ පියවුම් පද්ධතියේ (RTGS) ශේෂයන් (සටහන 26) | **148,823,686** | 192,367,084 |
| ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන නොස්ට්‍රෝ ගිණුමේ ශේෂය | **216,077** | 209,155 |
| භාණ්ඩාගාරය හා අනෙකුත් අමාත්‍යාංශ වෙත කළ යුතු ගෙවීම් (සටහන 25) | **57,036,040** | 134,657,025 |
| දෙසැම්බර් 31 දිනට රජයේ හා රජයේ ආයතන සමග ජංගම ගිණුම් ශේෂයන් | **(119,522)** | (141,802) |
| අත්හල දේපල වල ශේෂයන් | **3,125,129** | 2,571,814 |
| අනෙකුත් ශේෂයන් (සටහන 53.1.9) | **155,651** | 212,877 |

**53.1.1** මුදල් නීති පනතේ 28-33 වගන්ති අනුව පැවරෙන ලද බලය ප්‍රකාර බැංකුවේ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ බලපත්‍රලාභී බැංකුවල කටයුතු නියාමනය හා සුපරීක්ෂණය කරනු ලබයි. 2018 දෙසැම්බර් 31 දිනට රජය මගින් අරමුදල් සැපයූ හෝ රජයේ සුවිශේෂ බලපෑමක් ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු 06 ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 01 ක් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණයට භාජනය කර ඇති අතර ඒවා බැංකුවේ සම්බන්ධිත පාර්ශ්ව වේ.

බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි බැංකු නොවන, මූල්‍ය සමාගම්වල නියාමනය සහ සුපරීක්ෂණය කරගෙන යනු ලබයි. ඒ අනුව, රජය විසින් පාලනය කරනු ලබන හෝ අරමුදල් සපයා ඇති බැංකුවලට සම්බන්ධිත ආයතන සහ බැංකු නොවන මූල්‍ය සමාගම් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණය යටතට පැවරේ.

**53.1.2** මුදල් නීති පනතේ 113 වගන්තිය ප්‍රකාර රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය, මුදල් මණ්ඩලය හා බැංකුව සතු වේ. ඒ අනුව, රජයේ නියෝජිතයා ලෙස, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අයවැය අවශ්‍යතා සහ දේශීය හා විදේශීය ණය සේවා සපුරා ගැනීම සඳහා දේශීය වෙළෙඳපොළට සුරැකුම්පත් නිකුත් කිරීම කරනු ලැබේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ණය කළමනාකරණය හා ණය වෙළෙඳපොළ සංවර්ධනය කිරීම කරනු ලබයි. රජයේ අවශ්‍යතා හා එහි පියවීම් බැරකම් සපුරාලීම සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය ණය පරිපාලනය කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබේ.

**53.1.3** මුදල් නීති පනතේ 49 වගන්තිය ප්‍රකාර, මුදල් නිකුත් කිරීමේ තනි අයිතිය හා බලතල බැංකුව සතු වේ. ඒ අනුව බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, නෛතික ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ තනි බලධාරියා ලෙස කටයුතු කරයි. මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ කාර්යය ඩී ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (පුද්) සමාගම විසින් කරගෙන යනු ලැබේ. මෙහි කොටස් හිමිකමෙන් 40% දරන්නේ රජයයි.

**53.1.4** බැංකුව සාමාන්‍යයෙන් මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී, විවිධ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන හෝ රජයේ සුවිශේෂ බලපෑමක් හෝ පාලනයක් ඇති ආයතන සමග ගනුදෙනුවලට එළඹෙනු ලැබේ.

**53.1.5** සටහන් අංක 56 හි පැහැදිලි කර ඇති පරිදි බැංකුව භාරකරු සහ අනෙකුත් විශ්වාසතා තත්ත්වයන්හි කටයුතු කිරීම මගින් රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සාමාන්‍යයෙන් සිදුකරනු ලැබේ.

**53.1.6** මුදල් නීති පනතට යටත්ව බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දේශීය, විදේශීය විනිමය වෙළෙඳපොළෙහි සංවර්ධනය හා වාණිජ බැංකුවල එක් දින විවෘත විදේශ විනිමය තත්ත්වය සුපරීක්ෂණය කරනු ලැබේ. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ සංවර්ධනය සුපරීක්ෂණයේ දී ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය ඇඩි ලෙස වෙනස්වීම ලිහිල් කිරීමේ අරමුණින් බැංකුව වෙළෙඳපොළෙහි මෙම අංශ දෙකෙහි ම නියැලෙන්නේය. විදේශ විනිමය මිලට ගැනීම් සහ විකුණුම් ප්‍රමාණයන් එම සුපරීක්ෂණයේ ප්‍රතිඵල නියෝජනය කෙරේ.

**53.1.7** දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව, 1949 අංක 58 දරණ මුදල් නීති සංශෝධිත පනතේ 90-92 වගන්ති ප්‍රකාර, බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ කාර්යයන් ලෙස විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතුවල නියැලීම, මුදල් නීති පනතේ 93-98 වගන්ති ප්‍රකාර, නෛතික සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාව බලාත්මක කිරීම හා රජයේ කොටස් හිමිකම් ඇති වාණිජ බැංකුවල හා අනෙකුත් සමහරක් මූල්‍ය ආයතන හා රාජ්‍ය ආයතනවල බැංකුකරු ලෙස කටයුතු කරයි. 2019 දෙසැම්බර් 31 දිනට මෙම කාර්ය කිරීමේ දී උද්ගත වූ මුළු ශේෂය සටහන් අංක 13 හි දක්වා ඇත. රජයේ සුරැකුම්පත් මත උපයාගත් පොළිය 36 සටහනෙහි දැක්වේ.

**53.1.8** රජයේ පාලනයට යටත් එක් බැංකුවක භාරකාරත්ව විධිවිධානවල බැංකුව නියැලුන අතර ඒ සඳහා ගාස්තුවක් අය නොකෙරුණි.

**53.1.9** තනි වශයෙන් ගත්කල සුවිශේෂී නොවන, රජය, රජයේ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය වන ආයතන සමග බැංකුව විසින් සිදුකල ගනුදෙනුවල ශේෂයන්, අනෙකුත් ගනුදෙනු හා ශේෂයන් හි ඇතුලත් වේ.

### 53.2 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සමග ගණුදෙනු

අධිපති ඇතුළු මුදල් මණ්ඩලයේ සාමාජිකයන්, නියෝජ්‍ය අධිපතිවරුන් සහ සහකාර අධිපතිවරුන් ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයට ඇතුළත් වේ. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය බැංකුව සමග සිදුකරන ලද ගනුදෙනු පහත පරිදි වේ.

### 53.3 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය වෙත කළ ගෙවීම්

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | **188,111** | 161,833 |

මෙයට අමතරව ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සඳහා ඔවුන්ගේ සේවා ගිවිසුම්වලට යටත්ව මූල්‍ය නොවන ප්‍රතිලාභ ද සපයනු ලැබේ.

### 53.4 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් සමග වූ වෙනත් ගණුදෙනු

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් හට දුන් ණය ශේෂය | **92,549** | 71,459 |
| වසර තුළදී ප්‍රදානය කළ ණය | **10,299** | 18,000 |
| වසර තුළදී අය කරගත් ණය | **7,137** | 18,052 |

මෙම ණය සඳහා අදාළ වන වාර්ෂික පොළී අනුපාතයන් සියයට 2 සිට සියයට 7 දක්වා පරාසයන්හි වන අතර, මාසිකව ගෙවනු ලබන එම සියළු ණය ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත කොට ඇත.

### 53.5 පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් සමග ගණුදෙනු

| | 2019<br>රු. 000 | 2018<br>රු. 000 |
|---|---|---|
| ගෙවන ලද සහ ගෙවිය යුතු දායකය | **87,413** | 82,798 |

සටහන් අංක 32 හි දක්වා ඇති පරිදි බැංකුව විසින් විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා විශ්‍රාම සැලසුම් සඳහා විවිධ මුදල් ප්‍රමාණවලින් දායක වූ අතර රු.මි. 715.06 ක් (2018 - රු.මි. 718.71) සේවක අර්ථසාධක අරමුදලට ගෙවන ලදී.

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී බැංකුව විසින් ස්වකීය පශ්චාත් සේවා සැලසුම් සඳහා බැංකු සහ මූල්‍ය සේවා සපයනු ලබයි. එවැනි සැළසුම් වල ශේෂයන් 30.2 සටහනෙහි දක්වා ඇත.

## 54. අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්

### 54.1 මූල්‍ය ඇප කොන්ත්‍රාත්

රජයේ හෝ එහි නියෝජිතයන්ගේ සහ ආයතනවල නියෝජිත ලෙස ක්‍රියාකරමින්, මහා භාණ්ඩාගාරය විසින් බැංකුව වෙත නිකුත් කරනු ලබන ප්‍රති ඇප මත විවිධ පාර්ශ්වයන්ට ඇප සපයනු ලැබේ. 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ එවැනි ඇප කිසිවක් නොවීය.

### 54.2 ණය ඇප

බැංකුවෙහි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ (ප්‍රා.සං.දෙ.) කාර්යයන් වන්නේ පිටස්තර ණය මාර්ග තුළින් ලැබෙන මුදල් සහභාගී මූල්‍ය ආයතන මගින් ප්‍රතිමූල්‍යකරණ ණය ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබාදීම, එම ණය මත සහභාගී මූල්‍ය ආයතන වෙත ණය ඇපවීම් නිකුත් කිරීම, ඇප වාරික රැස්කිරීම, ණය පැහැරහැරීම් මගහැරවීම සඳහා හා එම ණය නිසිපරිදි යෙදවෙන බවට සාක්ෂාත් කර ගැනීම සඳහා ණය ඇපකරු අරමුදල් පරිපාලනය සහ පශ්චාත් ණය සුපරීක්ෂණයයි. මෙම වැඩපිළිවෙල යටතේ ලබාදුන් ණය සම්බන්ධයෙන් සහභාගි මූල්‍ය ආයතනවලට සිදුවිය හැකි පාඩු ආවරණය සැපයීම සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම ප්‍රා.සං.දෙ. විසින් සමාලෝචිත වර්ෂය තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී. මෙය ණය පැහැර හැරීමේ ප්‍රමාණය මත වන ආවරණයක් නොවන අතර සහභාගී වන මූල්‍ය ආයතන මගින් ණය ලබාදුන් පාර්ශ්වයන්ගෙන් ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් පසු, ඉතිරිවන පාඩු සඳහා වන ආවරණයකි. ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව සිදුවිය හැකි පාඩු පිළිබඳව සහභාගි මූල්‍ය ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් පමණක් සලකා බැලීම මෙහි අර්ථය වේ. මෙම වැඩපිළිවෙල මගින් උද්ගත වන අසම්භාව්‍ය බැරකම් පහත දැක්වේ.

**දේශීය වාණිජ බැංකු - ණය ඇප සඳහා :**

| | නොපියවා පැවැති ඇප ප්‍රමාණය<br>2019<br>රු. 000 | <br>2018<br>රු. 000 |
|---|---|---|
| සම්බන්ධිත පාර්ශ්වයන් | **796** | 784 |
| මුළු ණය ඇප ප්‍රමාණය | **796** | 784 |

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුව විසින් අපේක්ෂිත ණය අලාභ ලෙස රු. 9.32 ක් වාණිජ බැංකු ණය ඇපකර සඳහා වාර්තා කර ඇත (2018 රු.මි. 0.40 කි).

### 54.3 විශ්වස්ත ක්‍රියාකාරකම්

මුදල් නීති පනත අනුව බැංකුව විසින් විශ්වස්ත ක්‍රියාකාරකම් කරගෙන යනු ලබයි. ඒ අනුව ක්‍රියාකිරීමේ දී විවිධ පාර්ශ්වයන් සඳහා අරමුදල් දැරීම හෝ ස්ථාපනය කිරීම ද කරනු ලැබේ. කෙසේ වුවද එසේ කිරීමෙන් කිසියම් බැරකමක් ඇතිවේ යැයි බැංකුව අපේක්ෂා කරනු නොලැබේ.

### 54.4 නෛතික හිමිකම්

බැංකුවට එරෙහිව නීති කෘත්‍යන් ගණනාවක් 2019 දෙසැම්බර් 31 දිනට පරිශේෂව තිබුණු අතර මේ සම්බන්ධයෙන් සැලකිය යුතු පාඩුවක් බැංකුවට ඇති නොවේය යනු බැංකුවේ මතය බැවින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

### 54.5 බැඳීම්

(අ) 2019 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් රු.මි. 1,008.73 ක ප්‍රාග්ධන බැඳීමක් බැංකුව විසින් ඇති කර ගෙන තිබේ.

(ආ) 2019 දෙසැම්බර් 31 දිනට ඉදිරි හුවමාරු ගණුදෙනු මෙසේය.

| | 2019 000 | 2018 000 |
|---|---|---|
| ඉදිරි විනිමය කොන්ත්‍රාත්තු | | |
| ඉදිරි විනිමය විකුණුම් | | |
| - ඇ.එ.ජ. ඩොලර් | **357,000** | 726,310 |
| - ජපන් යෙන් | **131,500,000** | - |
| ඉදිරි විනිමය මිලදී ගැනීම් | | |
| - ඇ.එ.ජ. ඩොලර් | **-** | 388,908 |

## 55. මූල්‍ය වත්කම් මාරු කිරීම්

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී, මූලිකව දේශීය හා විදේශීය යන දෙවර්ගයෙන්ම පවත්නා ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් බැංකුව විසින් ගණුදෙනු වලට එළඹීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය වත්කම් මාරුවීමක් සිදු විය හැක. සටහන් 5.3.3. හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, එසේ මාරුකරන ලද මූල්‍ය වත්කම් පෙර හඳුනාගත් ලෙසම පවත්වාගැනීම හෝ බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට පවත්වාගැනීම හෝ සම්පූර්ණයෙන් හඳුනා නොගෙන සිටීමට සිදුවිය හැක.

සම්පූර්ණයෙන් ඉවත් නොකරන ලද හෝ පහත ගණුදෙනු තුළින් මූලිකව බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමක් පවතී නම් මූල්‍ය වත්කම් මාරුකිරීමක් සිදු කරයි.

- ප්‍රති මිලදී ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්
- සුරැකුම්පත් ණයට දීම
- සුරැකුම්පත් ඔඩපන කිරීම

### 55.1 සම්පූර්ණයෙන් ඉවත් නොකල නමුත් මාරුකල මූල්‍ය වත්කම්

**(අ) ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්**

බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් වල කොටසක් ලෙස ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් ගණුදෙනුවල නිරතවන අතර හිමිකාරීත්වයේ අවදානම් හා ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ බැංකුව සතුව පැවතීම හේතුවෙන්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ "ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්' යටතේ එම ප්‍රමාණය සම්පූර්ණයෙන් හඳුනාගෙන තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව ඒ මත ගෙවිය යුතු මුදල් ප්‍රතිෂ්ඨාව සහ උපචිත පොළිය, මූල්‍ය තත්ව ප්‍රකාශයේ දේශීය මූල්‍ය වගකීම්හි ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් ලෙස හඳුනාගෙන ඇත.

**(ආ) සුරැකුම්පත් ණයට දීම**

සුරැකුම්පත් ණය, ස්ථාපිත වෙළඳපල පුරුදු විස්තර කරන අතර එමගින්, ගාස්තුවකට යටත්ව, සුරැකුම්පත් එක් පාර්ශවයකගෙන් (ණය දීමනාකරු - ශ්‍රී ලංකා මහ බැංකුව), තවත් පාර්ශ්වයකට (ණය ගන්නා) තාවකාලිකව හුවමාරු වීම සිදුවේ. ණයගන්නා ඉල්ලූ විටදී හෝ යම් එකඟ වූ කාලසීමාව අවසානයේදී ඒවා නැවත ලබා දීමට බැදේ. මේ වන විට අධිජාතික බැඳුම්කර සහ විවිධ නිකුත්කරන්නන් විසින් නිකුත් කරන ලද බැඳුම්කර සඳහා භාරකරු ලෙස තෝරාගත් නිශ්කාශණ ආයතනයක් කටයුතු කරයි. නිශ්කාශණ ආයතනයේ කැමැත්ත පරිදි එම බැඳුම්කර සඳහා වන ඉල්ලුම මත පදනම්ව ණය දීමට බලය පැවරෙන පරිදි ගිවිසුමක් අත්සන් කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ණය දීමට සම්බන්ධ නොවන බැවින් හා නිශ්කාශන ආයතන, ණයකරුවන්ට සෘජුවම ණයදෙන බැවින්, මෙම ක්‍රියාවලිය "ස්වයං බැඳුම්කර ණය දීම" ලෙස හඳුන්වයි. ස්වයං බැඳුම්කර ණය දීමේ වැඩසටහන යටතේ බැඳුම්කර සඳහා යම් ණයදීමක් සිදුකර ඇත්නම්, එක් එක් මාසය අවසානයේ භාරකරු විසින් ස්වයං බැඳුම්කර ණයදීම සඳහා ගාස්තු ආයතනයට එවනු ලබයි. හිමිකාරීත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ මෙය සතු වීම හේතුවෙන් බැංකුව විසින් එම සුරැකුම්පත් සම්පූර්ණයෙන්ම මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනාගැනීම තවදුරටත් සිදු කරයි. මෙම සුරැකුම්පත් මූල්‍ය තත්ව ප්‍රකාශයේ "අනෙකුත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට වූ සුරැකුම්පත්" ලෙස ඉදිරිපත් කරයි.

**(ඇ) සුරැකුම්පත් ඔඩපන කිරීම**

සුරැකුම්පත් බේරුම් ක්‍රියාවලියට පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35 ක සුරැකුම්පත් යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කොට ඇ.එ.ජ. ඩොලර් මිලියන 30 ක ණය පහසුකම් ලබාගන්නා ලදී. ඔඩපන කරන ලද සුරැකුම්පත් යූරෝ ක්ලියර්හි වෙනම ගිණුමක රඳවා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්වල ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීමෙන් හා යූරෝ ක්ලියර් පද්ධතියට සහභාගී වන පාර්ශ්වයන්ට ණය දීර්ඝ කිරීම් හැසිරවීමේ පොදු කොන්දේසි අදාලත්වය සලකා බැලීමෙන් අනතුරුව, 2017.01.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි ණය පහසුකම ඇ.එ.ජ. ඩොලර් මිලියන 20 දක්වා අඩුකරන ලදී.

''යූරෝ ක්ලියර් පද්ධතියට සහභාගීවන පාර්ශවයන්ට ණය දීර්ඝ කිරීම් හැසිරවීමේ පොදු කොන්දේසි'' යන මාර්ගෝපදේශයන්ට අනුකූලව යූරෝ ක්ලියර් බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබා දී තිබූ ඉහත ණය පහසුකම් 2018 නොවැම්බර් 05 දිනට සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවා ඇත.

| | 2019 අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම් රු. 000 | 2018 අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම් රු. 000 |
|---|---|---|
| **වත්කම්** | | |
| සුරැකුම්පත් ණයදීම | **1,059,885** | 3,714 |
| සුරැකුම්පත් ඔඩපන | **4,794,109** | 4,841,397 |
| වත්කම් වල ධාරණ අගය | **5,853,994** | 4,845,111 |

## 56. භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

බැංකුව, සාමාන්‍යයෙන් භාරකරුවකු ලෙස හා අනෙකුත් විශ්වාසතා තත්ත්වයන්හි ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදු කරනු ලැබේ. බැංකුව විසින් ඉටු කරනු ලබන සැලකිය යුතු භාර ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

**56.1** විවිධ විදේශීය ණය සහ විදේශ අරමුදල් යොදන සංවර්ධන ව්‍යාපෘති සහ ණය යෝජනා ක්‍රම සඳහා වන ප්‍රදානයන්හි ණය මුදාහැරීම සහ ආපසු ගෙවීම් බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සිදු කරනු ලැබේ. තවද ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදානයන් යටතේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් රැස්කර ප්‍රදානය කරන නියෝජිත ආයතනයන්ගේ ඉල්ලීම පරිදි එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබේ.

**56.2** බැංකුව සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ) භාරකාරත්වය උසුලයි. ඒ අනුව, පනතේ විධි විධාන ප්‍රකාර දායක මුදල් ලබා ගැනීම, අධිභාර ලබාගැනීම, ආයෝජනවලින් ආදායම ලබා ගැනීම, සේ.අ.අ. අරමුදලේ ලියාපදිංචි සාමාජිකයන්ගේ ගිණුම් පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම මුදල් මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන්නේය.

**56.3** ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බලපත්‍රලාභී බැංකු ආයතන සහ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි, බැංකු ව්‍යාපාරයෙහි යෙදී සිටින සමුපකාර සමිති සඳහා විවෘතව ඇති ස්වේච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයක් වන "තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" බැංකුව විසින් පරිපාලනය කර ඇත. 2010 ඔක්තෝබර් 01 දා සිට එම යෝජනා ක්‍රමයෙහි ඇති අරමුදල්, 2010 සැප්තැම්බර් 28 දා තම, ගැසට් අංක 1673/11 යටතේ පිහිට වූ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" වෙත පවරා ඇත.

**56.4** 2010 සැප්තැම්බර් 28 දිනැති වූ 1673/11 අංක දරණ (සංශෝධිත) ගැසට් පත්‍රය අනුව 2010 ඔක්තෝබර් 01 දා සිට බැංකුව විසින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" නමින් අනිවාර්ය තැන්පතු රක්ෂණ ක්‍රමයක් ජාතික අවශ්‍යතාවයක් ලෙස තැන්පත්කරුවන්ගේ අරමුදල් ආරක්ෂාව වෙනුවෙන් පිහිටුවා ඇත.

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ලියාපදිංචි මූල්‍ය සමාගම් මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වේ. ඒ අනුව, 2019 දෙසැම්බර් 31 දිනට මෙහි සමස්ථ සාමාජිකයන් ගණන 73 කි. ගැසට් පත්‍රයේ 5.2 වගන්තියට අනුව විශේෂිත අතහැරීම් හා සියලුම ණය උපකරණ හැර සාමාජික ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු, කාලීන තැන්පතු සහ ඉතිරිකිරීමේ තැන්පතු වගකීම් සහ 01.01.2012 දිනට පෙර මුදල් මණ්ඩලයේ මගපෙන්වීම අනුව 2010 සහ 2011 වර්ෂවල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත සැලසුම්වලට අනුව ස්කන්ධය බවට පරිවර්තනය වූ පෙර තැන්පත්කරුවන් වූ දැනට කොටස් හිමියන්ගේ කොටස් රක්ෂණය කෙරේ.

රු.මි. 350.20 ක් වූ ස්වේච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන හා රු.මි. 1,168.31 ක් වූ වාණිජ බැංකුවල අත්හල දේපළ තුළින් කරන ලද ආයෝජන පැවරීමෙන් මෙම තැන්පතු රක්ෂණ අරමුදල පිහිටුවා ඇත. 2019 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ප්‍රමාණය රු. බිලියන 65.1 ක් (තාවකාලික) වන අතර, දැනට මෙම අරමුදලෙන් තැන්පතු හිමියෙකුට ගෙවන වන්දි මුදල් ප්‍රමාණය එක් මූල්‍ය ආයතනයක් සඳහා රු.මි. 0.60 ක් හෝ විදේශ විනිමය තැන්පතු සඳහා ඊට සමාන මුදලකි.

වන්දි ගෙවීම බැංකුවේ හෝ මුදල් මණ්ඩලයේ වගකීමක් නොවන අතර තැන්පත් අරමුදල විසින් එසේ ගෙවිය යුතු මුළු වන්දි මුදල් ප්‍රමාණය තැන්පත් අරමුදලේ අවසරලත් ණය සහ එකතු වී ඇති වාරික මුදල් ද ඇතුළුව තැන්පතු රක්ෂණ අරමුදලෙහි රැස් වී ඇති, පවත්නා මුදල් ප්‍රමාණයට සීමා විය යුතුය. අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන කිසිදු වගකීමකට මුදල් මණ්ඩලය හා බැංකුව වගකියනු නොලැබේ.

මෙම යෝජනා ක්‍රමය සහ අරමුදල 2013 නොවැම්බර් 22 වන දින සිට පිළිවෙලින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය" සහ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක අරමුදල" ලෙස නම් කරන ලදී.

යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා කළමණාකරණ කටයුතු නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ පිහිටා ඇති තැන්පත් රක්ෂණ ඒකකය මගින් මූල්‍ය මණ්ඩලය මගින් අනුමත වූ රෙගුලාසි හා ප්‍රතිපත්තීන් වලට අනුව නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාගේ අධීක්ෂණය හා උපදෙස් අනුව සිදු කෙරෙන අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශවලින් වෙන් වූ පොත් හා ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. විගණනය භාරව විගණකාධිපති කටයුතු කරයි.

**56.5** ලියාපදිංචි මූල්‍ය සමාගම් නියාමනය කිරීම හා සුපරීක්ෂණ කටයුතු, මුදල් මණ්ඩලය විසින් පවරා ඇති බලතල ප්‍රකාරව, බැංකුව විසින් සිදුකරයි. එසේ ක්‍රියාකිරීමේ දී ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස එම ස්වශක්තිතාවයන් නොමැති හා බුන්වත් වූ මූල්‍ය සමාගම්වල වගකිවයුතු පුද්ගලයන් ගේ වත්කම් මුදල් මණ්ඩලය වෙත පවරාගැනීම ද කරනු ලබයි.

**56.6** බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනය අනුව, කෘෂිකාර්මික කටයුතු සඳහා මුළු අත්තිකාරම්වලින් 10% ක අවමය පවත්වාගෙන නොමැති බැංකු එම හිඟ මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව (ප්‍රා.සං.දෙ.) විසින් පවත්වාගෙන යනු ලබන

ප්‍රතිමූල්‍ය අරමුදලට ආයක කළ යුතු වේ. ප්‍රා.සං.දෙ. එසේ එකතු කළ මුදල් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, ලංකා බැංකුව සහ මහජන බැංකුව තුළින් කෘෂිකාර්මික කටයුතු සඳහා "විස්කම්" ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ.

2018 දෙසැම්බර් 31 දිනට එසේ එක්රැස් කළ මුදල් නැවත බැංකුවලට ගෙවා ඇති අතර මෙම යෝජනා ක්‍රමය යටතේ හිඟ හිටි ණය නොමැත. මෙම ණය මගින් 2019 වර්ෂය තුළදී පොලියක් නොලැබුණි. (2018 වර්ෂය තුළදී - රු.මි. 0.17). තවද රු.මි. 102.65 (2018 - රු.මි. 28.12) ක ආයෝජන ආදායමක් උපයා ඇත.

### I ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍යනය කළ ව්‍යාපෘති

#### (i) නිමකර අවසන් ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) |
|---|---|---|---|---|---|
| 1 | සුසහන | රුපියල් | 352.69 | සුනාමියෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාරයන් නැවත නගා සිටුවීම | 351.06 |
| 2 | සුසහන | රුපියල් | 3,000.00 | සුනාමියෙන් හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නැවත ඇරඹීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 2,750.00 |
| 3 | සුසහන අදියර II | රුපියල් | 500.00 | සුනාමියෙන් හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නැවත ඇරඹීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 105.54 |
| 4 | පිබිදෙන උතුර | රුපියල් | 2.000.00 | උතුරු පළාත තුළ කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම | 2.000.00 |
| 5 | නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය | රුපියල් | 1,000.00 | නැගෙනහිර පළාත තුළ වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නගා සිටුවීම සඳහා ණය පහසුකම් ප්‍රදානය කිරීම | 1,000.00 |
| 6 | පශ්චාත් සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන සම්පත් කළමණාකරණ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.09 | සුනාමියේ බලපෑමට ලක් වූ ජනතාවගේ වත්කම් නැවත ගොඩනංවා ගැනීම, ඔවුන්ගේ දෛනික ආර්ථික කටයුතු සඳහා පදනම දැමීම හා ආදායම උත්පාදන මාර්ග විවිධාංගීකරණය කිරීම සඳහා සහාය දීම. | 190.77 |
| 7 | නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය - අදියර II | රුපියල් | 1,078.27 | නැගෙනහිර පළාත තුළ කෘෂිකාර්මික හා පශු සම්පත් ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම | 1,000.00 |
| 8 | නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය - අදියර III | රුපියල් | 1,000.00 | ව්‍යාපාර පරිසරය නගා සිටුවීම සඳහා, අවශ්‍යතාවයක් සහ ඉහළ ඉල්ලුමක් ඇති නැගෙනහිර පළාතේ කෘෂිකාර්මික, පශු සම්පත් ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර යන අංශ සඳහා තවදුරටත් සහාය වීම | 1,428.47 |
| 9 | උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන | රුපියල් | 600.00 | ගැටුම් පැවති කාල සීමා තුළ නැගෙනහිර හා උතුරු පළාත්වල හානියට පත් වූ නිවාස ප්‍රතිසංස්කරණය සඳහා ණය පහසුකම් සැපයීම | 600.00 |
| 10 | පශ්චාත් ආපදා ආර්ථික ක්‍රියාකාරකම් නගා සිටුවීමේ ණය යෝජනා ක්‍රමය (PEARL) | රුපියල් | 134.58 | මෑත කාලීන ගංවතුර/නියං හේතුවෙන් ආපදාවට පත් ණය ගැතියන් (පුද්ගල හෝ පුද්ගල කණ්ඩායම්) පශ්චාත් ආපදා තත්වයෙන් මුදවා ගැනීම සඳහා අරමුදල් අවශ්‍යතා සැපයීම තුළින් ඔවුන්ගේ ව්‍යාපාරික හෝ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් යථාතත්වයට පත් කිරීම. | 134.58 |
| 11 | පළාත්බද සංවර්ධන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 2,900.00 | රට තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය පුළුල් කිරීම සඳහා මධ්‍ය හා දිගුකාලීන ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැලසීම | 2,900.00 |

#### (ii) දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) |
|---|---|---|---|---|---|
| 1 | සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමය | රුපියල් | 30,301,79 | ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හා ආපදා මගින් හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වැඩිදියුණු කිරීම සඳහා ණය පහසුකම් සැපයීම | 30,301,79 |

## II ශ්‍රී ලංකා රජය හෝ අනුග්‍රාහකයෙකු විසින් මූල්‍යනය කළ ව්‍යාපෘති

### (i) නිමකර අවසන් ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) |
|---|---|---|---|---|---|
| 1 | තේ සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 24.50 | කුඩා පරිමාණ තේ වතු හිමියන්ගේ ආදායම වැඩිකිරීම හා ව්‍යාපෘති කලාපවල ස්වභාවික පරිසරය සංවර්ධනය | 2,550.90 |
| 2 | දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | බහු වාර්ෂික භෝග අංශය වාණිජ්‍යකරණය, නිෂ්පාදන වැඩි දියුණු කිරීම, තවාන් සංවර්ධනය, පසු අස්වනු පාලනය, සැකසීම හා අලෙවිකරණය | 1,453.11 |
| 3 | වැවිලි අංශය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 40.00 | ශ්‍රී ලංකාවේ භෝග කර්මාන්තයේ භෝග අනු අංශ වල ප්‍රතිපත්ති හා ආයතනමය ප්‍රතිසංස්කරණ වලට සහාය දීම, නිෂ්පාදනය හා ලාභදායිත්වය වැඩිදියුණු කිරීම, තරගකාරී වාසිය පවත්වා ගැනීම | 5,200.00 |
| 4 | කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන | රුපියල් | 2,656.00 | සුනාමියෙන් බලපෑමට ලක්වූ කුඩා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත නගා සිටුවීම සඳහා ණය පහසුකම් ලබා දීම | 2,663.40 |
| 5 | කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන - චක්‍රිය අරමුදල | රුපියල් | 150.00 | සුනාමිය මගින් බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත ආරම්භ කිරීම සඳහා ණය පහසුකම් ලබා දීම | 122.72 |
| 6 | හැකියා සංවර්ධන ව්‍යාපෘතිය | රුපියල් | 94.31 | ගුණත්වයෙන් අනුන ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා අවශ්‍ය හැකියා පුහුණු වැඩසටහන් වල අදාලත්වය සහ ගුණත්වය වැඩි දියුණු කිරීම හා හැකියා නොගැලපීම් ආමන්ත්‍රණය කිරීම | 94.59 |
| 7 | නාගරික පාරිසරික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 4.00 | නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ පාරිසරික, සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම | 369.15 |
| 8 | අඩු ආදායම් නිවාස සෙවණ ණය ඇපකර ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 25.00 | රටේ අඩු ආදායම්ලාභී ජනතාවට නිවාස ගොඩනැගීම අළුත්වැඩියාව සහ ඔවුන්ගේ වාසස්ථාන පුළුල් කිරීමට ආධාර කිරීම. | 1,362.00 |
| 9 | නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | වි.ගැ.හි | 15.10 | අඩු ආදායම් ලාභීන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා නිවාස සංවර්ධනයට ආධාර කිරීම | 1,915.76 |
| 10 | වයඹ පලාත් ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 1.80 | වයඹ පලාත් වාසීන්ගේ ආර්ථික, සමාජීය හා පෝෂණ සුබ සාධනය වැඩි දියුණු කිරීම. | 102.76 |
| 11 | මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.00 | කුඩා ව්‍යවසායකයින්ගේ ආදායම් තිරසාර වර්ධනය | 249.06 |
| 12 | රට මැද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | රට මැද බහුවාර්ෂික භෝග නිෂ්පාදන ධාරිතාව නගා සිටුවීමට ණය පහසුකම් සැලසීම | 642.00 |
| 13 | කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය. | වි. ගැ. හි. | 17.05 | සිවිල් අර්බුද වල බලපෑමට ලක්වූ උතුරු නැගෙනහිර පළාත් හා මායිම් දිස්ත්‍රික්ක පහ තුළ පුද්ගලයන් හා දේපල නැවත නගා සිටුවීම | 843.00 |
| 14 | කුඩා තේ වතු හිමියන් සංවර්ධන ව්‍යාපෘති | ඇ.එ.ජ. ඩොලර් | 12.60 | කුඩා තේ වතු අංශය සංවර්ධනය කිරීම හා තේ වතු පහසුකම් පුනරුත්ථාපනය කිරීම | 645.93 |
| 15 | දිළිඳු බව පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය | ජපන් යෙන් | 1,368.00 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා විධිමත් ලෙස ණය යොමු කිරීමට ඵලදායී ණය බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම | 1,402.45 |
| 16 | ඉඩම් අහිමි කුඩා පරිමාණ ගොවි ණය ව්‍යාපෘතිය | ඇ.එ.ජ. ඩොලර් | 17.40 | අඩු ආදායම් ලබන්නන් සඳහා රැකියා උත්පාදනය කිරීමටත්, ඉතිරිකිරීමේ පුරුදු වර්ධනයටත් අවම පිරිවැයක් සහිත තිරසාර ක්ෂුද්‍ර ණය බෙදැහැරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම | 345.69 |
| 17 | කෑගල්ල සමෝධාන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 1.50 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය ලබාදීම මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශ වල මිනිසුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම | 148.00 |
| 18 | දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 27.90 | දකුණු පළාත් වාසීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම හා ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම | 564.00 |
| 19 | EIB ගිවිසුම් B | යූරෝ | 10.00 | සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත සේවා අංශ ද ඇතුළත්ව සුනාමි මගින් සෘජු බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නැවත නගා සිටුවීම | 1,553.27 |
| 20 | පිබිදෙන උතුර අදියර II | රුපියල් | 2,154.25 | උතුරු පළාත තුළ කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම | 2,361.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 21 | දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘති - චක්‍රීය අරමුදල | රුපියල් | 1,200.00 | රට තුළ බහුවාර්ෂික භෝග අංශය නගා සිටුවීමට ණය පහසුකම් සපයා දීම | 1,199.82 |
| 22 | මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ - චක්‍රීය අරමුදල | රුපියල් | 77.00 | ග්‍රාමීය ගොවි පවුල්වල ආදායම් වර්ධනය, ගොවි නොවන ව්‍යවසාය සංවර්ධනය සඳහා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අරමුදල් සම්පාදනය හා එම දිස්ත්‍රික්කයේ පවත්නා ව්‍යාපෘති ප්‍රසාරණය | 77.00 |
| 23 | සබරගමු පළාත් ග්‍රාමීය සාමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 100.00 | සබරගමු පළාතේ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා පවතින ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම | 100.00 |
| 24 | ඉදිකිරීම් අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | යූරෝ | 9.00 | පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු යටතේ ඉදිකිරීමේ හා මහජන කටයුතුවලට සක්‍රීයව සහභාගී වීම සඳහා දේශීය පෞද්. ව්‍යාපාරවල මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතා ශක්තිමත් කිරීම | 1,399.73 |
| 25 | සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II | රුපියල් | 70.00 | සබරගමු පළාතේ නව ආදායම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම | 70.00 |
| 26 | දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II (ප්‍රබෝධිනී) | ජපන් යෙන් | 2,381.00 | ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රුපියල් 15,000 ට වඩා අඩු පවුල්වල ජීවන තත්ත්වය වර්ධනය කිරීම | 3,213.20 |
| 27 | ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 250.00 | රටතුළ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් සමත් පුහුණු තරුණ තරුණියන්ට ස්වයං රැකියා ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මූල්‍ය සහනාධාර සැපයීම | 232.39 |
| 28 | වියළි කලාපීය ජීවනෝපාය හා හවුල්වීමේ ණය සහන වැඩසටහන | රුපියල් | 252.95 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල හා බදුල්ල දිස්ත්‍රික්කවල කෘෂිකර්මාන්තය ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම් හරහා වැඩි ආදායමක් ඉපැයීමට අවස්ථාවක් සැලසීම | 252.95 |
| 29 | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන | ඇ.එ.ජ. ඩොලර් | 32.90 | වෙළෙඳපොළ වටිනාකම්දාම තුළ සිට ප්‍රයෝජනලාභීන්ගේ ආදායම් ඉහළ නැංවීම මගින් සුළු ඉඩම් හිමි නිෂ්පාදකයින් හා ඉඩම් අහිමි වූවන්, විශේෂයෙන් යෞවනයන් සඳහා අරමුදල් හා පුහුණුව සපයා දීම | 113.13 |
| 30 | කුඩා පරිමාණ වැවිලි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.60 | නුවර එළිය, මහනුවර, කෑගල්ල, මොණරාගල දිස්ත්‍රික්කවල අඩු ආදායම් ලාභීන්ගේ ජීවන තත්වය උසස් කිරීම | 487.66 |
| 31 | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන (NADeP) | රුපියල් | 1,049.84 | තෝරාගත් ව්‍යාපෘති ප්‍රදේශවල දිළිඳු ජනතාවගේ ආදායම් සහ සමාජ තත්ත්වය වර්ධනය කිරීම | 1,049.84 |
| 32 | NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන ප්‍රාග්ධන කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 135.69 | කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් වැඩි කිරීම | 135.69 |
| 33 | NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන ඍතුමය කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 302.04 | කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් තවදුරටත් වැඩි කිරීම | 302.04 |
| 34 | "තරුණ දිරිය" NADeP තරුණයින් බලගැන්වීමේ හා රැකියා යෝජනා ක්‍රමය | රුපියල් | 288.48 | කුඩා ව්‍යාපාර සහ අනෙකුත් ආකාරයේ ව්‍යවසායකත්ව ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැපයීම තුළින් ග්‍රාමීය මට්ටමේ දිළිඳු යෞවනයන්ගේ ජීවනෝපාය වර්ධනය කිරීම සඳහා උපකාරී වීම. | 288.48 |
| 35 | වියළි කලාපීය ජීවනෝපාය සහායවීමේ හා හවුල්වීමේ ණය වැඩසටහන - චක්‍රීය අරමුදල | රුපියල් | 252.90 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම | 252.89 |
| 36 | සුළු ගොවියන් හා ඉඩම් අහිමි වූවන් සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 345.69 | සුළු පරිමාණ ගොවීන්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන වේගය වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ වගා නොවන ග්‍රාමීය ව්‍යවසායන් ස්ථාපනය කිරීම | 1,564.75 |
| 37 | දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II - චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී) | රුපියල් | 2,764.84 | ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා ණය සැපයීම මගින් දිළිඳු පවුල්වල ආදායම් තත්වය වැඩි දියුණු කිරීම | 7,016.86 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 38 | කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Capital | ඇ.එ.ජ. ඩොලර් | 30.29 | වාණිජමය නැඹුරුවක් ඇති නිෂ්පාදන හා අලෙවිකරණ ක්‍රියාවලියක නිරත 57,500 ක් පමණ වන කුඩා ව්‍යාපාර හිමියන්ගේ දිළිඳුකම අවම කිරීම, තරඟකාරීත්වය, ආදායම හා ලබාගන්නා ආහාර වේලේ ගුණාත්මක බව වර්ධනයට දායක වීම. මෙම අරමුණු ළඟා කර ගැනීම සඳහා නිෂ්පාදිත කන්ඩායම්වල ධාරිතාවය ගොඩනැගීම හා වැඩිදියුණු කිරීමත්, පෞද්ගලික අංශය සමග හවුල්කාරිත්වයෙන් සබඳතා ජාලය ශක්තිමත් කිරීමත් යන ක්‍රියාවලිය තුළින් අත්පත් කර ගනී | 125.85 |
| 39 | කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Seasonal | | | | 854.05 |
| 40 | කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) Youth | | | | 14.45 |
| 41 | කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) Income Generation | | | | 106.42 |

## (ii) දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) |
|---|---|---|---|---|---|
| 1 | තේ සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 1,100.00 | තේ අංශය සංවර්ධනය සඳහා ණය පහසුකම් සපයාදීම | 964.87 |
| 2 | ස්වශක්ති ණය යෝජනා ක්‍රමය | රුපියල් | 4,000.00 | නව හා වත්මන් ව්‍යවසායකයින්ට මූල්‍ය සහනාධාර සැපයීම මගින් නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම | 2,576.89 |
| 3 | ''අත්වැල'' ස්වාභාවික ව්‍යසන මගින් හානිවූ ආර්ථික කටයුතු නැවත නඟා පිහිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (READ) | රුපියල් | 2,000.00 | රජය මගින් දැනුම් දී ඇති පරිදි ස්වභාවික ව්‍යසනයන්ගෙන් බලපෑමට ලක් වූ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සඳහා සුදුසුකම් ලත් ණය ගැතියන්ට මූල්‍ය සහනාධාර සැපයීම | 1,687.52 |
| 4 | දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී) | රුපියල් | 1,031.00 | විධිමත් මූල්‍ය පහසුකම්වලට ප්‍රවේශ වීමට අපහසු ග්‍රාමීය දිළිඳු පවුල් සඳහා ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම්වලට ණය සැපයීම පිණිස ඵලදායී ණය ප්‍රදාන යාන්ත්‍රණයක් ස්තාපිත කිරීම | 5,284.56 |
| 5 | කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Agribusiness | ඇ.එ.ජ. ඩොලර් | 30.29 | වාණිජමය නැඹුරුවක් ඇති නිෂ්පාදන හා අලෙවිකරණ ක්‍රියාවලියක නිරත 57,500 ක් පමණ වන කුඩා ව්‍යාපාර හිමියන්ගේ දිළිඳුකම අවම කිරීම, තරඟකාරීත්වය, ආදායම හා ලබාගන්නා ආහාර වේලේ ගුණාත්මක බව වර්ධනයට දායක වීම. මෙම අරමුණු ළඟා කර ගැනීම සඳහා නිෂ්පාදිත කණ්ඩායම්වල ධාරිතාවය ගොඩනැගීම හා වැඩිදියුණු කිරීමත්, පෞද්ගලික අංශය සමග හවුල්කාරිත්වයෙන් සබඳතා ජාලය ශක්තිමත් කිරීමත් යන ක්‍රියාවලිය තුළින් අත්පත් කර ගනී | - |
| 6 | කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Youth | | | | - |
| 7 | කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Youth | | | | - |
| 8 | කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Agribusiness | | | | - |
| 9 | කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Income Generation | | | | - |
| 10 | ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය - අදියර II (SEPI II) | රුපියල් | 950.00 | ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ සහතිකපත්‍ර හෝ ඩිප්ලෝමා පාඨමාලාව අවසන් කළ යෞවනයන් සඳහා නව ව්‍යාපාරයන් ආරම්භ කිරීමට හෝ පවත්නා ව්‍යාපාරයන් වැඩි දියුණු කිරීමට සහාය දීම | 409.54 |

III **අනෙකුත්**

**(i) දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති**

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) |
|---|---|---|---|---|---|
| 1 | විස්කම් (කෘෂිකාර්මික අංශය සංවර්ධනය සඳහා වූ විශේෂ ණය යෝජනා ක්‍රමය) | රුපියල් | 1,325.60 | ආයෝජන සඳහා ණය ලබා ගැනීමේ හැකියාව තහවුරු කර ගැනීම, විවිධාංගීකරණය සහ වාණිජ කෘෂි ව්‍යාපාර ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම | 881.00 |

**57. ශේෂ පත්‍ර දිනට පසු ඇතිවූ සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍ය වන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් ශේෂ පත්‍ර දිනට පසු ඇති නොවීය.

## 2. බැංකු අධීක්ෂණ

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ කාලීන ව පරීක්ෂාකිරීමේ අරමුණ පෙරදැරිව මුදල් නීති පනතේ 28 වැනි වගන්තිය අනුව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලද අතර 1988 අංක 30 දරන, සංශෝධිත බැංකු පනත ප්‍රකාරව බලපත්‍රලාභී බැංකු නියාමනය සහ අධීක්ෂණය ද සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාව හා සවිමත්භාවය තහවුරු කරලීම හා එමගින් බලපත්‍රලාභී බැංකුවල තැන්පතුකරුවන් හා අනෙකුත් ණය හිමියන්ගේ හිමිකම් සුරැකීමේ අභිලාෂයෙන් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සිය කාර්යභාරයන් සිදු කරනු ලබයි. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතරට ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු හා විශේෂිත බැංකු (මින් මතුවට බලපත්‍රලාභී බැංකු) සඳහා බලපත්‍ර නිකුත් කිරීම, විචක්ෂණ නියාමන සකස් කිරීම සහ නිකුත් කිරීම, බලපත්‍රලාභී බැංකු අඛණ්ඩ අධීක්ෂණයට හා කාලීන ව්‍යවස්ථාපිත පරීක්ෂාවන්ට ලක් කිරීම, බැංකු අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිළධාරීන් සහ විධායක කාර්යයන්හි නිරත නිළධාරීන්ගේ යථා යෝග්‍යතාව අනුමත කිරීම, නියාමන අනුමැතීන් ලබාදීම, අවශ්‍ය තැන් හිදී මුදල් මණ්ඩලයේ අනුමැතිය පරිදි නියාමන ක්‍රියාමාර්ග ගැනීම සහ බැංකු ක්ෂේත්‍රයේ දැනුම් යාවත්කාලීන කිරීම සහ ශක්‍යතා වර්ධනය කිරීමේ කටයුතු සිදු කිරීම ඇතුලත් වේ.

2019 වසර අවසානය වන විට මෙරට බැංකු ක්ෂේත්‍රය, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියාමනයට හා අධීක්ෂණයට යටත් බලපත්‍රලාභී වාණිජ බැංකු 26 කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6 කින් සමන්විත විය. මෙයට අමතරව විදේශීය බැංකුවල නියෝජිත කාර්යාල 3ක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇති අතර මෙම බලපත්‍රලාභී බැංකු හා නියෝජිත කාර්යාලවල නාම ලේඛනය ඇමුණුම II-1 හි දක්වා ඇත.

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේදී සිදු කළ ප්‍රධාන කාර්යයන්හි සාරාංශයක් පහත දක්වා ඇත.

### 2.1 විචක්ෂණශීලී නියාමනයන් නිකුත් කිරීම

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ විචක්ෂණශීලී නියාමනයන් මෙම වාර්තාවේ III වන කොටසෙහි දක්වා ඇත. ඒ අතුරින් ප්‍රධාන විචක්ෂණශීලී නියමයන් පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

**(අ) විදේශික නිළධාරීන් සේවා නියුක්ත කිරීම සඳහා වන නියාමන රාමුව**

විදේශික නිළධාරීන් මෙරට බැංකු සේවයේ නියුක්ත කිරීම සම්බන්ධයෙන් මෙයට පෙර තිබූ චක්‍රලේඛය අවලංගු කරමින් ඒ සඳහා බල පැවැත්වෙන නව නියාමන රාමුව සහිත චක්‍රලේඛයක් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කෙරිණ. බැංකු විසින් විදේශික නිළධාරීන් සේවයට නියුක්ත කිරීමට සැලකීමට පෙර, දේශීයව එම පුරප්පාඩු පිරවීමට ප්‍රමුඛතාව ලබා දිය යුතු බවටත්, එලෙස විදේශික නිළධාරීන් එමගින් සපුරාගන්නා රාජකාරි සහ වගකීම් දේශීයව සපුරා ගැනීමට හැකිවෙන පරිදි අනුප්‍රාප්තික නිළධාරීන් දේශීයව හඳුනාගෙන ගෙන සාධාරණ කාලසීමාවක් තුළදී ඔවුන් ඒ සඳහා පුහුණු කිරීමට බැංකු වලට උපදෙස් ලබා දුනි.

**(ආ) වාර්ෂික හා කාර්තුමය මූල්‍ය වාර්ථා සහ අනෙකුත් අනාවරණ කිරීම් ප්‍රකාශනය කිරීම**

බලපත්‍රලාභී බැංකු විසින් වාර්ෂික හා කාර්තුමය මූල්‍ය වාර්ථා සහ අනෙකුත් අනාවරණ කිරීම් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව චක්‍රලේඛයක් නිකුත් කරන ලද අතර මෙමගින් පැවැති පැරණි ආකෘති ඉවත් කරමින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 9 ට අනුගතව මූල්‍ය වාර්ථා ප්‍රකාශයට පත් කිරීම සඳහා නව ආකෘතීන් හඳුන්වා දෙනු ලැබිණ.

**(ඇ) පොළී ඉපැයීම් සහිත ඉතුරුම් සහ කාලීන තැන්පතු සඳහා හඳුන්වාදෙනු ලබන පොළී නොවන දිරිගැන්වීම් ඇතුලත් යෝජනා ක්‍රම**

පොළී ඉපැයීම් සහිත තැන්පතු ප්‍රවර්ධනය සඳහා පොළී නොවන දිරිගැන්වීම් සහිත යෝජනා ක්‍රම හඳුන්වාදීම මගින් බලපත්‍රලාභී බැංකු අතර අයුතු තරඟකාරීබවක් ඇතිවීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන පොළී අනුපාත ප්‍රතිපත්තීන්ට වන අහිතකර බලපෑම සලකා බලමින් මූල්‍ය උපකරණයක හෝ සේවාවක මූලිකාංග වෙනස් වන පරිදි සහ තැන්පතුකරුවන්ට අවාසිදායක තත්ත්වයන් ඇති විය හැකි පරිදි ලොතරැයි දිනුම් ඇදීම් හෝ ත්‍යාග යෝජනා ක්‍රම පැවැත්වීමෙන් වැලකෙන ලෙසට බලපත්‍රලාභී බැංකු වෙත උපදෙස් නිකුත් කෙරිනි.

**(ඈ) මෝටර් රථ සහ අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සීමා කිරීමට ගත් ක්‍රියා මාර්ග**

සහනදායී බලපත්‍ර මත මෝටර් රථ ආනයනය සඳහා ණයවර ලිපි නිකුත් කිරීම සම්බන්ධයෙන් පැවැති සීමා ඉවත් කිරීම පිළිබඳ බලපත්‍රලාභී බැංකු දැනුවත් කෙරිනි.

**(ඉ) බලපත්‍රලාභී බැංකු වල ශ්‍රී ලංකා රුපියල් තැන්පතු සඳහා වන උපරිම පොළී අනුපාත**

තැන්පතු හා ණය සේවා සඳහා පැවැති ඉහළ මූර්ත පොළී අනුපාත සලකා බලමින් සහ මූල්‍ය ක්ෂේත්‍රය හරහා මූල්‍ය ප්‍රතිපත්තිය සම්ප්‍රේෂණය කිරීම ශක්තිමත් හා වේගවත් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු වල ශ්‍රී ලංකා රුපියල් තැන්පතු සඳහා වන උපරිම පොළී අනුපාත නියම කරමින් මුදල් නීති පනත් නියෝගයක් නිකුත් කෙරිණ. මෙමඟින් බලපත්‍රලාභී බැංකු වල අරමුදල් සඳහා වන පිරිවැය පහත දැමීම මගින් ණය පොළී අනුපාත පහත හෙළීම සහ ඒ හරහා මූර්ත ආර්ථිකයේ ණය ප්‍රවාහයන් වැඩි කිරීමට අපේක්ෂිතය. මේ අනුව මාස තුනට අඩු කල්පිරීමේ කාල සීමාවක් සහිත හෝ කල්පිරීමේ කාලය සඳහන් නොවූ තැන්පතු සඳහා පොළී අනුපාතය නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය මතද කල්පිරීමේ කාල සීමාව මාස තුන හෝ ඊට වැඩි තැන්පතු සඳහා පොළී අනුපාතය දින 364 භාණ්ඩාගාර බිල්පත් අනුපාතය මත පදනම් විය යුතු බවට බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙනු ලැබීය. මෙම නියෝගය, මෑත කාලීන ප්‍රතිපත්තිමය තීරණ රුපියල් වෙළඳපොළ ණය පොළී අනුපාත වෙත සම්ප්‍රේෂණය වීමේ කාර්යක්ෂමතාව ඉහළ

දැමීම සඳහා පසුව නිකුත් කල මුදල් නීති පනත් නියෝගය මගින් අවලංගු කරන ලද අතර මෙමගින් සියළුම බලපත්‍රලාභී බැංකු වල රුපියල් ණය හා අත්තිකාරම් වල පොළී අනුපාත ඉලක්කගත දිනයන් වන විට නිශ්චිත පදනම් අංක ගණනකින් අඩු කිරීමට නියෝග කරන ලදී. ඒ හරහා ආර්ථිකය වෙත ණය ප්‍රවාහ සැලසීම ප්‍රවර්ධනය කර ආර්ථික කටයුතු යලි නගා සිටුවීම අපේක්ෂිතය. මෙයට අමතරව ණයපත්, පූර්ව අනුමැතිය සහිත තාවකාලික අයිරා සහ දඩ පොළී අනුපාත සඳහා උපරිම පොළී අනුපාත ද හඳුන්වා දෙන ලදී.

**(ඊ) බලපත්‍රලාභී බැංකු සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 9 මූල්‍ය උපකරණ අනුගමනය කිරීම සම්බන්ධව නිකුත් කල චක්‍රලේඛය සඳහා අතිරේකය**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් මුහුණ පා ඇති ගැටළු සහ අධික වෙළඳපොළ පොළී අනුපාත සලකා බලමින් 2019.01.01 සිට 2019.06.30 වන කාලය තුළදී බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 9 මූල්‍ය උපකරණ අනුගමනය කිරීම සම්බන්ධයෙන් අනුගමනය කල යුතු අන්තර්කාලීන ක්‍රියාමාර්ග දැනුම් දෙමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කෙරිණ.

**(උ) බාසල් III නියාමන රාමුවේ ප්‍රාග්ධන හා ද්‍රවශීලතා ප්‍රමිතීන් හි අවශ්‍යතා සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීම**

බාසල් III නියාමන රාමුවේ ප්‍රාග්ධන හා ද්‍රවශීලතා ප්‍රමිතීන්හි අවශ්‍යතාවයන් සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීමේදී සැළකිය යුතු නියාමන අවශ්‍යතාවයන් දැනුවත් කරමින් බලපත්‍රලාභී බැංකු වෙත බැංකු පනත් විධානයක් නිකුත් කෙරිණ.

**(ඌ) සංචාරක ක්ෂේත්‍රය සඳහා සහන ලබා දීම**

පාස්කු ඉරුදින සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය මගින් සංචාරක ක්ෂේත්‍රයට සිදුවූ අහිතකර බලපෑම සලකා බලමින් සහන ලබා ගැනීම සඳහා කැමැත්තක් ඇති සංචාරක ව්‍යාපාරයේ නිරත ව්‍යාපාර සහ පුද්ගලයන් හට සහන ලබා දෙන ලෙස දන්වමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කෙරිණ. මෙම සහන මගින් සංචාරක ක්ෂේත්‍රයේ නියුතු පුද්ගලයන් හට සිය ව්‍යාපාර යලි නගාසිටුවීම සඳහා අවස්ථාවන් ලබාදීම හා එමගින් බලපත්‍රලාභී බැංකුවල අක්‍රිය ණය ඇතිවීම අඩු කර ගැනීමට අපේක්ෂිතය. මේ අනුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ හෝ සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ සේවා සපයන වෙනත් ඕනෑම අධිකාරියක හෝ නියෝජිත ආයතනයක ලියාපදිංචි වී සිටින පුද්ගලයන් හා ආයතන සඳහා, ඒ ඒ අවස්ථානුකූලව සලකා බලා ණය සහන ලබා දීමට බලපත්‍රලාභී බැංකු වෙත උපදෙස් ලබා දෙන ලදී. ණය සහන කාල සීමාව තුළ අයවිය යුතු ප්‍රාග්ධනය සහ පොළී මුදල් ප්‍රමාණය 2020 ජූලි මස සිට පියවීම ඇරඹෙන පරිදි සහන ණය පොළී අනුපාතයක් සහිත නව කාලීන ණයකට හැරවීමට බැංකු වෙතට උපදෙස් ලබා දුන් අතර පසුව මේ සම්බන්ධයෙන් සහන අදාල වන ආකාරය සහ ණය සහන කාලය ක්‍රියාත්මක කිරීම, ලියාපදිංචි ආයතන සහ පුද්ගලයන් හඳුනාගැනීම සහ ගිණුම් තැබීමේ ක්‍රියාවලිය පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීම් සහිත සටහන් මාලාවක් ද නිකුත් කරන ලදී.

**(එ) මෝටර් රථ සඳහා ලබා දෙන ණය පහසුකම් වලට අදාළ වටිනාකම මත ණය අනුපාතය**

ව්‍යවසාය ශ්‍රී ලංකා වැඩසටහන යටතේ කුඩා කුළී රථ ණය සහන යෝජනා ක්‍රමය යටතේ මිලට ගන්නා ලියාපදිංචි නොකල විද්‍යුත් නොවන මෝටර් කාර් සඳහා ලබා දෙන ණය පහසුකම් වලට අදාළ සංශෝධිත වටිනාකම මත ණය අනුපාත බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දැනුම් දෙමින් බැංකු පනත් විධානයක් නිකුත් කෙරිණ.

**(ඒ) ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා සහ තෝලන අනුපාත පිළිබඳ බැංකු පනත් නියාමනයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 9 හා අනුගත කරවීම**

SLFRS 9 ක්‍රියාවට නැංවීමේ දී ඇතිවන ගැටළු මගහරවා ගැනීමට සහ බාසල් III යටතේ ප්‍රාග්ධනය හා අවධානම මත බර තැබූ වත්කම් ගණනය කිරීම් සංගතව පවත්වාගෙන යාම සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයන් හා තෝලන අනුපාතයන් ගණනය කිරීම් SLFRS 9 හා අනුගත කිරීමට බලපත්‍රලාභී බැංකු වෙත පැහැදිලි කිරීමේ සටහනක් නිකුත් කරන ලදී.

**(ඔ) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු වල භාණ්ඩාගාර මෙහෙයුම්හි වෙළඳපොළ හැසිරීම හා පරිචයන්**

බලපත්‍රලාභී බැංකු වල භාණ්ඩාගාර මෙහෙයුම්හි වෙළඳපොළ චර්යාධර්ම හා පරිචයන් සම්බන්ධයෙන් බැංකු පනත් විධානයක් නිකුත් කරන ලද අතර එමගින් වෙළඳපොළ හැසිරීම හා චාර්යාධර්ම පරිචයන්, රහස්‍යතා අවශ්‍යතාවයන්, ගනුදෙනු පිළිබඳ සංවාද පටිගත කිරීමේ ක්‍රියාවලිය, අවදානම් කළමණාකරන මූලධර්ම, වෘත්තීයභාවය සහ දැනුම් මට්ටම්, සහ මෙම විධානයන් හා අනුකූල නොවන විට පැනවිය හැකි සම්බාධක ආවරනය කෙරේ. මෙම විධානයන් මගින් බලපත්‍රලාභී බැංකු වල භාණ්ඩාගාර මෙහෙයුම්හි වෙළඳපොළ හැසිරීම හා පරිචයන් වැඩිදියුණු කිරීම හා එමගින් බලපත්‍රලාභී බැංකුවල වෙළඳපොළ අවදානම කළමණාකරන පද්ධතින් ශක්තිමත් කිරීමට අපේක්ෂිත අතර ඒ හරහා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව හා ශක්තිමත් බව වැඩිදියුණු කිරීම අරමුණ වේ. මේ සම්බන්ධයෙන් මෙයට පෙර නිකුත් කර ඇති විධානයන් හා චක්‍රලේඛද අවලංගු කරන ලදී.

**(ඕ) බලපත්‍රලාභී බැංකු වල ගිණුම් විගණනය කිරීම සඳහා සුදුසුකම් ලත් විගණකවරුන්ගේ ලැයිස්තුව**

2021 ජනවාරි 01 දින සිට ඇරඹෙන මූල්‍ය වර්ෂ සඳහා බලපත්‍රලාභී බැංකු වල ගිණුම් විගණනය කිරීම සඳහා සුදුසුකම් ලත් විගණකවරුන්ගේ නව ලැයිස්තුව ප්‍රකාශයට පත් කරමින් චක්‍රලේඛයක් නිකුත් කෙරිණ. මෙලෙස විගණකවරුන් ලෙස පත්කිරීම සඳහා සුදුසුකම් ලබන්නන් තෝරා ගැනීමේ දැනට පැවැති පටිපාටිය බැංකු ක්ෂේත්‍රයේ ඇතිවූ නව වෙනස්කම්, විගණන හා ගිණුම් තැබීමේ වෘත්තීන්ගේ සිදුවූ වෙනස්කම් සහ බාසල් III හා SLFRS 9 හඳුන්වා දීම නිසා සිදුවූ අවශ්‍යතා සලකාබලා යාවත්කාලීන කෙරිණ.

**(ඡ) බලපත්‍රලාභී බැංකු වල නිශ්චල දේපල තක්සේරු කිරීම සඳහා වන නියාමන රාමුව සංශෝධනය කිරීම**

බලපත්‍රලාභී බැංකු වල නිශ්චල දේපල තක්සේරු කිරීම සඳහා වන නියාමන රාමුව යටතේ බලපත්‍රලාභී බැංකු වල නිශ්චල දේපල තක්සේරුකිරීම සඳහා සුදුසුකම් ලබන තක්සේරුකරුවන් ගේ යෝග්‍යතා නිර්ණායක සංශෝධනය කරමින් බැංකු පනත් විධානයක් නිකුත් කෙරිණ.

**(ග) බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිළධාරීන්ගේ සහ විධායක කාර්යයන්හි නිරතු නිළධාරීන්ගේ යථා යෝග්‍යතාව තක්සේරුකිරීම**

බලපත්‍රලාභී බැංකුවල විධායක කාර්යයන්හි නිරත නිළධාරීන් ලෙස සැලකෙන තනතුරු නිර්ණය කරමින් බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිළධාරීන්ගේ සහ විධායක කාර්යයන්හි නිරතු නිළධාරීන්ගේ යථා යෝග්‍යතාව තක්සේරුකිරීම සම්බන්ධයෙන් බැංකු පනත් නිර්ණයන් නිකුත් කරන ලද අතර මෙමඟින් අදාල නිළධාරීන් පත්කිරීමට හෝ පත්වීම අළුත් කිරීමට පෙර බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගැනීම සඳහා එම නිළධාරීන්ගේ යථා යෝග්‍යතාව තක්සේරු කිරීම/යලි තක්සේරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශිත ආකෘතියකට සැපයීමට බලපත්‍රලාභි බැංකු වෙත දැනුවත් කෙරිණ. මේ සම්බන්ධයෙන් මෙයට පෙර නිකුත් කර ඇති නිර්ණයන් හා චක්‍රලේඛ මෙමඟින් අවලංගු කරන ලදී.

**(ච) බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂවරුන්ගේ යථා යෝග්‍යතාව තක්සේරුකිරීම**

බලපත්‍රලාභී බැංකු වලට අධ්‍යක්ෂවරුන් ලෙස නම්කිරීමට, තෝරා පත්කරගැනීමට හෝ පත්කිරීමට අපේක්ෂා කෙරෙන පුද්ගලයන් හට එසේ පත් කිරීමට හෝ නැවත පත් කිරීමට පෙර බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගැනීම සඳහා එම පුද්ගලයන්ගේ යථා යෝග්‍යතාව තක්සේරු කිරීම/යලි තක්සේරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමට බලපත්‍රලාභි බැංකු වෙත දැනුවත් කරමින් බැංකු පනත් විධානයක් නිකුත් කෙරිණ. මේ සම්බන්ධයෙන් මෙයට පෙර නිකුත් කර ඇති චක්‍රලේඛ මෙමඟින් අවලංගු කරන ලදී.

**(ජ) ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන බැංකු පනත් විධාන සංශෝධනය**

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිළධාරියෙක් ලෙස සේවය කරමින් සිටි පුද්ගලයෙක් මෙරට වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිළධාරියෙක් ලෙස පත්වීමට පෙර මාස 6ක අනිවාර්යයෙන් රැඳී සිටිය යුතු කාලයක් (Cooling-off period) ගත කල යුතු බවට විධානයක් ඇතුලත් කරමින් ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන බැංකු පනත් විධාන සංශෝධනය කෙරිණ.

**(ට) දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් සහිත බැංකු සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ පටිපාටිය**

වත්කම් ප්‍රමාණය රු. බිලියන 500 හෝ ඊට වැඩි බැංකු දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් සහිත බැංකු ලෙස නම් කිරීමේ දැනට පැවති පටිපාටිය සංශෝධනය කරමින් බැංකුවල ප්‍රමාණය, අන්තර් සබඳතා, ආදේශන හැකියාව සහ සංකීර්ණතාව වැනි සංරචක මත පදනම්ව එවැනි බැංකුවක් කඩා වැටීමෙන් මූල්‍ය ක්ෂේත්‍රයට විය හැකි විශාල බලපෑම මත ඒවා දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් සහිත බැංකු ලෙස හඳුනාගැනීමේ රාමුවක් නිකුත් කෙරිණ. මේ සම්බන්ධයෙන් දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් සහිත බැංකු 4 ක් නම් කරමින් බැංකු පනත් විධානයන් නිකුත් කළ අතර මෙලෙස නම්කරන ලද බැංකු විසින් ප්‍රාග්ධන අධිභාර ලෙස ඉහළ අලාභ අවශෝෂන හැකියාවන් සහිත අමතර ප්‍රාග්ධනයන් පවත්වාගෙන යායුතු වේ. තවද දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් සහිත බැංකු සඳහා පළමු පෙළ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය ලෙස ලෙස ඉහළ අලාභ අවශෝෂන හැකියාවන් සහිත අමතර ප්‍රාග්ධනයන් පවත්වාගෙන යායුතු ලෙසට බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතාවන් පිළිබඳව නිකුත් කරන ලද බැංකු පනත් විධාන සංශෝධනය කෙරිණ.

## 2.2 නව බැංකු පනත කෙටුම්පත් කිරීම

මෙරට මූල්‍ය ක්ෂේත්‍රයෙන් 62% ට ආසන්න ප්‍රමාණයකට හිමිකම් කියන බැංකු ක්ෂේත්‍රයේ වැඩිවෙමින් පවතින තරගකාරීත්වය, සීඝ්‍ර වෙනස්වීම් හා වැඩිවෙන සංකීර්ණත්වය සැලකිල්ලට ගනිමින් බලපත්‍රලාභී බැංකු සඳහා දැනට පවතින නියාමන රාමුව තවත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව මෑත කාලයේ වැඩි වශයෙන් අවධානයට ලක්විය. මේ අනුව, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නව බැංකු පනතක් කෙටුම්පත් කිරීමට ආරම්භ කල අතර යෝජිත නව බැංකු පනතේ මූලික සංකල්ප 2019 වසර තුළදී මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

නව බැංකු පනතට අන්තර්ගත කිරීමට යෝජිත සංකල්ප අතරට තනි බැංකු බලපත්‍ර ක්‍රමයක් හඳුන්වාදීම, බැංකු නියාමන සමානුපාතිකකරණය, බලපත්‍රලාභී බැංකුවල පරිපාලිත හා සහසම්බන්ධිත සමාගම් සඳහා මූල්‍ය පරිපාලක සමාගම් ව්‍යුහයන් හඳුන්වාදීම, බැංකු විසින් කොටස් ආයෝජන සිදුකිරීම් සුමට කිරීම, ශ්‍රී ලංකාව තුළ ඇති විදේශීය බැංකු ශාඛා පරිපාලිත ආයතන බවට පත්කිරීම, පාරිභෝගික ආරක්ෂණය, ආයතනික යහපාලනය ශක්තිමත් කිරීම සහ කොළඹ අන්තර්ජාතික මූල්‍ය මධ්‍යස්ථානයේ ස්ථාපනය කිරීමට යෝජිත බැංකු සඳහා බැංකු පනතේ විධි විධානයන් සුදුසු පරිදි යොදාගැනීම් ආදිය අයත් වේ.

ඉහත සඳහන් සංකල්ප පිළිබඳ බැංකු ක්ෂේත්‍රයේ සහ අනෙකුත් ක්ෂේත්‍රයන්ගේ සම්බන්ධිත පාර්ශ්වයන්ගේ අදහස් හා යෝජනා දැනගැනීම සඳහා උපදේශන පත්‍රිකාවක් නිකුත් කල අතර නව පනත 2021 වසරේ මුල් කාලය වන විට සම්පූර්ණ කර නීතිගත කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කර සිටී.

## 2.3 මුදල් මණ්ඩලය සහ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් ලබා දුන් අනුමැතීන්

**(අ) බලපත්‍රලාභී බැංකු ඒකාබද්ධ කිරීම්, අත්පත් කර ගැනීම් සහ වසා දැමීම්**

සලකා බලන වර්ෂය තුළදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රජයට අයත් කුඩා බැංකු ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සපයන ලදී. ඒ අනුව බැංකු අධීක්ෂණ

දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය මග පෙන්වීම් ලබා දී ඇති අතර, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිඩට් හි බැංකු කටයුතු අත්පත් කර ගැනීම සහ අවශෝෂණය කර ගැනීම සඳහා කාලෝචිත ආකාරයෙන් නියාමන අනුමැතිය ලබා දෙන ලදී. ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු, ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් වෙත නිකුත් කළ බැංකු බලපත්‍රය අවලංගු කරන ලදී. තවද, ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ් අත්පත් කර ගැනීම සඳහාද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව පහසුකම් සපයන ලදී. තවද, ඇක්සිස් බැන්ක් ලිමිටඩ් සහ අයිසීඅයිසීඅයි බැන්ක් ලිමිටඩ් යන බලපත්‍රලාභී බැංකු සඳහා ඔවුන්ගේ ප්‍රධාන කාර්යාලවල ඉල්ලීම් අනුව වසා දැමීමේ ක්‍රියා පටිපාටි ආරම්භ කිරීමට මුදල් මණ්ඩලය අවසර ලබා දුනි.

**(ආ) බලපත්‍රලාභී බැංකු ශාඛා සහ වෙනත් බැංකු ඒකක**

2019 වර්ෂය තුළදී බැංකු ශාඛා සහ වෙනත් බැංකු ඒකක ඉල්ලීම් 1,557 ක් සලකා බැලූ අතර අනුමත කිරීම් 1,519 ක් ලබා දී ඇත. තවද, විචක්ෂණශීලී හේතු මත ඉල්ලීම් 38 ක් කල් දමා/ ප්‍රතික්ෂේප කරන ලදි (සංඛ්‍යා සටහන II-1). ඒ අනුව, 2019 අවසන් වන විට බැංකු ශාඛා 3,604 ක්, ශිෂ්‍ය ඉතුරුම් ඒකක 3,783 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 5,571 ක් ක්‍රියාත්මක විය.

**II-1 සංඛ්‍යා සටහන**

**ශාඛා සහ වෙනත් බැංකු ඒකක සම්බන්ධ අනුමැතියන්**

| අනුමැතියේ ස්වභාවය | අනුමැතීන් සංඛ්‍යාව | |
|---|---|---|
| | අයදුම් කිරීම් | අනුමත කිරීම් |
| **විවෘත කිරීමේ සහ ස්ථාපනය කිරීම්** | **1,281** | **1,251** |
| ශාඛාවන් | 66 | 50 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | 146 | 136 |
| ශිෂ්‍ය ඉතුරුම් ඒකක | 231 | 231 |
| මුදල් තැන්පතු යන්ත්‍ර | 63 | 61 |
| ජංගම බැංකු ඒකක සහ ජංගම රථ | 560 | 560 |
| ජංගම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ මුදල් තැන්පතු යන්ත්‍ර | 8 | 8 |
| **ප්‍රතිස්ථාපන කිරීම්** | **149** | **143** |
| ශාඛාවන් | 137 | 131 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | 12 | 12 |
| ශාඛා සහ වෙනත් සේවා ඒකක වසා දැමීම හෝ ලබා දී ඇති අනුමැතීන් අවලංගු කිරීම් | 25 | 23 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හා අනෙකුත් ද සඳහා ලබා දී ඇති අනුමැතීන් අවංගු කිරීම සහ අත්හිටුවීම් | 102 | 102 |
| **මුළු එකතුව** | **1,557** | **1,519** |

**(ඇ) වෙනත් නියාමන අනුමත කිරීම්**

බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් යළි පත් කිරීම සඳහා යථා යෝග්‍යතාවය පරීක්ෂා කිරීම, සේවා බාහිරින් ලබා ගැනීමේ කටයුතු, වෙළඳපල වටිනාකමට වඩා අඩු වටිනාකමට දේපල බැහැර කිරීම, දෙවන පෙළ ප්‍රාග්ධනයෙහි ණයකර ඇතුළත් කිරීම, උපරිම අත්තිකාරම් සීමා ප්‍රමාණය ඉක්මවා යාම, අතහැර දැමූ දේපල ප්‍රතිපූරණය කිරීම, බැංකුවල කොටස් හිමිකාරිත්වය පිළිබඳ ප්‍රමාණාත්මක අයිතිය ලබා ගැනීම හා වෙනත් දෑ සම්බන්ධයෙන් 2019 දී නියාමන අනුමත කිරීම් 442 ක් ලබා දී ඇත. (සංඛ්‍යා සටහන II-2).

**II-2 සංඛ්‍යා සටහන**

**වෙනත් නියාමන අනුමත කිරීම්**

| අනුමත කිරීමේ වර්ගය | අනුමත කිරීමේ අංකය |
|---|---|
| ශාඛාවන් | 50 |
| අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පත් කිරීම සඳහා යථා යෝග්‍යතාවය පරීක්ෂා කිරීම | 220 |
| සේවා බාහිරින් ලබා ගැනීමේ කටයුතු | 51 |
| වෙළඳපල වටිනාකමට වඩා අඩු වටිනාකමට දේපල බැහැර කිරීම | 21 |
| දෙවන පෙළ ප්‍රාග්ධනයෙහි ණයකර ඇතුළත් කිරීම | 9 |
| උපරිම අත්තිකාරම් සීමා ප්‍රමාණය ඉක්මවා යාම | 7 |
| අතහැර දැමූ දේපල ප්‍රතිපූරණයන් | 7 |
| කොටස් හිමිකම සඳහා ප්‍රමාණාත්මක අයිතිය ලබා ගැනීම | 1 |
| වෙනත් අනුමත කිරීම් | 126 |

## 2.4 නියාමන ක්‍රියා

2019 වර්ෂයේදී, බලපත්‍රලාභී බැංකු විසින් බැංකු පනත හා එම පනත යටතේ නිකුත් කළ නියාමනයන්ට අනුකූල නොවන අවස්ථා 24 ක් සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අදාළ බැංකු වලට නියම කරන ලදී.

## 2.5 අඛණ්ඩ අධීක්ෂණයන් සිදු කිරීම

(අ) බැංකු පද්ධතියේ දිගුකාලීන පැවැත්ම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා අවදානම් කලින් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් ලෙස හා තැන්පත්කරුවන්ගේ අරමුදල් වල සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරමින් එක් එක් බැංකුවේ කටයුතු පිළිබඳව නිරන්තර අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණය, අඛණ්ඩ අධීක්ෂණය යනුවෙන් හඳුන්වනු ලැබේ.

(ආ) FinNet පද්ධතිය පදනම් කරගත් වෙබ් අඩවිය හරහා බැංකු පද්ධතිය මගින් සපයන්නා වූ මූල්‍ය තොරතුරු පදනම්ව නිරන්තර අධීක්ෂණයන් සිදු කරනු ලබයි. මූල්‍ය හා විචක්ෂණශීලී තොරතුරු ආවරණය වන පරිදි සතිපතා/ මාසිකව/ කාර්තුමය/ වාර්ෂිකව බැංකු විසින් ආකෘති 18 ක් පමණ FinNet පද්ධතිය භාවිතා කිරීමකින් තොරව ඉදිරිපත් කරන අතරතුර ආකෘති 70 ක් පමණ FinNet පද්ධතිය හරහා ඉදිරිපත් කරනු ලබයි. වඩාත් ඵලදායී වාර්තාවන් උත්පාදනය කිරීමට පහසුකම් සැලසීමේ අරමුණින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේද සහය ඇතිව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ තොරතුරු පද්ධතිය පුනර්ජීවනය කිරීමේ වැඩපිළිවෙල 2019 වර්ෂයේද අඛණ්ඩව ක්‍රියාත්මක විය. FinNet පද්ධතිය හරහා නව වාර්තා 8 ක් හඳුන්වා දුන් අතර තවත් වාර්තා 2 ක් සංශෝධනය කරන ලදී.

(ඇ) අඛණ්ඩ බැංකු අධීක්ෂණ ක්‍රියාවලිය තුළදී බැංකු මත පනවන ලද තැන්පතු හා ණයදීමේ සීමාවන් සම්බන්ධයෙන් වන පොලී අනුපාතයන්ගේ වෙනස්වීම් හා සහාධිපත්‍ය හා ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා බැංකු ක්ෂේත්‍රයේ නිරාවරණය වීම ආශ්‍රයෙන් විශේෂ වාර්තා ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, ප්‍රතිපත්ති තීරණ ගැනීම් හා වාර්තාවන් සකස් කිරීම පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සහ වෙනත් බාහිර රාජ්‍ය ආයතන වෙත බැංකු ක්ෂේත්‍රයේ සමස්ත තොරතුරු ඉදිරිපත් කරන ලදී. තවද, බැංකු අංශයේ ප්‍රවනතා පිළිබඳව ඉදිරිපත් කිරීම් 15 ක් සිදු කරන ලදී. තවද බැංකු අංශයේ ප්‍රවනතා පිළිබඳව මුදල් මණ්ඩලය කාර්තුමය වශයෙන් දැනුවත් කරන ලදී.

(ඈ) 2019 වසර තුළදී, තොරතුරු දැනගැනීමේ පනතට අදාළ ඉල්ලීම්ද ඇතුළත්ව පාරිභෝගික පැමිණිලි/ ඉල්ලීම් දළ වශයෙන් 661 ක් පමණ හසුරුවා ඇත. මෙම පැමිණිලි මූලික වශයෙන් ණය පොලී, ප්‍රතිව්‍යුහගත කරන ලද ණය, ණයපත්, උකස් කිරීම්, අනවසර මුදල් ආපසු ගැනීම් සහ සේවා ගාස්තු හා ඉලෙක්ට්‍රොනික් ටෙලර් යන්ත්‍ර ගාස්තු අඩු කිරීම් සඳහා කරන ලද ඉල්ලීම් වේ.

(ඉ) ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වූ විශේෂ පොලී යෝජනා ක්‍රමයට අදාළව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තොරතුරු රැස් කිරීම හා කාර්තුමය වශයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත එම තොරතුරු ලබා දීම සඳහා පහසුකම් සලසා ඇත.

(ඊ) බැංකු සඳහා පවත්වනු ලබන ව්‍යවස්ථාපිත පරීක්ෂණයන් මගින් හඳුනාගනු ලබන ගැටළු නියමිත කාලරාමුවන් තුළදී විසඳාගැනීමේ ප්‍රගතිය කාර්තුමය පදනමින් අධීක්ෂණය කිරීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරනු ලැබේ. මීට අමතරව, අඛණ්ඩ සුපරීක්ෂණයන් සිදු කිරීමේදී හඳුනාගත් නියාමන ගැටළු සාකච්ඡා කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු සමග රැස්වීම් 17 ක් පවත්වා ඇත.

## 2.6 කාලීන පරීක්ෂණ පැවැත්වීම

(අ) 2019 වසර තුළදී, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තෝරාගත් බැංකු 14 ක ණය කළමනාකරණය සම්බන්ධ තේමාත්මක සමාලෝචනයක් (Thematic review) ඇතුළුව ව්‍යවස්ථාපිත පරීක්ෂණ 27 ක් සහ පසුගිය වසරෙන් ඉදිරියට ගෙන ආ පරීක්ෂණ 5 ක් ද පවත්වන ලදී. 2019 වසරේදී අදාල බැංකු කළමනාකාරිත්ව සමග විධිමත් සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව බැංකු 26 ක ව්‍යවස්ථාපිත පරීක්ෂණ ආරම්භ කර අවසන් කරන ලදී. ව්‍යවස්ථාපිත පරීක්ෂණ 13 ක වාර්තා මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලද අතර පරීක්ෂණ 13 ක කටයුතු නිම කරමින් පැවතුණි. මෙම පරීක්ෂණ වලදී හඳුනාගත් ප්‍රධාන කරුණු ලෙස ඉහළ ගිය හානිකරණය වූ ණය හේතුවෙන් ණය වත්කම් වල ගුණාත්මකභාවය පිරිහීම, හානිකරණ ගාස්තු ගණනය කිරීමේ ක්‍රියාවලියේ පවතින අඩුපාඩු සහ එමගින් හානිකරණ ණය ප්‍රතිශතාත්මකව වැරදි ලෙස පෙන්වීම, අඩු ප්‍රාග්ධනකරණය සහ කාර්යක්ෂමතාවය, ආයතනික යහපාලනයේ සහ පරිපාලනයේ දුර්වලතා, තාක්ෂණික අවදානම් හා ද්‍රවශීල කළමනාකරණයේ අඩුලූහුඬුකම් සහ භාණ්ඩාගාරයේ මෙහෙයුම් සම්බන්ධ ගැටළුද ඇතුළත් වේ. මීට අමතරව ප්‍රතිව්‍යුහ ගත කළ ණය පහසුකම්, ආයතනික යහපාලනය සම්බන්ධ විධානයන් පිළිපැදීම, පාරිභෝගික පැමිණිලි, ද්‍රවශීලතා අවධානම, බැංකු ශාඛාවන්හි වංචනික කටයුතු, මානව සම්පත් කළමනාකරණය සහ පාරිභෝගික ගිණුම් ගනුදෙනු සත්‍යාපනය යනාදී ක්ෂේත්‍රයන් සඳහා සීමිත විෂයපථයන් සහිත පරීක්ෂණ කිහිපයක්ද පවත්වන ලදී.

(ආ) තවද, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී බැංකු වල අවදානම මත පදනම් අධීක්ෂණ රාමුවක් ක්‍රියාවට නැංවීම සඳහා බැංකුවල අධීක්ෂණ ශ්‍රේණිගත කිරීමේ ආකෘතියක්, බැංකු තිරසාර ශ්‍රේණිගත කිරීමේ දර්ශක (Bank Sustainability Rating Indicator (BSRI)) නමින් දියුණු කරන ලදී. බැංකුවල උපායමාර්ගික වෙස්කම් සහ නැගී එන ප්‍රවනතාවන් මගින් ඇතිවිය හැකි අවදානම් තත්වයන් හඳුනාගැනීම තුළින් කාලීනව මැදිහත් වී නිවැරදිකරණ පියවර ගැනීමට හැකි ක්‍රියාවලියක් සකස් කිරීමේ අරමුණින් මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිතව මෙය ක්‍රියාත්මක කරන ලදී. 2019 වසර තුළදී, බැංකු අතර BSRI රාමුව ඒකාකාරිව යොදවා ගැනීම සඳහා, සියළුම පරාමිතීන් සමාලෝචනය කරමින් යෝජිත BSRI ආකෘතිය තවදුරටත් වැඩිදියුණු කර වඩා පුළුල් වූ මාර්ගෝපදේශන රාමුවක් සකස් කරන ලදී.

## 2.7 බැංකු ක්ෂේත්‍රයේ දැනුම්වත්භාවය හා ශක්‍යතා වර්ධනය

### (අ) ශක්‍යතා වර්ධනය

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී බැංකු වල අනුකූලතා නිළධාරීන්, ප්‍රධාන තොරතුරු නිළධාරීන්, ප්‍රධාන අවදානම් නිළධාරීන් ඇතුළු ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් සඳහා අදාළ මාතෘකා යටතේ දැනුම බෙදාදීමේ වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. මෙයට අමතරව විවිධ පුහුණු වැඩසටහන් හා සැසිමාලාවල සාකච්ඡා මණ්ඩප සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තු නිළධාරීන් සම්පත් දායකත්වය සැපයීය. කොළඹ මූල්‍ය නගරයේ (Colombo Financial City) අවදානම් හා නියාමනය පිළිබඳ ක්‍රියාකාරී කමිටුව, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ ප්‍රාථමික වෙළඳුන්ගේ ක්‍රියාකාරකම් සඳහා විචක්ෂණ නියාමන හා විධාන ක්‍රියාකාරී කමිටුව, කණ්ඩදාම තාක්ෂණය පිළිබඳ ක්‍රියාකාරී කමිටුව, මූල්‍ය ක්ෂේත්‍රයේ පරිගණක තාක්ෂණ ආරක්ෂණ අවස්ථා ප්‍රතිචාරක කණ්ඩායමේ පාලක කමිටුව, ශ්‍රී ලංකාව තුළ

අතථ්‍ය මුදල් යෝජනා ක්‍රම පිළිබඳ අධ්‍යයනය කිරීමේ කාර්ය සාධක බලකාය, මූල්‍ය අන්තර්ගතකරණය වර්ධනය කිරීම සඳහා ගෙවීම් ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කිරීමේ කමිටුව, තිරසාර මූල්‍ය පිළිබඳ පාලක කමිටුව සහ ජාතික ගෙවීම් සහා සැලසුම් කමිටුව ආදී කමිටු රාශියක සාමාජිකයන් ලෙස බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තු නිළධාරීන් දායකත්වය සැපයීය.

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2019 වසරේ දී ද සිය කාර්ය මණ්ඩලයේ ශක්‍යතා වර්ධනයට කැපවී ක්‍රියා කල අතර අවදානම මත පදනම් වූ අධීක්ෂණය, ආතති පරීක්ෂාව, දත්ත විශ්ලේෂනය, ආයතනික යහපාලනය හා චර්යා ධර්ම, ඒකාබද්ධ අධීක්ෂණය, අවධානම් සමෝධායනය, මූල්‍ය වාර්ථාකරණ ප්‍රමිතීන් සහ තිරසාර මූල්‍යනය වැනි විෂය කරුණු ඔස්සේ පැවැති දේශීය හා විදේශීය පුහුණු වැඩමුළු සහ අධීක්ෂණ විද්‍යාලයයන් ට සිය නිළධාරීන් සහභාගී කරවීමට කටයුතු කරන ලදී.

**(ආ) බැංකු හා අනෙකුත් පාර්ශ්වයන් හා පැවති රැස්වීම්**

ශ්‍රී ලංකා ආර්ථිකයේ මෙන්ම බැංකු අංශයේ වර්ධනයන් සහ නියාමන හා අධීක්ෂණ රාමුවේ නව ප්‍රවනතාවයන් පිළිබඳ අදහස් හුවමාරු කරගැනීමේ හමුවක් ලෙස මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන බැංකු ප්‍රධාන විධායක නිළධාරීන්ගේ මාසික රැස්වීම්වල ලේකම් කටයුතු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ වසරේදීත් සිදු කරන ලදී. මෙයට අමතරව බැංකු ක්ෂේත්‍රයේ කාර්යසාධනය, දේශීය හා විදේශීය ආර්ථික හා නියාමන රාමුවන්ගේ සිදුවන නව ප්‍රවනතාවයන් පිළිබඳ දැනුවත් කිරීම සඳහා සියළු බැංකුවල සභාපතිවරුන් සමඟ රැස්වීමක් ද පවත්වන ලදී.

බලපත්‍රලාභී බැංකු වල සැලකිය යුතු නියාමන කරුණු පවතින අවස්ථාවන්හි දී ඒ සඳහා අවශ්‍ය නිවැරදිකරණ ක්‍රියාමාර්ග කඩිනමින් ලබා ගැනීම හා නිසි සුපරීක්ෂණයක් සෑම විටම පවත්වාගෙනයාමේ අරමුණින් සහ බැංකු ක්ෂේත්‍රයේ තිරසාරතාවය තහවුරු කිරීම සඳහා ඒ ඒ බැංකුවලට අදාළව විශේෂ රැස්වීම් බැංකු වල ඉහළ කළමනාකාරීත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සමඟ පැවැත්විණ. තවද නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති බැංකු ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කරලීමට පහසුකම් සැපයීමේ අරමුණින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී බැංකු හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය අතර රැස්වීම් සංවිධාන කරනු ලැබීය.

මූල්‍ය ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය, ශක්තිමත්භාවය හා සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රධාන නියාමන ආයතනයන්ගේ සහයෝගිතා වර්ධනයට පහසුකම් සැලසීමේ අරමුණින් එම ආයතනයන්ගේ ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් මූල්‍ය ක්ෂේත්‍ර අධීක්ෂණ කමිටුවේ කාර්තුමය රැස්වීම් සංවිධාන කිරීමට ද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කලේය.

**ඇමුණුම II-1**

**බලපත්‍රලාභී බැංකුවල නාමලේඛනය**

**බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අමානා බැන්ක් පී.එල්.සී.
2. ඇක්සිස් බැන්ක් ලිමිටඩ්*
3. ලංකා බැංකුව
4. බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ්
5. කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්
6. සිටි බැන්ක් එන්.ඒ.
7. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.
8. ඩොයිෂ් බැන්ක් ඒ.ජී.
9. ඩී.එෆ්.සී.සී. බැන්ක් පී.එල්.සී.
10. හබීබ් බැන්ක් ලිමිටඩ්
11. හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.
12. අයි.සී.අයි.සී.අයි බැන්ක් ලිමිටඩ්*
13. ඉන්දියන් බැන්ක්
14. ඉන්දියන් ඕවර්සීස් බැන්ක්
15. එම්.සී.බී. බැන්ක් ලිමිටඩ්
16. නැෂනල් ඩිවලෝප්මන්ට් බැන්ක් පී.එල්.සී.
17. නේෂන් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.
18. පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී.
19. මහජන බැංකුව
20. පබ්ලික් බැන්ක් බර්හාඩ්
21. සම්පත් බැන්ක් පී.එල්.සී.
22. සෙලාන් බැන්ක් පී.එල්.සී.
23. ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැන්ක්
24. ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
25. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
26. යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී.

**බලපත්‍රලාභී විශේෂිත බැංකු**

27. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
28. ජාතික ඉතිරි කිරීමේ බැංකුව
29. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
30. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.
31. ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ්
32. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

**විදේශ බැංකුවල නියෝජිත කාර්යාල**

1. දෝහා බැන්ක් ක්‍යු.පී.එස්.සී.
2. ජේ.පී. මෝගන් චේස් බැන්ක් එන්.ඒ.
3. එම්.යූ.එෆ්.ජේ. බැන්ක් ලිමිටඩ්

* ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇක්සිස් බැන්ක් ලිමිටඩ් හා අයි.සී.අයි.සී.අයි. බැන්ක් ලිමිටඩ් හි මව් සමාගම් බැංකු විසින් කල ඉල්ලීම් පරිදි එම බැංකු වල මෙරට ව්‍යාපාර මෙහෙයුම් කටයුතු කොන්දේසි වලට යටත්ව වසා දැමීමට අවසර ලබා දුනි. මේ අනුව මෙම බැංකු දෙකට මහජනතාවගෙන් තැන්පතු එකතු කිරීම ඇතුළු බැංකුකරණ කටයුතු වල නිරත වීමට මේ වන විට අවසර නොමැති අතර බැංකු දෙක වසා දැමීමෙන් අනතුරුව ඒවාට ලබා දී ඇති බලපත්‍ර අවලංගු කරනු ඇත.

## 3. බැංකු විදු පියෙස

බැංකු විදු පියෙස, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පුහුණු ආයතනය ලෙස ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ වෘත්තියවේදීන්ට සහ කලාපයේ අනෙකුත් මහ බැංකුකරුවන්ට ඉගෙනුම් අවස්ථාවන් ලබාදෙමින් උපායමාර්ගික කොටස්කරුවෙකු ලෙස අඛණ්ඩව ක්‍රියා කරයි. මූල්‍ය අංශයේ ආයතනවලට හා සමාගම්වලට මානව සම්පත තුළින් සාපේක්ෂ වාසි අත්කර ගැනීමේ අරමුණින් යුතුව මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමට බැංකු විදු පියෙස මගින් අවශ්‍ය සහයෝගය ලබා දෙයි.

මූල්‍ය අංශයේ වෘත්තිකයින්ට අවශ්‍ය දැනුම, කුසලතා සහ අත්දැකීම් ලබා දීම සඳහා පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම හා පැවැත්වීම තුළින් බැංකු විදු පියෙස සිය කැපවීම මනාව පෙන්නුම් කරයි. ඒ අනුව, මූල්‍ය අංශයේ වෘත්තිකයින්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සැලසුම් කිරීම, සම්බන්ධීකරණය හා පැවැත්වීම සඳහා බැංකු විදු පියෙස සිය අවධානය යොමු කර ඇති අතර උසස් මට්ටමේ පුහුණු පහසුකම් සමග උසස් තත්ත්වයේ පුහුණුවක් සහතික කරනු ලබයි. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මානව සම්පත සංවර්ධනය කිරීමේ උපායමාර්ගික අරමුණට අනුකූල වෙමින් මහ බැංකු කාර්යය මණ්ඩලය සඳහා අවශ්‍ය විවිධ පුහුණු පාඨමාලා පැවැත්වීම කෙරෙහි ද බැංකු විදු පියෙස සුවිශේෂී අවධානය යොමු කරනු ලබයි.

2019 වසරේ දී බැංකු විදු පියෙස මගින් බැංකු හා මූල්‍ය කටයුතු, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවය, භාණ්ඩාගාර මෙහෙයුම්, ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය, නීති හා රෙගුලාසි, පර්යේෂණ සහ දත්ත විශ්ලේෂණය, ආර්ථික විද්‍යාව, මානව සම්පත් සහ කළමනාකරණය, ග්‍රාමීය අංශ සංවර්ධනය හා ක්ෂුද්‍ර මූල්‍ය, තොරතුරු තාක්ෂණය යන අංශ ආවරණය වන විවිධ පුහුණු පාඨමාලා පැවැත්වීමට කටයුතු කර ඇත. මෙම විවිධ වූ අංශ ආවරණය වන පරිදි පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා බැංකු විදු පියෙස ඉහළ ශක්‍යතාවයෙන් යුත් සිය සම්පත් දායක මණ්ඩලයේ සේවය ලබා ගත් අතර මෙම සම්පත් දායක මණ්ඩලය ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහ මූල්‍ය අංශයෙහි ප්‍රතිපත්ති සහ නියාමන අංශයන්හි දේශීය/ජාත්‍යන්තර අත්දැකීම් සහිත ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් මෙන්ම දේශීය හා විදේශීය විශේෂඥයින්ගෙන් ද සමන්විත වේ.

බැංකු විදු පියෙස මගින් 2019 වසර තුළදී පුහුණු වැඩසටහන් 144 ක් සාර්ථකව පවත්වන ලද අතර එම වැඩසටහන්, පුහුණු පාඨමාලා දින දර්ශනයට අනුව පවත්වන ලද පාඨමාලා 50 කින්, මූල්‍ය අංශයේ ඉල්ලුම මත සංවිධානය කළ විශේෂ පාඨමාලා 62 කින්, අධ්‍යාපනික වැසටහන් 20 කින් සහ මහජනයාට විවෘත වූ ප්‍රසිද්ධ දේශන 12 කින් සමන්විත විය. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යය මණ්ඩලයේ නිපුණතාවයන් ඉහළ නැංවීමේ අරමුණින්, කුසලතා වර්ධන පුහුණු පාඨමාලා 26 ක් පවත්වන ලද අතර ඒ සඳහා නිලධාරීන් 1,052 ක් සහභාගි විය. මෙම කුසලතා වර්ධන පාඨමාලා, අග්නිදිග ආසියානු මහ බැංකු සංගමයේ (SEACEN) පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය, ඉන්දියානු මහ බැංකුව (RBI) සහ ජර්මනියේ මහ බැංකුව වන ඩොයිෂ් බුන්ඩේස් බැංකුවේ සහාය ඇතිව පවත්වන ලදී. තවද, දේශීය වාණිජ බැංකු හා විශේෂිත බැංකු, විදේශීය මහ බැංකු සහ විදේශීය වාණිජ බැංකුවල ඉල්ලීම පරිදි ඔවුන්ගේ කාර්යය මණ්ඩල සඳහා බැංකු විදු පියෙස මගින් විශේෂ පුහුණු පාඨමාලා 17 ක් පවත්වන ලදී. එසේම, ආර්ථික දැනුම සහ මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින්, විවිධ කාලීන මාතෘකා යටතේ මහජනතාවට විවෘත වූ ප්‍රසිද්ධ දේශන 8 ක් බැංකු විදු පියෙසෙහි ද, දේශන 4 ක් ප්‍රාදේශීය කාර්යාල මුල් කරගෙන ද පවත්වනු ලැබිණි. 2019 වසරේ දී බැංකු විදු පියෙසේ පුහුණු පාඨමාලා සඳහා දේශීය පුහුණුලාභීන් 8,378 ක් ද බංගලාදේශය, මාලදිවයින, නේපාලය, මැලේසියාව, ඕමානය සහ සුඩානය යන රටවල් නියෝජනය කරමින් විදේශීය පුහුණුලාභීන් 131 ක් ද සහභාගි විය. මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආර්ථික විද්‍යාව හදාරනු ලබන උසස් පෙළ සිසුන් ඉලක්ක කර ගනිමින් 'තක්ෂිලාව' හා 'අරිවූට්රු' නමින් සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් විකාශනය කරනු ලබන රූපවාහිනී අධ්‍යාපනික වැඩසටහන් මාලාවේ සම්බන්ධීකරන කටයුතු ද බැංකු විදු පියෙස මගින් 2019 වසරේ දී ද සිදු කරන ලදී.

මූල්‍ය ක්ෂේත්‍රයේ ශීඝ්‍ර තාක්ෂණික දියුණුවට සමගාමීව පුහුණු පාඨමාලාවල අන්තර්ගතය, දේශන පැවැත්වීම සහ ඒ සම්බන්ධ අනෙකුත් සේවා ඉහළ ප්‍රමිතියකින් පවත්වාගෙන යෑම සඳහා පශ්චාත් ඇගයුම් ක්‍රියාවලියක් ද බැංකු විදු පියෙස මගින් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ අනෙකුත් මූල්‍ය ආයතනයන්හි වර්තමාන සහ අනාගත පුහුණු සහ මානව සම්පත් සංවර්ධන අවශ්‍යතා නිසි ලෙස තක්සේරු කරමින් ඒ අනුව ඩිජිටල් බැංකුකරණයේ සහ ගෙවීම් ක්ෂේත්‍රයේ නැගී එන තාක්ෂණයන් පිළිබඳව වැඩසටහන් හඳුන්වා දෙමින් 2020 වසර සඳහා වූ බැංකු විදු පියෙසේ පුහුණු පාඨමාලා දින දර්ශනය සකස් කර ඇති අතර, සියලුම පාඨමාලා සෑම අංශයකින්ම ඉහළ ප්‍රමිතියකින් පවත්වාගෙන යෑමට බැංකු විදු පියෙස නිරන්තරයෙන් කටයුතු කරනු ලබයි.

## 4. සන්නිවේදන

ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු, එනම් ආර්ථික සහ මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව සුරක්ෂිත කිරීම සම්පූර්ණ කර ගැනීම සඳහා සහයෝගය දැක්වීමේ අරමුණින් මුදල් ප්‍රතිපත්තිය හා සම්බන්ධ තොරතුරු, මූල්‍ය ස්ථායිතාව සම්බන්ධ තොරතුරු මෙන් ම මහ බැංකුවේ ආයතනික සේවා සහ නියෝජිත කාර්යයන්ට අදාළ තොරතුරු ද පමාවකින් තොර ව සන්නිවේදනය කිරීමේ කාර්යභාරය සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් 2019 වසර තුළදී ද අඛණ්ඩ ව සිදු කරන ලදී. කථා, දේශන, රැස්වීම් සහ වැඩමුළු හරහා කෙරෙන සෘජු සන්නිවේදන කටයුතුවලට අමතර ව ඇල්මැති පාර්ශ්වයන් සමග සන්නිවේදනය සඳහා දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ නිල වෙබ් අඩවිය (www.cbsl.gov.lk), විවිධ මහ බැංකු ප්‍රකාශන, පුවත්පත්, රූපවාහිනිය මෙන් ම වීඩියෝ දර්ශන ද යොදා ගන්නා ලදී.

### 4.1 බාහිර සන්නිවේදන කටයුතු

විවිධ වෘත්තිකයන්, මාධ්‍යවේදීන්, සිසු සිසුවියන් ඇතුළු පොදු මහජනතාවට මහ බැංකු වෙබ් අඩවිය තුළින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් ම තොරතුරු සැපයීම තවදුරටත් සිදු විය. වෙබ් අඩවියේ ඇතුළත් වන තොරතුරු වෙත පහසුවෙන් හා වේගයෙන් මෙන් ම වඩාත් මිත්‍රශීලී ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාව එම පාර්ශ්වයන්ට හිමි වූ අතර ජංගම දුරකථන හරහා වෙබ් අඩවියට පිවිසීමේ අවස්ථාව ද සැලසිණි.

"මූල්‍ය ප්‍රතිපත්ති විවරණය" මෙන් ම මූල්‍යායතන සහ මූල්‍ය වෙළෙඳපොළට අදාළ මුදල් මණ්ඩල තීරණ ඇතුළත් පුවත්පත් නිවේදන ඇතුළු ව පුවත්පත් නිවේදන 1,202ක් 2019 වසරේ දී නිකුත් කෙරිණි. විවිධ ප්‍රතිපත්තිමය තීරණ පැහැදිළි කිරීම උදෙසා මාධ්‍ය හමු 08ක් ද පවත්වන ලදී. මෙම ක්‍රියාවලියේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් 2019 නොවැම්බර් මාසයේ දී මූල්‍ය ප්‍රතිපත්ති විවරණය දැනුම් දීමේ මාධ්‍ය හමුව එසැනින් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල සමාජ මාධ්‍ය වෙත මුදා හැරීම සිදු විය. 2019 වසර තුළ ගැසට් නිවේදන 05ක් නිකුත් වූ අතර පුවත්පත් දැන්වීම් ද ඇතුළු ව පුවත්පත් නිවේදන 107ක් ද 2019 වසර තුළදී මුද්‍රිත මාධ්‍ය වෙත නිකුත් කෙරිණි. මීට අමතර ව විදුලි පණිවුඩ පැවරුම් (විනිමය) අනුපාතික, ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පන අනුපාතික සහ ප්‍රතිපත්තිමය අනුපාතික සම්බන්ධ කෙටි පණිවුඩ හැඟවීම් 488ක් ද යවන ලදී.

ඇල්මැති පාර්ශ්වයන් සමග සන්නිවේදනය වඩාත් පහසු කරනු පිණිස සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල සමාජ මාධ්‍ය ගිණුම් වන YouTube, Twitter සහ Facebook පරිපාලනය සහ අධීක්ෂණය කරනු ලැබී ය. 2018 සහ 2019 යන වර්ෂවල මහ බැංකු සමාජ මාධ්‍ය ගිණුම්වල ක්‍රියාකාරීත්වයේ සංසන්දනාත්මක විග්‍රහයක් සංඛ්‍යා සටහන II-3 හි දැක්වේ.

**II-3 සංඛ්‍යා සටහන**

**සමාජ මාධ්‍ය හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන කටයුතු**

| සමාජ මාධ්‍යය | 2018 | 2019 |
|---|---|---|
| යූටියුබ් (වීඩියෝ උඩුගතකිරීම්) | 37 | 54 |
| යූටියුබ් නැරඹීම් (වසර තුළ) | 64,996 | 83,786 |
| ෆේස්බුක් ප්‍රියතා (වසර තුළ) | 5,221 | 7,266 |

අ.පො.ස. (උ.පෙ.) ශිෂ්‍ය ප්‍රජාවගේ ආර්ථික විද්‍යා දැනුම සහ මහ බැංකු ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම වර්ධනය කරනු වස් සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කෙරෙන "Econ Icon - Season IV" ප්‍රශ්න විචාරාත්මක තරගාවලියට කණ්ඩායම් තෝරා ගැනීම සඳහා ලිඛිත පරීක්ෂණයක් 2019 ජනවාරි 22 වන දින දිවයින පුරා පවත්වනු ලැබූ අතර එයින් සිංහල හා දෙමළ මාධ්‍ය පාසල් 16 බැගින් රූපවාහිනී වටය සඳහා තෝරා ගන්නා ලදී. මෙහි අවසන් මහා තරගය 2020 ජනවාරි මාසයේ දී පැවැත්විණ.

මහ බැංකුවේ පැවැත්වූ විවිධ සාකච්ඡා, සමුළු, සම්මන්ත්‍රණ, දේශන ආදිය සඳහා පහසුකම් සැපයීම ද සන්නිවේදන දෙපාර්තමේන්තුවෙන් සිදු විය. සිංගප්පූරු ජාතික සරසවියට අනුබද්ධ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ලී ක්වාන් යූ විද්‍යාලයේ සහාය මහාචාර්ය ආචාර්ය රසීන් සැලේ විසින් "අපේ කාලයේ දේශපාලන ආර්ථික කටයුතු සහ ආර්ථික ප්‍රතිපත්ති" මැයෙන් පැවැත්වූ 69 වන සාංවත්සරික දේශනය, 2019 පෙර දැක්ම සහ 12 වන වාර්ෂික ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව ඒ අතර ප්‍රධාන තැනක් ගනී.

2019 සැප්තැම්බර් 20 සිට 29 දක්වා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වූ කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සහභාගී වූ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු ප්‍රකාශන අලෙවිය සහ නොමිලේ බෙදාහැරීම සිදු කරන ලදී.

"ජනපතිට කියන්න" මහජන දුක්ගැනවිලි වැඩසටහන යටතේ මහ බැංකුවට ලැබුණු දුක්ගැනවිලි 234ක් සම්බන්ධයෙන් අදාළ දෙපාර්තමේන්තු හා එක් වී කටයුතු කිරීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව මැදිහත් විය.

### 4.2 අභ්‍යන්තර සන්නිවේදන කටයුතු

සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළ වන ජාතික පුවත්පත් 15ක පළ වූ ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ ආර්ථික කටයුතු සහ වෙනත් මූල්‍ය කාරණා සම්බන්ධ ලිපි, වාර්තා සහ මහජන මතය පෙන් වන පුවත්පත් ලිපි 3,983ක් කපා වෙන් කොට ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරන ලදී. ඊට අමතර ව වැදගත් පුවත්පත් නිවේදන මහ බැංකු කාර්ය මණ්ඩලය අතර ද බෙදා හරින ලදී.

ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් පමණක් පළ වන මහ බැංකුවේ අභ්‍යන්තර ප්‍රවෘත්ති සඟරාව වන "කවුළුව" බැංකුවේ අභ්‍යන්තර වෙබ් අඩවිය වන "මංසල" වෙත උඩුගත කරන ලදී.

### 4.3 මහජන දැනුම්වත්භාවය

"ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු හා කාර්යභාරය" සහ "ශ්‍රී ලංකාවේ ආර්ථිකය" යන මාතෘකා ප්‍රමුඛ පුළුල් පරාසයක පැතිරුණු විවිධ මාතෘකා ඔස්සේ දේශන මාලාවක් සම්බන්ධීකරණය කිරීමට සන්නිවේදන දෙපාර්තමේන්තුව සමත් විය. පාසල් සිසු සිසුවියන්, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සහ ගුරුවරුන් ඇතුළු 8,306ක සහභාගීත්වය ඒ සඳහා ලැබිණි. ඒ පිළිබඳ විස්තර සංඛ්‍යා සටහන II-4 හි දැක්වේ.

**II-4 සංඛ්‍යා සටහන**

**2018 වසර තුළ පැවැත්වූ මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර**

| ආයතනය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| පාසල් | 87 | 7,558 |
| විශ්වවිද්‍යාල | 6 | 491 |
| ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා සහ ආරක්ෂක විශ්වවිද්‍යාලය | 6 | 216 |
| විදෙස් නියෝජිතයන් (ජාතික ආරක්ෂක විද්‍යාල) | 1 | 41 |
| ප්‍රධාන කාර්යාලයෙන් පිටත පැවැත්වූ ජංගම වැඩසටහන් | 3 | ලැ.නො. |

ප්‍රධාන කාර්යාලයෙන් පිටත පැවැත්වූ ජංගම වැඩසටහන් තුන, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල මගින් සංවිධානය කරන්නට යෙදුණු අතර ඒ සඳහා සම්පත් දායකයන් සහ මහ බැංකු ප්‍රකාශන ලබා දීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව සිය සහයෝගය දැක්වී ය. ඊට අමතර ව සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ දෙවන කාර්තුවේ දී මාධ්‍යවේදීන් සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ද සංවිධානය කරන ලදී.

2019 වසර තුළදී සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 6.9ක් වටිනා ප්‍රකාශන විකුණන ලදී. ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාස කෞතුකාගාරයේ සහ රාජගිරිය බැංකු විදු පියෙසේ පිහිටි විකුණුම් කවුළුවල දී, ප්‍රාදේශීය කාර්යාලවල දී සහ කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේ දී මෙම අලෙවි කටයුතු සිදු විය. මීට අමතර ව සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පාසල් සහ විවිධ ප්‍රදේශවල මහජන පුස්තකාල සඳහා නොමිලේ බෙදා හරින ලද මහ බැංකු ප්‍රකාශන සංඛ්‍යාව 11,613කි.

## 4.4 දෙමළ පරිවර්තන සේවා

මහ බැංකුවේ දෙමළ සන්නිවේදන කටයුතු වඩාත් විධිමත් ලෙස කිරීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් විශිෂ්ට දෙමළ පරිවර්තන සේවාවක් සපයන ලදී. මහ බැංකුවේ ප්‍රධාන ප්‍රකාශනවල පරිවර්තන කටයුතු ද මෙයට ඇතුළත් ය. ජාතික භාෂා ප්‍රතිපත්තියට අනුකූල වන ලෙස තොරතුරු භාෂාත්‍රයෙන් ම සැපයීමේ සිය මෙහෙවර සාර්ථක කර ගැනීමට මෙමගින් සන්නිවේදන දෙපාර්තමේන්තුවට හැකි විය.

## 4.5 ඡායාරූප සහ වීඩියෝ ආවරණ කටයුතු

2019 වසර තුළදී අවස්ථා 669කට අධික ප්‍රමාණයක ඡායාරූප හෝ වීඩියෝ ආවරණ කටයුතු සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී. ආවරණ කටයුතුවලට අමතර ව ඡායාරූප හා වීඩියෝ සංස්කරණය, ඡායාරූප මුද්‍රණය, ඇල්බම් සෑදීම, ඡායාරූප සහ වීඩියෝ සංගත තැටිවලට කොපි කිරීම, ඒවා මහ බැංකු නිල වෙබ් අඩවියට සහ අභ්‍යන්තර වෙබ් අඩවිය (මංසල) ට උඩුගත කිරීම ආදී සේවාවන් රැසක් වෘත්තීය මට්ටමෙන් ඉටු කෙරිණි.

## 4.6 මුද්‍රණාලය

මහ බැංකුවේ මුද්‍රණ අවශ්‍යතා ඉතා ඉහළ ප්‍රමිතියකින් ඉටු කිරීම සඳහා අවශ්‍ය නිර්මාණ, වර්ණයෝජන, මුද්‍රණ සහ නිමැවුම් දායකත්වය අඛණ්ඩ ව සන්නිවේදන දෙපාර්තමේන්තුවෙන් සැපයිණි. 2019 වසරේ දී මුද්‍රණ ඇණවුම් 114ක් සම්පූර්ණ කිරීමට මහ බැංකු මුද්‍රණාලය සමත් විය. සටහන කලාප 6ක්, නිව්ස් සර්වේ කලාප 6ක්, වයිප්පහම් කලාප 7ක්, "කාසියේ අසිරිය", "ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු, කාර්යයන් සහ සංවිධානය" (භාෂාත්‍රයෙන්) "ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන" (භාෂාත්‍රයෙන්), "ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත" (භාෂාත්‍රයෙන්), යන ප්‍රකාශන ඒවා අතර විය. ඊට අමතර ව වර්ණ පෝස්ටර්, අත්පත්‍රිකා, ලිපි ශීර්ෂ, නම්පත්, විවිධ පෝරම වර්ග සහ සුබපැතුම්පත් ද මුද්‍රණය කරන ලදී.

## 4.7 පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය

ආර්ථික සංවර්ධනය ඇතුළු විෂය ක්ෂේත්‍රයන් රාශියක් සම්බන්ධයෙන් වර්ධනය කර ගත් නවතම දැනුම් සම්භාරයක් සහිත ව සිය වෘත්තීය භූමිකාව මනා ලෙස ඉටු කිරීමට මහ බැංකු නිලධාරීන් හට සහාය වීමේ අරමුණින් පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ.

පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය පොත් 38,194කින්, වාර්තා 19,600කින් සහ සංගත තැටි 2,080කින් සමන්විත ය. 2019 වසර තුළදී එකතු වූ පොත් 760ක් ද එයට අයත් වේ. ඊට අමතර ව ජර්නල 49,000ක් ද පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය සතු වේ. ආර්ථික විද්‍යාව, කළමනාකරණය සහ මූල්‍යය යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය කෙරෙන සුවිසල් ප්‍රකාශන එකතුවකට පිවිසිය හැකි "Science Direct", "EconLit" සහ "Wiley Online Journals" යන මංගත දත්ත පදනම්වල දායකත්වය ද පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් ලබා ගෙන ඇත. මේවාට අමතර ව මහ බැංකුකරණයට අදාළ තොරතුරු ලබාගත හැකි "www.centralbanking.com", "www.risk.net" සහ "www.ft.com" යන මංගත මූලාශ්‍රවල ද දායකත්වය ලබාගෙන ඇති පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය එම මූලාශ්‍රවලට පිවිසීමේ අවස්ථාව කාර්ය මණ්ඩලයට ලබා දී ඇත. ජර්නල ලිපිවලට ප්‍රවේශවීම සඳහා "OpenAthens"හි දායකත්වය ලබාගෙන ඇති පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය දේශීය මුද්‍රිත ජර්නල 18කට සහ විදේශීය මුද්‍රිත ජර්නල 84කට ද දායක වී ඇත.

පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් සකස් කරන ලද ඉලෙක්ට්‍රොනික ප්‍රකාශන රාශියක් අන්තඃජාලය හරහා කාර්ය මණ්ඩලය වෙත බෙදා හැරේ. පුස්තකාලය වෙත එකතු වූ නව පොත් ගැන සඳහන් "Recent Additions", ආර්ථික විද්‍යාව, බැංකු කටයුතු සහ මූල්‍යය පිළිබඳ වාර්තා සහ සටහන් ඇතුළත් "Current Contents", "International News Alert", "Local Press"යන .ඉලෙක්ට්‍රොනික ප්‍රකාශන ඒවා අතර වේ. කාර්ය මණ්ඩලයේ ඉල්ලීම මත අවශ්‍ය තොරතුරු විද්‍යුත් තැපැල හරහා ලබා දීමේ සේවාවක් ද පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය මගින් පවත්වාගෙන යයි.

අන්තර් පුස්තකාල ණය පහසුකම යටතේ ප්‍රයෝජනවත් තොරතුරු බැංකු කටයුතු හා ආර්ථික විද්‍යා පුස්තකාල වෙත ලබා දීමේ සේවාවක් ද පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය මගින් පවත්වාගෙන යයි. එසේ ම ලොව පුරා මහ බැංකු සහ මූල්‍යායතන අතර තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ඇති Global Central Bank, Financial Institutions Library සහ Information Professionals' Network (CBFA List) යන සමූහයන් තුළ ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය ක්‍රියා කරයි. පුස්තකාලයේ අන්තර්ජාල වෙබ් අඩවිය හරහා ඩිජිටල් පුස්තකාලයට ප්‍රවේශ වීමේ අවස්ථාව ද කාර්ය මණ්ඩලය වෙත පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් සලසා දී ඇත.

# 5. ව්‍යවහාර මුදල්


1949 අංක 58 දරන මුදල් නීති පනතේ 49 වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පරම අයිතිය හා අධිකාරිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. ඒ අනුව, ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ ව්‍යවස්ථාපිත වගකීම් හා බැඳී කාර්යයන් හැසිරවීම ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. ව්‍යවහාර මුදල් නෝට්ටු නිර්මාණය හා මුද්‍රණය කිරීම, කාසි ටංකනය කිරීම, මහජන ඉල්ලුම සපුරාලීම සඳහා ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි නිකුත් කිරීම, බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් මුදල් තැන්පතු භාර ගැනීම, සේවා අනිසි (භාවිතයට නුසුදුසු) නෝට්ටු හා කාසි සංසරණයෙන් ඉවත් කිරීම, වලංගු මුදල් සම්බන්ධයෙන් මුදල් නීති පනතේ පවතින විධි විධාන උල්ලංඝනය කළ අවස්ථාවලට අදාළව කටයුතු කිරීම සඳහා නීති ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ට සහය වීම හා ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනාගැනීමත්, ව්‍යවහාර මුදල් භාවිතයේ හොඳ පුරුදු මගින් එහි ගුණාත්මක තත්ත්වය සුරක්ෂිත කිරීමත් පිළිබඳ මහජන දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ වැඩසටහන් පැවැත්වීම යන කරුණු සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම 2019 වර්ෂය තුළදී ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. 2019 වර්ෂය තුළ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ හා ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතුවල සාරාංශයක් පහත දැක්වේ.

## 5.1 සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්

රූප සටහන II-1 හි දක්වා ඇති පරිදි පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයෙන් පසු මන්දගාමී වූ ආර්ථික කටයුතු හේතුවෙන් 2019 මැයි - ජූලි මාසවල දී ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි සඳහා ඉල්ලුම මධ්‍යස්ථව පැවතුනද එය 2019 වර්ෂයේ දී අඛණ්ඩව වර්ධනය වී ඇත.

**II-1 රූප සටහන**

**සංසරණයෙහි පැවති ව්‍යවහාර මුදල් (2015-2019)**




ඒ අනුව, පහත සංඛ්‍යා සටහන II-5 හි දැක්වෙන පරිදි 2019 දෙසැම්බර් 31 දින වන විට වර්ෂය තුළ සංසරණයේ පැවති මුළු ව්‍යවහාර මුදල් වටිනාකම රුපියල් බිලියන 677.4 දක්වා සියයට 5.8 කින් වර්ධනය වී ඇත.

**II-5 සංඛ්‍යා සටහන**

**සංසරණයෙහි පැවති ව්‍යවහාර මුදල් (දෙසැම්බර් 31 දිනට)**


| අයිතමය | වටිනාකම (රුපියල් බිලියන) | | | | | වෙනස (ප්‍රතිශතයක් ලෙස) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
| නෝට්ටු | 482.0 | 541.5 | 585.3 | 627.1 | 663.1 | 17.9 | 12.3 | 8.1 | 7.1 | 5.7 |
| කාසි* | 9.1 | 10.7 | 12.1 | 13.2 | 14.2 | 21.3 | 17.3 | 13.1 | 9.0 | 7.6 |
| එකතුව | 491.1 | 552.2 | 597.4 | 640.3 | 677.4 | 18.0 | 12.4 | 8.2 | 7.2 | 5.8 |

*සමරු කාසි අන්තර්ගත නොවේ.

2019 වර්ෂය තුළදී සංසරණයේ පැවැති ව්‍යවහාර මුදල් නෝට්ටුවල වටිනාකම රුපියල් බිලියන 663.1 දක්වා සියයට 5.7 කින් වැඩි වී ඇත. සංසරණයේ පැවැති රු.5000 සහ රු.1000 මුදල් නෝට්ටුවල වටිනාකම එක්ව ගත් විට එය සංසරණයේ පැවැති මුළු ව්‍යවහාර මුදල් නෝට්ටුවල වටිනාකමින් ආසන්න වශයෙන් සියයට 87ක් ද (රූප සටහන II-2) රු. 20 මුදල් නෝට්ටු ප්‍රමාණය සංසරණයේ පැවැති මුළු ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් සියයට 31 ක් ද වේ (රූප සටහන II-3).


**II-2 රූප සටහන**

**2019 වර්ෂය අවසානයේ දී සංසරණයේ පැවති මුදල් නෝට්ටුවල වටිනාකම (රුපියල්)**




**II-3 රූප සටහන**


**2019 වර්ෂය අවසානයේ දී සංසරණයේ පැවති මුදල් නෝට්ටුවල ප්‍රමාණය (නෝට්ටු වශයෙන්)**



දළ දේශීය නිෂ්පාදිතයට, සංසරණයේ පැවැති මුදල් ප්‍රමාණය දරන අනුපාතය 2019 වර්ෂයේ දී ද සියයට 4.5 ක ස්ථාවර අගයක්ව පැවති අතර එය ගෙවීම් ක්‍රමයක් ලෙස රටෙහි ව්‍යවහාර මුදල් වෙනුවෙන් පවතින සුවිශේෂීත්වය පෙන්නුම් කරනු ලැබේ (රූප සටහන II-4).

**II-4 රූප සටහන**

**සංසරණයේ පැවති ව්‍යවහාර මුදල්/දළ දේශීය නිෂ්පාදිතය**




## 5.2. ව්‍යවහාර මුදල් කළමනාකරණය

රට තුළ පවතින ගෙවීම් යාන්ත්‍රණයට පහසුකම් සලසා දෙමින් ගුණාත්මක තත්ත්වයේ ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි සංසරණයට නිකුත් කිරීම හා සේවා අනිසි (භාවිතයට නුසුදුසු) ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි සංසරණයෙන් ඉවත් කිරීම යන ප්‍රධාන කාර්යයන් ව්‍යවහාර මුදල් කළමනාකරණයට අයත් වේ. ඵලදායී ව්‍යවහාර මුදල් කළමනාකරණයක් සහතික කිරීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය තුළ පහත කාර්යයන් අඛණ්ඩව සිදු කිරීමට කටයුතු කරන ලදී.

### (අ) ව්‍යවහාර මුදල් මුද්‍රණය හා ටංකනය

ප්‍රමාණවත් තොග පවත්වා ගනිමින් ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය නව ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 175 ක් 2019 වර්ෂය සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ඇණවුම් කරන ලදී. එසේම 2017 වර්ෂයේ දී ඇණවුම් කරන ලද මිලියන 970 ක නව කාසි තොගයෙන් කොටසක් වූ කාසි මිලියන 639.4 ක ප්‍රමාණයක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව වෙත ලැබිණ.

### (ආ) ව්‍යවහාර මුදල් නිකුත් කිරීම

සේවා නිසි (භාවිතයට සුදුසු) ව්‍යවහාර මුදල් නෝට්ටු යළි සංසරණයට නිකුත් කිරීම මගින් නව ව්‍යවහාර මුදල් නෝට්ටු මුද්‍රණය සඳහා දැරිය යුතු පිරිවැය අවම කිරීම පිළිබඳව ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මෙම වර්ෂය තුළදී අවධානය යොමු කරන ලදී. ඒ අනුව 2019 වර්ෂය තුළදී, රුපියල් බිලියන 526.5 ක් සේවා නිසි ව්‍යවහාර මුදල් නෝට්ටු ද රුපියල් බිලියන 248.7 ක් නව ව්‍යවහාර මුදල් නෝට්ටු ද වශයෙන් මුළු ව්‍යවහාර මුදල් නෝට්ටු රුපියල් බිලියන 775.2 ක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සංසරණයට එක් කරන ලදී. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු, ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවේ මහජන කවුළු හා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් කවුළු මගින් රුපියල් බිලියන 1 ක වටිනාකමකින් යුතු කාසි නිකුත් කර ඇත (සංඛ්‍යා සටහන II-6). 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂය තුළ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුතුව අඩු වූ අතර එයට ප්‍රධාන හේතුව වූයේ හිතාමතා විකෘති කරන ලද හා හානි කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු සම්බන්ධ ප්‍රතිපත්තිය දැඩිව ක්‍රියාත්මක කිරීම හේතුවෙන් 2018 වර්ෂය තුළ නව නෝට්ටු විශාල ප්‍රමාණයක් නිකුත් කිරීමයි. මහජනතාව අතර කාසි සඳහා පවතින අඩු ඉල්ලුම පෙන්නුම් කරමින් 2019 වර්ෂය තුළ කාසි නිකුතුව ද සුළු වශයෙන් අඩු වී ඇත.

**II-6 සංඛ්‍යා සටහන**

**ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි නිකුතුව**

| නිකුතු | වටිනාකම (රු. බිලියන) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
| නෝට්ටු | 503.4 | 594.0 | 627.9 | 795.4 | 775.2 |
| කාසි* | 1.6 | 1.6 | 1.4 | 1.1 | 1.0 |
| එකතුව | 505.0 | 595.6 | 629.3 | 796.5 | 776.2 |

* සමරු කාසි අන්තර්ගත නොවේ.

### (ඇ) ව්‍යවහාර මුදල් තැන්පතු බාර ගැනීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද ව්‍යවස්ථාපිත සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාවය මූලික කරගනිමින් බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් සිදු කරනු ලබන ව්‍යවහාර මුදල් තැන්පතු ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් බාර ගනු ලැබේ. එමෙන්ම සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් නෝට්ටුවල ගුණාත්මක තත්ත්වය පවත්වා ගැනීම සඳහා හානි වූ ව්‍යවහාර මුදල් නෝට්ටු ඇතුළු භාවිතයට නුසුදුසු (සේවා අනිසි) ව්‍යවහාර මුදල් නෝට්ටු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් බාර ගෙන සංසරණයෙන් ඉවත් කිරීම ද ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. එලෙස 2015 සිට 2019 දක්වා කාලය තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තැන්පත් කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු වටිනාකම් පිළිබඳව සංඛ්‍යා සටහන II-7 හි දැක්වේ.

සිතාමතා විකෘති කරන ලද සහ හානි කරන ලද මුදල් නෝට්ටු තැන්පත් කිරීම සඳහා සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ලබා දෙන ලද කාල සීමාව 2018 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වූ බැවින් 2018 වර්ෂය තුළ තැන්පත් කරන ලද සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රමාණය පෙර වාර්තා නොවූ ප්‍රමාණයකින් ඉහළ අගයක් ගත් අතර ඒ හා සසඳන කළ 2019 වසරේ දී සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු තැන්පතු පහත වැටී ඇත.

**II-7 සංඛ්‍යා සටහන**

**ව්‍යවහාර මුදල් නෝට්ටු තැන්පතු**

| තැන්පතු | වටිනාකම (රු. බිලියන) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
| සේවා නිසි | 331.9 | 433.8 | 464.2 | 524.1 | 606.9 |
| සේවා අනිසි | 98.3 | 100.7 | 119.9 | 229.6 | 132.1 |
| එකතුව | 430.2 | 534.5 | 584.1 | 753.7 | 739.0 |

* බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කරන ලද කාසිවල වටිනාකම සැලකිය යුතු අගයක් නොවේ.

**(ඈ) සේවා අනිසි (භාවිතයට නුසුදුසු) ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කිරීම**

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරා ඇති සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කිරීමේ ව්‍යවස්ථාපිත බලය ක්‍රියාවට නංවමින් 2019 වර්ෂය තුළ රුපියල් බිලියන 139.8 ක් වටිනා සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 235 ක් (සංඛ්‍යා සටහන II-8) ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් විනාශ කරන ලදී.

**II-8 සංඛ්‍යා සටහන**

**සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කිරීම**

| නෝට්ටු | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| නෝට්ටු ගණන (මිලියන) | 182.7 | 179.2 | 177.1 | 343.8 | 235.0 |
| වටිනාකම (රු. බිලියන) | 88.8 | 57.4 | 94.2 | 252.2 | 139.8 |

## 5.3. අනෙකුත් කටයුතු

**(අ) ව්‍යවහාර මුදල් කවුළු මෙහෙයවීම**

මහජනතාවට ව්‍යවහාර මුදල් හුවමාරු කර ගැනීමේ පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටුවා තිබූ ව්‍යවහාර මුදල් කවුළු, 1996 බෝම්බ ප්‍රහාරයෙන් පසු අත්හිටුවන ලද අතර 2019 මාර්තු 27 දින එම මුදල් කවුළු නැවත විවෘත කරන ලදී. තවද, හානි වූ මුදල් නෝට්ටු හුවමාරු කවුළුව අඛණ්ඩව පවත්වාගෙන යන ලද අතර 2019 වර්ෂය තුළදී රුපියල් මිලියන 116 ක ව්‍යවහාර මුදල් නෝට්ටු ඒ හරහා හුවමාරුවන ලදී.

**(ආ) ආර්ථික ඉතිහාස කෞතුකාගාරය මෙහෙයවීම**

ආර්ථික ඉතිහාස කෞතුකාගාරය විසින් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි පිළිබඳව උනන්දුවක් දක්වන්නා වූ විදේශිකයන් ඇතුළු මහජනතාව වෙත පුළුල් දැනුමක් සපයනු ලැබේ. සමරු නෝට්ටු, සමරු කාසි සහ සමරු අයිතම විකිණීම හා නරඹන්නන්ට ආදර්ශන වැඩමුළු පැවැත්වීම ආර්ථික ඉතිහාස කෞතුකාගාරයේ ඇතැම් ප්‍රධාන කටයුතු වේ. ඒ අනුව 2019 වර්ෂය තුළදී ආර්ථික ඉතිහාස කෞතුකාගාරය මගින් දේශීය පුද්ගලයින් 2,301 ක් ද විදේශිකයින් 511 ක් ද පාසැල් 100 ක ශිෂ්‍යයින් 6,248 ක් ද ඇතුළුව සමස්ත පුද්ගලයින් 9,060 කට සේවා සලසන ලදී.

**(ඇ) ව්‍යවහාර මුදල් කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීම**

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් විමර්ශන කාර්යාංශයේ සහයෝගය ඇතිව ව්‍යාජ මුදල් නෝට්ටු සම්බන්ධ සිදුවීම් අවම කිරීම සහ ව්‍යවහාර මුදල් පිළිබඳ මහජන විශ්වාසය ආරක්ෂා කිරීම පිළිබඳව කටයුතු අඛණ්ඩව සිදුකරන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කළ අනාවරණය කර ගන්නා ලද ව්‍යාජ මුදල් නෝට්ටු 2,266 ක් සහතික කිරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් කටයුතු සලසන ලදී. අනාවරණය කර ගන්නා ලද ව්‍යාජ මුදල් නෝට්ටු අනුපාතිකය සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියනයකට ව්‍යාජ මුදල් නෝට්ටු දෙකක් වූ අතර එය අනෙකුත් බොහෝ රටවල ව්‍යාජ මුදල් නෝට්ටු සම්බන්ධ අවස්ථා සමග සසඳන විට සැලකිය යුතු අඩු මට්ටමක් වේ. අධිකරණමය නඩු විභාගයන් සඳහා පහසුකම් සලසමින් ව්‍යවහාර මුදල් නෝට්ටු අනුකරණය සම්බන්ධව තීරණාත්මක සාක්ෂ්‍යය වශයෙන් මුදල් නීති පනතේ 59 වන වගන්තිය ප්‍රකාරව සහතික 127 ක් නිකුත් කරන ලද අතර ව්‍යාජ මුදල් නෝට්ටු සම්බන්ධ අධිකරණමය නඩු විභාග හතකට වර්ෂය තුළදී සහභාගී වන ලදී.

**(ඈ) පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය ප්‍රවර්ධනය කිරීම**

ව්‍යවහාර මුදල් නෝට්ටු සිතාමතා විකෘති කිරීම හා හානි කිරීමට එරෙහි ප්‍රතිපත්තිය දැඩිව ක්‍රියාත්මක කිරීම ඉතා සාර්ථක බව දක්නට ලැබේ. සිතාමතා විකෘති කරන ලද හා හානි කරන ලද මුදල් නෝට්ටු සංසරණය වීම මේ වන විට ඉතාම අඩු මට්ටමක පවතින බව ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සහ සාමාන්‍ය මහජනතාවගේ පිළිගැනීමයි. ව්‍යවහාර මුදල් නෝට්ටු නිසි භාවිතය මගින් එහි ආයු කාලය වැඩිවන බැවින් ව්‍යවහාර මුදල් නිසි භාවිතය පිළිබඳව අඛණ්ඩව මහජනතාව දැනුම්වත් කිරීම සහ පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය ක්‍රමවත් ලෙස පවත්වා ගැනීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු අධීක්ෂණය කිරීම ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

**(ඉ) මහජන දැනුම්වත්භාවය ප්‍රවර්ධනය කිරීම**

ව්‍යවහාර මුදල් නෝට්ටුවල ආරක්ෂණ සළකුණු හා ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනාගැනීම, මුදල් නෝට්ටු භාවිතයේ යහපත් පුරුදු හා පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය, ව්‍යවහාර මුදල් කළමනාකරණ රෙගුලාසි සම්බන්ධයෙන් ප්‍රසිද්ධ දේශන, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් හා මුද්‍රිත මාධ්‍ය හරහා සමාජයේ විවිධ අංශ ඉලක්ක කරගනිමින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් 16 ක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. තවද, ව්‍යාජ මුදල් හඳුනාගැනීම පිළිබඳව ජාතික පුවත්පත් හරහා දැනුම්වත් කිරීමේ ව්‍යාපාරයක් සිදු කිරීමට ද ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි පිළිබඳ මහජන දැනුම්වත්භාවය ඉහළ නැංවීමට ප්‍රදර්ශන 3 ක් සඳහා ජංගම ව්‍යවහාර මුදල් කෞතුකාගාරය ප්‍රදර්ශනය කරමින් සහභාගී වීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

**(ඊ) 10 වන ආසියානු මුදල් චක්‍ර සම්මන්ත්‍රණය (Asia Cash Cycle Seminar)**

රටවල් 34 කට අධික සංඛ්‍යාවක 180 ක නියෝජිත පිරිසකගේ සහභාගීත්වයෙන් කොළඹ දී පැවති 10 වන ආසියානු මුදල් චක්‍ර සම්මන්ත්‍රණය - 2019 (අන්තර්ජාතික වාණිජ මුදල් මෙහෙයුම් සම්මන්ත්‍රණය - ICCOS) සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම සමසත්කාරකත්වය දරන ලදී. පිරිවැය ඉතිරිකිරීමේ තාක්ෂණයන්, ව්‍යවහාර මුදල් කළමනාකරණයේ කාර්යක්ෂමතාවය සහ ප්‍රශස්තකරණය ඉහළ නැංවීම සඳහා නිසි භාවිතයන් හා උපාය මාර්ග, ලෝකයේ පවතින විකල්ප ගෙවීම් ක්‍රමවේදයන්හි වේගයෙන් වෙනස්වන වර්ධනයන් පෙන්නුම් කිරීම යන කරුණු සම්බන්ධයෙන් පවතින දැක්ම හා අදහස් හුවමාරු කර ගැනීම සඳහා මෙම අවස්ථාව වේදිකාවක් විය.

(ඈ) කාසි බෙදා හැරීම

සංසරණය තුළ ප්‍රමාණවත් පරිදි කාසි පවත්වා ගැනීම තහවුරු කිරීමේ අරමුණින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල හරහා කාසි බෙදා හැරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර 2019 සැප්තැම්බර් 07 -10 දිනයන්හි යාපනයේ දී පැවැති එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා ජාතික ප්‍රදර්ශනයේ දී මුදල් හුවමාරු කවුළුවක් පවත්වාගෙන යැමට කටයුතු කරන ලදී.

(ඉ) ව්‍යවහාර මුදල් ප්‍රතිනිෂ්පාදනය සඳහා අවසර ලබා දීම

ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියට අනුව ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය තුළදී ප්‍රතිනිෂ්පාදන ඉල්ලීම් 7 ක් සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

### 5.4. වැඩිදියුණු කිරීම් සහ නව ව්‍යාපෘති

(අ) ව්‍යවහාර මුදල් නෝට්ටු පිළිබඳ සමීක්ෂණය

දැනට පවතින ව්‍යවහාර මුදල් නෝට්ටු කාණ්ඩයේ සිදුවිය යුතු වෙනස්කම් හා වැඩිදියුණු කිරීම් හඳුනා ගැනීමට සහ නව ව්‍යවහාර මුදල් නෝට්ටු කාණ්ඩයක අවශ්‍යතාවය නිර්ණය කිරීම සම්බන්ධව මහජන අදහස් ලබා ගැනීමේ අරමුණින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ දී සමීක්ෂණයක් පවත්වන ලදී. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල මත පදනම්ව, ඉහළ වටිනාකම් සහිත ව්‍යවහාර මුදල් නෝට්ටු සඳහා උසස් හා නව ආරක්ෂණ සළකුණු යොදා වැඩිදියුණු කරමින් දැනට පවතින නෝට්ටු කාණ්ඩයම අඛණ්ඩව පවත්වාගෙන යාමට මුදල් මණ්ඩලය තීරණය කරන ලදී. මෙම ක්‍රියාවලියෙහි ආරම්භක පියවරක් ලෙස උසස් හා නව ආරක්ෂණ සළකුණු සහිත රු.2000 ව්‍යවහාර මුදල් නෝට්ටුවක් 11 වන මුදල් නෝට්ටු කාණ්ඩය යටතේ හඳුන්වා දීමට තීරණය කරන ලදී.

(ආ) ව්‍යවහාර මුදල් කළමනාකරණය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය වෙනස්කම්

ඵලදායී හා කාර්යක්ෂම ව්‍යවහාර මුදල් කළමනාකරණ ක්‍රියාවලියක් තහවුරු කිරීම සඳහා 2019 වර්ෂය තුළදී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කරන ලදී.

(i) වඩාත් කාර්යක්ෂම මුදල් කළමනාකරණයක් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සතු අතිරික්ත මුදල් ඔවුන් අතරම හුවමාරු කර ගැනීම දිරිමත් කිරීමේ අරමුණින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කරනු ලබන සේවා නිසි (භාවිතයට සුදුසු) ව්‍යවහාර මුදල් නෝට්ටු මත අය කෙරෙන සේවා ගාස්තු ඉහළ නංවන ලදී.

(ii) ව්‍යවහාර මුදල් සඳහා වැඩිවන මහජන ඉල්ලුම වඩාත් ඵලදායීව සපුරාලීමට හැකිවන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා පනවා තිබූ හදිසි මුදල් ලබා ගැනීමේ සීමාව ඉහළ නංවන ලදී.

(ඇ) ව්‍යවහාර මුදල් මෙහෙයුම් වැඩිදියුණු කිරීම

ස්වයංක්‍රීය පද්ධති මගින් ව්‍යවහාර මුදල් සැකසුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට සහ ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ ව්‍යවහාර මුදල් නෝට්ටු සැකසුම් ධාරිතාවය වැඩි කිරීමට ව්‍යවහාර මුදල් මෙහෙයුම් පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් 2019 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් මේ පිළිබඳව අදාළ බලධාරීන් සමග සාකච්ඡා කළ අතර එම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය යන්ත්‍ර-සූත්‍ර හා උපකරණ මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී.

## 6. දේශීය මෙහෙයුම් කටයුතු

### 6.1 දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, මුදල් නීති පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට උපකාරීවන ප්‍රධාන කාර්යයන් කිහිපයක නිරත වේ. සක්‍රීය විවට වෙළඳපොළ කටයුතු හරහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, බලපත්‍රලාභී වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව පවත්වා ගැනීම නියාමනය කිරීම, වාණිජ බැංකුවල බැංකුව ලෙස ක්‍රියා කිරීම, රජය, රාජ්‍ය නියෝජිත ආයතන සහ අනෙකුත් ආයතන සඳහා බැංකුකරු සහ රාජ්‍ය තැන්පතු භාරය ලෙස ක්‍රියා කිරීම, රජයට තාවකාලික අත්තිකාරම් සැපයීම, තත්කාලීන දළ පියවුම් පද්ධතියේ සහභාගිත්ව ආයතනවල පියවීම් ගිණුම් පවත්වාගෙන යෑම, තත්කාලීන දළ පියවුම් පද්ධතියේ පියවීම් කටයුතු සඳහා සහභාගිත්ව ආයතන වෙත දවස ඇතුළත ණය පහසුකම ලබාදීම සහ බලයලත් මුදල් තැරැව්කරුවන් නියාමනය කිරීම මීට ඇතුළත් වේ.

### 6.2 මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මුදල් ප්‍රතිපත්තියට අනුකූල පරිදි කෙටිකාලීන පොලී අනුපාතික පවත්වාගෙන යෑමේ අරමුණින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව අඛණ්ඩව සිය මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළේය. වැඩිදියුණු කරන ලද, වර්තමාන මුදල් ප්‍රතිපත්ති රාමුවෙහි මෙහෙයුම් ඉලක්කය ලෙස සැලකෙන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයට සංඥා කිරීම සහ අඩු විචලතාවකින් යුක්තව එය අපේක්ෂිත මට්ටමෙහි පවත්වා ගැනීම සඳහා දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් විවට වෙළඳ කටයුතු සිදු කළේය. මේ අතර, සහභාගීත්ව ආයතනවල ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීමට දෛනික පදනමින් නිත්‍ය පහසුකම ද නොකඩවා ලබාදෙන ලදී. ඒ අනුව, විවට වෙළඳ කටයුතු යොදාගත් ස්වභාවය සහ සිදු කළ වාර ගණන, ප්‍රතිපත්ති පොලී අනුපාතික, ඵලදායි ලෙස මුදල් ප්‍රතිපත්ති සංඥා කිරීම් සහ ඉහළ විනිවිදභාවය වැනි සාධකයන්හි සිදු වූ යම් යම් වෙනස්වීම් සමගින් 2019 වසරේදී මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීමේ කටයුතු තවදුරටත් විකාසනය විය.

විවට වෙළඳ කටයුතු හරහා ලබාදෙන පහසුකම් මත බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් අධිකතර ලෙස රඳා පැවතෙමින් එම පහසුකම භාවිතා කිරීම හේතුකොටගෙන මුදල් ප්‍රතිපත්තිය කාර්යක්ෂම ලෙස සංඥා කිරීමට බාධා ඇති වූ බැවින් ශ්‍රී ලංකා මහ බැංකුව 2018 සැප්තැම්බර් 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්හට විවට වෙළඳ කටයුතු යටතේ වන වෙන්දේසි සඳහා ප්‍රවේශ වීමේ හැකියාව අත්හිටුවනු ලැබීය. කෙසේ වෙතත්, දේශීය මුදල් වෙළඳපොළ තුළ ද්‍රවශීලතා හිඟයක් පවතින අවස්ථාවකදී බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ට එක්දින පදනම මත ද්‍රවශීලතා ආධාරක පහසුකමක් ලබාදීමට මෙන්ම, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය මත ඇති විය හැකි අනවශ්‍ය පීඩනය අවම කිරීමේ අරමුණින් ද යුතුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019 සැප්තැම්බර් මාසයේදී දේශීය මුදල් වෙළඳපොළෙහි සුමට ක්‍රියාකාරීත්වය තහවුරු කිරීමට බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා ද්‍රවශීලතා ආධාරක පහසුකම (Liquidity Support Facility/ LSF) හඳුන්වා දෙන ලදී. විවට වෙළඳ කටයුතු හරහා මුදල් ප්‍රතිපත්තිය සංඥා කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීමට මෙම ද්‍රවශීලතා ආධාරක පහසුකම උපකාරී විය.

දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයෙහි අපේක්ෂිත වෙනස්වීම් මෙන්ම ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීමේ වෙන්දේසි සඳහා වූ පහළ ඉල්ලුම සැලකිල්ලට ගනිමින් දේශීය මුදල් වෙළඳපොළට ප්‍රමාණවත් පරිදි ද්‍රවශීලතාව සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019 සැප්තැම්බර් මැද භාගයේ සිට ස්ථිර පදනම මත භාණ්ඩාගාර බැඳුම්කර මිලට ගැනීමේ වෙන්දේසි හඳුන්වා දෙමින් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට යොදා ගනු ලබන උපකරණවල පරාසය පුළුල් කරන ලදී.

### 6.2.1 විවට වෙළඳ කටයුතු

**(අ) ද්‍රවශීලතා පුරෝකථනය**

පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව, යෝග්‍ය විවට වෙළඳ කටයුතු හරහා වෙළඳපොළ ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම සඳහා දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව විවිධ පැතිකඩ ඔස්සේ ඇස්තමේන්තු කිරීම දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව දෛනිකව සිදු කරනු ලබයි. දේශීය මුදල් වෙළඳපොළෙහි දෛනික ද්‍රවශීලතාව ඇස්තමේන්තු කිරීමේදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තියට අදාළව ගනු ලැබූ ක්‍රියාමාර්ගවල ඇති බලපෑමට අමතරව, ඇස්තමේන්තු කිරීමේදී ඉහළ අවිනිශ්චිතතාවක් ඇති සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකරන විදේශ විනිමය ගනුදෙනු, බලපත්‍රලාභී වාණිජ බැංකු සතු සංචිත ප්‍රමාණය සහ ශ්‍රී ලංකා මහ බැංකුව රජය සමඟ සිදු කරන ගනුදෙනු වැනි ස්වායත්ත සාධක ද සැලකිල්ලට ගනු ලබයි.

**(ආ) වෙළඳපොළ මෙහෙයුම් කමිටුව**

මුදල් මණ්ඩලය විසින් ගනු ලැබූ සමස්ත මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග දෛනික මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් බවට පරිවර්තනය කිරීමේ කාර්යභාරය වෙළඳපොළ මෙහෙයුම් කමිටුවට පැවරී ඇත. ඇස්තමේන්තුගත ද්‍රවශීලතා මට්ටම, මෙහෙයුම් ඉලක්කයෙහි යෝග්‍ය මට්ටම, වෙළඳපොළ සහභාගිවන්නන් අතර ද්‍රවශීලතා ව්‍යාප්තිය, යෝග්‍ය වෙළඳපොළ සංඥාවන්හි අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, දේශීය මුදල් වෙළඳපොළ සහ විදේශ විනිමය වෙළඳපොළ පවතින දෛනික වෙනස්වීම් නිරීක්ෂණය කර ද්‍රවශීලතා කළමනාකරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සැලසුම් කිරීම වෙළඳපොළ මෙහෙයුම් කමිටුව විසින් කරනු ලබයි.

**(ඇ) වෙන්දේසි**

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමේ මෙන්ම, ද්‍රවශීලතාව වෙළඳපොළට සැපයීමේ වෙන්දේසි නිසිපරිදි ක්‍රියාත්මක කිරීම හරහා මෙහෙයුම් ඉලක්කය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අපේක්ෂිත මට්ටමෙහි පවත්වා ගැනීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවල සංචිත හසුරුවමින් ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්වල නිරත වේ.

**(i) ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි**

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේදී දේශීය මුදල් වෙළඳපොළෙහි පැවති අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කරගැනීම සඳහා අවශ්‍යතාව අනුව එක්දින, කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි පවත්වන ලදී. ඒ අනුව, දේශීය මුදල් වෙළඳපොළ තුළ අතිරික්ත ද්‍රවශීලතාව පැවති අවස්ථාවලදී දෛනික පදනමින් ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම සඳහා එක්දින ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි පවත්වන ලදී. සතියක කාලසීමාවක් දක්වා ද්‍රවශීලතාව අවශෝෂණය කරගැනීමේ ක්‍රමයක් ලෙස එදිනම පියවීමේ පදනම මත, කෙටිකාලීන ප්‍රතිමිලදීගැනීමේ වෙන්දේසි පවත්වන ලදී. සැලකිය යුතු කාලසීමාවකට ද්‍රවශීලතාව අතිරික්තව පවතින බව පෙනීගිය අවස්ථාවලදී එම අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කරගැනීමේ අරමුණු සහිතව ඊළඟ ව්‍යාපාර දිනයේදී පියවීමේ පදනම මත, දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි පවත්වන ලදී.

**II-9 සංඛ්‍යා සටහන**

**2019 දී පවත්වන ලද ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි**

| ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි වර්ගය | පැවැත්වූ වෙන්දේසි සංඛ්‍යාව | ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය (රු.බිලියන) | පිළිගත් මුළු ලංසු ප්‍රමාණය (රු.බිලියන) |
|---|---|---|---|
| එක්දින | 47 | 903.4 | 661.1 |
| කෙටි කාලීන | 35 | 515.0 | 327.4 |
| දිගු කාලීන | 14 | 282.0 | 103.2 |

**(ii) ප්‍රතිවිකුණුම් වෙන්දේසි**

වෙළඳපොළට ද්‍රවශීලතාව සැපයීම සඳහා දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් එක්දින, කෙටිකාලීන සහ දිගුකාලීන පදනම මත ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලදී. මීට අමතරව,

බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ගේ දෛනික ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම සඳහා 2019 සැප්තැම්බර් මස සිට ද්‍රවශීලතා ආධාරක පහසුකම හඳුන්වා දෙන ලදී.

**II-10 සංඛ්‍යා සටහන**

**2019 දී පවත්වන ලද ප්‍රතිවිකුණුම් වෙන්දේසි**

| ප්‍රතිවිකුණුම් වෙන්දේසි වර්ගය | පැවැත්වූ වෙන්දේසි සංඛ්‍යාව | ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය (රු.බිලියන) | පිළිගත් මුළු ලංසු ප්‍රමාණය (රු.බිලියන) |
|---|---|---|---|
| එක්දින | 132 | 2,343.0 | 2,042.8 |
| කෙටි කාලීන | 70 | 805.0 | 566.4 |
| දිගු කාලීන | 39 | 616.6 | 396.8 |
| ද්‍රවශීලතා ආධාරක පහසුකම | 13 | 33.5 | 22.6 |

**(iii) ස්ථිර පදනම මත වූ වෙන්දේසි**

මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව සඳහා ස්ථිර පදනමින් බලපෑම් කිරීම සඳහා 2019 වසර තුළදී සහභාගිත්ව ආයතන සමඟ භාණ්ඩාගාර බිල්පත්වල හිමිකාරිත්වය වෙනස්වීමට හේතුවන ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් ගනුදෙනු වෙන්දේසි පවත්වන ලදී. කෙසේ වෙතත්, ද්‍රවශීලතා හිඟයක් පවතින අවස්ථාවලදී වෙළඳපොළ සහභාගි වන්නන් භාණ්ඩාගාර බිල්පත් වැනි වඩාත් ද්‍රවශීල සුරැකුම්පත් ස්ථිර පදනමින් විකිණීමට පසුබට වීමක් දක්නට ලැබුණි. ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් සඳහා වන වෙන්දේසිවලට ඇති ඉල්ලුම පහළ යෑම මධ්‍යයේ වෙළඳපොළට ස්ථිර පදනමින් ද්‍රවශීලතාව සැපයීමේ අවශ්‍යතාව සලකා බලමින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට යොදාගනු ලබන උපකරණවල පරාසය පුළුල් කරමින් 2019 සැප්තැම්බර් 06 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ස්ථිර පදනම මත භාණ්ඩාගාර බැඳුම්කර මිලට ගැනීමේ වෙන්දේසි හඳුන්වා දෙන ලදී.

**II-11 සංඛ්‍යා සටහන**

**2019 දී පවත්වන ලද ස්ථිර පදනම මත වූ වෙන්දේසි**

| ස්ථිර පදනම මත වූ වෙන්දේසි වර්ගය | පැවැත්වූ වෙන්දේසි ප්‍රමාණය | ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය (රු.බිලියන) | පිළිගත් මුළු ලංසු ප්‍රමාණය (රු. බිලියන) |
|---|---|---|---|
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (ද්‍රවශීලතාව අවශෝෂණය සඳහා) | - | - | - |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම (ද්‍රවශීලතාව සැපයීම සඳහා) | 182 | 647 | 41.8 |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බැඳුම්කර විකිණීම (ද්‍රවශීලතාව අවශෝෂණය සඳහා) | - | - | - |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම (ද්‍රවශීලතාව සැපයීම සඳහා) | 23 | 96 | 47.7 |

#### 6.2.2 නිත්‍ය පහසුකම

මුදල් වෙළඳපොළ එක්දින පොලී අනුපාතිකය, පොලී අනුපාතික කොරිඩෝව තුළ පවත්වා ගනිමින් සහභාගිත්ව ආයතනවලට නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ සපයනු ලබන නිත්‍ය පහසුකම වසර පුරාම සපයන ලදී. අන්තර් බැංකු මුදල් වෙළඳපොළ සහ විවට වෙළඳ කටයුතු හරහා දෛනික ද්‍රවශීල අවශ්‍යතා පූර්ණ වශයෙන් සපුරා ගැනීමට අපොහොසත් වූ සහභාගිත්ව ආයතනවලට නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ ද්‍රවශීලතාව ලබාදුන් අතර, සහභාගිත්ව ආයතන සතු අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කරගැනීම සඳහා නිත්‍ය තැන්පතු පහසුකම සපයන ලදී.

**II-12 සංඛ්‍යා සටහන**

**2019 දී විවට වෙළඳ කටයුතු යටතේ නිත්‍ය පහසුකම සැපයීම**

රු බිලියන

| පහසුකම | මුළු වටිනාකම | දෛනික සාමාන්‍යය |
|---|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම | 7,488.6 | 30.8 |
| නිත්‍ය ණය පහසුකම | 4,796.6 | 19.7 |

#### 6.2.3 ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය

මුදල් නීති පනතේ ප්‍රතිපාදනවලට අදාළව සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්ම මහ බැංකුවේ ජංගම ගිණුමක් පවත්වා ගෙන යනු ලබන අතර, එකී වාණිජ බැංකු සතු සමස්ත රුපියල් තැන්පතු වගකීම්වලට අනුපාතිකව එම ජංගම ගිණුම්වල රඳවා පවත්වාගෙන යා යුතු අවම සංචිත අවශ්‍යතාව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය මගින් තීරණය කරනු ලබයි. ව්‍යවස්ථාපිත සංචිත අනුපාත අවශ්‍යතාව යටතේ සංචිත පවත්වාගෙන යෑම පරිපාලනය කිරීම සහ වාණිජ බැංකු විසින් ඊට දක්වන අනුකූලතාව අධීක්ෂණය කිරීම දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වගකීමකි. වාණිජ බැංකුවල තැන්පතු වගකීම්වලට අදාළව සියයට 6.0 ක් ලෙස පැවති ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය, 2019 මාර්තු මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 5.0 ක් දක්වා පදනම් අංක 100 කින් පහත හෙලන ලදී.

#### 6.2.4 බැංකු අනුපාතිකය

මුදල් නීති පනතේ 87 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සපයනු ලබන කෙටිකාලීන අත්තිකාරම් මත වූ මහ බැංකු පොලී අනුපාතිකය සියයට 15 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, 2019 වසර තුළදී මෙම පොලී අනුපාතිකය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට මහ බැංකුවෙන් ණය ලබා ගැනීමේ අවශ්‍යතාවක් ඇති නොවීය.

### 6.3 රජයේ සහ වාණිජ බැංකුවල බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය

#### 6.3.1 මූල්‍ය ආයතනවල ගිණුම්

මහ බැංකුව තුළ පවත්වාගෙන යනු ලබන පියවීම් ගිණුම් හරහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් මූල්‍ය පද්ධතිය හා සම්බන්ධ වී සිටී.

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවෙහි පවත්වා ගෙන යනු ලබන මෙම ගිණුම් මගින් තත්කාලීන දළ පියවීම් පද්ධතියේ (RTGS) පාර්ශ්වකරුවන් අතර සිදු වන නිර්ලේඛන සුරැකුම්පත් ගනුදෙනුවල සහ අනෙකුත් ගනුදෙනුවලට අදාළ වන ගෙවීම් හා පියවීම් නිරවුල් කිරීම සඳහා පහසුකම් සැලසීමත් සිදු කෙරේ. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඔවුන්ගේ සංචිත පවත්වා ගැනීම ද මෙම ගිණුම් මගින් සිදු කෙරේ. ලංකාක්ලියර් (LankaClear) පෞද්ගලික සමාගම (LCPL) මගින් සකස් කරනු ලබන දෛනික වාර 18 ක් ඔස්සේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී වාණිජ බැංකුවල බහුපාර්ශ්වීය දළ පියවීම් ශේෂයන් (MLNSB), තත්කාලීන දළ පියවීම් පද්ධතියට යොමු කොට එම බැංකුවල ගිණුම් යාවත්කාලීන කිරීම ද දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වගකීමකි. මෙම වාණිජ බැංකුවල බහුපාර්ශ්වීය දළ පියවීම් ශේෂවල අන්තර්ගත වනුයේ ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතිය (CITS), ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS), ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (CAS), විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS), සහ විකුණුම් පොළ යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (CPS), යන පද්ධතීන් තුළින් වන දළ පියවීම් වේ. 2019 වසර අවසානයේදී, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු 26 කට සහ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් 8 කට අදාළව තත්කාලීන දළ පියවීම් ගිණුම් පවත්වාගෙන යනු ලැබීය.

**II-13 සංඛ්‍යා සටහන**

**දෛනිකව සිදු කරනු ලබන බහුපාර්ශ්වීය දළ පියවීම් ශේෂයන් නිෂ්කාශන (MLNSB) වාර පිළිබඳ තොරතුරු**

| බහුපාර්ශ්වීය දළ පියවීම් ශේෂයන් නිෂ්කාශන කාණ්ඩය | දෛනික වාර ගණන |
|---|---|
| 1) ප්‍රධාන නිෂ්කාශනය - ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන (CITS) | 03 |
| 2) ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් නිෂ්කාශන (SLIPS) | 03 |
| 3) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (CAS) | 04 |
| 4) විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) | 04 |
| 5) විකුණුම් පොළ යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (CPS) | 04 |
| මුළු වාර ගණන | 18 |

### 6.3.2 රජයේ ගිණුම්

රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය ඉටු කරමින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය නියෝජිත ආයතන සහ රාජ්‍ය ආයතන මෙන්ම ඇතැම් විදේශීය ආයතන සඳහා ද බැංකු පහසුකම් සැපයීම සිදු කෙරේ. 2019 වසර අවසානය වන විට දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන ලද එවැනි ගිණුම් සංඛ්‍යාව 46 ක් වූ අතර, රජය වෙනුවෙන් රුපියල් බිලියන 17,617.3 ක් වටිනා ගනුදෙනු 15,307 ක් සිදු කරන ලදී. එම ගනුදෙනු සංඛ්‍යාවෙන් සියයට 85 කට වැඩි ප්‍රමාණයක් නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් ගිණුම, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ජංගම ගිණුම, දේශීය ආදායම් කොමසාරිස්ගේ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ගිණුම සහ ජනාධිපති අරමුදල් ගිණුම යන ගිණුම්වලට අයත් විය.

මුදල් නීති පනතේ 89 වැනි වගන්තිය ප්‍රකාරව යම් මුදල් වර්ෂයක් සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද රජයේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 10 ක උපරිමයකට යටත්ව මහ බැංකුව විසින් රජයට පොලී රහිත තාවකාලික අත්තිකාරම් ලබාදීමට කටයුතු කරනු ලැබේ. 2018 වසරේදී රජයට ලබාදුන් රුපියල් බිලියන 225 ක් වූ තාවකාලික අත්තිකාරම් මුදල සමඟ සැසඳීමේදී, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2019 වසර සඳහා වූ ඇස්තමේන්තු කරන ලද රාජ්‍ය ආදායම පාදක කර ගනිමින් 2019 වසර ආරම්භයේදී රජයට ලබාදුන් තාවකාලික අත්තිකාරම් මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 238.06 ක් දක්වා රුපියල් බිලියන 13.06 කින් ඉහළ ගියේය.

**II-14 සංඛ්‍යා සටහන**

**2019 වසරේදී දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලැබූ ගිණුම් පිළිබඳ තොරතුරු**

| ගිණුම් වර්ගය | ගිණුම් සංඛ්‍යාව |
|---|---|
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 26 |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් | 08 |
| රජයේ දෙපාර්තමේන්තු | 32 |
| රජයේ ආයතන සහ නියෝජිත ආයතන | 14 |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තුවල ගිණුම් | 38 |
| විදේශීය නියෝජිත ආයතන (දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක වන) | 09 |
| මුළු එකතුව | 127 |

## 6.4. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම සැපයීම

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම (Intraday Liquidity Facility/ILF) තුළින් දවස ඇතුළත අරමුදල් සපයමින් තත්කාලීන දළ පියවීම් පද්ධතියේ මෙහෙයුම් කටයුතු සුමටව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යෑමට අඛණ්ඩව සහය දෙන ලදී. භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සුරැකුම් ලෙස තබා ගනිමින් ගාස්තුවකින් තොරව මෙම පහසුකම් සැපයීම සිදු කරනු ලබන අතර, සුරැකුම්පත්වල වර්තමාන වෙළඳපොළ මිල ගණන් සඳහා අදාළ සුරැකුම්පත්හි මිලෙහි සිදු විය හැකි උච්චාවචනයකින් ඇති විය හැකි අලාභය අවම කිරීමට මිලක් (Haircut) අන්තර්ගත කරමින් අදාළ සුරැකුම්පතෙහි නිල මිල ගණන් තීරණය කරනු ලබයි.

2019 වසර තුළදී දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ ලබාදුන් සමස්ත ණය ප්‍රමාණය සහ එහි දෛනික සාමාන්‍යය, පිළිවෙළින්, රුපියල් බිලියන 15,241 ක් සහ රුපියල් බිලියන 62.72 ක් විය. ඒ අනුව, පෙර වසරේ පැවති සමස්ත වටිනාකම වූ රුපියල් බිලියන 13,275 සහ දෛනික සාමාන්‍යය වූ රුපියල් බිලියන 55.31 හා සැසඳීමේදී දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම භාවිතය ඉහළ යෑමක් පෙන්නුම් කරයි.

### 6.5. බලයලත් මුදල් තැරැව්කරුවන් අධීක්ෂණය

දේශීය මුදල් වෙළඳපොළ මිල ගවේෂණය කාර්යක්ෂම කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත ශ්‍රී ලංකාවේ මුදල් තැරැව්කරුවන්ගේ මෙහෙයුම් කටයුතු නියාමනය සහ අධීක්ෂණය කිරීමේ බලය ලබාදෙමින්, 2013 පෙබරවාරි මස 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මුදල් නීති පනතේ 10 (සී) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2013 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි නිකුත් කරන ලදී. අනතුරුව, 2013 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසිය සංශෝධනය කොට ඉදිරිපත් කරන ලද 2016 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි අවලංගු කොට, 2018 මාර්තු 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි 2018 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි නිකුත් කරන ලදී. යථා යෝග්‍ය බව ඇගයීම සඳහා වූ අවශ්‍යතා වැඩිදියුණු කිරීම, මුදල් තැරැව්කරණ ව්‍යාපාර පාලනය අත්පත් කර ගැනීම මත සීමා පැනවීම, අභ්‍යන්තර නියාමනය ශක්තිමත් කිරීම, අදාළ ලියකියවිලි/පොත් පරීක්ෂා කිරීම සහ තොරතුරු වාර්තා කිරීමේ අවශ්‍යතා තවදුරටත් වැඩිදියුණු කිරීම ආදි නව අංග කිහිපයක් අන්තර්ගත කරමින් 2019 පෙබරවාරි මස 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි 2019 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි නිකුත් කරන ලදී. විද්‍යුත් ලේඛන භාවිතය හේතුවෙන් පරිපාලනමය වශයෙන් දැරීමට සිදුවන පිරිවැය අවම කර ගැනීම සහ දත්ත ඇතුළත් කිරීමේදී හා ගණනය කිරීමේදී පුද්ගලයන් විසින් සිදු කරනු ලබන කටයුතු අඩු කර ගැනීම පෙරදැරි කොටගෙන බලයලත් මුදල් තැරැව්කරුවන්ගේ මාසික කාර්යසාධන වාර්තා ඇතුළත් කිරීම සඳහා මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂණ පද්ධතිය (Central Intergrated Market Monitor/ CIMM) හරහා නව මංගත පද්ධතියක් හඳුන්වා දෙන ලදී. මෙම රෙගුලාසි යටතේ 2019 මාර්තු මස අවසානය වන විට සමාගම් 9 ක් සඳහා "බලය පැවරීමේ සහතික" නිකුත් කරන ලද අතර, එම සමාගම් "බලයලත් මුදල් තැරැව්කරුවන්" ලෙස නම් කර ඇත. 2019 වසර තුළ දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් බලයලත් මුදල් තැරැව්කරුවන් සඳහා එතැන් පරීක්ෂණ 9 ක් සිදු කරන ලද අතර, මුදල් තැරැව්කරණ රෙගුලාසි උල්ලංඝනය කරන ලද එක් මුදල් තැරැව්කරණ සමාගමකට එරෙහිව නියාමන ක්‍රියාමාර්ග ගන්නා ලදී.

#### 2019.12.31 දිනට බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් ලේඛනය

1. බාට්ලීට් මැක්ලේයි ඇන්ඩ් රෝයි (ප්‍රයිවට්) ලිමිටඩ්
2. ෆස්ට් එලායන්ස් මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
3. ජෝර්ජ් ස්ටුවර්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
4. එම් වී එස් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
5. සෙන්ට්‍රල් ෆොරෙක්ස් ඇන්ඩ් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
6. පිගට් චැප්මන් ඇන්ඩ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
7. එස් එම් බී මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
8. තැප්‍රොබේන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
9. විෂ්වින් මනි ඇන්ඩ් එක්ස්චේන්ජ් බ්‍රෝකර්ස් ලිමිටඩ්

## 7. ආර්ථික පර්යේෂණ

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට සහ අධිපතිතුමාට ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම මෙන්ම මහජනතාව වෙත තොරතුරු සැපයීම සඳහා දත්ත සම්පාදනය කිරීමේ සහ ආර්ථික පර්යේෂණ කටයුතු සිදු කිරීමේ කාර්යයන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ඒ අනුව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව මෙම වසර තුළදී ද ආර්ථික සහ මිල ස්ථායීතාවය පවත්වා ගැනීම සඳහා පර්යේෂණ මත පදනම් වූ ප්‍රතිපත්ති උපදේශ ලබා දෙන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, මුදල් ප්‍රතිපත්ති සම්පාදන සහ විශ්ලේෂණ ක්‍රමවේද වැඩිදියුණු කිරීමේ කටයුතුවල නිරත වූ අතර, පර්යේෂණ කටයුතු මත පදනම් වූ ප්‍රතිපත්ති නිර්දේශ සහ උපදේශ ලබා දීම මගින් 2019 වසරේදී ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා පහසුකම් සලසන ලදී. තවද, මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය වැඩිදියුණු කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ප්‍රමුඛත්වය දී කටයුතු කළ අතර, කාලීන සාර්ව ආර්ථික ගැටලු පිළිබඳ මහජනතාවගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීමටත්, ජාත්‍යන්තර ආයතන සමඟ සමීප සහයෝගිතාවයක් පවත්වාගැනීමට පහසුකම් සැලසීමටත් පියවර ගැනුණි.

2018 - 2020 කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාත්මක කළ යුතු උපාය මාර්ගික ප්‍රමුඛතා අතරින් ප්‍රමුඛතා දෙකක් වන සඵලදායි නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් හඳුන්වාදීම සහ ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ප්‍රමුඛ දෙපාර්තමේන්තුවේ වගකීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. මින් මුලින් සඳහන් කළ උපාය මාර්ගික ප්‍රමුඛතාවයට අදාළව, වසර අවසානයේදී ගැසට් පත්‍රයේ පළ කරන ලද නව මහ බැංකු පනත් කෙටුම්පත සැකසීමේ ක්‍රියාවලියේ දී ප්‍රතිපත්තිමය මට්ටමේ සාකච්ඡා සඳහා ක්‍රියාකාරී ව සහභාගී වෙමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රමුඛ කාර්යයක් ඉටු කරන ලදී. මෙම වසර තුළදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් රටවල් අතර සිදුවන ගනුදෙනු මෙන්ම බැංකු පද්ධතිය හරහා සිදු වන දේශීය විදේශ මුදල් ගනුදෙනු අධීක්ෂණය කිරීම ඉලක්ක කර ගත් ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද අවශ්‍ය මූලික කටයුතු සැලසුම් කිරීමට පියවර ගන්නා ලදී.

### 7.1 ආර්ථික සහ මිල ස්ථායීතාව පවත්වා ගැනීම

ආර්ථික සහ මිල ස්ථායීතාව ළඟා කර ගැනීමේ අරමුණ ඇතිව පූර්වෝපායික මෙන්ම කාලීන මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව දේශීය ආර්ථිකයේ මූර්ත, විදේශීය, රාජ්‍ය මූල්‍ය, සහ මුදල් යන සියලුම අංශවල මෙන්ම, ගෝලීය ආර්ථිකයේ ප්‍රවණතා සහ වර්ධනයන් සමීපව අධීක්ෂණය කරන ලදී. ඒ අනුව, මුදල් ප්‍රතිපත්ති කමිටුවේ ලේකම් කාර්යාලය වශයෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආකෘති මත පදනම් වූ සාර්ව ආර්ථික පුරෝකථනවල සහාය ඇතිව ආර්ථික සහ මුදල් තත්ත්වය පිළිබඳ ඉදිරි දැක්මකින් යුතු

විස්තරාත්මක වාර්තා මුදල් ප්‍රතිපත්ති කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. මෙමගින් වඩාත් දැනුවත් තීරණ ගැනීමටත්, මුදල් මණ්ඩලය වෙත මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ සුදුසු තීරණ ගැනීමට අදාළ පූර්වෝපායික ප්‍රතිපත්ති නිර්දේශයන් ලබා දීමටත් මුදල් ප්‍රතිපත්ති කමිටුවට හැකි විය. ශාස්ත්‍රීය හා පෞද්ගලික අංශවල විශේෂඥයන්ගේ අදහස් ලබා ගැනීම තුළින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටුවේ රැස්වීම් පවත්වාගෙන යාමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව පහසුකම් සලසන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් *2020 සහ ඉදිරිය සඳහා වූ මුදල් හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම* යන වාර්ෂික ප්‍රතිපත්ති ප්‍රකාශනය සම්පාදනය කිරීම සම්බන්ධීකරණය කරන ලද අතර, එම ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් මහ බැංකුවේ මැදි කාලීන මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්තීන් නිවේදනය කරමින් ආර්ථිකයේ සහ මූල්‍ය වෙළඳපොළ සියලු පාර්ශ්වකරුවන් වෙත ඉදිරි කාලය සඳහා මහ බැංකුවේ ප්‍රතිපත්ති දිශානතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සාර්ව ආර්ථික ප්‍රවණතා හා සබැඳි අවදානම් සහ එමගින් උද්ධමනයට සහ ආර්ථික වර්ධනයට ඇති විය හැකි බලපෑම අඛණ්ඩව අධ්‍යයනය කරන ලදී. තවද, ආර්ථිකයේ පවතින විවිධාකාර ගැටලු පිළිබඳව මෙන්ම සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය කෙරෙන සුදුසු ප්‍රතිපත්ති පිළිබඳව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය දැනුම්වත් කරන ලදී. ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තීන් මගින් ආර්ථිකයේ නොයෙක් අංශ කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳව ද විශ්ලේෂණය කළ අතර, තීරණ ගැනීමේ ක්‍රියාවලියට උපකාරී වීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරන ලදී. තවද, මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සහ සන්නිවේදන ක්‍රියාවලිය තවදුරටත් වැඩි දියුණු කිරීමේ අරමුණින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහාය ඇතිව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සිය ආකෘතිකරණ හා පුරෝකථන හැකියාව සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට අඛණ්ඩව කටයුතු කළේය. උද්ධමන අපේක්ෂාවන් මැදි කාලීනව අපේක්ෂිත උද්ධමන පරාසය තුළ මනාව පාලනය කිරීමේ අරමුණින් මහජනතාව සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම සහ බාහිර පාර්ශ්වයන් වෙත කෙරෙන සන්නිවේදනය දියුණු කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පියවර කිහිපයක්ම ගන්නා ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ මුදල් මණ්ඩල තීරණ මහජනතාව වෙත දැනුම් දීම සඳහා පුවත්පත් නිවේදන නිකුත් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. තවද, අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳව අදාළ පාර්ශ්වකරුවන් හට මූලික තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා ගැනීම සඳහා පසුබිම සපයන මුදල් ප්‍රතිපත්ති විවරණ හා සම්බන්ධ මාධ්‍ය හමුවලදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මූලික කාර්යභාරයක් ඉටු කළ අතර, 2019 වසරේදී එම මාධ්‍ය හමු සජීවී විකාශය කිරීම ආරම්භ කිරීම මගින් මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය තත්කාලීනව පුළුල් පරාසයක් වෙත ළඟා කරවීමට හැකි විය.

## 7.2 විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම

විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීමේ අරමුණින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ගෝලීය සහ දේශීය ආර්ථිකයේ ප්‍රවණතා පිළිබඳ පුළුල් නිරීක්ෂණයන් සිදුකරමින් ජාත්‍යන්තර වෙළඳාම සහ විදේශ මූල්‍ය සම්බන්ධ සංඛ්‍යා දත්ත එක්රැස් කිරීම, සම්පාදනය කිරීම සහ විශ්ලේෂණය කිරීම තුළින් මුදල් ප්‍රතිපත්ති කමිටුවට සහ මුදල් මණ්ඩලයට සුදුසු ප්‍රතිපත්ති උපදෙස් සහ නිර්දේශයන් ලබා දෙන ලදී. ඒ අනුව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා රුපියල මත ඇතිවන පීඩනය හඳුනාගැනීම සහ විනිමය අනුපාතිකයෙහි අධික විචලනයන් අඩු කිරීම සඳහා වන ක්‍රියාමාර්ග යෝජනා කිරීම පිණිස අනෙකුත් මුදල් ඒකකවලට සාපේක්ෂව රුපියලේ වෙනස්වීම පිළිබඳව අඛණ්ඩව අධ්‍යයනය කරන ලදී. විදේශීය අංශය සම්බන්ධ විවිධ කරුණු නිරීක්ෂණය කිරීමට සහ විශ්ලේෂණ සැපයීමට අමතරව, මුදල් නීති පනතෙහි විධිවිධානවලට අනුව රජය විසින් අවස්ථා ගණනාවකදී ගන්නා ලද විදේශ ණය මගින් මුදල් ප්‍රතිපත්තිය මත ඇතිවන බලපෑම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ඇගයීමට ලක් කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ එකඟ වූ ප්‍රමාණාත්මක කාර්යසාධක නිර්ණායක, මූලික ඉලක්ක සහ ව්‍යුහාත්මක මිනුම්දඬු සම්බන්ධයෙන් ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී. ජාත්‍යන්තරව පිළිගත් දත්ත වාර්තා කිරීමේ ප්‍රමිතීන්ට අනුකූලව විදේශීය අංශයේ සංඛ්‍යා දත්ත සම්පාදනය කිරීම සහ ඉදිරිපත් කිරීම වැඩි දියුණු කිරීම උදෙසා පියවර ගන්නා අතර ම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ගෙවුම් තුලන ලේඛනයේ 6 වන සංස්කරණ (BPM6) ආකෘතිය අනුව ගෙවුම් තුලන හා ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය පිළිබඳ සංඛ්‍යා දත්ත කාර්තුමය පදනම මත ද ජාත්‍යන්තර සංචිත දත්ත සටහන මාසික පදනම මත ද ප්‍රකාශයට පත් කළ අතර, කාර්තුමය විදේශීය ණය පිළිබඳ සංඛ්‍යා දත්ත ලෝක බැංකුව වෙත ද, වාර්ෂික පදනම මත සෘජු ආයෝජන දත්ත විදේශීය ආයෝජන පිළිබඳ ඒකාබද්ධ සමීක්ෂණය වෙත ද නිසි කාල රාමුව තුළදී ඉදිරිපත් කරන ලදී. විදේශීය අංශයේ දත්තවල නිරවද්‍යතාව ඉහළ නැංවීමට සහ වඩා කාලීන තොරතුරු ලබා ගැනීම තහවුරු කිරීම සඳහා පෞද්ගලික අංශයේ විදේශීය වත්කම් සහ වගකීම් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන වාර්ෂික අන්තර්ජාතික ආයෝජන තත්ත්වය පිළිබඳ සමීක්ෂණය, නේවාසික හා අනේවාසික ගුවන් සමාගම්, නාවික සමාගම්, විදුලි සංදේශ, ඉදිකිරීම් සහ රක්ෂණය ආදී අංශ රැසක් ආවරණය කරන සේවා වෙළඳාම පිළිබඳ වූ සමීක්ෂණය සහ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් සම්බන්ධයෙන් වූ මාසික සමීක්ෂණයක් ඇතුළු සමීක්ෂණ රැසක් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. තවද, අන්තර්ජාතික ගනුදෙනු වාර්තා කිරීමේ පද්ධතිය ක්‍රියාවට නැංවීමේ ප්‍රමුඛ දෙපාර්තමේන්තුව ලෙස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පද්ධති අවශ්‍යතා, අන්තර් දෙපාර්තමේන්තු දත්ත අවශ්‍යතා, නෛතික රාමුව සහ අවශ්‍ය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් හඳුනා ගැනීම සඳහා වූ කටයුතු වැනි මූලික කටයුතු ආරම්භ කරන ලදී.

## 7.3 පූර්වෝපායික ප්‍රතිපත්තිමය උපදේශන ලබා දීම

ප්‍රධාන වශයෙන් මුදල් ප්‍රතිපත්තිය, විනිමය අනුපාතික ප්‍රතිපත්තිය, ජාත්‍යන්තර වෙළඳාම සහ රාජ්‍ය මූල්‍ය අංශයට අදාළ ගැටලු සම්බන්ධව ඉදිරි කාලීන දැක්මකින් යුතු ප්‍රතිපත්තිමය උපදෙස් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩලය, රජය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත අඛණ්ඩව ලබා දෙන ලදී. 2019 වසර සඳහා වූ ජාතික අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම කල් තැබීම සැලකිල්ලට ගෙන අයවැය ලේඛනය 2019 මාර්තු මාසයේ ඉදිරිපත් කිරීමට පෙරාතුව ආර්ථිකයේ ප්‍රවණතා සහ අවදානම් පිළිබඳ කරුණු ඇතුළත් කරමින් සකස් කරන ලද සංක්ෂිප්ත වාර්තාවක් මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. මුදල් නීති පනතේ අංක 116(1) වගන්තිය ප්‍රකාරව ආර්ථිකයේ ප්‍රවණතා සහ අවදානම් පිළිබඳව කරුණු ඇතුළත් කරමින් සකස් කරන රහස්‍ය වාර්තාවක් වන *සැප්තැම්බර් 15 වාර්තාව* ද ව්‍යවස්ථාපිතව දක්වා ඇති දිනය වන 2019 සැප්තැම්බර් 15 වන විට මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාතික ආර්ථික සභාව වෙත විෂයානුබද්ධ උපදෙස් ලබා දෙන අතර ම, රජයේ විවිධ සාර්ව ආර්ථික ගැටලු සම්බන්ධව ස්වාධීන නිරීක්ෂණ ලබා දෙනු ලැබීය. 2019 වසර තුළදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම් අටක් සම්බන්ධීකරණය කරන ලදී. මුදල් ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීමට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙළඳපොළ මෙහෙයුම් කමිටුව, මූල්‍ය අංශ ස්ථායීතා කමිටුව, දේශීය ණය කළමනාකරණ කමිටුව, රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා වූ ටෙන්ඩර් මණ්ඩලය, පුහුණු කටයුතු කමිටුව, පුස්තකාල උපදේශන කමිටුව, 2019 වසර සඳහා ශ්‍රී ලංකාවේ රජය වෙනුවෙන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සඳහා නියාමන කමිටුව හා ටෙන්ඩර් මණ්ඩලය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ 70 වෙනි සංවත්සරය සැමරීම සඳහා වන නියාමන කමිටුව ඇතුළු අභ්‍යන්තර කමිටු ගණනාවකම සාමාජිකත්වය දරමින් කටයුතු කළේය. තවද, වසර තුළදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ අභ්‍යන්තර ආයෝජන අධීක්ෂණ කමිටුවෙහි සහ ජාත්‍යන්තර සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුවෙහි නිරීක්ෂකයකු ලෙස කටයුතු කළේය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් මුදල් මණ්ඩලයේ සහ මූල්‍ය ආයතනවල සභාපතිවරුන්ගේ හා විධායක නිලධාරීන්ගේ රැස්වීම්වල දී සාර්ව ආර්ථික ප්‍රවණතා සහ කාලීනව වැදගත් වන විෂයයන් පිළිබඳව ඉදිරිපත් කිරීම් නිරන්තරයෙන් සිදු කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරිහු ද මුදල් ප්‍රතිපත්ති කමිටුව ඇතුළු සෙසු අභ්‍යන්තර කමිටු කිහිපයක සාමාජිකයන් ලෙස කටයුතු කළහ.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සහ ජාතික විද්‍යා පදනම වැනි බාහිර ආයතන හා මුදල් අමාත්‍යාංශය, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සහ විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය විසින් පත් කරන ලද කමිටු සහ මණ්ඩල ගණනාවක් නියෝජනය කළහ. කෙළවරපිටියේ විදුලි බලාගාරයක් තැනීමේ ව්‍යාපෘතිය හා සම්බන්ධ තාක්ෂණික ඇගයුම් කමිටුව, අලිමංකඩ ලුණු ලේවායේ උතුරු කොටසෙහි ප්‍රතිසංස්කරණය කිරීමේ, පරන්තන් රසායනික සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමේ සහ ලංකා ඛනිජ වැලි සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමේ ව්‍යාපෘති කමිටු, වාහන එකලස් කිරීමේ කර්මාන්ත පිළිබඳව අධ්‍යයනය කිරීමේ කමිටුව සහ අනෙකුත් ජාතික මට්ටමේ කමිටු වන ජාතික අපනයන උපායමාර්ග පිළිබඳ තාක්ෂණික කමිටුව, ජාත්‍යන්තර වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ කමිටුව, රාජ්‍ය මූල්‍ය සංඛ්‍යා දත්ත සම්බන්ධීකරණය කිරීමේ කමිටුව, ශ්‍රී ලංකාවේ බලශක්ති සහ ප්‍රවාහන අංශ සඳහා කාබන් මිල උපකරණ සැලසුම් කිරීමේ තාක්ෂණික කමිටුව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ ස්ටෙම් (STEM) ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන අධ්‍යාපන සහ මානව සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුව, අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳ ප්‍රවර්ධන හා තොරතුරු පිළිබඳ උපදේශන කමිටුව සහ මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය පිළිබඳ ඒකාබද්ධ කමිටුව යනාදී කමිටු ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය විසින් 2019 වසර තුළදී නියෝජනය කරන ලද බාහිර කමිටු අතර විය. එසේම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කම්කරු ආගමනය හා ජාතික ගිණුම් සහ සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා වන කාර්ය සාධක බලකා සඳහා ද, යෝජිත බංග්ලාදේශ - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සහ ඒකාබද්ධ ඩිජිටල් සංචාරක වේදිකාව ක්‍රියාත්මක කිරීම වැනි ව්‍යාපෘති හා සම්බන්ධ ශක්‍යතා අධ්‍යයන කමිටු සඳහා ද දායකත්වය සපයන ලදී.

## 7.4 ව්‍යවස්ථාපිත ප්‍රකාශන සහ දත්ත හා තොරතුරු බෙදා හැරීම

මුදල් නීති පනතේ ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුගත වෙමින්, අනෙකුත් දෙපාර්තමේන්තුවල දායකත්වය ද ඇතිව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් 2019 අප්‍රේල් මස අවසානය වන විට 2018 වසර සඳහා වූ මහ බැංකු වාර්ෂික වාර්තාව භාෂා ත්‍රිත්වයෙන්ම සම්පාදන කර මුදල් අමාත්‍යවරයාට පිළිගන්වා මහජනතාව වෙත බෙදා හරින ලදී. *මෑත කාලීන ආර්ථික ප්‍රවණතා: 2019 සුවිශේෂ සිදුවීම් සහ අපේක්ෂාවන්* නම් අර්ධ වාර්ෂික ප්‍රකාශනය සහ මාසික විවරණිකා ද 2019 වසරේදී ප්‍රකාශයට පත් කෙරුණි. තවද, සිය ප්‍රතිපත්තිවල පුරෝකථනභාවය සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් මහ බැංකුව විසින් දහතුන් වන ප්‍රතිපත්ති ප්‍රකාශය *2020 සහ ඉදිරිය සඳහා වූ මුදල් හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම* පිළියෙළ කළ අතර, ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ට සිය ඉදිරි සැලසුම් සහ උපක්‍රමික සැලසුම් සකස් කිරීමට හා වැඩිදියුණු කිරීමට උපකාරීවන එම මුදල් ප්‍රතිපත්ති පෙර දැක්ම 2020 ජනවාරි මස 06 වන දින අධිපතිතුමා විසින් නිවේදනය කරන ලදී. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආර්ථික හා මූල්‍ය දත්ත, දෛනික, සතිපතා සහ මාසික ආර්ථික දර්ශක සහ විවරණිකා ලෙස මාධ්‍ය ඔස්සේ ද, මහ බැංකුවේ වෙබ් අඩවියේ ඇති දත්ත පුස්තකාලයේ ද ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. තවද, මහජනතාවගේ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීමේ අදහස ඇතිව නවතම මුදල් සංඛ්‍යාන, පොලී අනුපාත සංඛයාන, ගෙවුම් ශේෂ සහ අනෙකුත් විදේශීය අංශ

සංඛ්‍යාන ඇතුළත් මුදල් ප්‍රතිපත්ති විවරණ සහ විදේශීය අංශය පිළිබඳ පුවත්පත් නිවේදන නියමිත පරිදි නිකුත් කරන ලදී. විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයන්ට (SDDS) අනුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආර්ථිකයේ සියලුම අංශ ආවරණය වන පරිදි සංඛ්‍යාන දත්ත මුදා හරින ලදී.

### 7.5 ප්‍රතිපත්ති පර්යේෂණවල නිරත වීම සහ දැනුම බෙදා හැරීම

විවිධ පර්යේෂණ හා දැනුම හුවමාරු කර ගැනීමේ ක්‍රියාකාරකම් තුළින් දෙපාර්තමේන්තුව සහ මහ බැංකුව තුළ පර්යේෂණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව අඛණ්ඩව කටයුතු කළේය. පර්යේෂණ ආශ්‍රිත කාර්යයන් සඳහා වගකීම දරන ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර කමිටුවක් වන පර්යේෂණ උපදේශක මණ්ඩලය වසර තුළදී සිය ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරන ලදී. ආර්ථික විද්‍යාවට අදාළ ශාස්ත්‍රීය මට්ටමේ පර්යේෂණ ක්‍රමවේද හා ශිල්පීය ක්‍රම පිළිබඳව මහ බැංකුව තුළ මෙන්ම බාහිර ආයතනවලින් සහභාගිවන්නන්ගේ දැනුම වර්ධනය කිරීම සහ පර්යේෂණ දිශානතිය විධිමත් කිරීම සඳහා මෙන්ම මහ බැංකුවේ පශ්චාත් උපාධි අපේක්ෂකයන් සඳහා සාර්ව ආර්ථික විද්‍යාව, ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව සහ ආර්ථික විද්‍යාව සඳහා ගණිතය යන ක්ෂේත්‍රයන්හි පුහුණුව ලබා දීම සඳහා බැංකු විදු පියෙසෙහි සහාය ඇතිව *ආර්ථික විද්‍යාව තුළ පර්යේෂණ* ***(Research in Economics)*** පාඨමාලාව පර්යේෂණ උපදේශන මණ්ඩලය විසින් සාර්ථකව සම්බන්ධීකරණය කළේය.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ වාර්ෂිකව පැවැත්වෙන ප්‍රධාන පර්යේෂණ වැඩසටහන වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2019 දෙසැම්බර් මාසයේදී අඛණ්ඩව දොළොස්වන වරටත් සංවිධානය කරන ලදී. කාලීන සාර්ව ආර්ථික ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳ සෛද්ධාන්තික හා ප්‍රායෝගික පර්යේෂණ පිළිබඳ උනන්දුව ඇති කිරීම මෙම සමුළුවේ අරමුණ වූ අතර, විවිධ පසුබිම්වල පර්යේෂකයින්ට ඔවුන්ගේ අදහස්, සොයාගැනීම් සහ අත්දැකීම් විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් සාකච්ඡා කිරීමට පසුබිමක් සපයන ලදී. 2019 වසරේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව ප්‍රවීණ ජාත්‍යන්තර අර්ථශාස්ත්‍රඥයින් දෙදෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්විණ. ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකු ආයතනයේ විද්‍යාර්ථියකු සහ ජපාන මහ බැංකුවේ ප්‍රතිපත්ති මණ්ඩලයේ හිටපු සාමාජිකයෙකු වන කීඕ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය සයුරි ෂිරායි මහත්මිය විසින් *මෑත කාලීන මුදල් ප්‍රතිපත්ති සහ අභියෝග* යන මාතෘකාව යටතේ සිය දේශනය පැවැත්වූ අතර, ප්‍රංශ මහ බැංකුවේ හිටපු ප්‍රධාන අර්ථශාස්ත්‍රඥ සහ අධ්‍යක්ෂ ජනරාල් මාර්ක්-ඔලිවියර් ස්ට්‍රෞස්-කාන් මහතා විසින් *මහ බැංකුකරණය: පර්යේෂණවල සිට ආර්ථික සහ මූල්‍ය සාක්ෂරතාව දක්වා* යන මැයෙන් සිය දේශනය පවත්වන ලදී. දැඩි සමාලෝචන ක්‍රියාවලියක් මගින් තෝරාගත් මුදල් ප්‍රතිපත්තිය, රාජ්‍ය ආයෝජන, ඵලදායිතාව සහ බදුකරණය වැනි කාලීන මාතෘකා පිළිබඳ පර්යේෂණ පත්‍රිකා හතක් ඇමෙරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව සහ ශ්‍රී ලංකා මහ බැංකු පර්යේෂකයන් විසින් ඉදිරිපත් කර තිබූ අතර, ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ හොඳම පර්යේෂණ පත්‍රිකාව සඳහා පිරිනැමෙන *ආචාර්ය ඩී.එස්. විජේසිංහ අනුස්මරණ සම්මානය* ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි නිලධාරියෙකු වෙත පිරිනමන ලදී.

මීට අමතරව, 2019 පෙබරවාරි 28 සිට මාර්තු 01 දක්වා කාලය තුළ ලෝක බැංකුවේ දකුණු ආසියානු කාර්යාලය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ කොළඹ විශ්ව විද්‍යාලය යන ආයතන සමග එක්ව *දකුණු ආසියාවේ බාහිර අවදානම් පිළිබඳ කලාපීය සමුළුවක* සම සංවිධායකත්වය ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් දරන ලදී. දකුණු ආසියානු රටවල් හයක විද්‍යාර්ථීන් සහ වෘත්තිකයින් කිහිපදෙනෙක් ඔවුන්ගේ රටවල් මුහුණ දී සිටින සාර්ව ආර්ථික ගැටලු සහ බාහිර අවදානම් හා ඒවායෙහි ප්‍රභවයන් සහ අභියෝගාත්මක ගෝලීය පරිසරයන් තුළ ඒ සඳහා ලබා දිය හැකි විසඳුම් සම්බන්ධයෙන් මෙම සමුළුවේ දී සාකච්ඡා කළහ. සෛද්ධාන්තික හා ප්‍රතිපත්ති යන දෙඅංශය වෙතම අවධානය යොමු කරමින් පර්යේෂණ පත්‍රිකා 16ක් මෙම සමුළුවට ඇතුළත් විය. මෙහිදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් ද ඇතුළුව මහ බැංකුවේ නිලධාරීන් විසින් පර්යේෂණ පත්‍රිකා දෙකක් ඉදිරිපත් කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සහ මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවලට අනුයුක්ත නිලධාරීන්ගේ පර්යේෂණවල ප්‍රතිඵලවලින් සමන්විත වන මහ බැංකුවේ නිල පර්යේෂණ ප්‍රකාශනය වන *මාණ්ඩලික පත්‍රිකා* 2019 වසරේදී පර්යේෂණ උපදේශක මණ්ඩලයේ මග පෙන්වීම යටතේ ප්‍රකාශයට පත් කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් දේශීය හා ජාත්‍යන්තර ප්‍රකාශනවල සිය පර්යේෂණ ප්‍රකාශයට පත්කිරීම අඛණ්ඩව සිදුකරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවෙහි සහ *දකුණු ආසියාවේ බාහිර අවදානම් පිළිබඳ කලාපීය සමුළුවෙහි* සිදු කළ ඉදිරිපත් කිරීම්වලට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් විසින් ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් නුවර පැවැති තුන්වන ආර්ථික ආකෘතිකරණය පිළිබඳ දකුණු ආසියානු ජාලය හා ලෝක බැංකුවේ උතුරු ඇමෙරිකානු සාකච්ඡා සංසදයේ සහ ඉන්දුනීසියාවේ බාලි නුවරදී පැවැත්වූ ඉන්දුනීසියානු මහ බැංකුව හා ආසියා - ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමය විසින් සංවිධානය කරන ලද දහතුන්වැනි මුදල් ආර්ථික විද්‍යාව හා බැංකුකරණය පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේදී මෙන්ම ඉන්දියාවේ නව දිල්ලි නුවර පැවැති දිල්ලි සාර්ව ආර්ථික වැඩමුළුවේදී ද පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී.

මේ අතර, මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව, බැංකු විදු පියෙස සහ ප්‍රාදේශීය කාර්යාලවල සහයෝගය ඇතිව මහ බැංකුවට පැමිණි පාසල් හා විශ්ව විද්‍යාල සිසුන්, පාසල් ගුරුවරුන්, රජයේ සහ පෞද්ගලික ආයතනවල නිලධාරීන් සහ විදේශ නියෝජිතයින්හට දැනුම බෙදා දීම උදෙසා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සක්‍රීයව කටයුතු කළේය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් *2018 වාර්ෂික වාර්තාවෙන් පිළිඹිබු වන ශ්‍රී ලංකා ආර්ථිකය* යන මැයෙන් භාෂා ත්‍රිත්වයෙන් ම ප්‍රසිද්ධ දේශන බැංකු විදු පියෙසෙහි දී සහ මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල දී පවත්වන ලදී. මහ බැංකුවේ අරමුණු සහ

කාර්යභාර්ය, මුදල් ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, විදේශීය අංශයේ ප්‍රතිපත්ති සහ මෑත කාලීන ආර්ථික ප්‍රවණතා යන ක්ෂේත්‍රයන්හි අධ්‍යාපන වැඩසටහන් විශාල ප්‍රමාණයක් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් විසින් දිවයින පුරා පවත්වන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් මහ බැංකුවේ පශ්චාත් උපාධි අපේක්ෂකයින්ගේ පර්යේෂණ යෝජනා සහ පර්යේෂණ පත්‍රිකා ඇගයීම අඛණ්ඩව සිදු කළ අතර, 2019 ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සඳහා ලැබුණු පර්යේෂණ යෝජනා මෙන්ම බාහිර පර්යේෂණ ප්‍රකාශනයන් සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ යෝජනා ද ඇගයීමට ලක් කරන ලදී. අ.පො.ස. උසස්පෙළ සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා සංවිධානය කරන ලද, පිළිවෙළින් සිංහල හා දෙමළ භාෂාවලින් විකාශය වූ, *තක්ෂිලාව* සහ *අරිවුටෘ* යන රූපවාහිනී අධ්‍යාපනික වැඩසටහන් සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිප දෙනෙකු විසින් සිය සම්පත් දායකත්වය ලබා දෙන ලදී. සිංහල හා දෙමළ භාෂා ද්විත්වයෙන් ම පවත්වනු ලබන අන්තර් පාඨශාලීය ප්‍රශ්න විචාරාත්මක තරගාවලිය වන *Econ-Icon Season IV* සංවිධානය කිරීමේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි නිලධාරීහු සන්නිවේදන දෙපාර්තමේන්තුවට සහාය වූහ. 2019 වසර තුළ දී ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය විසින් සහ බැංකු අනුකූලතා නිලධාරීන්ගේ සංගමය විසින් පවත්වන ලද අන්තර් බැංකු ප්‍රශ්න විචාරාත්මක තරගාවලීන්හි දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් ප්‍රධාන ප්‍රශ්න ඉදිරිපත්කරන්නා ලෙස කටයුතු කළේය.

### 7.6 ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වාගෙන යෑම

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ජා.මූ. අරමුදල, දකුණු ආසියානු කලාපීය සහයෝගීතා මූල්‍ය සංවිධානය, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය, අග්නිදිග ආසියානු නවසීලන්ත සහ ඕස්ට්‍රේලියානු මහ බැංකු සංගමය වැනි ජාත්‍යන්තර බහුපාර්ශ්වීය මූල්‍ය සංවිධාන සමඟ සම්බන්ධතා පවත්වා ගන්නා මූලික ආයතනය ලෙස කටයුතු කළ අතර, 2019 වසරේදී ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි අනෙකුත් ප්‍රධාන බහුපාර්ශ්වීය සංවර්ධන බැංකු හා ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා රජයට අවශ්‍ය සහයෝගය අඛණ්ඩව ලබා දෙන ලදී. එසේම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජා.මූ. අරමුදල, ලෝක බැංකුව සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතනවලට සාර්ව ආර්ථික සංඛ්‍යාලේඛන ඉදිරිපත් කිරීම ද අඛණ්ඩව සිදු කරන ලදී. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ පෙබරවාරි සහ සැප්තැම්බර් මාසවලදී ජා.මූ. අරමුදල විසින් සිදු කළ සාමාජික මෙහෙයුම් වැඩසටහන් සම්බන්ධීකරණය කළ අතර, විස්තීරණ ණය පහසුකම සමාලෝචනය කිරීමේදී ජා.මූ. අරමුදල සමග සමීපව කටයුතු කරන ලදී. තවද, 2019 වසරේ ඔක්තෝබර් මාසයේදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාව සඳහා පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතියෙහි කොටසක් වන කාර්තුමය පුරෝකථන කිරීමේ ආකෘතිය දියුණු කිරීම සඳහා ජා.මූ. අරමුදල මගින් මෙහෙයවන ඉලක්කගත පුහුණු කිරීමේ මෙහෙයුම් වැඩසටහනක් සම්බන්ධීකරණය කරන ලදී. තවද, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ පාලක මණ්ඩලයේ සහ විධායක කමිටුවේ සභාපති ධූරය හෙබවූ ශ්‍රී ලංකා මහ බැංකුව 2019 වසරේ සැප්තැම්බර් මස 26 - 28 දිනයන්හි දී අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ සහ අන්තර්ජාතික පියවීම් බැංකුවේ ඉහළ පෙළේ සම්මන්ත්‍රණය සහ අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ විධායක කමිටුවේ 18 වැනි හමුව කොළඹදී පැවැත්වීම සඳහා සත්කාරකත්වය සපයන ලද අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ඒ සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කළේය.

## 8. සේවක අර්ථසාධක අරමුදල

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ ප්‍රතිපාදන යටතේ සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) පිහිටුවා ඇත. පනතේ විධිවිධාන ප්‍රකාරව පනතේ පරිපාලන බලතල සහ කාර්යයන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා සතුවන අතර, අරමුදල් කළමනාකරණයට අදාළ බලතල, කාර්යයන් සහ වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට පැවරී ඇත. සේ.අ.අ. පනතේ 5 වැනි වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තමන් වෙත පැවරී ඇති කාර්යභාරයන් ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් යාන්ත්‍රණය ලෙස සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත.

### 8.1 සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ කාර්යයන්

සේ. අ. අ. පනතේ ප්‍රතිපාදන අනුව සාමාජික දායක මුදල් සහ අධිභාර රැස් කිරීම, පොදු ගිණුම් සහ සාමාජික ගිණුම් පවත්වාගෙන යෑම, සාමාජික ගිණුම්වලට පොලිය බැර කිරීම, සාමාජිකයන්ට සහ ඔවුන්ගේ නෛතික උරුමකරුවන් හට ප්‍රතිලාභ ගෙවීම, අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සහ පනත මගින් මුදල් මණ්ඩලය සහ කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති කාර්යභාරයන් ඉටු කිරීමේදී දරනු ලබන පිරිවැය අරමුදලේ ආදායමෙන් අයකර ගැනීම යන කාර්යයන් සේ. අ. අ. දෙපාර්තමේන්තුවට පැවරී ඇත. ඒ අනුව, සේ. අ. අ දෙපාර්තමේන්තුව, සේ.අ.අ. පනතේ ප්‍රතිපාදනයන්ට අනුගත වෙමින් ඉහත කාර්යයන් ඉටු කළ අතර කම්කරු කොමසාරිස් ජනරාල්වරයා සමඟ ද සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යන ලදී. වසර 2019 දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් සංක්ෂිප්ත ලෙස පහත දැක්වේ.

**(අ) දායක මුදල් ලැබීම් සහ හිමිකම් ඇති අයට ප්‍රතිලාභ ගෙවීම්**

2019 වසරේ දායක මුදල් ලැබීම් රු. බිලියන 145.0 සිට 157.2 දක්වා ඉහළ ගිය අතර එය පසුගිය වසරට සාපේක්ෂව සියයට 8.4 ක වර්ධනයකි. එසේම 2019 වසර තුළදී ප්‍රතිලාභ ලෙස අරමුදලේ සාමාජිකයන් සහ ඔවුන්ගේ නෛතික උරුමකරුවන් වෙත රු. බිලියන 126.3 ක් ගෙවන ලදී. එසේම සමස්ත ප්‍රතිලාභ ගෙවීම් 2018 වසරට සාපේක්ෂව සියයට 17.0 කින් වර්ධනය විය. (සංඛ්‍යා සටහන II-9). ඒ අනුව, 2019 වසරේදී ශුද්ධ දායකත්වය, 2018 වසරේ පැවති රු. බිලියන 37.0 හා සැසඳීමේදී රු. බිලියන 30.9 ක් දක්වා අඩු විය.

**(ආ) අරමුදලේ පොදු ගිණුම් සහ සාමාජික ගිණුම් පවත්වාගෙන යාම**

2019 වසර අවසානයේ දී, අරමුදලේ මුළු වටිනාකම රු. බිලියන 2,540.4 ක් වූ අතර, එය 2018 වසර අවසානයේ වූ රු. බිලියන 2,289.4 හා සසඳන විට සියයට 11.0 ක වර්ධනයක් පෙන්නුම් කරයි. ආයෝජන තුළින් ඉපැයූ ආදායම් සහ සාමාජික ශුද්ධ දායක මුදල් (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) ලැබීම් අරමුදලේ වර්ධනයට ඉවහල් විය. 2018 වසරේ සාමාජික පොලිය ද ඇතුළු රුපියල් බිලියන 2,254.2 ක්ව පැවති අරමුදලේ සාමාජිකයන්ගේ මුළු වගකීම (සාමාජික ශේෂ) 2019 අවසන් වන විට රු. බිලියන 2,497.6 දක්වා සියයට 10.8 කින් වර්ධනය විය. (සංඛ්‍යා සටහන II-15).

**II-15 සංඛ්‍යා සටහන**

**අරමුදලට අදාළ වැදගත් සංඛ්‍යා තොරතුරු**

| අයිතමය | 2018 | 2019 (අ) | වෙනස % |
|---|---|---|---|
| අරමුදලේ සමස්ත වටිනාකම (රු. බිලියන) | 2,289.4 | 2,540.4 | 11.0 |
| සාමාජිකයන් වෙත වූ සමස්ත වගකීම (රු. බිලියන) | 2,254.2 | 2,497.6 | 10.8 |
| මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 18.6 | 19.0 | 1.5 |
| දැනට දායක මුදල් එවනු ලබන ගිණුම් (මිලියන) | 2.8 | 2.5 | (11.6) |
| දැනට දායක මුදල් එවනු නොලබන ගිණුම් (මිලියන) | 15.8 | 16.5 | 3.9 |
| මුළු දායක මුදල් ලැබීම් (රු. බිලියන) | 145.0 | 157.2 | 8.4 |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් (රු. බිලියන) | 108.0 | 126.3 | 17.0 |
| ශුද්ධ දායක මුදල් (රු. බිලියන) | 37.0 | 30.9 | (16.4) |
| ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව | 241,190 | 241,581 | 0.2 |

(අ) තාවකාලික

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(ඇ) අරමුදලේ ආයෝජන කටයුතු**

**(i) ආයෝජන කළඹ**

2019 වසරේ දී, සේ. අ. අ. තම අරමුදල් ප්‍රධාන කොට දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කර සහ ආයතනික ණයකර වල තවදුරටත් ආයෝජනය කරන ලදී. 2019 වසර අවසානයේ දී සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම (පොත් අගය) රුපියල් බිලියන 2,548.7 ලෙස වාර්තා වූ අතර, එය 2018 වසරේ පැවති රුපියල් බිලියන 2,298.8 ට සාපේක්ෂව සියයට 10.9 ක වර්ධනයක් පෙන්නුම් කරයි. (සංඛ්‍යා සටහන II-16). අරමුදලෙහි ආයෝජන ප්‍රතිපත්තිය, සාමාජිකයින්ට දිගුකාලීන ධන මූර්ත ප්‍රතිලාභයක් ලබා දීමේ අරමුණ පෙරදැරිව ක්‍රියාත්මක කෙරෙනු අතර එහිදී සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීම මෙන්ම සාමාජික ප්‍රතිලාභ ගෙවීම් සහ අනෙකුත් මෙහෙයුම් වියදම් දැරීම සඳහා අවශ්‍ය ද්‍රවශීලතාවයක් පවත්වා ගැනීම ද තහවුරු කරනු ලැබේ.

2019 වසර අවසානය වන විට අරමුදලේ සමස්ත ආයෝජනයන්ගෙන් සියයට 93.8 ක් රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කර තිබූ අතර, සමාගම් කොටස්වල සියයට 3.0 ක් ද සාංගමික ණය සහ භාරකාර සහතිකපත්වල සියයට 1.7 ක් ද ස්ථාවර තැන්පතුවල සියයට 0.9 ක්ද සහ ඉතිරි සියයට 0.6 ප්‍රතිවිකුණුම් ගිවිසුම්වල ද ආයෝජනය කර තිබුණි. 2019 වසර අවසානය වන විට රජයේ සුරැකුම් ආයෝජනයන්ගේ කල්පිරීමේ ව්‍යුහය සහ ඵලදා අනුපාතයන් සංඛ්‍යා සටහන II-17 හි දක්වා ඇත.

**II-16 සංඛ්‍යා සටහන**

**ආයෝජන කළඹ**

| ආයෝජන වර්ගය | 2018 | | 2019 | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු. බිලියන) | දායකත්වය % | වටිනාකම (රු. බිලියන) | දායකත්වය % |
| භාණ්ඩාගාර බැඳුම්කර සහ බිල්පත් | 2,119.2 | 92.2 | 2,390.4 | 93.8 |
| සමාගම් කොටස් | 74.9 | 3.3 | 75.4 | 3.0 |
| සාංගමික ණය උපකරණ | 44.8 | 1.9 | 42.2 | 1.7 |
| ස්ථාවර තැන්පතු | 33.6 | 1.5 | 25.0 | 0.9 |
| ප්‍රති විකුණුම් ගිවිසුම් | 26.4 | 1.1 | 15.6 | 0.6 |
| **එකතුව** | **2,298.8** | **100.0** | **2,548.7** | **100.0** |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**II-17 සංඛ්‍යා සටහන**

**2019 අවසානයේ දී රාජ්‍ය සුරැකුම්පත් කළඹෙහි කල්පිරීමේ ව්‍යුහය**

| කල්පිරීම | පරිණත වටිනාකම (රු. මිලියන) | දායකත්වය % | බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) (අ) |
|---|---|---|---|
| වසරකට වඩා අඩු | 117,804.50 | 4.9 | 7.96 |
| වසර 1-2 | 174,652.71 | 7.3 | 8.74 |
| වසර 3-4 | 293,388.18 | 12.3 | 9.52 |
| වසර 5 ට වැඩි | 1,804,331.66 | 75.5 | 10.09 |
| **එකතුව** | **2,390,177.05** | **100.0** | **9.82** |

(අ)එක් එක් කල්පිරීම් බාණ්ඩයේ බරිත සාමාන්‍ය ඵලදාව අදාළ පරිණත බාණ්ඩයේ එක් එක් සුරැකුම් ඵලදාව එම කල්පිරීම් බාණ්ඩයේ ඇති සුරැකුම් වල සමස්ත වෙළඳපොළ අගයට බරිත කිරීම මගින් ගණනය කර ඇත.

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(ii) ආයෝජන ආදායම**

අරමුදලේ සමස්ත ආයෝජන ආදායම 2019 වසරේ දී රුපියල් බිලියන 259.0 ක් ලෙස සටහන් වූ අතර, එය පෙර වසරේ උපයන ලද සමස්ත ආයෝජන ආදායම සහ සැසඳීමේදී සියයට 16.5 ක වර්ධනයක් පෙන්නුම් කරයි. (සංඛ්‍යා සටහන II-18). පොලී ආදායම අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය විය. 2019 වසරේ පොලී ආදායම රුපියල් බිලියන 254.7 ක් වූ අතර, එය 2018 වසරේ උපයන ලද රුපියල් බිලියන 229.4 හා සැසඳීමේදී සියයට 11.0 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. ව්‍යාපාර කොටස්වල ආයෝජනය කිරීම තුළින් ලැබූ ලාභාංශ ලෙස රුපියල් මිලියන 6,247.5 ක් 2019 වසර තුළදී උපයන ලද අතර, එය 2018 වසරේදී ආදායම වූ රුපියල් මිලියන 3,887.6 සමඟ සැසඳීමේදී සියයට 60.7 ක වර්ධනයකි. තව ද, 2019 දී ද්විතීයික වෙළඳපොළෙන් භාණ්ඩාගාර බැඳුම්කර මිලට ගැනීම නැවත ආරම්භ කරන ලදී. සමස්තයක් ලෙස, අරමුදලේ ඉපැයුම් අනුපාතිකය 2019 වසරේ දී සියයට 10.7 ක් වූ අතර එය 2018 වසරේ දී සියයට 10.4 කි.

**II-18 සංඛ්‍යා සටහන**

**ආයෝජන මගින් ලද ආදායම්**

| ආදායම් මූලාශ්‍රය | 2018 | | 2019 | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු. මිලියන) | දායකත්වය % | වටිනාකම (රු. මිලියන) | දායකත්වය % |
| පොලී සහ ක්‍රමක්ෂය ලාභ | 229,446.0 | 103.1 | 254,681.0 | 98.3 |
| වෙළඳපොළ මිලට අගය කිරීමෙන් ලාභ/පාඩු - ව්‍යාපාර කොටස් | (10,901.3) | (4.9) | (1,890.0) | (0.7) |
| ප්‍රාග්ධන ලාභ - ව්‍යාපාර කොටස් | 7.2 | - | - | - |
| ප්‍රාග්ධන ලාභ - රජයේ සුරැකුම්පත් | - | - | 0.1 | - |
| ලාභාංශ | 3,887.6 | 1.7 | 6,247.5 | 2.4 |
| මූල්‍ය වත්කම් හානිකරණය | 0.6 | - | 0.3 | - |
| **එකතුව** | **222,440.1** | **100.0** | **259,038.8** | **100.0** |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව , ශ්‍රී ලංකා මහ බැංකුව

### (iii) වියදම්

2019 වසරේ අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම රුපියල් මිලියන 1,581.8 ක් වූ අතර, එය 2018 වසරේ සමස්ත වියදම වූ රුපියල් මිලියන 1,505.3 හා සසඳන විට සියයට 5.1 ක වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. 2019 වසරේ දී අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම අරමුදලේ දළ ආදායමින් සියයට 0.61 ක් ලෙස සටහන් වූ අතර, එය 2018 වසරේ දී සියයට 0.68 ක් විය. (සංඛ්‍යා සටහන II-19). එසේම වසර ගණනාවක් පුරාම අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම එහි දළ ආදායමින් සියයට 1 කට වඩා පහළ මට්ටමක පවත්වා ගැනීමට අරමුදලට හැකි විය.

**II-19 සංඛ්‍යා සටහන**

**මෙහෙයුම් වියදම්**

| අයිතමය | වටිනාකම (රු. මිලියන) | | වෙනස (%) |
|---|---|---|---|
| | 2018 | 2019 | |
| සේවක පිරිවැය | 967.3 | 1,062.6 | 9.8 |
| පරිපාලන වියදම් | 470.0 | 450.7 | (4.1) |
| වෙනත් වියදම් | 68.0 | 68.5 | 0.8 |
| එකතුව | 1,505.3 | 1,581.8 | 5.1 |
| **මුළු පිරිවැය දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස %** | **0.68** | **0.61** | |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව , ශ්‍රී ලංකා මහ බැංකුව

### (ඈ) සාමාජික ශේෂ සඳහා පොලී ගෙවීම්

පසුගිය වර්ෂයන් පුරා, සේ. අ. අරමුදලට, එහි සාමාජිකයින් වෙත ඉහළ පොලියක් අඛණ්ඩව ගෙවීමට හැකි විය. (සංඛ්‍යා සටහන II-20). ඒ පිළිබඳ තොරතුරු 8 වන පරිච්ඡේදයේ දක්වා ඇත.

**II-20 සංඛ්‍යා සටහන**

**සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද පොලී අනුපාතික**

| වසර | ගෙවන ලද පොලී අනුපාතය (%) | සඵල පොලී අනුපාතය (%) * |
|---|---|---|
| 2009 | 13.75 | 13.92 |
| 2010 | 12.50 | 12.65 |
| 2011 | 11.50 | 11.58 |
| 2012 | 11.50 | 11.62 |
| 2013 | 11.00 | 11.14 |
| 2014 | 10.50 | 10.60 |
| 2015 | 10.50 | 10.57 |
| 2016 | 10.50 | 10.51 |
| 2017 | 10.50 | 10.51 |
| 2018 | 9.50 | 9.54 |
| 2019 (අ) | 9.25 | 9.27 |

(අ) තාවකාලික

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

* සඵල පො.අ. = (සාමාජිකයන්ට ගෙවන ලද පොලිය) / [(ආරම්භක සාමාජික ශේෂය + වසර අවසානයේ පොලී ගෙවීමට පෙර සාමාජික ශේෂය)/2]

### (ඉ) සාමාජික සේවාවන්හි නිරත වීම

### (i) සාමාජික ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම

2019 වසරේදී, 2018 වසරේ පළමු සහ දෙවන අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශන, සේ.අ. අරමුදලේ ක්‍රියාකාරී සාමාජිකයින් වෙත, ඔවුන්ගේ සේවායෝජකයන් මගින් බෙදා හරින ලදී. ඊට අදාළ තොරතුරු සංඛ්‍යා සටහන II-21 හි දක්වා ඇත.

**II-21 සංඛ්‍යා සටහන**

**නිකුත් කළ සාමාජික ගිණුම් ප්‍රකාශන**

| කාලච්ඡේදය | සේවායෝජකයන් සංඛ්‍යාව | ප්‍රකාශන සංඛ්‍යාව (ක්‍රියාකාරී සාමාජිකයින්) |
|---|---|---|
| 2018 පළමු අර්ධ වර්ෂය | 70,180 | 2,201,077 |
| 2018 දෙවන අර්ධ වර්ෂය | 78,651 | 2,730,561 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### (ii) නිවාස ණය ලබා ගැනීම සඳහා සාමාජිකයන්ට ණය සුරැකුම් නිකුත් කිරීම

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව සහ සමුපකාර ග්‍රාමීය බැංකුව යනාදි සහභාගිත්ව ණය දෙන ආයතන වලින් සාමාජිකයන්ට නිවාස ණයක් ලබා ගැනීමේ අරමුණින් 1988 වසරේ දී හඳුන්වා දුන් නිවාස ණය ක්‍රමය 2019 වසරේදී ද තවදුරටත් ක්‍රියාත්මක විය. නිවාස ණය ක්‍රමය යටතේ සේවක අර්ථසාධක අරමුදල මගින් 2019 වසර තුළදී රුපියල් මිලියන 5,097 ක්වූ නිවාස ණය සඳහා අනුමැතිය ලබා ගැනීමට සාමාජික ශේෂ සහතික පත් 10,022 ක ප්‍රමාණයක් ණය ලබා දෙන ආයතන වෙත ලබා දෙන ලදී. (සංඛ්‍යා සටහන II-22). තවද, 2019 වසරේදී 2018 වසර තුළ හිඟ ණය පියවීම සඳහා රුපියල් මිලියන 3,164 කට ආසන්න මුදලක් අදාළ සාමාජික ගිණුම් වලින් අඩු කොට, අදාළ ණය දෙන ආයතනවලට ප්‍රේෂණය කරන ලදී.

**II-22 සංඛ්‍යා සටහන**

**නිවාස ණය පහසුකම**

| වසර | ශේෂ සහතිකපත් ගණන | අනුමත කරන ලද නිවාස ණය මුදල (රුපියල් මිලියන) | සහභාගීත්ව ණය දෙන ආයතන වෙත කළ ප්‍රේෂණයන් (රුපියල් මිලියන) |
|---|---|---|---|
| 2009 | 10,383 | 2,680 | 1,552 |
| 2010 | 13,848 | 4,512 | 2,093 |
| 2011 | 20,041 | 6,355 | 1,896 |
| 2012 | 11,234 | 3,973 | 2,019 |
| 2013 | 16,268 | 6,914 | 2,178 |
| 2014 | 17,786 | 8,021 | 2,394 |
| 2015 | 13,132 | 5,489 | 2,522 |
| 2016 | 12,780 | 5,414 | 2,541 |
| 2017 | 10,998 | 4,946 | 2,485 |
| 2018 | 10,036 | 4,974 | 2,759 |
| 2019 (අ) | 10,022 | 5,097 | 3,164 |

(අ) තාවකාලික

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### (iii) පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය

2012 අංක 02 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතට සහ පසුකාලීනව පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද ක්‍රියාපටිපාටියන්ට අනුව, සියයට 30 ක පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය, 2015 ජූලි 01 වන දින සිට ක්‍රියාත්මක විය. මෙම ක්‍රමය සඳහා ප්‍රතිලාභ ලබන්නන්ගෙන් ඉහළ ඉල්ලුමක් පැවති අතර, ඒ යටතේ 155,000 ඉක්ම වූ ප්‍රතිලාභීන් වෙත රුපියල් බිලියන 88.3 ක මුදලක් 2019 වසර අග වන විට ගෙවන ලදී. එසේම 2019 වසර තුළදී, ප්‍රතිලාභීන් 29,646 ක් වෙත රුපියල් බිලියන 15.2 ක් නිදහස් කර ඇත.

### (iv) සේ.අ.අ. ජංගම සේවාවන්

සේ.අ.අ. සාමාජිකයන් හට වඩාත් පහසුවන අයුරින් සේවා සැපයීම සහ ඔවුන්ගේ මෙන්ම සාමාන්‍ය ජනතාව තුළ ඇති සේ.අ.අ. සම්බන්ධ දැනුම වඩ වඩාත් දියුණු කිරීමේ අරමුණින් 2019 වසර තුළදී ද මෙම සේ.අ.අ. ජංගම සේවා පවත්වන ලදී. එලෙස 2019 වසර තුළදී සේ.අ.අ. ජංගම සේවාවන් 16 ක් සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 2 ක් පවත්වන ලද අතර ඒවායින් කිහිපයක් කම්කරු දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව සහ අදාළ ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල යන ආයතන සමඟ සහයෝගයෙන් පවත්වන ලදී. විවිධ රාජ්‍ය ආයතන/අමාත්‍යංශ සහ රාජ්‍ය නොවන සංවිධාන මගින් සංවිධානය කරන ලද ජංගම සේවා වැඩසටහන් සඳහා සහභාග වන පුද්ගලයන්ට සේ.අ.අ. සම්බන්ධ සේවාවන් ලබා දීම සහ දැනුම්වත් කිරීම සඳහා එම ආයතන සහ සංවිධානවල ආරාධනයෙන් සේ.අ.අ දෙපාර්තමේන්තුව සහභාගී වී ඇත. කොළඹ පිහිටි සේ.අ.අ. ප්‍රධාන කාර්යාලයට පැමිණීමෙන් සේ.අ.අ. සාමාජිකයෙකු හට ලබා ගත හැකි සේවාවන් සියල්ලක්ම පාහේ තම ප්‍රදේශයේදී හෝ තම සේවා ස්ථානයේදී ලබා ගැනීමේ පහසුකම මෙම ජංගම සේවා වැඩසටහන් මගින් සලසා ඇත. ප්‍රධාන වශයෙන් සාමාජික ගිණුමේ ශේෂය පරීක්ෂා කිරීම, සේ.අ.අ. සාමාජික තොරතුරු සංශෝධනය කිරීම, සේ.අ.අ. ගිණුම් සංශෝධනය සිදු කිරීම සහ සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම යන පහසුකම්, කෙටි පණිවුඩ අන්තර්ජාලය මගින් සේ.අ.අ. සාමාජික ගිණුම් තොරතුරු පිරික්සීමේ සේවාව ප්‍රවර්ධනය කිරීම මෙන්ම සමස්ත සේ.අ.අ. ක්‍රියාපටිපාටි පිළිබඳ උපදෙස් සැපයීම සිදු කරනු ලබයි. මීට අමතරව, විද්‍යුත් තැපැල්, පෝස්ටර්, පත්‍රිකා, වීඩියෝ දර්ශන සහ දේශන වැනි සන්නිවේදන මාධ්‍යයන් යොදා ගනිමින් සේ.අ.අ. විසින් සපයනු ලබන සේවාවන් පිළිබඳ සාමාජිකයින්, සේවා යෝජකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් ඉලක්ක කර ගනිමින් ජංගම සේවාවන්ට සමගාමීව දැනුම්වත් කිරීමේ කටයුතු සිදු කරන ලදී. ඒ අනුව, සෑම ජංගම සේවා වැඩසටහනකටම පෙර, ජංගම සේවාවල ඵලදායිතාව ඉහළ නැංවීමේ අරමුණින් අදාළ සේවා යෝජකයින්, කළමනාකරුවන් සහ අදාළ සේවා යෝජකයින්ගේ කාර්යමණ්ඩල සාමාජිකයින් සඳහා විශේෂ දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

### (v) විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් සේවක අර්ථසාධක දායක මුදල් රැස්කිරීම

කඩදාසි භාවිතයෙන් තොර පරිසරයක් තුළ වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින් සේ.අ.අ. විසින් විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් දායක මුදල් ගෙවීමේ සහ අදාළ සාමාජික දත්ත වාර්තා සැපයීමේ පහසුකම් සහිත විද්‍යුත් දත්ත වාර්තා රැස්කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී. මූලිකව, මෙම ක්‍රමය ස්වේච්ඡා පදනමින් ක්‍රියාත්මක වූ අතර 2012 අංක 02 දරන සේ.අ.අ. (සංශෝධිත) පනත හරහා මේ සඳහා අදාළ වන නීතිමය ප්‍රතිපාදනයන් ස්ථාපිත කරන ලදී. එකී ප්‍රතිපාදනයන් අනුව, සේවකයින් පනහකට වැඩි සේවායෝජකයින් සඳහා සිය සේවක අර්ථසාධක දායක මුදල් වාර්තා විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් සැපයීම අනිවාර්ය වේ. විද්‍යුත් දත්ත වාර්තා රැස්කිරීමේ ක්‍රමවේදය තුළ පරිවර්තනීය වෙනසක් සිදු කරමින් 2011 වසරේදී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය මාර්ගගත ගෙවීම් ක්‍රමය භාවිතයෙන් සේවක අර්ථසාධක දායක මුදල් එක්රැස් කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී. එමගින් සේවායෝජකයින් මෙම ක්‍රමය සමඟ සම්බන්ධ වීමේ වර්ධනීය වෙනසක් සිදු වූ අතර සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය ද වඩාත් කාර්යක්ෂම විය. එමෙන්ම සමස්ත ක්‍රියාවලිය කළමනාකරණය කිරීමේ සහ නියාමනය කිරීමේ ක්‍රියාදාමයන් ද මේ සමඟ වඩාත් පහසු විය. 2016 වසරේදී, විද්‍යුත් දායක මුදල් රැස් කිරීමේ ක්‍රමවේදය එහි විශිෂ්ට තාක්ෂණික ජයග්‍රහණයක් සනිටුහන් කරමින් නියෝජිත වාණිජ බැංකු හරහා මාර්ගගතව සේවක දත්ත සත්‍යාපනය කළ හැකි යෙදවුමක් සහිත ස්වයංක්‍රීයව සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. මේ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකු අටක් නියෝජිත බැංකු ලෙස දැනට සේ.අ.අ. ගෙවීම් කරනු

ලබන සිය ගනුදෙනුකරුවන් වෙත පහසුකම් සලසනු ලබයි. ඒ අතරින්, වාණිජ බැංකු හතරක් මංගත දත්ත සත්‍යාපනයක් සහිත ස්වයංක්‍රීයව සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදය භාවිතයෙන් ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දී ඇත.

මීට අමතරව, විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සහ ඒ තුළින් සේවක අර්ථසාධක අරමුදලෙහි සියලුම පාර්ශ්වකරුවන්හට අත්වන ප්‍රතිලාභ පිළිබඳව සේවායෝජකයින් දැනුම්වත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් අනුගමනය කරන ලදී. ඒ අනුව, ආසන්න වශයෙන් සක්‍රිය සාමාජිකත්වයෙන් 79% ක ප්‍රමාණයක් නියෝජනය කරමින් විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සඳහා ලියාපදිංචි වූ සේවායෝජකයින් සංඛ්‍යාව 8,540 සිට 9,267 දක්වා 2019 වසර තුළදී වැඩි වූ අතර අදාළ මාසික දායක මුදල් ලැබීම් සමස්ත දායක මුදලෙන් 88% ක පමණ ප්‍රමාණයක් ආවරණය කරනු ලබයි.

තවද, සේ.අ.අ. ගෙවීම සඳහා නව ගෙවුම් ක්‍රම හඳුන්වා දීමේ අරමුණින්, සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය හරහා විද්‍යුත් දත්ත වාර්තා සැපයීමට හැකි වන සේ වෙබ් අඩවිය වැඩි දියුණු කිරීමටත්, අදාළ ගෙවීම් ලංකා ක්ලියර් ආයතනයෙහි විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) සහ සම්බන්ධව ඇති ඕනෑම වාණිජ බැංකුවක් හරහා කිරීමටත් හැකි වන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

**(vi) සේ.අ.අ. සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම**

සේ.අ.අ. විසින්, වඩාත් කාර්යක්ෂම සේවාවක්, සේවකයින් සහ සේවායෝජකයින් හට ලබා දීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව සහ අත්වැල් බඳවා ගනිමින් පුද්ගලයින් නැවත ලියාපදිංචි කිරීම සඳහා, 2010 වසරේ ආරම්භ කළ විශේෂ ව්‍යාපෘතිය, 2019 වසර තුළදී ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, ජාතික හැඳුනුම්පත් තොරතුරු එක්රැස් කර, ජාතික හැඳුනුම්පතෙහි තොරතුරු සඳහන්ව ඇති ආකාරයට නැවත ලියාපදිංචි කර, ජාතික හැඳුනුම්පත් අංකය සාමාජිකයාගේ ඒකීය හඳුනා ගැනීමේ අංකය (Unique Identification Number) ලෙස භාවිතා කිරීමට හැකි වන ආකාරයට පහසුකම් සපයන අතර මෙමගින් ආයතන දෙකටම පොදුවේ භාවිතා කළ හැකි සාමාජික කේන්ද්‍රීය දත්ත ගබඩාවක් (Member Centric Database) සකස් කිරීම සඳහා මූලික කටයුතු කරන ලදී. මෙම වැඩසටහන සේ.අ.අ. දෙපාර්තමේන්තුව සහ කම්කරු දෙපාර්තමේන්තුව යන දෙඅංශයේම සාමාජික සාමාජිකාවන්ට සේවයක් සැපයීම සඳහා ඵලදායි ලෙස සාමාජිකයන්ගේ තොරතුරු වැඩි දියුණු කිරීම සඳහා උපකාරී වේ.

2019 වසර අවසානය වන විට ක්‍රියාකාරී සාමාජිකයින් මිලියන 1.98 කට ආසන්න සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු ප්‍රමාණයක් රැස්කර ගනිමින් අරමුදලේ සක්‍රීය (වර්තමාන දායක මුදල් ගෙවනු ලබන) සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම සිදු කර ඇත. ඒ අතුරින් සියයට 81 ක් (ගිණුම් මිලියන 1.62) පමණ වූ සාමාජික ප්‍රතිශතයකට ඒකීය හඳුනා ගැනීමේ අංක ලබා දී ඇති අතර, සෙසු සාමාජිකයන්ගේ තොරතුරු තහවුරු කරමින් පවතී. තවද, නව සාමාජිකයන්ගේ තොරතුරු නිවැරදිව යාවත්කාලීන කිරීම සඳහා පද්ධතියක් ස්ථාපිත කර ඇති අතර ඒ සඳහා සෑම මසකදීම පළමු වරට දායක මුදල් ලැබෙන සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු රැස්කර ගැනීම සඳහා මාසික නිරීක්ෂණ ක්‍රියාවලියක් ද පවත්වා ගෙන යනු ලැබේ. තවද, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව (පු.ලි.දෙ.) දත්ත ගබඩාවට ප්‍රවේශය ලබා ගැනීමෙන් නැවත ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පු.ලි.දෙ. සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

**(vii) වෙනත් සේවා**

සේවක අර්ථසාධක අරමුදල සිය සාමාජිකයන්ට කාර්යක්ෂම සහ ඵලදායි ලෙස සේවා සැපයීම සඳහා කටයුතු කරයි. වර්තමානයේ වේගයෙන් වර්ධනය වන වටපිටාවක් තුළ සාමාජිකයන් විශිෂ්ට සේවා සැපයුමක් අපේක්ෂා කරති. මේ අනුව, 2019 වසරේදී සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ මහජන සම්බන්ධතා සහ විමසීම් අංශය අභියෝගාත්මක වසරක් සනිටුහන් කර ඇත. 2019 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව වෙත සාමාජික/සේවාදායක පැමිණීම් 156,898 ක් වාර්තා වූ අතර, දුරකථන ඇමතුම් හරහා පුද්ගලයින් 77,310 දෙනෙක් ද ඊමේල් හරහා සාමාජිකයින් 8,713 දෙනෙක් ද විමසීම් කර ඇත. තවද, 2019 වසරේදී සාමාජිකයින්, සේවායෝජකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් දෙපාර්තමේන්තුව වෙත ලිපි 84,550 ක් යොමු කර ඇත.

සාමාජික ගිණුම් සංශෝධනය කිරීම/නිවැරදි කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත ලිපි ලේඛන මගින් සහ සාමාජිකයන් පැමිණීම් හරහා ඉල්ලීම් විශාල ප්‍රමාණයක් ලැබෙයි. වසර 2019 දී සේ.අ.අ. සාමාජික ගිණුම්වල සංශෝධන 72,313 ක් දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. සේ.අ.අ. සාමාජික ගිණුම්වල සංශෝධන ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වර්ගීකරණය කළ හැකිය. එය සේ.අ. අරමුදලේ සාමාජික ගිණුමක නම/ජාතික හැඳුනුම්පත් විස්තර නිවැරදි කිරීමක් ලෙස සහ සාමාජික ගිණුමකට බැර කර ඇති දායක මුදල්වල නිවැරදි කිරීමක් ලෙස දැක්විය හැකිය. 2019 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව මගින් නම/ජාතික හැඳුනුම්පත් සංශෝධන 67,083 ක් සහ ගිණුම් සංශෝධන 5,230 ක් සිදු කර ඇත. තවද, ලේඛන ඡායාස්ථගත පිළිබිඹු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමඟම සේවක අර්ථසාධක අරමුදල් සාමාජික ගිණුම් සංශෝධනය කිරීම සඳහා මහ බැංකුවේ ශාඛා කාර්යාල වෙත ද ඉඩ ප්‍රස්ථාව උදා විය. ඒ අනුව 2019 වසරේ දී ශාඛා කාර්යාල හරහා සේවක අර්ථසාධක අරමුදල් සාමාජික ගිණුම් සංශෝධන 12,944 ක් සිදු කරන ලදී.

**(ඊ) අනෙකුත් කාර්යයන්**

තවද, සේ.අ.අ. විසින් එහි ආයෝජන උපායමාර්ග සහ ආයෝජන රාමුව සමාලෝචනය සහ නැවත පිළියෙළ කිරීමේ ක්‍රියාවලිය ලෝක බැංකුවේ සහ ශ්‍රී ලංකා ආණ්ඩුවේ මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය යටතේ සිදු කරමින් පවතී. තවදුරටත්, පුළුල්ව පැතිරුණු ආයතනික තොරතුරු තාක්ෂණික විසඳුම් පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය ඉහත ව්‍යාපෘතිය යටතේ ලබා දේ. මෙය අරමුණු කොටගෙන ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) තාක්ෂණික අනුග්‍රහය යටතේ, ශ්‍රී ලංකා ආණ්ඩුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය වැඩසටහන හරහා ව්‍යාපාර ක්‍රියාවලි සමාලෝචනයක් (BPR) සිදු කරන ලදී.

## 9. පහසුකම් කළමනාකරණ

ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි අභ්‍යන්තරය, පිරියත හා උපකරණයන්හි ප්‍රමුඛ අළුත්වැඩියාවක් සඳහා ආරම්භ කරන ලද ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියට අදාළ මූලික තක්සේරු කටයුතු සහ ප්‍රසම්පාදන ලේඛන පිළියෙළ කිරීම ව්‍යාපෘති උපදේශන ආයතනයේද සහාය ඇතිව පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2019 වසර තුළදී තවදුරටත් සිදු කරන ලදී. ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක තත්ත්ව පරීක්ෂාව මෙම කාලසීමාව තුළදී අවසන් කරන ලද අතර සනීපාරක්ෂක පද්ධතිය මෙන්ම ජල සැපයුම් සහ ගිනි නිවීම් පද්ධතිවලට අදාළ විද්‍යුත් සහ යාන්ත්‍රික උපකරණ අලුතෙන් සවි කිරීමේ කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියද ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ කොටසක් ලෙස ප්‍රධාන ගොඩනැගිල්ලේ උපස්ථ විදුලි ජනන පාලක පද්ධතිය සහ නවීන තාක්ෂණය මත පදනම් වූ ආරක්ෂක කැමරා පද්ධතියක් සවි කිරීම මෙන්ම හදිසි පිටවීම් පියගැටපෙළ අලුත්වැඩියා කිරීමේ කටයුතු ද ආරම්භ කරන ලදී. ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ආරක්ෂක තත්ත්වය ශක්තිමත් කිරීමේ පියවරක් ලෙස ප්‍රධාන පිවිසුමට ආසන්නව ස්ථිර මාර්ග බාධකයක් සහ ආරක්ෂක ගේට්ටුවක් සවි කිරීමද සිදු කරන ලදී.

සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලයන්හි සහ රාජගිරිය බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ ගොඩනැගිලි පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති ආරම්භ කරන ලදී. රාජගිරිය බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ සහ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ විදුලි සෝපාන නැවත සවි කිරීම සඳහා ආරම්භ කරන ලද ව්‍යාපෘතිය ද මේ අතර වේ. රාජගිරිය බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ මළාපවහන පද්ධතිය සහ ශ්‍රවණාගාරයේ වායුසමීකරණ පද්ධතිය නැවත සවි කිරීම සහ මාතලේ ප්‍රාදේශීය කාර්යාලයේ විදුලි සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීමේ නව ව්‍යාපෘතිද ක්‍රියාත්මක කරන ලදී. බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ පාඨමාලාවන් සඳහා සහභාගි වන්නන් හට එම පරිශ්‍රය තුළම නවාතැන් පහසුකම් සැලසීමේ වැඩපිළිවෙළ අනුව යමින් නේවාසිකාගාර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රථම අදියර මෙම කාලසීමාව තුළදී නිම කරන ලදී. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව පිහිටි ලොයිඩ් ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මත ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා ද ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

රාජකාරි කටයුතු සහ නිවාඩු අවශ්‍යතාවයන් සඳහා පිට පළාත්වලට ගමන් කරන ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නිවාඩු නිකේතන පහසුකම් පුළුල් කිරීමට පියවර ගෙන තිබේ. අනුරාධපුරයේ යෝජිත නව නිවාඩු නිකේතනයට අදාළ ගෘහ නිර්මාණ සැලසුම් 2019 වසරේ දී අවසන් කරන ලද අතර කතරගම පැරණි නිවාඩු නිකේතන ගොඩනැගිලිවල තත්ත්වය තක්සේරු කිරීම සඳහා ව්‍යුහාත්මක පරීක්ෂාවක් උපදේශන ආයතනයක සහාය ඇතිව සිදු කරන ලදී. බැංකු වාස පරිශ්‍රයේ උද්‍යාන අලංකරණ කටයුතු වැඩිදියුණු කිරීම සහ ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු ද සිදු කරන ලද අතර කතරගම නිවාඩු නිකේතනයේ සහ බැංකු වාස පරිශ්‍රයේ හදිසි විදුලි අවශ්‍යතා සපුරාලීම සඳහා නව උපස්ථ විදුලි ජනන යන්ත්‍ර ස්ථාපිත කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කරන ලදී.

සිය පහසුකම් කළමනාකරණ කටයුතු වඩා විධිමත් කිරීම සඳහා පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය තුළදී පරිපාලන ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කරන ලදී. සේවා නියුක්තිකයන්ගේ සහ විශ්‍රාමිකයන්ගේ ශුභ සිද්ධිය සඳහා හඳුන්වා දෙන ලද පරිඝනක ආශ්‍රිත (on line) නිවාඩු නිකේතන වෙන් කරවා ගැනීමේ ක්‍රමවේදයෙහි ගෙවීම් නිරවද්‍යතාවය සහ පරිශීලකයන්ගේ පහසුව සඳහා වැටුප් ගෙවීම් පද්ධතිය (Payroll Sysem) සමඟ සම්බන්ධ කිරීම ද සිදු කරන ලදී.

රාජකාරි ප්‍රවාහන කටයුතු සඳහා කුලී රථ භාවිතා කරන්නන් සඳහා පරිඝණක ආශ්‍රිත වවුචරපත් නිකුත් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට ද පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් කටයුතු ආරම්භ කරන ලදී. මෝටර් රථ ගාල් කිරීමේ ඉඩකඩ සඳහා දැනට පවතින ඉල්ලුම සපුරාලීමට නාගරික සංවර්ධන අධිකාරියේ ද සහාය ඇතිව වාහන ගාල් කිරීමේ අතිරේක ඉඩ පහසුකම පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සපයා දෙන ලදී. නවීකරණ සහ පුළුල් කිරීම්වලට අදාළ නව ව්‍යාපෘති සඳහා කටයුතු කරන අතරතුරම පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ගෙඩනැගිලිවල අත්‍යාවශ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යෑම මෙන්ම ප්‍රවාහන සහ විදුලි සංදේශ සේවාවන් සැපයීම ප්‍රමුඛ වගකීම් කොටසක් ලෙස සලකා කටයුතු කරන ලදී.

## 10. මූල්‍ය කටයුතු

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ මුදල් නීති පනතේ අදාළ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යය මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. 2002 වර්ෂයේ සිට මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ රාමුව අදාළ කර ගන්නා

ලදී. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, මහ බැංකුවේ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම හා නිරීක්ෂණය කිරීම, මහ බැංකුවේ අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වයන් සඳහා ගෙවීම් සිදු කිරීම, දායක අරමුදල් මුදාහැරීම සහ රාජ්‍ය විදේශීය ණය ආපසු ගෙවීම, මූල්‍ය ගනුදෙනු අභ්‍යන්තර වාර්තාකරණය සඳහා පද්ධති පවත්වාගෙන යෑම, අභ්‍යන්තර අරමුදල් 17 හි ආයෝජන කළඹ කළමනාකරණය කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම සහ සේවක ණය දත්ත සංචිතය පවත්වාගෙන යෑම ඇතුලත් වේ.

## 10.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම

(අ) **මාසික ශේෂ පත්‍රය** : 1949 අංක 58 දරන මුදල් නීති පනතේ විධි විධාන ප්‍රකාරව, 2018 වසරේ දෙසැම්බර් මාසය හා 2019 වසරේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා වූ මාසික ශේෂ පත්‍රයන් පිළියෙළ කරන ලද අතර එම මාසික ශේෂ පත්‍රයන් රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදී.

(ආ) **කාර්තුමය වාර්තා** : ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය ප්‍රගතිය සහ මූල්‍ය තත්ත්වය කාර්තුමය වශයෙන් මුදල් මණ්ඩලය වෙත වාර්තා කිරීම සිදු කරන ලදී.

(ඇ) **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන** : 2019 වර්ෂය තුළදීත් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම උදෙසා අවශ්‍ය වන අදාළ ගිණුම්කරන ප්‍රමිතීන් හා අවශ්‍යතාවයන් මත අනුකූලවීම සඳහා අඛණ්ඩ පදනමකින් ගිණුම්කරණ පද්ධතීන් හා කාර්ය පටිපාටිය යාවත්කාලීන කරන ලදී. 2019 වර්ෂයේ දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වූ මහ බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවේ 11 වන කොටස ආරම්භයේදී ඉදිරිපත් කර ඇත.

## 10.2 වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2020 වසර සඳහා වූ වාර්ෂික ආදායම් හා වියදම් අයවැය හා ප්‍රාග්ධන අයවැය බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවල උපායමාර්ගික සැලසුම් යටතේ ඇති කාර්ය සැලසුම්වලට අනුකූලව "පරිඝණකගත අයවැය සැකසුම් පද්ධතියක්" මගින් පිළියෙළ කරන ලදී. 2020 වාර්ෂික අයවැය සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය 2019 දෙසැම්බර් මස ලබා ගන්නා ලද අතර, එය 2020 වසරේ වැඩ කරන මුල් දින සිටම සියලුම දෙපාර්තමේන්තුවලට ලබාදෙන ලදී. 2019 වසර සඳහා වූ අයවැයෙහි ප්‍රගතිය දැක්වෙන කාර්තුමය වාර්තා, ඵලදායී අයවැය පාලනය සඳහා මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලදී.

## 10.3 අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් සඳහා ගෙවීම් සිදු කිරීම

(අ) 2019 වසර තුළදී නියමිත කාලසීමාවන් ඇතුළත සියලු අභන්තර ගෙවීම් එනම් සේවක වේතන, සේවක ණය හා මෙහෙයුම්වියදම් යනාදිය සිදු කරන ලදී.

(ආ) මහ බැංකුවේ ස්ථාවර නියෝග යටතේ ඇති ක්‍රියාපටිපාටීන්ට යටත්ව දේශීය හා විදේශීය සැපයුම්කරුවන්ට ගෙවිය යුතු සියලුම බාහිර ගෙවීම් සිදු කර ඇත. 2019 වර්ෂය ඇතුළත මුළු ගෙවීම් 6.198 ක් සිදු කරන ලද අතර, ඉන් 5,929 ක් දේශීය සැපයුම්කරුවන් සඳහාත් 269 ක් විදේශීය සැපයුම්කරුවන් සඳහාත් විය.

(ඇ) ආසන්න වශයෙන්, 2019 වසර තුළදී මහා භාණ්ඩාගාරයට සහ අදාළ ව්‍යාපෘතීන් සඳහා රු. බිලියන 1,231.9 ක වටිනාකමකින් යුත් ණය අරමුදල් නිදහස් කිරීම් 3,027 ක් සහ රු. බිලියන 1,411.7 ක වටිනාකමකින් යුත් විදේශීය ණය වාරික ආපසු ගෙවීම් 821 ක් සිදු කර ඇත. මීට අමතරව විවිධ ව්‍යාපෘති සඳහා විදේශ බැංකු 2ක් සමඟ බැංකු එකඟතා ගිවිසුම් 4 ක් අත්සන් කරන ලදී.

## 10.4 අභ්‍යන්තර අරමුදල් කළමනාකරණය

(අ) මුදල් මණ්ඩල තීරණයකට අනුව මහ බැංකුවේ අභ්‍යන්තර අරමුදල් (සේවක අර්ථ සාධක අරමුදල හැර) මධ්‍යගත ලෙස කළමනාකරණය කිරීම සඳහා 2016 මාර්තු මස සිට මෙහෙයුම් ඇරඹූ මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කරන ලද වෙන්වූ ඒකකය මගින් මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන බැංකුවෙහි කාර්ය මණ්ඩලයේ සහ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 8ක් සහ වෙනත් අරමුදල් 4 ක්, නිරතවීම් හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන ශ්‍රී ලංකා තැන්පතු සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල, කාර්ය මණ්ඩල කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන අරමුදල් 3 ක් හා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන ව්‍යාපෘති අරමුදල් 13 ක් ඇතුළත් අභ්‍යන්තර අරමුදල් 17 ක් කළමනාකරණය කරන ලදී.

මෙම සියලු අරමුදල් පොදු ආයෝජන ප්‍රතිපත්තියක් යටතේ මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් ආයෝජනය කෙරෙන අතර, අදාළ අරමුදල් හිමිකාර දෙපාර්තමේන්තු ඒවායේ පරිපාලක ලෙස කටයුතු කරයි. මෙම අරමුදල් කළමනාකරණ ක්‍රියාවලිය මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය / ක්‍රියාපටිපාටීන් සහ ක්‍රමෝපායිකව වත්කම් ආයෝජනයන් සඳහා වෙන්කිරීම් වෙනුවෙන් වූ ක්‍රියාපටිපාටීන් මගින් පාලනය වේ. තවද, මෙම ක්‍රියාවලිය ස්වාධීනව කටයුතු කරන ඉදිරි කාර්යාලය හා පසු කාර්යාලයකින් සමන්විත වන අතර මූල්‍ය අංශය නියාමනය හා අධීක්ෂණ කටයුතු භාර නියෝජ්‍ය අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් අභ්‍යන්තර ආයෝජන පිළිබඳ අධීක්ෂණ කමිටුව මගින් තීරණ ගැනීම සිදු කෙරේ. අරමුදල් ආයෝජන උපදෙස් දීම සහ නිරීක්ෂණය කිරීම සඳහා වන මෙම කමිටුව 2019 වසර තුළ 12 වතාවක් රැස් විය. මෙම අභ්‍යන්තර අරමුදල් ආයෝජනයන්හි කාර්ය සාධන වාර්තා මාසික වශයෙන් මුදල් මණ්ඩලය වෙත වාර්තා කර ඇත.

(ආ) මෙම අරමුදල් ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල, ස්ථාවර තැන්පතුවල, ඉහළ ශ්‍රේණිගත සංස්ථාපිත ණයකරවල හා කෙටිකාලීන ප්‍රතිවිකුණුම්වල ආයෝජනය කෙරේ. විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 6 ක 2018 වසර සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය වාර්තා එම අරමුදල්වල නීති රීති වලට අනුව මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. 2019 වසර අග වන විට මෙම මුළු අරමුදල රු. බිලියන 130.17 දක්වා වර්ධනය විය.

**II-23 සංඛ්‍යා සටහන**

**අරමුදල් කළමනාකරණ කාර්ය සාධනය - 2019 (රු. බිලියන)**

| දෙපාර්තමේන්තුව | 2019 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය) | 2018 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය) |
|---|---|---|
| මූල්‍ය | 59.96 | 55.16 |
| නිරාකරණ හා බලගැන්වීම් | 64.06 | 53.96 |
| ප්‍රාදේශීය සංවර්ධන | 6.07 | 3.64 |
| කාර්ය මණ්ඩල කළමනාකරණ සේවා | 0.08 | 0.08 |
| එකතුව | 130.17 | 112.84 |

### 10.5 ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පොදු ලෙජරයේ ස්ථාවර වත්කම් මොඩියුලය යටතේ වන ස්ථාවර වත්කම් ලේඛනය තුළ මහ බැංකුවේ සියලුම ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාවන් පවත්වාගෙන යනු ලබයි. මේ හා සම්බන්ධ සියලුම වෙනස්කම් එනම් නව මිලදී ගැනීම්, ස්ථානගත කිරීම්වල සිදු වූ වෙනස්කම්, ප්‍රත්‍යාගණනයන්, ක්ෂයවීම් සහ ඉවත් කිරීම් 2019 වසර තුළදී මෙම ලේඛනයේ වාර්තා කර ඇත. ඒ අනුව, අයිතමයන් අත්පත් කර ගැනීම් 1,559 ක් සහ බැහැර කිරීම් 338 ක් සමගින් 2019 වසර තුළදී මෙම ලේඛනය යාවත්කාලීන කරන ලදී.

### 10.6 කාර්යමණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මහ බැංකු කාර්ය මණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය අඛණ්ඩ ලෙස යාවත්කාලීනව පවත්වාගෙන යන අතර, එමගින් ණය අයකර ගැනීම් වාර්තා කිරීමේ ක්‍රියාවලිය සඳහා සහ සේවකයන්ට සහ කළමනාකරණය වෙත ණය තොරතුරු සැපයීමේ කටයුතු සඳහා 2019 වසර තුළදී පහසුකම් සපයන ලදී. ඒ අනුව, 2019 වසර තුළදී රු. බිලියන 2.17 ක වටිනාකමකින් යුත් 2,055 ක ණය සංඛ්‍යාවක් සේවකයන් සඳහා පිරිනමා ඇත.

### 10.7 අනෙකුත් කාර්යයන් - මිලදී ගැනීමේ ක්‍රියාවලිය

ශ්‍රී ලංකා මහ බැංකුවේ නීති රීති වලට අනුව, මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව බැංකුවෙහි සියලුම තාක්ෂණික ඇගයීම් කමිටු, භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා වන ටෙන්ඩර් මණ්ඩල සහ ස්ථාවර වත්කම් බැහැර කිරීම් සඳහා වන සමීක්ෂණ මණ්ඩල නියෝජනය කරයි. ඒ අනුව, 2019 වසර තුළදී මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එවැනි ටෙන්ඩර් මණ්ඩල 192 ක්, මිලදී ගැනීම් හා සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටු 61 ක් , ස්ථාවර වත්කම් බැහැර කිරීම සඳහා වන එක් සමීක්ෂණ මණ්ඩලයක් සහ එක් වාහන බැහැර කිරීමේ කමිටුවක් නියෝජනය කර ඇත.

## 11. මූල්‍ය බුද්ධි ඒකකය

මූල්‍ය බුද්ධි ඒකකය, එහි ආරම්භයේ සිටම ජාතික හා අන්තර්ජාතික බලධාරීන් සමග සමීප සහයෝගයෙන් යුතුව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සඵලදායී වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීමේ සිය ප්‍රයත්නයෙහි අඛණ්ඩව නිමග්න වන ලදී. 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ 2006 වර්ෂයේදී පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය, ස්වාධීන ව්‍යවස්ථාපිත අධිකාරියක් ලෙස රටෙහි මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රධාන නියාමකයා ලෙස කටයුතු කරයි. මීට අමතරව මූල්‍ය බුද්ධි ඒකකය, මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් නිකුත් කරන ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම සඳහා රටෙහි මූල්‍ය ආයතන සහ මූල්‍ය නොවන ආයතනද ඇතුළත්ව ආයතනික වශයෙන් පුළුල් ආවරණයක් සපයන අතර, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ සහ මූල්‍ය කාර්යසාධන බලකායෙහි ඒකාබද්ධ අධීක්ෂණයට ලක් වේ. මූල්‍ය බුද්ධි ඒකකයෙහි ප්‍රධාන කාර්යයන් අතරට මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දක්වා ඇති අනෙකුත් අදාළ නීත්‍යනුකූල නොවන ක්‍රියාවන්ට සම්බන්ධ තොරතුරු රැස් කිරීම හා ලබා ගැනීම එවැනි නීත්‍යනුකූල නොවන ක්‍රියාවන් හා සම්බන්ධ සැක කටයුතු ගනුදෙනු පිළිබඳ විශ්ලේෂණවලට අදාළ තොරතුරු, අදාළ නීති බලාත්මක කිරීමේ අධිකාරීන් වෙත ලබා දීම ඇතුළත් වේ. තවද, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ශ්‍රී ලංකාවේ වැඩපිළිවෙළ, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යන ප්‍රධාන නීති සංහිතාවලින් සමන්විත වේ.

### 11.1 තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ තොරතුරු බෙදාහැරීම

ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලව, වාර්තාකරණ ආයතන විසින්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ කර්තව්‍යයට බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම්,

රක්ෂණ සමාගම්, කොටස් තැරැව්කරුවන් සහ මුදල් හෝ මූල්‍ය වටිනාකම් හුවමාරු කිරීමේ සේවා සපයන ආයතන විසින් රුපියල් මිලියනයක් හෝ විදේශ මුදල්වලින් ඊට සමාන මුදල් ඉක්මවන මුදල් ගනුදෙනු සහ විද්‍යුත් මුදල් ප්‍රේෂණ ගනුදෙනු (දේශීය හා විදේශීය) මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලදී. ඒ අනුව, 2019 වසර තුළදී, වාර්තාකරණ ආයතන විසින් මිලියන 4.9 ක (තාවකාලික) මුදල් ගනුදෙනු සහ මිලියන 6.6 ක (තාවකාලික) විද්‍යුත් මුදල් ප්‍රේෂණ සංඛ්‍යාවක් වාර්තා කරන ලදී. තවද, මුදල් ගනුදෙනු වාර්තා පනතෙහි 7 වන වගන්තිය අනුව, වාර්තාකරණ ආයතන විසින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත සැක කටයුතු මුදල් ගනුදෙනු වාර්තා කරන ලදී. මෙහෙයුම් හා උපායමාර්ගික විශ්ලේෂණවලින් අනතුරුව සැක කටයුතු ගනුදෙනු වාර්තා වැඩිදුර විමර්ශණය සඳහා නීති බලාත්මක කරන අධිකාරීන් සහ නියාමන අධිකාරීන් වෙත යොමු කරන ලදී. 2019 වසර තුළදී, සැක කටයුතු වාර්තා 2,806 ක් මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලද අතර, මූල්‍ය බුද්ධි ඒකකය විසින් සැක කටයුතු වාර්තා 1,478 ක් වැඩිදුර විමර්ශන සඳහා නීති බලාත්මක කරන අධිකාරීන් සහ නියාමන අධිකාරීන් වෙත යොමු කරන ලදී.

## 11.2. වාර්තාකරණ ආයතන නියාමනය කිරීම

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නියාමන රාමුව තවදුරටත් විධිමත් කිරීම සඳහා මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් වෙත මූල්‍ය බුද්ධි ඒකකය විසින් රෙගුලාසි නීති හා මාර්ගෝපදේශ නිකුත් කරනු ලබයි. ඒ අනුව, 2019 වසර තුළදී, මූල්‍ය බුද්ධි ඒකකය විසින්, සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීම, අවදානම මත පදනම් වූ ප්‍රවේශය මත ගනුදෙනුකරුවන් පිළිබඳ අඛණ්ඩව නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම, ප්‍රවර්ධිත නිසි උද්යෝගය, ප්‍රතිලාභ හිමිකාරීත්වය හඳුනා ගැනීම සහ දේශපාලන වශයෙන් අනාවරණය වූ පුද්ගලයන් හඳුනා ගැනීම පිළිබඳව මාර්ගෝපදේශ කිහිපයක්ම නිකුත් කරන ලදී. මූල්‍ය බුද්ධි ඒකකය, සඵලදායී අධීක්ෂණය හා බලාත්මක කිරීම, එතැන් හා විතැන් ආවේක්ෂණ, සම්මන්ත්‍රණ මගින් දැනුම්වත්භාවය ඉහළ නැංවීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධව වාර්තාකරණ ආයතනවලට අනුකූලතා සමාලෝචන රැස්වීම් පැවැත්වීම ආදිය මගින් වාර්තාකරණ ආයතනවල අනුකූලතාවය ප්‍රවර්ධනයට නිරන්තරයෙන් පියවර ගන්නා ලදී. ඊට සමගාමීව, මූල්‍ය බුද්ධි ඒකකය විසින්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති හා නිකුත් කරන ලද අනෙකුත් රෙගුලාසි සහ රීතිවලට දක්වන අනුකූලතාවය ඇගයීම සඳහා අවදානම මත පදනම් වූ එතැන් අධීක්ෂණ මූල්‍ය ආයතන සඳහා 32 ක් ද, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන් සඳහා 36 ක් ද, පවත්වන ලදී. තවද, මූල්‍ය බුද්ධි ඒකකය විසින්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වූ මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන්වලට දණ්ඩන පැනවීම, අවවාදාත්මක ලිපි නිකුත් කිරීම, පසු විපරම් සාකච්ඡා පැවැත්වීම ආදී නියාමන ක්‍රියාමාර්ග ගන්නා ලදී.

## 11.3. දේශීය සහ විදේශීය සහයෝගීතාව

### (අ) අවබෝධතා ගිවිසුම්

2019 වසරේ දී, මූල්‍ය බුද්ධි ඒකකය මාලදිවයින් මූල්‍ය බුද්ධි ඒකකය සහ පැපුවා නිව් ගිනියාවේ මූල්‍ය විශ්ලේෂණ සහ අධීක්ෂණ ඒකකය යන ඒකක දෙක සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළැඹි අතර, ඒ අනුව, විදේශීය පාර්ශ්ව සමඟ අත්සන් කර ඇති සමස්ත අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව 39 දක්වා ඉහළ යන ලදී. තවද, තොරතුරු හුවමාරු කර ගැනීමේ අභිප්‍රායෙන් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය සහ ජාත්‍යන්තර පොලීසියේ කොළඹ ශාඛාව යන දේශීය නියෝජිත ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලදී. ඒ අනුව, දේශීය නියෝජිත ආයතන සමඟ අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව 11 ක් දක්වා ඉහළ යන ලදී.

### (ආ) එග්මොන්ට් කණ්ඩායම (Egmont Group)

විමර්ෂණ පවත්වාගෙන යෑමේ දී අවශ්‍ය තොරතුරු එක්රැස් කර ගැනීම පිණිස ගෝලීයව මූල්‍ය බුද්ධි ඒකක 164 කින් සමන්විතව පිහිටුවා ඇති එග්මොන්ට් කණ්ඩායමේ සහාය මූල්‍ය බුද්ධි ඒකකය විසින් ලබා ගන්නා ලද අතර, සාමාජික රටවල විමර්ශන කටයුතු සඳහා බුද්ධිමය තොරතුරු එක්රැස් කිරීමට ද සහාය දෙන ලදී. දැනට සිදු කරගෙන යන විමර්ශනවලට අදාළව ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2019 වසර තුළදී විදේශීය මූල්‍ය බුද්ධි ඒකකවලින් සිදු කරන ලද තොරතුරු ඉල්ලීම් 40 ක් සඳහා ප්‍රතිචාර දක්වා ඇති අතර, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් විදේශීය මූල්‍ය බුද්ධි ඒකක වෙතින් තොරතුරු ඉල්ලීම් 58 ක් සිදු කර ඇත. තවද, 2019 ජනවාරි මාසයේ දී ඉන්දුනීසියාවේ ජකර්තා හි පැවති මූල්‍ය බුද්ධි ඒකකයන්ගේ එග්මොන්ට් කණ්ඩායම් රැස්වීමට සහ 2019 සැප්තැම්බර් මාසයේ දී නෙදර්ලන්තයේ හේග් හි පැවති එග්මොන්ට් සැසි වාරය සඳහා මූල්‍ය බුද්ධි ඒකකයේ නිලධාරීහු සහභාගි වූහ. නෙදර්ලන්තයේ පැවති එග්මොන්ට් සැසි වාරයේ දී ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ඩී එම් රූපසිංහ මහතා එග්මොන්ට් කණ්ඩායමේ ආසියා ශාන්තිකර කලාපයේ නියෝජිත වශයෙන් තේරී පත් විය.

### (ඇ) මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම (APG)

2019 අගෝස්තු 18 සිට 23 දක්වා ඕස්ට්‍රේලියාවේ කැන්බරා හි පැවති මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපයේ 22 වන රැස්වීම සහ තාක්ෂණික සහාය සංසදය සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආයතන නියෝජනය කරමින් ශ්‍රී ලංකාවේ නිලධාරීන් කණ්ඩායමක් සහභාගි විය. එම රැස්වීමේ දී ශ්‍රී ලංකාවේ අන්‍යෝන්‍ය ඇගයීම පිළිබඳව වූ 4 වන පසු විපරම් වාර්තාව සාකච්ඡා කෙරිණි. ඵලදායී විවාදයකින්

අනතුරුව පෙර අනුකූල නොවන හෝ අර්ධ වශයෙන් අනුකූල ලෙස නිර්දේශිත නිර්දේශ 4 ක අනුකූලතා ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමට සාමාජිකත්වය අනුමැතිය පළ කරන ලදී. ඒ අනුව, මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ 40 න්, ශ්‍රී ලංකාවේ වත්මන් ශ්‍රේණිගත කිරීම, අනුකූල නිර්දේශ 7 ක් ද, විශාල වශයෙන් අනුකූල නිර්දේශ 24 ක් ද, අර්ධ වශයෙන් අනුකූල නිර්දේශ 7 ක් ද, අනුකූල නොවන නිර්දේශ 2 ක් ද වශයෙන් පැවතිණි.

**(ඈ) බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාවය උදෙසා වන බෙංගාල බොක්කේ රටවල මූලිකත්වය සංවිධානයේ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ උප කණ්ඩායම (BIMSTEC - SG - CFT)**

බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව උදෙසා වන බෙංගාල බොක්කේ රටවල මූලිකත්වය ( BIMSTEC - SG - CFT ) සංවිධානයේ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ උප කණ්ඩායම් වැඩමුළුව 2019 නොවැම්බර් මස 27 - 29 කාලපරිච්ඡේදය තුළ කොළඹ දී "ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ අත්දැකීම් සිද්ධි අධ්‍යයන තුළින් හුවමාරු කර ගැනීම" යන තේමාව යටතේ සාමාජික රටවල නියෝජිතයන් 40 කගේ සහභාගිත්වයෙන් පැවැත්විණ.

**(ඉ) වෙනත් මූල්‍ය බුද්ධි ඒකක සමඟ දැනුම හුවමාරු කර ගැනීම**

2019 දෙසැම්බර් 02 සිට 05 දක්වා කාලය තුළ මාලදිවයිනේ මූල්‍ය බුද්ධි ඒකකයේ නිලධාරීන් කණ්ඩායමකට සිව් දින අධ්‍යයන චාරිකාවක් සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින් සත්කාරකත්වය සපයන ලදී. එම අධ්‍යයන චාරිකාව ප්‍රධාන වශයෙන්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධ අවදානම මත පදනම් වූ අධීක්ෂණය, සැක කටයුතු ගනුදෙනු විශ්ලේෂණය, අන්‍යෝන්‍ය ඇගයීම සහ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ ජාතික අවදානම් තක්සේරුව පිළිබඳ ශ්‍රී ලංකාවේ අත්දැකීම් බෙදා ගැනීම පිළිබඳ අවධානය යොමු කෙරිණි. මූල්‍ය බුද්ධි ඒකක අතර සහයෝගීතාවය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා කලාපයේ අනෙකුත් මූල්‍ය බුද්ධි ඒකක සමඟ මෙම මුල පිරීම නිරන්තරයෙන් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය අපේක්ෂා කරයි.

## 11.4 ආයතනික හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන්

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාකාරකම්වලට අදාළ ගනුදෙනු හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීම සම්බන්ධ දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ සිය නිරන්තර පරිශ්‍රමය ක්‍රියාවට නංවමින් වසර තුළදී, සහභාගිකරුවන් 3,688 ක ගේ සහභාගීත්වය ඇතිව දැනුම්වත් කිරීමේ/පුහුණු වැඩසටහන් 55 ක් පවත්වන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හයවන සහ හත්වන තාක්ෂණික සහයෝගිතා දූත මෙහෙයුම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂඥයන් විසින් පිළිවෙළින්, 2019 මාර්තු සහ ඔක්තෝබර් යන මාසවල පවත්වන ලදී. මෙම දූත මෙහෙයුම මගින් ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ කාර්යභාරය යටතේ, අවදානම මත පදනම් වූ අධීක්ෂණය, මූල්‍ය බුද්ධි ඒකකයේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සහ නීති සංශෝධන යන අංශ සඳහා තාක්ෂණික සහාය අඛණ්ඩව ලබා දෙන ලදී. තවද, ඇමෙරිකා එක්සත් ජනපදයේ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවට අදාළ නේවාසික උපදේශන නිලධාරියෙකු, මූල්‍ය බුද්ධි ඒකකයේ මෙහෙයුම් සහ ඵලදායීත්වය, මූල්‍ය අංශයේ අධීක්ෂණය හා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම යනාදියට අදාළ උපායමාර්ග සංවර්ධනය සහ සම්පත් කළමනාකරණය ආදී වශයෙන් වූ අංශ සම්බන්ධ තාක්ෂණික සහයෝගීතාවය ලබාදීම අඛණ්ඩව සිදු කරන ලදී. ආසියානු සංවර්ධන බැංකුවේ නොමසුරු අනුග්‍රාහකත්වයෙන් goAML පද්ධතිය වින්‍යාසගත කිරීම සඳහා සති දෙකක උපදේශන දූත මෙහෙයුමක් වෙනුවෙන් ෆින්ලන්තයේ මූල්‍ය බුද්ධි ඒකකයේ විශේෂඥයෙකුගේ තාක්ෂණික සහාය ලබා ගැනීමට මූල්‍ය බුද්ධි ඒකකයට හැකි විය.

## 11.5 ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ සමාලෝචන කණ්ඩායමේ ඇගයීම

ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාවලිය, ඊට අදාළ ජාත්‍යන්තර සම්මුතීන්ට ඇති අනුකූලතාව ඇගයීමේ අරමුණින් මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම විසින් අන්‍යෝන්‍ය ඇගයීම් ක්‍රියාවලියේ දෙවන වටය 2014/2015 වර්ෂ තුළදී පවත්වන ලදී. 2015 ජූලි මාසයේ දී සම්මත කර ගන්නා ලද අන්‍යෝන්‍ය ඇගයීම් වාර්තාවේ දී මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කණ්ඩායමේ "කඩිනම් සහ පුළුල් පසු විපරම් ක්‍රියාවලිය" යටතේ ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග රාශියක් නිර්දේශ කරන ලදී. මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සඵලදායීතාව සම්බන්ධව ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය සොයා බැලීම සඳහා මූල්‍ය කාර්ය සාධක බලකායේ ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ සමාලෝචන කණ්ඩායමේ (ICRG) ඇගයීමට ශ්‍රී ලංකාව ලක්වන බව මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ඔක්තෝබර් මස දැනුම් දෙන ලදී. සාකච්ඡා සහ ප්‍රගති සමාලෝචන වාර්තාවන් කිහිපයකට පසුව ජාත්‍යන්තර සහයෝගීතාව, අධීක්ෂණය, නෛතික පුද්ගලයන් හා විධිවිධාන සහ සමූල ඝාතන අවි ව්‍යාප්තිය සම්බන්ධයෙන් ඉලක්කගත මූල්‍ය සම්බාධක (උතුරු කොරියාව සහ ඉරානයට අදාළ) ආදී වශයෙන් වන කරුණු 4 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අවශ්‍ය ප්‍රගතිය පෙන්වා නොමැති බවට මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාවට දැනුම් දෙනු ලැබීය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2017 ඔක්තෝබර් මාසයේ දී ආජන්ටිනාවේ බුවනෝස් අයර්ස් හි දී පැවති වාර්ෂික රැස්වීමේ දී, ශ්‍රී ලංකාව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රමෝපායන්ගේ දුර්වලතා සහිත රටක් ලෙස මූල්‍ය කාර්ය සාධක බලකායේ

අනුකූලතා ලේඛනයෙහි ලැයිස්තුගත කරන ලද අතර, මෙය "අළු ලේඛනයට" ඇතුළත් කිරීම ලෙස හඳුන්වයි. මෙසේ ලැයිස්තුගත කිරීමෙන් අනතුරුව එම හඳුනාගත් ක්‍රමෝපාය දුර්වලතා මග හරවා ගැනීම සඳහා කාල රාමුවකට යටත් වූ ක්‍රියාකාරී සැලැස්මක් ශ්‍රී ලංකාවට ලබා දෙන ලදී.

2017 නොවැම්බර් මස ලැයිස්තුගත වීමෙන් පසුව, ශ්‍රී ලංකාවේ බලධාරීන් විසින් මූල්‍ය කාර්ය සාධක බලකායේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී පියවර රැසක් ගන්නා ලද අතර, ඒ සඳහා 2018 අංක 6 දරන භාර (සංශෝධන) පනත සහ 2018 අංක 24 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාවය දැක්වීමේ (සංශෝධන) පනත සම්මත කිරීම, උතුරු කොරියාව සහ ඉරානය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ රෙගුලාසි/නියෝග/මාර්ගෝපදේශ නිකුත් කිරීම, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති නිකුත් කිරීම මගින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් වන ආවරණය නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් දක්වා පුළුල් කිරීම, අවදානම මත පදනම් වූ අධීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම, අනුගත නොවන මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සඳහා බලාත්මක පියවර ගැනීම සහ දැනුම්වත් කිරීමේ ක්‍රියාවලි ඇතුළත් වේ.

ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය, මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ආසියා ශාන්තිකර ඒකාබද්ධ කණ්ඩායම (AP/JG) හරහා ඇගයීමට ලක් කරන ලදී. මේ අනුව, ශ්‍රී ලංකාව ලබා ඇති සැලකිය යුතු ප්‍රගතිය ආසියා ශාන්තිකර ඒකාබද්ධ කණ්ඩායමේ පිළිගැනීමට ලක් වූ අතර, 2019 පෙබරවාරි මාසයේ දී මූල්‍ය කාර්ය සාධක බලකාය ශ්‍රී ලංකාව සිය ක්‍රියාකාරී සැලැස්ම සැලකිය යුතු ලෙස සම්පූර්ණ කර ඇති බවට මූලිකව තීරණය කරන ලදී. අනතුරුව, මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ලබා දී ඇති ක්‍රියාකාරී සැලැස්ම ශ්‍රී ලංකාව විසින් ක්‍රියාත්මක කර ඇත් ද යන්න තහවුරු කිරීම සඳහා 2019 සැප්තැම්බර් 16 සිට 17 දක්වා කාලය තුළ ආසියා ශාන්තිකර ඒකාබද්ධ කණ්ඩායම විසින් එතැන් ඇගයීමක් පවත්වන ලදී. එහිදී, ආසියා ශාන්තිකර ඒකාබද්ධ කණ්ඩායමේ නියෝජිතයන් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවේ දේශපාලනමය හා ආයතනික කැපවීම තහවුරු කිරීම සඳහා පෞද්ගලික අංශය හා මුදල් ඇමතිතුමා ඇතුළු අදාළ සියලු පාර්ශ්වකරුවන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. 2019 ඔක්තෝබර් මසයේ දී පැවති මූල්‍ය කාර්ය සාධක බලකායේ සැසි වාරයේ දී ඇගයීමේ කණ්ඩායමෙහි නිර්දේශ සාකච්ඡාවට බඳුන් වූ අතර, ශ්‍රී ලංකාව "අළු ලේඛනයෙන්" ඉවත් කිරීමේ තීරණයට සියලු සාමාජිකයන්ගේ අනුමැතිය ලැබිණ. ඒ අනුව, 2019 ඔක්තෝබර් 18 වන දින ශ්‍රී ලංකාව මූල්‍ය කාර්ය සාධක බලකායේ අධීක්ෂණ ක්‍රියාවලියට තවදුරටත් ලක් නොවන බව මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් නිවේදනය කරන ලදී. මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් අළු ලේඛනයෙන් ඉවත් කිරීම ශ්‍රී ලංකාවට ආර්ථිකමය සහ මූල්‍යමය වශයෙන් හිතකර බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 12. විදේශ විනිමය

විදේශ විනිමය ගනුදෙනු ප්‍රවර්ධනය සහ නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරා ඇති වගකීම ඉටු කරමින් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ වගන්ති ක්‍රියාත්මක කිරීමේ අරමුණින් එම පනතේ 02 වගන්තිය ප්‍රකාරව විදේශ විනිමය දෙපාර්තමේන්තුව 21017 නොවැම්බර් 17 වෙනි දින ස්ථාපනය කරන ලදී.

විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වන්නේ විදේශ විනිමය පනත යටතේ මුදල් ඇමතිවරයා නියම කර ඇති පරිදි විදේශ විනිමය ගනුදෙනු සඳහා බලයලත් වෙළෙඳුන්, පරිසීමිත වෙළෙඳුන් හා වෙනත් පුද්ගලයින් පත් කිරීම, රෙගුලාසි හා විධානයන් සකස් කරමින් විදේශ විනිමය පනතේ වගන්ති ක්‍රියාත්මක කිරීම හා විදේශ විනිමය කටයුතු හා ගනුදෙනු සිදු කිරීම සඳහා විධිවිධාන නිකුත් කිරීම, විදේශ විනිමය පනත යටතේ පොදු අවසරයක් ප්‍රදානය කර නොමැති විශේෂ අරමුණු සඳහා අවසරයක් ලබා දීම, විදේශ විනිමය වෙළඳපොළේ සිදුවන වර්ධනයන් හා සමගාමීව පවත්නා විදේශ විනිමය ප්‍රතිපත්තීන්වල සඵලතාවය තීරණය කිරීම හා නව ප්‍රතිපත්තිවල අවශ්‍යතාවය හඳුනා ගැනීම, විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි, නියෝග සහ විධාන සඳහා අදාළ බලයලත් වෙළෙඳුන් දක්වන අනුකූලතාවය පිළිබඳ මෙහෙයුම් කටයුතු සිදු කිරීම, විදේශ විනිමය පනතට අනුකූලතාවය දක්වන අවස්ථාවන් පිළිබඳ විමර්ශන කටයුතු සිදු කිරීම, විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ වැඩිදුර පැහැදිලි කර ගැනීම සඳහා ලැබෙන ඉල්ලීම්වලට පිළිතුරු ලබාදීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තා සහ ප්‍රකාශනයන්වල විදේශ විනිමය රෙගුලාසි සහ ප්‍රතිපත්තීන් ඇතුළත් කර සකස් කරනු ලබන අදාළ කොටස් සකස් කිරීම ආදිය වේ.

ඒ අනුව, ප්‍රතිපත්ති හා පර්යේෂණ අංශය, ප්‍රාග්ධන ගනුදෙනු අංශය හා සංඛ්‍යාන, මෙහෙයුම් හා විමර්ශන අංශය ලෙස දෙපර්තමේන්තුව කොටස් තුනක් යටතේ ක්‍රියාත්මක වේ. 2019 වසරේ, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් හා කටයුතුවල කාර්යසාධනය පිළිබඳ සාරාංශයක් පහත දක්වේ.

### 12.1 නව රෙගුලාසි, විධාන හා නියෝග නිකුත් කිරීම සඳහා පහසුකම් සපයමින්, 2017 දී හඳුන්වා දුන් විදේශ විනිමය පනත හා ඒ යටතේ නිකුත් කළ රෙගුලාසි, නියෝග හා විධාන යළි සමාලෝචනය කිරීම

**(අ) රෙගුලාසි නිකුත් කිරීම සඳහා පහසුකම් සැපයීම**

වසර තුළදී, විදේශ විනිමය පනත යටතේ මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කළ රෙගුලාසි තුනක් සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුව පහසුකම් සලසනු ලැබීය. මෙම ගැසට් නිවේදනයන් මෙම වාර්තාවේ 111 වන කොටසේ ඇතුළත් වන අතර ඒවායේ සාරාංශය පහත දැක්වේ.

- **2019.02.27 දිනැති ගැසට් (අතිවිශේෂ) නිවේදන අංක 2112/17:** 2019 දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම සඳහා සහ එවැනි නිකුතුන් සම්බන්ධයෙන් අනේවාසික ආයෝජකයන් හට අදාළ යම් ගෙවීමක් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට අවසර දෙන ලදී.
- **2019.02.28 දිනැති ගැසට් (අතිවිශේෂ) නිවේදන අංක 2112/25:** අදාළ රේඛීය අමාත්‍යාංශයෙහි සහ අදාළ වෙනත් ඕනෑම අධිකාරියක අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා රජයට සහ ශ්‍රී ලංකා රජය සතු ව්‍යවසායයන්ට (රජය සතුව 50% කට අධික කොටස් ප්‍රාග්ධන සහිත), ලබාගන්නා ණය මුදල්, ණය ලබා දෙන්නාගේ ආමුඛ ආයෝජන ගිණුම හරහා යොමු කිරීමකින් තොරව, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වලින්, ශ්‍රී ලංකාවට පරිබාහිරින් ණය ලබා ගැනීමට අවසර ලබා දෙන ලදී.
- **2019.10.17 දිනැති ගැසට් (අතිවිශේෂ) නිවේදන අංක 2145/49:** මූලික වශයෙන් අපනයනකරුවන්ගේ අවශ්‍යතා සලකා බැලීමෙන් අනතුරුව සහ ඔවුන්ට වෙනත් ප්‍රාදේශීය වෙළඳ හවුල්කරුවන් සමඟ වඩා තරඟකාරීව කටයුතු කිරීමට හැකිවන අයුරින්, අපනයනකරුවන් විසින් සිය භාණ්ඩ අපනයනය කිරීම මගින් ලද මුදල් ආපසු ශ්‍රී ලංකාවට රැගෙන ආ යුතු කාලසීමාව අපනයනය සිදු කළ දිනයේ සිට දින 180 ක් (දින 120 ක් ව පැවති) දක්වා දීර්ඝ කරන ලදී.

**(ආ) බලයලත් වෙළෙඳුන්හට විධාන නිකුත් කිරීම**

පෙර ගෙවීම් ක්‍රමය (මුදල් අත්තිකාරම් වශයෙන්) යටතේ යම් අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කර සිදු කරනු ලබන ගෙවීම් සඳහා විදේශ විනිමය නිදහස් කිරීම අත්හිටුවමින් 2018 ඔක්තෝබර් 10 දින නිකුත් කරන ලද 2018 අංක 1 දරන විධානය අවලංගු කිරීම දැනුම් දෙමින් බලයලත් වෙළෙඳුන් හට 2019 අංක 1 දරන විධානය නිකුත් කරන ලදී.

## 12.2 විදේශ විනිමය ගනුදෙනු සඳහා අවසර ලබා දීම

**(අ) පහත සංඛ්‍යා සටහන II-24 හි දක්වා ඇති පරිදි, විදේශ විනිමය පනත යටතේ විශේෂ අවසර ලබා දී ඇත.**

**II-24 සංඛ්‍යා සටහන**

**විදේශ විනිමය පනත යටතේ ලබාදුන් විශේෂ අවසර**

| අරමුණ | බලපත්‍ර ගණන | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන |
|---|---|---|
| ශ්‍රී ලංකා රජය විසින් ස්වෛරීත්ව ඇප කර නිකුත් කිරීම සඳහා | 1 | 175.00 |
| නේවාසික සමාගම් විසින් විදේශයන්හි අයෝජන කිරීම සඳහා | 3 | 7.87 |
| නේවාසික සමාගම් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් වෙනුවෙන් නිකුත් කරනු ලබන බැංකු/සමාගම් ඇපකර සඳහා | 6 | 13.05 |
| බලයලත් වෙළෙඳුන් විසින් විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කොට පවත්වාගෙන යෑම සඳහා | 20 | අදාළ නොවේ |
| බලයලත් වෙළෙඳුන් විසින් විදේශ විනිමය පනත යටතේ ප්‍රදානය කරන ලද පොදු අවසරයන්ගෙන් ආවරණය නොවන විවිධ විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීම සඳහා | 305 | අදාළ නොවේ |

**(ආ) මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයේ යෙදීම සඳහා පරිසීමිත වෙළෙඳුන් සඳහා බලපත්‍ර ලබා දීම සහ එම මෙහෙයුම් කටයුතු අවසන් කිරීම**

- 2019 වසර තුළදී විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සහ හුවමාරු කිරීම සඳහා බලපත්‍ර 8 ක් සහ විදේශ ව්‍යහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම සඳහා බලපත්‍ර දෙකක් ලෙස, නව බලපත්‍ර 10 ක් සීමිත සමාගම් (මුදල් මාරුකරන්නන්) වෙත නිකුත් කරන ලදී.
- මීට අමතරව, දැනටමත් එම ව්‍යාපාරයේ යෙදෙන මුදල් මාරුකරන්නන් සඳහා නව ශාඛා තුනක් විවෘත කිරීමට අනුමැතිය ප්‍රදානය කරන ලදී.
- බලපත්‍ර පරීක්ෂා කිරීමේ දී අනුමත උපමාන සාක්ෂාත් කර නොගත් මුදල් මාරුකරන්නන් 03 දෙනෙකුගේ බලපත්‍ර අලුත් නොකරන ලදී. තවද, සංචාරක හෝටල් දෙකක් 2019 වසර තුළදී මුලුමනින්ම, තම විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම පිළිබඳ මෙහෙයුම් කටයුතු අවසන් කරන ලදී.
- එක් එක් පරිසීමිත වෙළෙන්ඳා වෙත මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයේ නියැලීම සඳහා බලපත්‍ර නිකුත් කර ඇති ආකාරය පහත සංඛ්‍යා සටහන II-25 හි දක්වා ඇත.

**II-25 සංඛ්‍යා සටහන**

**2019.12.31 වන විට මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරත වීම සඳහා බලයලත් පරිසීමිත වෙළෙඳුන්**

| ආයතන කාණ්ඩය | අවසරලත් ව්‍යාපාරික කටයුතු | නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයේ පමණක්ම නියැලෙන සීමිත සමාගම් (මුදල් මාරුකරන්නන්) | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සහ හුවමාරු කිරීම | 65* |
| | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම | |
| බලපත්‍රලාභී මූල්‍ය සමාගම් | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම | 09 |
| සංචාරක හෝටල් | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම | 03 |
| එකතුව | | 77 |

* මුදල් මාරු කිරීමෙහි නියැලෙන ව්‍යාපාරික ස්ථාන/ශාඛා 76 ක් ඇතුළුව සමාගම් 65 ක් වෙත බලපත්‍ර නිකුත් කරන ලදී. එම ව්‍යාපාරික ස්ථාන 76 න්, 64 ක් වෙත විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සහ හුවමාරු කිරීමට අවසර ලබා දී ඇති අතර, ඉතිරි ව්‍යාපාරික ස්ථාන 12 ක් වෙත විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

එපරිදි, 2019 දෙසැම්බර් 31 දින වන විට, බලයලත් වෙළෙඳුන් 26 ක් සහ පරිසීමිත වෙළෙඳුන් 79 ක් (එම්.එම්.බී.එල් මනි ට්‍රාන්ස්ෆර් (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව ඇතුළුව) මෙහෙයුම් කටයුතුවල නිරත වී සිටි අතර, අනුමත විදේශ විනිමය ගනුදෙනුවල නිරතවීමට අවසරලත්, බලයලත් වෙළෙඳුන් (එනම්, බලපත්‍රලාභී වාණිජ බැංකු, අදාළ අවසරදීමේ සඳහන් කර ඇති අරමුණු සඳහා අවසරලත් බලපත්‍රලාභී විශේෂිත බැංකු) සහ පරිසීමිත වෙළෙඳුන් පිළිවෙළින් ඇමුණුම II-2 සහ ඇමුණුම II-3 හි සඳහන් වේ.

මෙයට අමතරව, 2019 දෙසැම්බර් මස තුළදී, 2020 වර්ෂය සඳහා මුදල් මාරුකරන්නන් 65 කට සහ සංචාරක හෝටල් තුනකට මුදල් මාරු කිරීමේ බලපත්‍ර ලබා දෙන ලදී. බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා ලබා දී ඇති බලපත්‍රවල වලංගු කාලය 2020 ජනවාරි 31 වන දිනෙන් අවසන් විය.

**(ඇ) සංක්‍රමණිකයන්ගේ අරමුදල් මාරු කිරීම**

ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන්ගේ විගාමික දීමනාව නිදහස් කිරීමේ අරමුණ සඳහා සහ විගමනිකයන්ට උරුම වූ මුදල් ප්‍රතිමුඛ ප්‍රේෂණය කිරීමට පහසුකම් සැලසීම සඳහා වසර තුළ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් 1,353 ක් විවෘත කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර දෙන ලදී.

## 12.3 නේවාසික ආයෝජකයන් උදෙසා නිෂ්කාශන ලිපි නිකුත් කිරීම

ගරු මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කර ඇති රෙගුලාසි වලට අනුව, ප්‍රතිමුඛ ආයෝජනයන් සිදු කිරීම සඳහා, විදේශ විනිමය පනත යටතේ සිදු කරමින් පවතින විමර්ශණයන් නොමැති බවට තහවුරු කරමින් විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් නේවාසික ආයෝජකයින් වෙත නිෂ්කාශන ලිපි 355 ක් වර්ෂය තුළදී (2018 දී ලිපි 429 ට සංසන්දනාත්මකව ) නිකුත් කරන ලදී.

## 12.4 විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණය සහ විමර්ශණය

**(අ) එතැන් පරීක්ෂණ**

පරිසීමිත වෙළෙඳුන් විසින් ඔවුන් වෙත නිකුත් කර ඇති බලපත්‍රවල දැක්වෙන නියම සහ කොන්දේසිවලට අනුකූලතාව දැක්වීම පිළිබඳව නිශ්චය කර ගැනීම සඳහා එතැන් පරීක්ෂණ 22 ක් ක්‍රියාත්මක කරන ලදී.

**(ආ) විමර්ශන**

- විදේශ විනිමය පනත යටතේ නිකුත් කර ඇති රෙගුලාසි, නියෝග සහ විධානයන්ට අනුකූලතාව නොදැක්වීම සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන්, පරිසීමිත වෙළෙඳුන් (ඉහත දැක්වූ එතැන් පරීක්ෂණයන්ට අමතරව) සහ අනෙකුත් පුද්ගලයන් උදෙසා විමර්ශන 34 ක් ක්‍රියාත්මක කරන ලදී.
- විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව විමර්ශන ක්‍රියාපටිපාටි අනුගමනය කරමින් ක්‍රියාත්මක කරන ලද විමර්ශන 28 ක් අදාළ ක්‍රියාමාර්ග අනුගමනය කරමින් වසර තුළදීම අවසන් කරන ලදී.

**(ඇ) මීට අමතරව, විශේෂ සාක්ෂි/වාචික සාක්ෂි ලබාදීම මගින් නීති බලාත්මක කිරීමේ අධිකාරීන් හට විදේශ විනිමය පනතේ ප්‍රතිපාදනයන්ට අදාළ කාර්යයන් සඳහා වන නඩු හා අධිකරණ කටයුතුවලට විදේශ විනිමය දෙපාර්තමේන්තුව සහාය දක්වන ලදී.**

## 12.5 විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණ පද්ධතියක් අරම්භ කිරීම

බලයලත් වෙළෙඳුන්ගෙන් දත්ත ග්‍රහණය කර ගැනීමේ අරමුණින් විස්තීරණ දේශ සීමා සහ විදේශ මුදල් ගනුදෙනු අධීක්ෂණ පද්ධතියක් (එනම් ජාත්‍යන්තර ගනුදෙනු වාර්තා කිරීමේ පද්ධතියක්) ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් ආරම්භ කිරීම උදෙසා 2019 වර්ෂය තුළදී කටයුතු සිදු කරන ලදී.

මෙම යෝජිත යාන්ත්‍රණයෙන් විදේශ විනිමය විකුණුම් හා මිලට ගැණුම් සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළට ගලා ඒම සහ ගලා යෑම් වලට අදාළව සියලුම දත්තයන් ග්‍රහණය කිරීම මගින් විදේශ විනිමය මෙහෙයුම් කටයුතු නිරන්තරව අධීක්ෂණය කිරීමක් අපේක්ෂා කරනු ලැබේ.

## 12.6 විදේශ විනිමය රෙගුලාසි පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු විදු පියස සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහයෝගයෙන් බලයලත් වෙළෙඳුන් වෙනුවෙන්, පවත්නා විදේශ විනිමය රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 8 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් පැවැත්වීමේ මූලික අරමුණ වූයේ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල කාර්ය මණ්ඩලයන්ට පවත්නා රෙගුලාසි සම්බන්ධ දැනුම ඉහළ නැංවීම සහ ප්‍රවීණතාවක් ලබා දීම මගින් ඔවුන්ට ඵලදායීව සහ කාර්යක්ෂමව විදේශ විනිමය මෙහෙයුම් සහ ගනුදෙනු සඳහා පහසුකම් ලබා දීමයි.

(ආ) විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන සහ පවත්නා විදේශ විනිමය රෙගුලාසි සම්බන්ධයෙන් බැංකුකරුවන්, විදේශ මුදල් මාරුකරන්නන් සහ ඒ සම්බන්ධයෙන් උනන්දුව දක්වන අනෙකුත් පාර්ශ්ව සතු දැනුම ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව සම්මන්ත්‍රණ 5 ක් පවත්වන ලදී.

(ඇ) විදේශ විනිමය පනත ක්‍රියාත්මක කිරීමත් සමග රටේ පවතින විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධයෙන් වන හිඩැස් හඳුනා ගනිමින් අන්තර් සම්බන්ධිත ප්‍රතිපත්ති ක්ෂේත්‍රයන්හි ස්ථාවර සහ එකිනෙකට බැඳුන තීරණ ගැනීමට සහාය දැක්වීමේ අරමුණින්, මේ සඳහා උනන්දුවක් දක්වන ආයතනවල (එනම් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්මේන්තුව, වාණිජ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, කොළඹ කොටස් හුවමාරුව සහ සුරැකුම්පත් සහ විනිමය කොමිසම) ප්‍රධාන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පොදු ප්‍රතිපත්ති සංසද 2 ක් පවත්වන ලදී.

(ඈ) විදේශ විනිමය රෙගුලාසි පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (www.dfe.lk) නිසි පරිදි යාවත්කාලීන කිරීම සිදු කෙරුණු අතර විද්‍යුත් තැපැල, දුරකථන ඇමතුම් සහ දෙපාර්තමේන්තුවට පැමිණීම මගින් ඉදිරිපත් කෙරුණු විමසීම්වලට පිළිතුරු ලබාදීම විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් නොකඩවා සිදු කරන ලදී.

### ඇමුණුම II-2

## 2019.12.31 දිනට බලයලත් වෙළෙඳුන්ගේ ලැයිස්තුව

| | |
|---|---|
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | |
| 1 | අමානා බැන්ක් පී.එල්.සී |
| 2 | ඇක්සිස් බැන්ක් ලිමිටඩ් * |
| 3 | ලංකා බැංකුව |
| 4 | බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ් |
| 5 | කාගිල්ස් බැන්ක් ලිමිටඩ් |
| 6 | සිටි බැන්ක් එන්.ඒ. |
| 7 | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී |
| 8 | ඩොයිෂ් බැන්ක් ඒ.ජී |
| 9 | ඩී එෆ් සී සී බැන්ක් ලිමිටඩ් |
| 10 | හබීබ් බැන්ක් ලිමිටඩ් |
| 11 | හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී |
| 12 | අයි සී අයි සී අයි බැන්ක් ලිමිටඩ් * |
| 13 | ඉන්දියන් බැන්ක් |
| 14 | ඉන්දියන් ඕවර්සීස් බැන්ක් |
| 15 | එම් සී බී බැන්ක් ලිමිටඩ් |
| 16 | නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී |
| 17 | නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී |
| 18 | පැන් ඒෂියා බැන්කින් කොපරේෂන් පී.එල්.සී |
| 19 | මහජන බැංකුව |
| 20 | පබ්ලික් බැන්ක් බර්හාඩ් |
| 21 | සම්පත් බැන්ක් පී.එල්.සී |
| 22 | සෙලාන් බැන්ක් පී.එල්.සී |
| 23 | ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැන්ක් |
| 24 | ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා |
| 25 | ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කොපරේෂන් ලිමිටඩ් |
| 26 | යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී |
| **බලපත්‍රලාභී විශේෂිත බැංකු** | |
| 27 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව |
| 28 | සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී |

* බැංකු පනතේ ප්‍රතිපාදන යටතේ, බැංකු ව්‍යාපාරය වසා දැමීමේ කටයුතු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඇක්සිස් බැන්ක් ලිමිටඩ් සහ අයි සී අයි සී අයි බැන්ක් ලිමිටඩ් හට ලබා දී ඇති බලපත්‍ර අවලංගු කිරීමට නියමිත බැවින් මෙම බැංකුවලට මහජනතාවගෙන් තැන්පතු භාර ගැනීමද ඇතුළත්ව, බැංකු ව්‍යාපාරයේ නිරත වීම සඳහා දැනට අවසර නොමැත.

### ඇමුණුම II-3

## 2019.12.31 දිනට පරිසීමිත වෙළෙඳුන්ගේ ලැයිස්තුව විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම හා හුවමාරු කිරීමට බලයලත් පරිසීමිත වෙළෙඳුන්

| | |
|---|---|
| **බලයලත් මුදල් මාරුකරන්නන්** | |
| 1 | ඒ ඕ ලක්ෂ්මි ජුවෙල්ස් (පුද්.) සමාගම |
| 2 | ආබ්දීන් මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 3 | අබිලාශ් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 4 | ආරියවංශ එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම |
| 5 | අරුණ ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 6 | ඒෂියන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 7 | බ්‍රෙෂියා ග්‍රාමීන් (පුද්.) සමාගම |
| 8 | බුලියන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 9 | කැපිටල් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 10 | කාලෝ ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම |
| 11 | සෙන්ට්‍රල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 12 | කලම්බු මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01 |
| 13 | කලම්බු මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06 |
| 14 | දැදිගම ගෲප් (පුද්.) සමාගම |
| 15 | ඩේටා එක්ස්චේන්ජ් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම |
| 16 | දයා ඕතරයිස්ඩ් මනි චේන්ජ්ර් (පුද්.) සමාගම |
| 17 | ඩෙල්ටා සරත් හෝල්ඩිංග්ස් (පුද්.) සමාගම |
| 18 | ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - ගාල්ල |
| 19 | ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - ගාලු කොටුව |
| 20 | ජෝර්ජ් මයිකල් හෝල්ඩිංග්ස් (පුද්.) සමාගම |
| 21 | ජෙක්සන් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 22 | ග්ලෝබල් ට්‍රස්ට් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 23 | ග්ලෝබල් විලේජ් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 24 | ගෝල්ඩන් මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 25 | හයිෆා ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (පුද්.) සමාගම |
| 26 | ඉන්ටර්නැෂනල් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 27 | ජයේස් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් |
| 28 | ජුවෙල් ලංකා මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 29 | ජෙයා ෆොරෙක්ස් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 30 | කමල් එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම |
| 31 | කේසර් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 32 | කුඩා මඩු මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 33 | එම් පී මනි චේන්ජර් (පුද්.) සමාගම |
| 34 | මරුති මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - යාපනය |
| 35 | මයූරි මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 36 | මිඩ්නා මිනි මාර්කට් (පුද්.) සමාගම |
| 37 | මිලානෝ මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 38 | නර්මදා ගෝල්ඩ් සෙන්ටර් (පුද්.) සමාගම - යාපනය |
| 39 | නර්මදා ගෝල්ඩ් සෙන්ටර් (පුද්.) සමාගම - කිලිනොච්චි |
| 40 | නිව් නටාෂා (පුද්.) සමාගම |
| 41 | නිව් රීගල් මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 42 | පර්ල් එක්සි (පුද්.) සමාගම |
| 43 | රෆික්ස් ජෙම්ස් (පුද්.) සමාගම |
| 44 | රිම් හා ජුවෙලරි (පුද්.) සමාගම |
| 45 | රිවිඳු එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම |
| 46 | රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01 |
| 47 | රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06 |
| 48 | රෝයල් මනි මාර්ට් (පුද්.) සමාගම - අලුත්ගම |
| 49 | රෝයල් මනි මාර්ට් (පුද්.) සමාගම - කොළඹ 01 |
| 50 | සලාකා ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් (පුද්.) සමාගම |
| 51 | ශාරංගා මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 52 | ශිෆාස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 53 | සෝනම් ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 54 | එස් එස් ඩී ඩී මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 55 | ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01 |
| 56 | ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06 |
| 57 | තමාශා ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 58 | තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම - කොළඹ 02 |
| 59 | තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම - කොළඹ 03 |
| 60 | තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම - මහනුවර |
| 61 | යුනික් ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 62 | වසන්තාස් ඉන්ටර්නැෂනල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 63 | වෙස්ටර්න් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 64 | වින්ඩ්සර් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |

**විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීමට බලයලත් පරිසීමිත වෙළෙඳුන්**

| | |
|---|---|
| බලයලත් මුදල් මාරු කරන්නන් | |
| 65 | අරුජිනා ජුවලරි (පුද්.) සමාගම |
| 66 | ක්‍රවුන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 67 | සිටි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 68 | දේවි ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 69 | මරුති මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06 |
| 70 | මර්කන්ටයිල් මර්චන්ට් බැන්ක් ලිමිටඩ් |
| 71 | මෙට්රෝ ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 72 | ප්‍රසන්න මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 01 |
| 73 | ප්‍රසන්න මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - කොළඹ 06 |
| 74 | පුෂ්පා මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 75 | රවී ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 76 | තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම - බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ |
| බලපත්‍රලාභී මූල්‍ය සමාගම් | |
| 77 | ඒසියා ඇසෙට් ෆිනෑන්ස් පී.එල්.සී |
| 78 | බිම්පුත් ෆිනෑන්ස් පී.එල්.සී |
| 79 | සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පී.එල්.සී |
| 80 | ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් ලිමිටඩ් |
| 81 | එල් ඕ එල් සී ෆිනෑන්ස් පී.එල්.සී |
| 82 | එල් බී ෆිනෑන්ස් පී.එල්.සී |
| 83 | සෙංකඩවල ෆිනෑන්ස් පී.එල්.සී |
| 84 | සිංහ පුත්‍ර ෆිනෑන්ස් පී.එල්.සී |
| 85 | සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී.එල්.සී |
| විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීමට බලයලත් පරිසීමිත වෙළෙඳුන් | |
| සංචාරක හෝටල | |
| 86 | පර්ල් සිටි හොටෙල් |
| 87 | ෂැංග්‍රිලා හොටෙල් කලම්බු |
| 88 | ෂැංග්‍රිලාස් හම්බන්තොට රිසෝට් ඇන්ඩ් ස්පා |
| අනෙකුත් ආයතන | |
| 89 | එම් එම් බී එල් මනි ට්‍රාන්සර් (පුද්.) සමාග |
| 90 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව |

# 13. මානව සම්පත්

මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේ පුද්ගලයන්ගේ හැකියාවන් සාක්ෂාත් කර ගැනීම සහ එමගින් වඩා ගුණාත්මක සේවාවක් සැපයීමට හැකි වන අයුරින් විශේෂ කුසලතා ඇති පුද්ගලයන් මහ බැංකුව වෙත ආකර්ෂණය කර ගැනීමට හා රඳවා ගැනීමට හැකි වන පරිදි මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සහ විශිෂ්ඨ පරිචයන් අනුගමනය කිරීමයි. ඉහත අරමුණුවලට අනුකූලව සිය උපායමාර්ගික අරමුණ වන පැන නගින අභියෝග මධ්‍යයේ මහ බැංකුවේ සමස්ත අරමුණු ඉටු කර ගැනීමට දායක විය හැකි ඉහළ ඵලදායිතාවයකින් යුත් අභිප්‍රේරිත සහ තෘප්තිමත් සේවක පිරිසක් මහ බැංකුව තුළ ස්ථාපිත කිරීම, සහතික කර ගැනීම සඳහා 2019 වසරේදී ද මානව සම්පත් දෙපාර්තමේන්තුව ක්‍රියාමාර්ග රැසක් අනුගමනය කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික සැලැස්ම තුළින් හඳුනාගෙන ඇති මානව සම්පත් අවශ්‍යතාවන්ට අනුකූලව සිය උපායමාර්ගික අරමුණු ළඟා කර ගැනීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව කාර්යසාධන ඇගයීම, දෙපාර්තමේන්තු අතර සේවකයන් උචිත අයුරින් ස්ථාන මාරු කිරීම, අනුප්‍රාප්තික සැලසුම් සිදු කිරීම, පන්ති සහ ශ්‍රේණි උසස්වීම් ලබා දීම, අලුතෙන් බඳවා ගන්නා ලද සේවකයන් සඳහා මනෝමිතික පරීක්ෂණ පැවැත්වීම, පවත්නා කාර්ය මණ්ඩලය සහ අලුතින් බඳවා ගන්නා ලද සේවකයන් සඳහා උපදේශන හා පුහුණු සැසි පැවැත්වීම, සේවා නියුක්තිකයන්ගේ සේවයේ යෙදීම සම්බන්ධ සමීක්ෂණ පැවැත්වීම සහ යහපත් සේව්‍ය-සේවක සබඳතා පවත්වා ගැනීමට අවශ්‍ය හිතකර පරිසරයක් ගොඩ නැගීම සඳහා කාර්මික සාමය පවත්වා ගෙන යෑම ද අඛණ්ඩව සිදු කරන ලදී.

## 13.1 මානව සම්පත් ව්‍යුහය

2019 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත සේවක සංඛ්‍යාව 1,366 ක් වූ අතර, එය මාණ්ඩලික පන්තියේ නිලධාරීන් 650 කින්, කළමනාකරණ සහකාර පන්තියේ නිලධාරීන් 561 කින් සහ කාර්යාල සහායක පන්තියේ සේවකයින් 155 කින් සමන්විත වූ අතර, එය අනුපිළිවෙළින් බැංකුවේ සමස්ත සේවක සංඛ්‍යාවෙන් සියයට 48 ක්, සියයට 41 ක් සහ සියයට 11 ක් විය. ස්ත්‍රී/පුරුෂ භාවය අනුව සැලකූ විට, මහ බැංකුවේ සමස්ත සේවක සංඛ්‍යාවෙන් 754 ක් පුරුෂ හා 612 ක් ස්ත්‍රී වූ අතර, එය පිළිවෙළින් සමස්ත සේවක සංඛ්‍යාවෙන් සියයට 55 ක් සහ සියයට 45 ක් විය. 2019 වසර අවසානය වන විට මහ බැංකුවේ සමස්ත සේවකයන්ගේ වයස්වල සාමාන්‍යය අවුරුදු 39 ක් විය.

2019 වසර අවසානය වන විට වයස අනුව සහ ස්ත්‍රී/පුරුෂ භාවය අනුව කාර්ය මණ්ඩලයේ සංයුතිය පහත රූප සටහන II-5 මගින් දක්වා ඇත.

## 13.2 ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

පහත සංඛ්‍යා සටහන II-26 හි දැක්වෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව ඉහළ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහ නිපුණතාවලින් හෙබි, විවිධ දක්ෂතා ඇති කාර්යමණ්ඩලයකින් සමන්විත වේ.

## 13.3 මානව සම්පත් කළමනාකරණය


### (අ) බඳවා ගැනීම්

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් බැංකුවට අවශ්‍ය විවිධ සේවක කාණ්ඩ බඳවා ගැනීම් සඳහා සාමාන්‍ය බඳවා ගැනීම් ක්‍රියාපටිපාටිය ද, බැංකුවට අවශ්‍ය සුවිශේෂී නිපුණතා සපුරා ගැනීම සඳහා පාර්ශ්වික බඳවා ගැනීම් ක්‍රියාපටිපාටිය ද අනුගමන කරන ලදී. ඒ අනුව, 2019 වසරේදී පාර්ශ්වික බඳවා ගැනීම් පටිපාටිය යටතේ සිවිල් හා විදුලි ක්ෂේත්‍රවල නඩත්තු හා ව්‍යාපෘති ඉංජිනේරුවරුන්, සිවිල්/විදුලි හා කාර්මික ක්ෂේත්‍රවල තාක්ෂණ නිලධාරීන්, තාක්ෂණික ශිල්පීන් (දුරකථන හා ශ්‍රව්‍ය-දෘශ්‍ය), මුදල් කෞතුකාගාරයට අභිරක්ෂකවරයෙක් සහ ප්‍රධාන පුස්තකාලයාධිපතිවරයෙක් බඳවා ගන්නා ලදී. තවද, සාමාන්‍ය බඳවා ගැනීමේ පටිපාටිය යටතේ සහකාර ආරක්ෂක


II-5 රූප සටහන

**2019.12.31 දිනට කාර්යමණ්ඩල සංයුතිය**

**(අ) සේවක පන්ති අනුව වයස් ව්‍යාප්තිය**




**(ආ) සේවක පන්ති අනුව ස්ත්‍රී/පුරුෂ භාවයෙහි ව්‍යාප්තිය**




නිලධාරීන් (පුහුණු) බඳවා ගැනීමට කටයුතු කරන ලද අතර කනිෂ්ඨ පෞද්ගලික සහකාර සහ කළමනාකරණ අභ්‍යාසලාභී යන තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම සිදු කරන ලදී.

**(ආ) කාර්යසාධන කළමනාකරණය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යසාධන කළමනාකරණ ක්‍රියාවලිය, සේවකයන්ගේ රාජකාරි ලැයිස්තු සකස් කිරීම හා සමාලෝචනය කිරීම, එක් එක් සේවකයන්ට අදාළ වන පරිදි ඉලක්ක අරමුණු පිහිටුවීම, කාර්යසාධන නිරීක්ෂණය සහ කාර්යසාධන ඇගයීම යන කොටස්වලින් සමන්විත වේ.

කාර්යසාධන ඇගයීමේ ක්‍රියාවලිය යටතේ, කාර්යසාධන ඇගයීම් පටිපාටියේ සඳහන් වන පරිදි සාමාන්‍ය නිපුණතා සහ තාක්ෂණික නිපුණතා පදනම්ව ළඟා කරගත් කාර්යසාධන ප්‍රමාණනය කර ඒ සඳහා අගයන් ලබා දෙමින් සෑම සේවකයෙකුගේම කාර්යසාධන ඇගයීම සිදු කරනු ලැබීය. සේවක උසස්වීම් පටිපාටියේ ඇති එක් සංරචකයක් ලෙස සේවකයන්ගේ අවසාන කාර්යසාධන ලකුණු යොදා ගැනේ.

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සේවකයන්ගේ කාර්යසාධන ඇගයීම් ක්‍රියාවලිය සැලසුම් කළ පරිදි වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද අතර, 2018 වසරට අදාළ කාර්යසාධන ලකුණු අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ සේවකයින් වෙත සන්නිවේදනය කරන ලදී. තවද, මධ්‍ය වාර්ෂික කාර්යසාධන සමාලෝචන ක්‍රියාවලිය ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද අතර, එම ක්‍රියාවලිය මගින් වසරේ මුල් භාගය තුළදී සේවකයන්ගේ කාර්යසාධන මට්ටම පිළිබඳව අදාළ සියලු පාර්ශ්වයන්හට අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව සැලසිණි.

**(ඇ) උසස්වීම්**

2019 වසරේදී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් අදාළ උසස්වීම් පටිපාටිවලට අනුකූලව සේවකයන්ගේ වෘත්තීය අභිවෘද්ධිය තහවුරු කරමින් සේවක උසස්වීම් ලබා දුන් අතර, මේ යටතේ සේවකයන් 103 දෙනෙකුට අදාළ පන්ති හා ශ්‍රේණි

II-26 සංඛ්‍යා සටහන

**2019.12.31 දිනට ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ගේ අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සාමාජිකත්වයන්**

| සේවක පන්ති | අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සාමාජිකත්ව දරන්නන් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආචාර්ය උපාධි | පශ්චාත් උපාධි, ප්‍රථම උපාධි හා වෘත්තීය සාමාජිකත්ව | පශ්චාත් උපාධි හා ප්‍රථම උපාධි | ප්‍රථම උපාධි හා වෘත්තීය සාමාජිකත්ව | පශ්චාත් උපාධි හා වෘත්තීය සාමාජිකත්ව | පශ්චාත් උපාධි | ප්‍රථම උපාධි | වෘත්තීය සාමාජිකත්ව | එකතුව |
| මාණ්ඩලික පන්තිය | 20 | 125 | 158 | 69 | 29 | 2 | 143 | 15 | 561 |
| කළමනාකරණ සහකාර පන්තිය | - | 12 | 27 | 16 | 17 | 23 | 66 | 37 | 198 |
| කාර්යාල සහායක පන්තිය | - | - | - | - | - | - | 7 | - | 7 |
| **එකතුව** | **20** | **137** | **185** | **85** | **46** | **25** | **216** | **52** | **766** |

උසස්වීම් ලබා දෙනු ලැබිණි. මේ අනුව දෙපාර්තමේන්තු ප්‍රධානීන් දෙදෙනෙකුට සහකාර අධිපතිවරුන් ලෙස ද, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සිව් දෙනෙකුට ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස ද උසස්වීම් ලැබිණි. තව ද, නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් හත් දෙනෙකුට අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස උසස්වීම් ලැබුණු අතර, නිලධාරීන් 82 දෙනෙකුට ශ්‍රේණි උසස්වීම් ද, නිලධාරීන් අට දෙනෙකුට කළමනාකරණ සහකාර පන්තියේ සිට මාණ්ඩලික පන්තිය දක්වා උසස්වීම් ද ලබා දෙන ලදී.

**(ඇ) දෙපාර්තමේන්තු අතර සේවක ස්ථාන මාරු කිරීම්**

බැංකුවේ විවිධ ක්ෂේත්‍රයන්හි අත්දැකීම් ලබා ගැනීමට සියලු සේවකයන්ට අවස්ථාව සලසා දීමේ අරමුණින් යුතුව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ස්ථාන මාරු කිරීමේ ප්‍රතිපත්තිය යටතේ මාණ්ඩලික නිලධාරීන් 15 දෙනෙකු, කළමනාකරණ සහකාර නිලධාරීන් 54 දෙනෙකු සහ බැංකු කාර්යාල සහායකයින් 19 දෙනෙකු 2019 ජනවාරි මස 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරු කිරීමට කටයුතු කරන ලදී.

**(ඉ) කාර්මික සාමය**

පහසුකම් සලසා දෙන්නෙකු වශයෙන් මානව සම්පත් දෙපාර්තමේන්තුව වෘත්තීය සමිති සහ කළමනාකාරිත්වය අතර සමීප සම්බන්ධතාවයක් පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2019 වසර තුළදී, කළමනාකාරිත්වය සහ වෘත්තීය සමිති අතර රැස්වීම් අටක් පවත්වන ලද අතර, එමගින් සේවක ප්‍රතිලාභ, උසස්වීම්, පුහුණු වීම්, සුභ සාධනය, නව බඳවා ගැනීම් සහ සාමාන්‍ය පරිපාලනය යනාදිය සම්බන්ධයෙන් පැවති ඇතැම් ගැටලු විසඳා ගැනීමට අවස්ථාව ලැබිණි.

## 13.4 2019 වසර තුළ අධිපතිතුමා සහභාගී වූ විදේශයන්හි පැවති රැස්වීම්

(අ) ජනවාරි 14 හා 15 දින වොෂින්ටන්හි දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය නිලධාරීන් සමඟ පැවති රැස්වීම් සඳහා සහභාගී වීම.

(ආ) අප්‍රේල් 09 සිට 19 දින දක්වා වොෂින්ටන්හි දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකුවේ 2019 වාර්ෂික වසන්ත සෘතු රැස්වීම සහ නිව්යෝක්, බොස්ටන් හා ලොස් ඇන්ජලීස්හි දී පැවති ආයෝජක රැස්වීම් සඳහා සහභාගී වීම.

(ඇ) මැයි 09 හා 10 දින ලන්ඩන්හි දී පැවති ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ලැයිස්තුගත කිරීම නිල වශයෙන් විවෘත කිරීම සඳහා සහභාගී වීම.

(ඈ) මැයි 21 දින සිංගප්පූරුවේ දී පැවති "Invest Sri Lanka" ආයෝජක සමුළුව සඳහා සහභාගී වීම.

(ඉ) ජූලි 21 සිට 25 දින දක්වා ජපානයේ ටෝකියෝහි දී පැවති ආයෝජක රැස්වීම් සඳහා සහභාගී වීම.

(ඊ) ඔක්තෝබර් 17 සිට 21 දින දක්වා වොෂින්ටන්හි දී පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුවේ වාර්ෂික රැස්වීම් සඳහා සහභාගී වීම.

(උ) නොවැම්බර් 13 හා 14 දින සිංගප්පූරුවේ දී පැවති 55 වන අග්නිදිග ආසියානු මහ බැංකු සංගමයේ (SEACEN) අධිපතිවරුන්ගේ සම්මේලනය/ඉහළ මට්ටමේ සම්මන්ත්‍රණය සහ 39 වන අග්නිදිග ආසියානු මහ බැංකු සංගමයේ අධිපතිවරුන්ගේ මණ්ඩල රැස්වීම සඳහා සහභාගී වීම.

(ඌ) නොවැම්බර් 24 හා 25 දින සිංගප්පූරුවේ දී පැවති "Sri Lanka Corporate Access Days" යන අවස්ථාව සඳහා සහභාගී වීම.

## 13.5 උසස් කිරීම්/පත් කිරීම්

(අ) මාණ්ඩලික පන්තියේ විශේෂ ශ්‍රේණිය සඳහා උසස් කිරීම් හා පත් කිරීම් පහත පරිදි සිදු කරන ලදී.

(i) ඒ.ඒ.එම්. තාසීම් මහතා සහ සී.එන්. විජයසේකර මහතා සහකාර අධිපතිවරුන් ලෙස 2019 දෙසැම්බර් 19 දින සිට පත් කරන ලදී.

(ii) කේ. දසනායක මහත්මිය, ඒ.එම්.එන්. ගුණවර්ධන මහතා, ඩී.එම්. රූපසිංහ මහතා සහ ඒ.ආර්.කේ. විජේසේකර මහතා ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස 2019 දෙසැම්බර් 19 දින සිට පත් කරන ලදී.

(ආ) පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආර්.එම්. ජයවර්ධන මහතා 2019 ජනවාරි 04 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ඇ) ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරි ඒ.ජී.යූ. තිලකරත්න මහතා 2019 ජනවාරි 11 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධිකාරි ලෙස ද පසුව, 2019 මාර්තු 01 දින සිට සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධිකාරි ලෙස ද පත් කරන ලදී.

(ඈ) මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කේ.එම්. අබේකෝන් මහතා 2019 මාර්තු 01 දින සිට බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ඉ) අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරි කේ.එන්.එන්.එම්. බණ්ඩාර මහත්මිය 2019 මාර්තු 01 දින සිට මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ඊ) බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ අධ්‍යක්ෂ එච්.පී.ටී. විජේසූරිය මහත්මිය 2019 මාර්තු 01 දින සිට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරි ලෙස පත් කරන ලදී.

(උ) රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරි ආර්.ඩී.ටී. ගුණසේකර මහත්මිය 2019 මාර්තු 01 දින සිට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ

දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස ද පසුව, 2019 මාර්තු 11 දින සිට සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස ද ඉන් අනතුරුව 2019 ජූලි 22 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

(ඌ) සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරි එස්.සී. ගුණධීර මෙනෙවිය 2019 මාර්තු 01 දින සිට ලේකම් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක ලේකම් ලෙස ද පසුව, 2019 මාර්තු 11 දින සිට සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරි ලෙස ද පත් කරන ලදී.

(එ) නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ඩබ්ලිව්.ආර්.එම්.කේ. ප්‍රනාන්දු මහතා 2019 ජූලි 01 දින සිට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ඒ) සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඩබ්ලිව්.ඒ. දිල්රුක්ෂිණී මහත්මිය 2019 ජූලි 01 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ඔ) බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ අතිරේක අධ්‍යක්ෂ ඩී.එම්.ඩී.බී. දිසානායක මහතා 2019 ජූලි 01 දින සිට නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස ද පසුව, 2019 ජූලි 29 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

(ඕ) ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එම්.එස්.කේ. ධර්මවර්ධන මහතා 2019 ජූලි 09 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ක) නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ බී.එල්.ජේ.එස්. බාලසූරිය මහතා 2019 ජූලි 29 දින සිට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ග) ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය සී. අමරසේකර මහතා 2019 ඔක්තෝබර් 31 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ච) ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ සී.පී.එස්. බණ්ඩාර මහතා 2019 නොවැම්බර් 10 දින සිට ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ජ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජේ.පී. ගමලත් මහතා 2019 නොවැම්බර් 20 දින සිට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස ද පසුව, 2019 දෙසැම්බර් 20 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

(ට) ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඩී.එස්.ඩබ්ලිව්. සමරතුංග මහත්මිය 2019 දෙසැම්බර් 19 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

(ඩ) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වී.ඒ.ඒ.එන් ද සිල්වා මහත්මිය 2019 දෙසැම්බර් 20 දින සිට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

### 13.6 මුදා හරිනු ලැබ සිටි නිලධාරීන්

(අ) නියෝජ්‍ය අධිපති, එස්.ආර්. ආටිගල මහතා ලේකම් ලෙස මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය වෙත

(ආ) මාණ්ඩලික පන්තියේ IV ශ්‍රේණියේ, ආචාර්ය වයි.එම්. ඉන්ද්‍රරත්න මහත්මිය, විකල්ප විධායක අධ්‍යක්ෂ ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත

(ඇ) මාණ්ඩලික පන්තියේ II ශ්‍රේණියේ, එස්. රත්නායක මහත්මිය පරිපාලන සහකාර ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත

(ඈ) මාණ්ඩලික පන්තියේ II ශ්‍රේණියේ, එස්. අමිතා මෙනෙවිය, අර්ථ ශාස්ත්‍රඥවරියක ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකා නේවාසික නියෝජිත කාර්යාලය වෙත

### 13.7 විශ්‍රාම ගැනීම්/සේවයෙන් ඉල්ලා අස්වීම

2019 වසර තුළදී, සේවකයන් 63 දෙනෙකු බැංකු සේවාවෙන් විශ්‍රාම ගත් අතර, ඒ අතර එක් නියෝජ්‍ය අධිපතිවරයෙක්, එක් ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් නව දෙනෙකු විය. තව ද, සේවකයන් නව දෙනෙකු බැංකු සේවාවෙන් ඉල්ලා අස් විය.

**II-27 සංඛ්‍යා සටහන**

**2019 වසරේ දී මහ බැංකු කාර්ය මණ්ඩලයේ විශ්‍රාම ගැනීම්/සේවයෙන් ඉල්ලා අස්වීම් පිළිබඳ සාරාංශය**

| සේවක පන්තිය | විශ්‍රාම ගැනීම් | සේවයෙන් ඉල්ලා අස්වීම් | එකතුව |
|---|---|---|---|
| මාණ්ඩලික පන්තිය | 48 | 5 | 53 |
| කළමනාකරණ සහකාර පන්තිය | 15 | 3 | 18 |
| කාර්යාල සහායක පන්තිය | - | 1 | 1 |
| එකතුව | 63 | 9 | 72 |

## 14. තොරතුරු තාක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උසස් ප්‍රමිතියෙන් යුතු ඒකාබද්ධ මෘදුකාංග සපයමින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව එහි ක්‍රියාකාරී කාර්යභාරය අඛණ්ඩව සිදු කරන ලදී.

2019 වසර තුළ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන අංශ පහක් යටතේ සිය දායකත්වය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දෙන ලදී.

(අ) පිරිවැය-ඵලදායී ව්‍යාපාර විසඳුම් ඉදිරිපත් කිරීම

(ආ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම

(ඇ) ජාතික ගෙවීම් පද්ධතියේ යටිතල පහසුකම් වර්ධනය සඳහා දායකත්වය ලබා දීම

(ඈ) තොරතුරු තාක්ෂණ ආරක්ෂාව හා ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම

(ඉ) කාර්ය මණ්ඩලය අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා සංවර්ධනය

**(අ) පිරිවැය-ඵලදායී ව්‍යාපාර විසඳුම් ඉදිරිපත් කිරීම**

කළමනාකාර අභ්‍යාසලාභීන් (Management Trainee) බඳවා ගැනීමේ පද්ධතිය, නව බඳවා ගැනීමේ ක්‍රියාවලිය සපුරා ගැනීම සඳහා නවීකරණය කරන ලද අතර එමගින් මානව සම්පත් දෙපාර්තමේන්තුවේ මිනිස් පැය 1000 ක ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට හැකි විය. මෙම පද්ධතිය, මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කිරීම සහ තත්‍ය කාලීන වලංගු කිරීම් සඳහා පහසුකම් සපයන අතර එමගින් අයදුම්කරුවන් අතින් වන දෝෂ අවම කරන ලදී. තවද, අයදුම්පත් තැන්පත් කිරීම සඳහා වැය වන අවකාශය හා පිරිවැය ඉතිරි කොට කෙටි කාලයක් තුළ මානව සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට දායකත්වය සැපයීය.

රජයේ සුරැකුම්පත් පියවනය සහ මධ්‍යම සුරැකුම්පත් තැන්පතුව ලෙස ක්‍රියාත්මක වන ලංකා සෙක්‍යු (Lanka Secure) පද්ධතිය මගින් ආයෝජකයින්ට තමන්ගේ සුරැකුම්පත් ගිණුම්වල තත්‍ය කාලීන වෙනස්කම් දැනුම් දීම සඳහා ඊ-මේල් සහ කෙටි පණිවුඩ සේවාවන් ස්ථාපනය කරන ලදී. මෙම ක්‍රියාදාමය මගින් ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නංවා වැඩි ආයෝජකයින් පිරිසක් සුරැකුම්පත් වෙළඳපොළට ආකර්ෂණය කර ගැනීමට ඉවහල් විය. එසේම, රජයේ සුරැකුම්පත් සඳහා වන භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි පද්ධතියේ (PDOffice), දෙවන අදියර වන ස්වේච්ඡා ලංසු තැබීමේ අදියර දැනුම් දීම සඳහා ඊ-මේල් සහ කෙටි පණිවුඩ සේවාවන් හඳුන්වා දී වෙන්දේසි සඳහා සහභාගි වන ප්‍රාථමික වෙළඳුන්ට වඩා හොඳ විනිවිදභාවයක් ලබා දෙන ලදී.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය (SLDILSS) යටතේ තැන්පත්කරුවන්ට වන්දි ලබා දීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම හා වේගවත් කිරීම සඳහා, තැන්පත්කරුවන්ට වන්දි ගෙවීමේ පද්ධතිය (Compensation Payment System), බැංකුවේ භාවිතා වන ගිණුම්කරණ පද්ධතිය සමඟ ඒකාබද්ධ කර නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව (Resolution and Enforcement Department) සඳහා ස්ථාපනය කරන ලදී.

දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ පද්ධතියේ (CWDCS) දත්ත සංස්කරණය සහ පරිශීලකයින් විසින් දත්ත වාර්තාකරණය සඳහා මනා පහසුකම් සහිත වෙබ් අතුරු මුහුණතක් එකතු කර වැඩිදියුණු කරන ලදී. තවද, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින්, සම්ප්‍රේෂණ ප්‍රමාදයන් රහිතව තත්‍ය කාලීන දත්ත උඩුගත කිරීම (upload) සඳහා පහසුකම් සහිතව එම පද්ධතිය තවදුරටත් ඉහළ නංවන ලදී.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරනු ලබන දත්ත පුස්තකාලය (Data Library), රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ද්විතීයික වෙළඳපොළ මිල ගණන් ඇතුළත් කිරීම මගින් වැඩිදියුණු කරන ලද අතර එමගින් පුළුල් පරාසයක ජාතික දත්ත සඳහා සාමාන්‍ය ජනතාවට ප්‍රවේශය ලබා දෙන ලදී.

බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන විසින් වාර්තා කරනු ලබන තොරතුරු අධීක්ෂණය කිරීම සඳහා දෙපාර්තමේන්තු කිහිපයක් විසින් භාවිතා කරන ලද මධ්‍යම දත්ත පද්ධතිය (FinNet) සඳහා දත්ත විශ්ලේෂණ මෙවලමක් හඳුන්වාදීමෙන් පරිශීලකයින්ට තමන් විසින්ම වාර්තා උත්පාදනය කිරීමට පහසුකම් සපයන ලදී. තවද, දෙපාර්තමේන්තු විශේෂිත දත්ත සමඟ දත්ත විශ්ලේෂණ මෙවලම භාවිතා කිරීම සඳහා පරිශීලකයින්ට මඟ පෙන්වීම සහ වැඩිදුර පුහුණුව ලබා දෙන ලදී.

මුදල් මණ්ඩල තීරණ සමාලෝචනය විධිමත් කිරීම සඳහා මුදල් මණ්ඩල ලේකම් දෙපාර්තමේන්තුව සඳහා කාර්ය අධීක්ෂණ පද්ධතියක් (Task Tracker System) හඳුන්වා දෙන ලදී.

වාර්තාකරණ ක්‍රියාවලියට දිනය පුරා කළ හැකි පරිදි පහසුකම් සපයමින් විදේශ මුදල් විකුණුම් හා මිලදී ගැනීමේ අධීක්ෂණ මොඩියුලය නවීකරණය කිරීමත් සමඟ විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරන ForexNet පද්ධතිය තවදුරටත් වැඩිදියුණු විය. එපමණක් නොව, භාවිතා කරන ලද විදේශ මුදල් සහ නිකුත් කරන ලද ණයපත් (credit cards) සහ ඩෙබිට් කාඩ්පත්වල වර්ගීකරණය ඇතුලත් කිරීම සඳහා විද්‍යුත් අරමුදල් හුවමාරු කාඩ්පත් අධීක්ෂණ පද්ධතිය (Electronic Fund Transfer Cards Monitoring System) නවීකරණය කරන ලදී.

දේශීය මුදල් වෙළඳපොළ තුළ ව්‍යුහාත්මක ද්‍රවශීලතාවයට පිළියම් යෙදීමට දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉඩ සලසන බැඳුම්කර මිලදී ගැනීම් සඳහා ඉඩ පහසුකම් සැලසීම සඳහා විවෘත වෙළඳපොළ කටයුතු (OMO) සුරැකුම්පත් වෙන් කිරීමේ පද්ධතිය වැඩිදියුණු කරන ලදී.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ 4P (Public - Private - Producer - Partnerships) ණය යෝජනා ක්‍රමයට අනුකූල වන පරිදි ප්‍රාදේශීය සංවර්ධන ණය කළමනාකරණ පද්ධතියේ මූලික ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කරන ලදී.

බලපත්‍රලාභී වාණිජ බැංකුවල හදිසි මුදල් ආපසු ගැනීමේ අවශ්‍යතා සපුරාලීම සඳහා භාවිතා කරන මුදල් කළමනාකරණ පද්ධතියේ (Currency Management System) ඉලෙක්ට්‍රොනික දත්ත හුවමාරු අතුරු මුහුණත ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් පනවා ඇති නව රෙගුලාසිවලට අනුකූල වන පරිදි වැඩිදියුණු කරන ලදී.

බැංකුවේ අවදානම් අවම කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම හා විධිමත් කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් භාවිතයන්ට අනුකූලව අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සඳහා අවදානම් වාර්තාකරණ පද්ධතියක් ස්ථාපනය කරන ලදී.

මූල්‍ය වර්ෂය අවසානයේදී නව ගෙවීම් බදු ක්‍රමය එහි අභ්‍යන්තර පද්ධති සමඟ සාර්ථකව ඒකාබද්ධ කිරීමට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව සමත් වූ අතර එමගින් සේවක බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට කාලෝචිත ලෙස ඉදිරිපත් කිරීමට මූල්‍ය දෙපාර්තමේන්තුවට සහාය විය.

නව ලේඛන කළමනාකරණ පද්ධතිය (Document Management System) හඳුන්වාදීමත් සමඟ ලිපි ලේඛන 300,000 කට අධික ප්‍රමාණයක් පරිලෝකනය කර පහසුවෙන් පරිශීලනය කළ හැකි පරිදි සකසා, භෞතික ලේඛන සමඟ කටයුතු කිරීමේ දී ඇති වූ අභියෝග ඉවත් කරන ලදී.

**(ආ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩි දියුණු කිරීම**

නව දියුණු තාක්ෂණය සමඟ තොරතුරු තාක්ෂණ පද්ධතිවල ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කරමින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පසුගිය වර්ෂය තුළදී තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

බැංකු, ප්‍රාථමික අලෙවිකරුවන් ඇතුළු සම්බන්ධිත ආයතන විසින් උපායමාර්ගික ලෙස වැදගත් තොරතුරු පද්ධති වෙත ප්‍රවේශ වීමට භාවිතා කරන CBSLNet අතථ්‍ය පෞද්ගලික ජාලය (Virtual Private Network - VPN), විදුලි සංදේශ සේවා සපයන්නන් දෙදෙනෙකු හරහා ද්විත්ව සම්බන්ධතාවයක් ඇති කරමින් වැඩිදියුණු කරන ලදී. තවද, මෙම VPN ජාලයේ ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා, සම්බන්ධිත අන්ත අතර ගුප්ත කේතනය (encryption) බලාත්මක කරන ලදී.

වර්ෂය තුළදී, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැනට පවත්නා ප්‍රධාන කාර්යාලයේ දත්ත මධ්‍යස්ථානය නවීන TIA 942 වර්ගීකරණ 3 අනුකූලතා මට්ටමට නවීකරණය කිරීම ආරම්භ කරන ලදී. එම ප්‍රමිතීන්ට අනුව, දත්ත මධ්‍යස්ථානයක යටිතල පහසුකම්වල ඔරොත්තු දීමේ හැකියාව අනුව ශ්‍රේණිගත කිරීම් හතරකට දත්ත මධ්‍යස්ථානයක් වර්ග කළ හැකිය. මෙම වර්ගීකරණය එහි යටිතල පහසුකම් ව්‍යුහයේ අංශ හතරක් යටතේ ලබා දී ඇත. ඒවා නම් විදුලි සංදේශ (Telecommunications), විදුලි (Electrical), වාස්තු විද්‍යාත්මක (Architectural) සහ යාන්ත්‍රික (Mechanical) යන අංශයන්ය. නව දත්ත මධ්‍යස්ථානයෙහි ඉහත සියලුම අංශයන්හි 99.982% ක සුලබතාවක් (availability) ලබා ගත හැක.

ආරක්ෂක සිදුවීම් කළමනාකරණ (Security Incident and Event Management) විශ්ලේෂකයක් ක්‍රියාත්මක කිරීමට සහ ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් (SOC) පිහිටුවීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් කිරීමට වැඩිදුර පියවර ගන්නා ලදී.

**(ඇ) ජාතික ගෙවීම් පද්ධතියේ යටිතල පහසුකම් වර්ධනය සඳහා දායකත්වය ලබා දීම**

ජාතික වශයෙන් වැදගත්කමක් ඇති ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන උපදේශනය සහ තාක්ෂණ දැනුම තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සපයන ලදී. ඒ අනුව, පසුගිය වසර තුළ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් ජාතික ව්‍යාපෘති කිහිපයක් සඳහා සිය තාක්ෂණ දැනුම සපයන ලදී.

මධ්‍යම ප්‍රතිපාර්ශව පද්ධතිය සම්බන්ධ ඊ-වෙළඳ වේදිකාව (e-Trading Platform) ස්ථාපිත කිරීම මූල්‍ය වෙළඳපොළ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා ගෙන එන වැදගත් ජාතික ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය උපදේශකයෙකු තෝරා ගැනීම සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් සේවය කරන ලදී.

තත් කාලීන දළ පියවුම් පද්ධතිය (RTGS) නවීකරණය කිරීම සඳහා උපදේශකයෙකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටු (PC) සහ තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) හරහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සුදුසු තාක්ෂණික සහාය ලබා දුන් අතර අදාළ උපදේශකවරයා තෝරා ගැනීම සම්පූර්ණ කරන ලදී. තවද, ජාතික ඉතිරිකිරීමේ බැංකුව RTGS පද්ධතියේ සහභාගිවන්නෙකු ලෙස සැලකීමට ඔවුන්ගේ තාක්ෂණික සූදානම තක්සේරු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් එම බැංකුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විධිවිධාන ඇගයීමට ලක් කරන ලදී.

ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා එක්සත් ජාතීන්ගේ (United Nations) ගෝලීය මුල පිරීමක් වන goAML පද්ධතිය මිලදී ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට මූල්‍ය බුද්ධි ඒකකය (FIU) සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව තාක්ෂණික සහාය ලබා දුන්නේය.

ඊට අමතරව ජාතික ගෙවීම් කවුන්සිලය (NPC), විසින් පත් කරන ලද Fintech Developments පිළිබඳ කමිටුවට සහ Blockchain තාක්ෂණය පිළිබඳ කමිටුවට තොරතුරු තාක්ෂණ නිලධාරීන් දායක විය.

**(ඈ) තොරතුරු තාක්ෂණ ආරක්ෂාව හා ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම**

තොරතුරුවල සුරක්ෂිතභාවය වැඩිදියුණු කොට බැංකුවේ තොරතුරු තාක්ෂණ පද්ධති සයිබර් තර්ජනයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විවිධ ක්‍රියාමාර්ගයන් ගන්නා ලදී. ඒ අනුව, ආරක්ෂක පිළිවෙතක් ලෙස, උපායමාර්ගික ලෙස වැදගත් තොරතුරු පද්ධතිවල අවදානම් තත්වයන් හඳුනා ගැනීම සඳහා අඛණ්ඩ අවදානම ඇගයීම් (vulnerability assessments) සිදු කරන ලද අතර සයිබර් ප්‍රහාරයන්ට නිරාවරණය වීම අවම කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂණ ක්‍රමවේද යොදන ලදී.

එපමණක් නොව, ඇති විය හැකි ඕනෑම තර්ජනයකින් බැංකුවේ දත්ත ජාලය තවදුරටත් ආරක්ෂා කිරීම සඳහා නව සහ වැඩිදියුණු කළ ගිනි පවුරු (firewall) හඳුන්වා දෙන ලදී.

**(ඉ) කාර්ය මණ්ඩලය අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා සංවර්ධනය**

බැංකුවේ සියලු සේවකයන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ඊ මේල් හා අභ්‍යන්තර වෙබ් අඩවිය මගින් දැනුවත් කිරීම් සහ අනතුරු ඇඟවීම් ප්‍රකාශයට පත් කරන ලදී.

තවද, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීම පිණිස, එම නිලධාරීන්ට කෙටි කාලීන දේශීය හා විදේශීය පුහුණු අවස්ථා ලබා දෙන ලදී.

## 15. අභ්‍යන්තර විගණන

ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කටයුතු 1951 වසරේ සිට ක්‍රියාත්මක වේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ කාර්ය මණ්ඩලයේ මෙහෙවර, කාර්ය වපසරිය, අධිකාරී බලය, වගකීම, වගවීම සහ ස්වාධීනත්වය මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර විගණන අධිකාරි පත්‍රයේ අන්තර්ගතව ඇත. විගණන කටයුතු ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරයි. 2019 වසර තුළදී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කාර්යයන් හි සාරාංශයක් පහත දැක්වේ.

### 15.1 අභ්‍යන්තර විගණන සැලසුම

2020 - 2022 සඳහා වන උපායමාර්ගික විගණන සැලසුම සහ 2020 වසර සඳහා සකසන ලද අභ්‍යන්තර විගණන සැලසුම මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව විසින් සමාලෝචනය කර මුදල් මණ්ඩලයෙන් අනුමත කර ඇත.

### 15.2 විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීම

**(අ) ක්‍රියාවලි සහ තොරතුරු පද්ධති විගණනයන්**

අභ්‍යන්තර විගණන සැලසුමට අනුව 2019 වසරේ දී, ක්‍රියාවලි සහ තොරතුරු පද්ධති විගණනයන් සිදු කරන ලදී. සෑම විගණනයක්ම සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සන්නිවේදනය කිරීම සහ නිරාකරණයන්ට අදාළ කටයුතු කිරීම යන පියවර හතරකින් ක්‍රියාත්මක කරන ලදී. විගණන ප්‍රතිඵල සන්නිවේදනය කිරීමේදී විගණන නිරීක්ෂණ තහවුරු කර ගැනීම සඳහා නිම කිරීම් රැස්වීම් පැවැත්වීම, විගණන කෙටුම්පත් වාර්තා නිකුත් කිරීම සහ අවසන් විගණන වාර්තා නිකුත් කිරීම යන පියවර තුනකින් යුතු ක්‍රියාවලිය අනුගමනය කරන ලදී. ක්‍රියාවලි හිමිකරුවන් විසින් විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගැනීම සඳහා පසු විපරම් විගණනයන් ද කාර්තු පදනමින් වසර තුළදී සිදු කරන ලදී.

**(ආ) විශේෂ පැවරුම්**

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදල්, රාජ්‍ය ණය, බැංකු අධීක්ෂණ සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවල ලිපි ලේඛණ සුරක්ෂිත කිරීම සඳහා වූ මුදල් මණ්ඩල උපදෙස් ක්‍රියාත්මක කිරීම වසර තුළදී සිදු කරන ලදී.

**(ඇ) විගණන කටයුතුවල ප්‍රගතිය වාර්තා කිරීම**

විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මුදල් මණ්ඩලයට සහ මුදල් මණ්ඩල උපදේශණ විගණන කමිටුවට කාර්තුමය වශයෙන් වාර්තා කරන ලදී. එමෙන්ම කරන ලද විගණනයන් පිළිබඳව විගණකාධිපතිට වාර්තා කරන ලදී.

### 15.3 දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු කිරීම්

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් විගණන සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා 'අභ්‍යන්තර විගණන පහසුකම් සැපයීමේ මාර්ගෝපදේශ' පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී. තවද, මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි උපාධි අපේක්ෂකයන් සඳහා අභ්‍යන්තර විගණනය සහ ඊට අදාළ විෂයයන් පිළිබඳව පුහුණු කිරීම් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් වසර තුළදී අඛණ්ඩව සලසන ලදී.

### 15.4 මුදල් මණ්ඩල උපදේශණ විගණන කමිටුව සඳහා පහසුකම් සැලසීම

මුදල් මණ්ඩල උපදේශණ විගණන කමිටුව මුදල් මණ්ඩලය විසින් පත් කරන ලද අනු කමිටුවක් වන අතර මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන, අභ්‍යන්තර විගණන, බාහිර විගණන සහ මුදල් මණ්ඩලය විසින් පැවරූ වෙනත් කරුණු මත මුදල් මණ්ඩලයට උපදෙස් දීම එමගින් සිදු කරයි. මුදල් මණ්ඩලයේ ලේකම් මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේද ලේකම් ලෙස කටයුතු කරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුමේ සහකාර ලේකම් ලෙස කටයුතු කරයි. ඒ අනුව, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ රැස්වීම් දහයකට (10) ලේකම් කටයුතු සඳහා පහසුකම් සැලසීම ද වසර තුළදී සිදු කරන ලදී.

## 16. ජාත්‍යන්තර මෙහෙයුම්

මුදල් නීති පනතට අනුව ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමනාකරණය කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පවතී. මේ යටතේ, විදේශ සංචිත කළමනාකරණය කිරීමේ කාර්යය සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි කටයුතු අධීක්ෂණය තුළින් එහි සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීමේ කාර්යය ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

විදේශ සංචිතයන්හි සංයුතිය සහ එය පවත්වා ගෙන යෑම, රුපියලෙහි ජාත්‍යන්තර ස්ථාවරභාවය ආරක්ෂා කර ගැනීමට සඳහා ගන්නා ක්‍රියාමාර්ග, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය මෙහෙයුම් කාර්යයන්හි විෂය පථය සහ විදේශ සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම්වලට අදාළව මුදල් මණ්ඩලයට පැවරී ඇති බලතල සහ වගකීම් යනාදිය ආවරණය කරන විදේශ සංචිත කළමනාකරණය සඳහා අවශ්‍ය නෛතික රාමුව මුදල් නීති පනත මගින් දක්වා ඇත. මේ අනුව වත්කම් වර්ග, ප්‍රතිපාර්ශ්ව ආයතන, මූල්‍ය උපකරණ සහ නිකුත් කරන්නන්ට අදාළව පවත්නා ප්‍රමිතීන් මුදල් නීති පනතේ 67 වගන්තිය මගින් දැක්වේ. මෙයට අමතරව මුදල් මණ්ඩලය, සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම්හි විෂය පථය තවදුරටත් පුළුල් කරමින් ඊට අදාළ ආරක්ෂාව, ද්‍රවශීලතාව හා ප්‍රතිලාභ යන අරමුණු වැඩිදියුණු කිරීම සඳහා යොමු වීමට ඉඩකඩ පවතී.

## 16.1 විදේශ සංචිත කළමනාකරණය

ශ්‍රී ලංකාවේ විදේශ සංචිත ආයෝජනය කරනු ලබන්නේ මුදල් මණ්ඩලය මගින් සංශෝධිත සහ අනුමත කරන ලද, විදේශ සංචිත කළමනාකරණ මාර්ගෝපදේශ (Foreign Reserve Management Guideline) සහ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයට (Investment Policy Statement) අනුකූල වන පරිදිය. මෙම ආයෝජන, විදේශ සංචිතවල ආරක්ෂාව, ද්‍රවශීලතාවය සහ ප්‍රතිලාභ යන අරමුණු මූලික වශයෙන්ම සැලකිල්ලට ගෙන සිදු කරනු ලබන අතර, ඒවා විදේශ සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුව (International Reserves Investment Oversight Committee - IRIOC) මගින් අධීක්ෂණයට ලක් කෙරේ. මෙම විදේශ සංචිත ප්‍රධාන මුදල් වර්ග කිහිපයකින් සංයුක්ත වන අතර, ඒවා ප්‍රධාන වශයෙන් ස්ථාවර ආදායම් සුරැකුම් (Fixed Income Securities), මුදල් වෙළඳපොළ උපකරණ (Money Market Investments) සහ රත්‍රංවල ආයෝජනය කර ඇත. ස්ථාවර ආදායම් සුරැකුම් කළඹ ඉතා ඉහළ ශ්‍රේණිගත කිරීමක් සහිත රාජ්‍ය සුරැකුම්පත්, රාජ්‍ය වගකීම් සහිත සුරැකුම්පත්, රාජ්‍ය නියෝජිත ආයතන සහ අධිජාතික (Supra National) ආයතන මගින් නිකුත් කළ සුරැකුම්පත්වලින් සමන්විත වේ.

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සංචිත කළමනාකරණ කාර්යය සඳහා වන ගනුදෙනු ඉටු කිරීමේ දී එම ගනුදෙනු, විදේශ සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුවේ (IRIOC) අනුමැතිය ලද ප්‍රතිපාර්ශ්ව වන මහ බැංකු, ඉහළ ශ්‍රේණිගත කිරීමක් සහිත වාණිජ බැංකු සහ ආයෝජන ආයතන (Investment Houses) සමඟ සිදු කරනු ලබයි. මෙම ප්‍රතිපාර්ශ්ව, ඒ එක් එක් ප්‍රතිපාර්ශ්වයේ ශක්තිය හා ණය පියවීමේ හැකියාව කෙරෙහි වැඩ සැලකිල්ලක් යොමු කර අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි සීමා වෙන් කිරීම්වලට යටත්ව, ප්‍රතිපාර්ශ්ව අවදානම් කළමනාකරණ පද්ධතියේ (Counterparty Credit Risk Management System - CCRMS) දක්වා ඇති පරාමිතීන්ට අනුව තෝරා ගනු ලබයි.

### (අ) ව්‍යූහාත්මක සංචිත කළමනාකරණය

2016 වසරේ සිට ශ්‍රී ලකා මහ බැංකුව ලෝක බැංකුවේ "සංචිත උපදේශක සහ කළමනාකරණ වැඩසටහන"ට (Reserve Advisory and Management Programme - RAMP) සම්බන්ධ වූ අතර, එමගින් විදේශ සංචිත සහ අනෙකුත් ආයෝජන කළඹ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා උපදේශක සේවා සහ පුහුණුවීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයෝජන කළමනාකරුවන්ට සපයනු ලබයි. ඒ අනුව, ප්‍රාග්ධන සංරක්ෂණය, ද්‍රවශීලතා අවශ්‍යතා, ආදායම් උත්පාදනය සහ දැරිය හැකි අවදානම් මට්ටම යන කරුණු ප්‍රධාන වශයෙන් සලකා බලා ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම් ව්‍යූහය මත පදනම්ව ආදර්ශ ආකෘතියක් මත නිර්මාණය වූ උපායමාර්ගික වත්කම් වෙන් කිරීම (Strategic Asset Allocation) නමින් වූ ක්‍රමයක් අනුගමනය කරනු ලැබේ. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත, අවශ්‍යතාව මත පදනම්ව, විවිධ වූ ආයෝජන කළඹවලින් සමන්විත ප්‍රධාන කාණ්ඩ (tranches) තුනකට වෙන් කර ඇති අතර, එම කාණ්ඩවලට ආයෝජන කාල පරාස, මුදල් සංයුතීන් සහ වත්කම් සංයුතීන් පවරා ඇත. මෙම කාණ්ඩ යටතේ පවතින සෑම ආයෝජන කළඹකටම ජාත්‍යන්තරව සම්මත මිණුම් සලකුණු (Benchmark) පවරා ඇත. ඒ අනුව, ආයෝජන කළඹවල කාර්යසාධනය සිදු කිරීමේ දී එය ගෝලීය වශයෙන් පිළිගත් භාවිතයන්ට අනුකූල වන පරිදි, පිළිවෙළින් අදාළ සම්මත මිණුම් සලකුණුවලට සාපේක්ෂව සසඳා බලා සිදු කරනු ලැබේ.

### (ආ) බාහිර කළමනාකරු මගින් පාලිත මහ බැංකු සංචිත

සංචිත උපදේශක සහ කළමනාකරණ වැඩසටහන (RAMP) යටතේ, 2016 වසරේ සිට ලෝක බැංකු භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිත කළනාකරණය සඳහා වන බාහිර කළමනාකරු ලෙස පත් කරන ලදී. ඒ අනුව, එ.ජ. ඩොලර් මිලියන 200 ක් වටිනා ආයෝජන කළඹක් පෙර අර්ථ දක්වන ලද ආයෝජන මාර්ගෝපදේශයකට අනුව ආයෝජනය කිරීමට ලෝක බැංකු භාණ්ඩාගාරය වෙත පවරන ලදී. මෙහි ආයෝජන කාල පරාසය වසර 3 කි.

### (ඇ) ලෝක බැංකුවේ තාක්ෂණික සහාය

2019 වසර තුළදී, විදේශ සංචිත කළමනාකරණය හා සම්බන්ධව තාක්ෂණික වැඩමුළු දෙකක් ලෝක බැංකු තාක්ෂණික ප්‍රවීණයන්ගේ මග පෙන්වීම ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුවේ නේවාසික පුහුණු වැඩසටහන් වශයෙන් පවත්වන ලදී. මෙම තාක්ෂණික වැඩමුළුවලින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලැබුවේ යෝජිත සංචිත කළමනාකරණ පද්ධතිය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය (Procurement Process) සහ ටෙන්ඩර් ක්‍රියාවලියේ "විසඳුම පිළිබඳ සාධනය" (Proof of Solution) පිළිබඳව සවිස්තරාත්මක දැනුවත් කිරීමක් කෙරෙහිය.

## 16.2 කාර්යසාධන විශ්ලේෂණය හා පහසුකම් සැලසීමේ ක්‍රියාකාරකම්

කාර්යසාධන විශ්ලේෂණය හා පහසුකම් සැලසීම යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිත කළමනාකරණය හා සම්බන්ධ පහත සඳහන් ප්‍රධාන කාර්යයන් සිදු කෙරේ.

### (අ) කාර්යසාධන ඇගයීම හා විදේශ සංචිත කළමනාකරණය

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සමස්ථ ප්‍රතිලාභ ප්‍රවේශයක් අනුව එහි සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම්වල කාර්යසාධන ඇගයීම් කටයුතු දෛනික ව සිදු

කරනු ලබන අතර, එය සංචිත මට්ටම් විශ්ලේෂණයක් ද සහිතව මාසිකව විදේශ සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුවටත්, කාර්තුමය වශයෙන් මුදල් මණ්ඩලය වෙතටත් වාර්තා කරනු ලබයි. ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල හා මුදල් වෙළඳපොළ ආයෝජනයන් හරහා ඉපැයෙන ප්‍රතිලාභ මුදල් මණ්ඩලය අනුමත කළ උපායමාර්ගික වත්කම් වෙන් කිරීමේ ක්‍රමයට අනුව එකිනෙකට අදාළ පිළිගත් මිනුම් දඬුවලට එරෙහිව ඇගයීමට ලක් කරයි. පිළිගත් මිණුම් දඬුවලට සාපේක්ෂව අතිරේක ප්‍රතිලාභ ගණනය කිරීම තුළින් සක්‍රීය සංචිත කළමනාකරණ උපායමාර්ගවල සඵලතාව තීරණය කරනු ලබයි. අනුමත නිර්දේශ තුළ ආයෝජනය කිරීමෙන් සංචිත කළමනාකරණයෙහි ප්‍රතිලාභ අරමුණු සාධාරණ ප්‍රමාණයකට ළඟා කර ගෙන ඇත්දැයි ඇගයීමට මෙම ප්‍රවේශය උපකාරී වේ. කළඹ විවිධාංගීකරණයෙහි කාර්යක්ෂමතාවය මැනීම සඳහා තොරතුරු අනුපාතය (Information Ratio) හා අමතර ප්‍රතිලාභයන්හි සම්මත අපගමනය (Tracking Error) වැනි අවධානම් ගළපන ලද කළඹ කාර්යසාධන මිණුම් ද භාවිතා කෙරේ. විදේශ සංචිත කමනාකරණයෙන් උත්පාදනය වූ සමස්ත ප්‍රතිලාභ තවදුරටත් විදහා දැක්වීම සඳහා 2019 වසරේ සිට කාර්යසාධන විශේෂණය ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. විවිධ ආදායම් ප්‍රභවයන් මගින් උත්පාදනය වූ ප්‍රතිලාභ ඇගයීම මගින් ආයෝජන කළඹවල කාර්යසාධනය විශ්ලේෂණය කිරීමට මෙම ක්‍රියාවලිය උපකාරී වන අතර, එහි ප්‍රතිඵල, සංචිත කළමනාකරණ ක්‍රමෝපායන් සැකසීම සඳහා භාවිතා කළ හැකි ඉතා වැදගත් යෙදවුම් වේ.

**(ආ) ජාත්‍යන්තර සංචිත ගණනය කිරීම හා විදේශ මුදල් සංචිත සඳහා දත්ත සමුදායක් පවත්වා ගැනීම**

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකු සංචිත හා නිල ජාත්‍යන්තර සංචිත අගයන් දෛනිකව ගණනය කරන අතර, සංචිත අගයන් සම්බන්ධ අදාළ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත සපයයි. තවද, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ සහ මූල්‍ය දෙපාර්තමේන්තුවල සහයෝගය ඇතිව එක් එක් මාසයේ අවසාන සංචිත අගයන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ශේෂ පත්‍රයේ සංචිත අගයන් සමඟ සැසඳීම සිදු කරයි.

**(ඇ) සංචිත කළමනාකරණ පද්ධතිය (TMS) පරිපාලනය කිරීම**

සංචිත කළමනාකරණ පද්ධතියෙහි ප්‍රධාන පරිශීලකයා වශයෙන් ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව එහි සාමාන්‍ය පරිපාලන කටයුතුවල වගකීම දරන අතර, සංචිත කළමනාකරණ පද්ධතියෙහි සේවය ලබන අනෙක් දෙපාර්තමේන්තු, පරිඝණක මෘදුකාංග සැපයුම්කරු හා දේශීය හවුල්කරු අතර විධිමත් සම්බන්ධීකරණය ද සිදු කරයි. ඒ අනුව, සංචිත කළමනාකරණ පද්ධතියේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සහතික කරනු වස් අවශ්‍ය වන්නා වූ නිසි වැඩිදියුණු කිරීම් සහ යාවත්කාලීන කිරීම් පිළිබඳ මෙන්ම ස්විෆ්ට් (SWIFT), තත්කාලීන මුදල් පියවීමේ පද්ධතිය (RTGS) සහ පොදු ලෙජරය (GL) වැනි අභ්‍යන්තර පද්ධති මෙන්ම Bloomberg සහ Reuters වැනි බාහිර පද්ධති සමඟ ද පූර්ණ සහ අඛණ්ඩ සම්බන්ධතාව සහතික කිරීමේ වගකීම ද ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සතුව පවතී. පවතින සංචිත කළමනාකරණ පද්ධතිය 2021 අග භාගයේ දී කල් ඉකුත් වීමට නියමිත බැවින්, නව කළමනාකරණ පද්ධතියක් ලබා ගැනීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2019 දී ආරම්භ කරන ලදී.

**(ඈ) මූල්‍ය විශුද්ධිකරණය හා ත්‍රස්තවාදී කටයුතු සඳහා අරමුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධයෙන්, වර්තමාන ගනුදෙනු පාර්ශ්වයන්ගේ අනුකූලතාව පිළිබඳ වාර්ෂික සමාලෝචනය**

වර්ෂ 2019 දී, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් විදේශ සංචිත කළමනාකරණයට සම්බන්ධිත නීති, රෙගුලාසි හා මූල්‍ය විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමට අදාළව ජාත්‍යන්තර ව පිළිගත් පරිචයන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා "ගනුදෙනුකරු හඳුනා ගැනීම (KYC)/ ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම (CDD)" අදාළ රීති මහ බැංකුවේ වර්තමාන ගනුදෙනු පාර්ශ්ව සඳහා ක්‍රියාත්මක කරන ලදී. ගනුදෙනුකරුවන් හඳුනාගැනීමේ සමාලෝචන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගත කිරීමේ පියවරක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ගනුදෙනුකරු හඳුනාගැනීමේ දත්ත ගබඩාවක් වන ස්විෆ්ට් ගනුදෙනුකරු හඳුනාගැනීමේ ලේඛණය (SWIFT KYC Registry) හි ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියෙහි දැනට නියුක්තව සිටියි.

## 16.3 දේශීය විදේශ විනිමය වෙළඳපොළ සංවර්ධනය

මෙම වසර තුළදී ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, විනිමය අනුපාතයේ අධික උච්චාවචනයන් කළමනාකරණය කරන ලද අතරම එහිදී ඉහළ නම්‍යශීලීත්වයකට ඉඩ සලස්වමින්, දේශීය විදේශ විනිමය වෙළඳපොළේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම උදෙසා අඛණ්ඩව කටයුතු කරන ලදී.

**(අ) දේශීය විදේශ විනිමය වෙළඳපොළ මැදිහත් වීම්**

2019 වසර තුළදී ද ශ්‍රී ලංකා මහ බැංකුව, අක්‍රමවත් වෙළඳපොළ තත්ත්ව හමුවේ විනිමය අනුපාතිකයේ අධික උච්චාවචනයන් අවම කිරීම පිණිස අවශ්‍ය පරිදි දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් විය. එම මැදිහත්වීම් සිදු කරන ලද්දේ 2018 වසරේ දී හඳුන්වා දුන් මිල ගණන් කැඳවීම (Request for Quote) නැමති ක්‍රමවේදය තුළින් වන අතර එය වෙළඳපොළ විනිවිදභාවය වැඩිදියුණු කිරීමට මෙන්ම විදේශ විනිමය සංචිතයන්හි ණය නොවන කොටස (Non - borrowed reserves) ඉහළ නැංවීමට උපකාරී විය.

**(ආ) තොරතුරු බෙදා හැරීම**

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව තවදුරටත් ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ නිරූපිත (Indicative) විනිමය අනුපාතිකය ඇතුළුව තවත් ලෝක මුදල් වර්ග 56 ක නිරූපිත විනිමය අනුපාතිකයන් හා ප්‍රධාන මුදල් වර්ග 9 ක් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදුලි පැවරුම් සඳහා වූ මිලදී ගැනීමේ හා විකිණීමේ විනිමය

අනුපාතිකයන්ගේ සාමාන්‍ය අගය, දෛනිකව ශ්‍රී ලංකා මහ බැංකු නිල වෙබ් අඩවිය හරහා ප්‍රකාශයට පත් කරනු ලැබේ. මීට අමතරව, රාජ්‍ය ආයතනවලට සහ මහජනයා ඇතුළු විවිධ පාර්ශ්වයන් වෙත ඔවුන්ගේ ඉල්ලීම් මත විනිමය අනුපාත දත්ත සැපයීම මගින් ද ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සිය තොරතුරු බෙදා හැරීමේ කාර්යය ඉටු කරන ලදී.

**(ඈ) ශුද්ධ විවෘත විදේශ විනිමය ප්‍රමාණය (NOP) සංශෝධනය කිරීම**

පුරෝකථනය නොකරන ලද විශාල ප්‍රමාණයේ විදේශ විනිමය ප්‍රවාහ විනිමය අනුපාතය මත අනවශ්‍ය පීඩනයක් ඇති කරන අතර, එය විනිමය අනුපාතයේ අධික උච්චාවචනයන්ට හේතු වේ. එවැනි ප්‍රවාහ සඳහා අවකාශ සැලසීම පිණිස 2019 වසරේ දී සමහර බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය මෙහෙයුම්වලට අදාළව ශුද්ධ විවෘත විදේශ විනිමය සීමාවන්, එක් එක් අවස්ථාව සලකා බලා සංශෝධනය කරන ලදී.

**(ඇ) වෙළඳපොළ සහභාගිවන්නන් සමග සම්බන්ධතාව**

වෙළඳපොළ සංවර්ධනයට අදාළ කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල භාණ්ඩාගාර ප්‍රධානීන් සමග අර්ධ වාර්ෂික පදනමින් රැස්වීම් පැවැත්වූ අතර විදේශ විනිමය වෙළඳපොළ මෙහෙයුම් විධිමත් කිරීමේ අරමුණින් අදාළ ගැටලු මග හරවා ගැනීමට අවශ්‍ය පියවර කිහිපයක් සඳහා මුල පුරන ලදී. මේ යටතේ, ඒකාග්‍රිත කේන්ද්‍රීය වෙළඳපොළ අධීක්ෂක (CIMM) පද්ධතිය සහ ජාත්‍යන්තර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය (lOMS) එකිනෙක හා සම්බන්ධ කිරීම මගින් දෛනික පදනමින් විදුලි පැවරුම් (TT) අනුපාත වාණිජ බැංකුවලින් ලබා ගැනීම් සහ මහ බැංකුවෙන් ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කරන ලදී.

**(ඉ) වෙළඳපොළ අපේක්ෂා පිළිබඳ නිරීක්ෂණ**

2019 වසර පුරාවටම, දේශීය විදේශ විනිමය වෙළඳපොළ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමේ මූලික වගකීම දරන දෙපාර්තමේන්තුව ලෙස ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සහ බාහිර ආයතන විසින් ඉදිරිපත් කරන ලද විවිධ යෝජනා, රෙගුලාසි, සංශෝධන හා ප්‍රතිපත්තිමය කරුණු හේතුවෙන් විදේශ විනිමය අනුපාතයේ විචලනයට සිදු විය හැකි බලපෑම පිළිබඳව සිය අදහස්, නිරීක්ෂණ සහ නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

## 17. නීති හා අනුකූලතා

ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් කටයුතුවල ඇති සියළු නෛතික හා කාර්ය පටිපාටිමය අංශයන්හි යහපාලන ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමෙහි ලා පහසුකම් සැපයීමේ කාර්යභාරය නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබේ. මහ බැංකුවේ මූලික ව්‍යවස්ථාපිත අරමුණු සාක්ෂාත් කරගැනීමේ අරමුණින් යුතුව නව නීති නිර්මාණය කිරීම, මහ බැංකුව විසින් ක්‍රියාවේ යොදවමින් පවත්නා නීති සඳහා උචිත සංශෝධන ගෙන ඒම සහ නියාමන හා සුපරීක්ෂණ රාමුව තවදුරටත් සවිමත් කිරීම, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව වෙත පැවරුණු කාර්යයභාරය අතර වේ. ඉහත කී අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී මහ බැංකුවට අදාළ වන නෛතික හා නියාමන රාමුව ජාත්‍යන්තර සම්මතයන් හා යහපත් පරිචයන් සමග සමපාත වීම ද තහවුරු කරමින් නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව 2019 වසරේ දී මහ බැංකුව තුළ පුළුල් පරාසයක පැවති කාර්යයන් රැසක් ඉටු කිරීමට කටයුතු කර තිබේ. ඒ අනුව, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් 2019 වසර තුළ ඉටු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදි සාරාංශගත කොට ඇත.

1949 අංක 58 දරන මුදල් නීති පනත පරිච්ඡින්න කරමින් ඒ වෙනුවට නව ශ්‍රී ලංකා මහ බැංකු පනත හඳුන්වා දීම උදෙසා නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව 2018 වර්ෂයේ පටන්ම බොහෝ සේ මැදිහත් ව කටයුතු කරන ලදී. මුදල් අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව සහ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව යනාදී විවිධ පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාවයෙන් යුතුව පුළුල් නියාමන හා සුපරීක්ෂණ බලතල ද උසස් යහපාලන සම්මතයන් ද සහිතව සකසන ලද ශ්‍රී ලංකා මහ බැංකු පනත් කෙටුම්පතට අදාළ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලිය දක්වා ඉදිරියට ගෙන යැමට නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව සමත් විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ නෛතික හා නියාමන රාමුව තවදුරටත් සවිබල ගැන්වීමේ අරමුණින් යුතුව, නව බැංකු පනත, ඒ සම්බන්ධයෙන් අවසානාත්මක වූ සංකල්ප පත්‍රය මත පදනම්ව මේ වන විට සකස් වෙමින් පවතින අතර එමගින් බැංකු පද්ධතිය සඳහා වන සවිමත් නෛතික පදනමකට ප්‍රතිපාදන සලසනු ඇත. විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සුපරීක්ෂණ බලතල වඩාත් පුළුල් කිරීමේ අරමුණින් යුතුව, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත සඳහා අවශ්‍ය සංශෝධන හඳුන්වාදීමට ද නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව සිය දායකත්වය ලබා දී තිබේ. තවද, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් 1937 අංක 7 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත, 1990 අංක 2 දරන ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සහ 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙණු පනත සඳහා සංශෝධන යෝජනා කරන ලද අතර එකී සියළු ක්‍රියාකාරකම් මගින් මූල්‍ය වෙළඳපොළෙහි යටිතල පහසුකම් ඉහළ නැංවීම අපේක්ෂා කොට තිබේ.

මහ බැංකුවේ අනුකූලතා කාර්යයන් වශයෙන්, බැංකුවේ යහපාලන ප්‍රමිතීන් ශක්තිමත් කිරීම සඳහා නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව සැලකිය යුතු කාර්ය භාරයක් ඉටු කරන ලද අතර මහ බැංකුවේ විදේශ විනිමය මෙහෙයුම්වල දී සම්බන්ධ වන විදේශීය පාර්ශ්වයන් සම්බන්ධයෙන් වන අනුකූලතා අවශ්‍යතා සම්බන්ධයෙන් වැඩි වශයෙන් මැදිහත්වීමක් සිදු කරන ලදී. ඊට අමතරව, 2019 වසරේ සිට, 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ මහ බැංකුවේ තොරතුරු නිලධාරී වෙත ලැබෙන තොරතුරු

ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ එවැනි තොරතුරු දැනගැනීමේ ඉල්ලීම්වලින් අනතුරුව තෙවන පාර්ශ්වයන් විසින් ආරම්භ කරනු ලබන විමර්ශනයන්/නීති කෘත්‍යයන්හි දී මහ බැංකුවේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් පෙනී සිටීමද, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

එසේම, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් යහපාලන සංකල්පයන්ගෙන් ගොඩනැගුණු දෘෂ්කෘත නිවේදන ප්‍රතිපත්තිය, මහ බැංකු නිලධාරීන්ට සහ මුදල් මණ්ඩල සාමාජිකයන්ට අදාළ වන චර්යා ධර්ම සංග්‍රහ වැනි ප්‍රතිපත්තීන්වලට සංශෝධන හඳුන්වාදීම සිදු කරන ලද අතර විගණන කමිටුව සහ මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාව යනාදිය වෙනුවෙන් සක්‍රීය දායකත්වයක් දැක්වීමද සිදු කරන ලදී.

මුදල් මණ්ඩලය, මහ බැංකුව හෝ එහි සේවකයන් විසින් සහ ඔවුන්ට එරෙහිව පවරන ලද නීති කෘත්‍යයන්වලදී එම පාර්ශ්වයන්හි බැඳියාවන් ආරක්ෂා කර ගනිමින් එම සියළු නීති කෘත්‍යයන් සම්බන්ධව සාර්ථකව කටයුතු කිරීමට 2019 වසරේ දී නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව සමත් වන ලදී. මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන ඇතැම් ප්‍රශ්නගත මූල්‍ය ආයතනයන්ට සහ ඒවායේ අධ්‍යක්ෂවරුන්ට එරෙහිව නීති කෘත්‍යයන් ආරම්භ කිරීම ද නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි සහ 1988 අංක 30 දරන බැංකු පනතෙහි ප්‍රතිපාදන අනුව නීතිපති දෙපාර්තමේන්තුවෙහි සහ අනෙකුත් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයන්ගේ ද සහයෝගය ඇතිව තැන්පත්කරුවන්ගේ සහ ණය හිමියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ අරමුණින් යුතුව අනවසර මූල්‍ය සමාගම්, තහනම් යෝජනා ක්‍රම සහ මූල්‍ය අංශයේ අනෙකුත් ගැටළු හා සම්බන්ධව නීති කෘත්‍යයන් අඛණ්ඩව සිදු කරගෙන යැමට නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

මහ බැංකුවේ දැනට පවතින නියාමන අධිකාරිය ඉහළ නැංවීමේ අරමුණින් යුක්තව, රෙගුලාසි, නිර්දේශයන්, මාර්ගෝපදේශයන්, මෙහෙයුම් උපදෙස්, ගිවිසුම් චක්‍රලේඛයන් ආදී නෛතික උපකරණ වැඩිදියුණු කිරීම සහ සංශෝධනය කිරීම සඳහා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු වෙත සහයෝගය දැක්වීම නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. එසේම, බාහිර පාර්ශ්වයන් විසින් කෙටුම්පත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථාන පනත් කෙටුම්පත, දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත, සයිබර් ආරක්ෂණ පනත් කෙටුම්පත වැනි නව නීතීන්හි ප්‍රතිපාදන පිළිබඳව නිරීක්ෂණයන් ලබා දීම සඳහා ද නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව පියවර ගනු ලැබූ අතර එළඹීමට අපේක්ෂිත ගිවිසුම්, විවිධ නීති යටතේ මහ බැංකුව විසින් නිකුත් කරන ලද අනු නීති ආදියෙහි නෛතිකභාවය තහවුරු කිරීම උදෙසා ඒවා අධ්‍යයනය කිරීමද සිදු කරන ලදී. මහ බැංකුවේ දෙපාර්තමේන්තුවල මෙහෙයුම් කටයුතු ඉටු කිරීමේදී එකී දෙපාර්තමේන්තුවලට මුහුණ පෑමට සිදු විය හැකි අනවශ්‍ය නෛතික, මෙහෙයුම් හා අනුකූලතා අවදානම් වළක්වා ගැනීම සඳහා නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් සිය උපදෙස් එම දෙපාර්තමේන්තු වෙත ලබා දීම ද සිදු කරන ලදී.

ඉහත සඳහන් කරුණුවලට අනුව නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව මහ බැංකුවේ එක් ආරක්ෂණ අංශයක් වශයෙන්, මහ බැංකුවේ ප්‍රධාන අරමුණු, උපායමාර්ගික ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීම සහ නෛතික, මෙහෙයුම් හා අනුකූලතා අවදානම් කළමනාකරණය කිරීම, ස්වකීය කාර්ය සාධනය තුළින් 2019 වසරේ දී සාර්ථකව ඉටු කිරීමට සමත් වී ඇත.

## 18. සාර්ව විචක්ෂණතා අධ්‍යයන

මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය පවත්වාගෙන යැම මහ බැංකුව සතු ව්‍යවස්ථාපිත අරමුණු දෙකෙන් එකකි. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා මහ බැංකුව විසින් ක්ෂුද්‍ර විචක්ෂණතා අධීක්ෂණයන් සහ සාර්ව විචක්ෂණතා අධ්‍යයනයන් අඛණ්ඩව සිදු කරයි. රටේ මූල්‍ය පද්ධතිය තුළ ඇතිවන පද්ධතිමය අවදානම් ඇගයීම සඳහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් පුළුල් පාරාසයක විශ්ලේෂණ සිදු කරන අතර ඉන් සමහරක් ක්ෂුද්‍ර විචක්ෂණතා අධීක්ෂණයන් අනුපූරණය කරයි. මීට අමතරව, දේශීය මූල්‍ය පද්ධතියට සහ එහි ස්ථායීතාවයට සාර්ව ආර්ථික වර්ධනයන්ගෙන් ඇතිවන බලපෑම හඳුනාගැනීමට සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සාර්ව මූල්‍ය සම්බන්ධතා (Macrofinancial Linkages) විශ්ලේෂණය කරනු ලබයි. මෙම දෙපාර්තමේන්තුව සාර්ව විචක්ෂණතා අධ්‍යයනයන් කරනු ලබන්නේ මහ බැංකුව මගින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනවලින් සහ අනෙකුත් ප්‍රභවයන්ගෙන් එක්රැස් කරගන්නා දත්ත යොදා ගැනීමෙනි. මෙම අධ්‍යයනයන්ගේ සොයා ගැනීම් මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට දායක වන අතර පද්ධතිමය අවදානම් අවම කිරීමට අවශ්‍ය සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හඳුන්වාදීමටද සහාය වේ. 2019 වසරේදී සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

### (අ) සාර්ව විචක්ෂණතා අධ්‍යයන

මූල්‍ය අංශයේ නැගී එන පද්ධතිමය අවදානම් හඳුනා ගැනීමටත් එවැනි අවදානම්වලට ඔරොත්තුදීමට මූල්‍ය පද්ධතියට ඇති හැකියාව ඇගයීමටත් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මගින් අධ්‍යයනයන් සිදුකරන ලදී. මෙම අධ්‍යයන රාමුව මගින් ගෝලීය හා දේශීය සාර්ව ආර්ථික ප්‍රවණතාවන්ගෙන්, මූල්‍ය වෙළඳපොළ ක්‍රියාකාරකම්වලින් සහ මූල්‍ය ආයතන අංශයෙන් මතුවන අවදානම් අනාවරණය කරයි. මහ බැංකුව නියාමනය කරන මූල්‍ය ආයතනයන්ගෙන් සහ බාහිර ප්‍රභවයන්ගෙන් එක්රැස්කර ගන්නා දත්ත යොදා ගනිමින් මූල්‍ය පද්ධතියේ අවදානම් අධ්‍යයනය කරන ලදී. ආයතනික සහ ගෘහස්ථ අංශයන්ගේ ප්‍රවණතාවන්ගෙන් මූල්‍ය අංශයට ඇතිවිය හැකි අවදානම් ඇගැයීමට 2019 වසරේදී සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සාර්ව විචක්ෂණතා අධ්‍යයන රාමුව සැලකිය යුතු ලෙස පුළුල් කරන ලදී. බාහිර මූලාශ්‍රවලින් ලබා ගත් දත්ත, ගෘහස්ත සහ ගෘහස්ත නොවන අංශවලට විධිමත් මූල්‍ය අංශයේ ඇති නිරාවරණය ඇගයීමට උපකාරී විය. මෙම අධ්‍යයනය මගින් ගෘහස්ත සහ ගෘහස්ත නොවන අංශවල ණය බරෙහි විචලනය පිළිබඳ

ප්‍රමුඛතා දර්ශක සපයනු ලබයි. ආයතනික අංශයෙන් මූල්‍ය පද්ධති ස්ථායීතාව වෙත පැන නගින අවදානම් පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් කිරීමේ අවශ්‍යතාවය සපුරාලීමේ අරමුණින් දෙපාර්තමේන්තුව විසින් මූල්‍යමය නොවන ආයතනික අංශයේ අවදානම් පැතිකඩ විශ්ලේෂණය කිරීම ආරම්භ කරන ලදී. සාර්ව ආර්ථික හා මූල්‍ය අංශයන්ගේ ප්‍රවණතා මූල්‍ය නොවන ආයතනික අංශයේ ක්‍රියාකාරිත්වයට සහ ශේෂ පත්‍රවලට බලපාන අතර, ආයතනවල සංයුක්ත හැසිරීම හෝ පද්ධතිමය වැදගත්කමක් ඇති මූල්‍යමය නොවන ආයතනවල හැසිරීම සාර්ව ආර්ථිකයට සහ මූල්‍ය පද්ධතියට බලපෑම් ඇති කළ හැකිය. තවද, බැංකු අංශයේ ඇති විය හැකි පැතිරයාමේ අවදානම (Contagion risk) හඳුනා ගත හැකි අන්තර් සම්බන්ධතා අධ්‍යයනයකද සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව නිරත විය. මූල්‍ය පද්ධතියේ ණයවල ගුණාත්මකභාවය කාලයත් සමග විකසනය වීම අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් අක්‍රීය ණය සඳහා සම්භාවිතා ශ්‍රිතයක් නිර්මාණය කරන ලද අතර, එමගින් වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම හේතුවෙන් මූල්‍ය පද්ධතියට ඇති අවදානම ඉහළ යෑමේ සම්භාවිතාවය නිරූපණය කරයි. මූල්‍ය පද්ධතිය ඉටු කරන්නා වූ අතරමැදි ක්‍රියාවලියට බාධා වන කාලපරිච්ඡේද හඳුනා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් වසර තුළදී මූල්‍ය ආතති දර්ශකයක් (Financial Stress Index) ගොඩ නගන ලදී. මෙම දර්ශකය මූල්‍ය පද්ධතියේ පවතින ආතතිය නිර්ණය කිරීම සඳහා කොටස් වෙළඳපොළ, බැඳුම්කර වෙළඳපොළ, විදේශ විනිමය වෙළඳපොළ සහ බැංකු අංශයේ දර්ශක ඒකාබද්ධ කර නිර්මාණය කරන ලද සංයුක්ත දර්ශකයකි. සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් දේශීය මූල්‍ය පද්ධතියේ විවිධ උපඅංශවල ස්ථායීතාව සහ ශක්තිමත්භාවය මත පදනම්ව සංයුක්ත මූල්‍ය පද්ධති ස්ථායීතා දර්ශක ගණනාවක් තව දුරටත් සම්පාදනය කල අතර මෙම දර්ශකවල විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීමට පියවර ගන්නා ලදී. මීට අමතරව, බැංකු අංශයේ සහ තනි බැංකුවල ප්‍රාග්ධන මට්ටමට බලපාන ණය අවදානම, පොලී අනුපාත අවදානම සහ විදේශ විනිමය අවදානම තක්සේරු කිරීම සඳහා ඉහළ සිට පහළට (Top down) ගණනය කරන සාර්ව ආතති පරීක්ෂණ අඛණ්ඩව සිදු කළ අතර, බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයට ද ආතති පරීක්ෂණවල විෂය පථය තවදුරටත් පුළුල් කරන ලදී. මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට ඇති වියහැකි තර්ජන හඳුනාගැනීමට අවදානම් විශ්ලේෂණ වාර්තා සහ මූල්‍ය පද්ධතියට ඇතිවන අනෙකුත් කාලීන ගැටලු අන්තර්ගත මාණ්ඩලික පත්‍රිකා ගණනාවක් මුදල් මණ්ඩලයට 2019 වසර තුළදී ඉදිරිපත් කරන ලදී.

**(ආ) සමීක්ෂණ සහ දත්ත රැස් කිරීම**

**මූල්‍ය පද්ධතිමය අවදානම පිළිබඳ සමීක්ෂණය** : මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට ඇති විය හැකි අවදානම් පිළිබඳ වෙළඳපොළ ආකල්ප හඳුනා ගැනීමේ අරමුණින් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් 2017 වසරේදී ආරම්භ කරන ලද මූල්‍ය පද්ධති අවදානම පිළිබඳ අර්ධ වාර්ෂික සමීක්ෂණය අඛණ්ඩව සිදු කරන ලදී. මෙම අවදානම් යථාර්ථයක් බවට පත් වුවහොත් මූල්‍ය ආයතන, මූල්‍ය වෙළඳපොළ සහ ගෙවීම් පද්ධතියේ විධිමත් ක්‍රියාකාරිත්වය ඇතුළුව මූල්‍ය අතරමැදි ක්‍රියාවලියට බාධාවක් විය හැකි අතර, එය මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය පිළිබඳව මහජන විශ්වාසයට බලපානු ඇත. මෙම සමීක්ෂණ ප්‍රතිඵල මගින් මූල්‍ය පද්ධතියට ඇති විය හැකි පද්ධතිමය අවදානම් පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම් සපයන අතර, නැගීඑන අවදානම් අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ගයන් අතරින් ප්‍රමුඛතාවය හඳුනාගැනීමට සහ සුදුසු ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට පහසුකම් සපයයි. තවද, මූල්‍ය පද්ධතියේ අවදානම් සම්බන්ධව දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර අධ්‍යයනවල ප්‍රතිඵල තහවුරු කිරීමටද මෙම සමීක්ෂණය උපකාරී වේ.

**ගෘහස්ත අංශයේ ණයගැතිභාවය පිළිබඳ සමීක්ෂණය** : කුටුම්භ අංශය පිළිබඳ අධ්‍යයනය තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් ගෘහස්ත අංශයේ ණයගැතිභාවය පිළිබඳ සමීක්ෂණය ආරම්භ කරන ලදී. මෙම සමීක්ෂණයෙහි ආවරණය පුළුල් කිරීමටත්, එමගින් ගෘහස්ත අංශයෙන් මතුවන අවදානම් හා අන්තරාවන් හඳුනාගෙන එයින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට වන බලපෑම හඳුනාගැනීමටත් දෙපාර්තමේන්තුව විසින් තුන්වන පාර්ශ්වයක් වෙත සමීක්ෂණයේ දත්ත එකතු කිරීමේ කර්තව්‍යය පැවරීමට ටෙන්ඩර් ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී. මෙම සමීක්ෂණය 2020 දී අවසන් කිරීමට අපේක්ෂා කරයි.

**දත්ත රැස් කිරීම** : සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සිය දත්ත ගබඩාව ශක්තිමත් කිරීමට විවිධ බාහිර පාර්ශ්ව වෙතින් ක්ෂුද්‍ර මට්ටමේ දත්ත එක්රැස් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. දෙපාර්තමේන්තුව විසින් කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, සේවක භාරකාර අරමුදල් මණ්ඩලය, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, සණස සම්මේලනය, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ණය තොරතුරු කාර්යාංශය, ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා ඒකක භාර සංගමය වැනි බාහිර ආයතනවලින් නිතිපතා දත්ත රැස් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

**(ඇ) මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය ප්‍රකාශයට පත් කිරීම සහ මහ බැංකුවේ ව්‍යවස්ථාපිත හා වෙනත් ප්‍රකාශන සඳහා දායකත්වය**

**මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය 2019** : ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය මුහුණදී ඇති අවදානම් සහ දුර්වලතා පිළිබඳ ස්වාධීන ඇගයීමක් ඉදිරිපත් කිරීමේ සහ අනුගමනය කරන ලද අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීමේ අරමුණින් 2019 දෙසැම්බර් මාසයේදී මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය ප්‍රකාශයට පත් කරන ලදී. 2019 මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය "සාර්ව මූල්‍ය තත්ත්වයන්", "මූල්‍ය වෙළඳපොළ", "මූල්‍ය ආයතන", "ගෘහස්ත හා ආයතනික අංශය" සහ "මූල්‍ය පද්ධති යටිතල පහසුකම්" වශයෙන් පරිච්ඡේද 5 කින් සමන්විත විය. මීට අමතරව, 2019 දී මූල්‍ය අංශය සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම් සහ අධීක්ෂණ ක්‍රියාමාර්ග ඇතුළත් විශේෂ සටහනක්ද මූල්‍ය පද්ධති අවදානම් සමීක්ෂණය - 2019 සහ දේශගුණික විපර්යාස තුළින් මූල්‍ය පද්ධති ස්ථායීතාවයට ඇති බලපෑම යන මැයෙන් විශේෂ සටහන් දෙකක්ද එහි අඩංගු විය.

**අනෙකුත් ප්‍රකාශන** : මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 2018 වසරේ වාර්ෂික වාර්තාවේ සහ 2019 වසරේ මෑත කාලීන ප්‍රවණතා වාර්තාවේ අඩංගු "මූල්‍ය අංශයේ ප්‍රවණතා හා ස්ථායීතාවය" යන පරිච්ඡේදය සම්බන්ධීකරණය සහ සම්පාදනය කිරීම සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. තවද මෙම දෙපාර්තමේන්තුව, මහ බැංකුව විසින් මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද සැප්තැම්බර් 15 වාර්තාවේ "මූල්‍ය අංශයේ ප්‍රවණතා" පිළිබඳ පරිච්ඡේදය ද සම්පාදනය කරන ලදී. මෙම වාර්තා මගින් එක් එක් ක්ෂේත්‍ර තුළින් රටෙහි සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය මත ඇති විය හැකි බලපෑම තක්සේරු කරමින් එක් එක් ක්ෂේත්‍රයට අදාළ කාර්යසාධනය, අවදානම් සහ අවදානම් කළමනාකරණය, සම්පත් සුලභතාවය සහ නියාමන උපනතීන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන අතර, රටෙහි මූල්‍ය ආයතන, මූල්‍ය වෙළඳපොළ සහ මූල්‍ය යටිතල පහසුකම් පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් සපයනු ලබයි. මූල්‍ය අංශයේ දත්ත සම්පාදනය කරමින් සහ මූල්‍ය පද්ධතියේ උප අංශයන් සම්බන්ධව විශ්ලේෂණ සපයමින් මහ බැංකුවේ අනෙකුත් ප්‍රකාශන සඳහා ද දෙපාර්තමේන්තුව දායක විය.

**(ඈ) මූල්‍ය පද්ධති ස්ථායීතාවය පිළිබඳ කමිටු සම්බන්ධීකරණය**

**මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව (FSSC) :** සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මූල්‍ය ස්ථායීතා කමිටුවේ ලේකම් කටයුතු සිදු කරයි. මෙම කමිටුව දෙපාර්තමේන්තු කිහිපයකින් සමන්විත වන අතර මූල්‍ය අංශයට බලපාන අවදානම් හඳුනා ගැනීම, අවදානම් අවම කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගැනීම සාකච්ඡා කිරීම සහ මූල්‍ය පද්ධති ස්ථායීතාවය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නයන් සම්බන්ධීකරණය සඳහා වූ සංසදයකි. 2019 වසර තුළදී මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුවේ රැස්වීම් පහක් පවත්වන ලදී. මුදල් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර සාමාජිකයින්ගේ අදහස් ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් සිය අවදානම් විශ්ලේෂණ වාර්තා මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

**මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටුව (FSSCC)** : මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටුව විසින් මූල්‍ය ක්ෂේත්‍රයේ ගැටලු පිළිබඳව මහ බැංකුව වෙත අදහස් හා උපදෙස් ලබා දේ. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියෙහි ආයතනවලට අනුයුක්ත ප්‍රධාන පුද්ගලයන්ගෙන් මෙම කමිටුව සමන්විත වේ. මහ බැංකු අධිපතිතුමා විසින් මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුවට මෙම පුද්ගලයන් පත් කරන ලද අතර වර්තමානයේ එය සාමාජිකයින් 17 කින් සමන්විත වේ. වසර තුළදී මෙම කමිටුවේ රැස්වීම් පහක් පවත්වන ලදී. සාර්ව විචක්ෂණ අධ්‍යයන දෙපාර්තමේන්තුව මගින් මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටුව වෙත ලේකම් සේවා සපයනු ලබයි.

**(ඉ) අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහාය ලබා ගැනීම හරහා තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම**

**මූල්‍ය අංශයේ ස්ථායීතා අරමුදල (FSSF) විසින් අරමුදල් සපයන තාක්ෂණික සහායක ව්‍යාපෘතිය** : මූල්‍ය ආයතනවල මූල්‍ය අවදානම් සහ කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා මහ බැංකුවෙන් කෙරෙන කාර්යයන් වැඩිදියුණු කිරීමට සහාය වීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. 2019 වසරේදී අවසන් කරන ලද තාක්ෂණික සහායක ව්‍යාපෘතියේ ඉදිරි දැක්මෙහි සාර්ව විචක්ෂණ රාමුව පුළුල් කිරීම, ආතති පරීක්ෂණ ක්‍රියාවලියෙහි ධාරිතාව වැඩිදියුණු කිරීම සහ මූල්‍ය වෙළඳපොළ යටිතල පහසුකම් සම්බන්ධ අධ්‍යයන වැඩිදියුණු කිරීම යන අරමුණු හඳුනා ගෙන ඇත. 2020 දී තාක්ෂණික සහායක ව්‍යාපෘතිය ආරම්භ වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතියට අදාළව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ප්‍රධාන සම්බන්ධීකාරක ලෙස සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව ක්‍රියාකරන අතර එමගින් මහ බැංකුවේ අනෙකුත් අදාළ දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි.

## 19. ගෙවීම් සහ පියවීම්

මුදල් නීති පනතේ 62අ වගන්තිය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අරමුදල් මාරු කිරීම සඳහා පද්ධති පිහිටුවීම සහ මෙහෙයවීම, ගෙවීම් බැරකම් පියවීම සහ සහභාගීත්ව ආයතනවලට පද්ධති නීතිරීති නිකුත් කිරීම සඳහා පැවරී ඇති වගකීම ඉටු කිරීම ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙයට අමතරව, ශ්‍රී ලංකාවේ ගෙවීම් සහ පියවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය, කාර්යක්ෂමභාවය, තරගකාරීත්වය සහ ස්ථායීතාවය ඇති කිරීමේ අරමුණ ඇතිව ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණය කිරීමට සහ ජාතික ගෙවීම් පද්ධති ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට 2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත බලය ක්‍රියාත්මක කිරීම ද ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව හරහා සිදු කරන ලදී.

තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් සිදු කිරීම, මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සැලසීම, ස්විෆ්ට් (SWIFT) සන්නිවේදන කටයුතු කළමනාකරණය කිරීම, ආසියානු නිෂ්කාශන සංගමයේ (ACU) රටවල් අතර ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම, ගෙවීම් යටිතල පහසුකම් සංවර්ධනයට පහසුකම් සැලසීම සහ රට තුළ ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණ කටයුතු සිදු කිරීම යන කාර්යයන් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ප්‍රධාන කාර්යයන් වේ. 2019 වසර තුළ සිදු කරන ලද කාර්යයන්වල සාරාංශයක් පහත දැක්වේ.

### 19.1 තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු

(අ) ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගීත්ව ආයතන අතර කාල සංවේදී සහ අන්තර් සාමාජිකයින්ගේ මෙන්ම ගනුදෙනුකරුවන්ගේ විශාල වටිනාකම් සහිත ගෙවීම් තත්කාලීන දළ පියවීම් පදනම මත සිදු කරන තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු තවදුරටත් සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් අතිරේක අරමුදල් සඳහා ඉල්ලීම් සිදු කරන සහභාගීත්ව ආයතන වෙත එක්දින ද්‍රවශීලතා පහසුකම ලබා දීමට පහසුකම් සැලසීමත් අධීක්ෂණය කිරීමත්

සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගීත්ව ආයතන වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්, සේවක අර්ථසාධක අරමුදල සහ කොළඹ කොටස් හුවමාරුවෙහි මධ්‍යම තැන්පතු පද්ධතියයි.

(ආ) 2019 වසර අවසානය වන විට තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගීත්ව ආයතන සංඛ්‍යාව 37 ක් විය. වසර තුළදී, තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් රුපියල් බිලියන 117,151 ක වටිනාකමකින් යුත් ගනුදෙනු 428,161 ක පියවීම් කටයුතු සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් පියවන ලද දෛනික සාමාන්‍ය ගනුදෙනු ප්‍රමාණය සහ වටිනාකම පිළිවෙළින් 1,762 ක් සහ රුපියල් බිලියන 482 ක් විය. සහභාගීත්ව ආයතන වෙත දෛනිකව ලබා දෙන ලද එක්දින ද්‍රවශීලතා පහසුකමෙහි සාමාන්‍යය රුපියල් බිලියන 63 ක් විය. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරමින් තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි උපයෝගීතාවය වසර තුළදී සියයට 99.8 ක ඉහළ තත්ත්වයකින් පවත්වා ගෙන යනු ලැබීය.

## 19.2 ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා සැපයීම

**(අ) විදේශ විනිමය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා.**

2019 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් සපයන ලද පසු මෙහෙයුම් කාර්යාල සේවා පහත දැක්වේ.

(i) 2019 වසර තුළදී, විදේශ විනිමය අලෙවි සහ මූල්‍යයන, මුදල් වෙළඳපොළ, ස්ථාවර ආදායම් සුරැකුම්පත්, රන් වෙළඳපොළ ආශ්‍රිත කටයුතු, ආසියානු නිෂ්කාශන සංගමයේ ගනුදෙනු සහ ප්‍රතිමිලදී ගැනුම්/විකුණුම් ගනුදෙනු 11,982 කට අදාළ පියවීම් සිදු කළ අතර, එහි වටිනාකම එක්සත් ජනපද ඩොලර් බිලියන 226.1 ක් විය.

(ii) නව යුරෝක්ලියර් ඊසිවේ පද්ධතිය (Euroclear EasyWay) 2019 දෙසැම්බර් මස 13 වන දින සිට පසු මෙහෙයුම් කාර්යාලය තුළ සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව එතෙක් පැවති යුරෝක්ලියර් EUCLIDPC පද්ධතියෙහි කටයුතු 2020 ජනවාරි මස 12 වන දින සිට නවතා දමන ලදී.

(iii) ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව, නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා දායකත්වය සපයන ලදී.

**(ආ) විවට වෙළඳපොළ කටයුතු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා**

වෙළඳපොළ ද්‍රවශීලතා කළමනාකරණයට පහසුකම් සැලසීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් සමඟ විවට වෙළඳපොළ මෙහෙයුම් ආශ්‍රිත ගනුදෙනු පියවීම් කටයුතු සිදු කරන ලදී. ඒ අනුව, 2019 වසර තුළදී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රුපියල් බිලියන 1,092 ක් වටිනා ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු 467 ක් ද, රුපියල් බිලියන 7,489 ක් වටිනා නිත්‍ය තැන්පතු පහසුකම් ගනුදෙනු 3,854 ක් ද, රුපියල් බිලියන 7,818 ක් වටිනා නිත්‍ය ණය පහසුකම් 7,472 ක් ද, රුපියල් බිලියන 89 ක් වටිනා ස්ථිර පදනම මත මිලදී ගැනීම් ගනුදෙනු 214 ක් ද සිදු කිරීමට සහ පහසුකම් සැලසීමට දායක විය.

## 19.3 ස්විෆ්ට් මූල්‍ය තොරතුරු සන්නිවේදන පද්ධතිය කළමනාකරණය

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් තම මූල්‍යමය සන්නිවේදන කටයුතු සඳහා ස්විෆ්ට් සේවය භාවිතා කරන අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්විෆ්ට් පද්ධතිය භාවිතා කරන සියල්ලන් වෙනුවෙන් එම පද්ධතිය කළමනාකරණය කරනු ලබයි. මෘදුකාංග, දෘඩාංග, ක්‍රියාදාමයන්, ක්‍රියාපටිපාටීන් සහ අවදානම් කළමනාකරණය පාලනයන් සම්බන්ධයෙන් ස්විෆ්ට් මූලස්ථානය මගින් නියම කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් එම පද්ධතිය පවත්වාගෙන යනු ලැබේ. මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යෑම සහ කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ස්විෆ්ට් නෙට් පද්ධතිය සමඟ සම්බන්ධතාවය ලංකා මූල්‍ය සේවා කාර්යාංශ සමාගම හරහා පවත්වා ගනී.

2019 වසරේදී, ස්විෆ්ට් පද්ධතිය, නව සංස්කරණයක් (වෙළුම 7.4.20) සඳහා වැඩි දියුණු කරන ලද අතර කාර්තුමය ආරක්ෂිත යාවත්කාලීන කිරීම් ද තව දුරටත් සිදු කරන ලදී. පද්ධතිය භාවිතා කරන්නන් හට වඩාත් ආරක්ෂිත සහ කාර්යක්ෂම සේවාවන් සැලසීම සඳහා නව සංස්කරණය හඳුන්වා දෙන ලද අතර ස්විෆ්ට් පද්ධතිය, උපක්‍රම සහ මෘදුකාංග ශක්තිමත් කිරීම සඳහා කාර්තුමය ආරක්ෂිත යාවත්කාලීන කිරීම් සිදු කරනු ලබයි. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව මෙම නව සංස්කරණය සාර්ථකව ස්ථාපනය කරන ලද අතර එය ස්විෆ්ට් සේවාව විසින් සපයන පහසුකම් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව ද වසර පුරාම ස්විෆ්ට් අංශයෙහි මනා ආරක්ෂිත මට්ටමක් පවත්වා ගෙන යන ලදී.

## 19.4 ආසියානු නිෂ්කාශන සංගමය යටතේ සිදු කරන ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම

2019 වසරේදී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ආසියානු නිෂ්කාශන සංගමයෙහි සාමාජික රටවල් අතර සුදුසුකම් ලද වෙළෙඳාම සහ වෙළෙඳාම ආශ්‍රිත ගනුදෙනු බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් පදනම මත පියවීම් සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී. ආසියානු නිෂ්කාශන සංගම් යාන්ත්‍රණය හරහා ශ්‍රී ලංකාව, රුපියල් බිලියන 559.7 ක වටිනාකමින් යුතු ගනුදෙනු 6,523 ක් සිදු කරන ලදී. එම යාන්ත්‍රණය යටතේ සිදු කරන ලද ශුද්ධ පියවීම් වල වටිනාකම රුපියල් බිලියන 460.6 ක් විය. නිත්‍ය තාක්ෂණික කමිටුවෙහි ප්‍රාරම්භක රැස්වීම 2019 වසරේ ජූනි මාසයේ දී නේපාලයේ දී පවත්වන ලද අතර, ආසියානු නිෂ්කාශන සංගමයේ මහ ලේකම් සහ සාමාජික රටවල මහ බැංකු සහ මූල්‍ය අධිකාරීන් හතක නියෝජිතයින් මෙම

රැස්වීමට සහභාගි විය. ආසියානු නිෂ්කාශන සංගමයේ 48 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සහ නිත්‍ය තාක්ෂණික කමිටු රැස්වීම 2019 ජූලි මාසයේ දී භූතානයේ පාරෝ නගරයේ දී පැවැත්විණ. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති සහ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මෙම රැස්වීම සඳහා සහභාගි විය.

## 19.5 ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණය

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව නව ගෙවීම් තාක්ෂණයන් හඳුන්වා දීම සඳහා පහසුකම් සලසන ලද අතර විද්‍යුත් ගෙවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය සහ කාර්යක්ෂමතාවය තහවුරු කිරීම සඳහා නියාමන සහ අධීක්ෂණ කටයුතු තවදුරටත් සිදු කරන ලදී. ඒ අනුව, 2019 වසර තුළදී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටු කරන ලදී.

(අ) විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර මගින් සිදු කරන ගෙවීම් කාඩ්පත් ගනුදෙනු හුවමාරුව සහ නිෂ්කාශනය සඳහා පහසුකම් සලසනු ලබන විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සජීවී මෙහෙයුම් කටයුතු 2019 ජුනි මාසයේදී ආරම්භ විය. මෙම යාන්ත්‍රණය මගින් ප්‍රධාන වශයෙන් ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමවේදය යටතේ නිකුත් කරන ලද ගෙවීම් කාඩ්පත් සඳහා හුවමාරු සහ නිෂ්කාශන පහසුකම් සලසනු ලබයි.

(ආ) බ්ලොක්චේන් තාක්ෂණය (Blockchain Technology) පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ නිර්දේශයක් ලෙස පත් කරන ලද බ්ලොක්චේන් තාක්ෂණය පිළිබඳ ක්‍රියාකාරී කමිටුව, බ්ලොක්චේන් තාක්ෂණය මත පදනම් වූ ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීම (KYC) සඳහා වූ හවුල් ක්‍රමවේදයක් සඳහා පහසුකම් සැලසීම නිර්දේශ කරන ලදී. ඒ අනුව, ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා වූ හවුල් ක්‍රමවේදයක් ඇති කිරීම සඳහා සංකල්ප සාධනයක් නිර්මාණය කිරීමට කටයුතු ආරම්භ කරන ලදී.

(ඇ) ගනුදෙනුකරුවන්ට හා වෙළෙඳුන්ට අඩු පිරිවැයකින්, පහසු සහ ආරක්ෂිත ඩිජිටල් ගෙවීම් ක්‍රමවේද සඳහා පිවිසීමේ හැකියාව සැලසීමේ අරමුණ ඇතිව "LANKAQR" යන නාමය සහිත වූ ජාතික QR කේත ප්‍රමිතියක් නිකුත් කරන ලදී. 2019 වසර තුළදී, LANKAQR කේතය භාවිතා කිරීම දිරිමත් කිරීම සඳහා ආදායම් බෙදී යාම වඩාත් ක්‍රමවත් කිරීම සිදු කරන ලද අතර මූල්‍ය සමාගම් කීපයක් විසින් තම ගනුදෙනුකරුවන්ට LANKAQR මත පදනම් වූ ගෙවීම් ක්‍රමවේද හඳුන්වා දෙන ලදී.

(ඈ) නියාමන අවශ්‍යතා උල්ලංඝනය නොවන ආකාරයෙන් තම නිෂ්පාදන සහ සේවාවන් පරීක්ෂා කිරීමට ආරක්ෂාකාරී සහ පාලිත පරිසරයක් නව නිපැයුම් හඳුන්වා දෙන්නන් හට සලසා දීම සඳහා මූල්‍ය තාක්ෂණ නියාමන පරීක්ෂණ අවකාශයක් ස්ථාපනය කිරීම සඳහා කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව, 2019 වසරේදී මූල්‍ය තාක්ෂණ නියාමන පරීක්ෂණ අවකාශ රාමුව සකස් කර අවසන් කරන ලදී.

(ඉ) 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝග යටතේ, බලපත්‍රලාභී ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් ලෙස හරපත් නිකුත් කිරීමට මූල්‍ය ආයතන තුනක් වෙත අවසර ලබා දෙන ලදී. මෙයට අමතරව, බලපත්‍රලාභී ගෙවීම් කාඩ්පත් සේවා සපයන්නෙකු ලෙස ගෙවීම් කාඩ්පත් නිකුත් කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවකට ගෙවීම් කාඩ්පත් පිළිබඳ මූල්‍ය අත්පත්කරුවකු ලෙස කටයුතු කිරීමට ද බලපත්‍රයක් ලබා දෙන ලදී.

(ඊ) ගනුදෙනුකරුවන්ගේ පහසුව වැඩි දියුණු වන සහ වෙළෙඳුන් සඳහා පියවීම් කාර්යක්ෂමතාවය ඇති කරන නව ගෙවීම් ක්‍රමවේද සඳහා මූල්‍ය ආයතන විසින් යොමු කරන ලද යෝජනාවන් සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

(උ) ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධතිවල විශ්වාසනීයත්වය සහ සුමට ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා බලපත්‍රලාභී ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සේවා සැපයුම්කරුවන් වෙත නිකුත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා එම පද්ධති පිළිබඳ එතැන් පරීක්ෂණ සිදු කරන ලදී. මෙයට අමතරව ගනුදෙනුකරුවන්ගේ විද්‍යුත් මුදල් ගිණුම්වලට අදාළ වන පවත්වාගත හැකි විද්‍යුත් ගිණුම් ගණන, ඒකපුද්ගල රාශිගත අගය සීමාව, දින සීමාව සහ ගනුදෙනු සීමාව නිර්ණය කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

(ඌ) විද්‍යුත් ගෙවීම් උපකරණ/ක්‍රමවේද මගින් සිදු කරන ගනුදෙනු සඳහා තත්කාලීන දැනුම්දීම් සිදු කරන ලෙසට මූල්‍ය ආයතන වෙත උපදෙස් ලබා දීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

(එ) හදිසි අවස්ථාවකදී, තම ව්‍යාපාර මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා වන සූදානම තහවුරු කර ගැනීම සඳහා ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙහි ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇගයීමට ලක් කරන ලදී.

## 19.6 ජාතික ගෙවීම් කවුන්සිලය

ගෙවීම් පද්ධති පිළිබඳ උපදේශනාත්මක සහ නිරීක්ෂණ කමිටුව වන ජාතික ගෙවීම් කවුන්සිලය, ගෙවීම් යටිතල පහසුකම් සහ නව්‍ය ගෙවීම් ක්‍රමවේද සංවර්ධනය සහ විද්‍යුත් ගෙවීම් ප්‍රවර්ධනය තුළින් මුදල් භාවිතය අවම කිරීමේ අරමුණ ඇතිව 2020-2022 සඳහා වූ තම පෙර දැක්ම සකස් කරන ලදී. අන්තර් බැංකු ගෙවීම් යටිතල පහසුකම්වල හැකියාව වර්ධනය කිරීම, ගෙවීම් පද්ධති සඳහා නව්‍යකරණය, විද්‍යුත් ගෙවීම් ප්‍රවර්ධනය කරනු ලබන මූල්‍ය සේවාවන් සහ ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව යන අංශ පෙර දැක්මෙන් ආවරණය කරන ලදී. තවද, ගෙවීම් පද්ධති පිළිබඳ මහජනතාවගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග සහ අරමුදල්, දත්ත සහ පද්ධති සුරක්ෂිත කිරීම සඳහා අනුගමනය කළ යුතු යහපුරුදු ද පෙර දැක්මට ඇතුළත් කරන ලදී. ඩිජිටල්

ගෙවීම් වේදිකාව (Digital Payment Platform), විවෘත යෙදුම් ක්‍රමලේඛ අතුරු මුහුණත (Open Application Programming Interface), විවෘත බැංකුකරණය (Open Banking), අතථ්‍ය බැංකුකරණය (Virtual Banking) සහ මූල්‍ය අන්තර්ගතභාවය වැඩි කිරීම සඳහා ගෙවීම් ඩිජිටලීකරණය ප්‍රවර්ධනය යනාදී නව තාක්ෂණයන් සහ සංකල්පයන් පිළිබඳව අවධානය යොමු කිරීම සඳහා මූල්‍ය තාක්ෂණ සංවර්ධනය සඳහා කමිටුවක්, ජාතික ගෙවීම් කවුන්සිලය විසින් පත් කරන ලදී.

ඩිජිටල් ගෙවීම් ක්‍රමවේද ජනප්‍රිය කිරීම, ඩිජිටල් ගෙවීම් පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම, අවම වශයෙන් මුදල් භාවිතා කරන සමාජයක් ගොඩ නැගීම සහ ආර්ථික අභිවෘද්ධිය ඇති කිරීමේ අරමුණ ඇතිව, ජාතික ගෙවීම් කවුන්සිලය විසින් ගන්නා ලද තීරණයකට අනුව 2020 වර්ෂය ඩිජිටල් ගෙවීම් වර්ෂය ලෙස නම් කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

### 19.7 මහජනතාව දැනුම්වත් කිරීම

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රටෙහි ක්‍රියාත්මක ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ තොරතුරු සහ සංඛ්‍යාලේඛන ප්‍රචාරය කිරීම සඳහා නිකුත් කරනු ලබන "කාර්තුමය විවරණිකාව" (Payments Bulletin) ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදී. තවද, අවශ්‍යතාවය මත පදනම්ව, ගෙවීම් පද්ධති සහ වෙනත් සම්බන්ධිත කරුණු පිළිබඳව සාමාන්‍ය ජනතාව සහ බැංකු කාර්යමණ්ඩල දැනුම්වත් කිරීමේ අරමුණින් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙයට අමතරව, විද්‍යුත් ගෙවීම් ක්‍රමවේද භාවිතයෙන් සිදු කරනු ලබන ගනුදෙනු සඳහා තත්කාලීන දැනුම්වත් කිරීම් ලබා ගැනීමේ වාසි පිළිබඳව ගනුදෙනුකරුවන් දැනුම්වත් කිරීමටත් එම පහසුකම ලබා ගැනීම සඳහා ගනුදෙනුකරුවන් උනන්දු කිරීමටත් පුවත්පත් දැන්වීමක් පල කරන ලදී. ගෙවීම් කාඩ්පත් ගනුදෙනුවල ආරක්ෂාව තහවුරු කිරීම, සුරක්ෂිත ගෙවීම් පුරුදු අනුගමනය කිරීම, මංගත ක්‍රමවේද හරහා සිදුවන වංචාවලින් ප්‍රවේසම් වන ලෙස මහජනතාව දැනුම්වත් කිරීම සහ බැංකු කටයුතු සඳහා භාවිතා කරන මුරපද සහ පෞද්ගලික හැඳුනුම් අංක ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳව පුවත්පත් නිවේදනයක් නිකුත් කරන ලදී.

## 20. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ

බැංකුවේ ප්‍රධාන අරමුණු හා මෙහෙයුම් කටයුතු සාක්ෂාත් කර ගැනීම උදෙසා දෙපාර්තමේන්තුවල කටයුතු යොමු කරමින්, ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව බැංකුවේ උපායමාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලියට අදාළ කටයුතු සිදු කරයි. ඒ අනුව, ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වනුයේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීම හා බැංකුවේ ප්‍රධාන අරමුණු නියමිත කාලවකවානුවල දී ඉටු කරගැනීම තහවුරු කර ගැනීම සඳහා වාර්ෂික උපායමාර්ගික කතිකාවත පැවැත්වීම, උපායමාර්ගික ප්‍රමුඛතා හා දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය කාර්තුමය වශයෙන් සමාලෝචනය කිරීම හා අවශ්‍ය නිර්දේශයන් ද සහිතව එම ප්‍රගතිය ආයතනික කළමනාකාරිත්ව කමිටුවට හා මුදල් මණ්ඩලයට වාර්තා කිරීමයි.

### 20.1 2019 ක්‍රියාකාරී සැලසුම සහ 2018-2020 උපායමාර්ගික ප්‍රමුඛතා

2019 ජනවාරි 01 දින නව වසර සඳහා වැඩ ආරම්භ කිරීමේ උත්සවයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ 2019 ක්‍රියාකාරී සැලසුම දියත් කරන ලද අතර 2019 දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුම් පිළිබඳ දැනුවත් කිරීමේ සැසිවාර දෙපාර්තමේන්තු මට්ටමින් පවත්වන ලදී.

දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුම්හි ඇතුළත් උපායමාර්ගික කටයුතු පහත සඳහන් 2018-2020 උපායමාර්ගික ප්‍රමුඛතා හා සම්බන්ධ වේ.

(i) ඵලදායී නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් හඳුන්වා දීම

(ii) තිරසාර වර්ධනයට උරදෙන ගතික සහ ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතු මූල්‍ය ක්ෂේත්‍රයක් ප්‍රවර්ධනය කිරීම

(iii) ගෙවීම් සහ පියවීම් පද්ධතිවල යටිතල පහසුකම් නවීකරණය - අඩු මුදල් භාවිත සමාජයක් කරා මාර්ගය සෑදීම

(iv) ණය තිරසාරභාවය ඇති කිරීම අරමුණු කර ගනිමින් විචක්ෂණශීලී ණය කළමනාකරණය වැඩිදියුණු කිරීම

(v) පුළුල් මානව සම්පත් උපායමාර්ගයක් නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම

(vi) ආයතනගත අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සහ අනුකූලතාව ශක්තිමත් කිරීම

(vii) ජාත්‍යන්තර ගනුදෙනු වාර්තා කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම

### 20.2 ප්‍රගති සමාලෝචනය හා කළමනාකාරිත්වයට වාර්තා කිරීම

උපායමාර්ගික ප්‍රමුඛතා හා දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අගයමින් ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී. 2019 වසරේ දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුම්හි ඇතුළත් ප්‍රධාන කාර්යසාධන දර්ශකවලට අනුව උපායමාර්ගික කටයුතුවල හා මෙහෙයුම් කටයුතුවල ප්‍රගතිය අගයන ලදී. අවධානය යොමු කළ යුතු ගැටළු ඇතුළත්ව සමස්ත ප්‍රගතිය ආයතනික කළමනාකාරිත්ව කමිටුවේ සමාලෝචනයට ද ඉන් අනතුරුව මුදල් මණ්ඩලයට ද වාර්තා කරන ලද්දේ ප්‍රතිපත්ති සමාලෝචන

හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් ද ඇතුළත්වය. 2019 වසරේ අවසානය වන විට උපායමාර්ගික කටයුතුවල හා මෙහෙයුම් කටයුතුවල ප්‍රගතිය පිළිවෙළින් සියයට 93.91 හා සියයට 94.82 ක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත ප්‍රගතිය සියයට 94.64 ක් විය.

තවද, අදාළ ක්‍රියාකාරිත්වය අනුව අන්තර් දෙපාර්තමේන්තු සබඳතා ද සහිතව 2018 දී හඳුන්වා දුන් උපායමාර්ගික ප්‍රමුඛතා ළඟාකර ගැනීමේ ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීම හා 2020 වන විට ඒවා ළඟාකර ගැනීමේ හැකියාව තහවුරු කර ගැනීම උදෙසා කාර්යසාධක බලකා රැස්වීම් පවත්වන ලදී.

### 20.3 2019 උපායමාර්ගික කතිකාවත

උපායමාර්ගික කතිකාවත යනු ඉදිරි වර්ෂයේ දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුම් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව සාකච්ඡා මණ්ඩපයයි. තත්කාලීන ප්‍රවණතාවන් හා බැංකුවේ අරමුණු ළඟා කරගැනීමේ දී අවධානය යොමු කළ යුතු ගැටළු පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡා කරන ලද 14 වන උපායමාර්ගික කතිකාවත මුදල් මණ්ඩල සාමාජිකයින්ගේ හා බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහභාගිත්වයෙන් 2019 නොවැම්බර් 02-03 දිනයන්හි දී මහ බැංකු සන්ථාගාරයේ දී පවත්වන ලදී.

2018 ජනවාරි - 2019 සැප්තැම්බර් කාල පරිච්ඡේදය තුළ උපායමාර්ගික ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හා 2019 දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුම්හි ප්‍රගතිය සිය නිරීක්ෂණයන් ද සහිත ව ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙහි දී ඉදිරිපත් කරන ලද අතර එක් එක් දෙපාර්තමේන්තුව විසින් 2019 තම දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුමේ ප්‍රගතියත් 2020 ක්‍රියාකාරී සැලසුමත් ඉදිරිපත් කරන ලදී.

උපායමාර්ගික ප්‍රමුඛතා හා දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රධාන ප්‍රතිඵල සහ අපේක්ෂිත බලපෑම් උපායමාර්ගික කතිකාවතෙහි දී සාකච්ඡා කරන ලදී. මෙහි දී ඉදිරිපත් කරන ලද යෝජනා අන්තර්ගත කරමින් 2020 ක්‍රියාකාරී සැලසුම් පිළියෙළ කරන ලදී.

## 21. රාජ්‍ය ණය

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, මුදල් නීති පනතේ 113 වන වගන්තියට අනුව රජයේ ණය කළමනාකරණ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම් ඉටු කරයි. මෙම වගකීම් ඉටු කිරීම සඳහා 1950 අගෝස්තු මස 28 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරම්භයත් සමඟ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. විසර්ජන පනතෙහි සඳහන් දළ ණය ගැනීම් අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා අරමුදල් රැස් කිරීම, නියමිත කාලය තුළ රජයේ ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම, රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු පියවීමේ පහසුකම් සුමටව සිදු කිරීම සඳහා ලංකාසෙක්‍යු (LankaSecure) පද්ධතිය මගින් පහසුකම් සැලසීම, මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) රාජ්‍ය සුරැකුම්පත් ලේඛනය පවත්වාගෙන යෑම සහ අවදානම් කළමනාකරණය සඳහා ණය සංයුතියේ සිදුවන වෙනස්වීම් පිළිබඳ විශ්ලේෂණාත්මක කටයුතු වල නියැලීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වේ. මීට අමතරව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ණය කළමනාකරණ සහ වගකීම් කළමනාකරණ උපායමාර්ග තීරණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට දායක වෙමින්, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ පුළුල්ව ව්‍යාප්ත කිරීමේ සහ ගනුදෙනු ප්‍රමාණය වැඩි කිරීමේ අරමුණින් යුතුව කටයුතු කරනු ලබයි.

### 21.1 විසර්ජන පනතට අනුව රජයේ දළ ණය ගැනීම සඳහා අරමුදල් රැස් කිරීම

(අ) 2019 වසරේදී, රජයේ දළ අරමුදල් අවශ්‍යතාවය මූල්‍යයනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුන් මගින් අරමුදල් රැස් කිරීම සිදු කෙරිණි.

(ආ) ඉහත සඳහන් කළ ණය උපකරණ මගින් සිදු කරනු ලැබූ මූල්‍යයන කටයුතු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

**II-28 සංඛ්‍යා සටහන**

**2018 සහ 2019 වසරේ ණය උපකරණ සහ වෙන්දේසි කාර්යසාධනය**

| උපකරණය | 2018 | | 2019 | |
|---|---|---|---|---|
| | නිකුත් කිරීම් (රු.බිලියන) | වෙන්දේසි ගණන | නිකුත් කිරීම් (රු.බිලියන) | වෙන්දේසි ගණන |
| භාණ්ඩාගාර බිල්පත් | 1,653.3 | 51 | 1,719.3 | 52 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 763.0 | 11 | 798.0 | 12 |
| | නිකුත් කිරීම් (එ.ජ. ඩොලර් මිලියන) | වෙන්දේසි ගණන | නිකුත් කිරීම් (එ.ජ. ඩොලර් මිලියන) | වෙන්දේසි ගණන |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB) | 1,492.1 | 6 | 345.2 | 2 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ISB) | 2,500.0 | 1 | 4,400.0 | 2 |

(ඇ) ඉහත සඳහන් කළ සියලුම අරමුදල් රැස්කිරීමේ ක්‍රියාමාර්ග මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගයෙහි සඳහන් වන පිරිවැය-අවදානම් තත්ත්ව ගැළපීම් හා අනුකූල වේ.

### 21.2 රජයේ ණය සේවාකරණ

2019 වසර තුළදී රුපියල් බිලියන 1,199.11 ක දේශීය ණය සේවාකරණ ගෙවීම් සහ රුපියල් බිලියන 823.40 ක විදේශීය ණය සේවාකරණ ගෙවීම් වශයෙන් රුපියල් බිලියන 2,022.51 ක සමස්ත රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් කාලීනව සහ ඵලදායී ලෙස සිදු කරන ලදී.

## 21.3 රාජ්‍ය සුරැකුම්පත් පියවීමේ පහසුකම් සැලසීම

රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු පියවීම සඳහා ලංකාසෙක්‍යු පද්ධතිය භාවිතා කරනු ලැබේ. මෙම පද්ධතිය ඔවුන් වෙනුවෙන් සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් වන අනෙකුත් ආයෝජකයින් වෙනුවෙන් ගිණුම් පවත්වාගෙන යනු ලබන සෘජු අලෙවි සහභාගීකරුවන් 34 දෙනෙකුගෙන් (බලපත්‍රලාභී වාණිජ බැංකු 26 ක් සහ ප්‍රාථමික අලෙවි සමාගම් 8 ක්) සහ ඔවුන් වෙනුවෙන් පමණක් ගිණුම් පවත්වාගෙන යනු ලබන සෘජු සහභාගීකරුවන් 3 දෙනෙකුගෙන් (කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා මහ බැංකුව සහ සේවක අර්ථසාධක අරමුදල) සමන්විත වේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ලංකාසෙක්‍යු පද්ධතියෙහි මෙහෙයුම් අඛණ්ඩව හා තත්කාලීනව සිදුවන බව සහතික කරමින් පියවීමේ කටයුතුවලට අදාළ පහසුකම් සැලසීමේ ප්‍රධාන කාර්යභාරය ඉටු කරයි. 2019 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට සමස්ත නිර්ලේඛිත සුරැකුම්පත්වල මුහුණත වටිනාකම රුපියල් බිලියන 5,584.2 ක් වූ අතර එය රුපියල් බිලියන 897.7 ක් වූ භාණ්ඩාගාර බිල්පත්වලින් සහ රුපියල් බිලියන 4,686.5 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කරවලින් සමන්විත විය.

## 21.4 රාජ්‍ය සුරැකුම්පත් ලේඛනය පවත්වාගෙන යෑම

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම තැන්පතු පද්ධතියෙහි රාජ්‍ය සුරැකුම්පත් හිමිකාරීත්වයේ සිදුවන වෙනස්කම් යාවත්කාලීනව පවත්වාගෙන යෑම, රජයේ සුරැකුම්පත් සුරක්ෂිත කිරීමට උපකාරී විය. මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන්ට හිමිකම්, ගනුදෙනු හා ගෙවීම් වශයෙන් වූ කාලීන ප්‍රකාශයන් යැවීමේ කාර්යය වසර පුරා අඛණ්ඩව සිදුවිය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2019 වසර තුළ විද්‍යුත් තැපෑල මගින් විද්‍යුත් ප්‍රකාශනයන් 1,551 ක් සහ සාමාන්‍ය තැපෑල මගින් අර්ධ වාර්ෂික හිමිකම් ප්‍රකාශන 14,113 ක්, මාසික ගනුදෙනු ප්‍රකාශන 38,467 ක් සහ ගෙවීම් ප්‍රකාශන 16,184 ක් මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන් වෙත යවන ලදී. 2019 වසරේ දෙසැම්බර් මස අග වන විට මධ්‍යම තැන්පතු පද්ධතියේ මුළු ලියාපදිංචි ගිණුම් හිමියන් සංඛ්‍යාව 93,911 ක් විය. තවද, රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජන සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා හඳුන්වාදෙනු ලැබූ ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් වශයෙන් මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන්ට තම යාවත්කාලීන ගිණුම් තොරතුරු අන්තර්ජාල ගිණුමක් හරහා පරීක්ෂා කිරීමේ පහසුකම ලබා දෙන ලදී.

## 21.5 ක්‍රියා පිළිවෙත ප්‍රතිසංස්කරණය කිරීම

රජයේ සුරැකුම්පත් වෙළඳපොළ සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව එහි කාර්යක්ෂමතාවය, සඵලතාවය සහ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා 2019 වසර තුළ පහත සඳහන් පද්ධති වැඩිදියුණු කිරීම් ක්‍රියාවට නංවන ලදී.

### (අ) සක්‍රීය වගකීම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2018 මාර්තු මාසයේ දී සක්‍රීය වගකීම් කළමනාකරණ පනත (Active Liability Management Act-ALMA) සම්මත කරන ලද අතර ඒ යටතේ 2019 ජූලි මාසයේ දී, ණය වශයෙන් රුපියල් බිලියන 480 ක අරමුදල් රැස් කිරීම සඳහා වූ යෝජනාව ද සම්මත කරන ලදී. මෙමගින් ශ්‍රී ලංකා රජයට, ඉදිරි කාලය තුළදී මුහුණ දීමට සිදුව ඇති ප්‍රතිමූල්‍යායන අවශ්‍යතාවයන් කල්තියා හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මගින් ණය ඒකරාශී වීම අවම කිරීමට හා අන්තර්ජාතික ස්වෛරීත්ව බැඳුම්කර ඇතුළු ණය කළඹෙහි කල් පිරීමේ කාලය දීර්ඝ කිරීම සහ/හෝ ආපසු ගෙවීම් ව්‍යුහය සුමට කිරීම සඳහා සක්‍රීය ලෙස මැදිහත්වීමට අවකාශය සලසයි. වගකීම් කළමනාකරණය ආධාරයෙන් ශ්‍රී ලංකා රජයට, ආයෝජන පදනම විවිධාංගීකරණය කිරීම, වෙළඳපොළ තත්ත්වයන් පදනම් කරගනිමින් ණය පිරිවැය පාලනය සඳහා ඉඩප්‍රස්ථා සැලසීම, වගකීම් කළඹෙහි කාලසීමාව දීර්ඝ කිරීම, ඉදිරි කාලය තුළ ප්‍රතිමූල්‍යකරණ අවදානම අඩු කිරීම සහ ඕනෑම නව නිකුතුන් සඳහා හිතැති මිල පරිසරයක් ඇති කිරීම ආදී දෑ සඳහා අවශ්‍ය පසුබිම සැලසේ. මේ සම්බන්ධයෙන්, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් එහි වගකීම් කළමනාකරණය පාදක කරගත් පළමු ක්‍රියාවලිය ලෙස දේශීය වෙළඳපොළ තුළ අරමුදල් රැස්කිරීම හා අවශ්‍ය සංචිත ගොඩනැගීමේ අරමුණින් යුතුව, 2019 ඔක්තෝබර් හා දෙසැම්බර් යන මාසයන්හිදී රුපියල් බිලියන 15 බැගින් වූ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුන් සිදුකරන ලදී. 2019 වසරේදී මෙසේ ගොඩනගන ලද සංචිත, 2020 වසරේ මුල් භාගයෙහි ණය සේවාකරණ වගකීම් පියවීම සඳහා උපයෝජනය කිරීමට අපේක්ෂිතය. එමෙන්ම ශ්‍රී ලංකා රජය විසින් 2019 වසරේ අග භාගයේදී විකල්ප ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වෙළඳපොළවල් වෙත ප්‍රවේශවීම සඳහා වන මූලික කටයුතු ද ආරම්භ කර ඇත.

### (ආ) 2019-2023 කාල පරිච්ඡේදය සඳහා වන මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව හා මුදල් හා සැලසුම් අමාත්‍යාංශය ඒකාබද්ධව ශ්‍රී ලංකාව සඳහා වන මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සකස් කොට 2019 අප්‍රේල් මාසයේ දී එය ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී. මෙමගින්, සුදුසු සංයුතියකින් රජයේ මුදල් ප්‍රවාහ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය අරමුදල් රැස් කිරීම හා විචක්ෂණශීලී අවදානම් මට්ටමක් සහිතව රජයේ මූල්‍ය අවශ්‍යතා අවම පිරිවැයකින් සපුරාලීම සහතික කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයනු ලැබේ. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය මගින් 2018 වසරේ පැවැති මට්ටමට අනුකූලව විදේශ මුදල් ණය නිරාවරණය පවත්වාගෙන යාම, විදේශ මුදල් ණය කළඹෙහි සාමාන්‍ය පරිණත කාලය ඉහළ නැංවීම හා 2023 වසර අවසානය වන විට වසරක් තුළ පරිණත වන ණය ප්‍රමාණය අඩු කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් අවධානය යොමුකරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව හා ශ්‍රී ලංකා රජය එක්ව 2019 මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගයෙන් පෙන්නුම් කරන සියලුම ණය නිර්ණායකයන්හි වර්ධනයන් ළඟා කරගෙන ඇති අතර විදේශ මුදල් ණය කළඹෙහි සාමාන්‍ය පරිණත කාලය ඉහළ නැංවීම හා 2023 වසර අවසානය වන විට වසරක් තුළ පරිණත වන ණය ප්‍රමාණය අඩු කිරීම ඒ අතර වැදගත් වේ.

**(ඈ) ලංකාසෙක්‍යුහි මධ්‍යම තැන්පතු පද්ධතියෙහි ලියාපදිංචි ගනුදෙනුකරුවන් වෙත කෙටි පණිවිඩ /විද්‍යුත් තැපැල හරහා තත්කාලීන දැනුම්දීමේ සේවාව**

ලංකාසෙක්‍යු පද්ධතියෙහි සෑම සුරැකුම්පත් ගිණුමකම නිර්ලේඛිත සුරැකුම්පත්වල සිදුවන සෑම එක් එක් හර හා බැර සටහනක් සඳහාම කෙටි පණිවිඩ සේවාව මගින් සහ/හෝ විද්‍යුත් තැපැල මගින් එහි ගනුදෙනුකරුවන්ට තත්කාලීනව දැනුම් දීම 2019 මාර්තු 25 දින ක්‍රියාත්මක කරන ලදී.

**(ඇ) ප්‍රාථමික වෙන්දේසි ක්‍රියාවලියේ පුරෝකථනය හා විනිවිදභාවය වැඩිදියුණු කිරීම**

රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික වෙන්දේසි ක්‍රියාවලියේ පුරෝකථනය සහ විනිවිදභාවය තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින් යාවත්කාලීන වෙමින් පවතින කාර්තුමය වෙන්දේසි දින දර්ශනය 2019 වසර තුළදී මාස හයක් ආවරණය වන පරිදි පුළුල් කරමින්, වැඩි දියුණු කරන ලද අතර, 2019 ජූලි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ආවරණය වන පරිදි භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි දින දර්ශනය මුදල් අමාත්‍යාංශයේ ද එකඟතාවයෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

## 21.6 ඉදිරි දැක්ම

(අ) දේශීය වෙළඳපොළෙහි රාජ්‍ය ණය ගැනීමේ විනිවිදභාවය හා කාර්යක්ෂමතාවය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා, ප්‍රාථමික වෙළඳපොළ සඳහා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ නව පද්ධතියක් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ප්‍රාථමික නිකුතුන් සඳහා ඉලෙක්ට්‍රොනික ලංසු තැබීමේ පද්ධතියක් නිර්මාණය කිරීමේ හැකියාව සොයා බැලීමට අපේක්ෂිතය. භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ නව ප්‍රාථමික නිකුතු පද්ධතියේ වෙළඳපොළ පදනම් වූ නිකුත් කිරීම සහ වෙළඳපොළ සහභාගීවන්නන් හට භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අවශ්‍ය වන ලංසු ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා භාණ්ඩාගාර බැඳුම්කර නිකුතු පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කිරීමට අපේක්ෂිතය.

(ආ) රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි විචක්ෂණශීලී නීති සම්පාදනය කිරීමේ අරමුණින්, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත (Registered Stocks and Securities Ordinance-RSSO) සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත (Local Treasury Bills Ordinance - LTBO) යටතේ වන රෙගුලාසි සහ නියෝග මේ වන විට සමාලෝචනය කරමින් පවතින අතර අවශ්‍ය සංශෝධන යෝජනා කර ඇත.

(ඇ) 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ද්විතීයික වෙළඳපොළ තුළ රජයේ සුරැකුම්පත් ගනුදෙනු වල විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා, සෑම ගනුදෙනුවකම පියවීම් වටිනාකම, මිල සහ පොලී අනුපාතය වැනි ප්‍රධාන ලක්ෂණයන් ඇතුළත් කිරීම සඳහා ලංකාසෙටල් පද්ධතියේ සියලුම සහභාගිවන්නන්ට චක්‍රලේඛයක් 2019 ඔක්තෝබර් 01 දින නිකුත් කරන ලදී.

(ඈ) ද්විතීයික වෙළඳපොළේ රජයේ සුරැකුම්පත් ගනුදෙනු පුළුල්ව ව්‍යාප්ත කිරීම සහ ගනුදෙනු ප්‍රමාණය වැඩි කිරීමේ අරමුණින්, අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ ඇතුළත්ව රජයේ සුරැකුම්පත් සඳහා වෙන් වූ විද්‍යුත් ගනුදෙනු පද්ධතියක්, මධ්‍යම ප්‍රතිපාර්ශ්ව පද්ධතියක් සහ වැඩිදියුණු කළ මධ්‍යම සුරැකුම්පත් තැන්පතු පද්ධතියක් ස්ථාපිත කිරීමෙහි ලා ගෙන ඇති මූලික ක්‍රියාමාර්ග යන්හි ප්‍රගතියක් 2019 වර්ෂය තුළදී දක්නට ලැබුණි.

## 21.7 ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම සමාලෝචනය කිරීමේ දූත මණ්ඩල සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු සම්බන්ධීකරණය

2019 වසරේදී ශ්‍රී ලංකාව වෙනුවෙන් ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් ලබාගැනීමේ අරමුණින් ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතනවලට (ෆිච් රේටින්ග්ස් ලිමිටඩ්, මූඩීස් ඉන්වෙස්ටර් සර්විසස්, ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස්), ඒවායේ වාර්ෂික ශ්‍රේණිගත කිරීමේ සමාලෝචන සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී.

ශ්‍රී ලංකාව විසින් 2019 වසරේදී සාර්ථක ලෙස ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුන් දෙකක් සිදු කරන ලදී. මේ අතරින් පළමු නිකුතුව ලෙස 2019 මාර්තු මාසයේ දී, එ.ජ. ඩොලර් බිලියන 1 ක් හා එ.ජ. ඩොලර් බිලියන 1.4 ක් වටිනා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් පිළිවෙළින් වසර 5 ක හා වසර 10 ක පරිණත කාලයන්ට යටත්ව 6.85% ක හා 7.85% ක පොලී අනුපාතයන් යටතේ නිකුත් කරන ලදී. දෙවන නිකුතුව 2019 ජුනි මාසයේදී එ.ජ.ඩොලර් බිලියන 0.5 ක හා එ.ජ ඩොලර් බිලියන 1.5 ක වටිනාකමකින් යුක්තව සිදු කළ අතර පිළිවෙළින් වසර 5 ක හා වසර 10 ක (දිගු) පරිණත කාලයන්ට යටත්ව 6.35% ක හා 7.55% ක පොලී අනුපාතයන් යටතේ නිකුත් කරන ලදී.

# 22. ප්‍රාදේශීය සංවර්ධන

සාම්ප්‍රදායික ණය මෙහෙයුම් කටයුතු තවදුරටත් ව්‍යාප්ත කරමින් 2019 වර්ෂයේ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවර්ධන මූල්‍ය මුලපිරීම්වලට අදාළ නව ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග ගොඩනැංවීම සහ ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙම නව ප්‍රතිපත්තිමය උපාය මාර්ග සහ ක්‍රියාමාර්ග මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ධාරිතාව ශක්තිමත් වූ අතර, එතුළින් රටෙහි සියලු දෙනාම ඇතුලත් වූ ස්ථායී මූල්‍ය පද්ධතියක් මෙන්ම තුලිත ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමෙන් සමස්තයක් ලෙස රටෙහි මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමට හැකි විය.

පෙර වර්ෂයේ මෙන්ම 2019 වර්ෂයේ දී ත් ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකා මහ බැංකුව, විදේශ ආධාර සපයන නියෝජිත ආයතන සහ සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් අරමුදල් සපයන ලද විවිධ ප්‍රතිමූල්‍ය, පොළී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම සම්බන්ධීකරණය, පහසුකම් සැලසීම සහ ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින්

අඛණ්ඩවම සිදු කරන ලදී. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට සහ රට පුරා විසිරී සිටින තනි තනි පුද්ගලන්ට සිය ව්‍යාපාර කටයුතු වැඩිදියුණු කිරීම සඳහා දැරිය හැකි මූල්‍ය පහසුකම් ලබාදීම මෙම ණය යෝජනා ක්‍රමයන්හි මූලික අරමුණ විය. කෘෂි කාර්මික හා සත්වපාලන, කර්මාන්ත හා සේවා යනාදී ආර්ථිකයේ සියලුම අංශයන්හි පුද්ගලයින් හට මෙම ණය යෝජනා ක්‍රම යටතේ ප්‍රතිලාභ ලබාදෙනු ලබයි. තවද මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීමත්, ආර්ථිකයේ අවදානමට ලක් විය හැකි කණ්ඩායම් අතර ව්‍යවසායකත්ව කුසලතා ප්‍රවර්ධනය කිරීමත් අරමුණු කරගනිමින් ණය අතිරේකකරණ සේවාවන් රාශියක් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සපයන ලද අතර මේ සඳහා වර්ෂය පුරාම මූල්‍ය සාක්ෂරතාවය සහ කුසලතා සංවර්ධන වැඩසටහන් ගණනාවක්ම පවත්වන ලදී. ඒ හැරුණු විට, මූල්‍ය සාක්ෂරතා මට්ටම සහ ව්‍යවසායකත්ව සංවර්ධනය ඉහළ නැංවීම සඳහා පරිපූර්ණ වූ දැනුම්වත් කිරීමේ වැඩසටහන් රාශියක් දිවයින පුරා පවත්වන ලද අතර ඒ සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය සඵලදායි ලෙස භාවිතා කරන ලදී. ප්‍රතිපත්තිමය දෘෂ්ටි කෝණයෙන් බලන කල, රටේ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා ජාතික උපායමාර්ගයක් පිළියෙළ කිරීම අවසන් කර එය 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කළ බැවින් 2019 වර්ෂය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා අභියෝගාත්මක වූ නමුත් සාර්ථක වර්ෂයක් විය. තවද, ඉලක්කගත කණ්ඩායම්වල වෙනස් වන අවශ්‍යතා සපුරාලීම සඳහා නව යෝජනා ක්‍රම හඳුන්වාදීමට ක්‍රියාමාර්ග කීපයක්ම ගන්නා ලදී.

## 22.1 සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම

ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකා මහ බැංකුව, විදේශ ආධාර සපයන නියෝජිත ආයතන යනාදි ප්‍රධාන අරමුදල් ප්‍රභව තුන යටතේ වැඩි පිරිසක් වෙත මූල්‍ය පහසුකම් ලබාදීම තුළින් මූල්‍ය පරාසය ඉහළ නැංවීම සඳහා ප්‍රතිමූල්‍ය, පොළී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම 10 ක් ක්‍රියාත්මක කරමින් 2019 වර්ෂයේ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව එහි ණය මෙහෙයුම් කටයුතු අඛණ්ඩවම සිදු කරන ලදී. 2019 වර්ෂයේ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රමවල සාරාංශය පහත සංඛ්‍යා සටහන II-29 හි දක්වා ඇත.

ප්‍රතිලාභීන්හට ඉදිරි අභියෝගවලට ශක්තිමත් මූල්‍ය පදනමකින් හා ඉහළ ආත්ම විශ්වාසයකින් යුතුව මුහුණ දීමට හැකිවනු පිණිස, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 8 ක් සහ පොළී සහනාධාර යෝජනා ක්‍රම 2 ක් මගින් සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා ණය ප්‍රතිලාභීන් 104,238 ක් සඳහා රුපියල් මිලියන 15,320 ක මුදල් ප්‍රමාණයක් 2019 වර්ෂයේ දී මුදා හැර ඇත. මෙම මුදා හැරීම්වලින් සියයට 67.9 ක බහුතර ණය ප්‍රමාණයක් පොළී සහනාධාර ක්‍රම හරහා මුදා හරිමින් විශාල කාර්යභාරයක් ඉටු කළ අතර, ඉතිරි සියයට 32.1 ක ප්‍රමාණයක් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම හරහා මුදා හැර ඇත. 2019 වර්ෂයේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද මෙම ණය යෝජනා ක්‍රම සඳහා ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකා මහ බැංකුව සහ විදේශ ආධාර සපයන නියෝජිත ආයතන යටතේ ලබා දී ඇති ණය ප්‍රමාණය පිළිවෙලින් සියයට 72 ක් සියයට 23.6ක් සහ සියයට 4.4 ක් වේ.

2019 වර්ෂයේ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනාක්‍රමවල තත්ත්වයන් සහ මෙම යෝජනා ක්‍රම සම්බන්ධ නව ප්‍රවණතාවයන් පහත දැක්වේ.

### 22.1.1 ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයනු ලබන ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම

2019 වර්ෂය තුළදී, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 4 ක් සහ පොළී සහනාධාර යෝජනා ක්‍රම 1 ක් ඇතුළත්ව ශ්‍රී ලංකා රජය මගින් අරමුදල් සපයන ලද ණය යෝජනා ක්‍රම 5 ක් යටතේ රුපියල් මිලියන 11,034 ක් එනම් 2019 වර්ෂයේ දී මුදා හරින ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 72 ක් ප්‍රතිලාභීන් 96,220 ක් අතරේ මුදා හරින ලදී.

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (සරුසාර), එහි කැපී පෙනෙන කාර්යසාධනය අඛණ්ඩවම පවත්වාගෙන යමින්, කෙටිකාලීන භෝග වර්ග 33 ක් සඳහා කුඩා පරිමාණයේ ගොවීන් 86,301 ක් වෙත පොළී සහනාධාර සපයන ලදී. ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ලෙස සහ පොළී සහනාධාර යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වන නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ 2019 වර්ෂයේ දී සිදු කරන ලද මුළු ණය මුදා හැරීම්වලින් සියයට 67.7 ක් සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල් සපයන ලද ණය යෝජනා ක්‍රම යටතේ සිදු කරන ලද මුළු ණය මුදාහැරීම් වලින් සියයට 94 ක් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ මුදා හැර ඇත. රටේ කෘෂි කාර්මික සංවර්ධන සඳහා සැලකිය යුතු දායකත්වයක් දක්වමින්, සරුසාර ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 224 ක පොළී සහනාධාර ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය විසින් සපයා ඇති අතර රුපියල් මිලියන 10,370 ක ණය මුදල් ප්‍රමාණයක් සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි අරමුදල් මගින් මුදා හැර ඇත. 2018 වර්ෂයේ දී, මුළු ණය මුදා හැරීම්වලින් ප්‍රමුඛත්වය ගෙන සිටි අම්පාර දිස්ත්‍රික්කය අභිභවමින් අනුරාධපුර දිස්ත්‍රික්කය, 2019 වර්ෂයේ දී සරුසාර ණය යෝජනා ක්‍රමය යටතේ සිදු කරන ලද මුළු ණය මුදා හැරීම්වලින් වැඩිම ණය මුදල් ප්‍රමාණයක් මුදා හරින ලද දිස්ත්‍රික්කය බවට පත්වීමට යළිත් වරක් සමත් විය. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් වෙත මුදා හරින ලද ණය ප්‍රමාණය සියයට 13.1 ක් එනම්, රුපියල් මිලියන 1,360 ක් වන අතර, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ මුදා හරින ලද ණය ප්‍රමාණයෙන් සියයට 12.3 ක් එනම් රුපියල් මිලියන 1,227 ක් ප්‍රතිලාභීන් වෙත මුදා හරිමින් දෙවැනි ස්ථානයට අම්පාර දිස්ත්‍රික්කය පත් වූ අතර ඊළඟ ස්ථානයට පත් වූ පොළොන්නරුව දිස්ත්‍රික්කය, සියයට 10.8 ක් එනම් රුපියල් මිලියන 1,124 ක් ප්‍රතිලාභීන් වෙත මුදා හරින ලදී.

දරිද්‍රතාව පිටුදැකීම, ව්‍යවසායකත්ව සංවර්ධනය, රැකියා උත්පාදනය සහ ආපදාවට ලක් වූ ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය කිරීම යනාදී පුළුල් අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 4 ක් එනම්, දිළිඳුකම පිටු දැකීම සඳහා වන

**II-29 සංඛ්‍යා සටහන**

**ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා වැඩසටහන්**

| අරමුදල් ප්‍රභවය | ණය වැඩසටහනේ/සහනදායී ණය යෝජනා ක්‍රමයේ තොරතුරු | | | | | |
|---|---|---|---|---|---|---|
| | නම | අරමුණ | ප්‍රතිමූල්‍ය/ පොලී සහනාධාර | 2019 මුදාහරින ලද අරමුදල් ප්‍රමාණය | ණයගැතියා ගෙවිය යුතු වාර්ෂික පොලී අනුපාතය (වසර අවසානයේ දී) | වෙනත් කරුණු |
| ශ්‍රී ලංකා රජයේ අරමුදල් | දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල (PAMP-RF) | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය හා විධිමත් බැංකු පද්ධතිය හා සම්බන්ධ වීමට අඩු ආදායම්ලාභී කණ්ඩායම් සංවිධානය කිරීම තුළින් දිළිඳුකම පිටු දැකීම | ප්‍රතිමූල්‍ය | රු. මිලියන 463 | 12% | |
| | ස්වශක්ති ණය යෝජනා ක්‍රමය | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල නිරත වී සිටින ව්‍යවසායකයන් සහ එම අංශයට අලුතින් ඇතුලත් වන ව්‍යවසායයන් සඳහා රැකියා අවස්ථා උත්පාදනය කිරීම | ප්‍රතිමූල්‍ය | රු.මිලියන 55 | 5.5% | |
| | ආපදාවලින් හානියට පත් ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා වූ අත්වැල ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද ඕනෑම ආපදාවකින් හානියට පත් ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම | ප්‍රතිමූල්‍ය | රු.මිලියන 88 | 2% | |
| | ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය | තමන්ගේම ස්වයං රැකියා ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් පුහුණුව ලැබූ තරුණ පිරිස් සඳහා මූල්‍ය සහය ලබා දීම | ප්‍රතිමූල්‍ය | රු.මිලියන 57 | 7% | |
| | (සරුසාර) නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය | වී සහ කෙටි කාලීන බෝග වගාවේ නිරත ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ගොවීන්ගේ සමාජ හා ආර්ථික තත්ත්වය නගා සිටුවීම | පොලී සහනාධාර සහ ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයකි | රු.මිලියන 10,370 | 7% | සහභාගිත්ව මූල්‍ය ආයතනවල අරමුදල් සහ ශ්‍රී ලංකා රජයේ පොලී සහනාධාර මගින් |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ආරම්භ කිරීමට හෝ වැඩිදියුණු කිරීමට හා ආපදාවකින් විපතට පත් ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා | ප්‍රතිමූල්‍ය | රු. මිලියන 3,576 | 8% | |
| | මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය | වාණිජ මට්ටමේ කිරි ගොවිපළවල් ප්‍රවර්ධනය කිරීම තුළින් සහ කිරි නිෂ්පාදනය තුළින් ස්වයංපෝෂිත වීම අත්පත් කර ගැනීමට සහාය වීම | පොලී සහනාධාර | රු. මිලියන 38 | 6% | සහභාගිත්ව මූල්‍ය ආයතනවල අරමුදල් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ පොලී සහනාධාර මගින් |
| ප්‍රදානිත අරමුදල් | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන - ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ නිෂ්පාදකයන්ගේ දිළිඳුකම අඩු කිරීමට හා තරඟකාරිත්වයට දායක වීම සහ වාණිජ අරමුණින් නිෂ්පාදනයේ සහ අලෙවිකරණ පද්ධතියේ නියුතු කුඩා පරිමාණ නිෂ්පාදකයන් 57500 කගේ ආදායම හා ආහාරවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම | ප්‍රතිමූල්‍ය | රු. මිලියන 58 | 6.5% | කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල විසින් අරමුදල් සපයයි |
| | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන - කාලීන ණය යෝජනා ක්‍රමය | | ප්‍රතිමූල්‍ය | රු. මිලියන 600 | 6.5% | |
| | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන - තුරුණු ණය යෝජනා ක්‍රමය | | ප්‍රතිමූල්‍ය | රු. මිලියන 15 | 6.5% | |

ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘති චක්‍රීය අරමුදල (PAMP RF) ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය අදියර II (SEPI - Phase II) ස්වශක්ති ණය යේජනා ක්‍රමය සහ අත්වැළ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී.

වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි සහයෝගය ඇතිව තේ නැවත වගා කිරීමෙහි සහ රබර් නව රෝපණ කටයුතුවල නියැළී සිටින කුඩා වතු හිමියන්ට සහය දැක්වීම සඳහා 2019 වර්ෂයේ දී කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන පොළී සහනාධාර යෝජනා ක්‍රමය සැලසුම් කරන ලදී.

නව වගාවන් තුළින් නිෂ්පාදනය ජනනය වන තුරු ස්වයං රැකියා හෝ කෙටිකාලීන ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ඇති කිරීම සඳහා තේ සහ රබර් කුඩා වතු හිමියන්ට සහනදායි ණය පහසුකම් ලබාදීම කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන පොළී සහනාධාර යෝජනා ක්‍රමය මගින් අපේක්ෂා කෙරේ.

කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල මගින් අරමුදල් සපයනු ලබන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන පොළී සහනාධාර යෝජනා ක්‍රමය සඳහා ශ්‍රී ලංකා රජය මගින් අරමුදල් සපයනු ලබයි. මෙයට අදාළව

ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර පරිපාලන ගිවිසුමක් අත්සන් කිරීමට අදාළ කටයුතු ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. ඒ අනුව, කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන පොළී සහනාධාර යෝජනා ක්‍රමයට අදාළ මෙහෙයුම් උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කුඩා තේ කර්මාන්ත සහ රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි සහය ඇතිව මෙම පොළී සහනාධාර යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කටයුතු 2020 වර්ෂයේ පළමු කාර්තුවේ දී ආරම්භ වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා රජය මගින් ක්‍රියාත්මක කරන ලද ''ව්‍යවසායි ශ්‍රී ලංකාවක්'' වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන රන් අස්වැන්න, ගොවි නවෝදා, ජය ඉසුර, දිරි සවිය, කාරක ප්‍රාග්ධන සහ හරිත ණය යෝජනා ක්‍රම මගින් ලබාදෙන ලද ණය සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ශ්‍රී ලංකා මහ බැංකුව හරහා රජයේ ඇපකර ලබාදීම අරමුණු කරගනිමින් නව ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා වන පරිපාලන ගිවිසුම ශ්‍රී ලංකා රජය සමඟ අත්සන් කරන ලදී.

දිගුකාලීන සංවර්ධන ව්‍යාපෘතිවල සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්හි අරමුදල් අවශ්‍යතා සපුරාලීමත්, ශ්‍රී ලංකාවේ අපනයන අරමුණු කරගත් ව්‍යවසායයන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ඉටුකරදීමත් අරමුණු කර ගනිමින් 2019 වර්ෂයේ දී සංවර්ධන මූල්‍යකරණය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ශ්‍රී ලංකා රජය මගින් අරමුදල් සපයන ලබන නව ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට සැලසුම් කෙටුම්පත් සකස් කරන ලදී.

තරුණ ව්‍යවසායකයන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය මූල්‍යමය සහය ලබාදීම අරමුණු කර ගනිමින් ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය අදියර II යටතේ වෙන් කරන ලද මුළු මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 390 සිට මිලියන 950 දක්වාත් එක් ණය ගැතියෙකු සඳහා වන උපරිම ණය මුදල රුපියල් 500,000 සිට රුපියල් 1,000,000 දක්වා ඉහළ නැංවීමටත් කටයුතු කරන ලදී.

ආර්ථික වර්ධනය වේගවත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක ණය සහන යෝජනා ක්‍රමය යටතේ දැනට අක්‍රිය ණය කාණ්ඩයෙහි සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා නව ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් සැලසුම් කරන ලදී.

### 22.1.2 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් සපයනු ලබන ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්හි මූල්‍යමය ව්‍යාප්තිය පුළුල් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමය හා මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය සඳහා අරමුදල් අඛණ්ඩවම සපයන ලද අතර, සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ලෙස සහ මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය පොළී සහනාධාර ණය යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ.

පෙර වර්ෂයන්හි දී මෙන්ම 2019 වර්ෂයේ දී ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම අතර වඩාත්ම ඉල්ලුමක් පැවති සහ ජනප්‍රියම ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය වූයේ "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමයයි. එම ණය යෝජනා ක්‍රමය යටතේ 2019 වර්ෂය අවසානය වන විට රුපියල් මිලියන 3,576 ක වටිනාකමින් යුතු ණය මුදල් ප්‍රමාණයක් ප්‍රතිලාභීන් අතර මුදා හැර ඇත. 2019 පාස්කු ඉරිදා සිද්ධිය හේතුවෙන් සංචාරක කර්මාන්තයට ඇති වූ අහිතකර බලපෑමෙන් පසුව "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමය යටතේ සංචාරක අංශයට ලබා දී ඇති ණය සඳහා තාවකාලික අත්හිටුවීමක් ලබා දීමට ද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කර තිබීම ඉතා වැදගත් කරුණකි. 2019.05.08 දිනැති ශ්‍රී ලංකා මහ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2019 අංක 07 දරන චක්‍රලේඛයට අනුව සංචාරක කර්මාන්තයේ නිරත පුද්ගලයින්ට සහ ආයතනවලට ලබා දී ඇති ණය සඳහා තාවකාලික අත්හිටුවීමක් ලබා දෙන ලෙස බලපත්‍රලාභී බැංකුවලින් ඉල්ලා ඇත. කිරිවලින් ස්වයංපෝෂිත වීමේ ජාතික අරමුණට සහාය වෙමින් සියලුම කිරි ආශ්‍රිත ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි කිරි ගොවීන් හට මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත පොළී සහනාධාර ලබා දෙන ලදී.

### 22.1.3 ප්‍රදානිත අරමුදල් මගින් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩ සටහනේ (SAPP) ප්‍රදානිත අරමුදල් සංරචකය 2019 වර්ෂය පුරා ද අඛණ්ඩවම ක්‍රියාත්මක කරන ලදී. කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) මගින් මූල්‍යනය කරන ලද මෙම සංරචකයට රජ්‍ය, පෞද්ගලික, නිෂ්පාදක හවුල්කාරිත්ව (4P) ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය, කාලීන ණය යෝජනා ක්‍රමය සහ තුරුණු ණය යෝජනා ක්‍රමය ඇතුලත් වේ. 2019 වර්ෂය තුළදී මෙම ණය යෝජනා ක්‍රම යටතේ රුපියල් මිලියන 672 ක් ප්‍රතිලාභීන් 3,251 ක් අතරේ මුදා හරින ලදී. ප්‍රදානිත අරමුදල් මගින් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම හරහා මුදා හරින ලද ණය ප්‍රමාණය ශ්‍රී ලංකා මහ බංකුව විසින් සිදු කරන ලද මුළු ණය මුදා හැරීම්වලින් සියයට 4.4 ක් පමණ වේ.

කෘෂි කාර්මික අංශය මෙන්ම අනෙකුත් අදාළ අංශයන්හි ප්‍රතිලාභීන්ගේ වෙනස් වන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා වැඩසටහන් කළමනාකරණ ඒකකයෙහි දායකත්වයද සහිතව කුඩා පරිමාණ ව්‍යාපාර කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහනෙහි ණය සංරචකයේ මූලික ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කරන ලදී. මෙම ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණු ලෙස, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහනේ ශ්‍රී ලංකා රජය මගින් සහ කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල මගින් මූල්‍යනය වන සංරචක දෙකෙහිම ණය මෙහෙයුම් කටයුතු සරල කිරීම, වඩාත් සරල ණය සංරචකයක් හඳුන්වා දීම මගින් මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සහ ප්‍රතිලාභීන් වෙත වඩාත් හොඳ සේවාවක් සැපයීම දැක්විය හැකිය. විස්තීර්ණ උපායමාර්ගික සංශෝධන හරහා සිදු කරන ලද මෙම ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් ක්‍රියාත්මක වෙමින් පැවති ණය යෝජනා ක්‍රමයන්හි මෙහෙයුම් කටයුතු අත්හිටුවන ලද අතර වඩාත් වෙළඳපොළ හිතකාමී සහ නම්‍යශීලී ලක්ෂණ සහිත නව ණය යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදී.

මේ අනුව පෙර පැවති ණය යෝජනා ක්‍රම හය වෙනුවට කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි නව ණය සංරචකය, 4P ණය යෝජනා ක්‍රම දෙකක් (4P කෘෂි ව්‍යාපාර ණය යෝජනා ක්‍රමය සහ 4P තුරුණු ණය යෝජනා ක්‍රමය) සහ චක්‍රීය අරමුදල් (RF) ණය යෝජනා ක්‍රම තුනක් (RF කෘෂි ව්‍යාපාර ණය යෝජනා ක්‍රමය, RF තුරුණු ණය යෝජනා ක්‍රමය සහ RF ආදායම් උත්පාදන ණය යෝජනා ක්‍රමය) ඇතුළුව ණය යෝජනා ක්‍රම පහකින් සමන්විත වේ.

ප්‍රතිපත්තිමය වශයෙන් ගත් කළ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනේ නව ණය යෝජනා ක්‍රමවල මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම සඳහා එම වැඩසටහනෙහි දෙවන පරිශිෂ්ඨයන් සහිත පරිපාලන ගිවිසුම අත්සන් කිරීමට සහ එයට අදාළ නව මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම සිදු කරන ලදී.

## 22.2 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි උපායමාර්ගික මූල පිරිම්

ප්‍රතිපත්තිමය දෘෂ්ඨියෙන් බලන කළ 2019 වර්ෂයේ දී ත් තුලිත සහ සියලු දෙනාම ඇතුලත් වූ ආර්ථික වර්ධනයක් ලබා ගැනීමේ උත්සාහයන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගණනාවක්ම ගන්නා ලදී.

### 22.2.1 ශ්‍රී ලංකාව සඳහා පළමු වරට මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයක් සැකසීම

මෑතක දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය අන්තර්ගතභාවය ඇති කිරීම සඳහා ගන්නා ලද උත්සාහයන් සැලකිය යුතු උපායමාර්ගික වෙනසක් ඇති කරන ලද අතර එම උත්සාහයන් සාර්ථක කර ගැනීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළියෙල කරන ලද තිරසාර සංවර්ධන පෙර දැක්මෙහි මූලික වශයෙන් අවධානය යොමු කළ යුතු අංශයක් ලෙස මූල්‍ය අන්තර්ගතභාවය හඳුනාගෙන ඇති අතර ශ්‍රී ලංකාව සඳහා වූ පළමු මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය 2020 වර්යේ දී එළි දැක්වීමට අපේක්ෂා කෙරේ. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම සඳහා මූලික වශයෙන්ම තිබිය යුතු කරුණු අතර ජාතික මට්ටමේ සම්බන්ධීකරණයක් ඇති කිරීම, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයේ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම සහ ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා තිරසාර නිෂ්පාදන සංවර්ධනය කිරීම හා සැලසුම් කිරීම සඳහා මූල්‍ය ආයතනයන් හි ධාරිතා ගොඩනැංවීමට මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයෙහි ලේකම් කාර්යාලය සමඟ එක් කටයුතු කිරීම දැක්විය හැකිය.

ලෝක බැංකු සමූහයේ සාමාජිකයෙකු වන ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ තාක්ෂණික හා මූල්‍යමය සහය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු කිහිපයක් ඇතුළුව අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පිළියෙළ කර ඇත. “වඩා හොඳ ජීවන තත්ත්වයක් සඳහා ගුණාත්මක බවින් යුතු මූල්‍ය අන්තර්ගතභාවයක් ඇති කිරීම මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයේ දැක්ම වන අතර මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම හරහා ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම කෙරෙහි එමගින් අවධානය යොමු කෙරේ.

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය සැකසීමට අදාළ වන තුන්වන උපදේශන මෙහෙයුම 2019 වර්ෂයේ අගෝස්තු මාසයේ දී සාර්ථකව සිදු කරන ලද අතර මෙහෙයුම් මූලික පරමාර්ථයන් ඉටු කිරීම තුළින් පාර්ශ්වකරුවන්ට මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය සැකසීමේ කටයුතු අවසන් කිරීමට හැකිවනු ඇත. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමර්ගයේ පුළුල් උපදේශන ක්‍රියාවලියේ දී උපායමාර්ග සඳහා ප්‍රතිපත්තිමය අංශ හඳුනාගෙන ඇත. එනම්, ඩිජිටල් මූල්‍ය හා ගෙවීම්, ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, පාරිභෝගික ආරක්ෂණය හා මූල්‍ය සාක්ෂරතාවය සහ ධාරිතා ගොඩනැංවීම වේ. තවද, දත්ත, යටිතල පහසුකම් සහ ප්‍රතිපත්ති නියාමනය සහ අධීක්ෂණය ද මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයෙහි ප්‍රධාන ක්‍රියාකාරීන් ලෙස හඳුනාගෙන ඇත.


මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ක්‍රියාවලියේ ම ප්‍රධාන උත්ප්‍රේරකයක් ලෙස මූල්‍ය අධ්‍යාපනය ඉස්මතු කර ඇත. එබැවින් “මූල්‍ය අධ්‍යාපනය තුළින් පාරිභෝගික බල ගැන්වීම වැඩිදියුණු කිරීම” ලෙස නව අංගයක් හඳුන්වා දෙන අතරම මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය යටතේ මෙම ක්ෂේත්‍රයට අදාළ ක්‍රියාමාර්ග වඩාත් තීව්‍ර ලෙස ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛත්වය දී ඇත. නවීන ඉගැන්වීම් ද්‍රව්‍ය, මෙවලම් හා ශිල්පීය ක්‍රම වඩාත් ගතික ආකාරයකින් යුතුව යොදා ගනිමින් “මූල්‍ය සාක්ෂරතා” යන විෂය ජාතික අධ්‍යාපන පාඨමාලාවට ඇතුලත් කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවව විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට නිර්දේශ කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවයේ සහාය ඇතිව දිවයින පුරා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සමීක්ෂණයක් පවත්වන ලදී. රට පුරා පවතින මූල්‍ය අන්තර්ගතභාවයෙහි මට්ටම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට දරන උත්සාහයට බාධාවක් වන දත්ත සහ තොරතුරු මෙම සමීක්ෂණය මගින් සපුරා ගැනීමට අපේක්ෂා කරන ලදී. සමීක්ෂණයෙහි ප්‍රතිඵල මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයක් සැකසීම සඳහා වන මූලික තොරතුරු ලෙස සහ ඉදිරි දැක්ම උපායමාර්ග රාමුවක් තුළ ඉලක්ක සැකසීමට භාවිතා කළ යැකිය. සමීක්ෂණයේ ප්‍රතිඵල මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපායමාර්ගය එළි දැක්වීමට සමගාමීව 2020 වර්ෂයේ මුල් භාගයේ දී ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

මූල්‍ය අන්තර්ගතභාවය ඇති කිරීමේ උත්සාහයන් සමඟ තවදුරටත් ඉදිරියට යමින්, ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවයේ තාක්ෂණික සහයෝගීතාවය ඇතිව 2020 වර්ෂයේ දී පළමු මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණය පැවැත්වීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් අපේක්ෂා කරනු ලබයි. ශ්‍රී ලංකාව තුළ පවතින පරතරයන් සහ උගත් පාඩම් හඳුනා ගැනීමට මෙන්ම, මූල්‍ය අධ්‍යාපනයේ සහජීවනය සඳහා පවතින විභවතාවයන් සහ උත්සාහයන් තවදුරටත් ඉහළ නැංවීමට හැකිවන පරිදි


**II-6 රූප සටහන**

**කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහනෙහි ණය සංරචකයේ පූර්ව ව්‍යුහය**




**II-7 රූප සටහන**

**කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහනෙහි ණය සංරචකයේ නව ව්‍යුහය**




ශ්‍රී ලංකාව සඳහා මූල්‍ය අධ්‍යාපන මුල පිරීම් හඳුන්වා දීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට මෙමගින් හැකිවනු ඇත. තවද, මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සඳහා ශක්තිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන අතර මූල්‍ය සාක්ෂරතාවය සඳහා පොදු අර්ථකථන මාලාවක් වැඩිදියුණු කිරීම සහ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් නිපුණතා රාමු සකස් කිරීම එතුලින් අපේක්ෂා කෙරේ.

### 22.2.2 මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංසදයෙහි සාමාජිකත්වය අඛණ්ඩවම ලබා ගැනීම

2019 වර්ෂයේ දී මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංසදය සමඟ ශ්‍රී ලංකා මහ බැංකු සාමාජිකත්වය අඛණ්ඩව පවත්වාගෙන යෑමට අවශ්‍ය ක්‍රියාමාර්ග ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ගන්නා ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඍජුව හෝ වක්‍රව සිදු කරනු ලබන මූල්‍ය අන්තර්ගතභාවයෙහි උත්සාහයන් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරනු ලබන දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකාව ඇතුළුව එහි සාමාජිකත්වය ලබා සිටින සාමාජික ආයතන සඳහා විවිධ අවස්ථාවන් මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංසදය මගින් සපයනු ලබයි.

සබඳතා පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් පරිපාලනමය කාර්යභාරයන් ඉටු කිරීම සහ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංසදයෙහි සන්නිවේදනයේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාත්මක කිරීම හැරුණු විට මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංසදය සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව අනෙකුත් දෙපාර්තමේන්තු අතර මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංසදයේ විවිධ ක්‍රියාකාරකම් සඳහා අඛණ්ඩවම සහභාගි වීම තුළින් නිරන්තරයෙන් මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංසදය සඳහා ක්‍රියාකාරී දායකත්වයක් ලබා දී ඇත.

සාකච්ඡා මණ්ඩලයක සාමාජිකයෙකු ලෙස සහ සම්පත් දායකයෙකු ලෙස දැනුම සපයමින් මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංසදයෙහි සාමාජික ආයතන සමඟ අත්දැකීම් බෙදා

හඳා ගැනීම තුළින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී රැස්වීම්වලට 2019 වර්ෂයේ දී ක්‍රියාකාරීව සහභාගි වූ අතර එහි තාක්ෂණික දැනුම මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංසදයෙහි සාමාජික රටවල් සමඟ බෙදා ගන්නා ලදී. තවද, මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය වැඩි කිරීමට සහ ගෝලීය වශයෙන් මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යැමට සහයෝගී ක්‍රම සාකච්ඡා කිරීම සඳහා ප්‍රමිතිගත ආයතන, පුද්ගලික සහ ශාස්ත්‍රීය අංශයන්හි බාහිර පාර්ශ්වකරුවන්ගෙන් සහ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංසදයෙහි සාමාජිකයන් වාර්ෂිකව රැස්වන ගෝලීය ප්‍රතිපත්ති කතිකාවත 2019 වර්ෂයේ දී රුවන්ඩාවේ කිගාලිහීදී පැවැත්වූ අතර ඒ සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි වන ලදී.

තවද, මායා කැපවීම් ප්‍රකාශනය හරහා (Maya Commitment Declaration) මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංසදයෙහි අද්විතීය ගෝලීය හඬ වේදිකාවේ වුවද සාමාජික රටවල ගෝලීය හඬ වැඩිදියුණු කිරීමේ අවස්ථාවන් උදා වී ඇත. එසේම, මූල්‍ය අන්තර්ගතභාවය ඇති කිරීමේ උත්සාහයන් වැඩිදියුණු කිරීමට සහ සාමාජිකයන්ගේ විශේෂඥ හැකියාවක් ගෝලීය ජාලය වෙත රැගෙන යැමට මෙමඟින් අවස්ථාව සැලසෙනු ඇත.

### 22.2.3 ආසියානු ණය සේවා සැපයුම් ආයතන එකමුතුවෙහි 32 වන වාර්ෂික සමුළුවේ සත්කාරකත්වය දැරීම

“ණය පූරකකරණය : තිරසාර සංවර්ධනයක් උදෙසා” යන තේමාව යටතේ ආසියානු ණය පූරකකරණ ආයතනික එකමුතුවෙහි 32 වන වාර්ෂික සමුළුව 2019 වර්ෂයේ ඔක්තෝබර් මස 28 වන දින සිට 30 දින දක්වා කොළඹ සිනමන් ලේක් සයිඩ් හෝටල් පරිශ්‍රයේ දී පැවැත් වූ අතර එහි සත්කාරකත්වය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලදී. වඩා හොඳ ණය පූරකකරණ ක්‍රමවේදයක් හඳුන්වාදීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 1987 වර්ෂයේ දී ආසියානු ණය පූරකකරණ සැපයුම් ආයතනික එකමුතුව ස්ථාපිත කරන ලද අතර මෙය රටවල් 11 ක සාමාජික ආයතන 16 කින් සමන්විත වේ. ආසියානු ණය පූරකකරණ එකමුතුවේ වර්තමාන සාමාජික රටවල් අතරට ඉන්දියාව, ඉන්දුනීසියාව, ජපානය, දකුණු කොරියාව, මැලේසියාව, මොන්ගෝලියාව, නේපාලය, පිලිපීනය, තායිවානය, තායිලන්තය සහ ශ්‍රී ලංකාව ඇතුලත් වේ. මෙම සමුළුවට විදේශ නියෝජිතයන් ද සමඟ 90 ක පමණ පිරිසක් සහභාගි වූ අතර එය තාක්ෂණික සැසිවලින් ද සමන්විතව දෙදිනක් පුරා පැවැත්විය. මෙම සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීම මගින් ශ්‍රී ලංකාව පිළිබඳව ධනාත්මක ප්‍රතිරූපයක් ජාත්‍යන්තරය තුළ නිර්මාණය කිරීමට හැකිවූ අතර ණය පූරකකරණය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීමටත් සාමාජිකයන් අතර සබඳතා වඩාත් ශක්තිමත් කර ගැනීමටත් හැකි විය.

### 22.2.4 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රමවල මෙහෙයුම් කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩ සටහනේ ණය යෝජනා ක්‍රම ආරම්භ කිරීමත් සමඟ ශ්‍රී ලකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රමවල මෙහෙයුම් කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා අවශ්‍ය මූලික පියවරයන් ප්‍රාදේශීය සංවර්ධන දෙපර්තමේන්තුව මගින් ගන්නා ලදී. කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල සහ රජය අතර පවතින කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහනේ මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති ආයතන ශක්තිමත් කිරීමේ සංරචකය යටතේ රජය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහනේ, සහභාගිත්ව මූල්‍ය ආයතන සහ රාජ්‍ය, පෞද්ගලික, නිෂ්පාදන හවුල්කාරිත්වයෙන් සම්බන්ධ වී සිටින පෞද්ගලික ආයතන ඇතුලත්ව කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහනෙහි පාර්ශ්වකරුවන් සඳහා වෙනම පරිශීලක අතුරු මුහුණතක් ලබා දීමට අපේක්ෂා කෙරේ. 2019 වර්ෂයේ දී ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතියෙහි මෘදුකාංග නිර්මාණය කිරීම සඳහා සුදුසු පාර්ශ්වකරුවෙකු මේ වන විටත් තෝරා ගෙන ඇති අතර එම ව්‍යාපෘතිය 2020 වර්ෂයේ මුල් භාගයේ දී නිම කිරීමට අපේක්ෂා කෙරේ.

තවද, සහනදායී ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ අතිරික්ත කාර්යයන් අවම කිරීම තුළින් ණය මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඉහළ නැංවීමේ අරමුණින් සහ කඩදාසි භාවිතයෙන් තොර හරිත ප්‍රවේශයක් කරා ගමන් කිරීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම සහ ණය ඇප ආවරණ ක්‍රම සඳහා නව තොරතුරු තාක්ෂණික අයදුම්පතක් නිර්මාණය කිරීමටත් 2020 වර්ෂයේ දී අපේක්ෂා කෙරේ.

## 22.3 කුසලතා සංවර්ධනය සහ ශක්‍යතා ගොඩ නැංවීම

පුළුල් මූල්‍ය අන්තර්ගතභාවයක් සඳහා වන ගතික සංරචකයක් ලෙස මූල්‍ය සාක්ෂරතාවයෙහි සහ දැනුම්වත් කිරීමෙහි ඇති වැදගත්කම වටහා ගනිමින්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රටේ සියළුම ප්‍රදේශ ආවරණය වන පරිදි දැනුම්වත් කිරීමේ වැඩසටහන් 122 ක් පවත්වන ලදී. විධිමත් මූල්‍ය අංශයෙන් බැහැර වී සිටින සමාජයේ පහළ මට්ටම්වල පුද්ගලයින් සහ සමාජීය බලමුළු ගැන්වීම් කාර්යයන්හි නියැලී සිටින ප්‍රජා නායකයින් සහ අනෙකුත් පාර්ශ්වයන් දැනුවත් කිරීම සඳහා මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යවසායකත්ව සංවර්ධනය, කුසලතා සංවර්ධනය වැනි අංශයන් ආවරණය කරමින් වැඩසටහන් පැවැත්වීම මෙම දැනුම්වත් කිරීමේ වැඩසටහන් තුළින් අපේක්ෂා කරන ලදී.

**II-30 සංඛ්‍යා සටහන**

**2019 වර්ෂයේ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන්**

| වැඩසටහන් වර්ගය | වැඩසටහන් ගණන |
|---|---|
| ධාරිතා ගොඩනැංවීම | 87 |
| කුසලතා සංවර්ධනය | 30 |
| විද්‍යුත් මාධ්‍ය | 05 |
| මුළු ගණන | 122 |

# 23. ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ

මහ බැංකු කටයුතු සාර්ථකව කරගෙන යෑම සඳහා මුදල් නීති පනතේ 07 වන වගන්තියට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව 1981 සිට මාතර, අනුරාධපුර, මාතලේ, යාපනය, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය හා නුවරඑළිය යන දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය කාර්යාල 07 ක් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී. පසුව, මහජනතාවට වඩාත් සමීප හා කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින් හා කිලිනොච්චිය ප්‍රාදේශීය කාර්යාලයේ සම්පත් වඩාත් ඵලදායි ලෙස යොදාගැනීමේ අරමුණින් 2017 වසරේ ජුනි මාසයේ දී යාපනය ප්‍රාදේශීය කාර්යාලය කිලිනොච්චිය ප්‍රාදේශීය කාර්යාලය සමඟ ඒකාබද්ධ කරන ලදී. ඒ අනුව, වර්තමානයේ ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය කාර්යාල මගින් දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන ලෙස සේවා සැපයීම කරනු ලබයි.

ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය කාර්යාල විසින් තිරසාර හා තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම සඳහා දායකත්වය සපයනු ලබන අතර ව්‍යවසායකයින් උදෙසා දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ වෙළඳපොළවල්, තාක්ෂණික හුවමාරු වැඩසටහන් හා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීමට කටයුතු කරනු ලබයි. තවද, ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය කාර්යාල මහ බැංකු කාර්යයන් ප්‍රාදේශීයව ව්‍යාප්ත කිරීම සඳහා ද වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

## 23.1 සංවර්ධන කාර්යයන්

2019 වසර තුළදී විධිමත් හා අඩු පිරිවැය මූල්‍ය සේවා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 139 ක් ව්‍යවසායකයින්, රාජ්‍ය සේවකයින්, පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් හා අනෙකුත් මහජනතාවගෙන් සමන්විත පුද්ගලයින් 15,267 දෙනෙකු ඉලක්ක කර ගනිමින් පවත්වන ලදී. තව ද, ප්‍රාදේශීය කාර්යාල විසින් සාර්ථක ලෙස ණය සම්බන්ධතාවයන් 1,467 ක් ස්ථාපිත කරමින් ප්‍රාදේශීය කාර්යාල අදාළ ප්‍රදේශයන්හි ණය බෙදා දීමේ යාන්ත්‍රණය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන ලද අතර විවිධ හේතු නිසා ණය වාරික ගෙවීමට දුෂ්කරතා මතු වී ඇති ණයකරුවන් උදෙසා ණය උපදේශන සේවා ද සපයා ඇත. මෙයට අමතරව, ණයගැතිභාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 15 ක් පවත්වා පුද්ගලයින් 1,724 දෙනෙකු දැනුවත් කරන ලදී.

ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය කාර්යාල මගින් ව්‍යවසාය සංවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය මූලික අවශ්‍යතා හා දැනුම, කුසලතා සංවර්ධනය, තාක්ෂණික හුවමාරු වැඩසටහන් හා විශිෂ්ට පරිචයන් පිළිබඳ වැඩසටහන් රැසක් පවත්වන ලදී. ඒ අනුව, ව්‍යාපාර සැලසුම්කරණය, ගිණුම්කරණය, බදුකරණය සහ අලෙවිකරණය වැනි ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික සිද්ධාන්ත හා දැනුම ඇතුළත් වැඩසටහන් 83 ක් ප්‍රතිලාභීන් 7,773 දෙනෙකු සඳහා පවත්වන ලදී. තව ද, ව්‍යවසායකයින් 4,564 දෙනෙකු සඳහා විශිෂ්ට පරිචයන් පිළිබඳ වැඩසටහන් ඇතුළුව කුසලතා සංවර්ධන වැඩසටහන් 107 ක් ද පවත්වන ලදී. මෙම ව්‍යවසායකයින් මූලිකවම කිරිපට්ටි පාලනය, පාවහන් නිෂ්පාදනය, බතික් කර්මාන්තය, ඇඟලුම් කර්මාන්තය, අත්කම් කර්මාන්තය හා සංචාරක කර්මාන්තයට අදාළ අංශවල තම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන අය වේ. එමෙන්ම, ප්‍රාදේශීය කාර්යාල විසින් වෙළඳපොළ සම්බන්ධතා ඇති කිරීම, විකුණුම් හා ගැණුම්කරුවන් අතර සාකච්ඡා හා වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම යනාදිය මගින් ව්‍යවසායකයින්ගේ අලෙවි කටයුතු ප්‍රවර්ධනය කර ගැනීම සඳහා සහාය ලබා දෙන ලදී. ඒ අනුව, ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් වෙළඳ ප්‍රදර්ශන 5 ක් සංවිධානය කරන ලද අතර ඒ තුළින් ව්‍යවසායකයින් 276 දෙනෙකු හට ප්‍රතිලාභ ලැබිණි. තව ද, ප්‍රාදේශීය කාර්යාල විසින් ව්‍යවසායකයින් 214 දෙනෙකු සඳහා තාක්ෂණික හුවමාරු වැඩසටහන් 07 ක් ද සංවිධානය කරන ලදී.

ඒ අතරම, 2019 වසර තුළ ලදී ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නගාසිටුවීම සඳහා විවිධ උපක්‍රම ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, සෑම කලාපයකම දියුණු කළ හැකි එක් ආර්ථික අංශයක් හඳුනාගෙන එහි නිරත ව්‍යවසායකයින් පුහුණු කිරීම හා ණය පහසුකම් සලසාදීම තුළින් එම හඳුනාගත් ආර්ථික අංශයන් ගොඩනැංවීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදී. එහිදී, පාවහන් නිෂ්පාදනය, රූපලාවන්‍ය ශිල්පය, විසිතුරු මල් වගාව, අත්කම් කර්මාන්තය, කිරිපට්ටි පාලනය හා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ආදී කර්මාන්තවල නිරත ව්‍යවසායකයින් 2,145 දෙනෙකු ඉලක්ක කර ගනිමින් වැඩසටහන් 38 ක් පවත්වන ලදී.

තව ද, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය නගාසිටුවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර සිටින සංවර්ධන නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමේ අරමුණින් ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය කාර්යාල විසින් පුහුණු වැඩසටහන් 32 ක් පවත්වා සංවර්ධන නිලධාරීන් 2,974 දෙනෙකු පුහුණු කරන ලදී.

2019 වසර තුළදී ප්‍රාදේශීය කාර්යාල විසින් හඳුනාගත් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වඩාත් කාර්යක්ෂම හා සංවිධානාත්මක ව්‍යාපාර ලෙස ගොඩනැංවීම සඳහා විවිධ ආයතන සම්බන්ධ කර ගනිමින් විශේෂ සායන 06 ක් පවත්වා ව්‍යවසායකයින් 515 දෙනෙකු හට නවතම ව්‍යාපාර දැනුම ලබා දෙන ලදී. මෙයට අමතරව, තත්ත්ව කළමනාකරණය, පාරිභෝගික ආරක්ෂණය හා ඊට අදාළ පටිපාටීන්, ආනයන හා අපනයන රෙගුලාසි පිළිබඳ විශේෂ වැඩසටහන් 22 ක් පවත්වන ලද අතර ඒ තුළින් පුද්ගලයින් 968 දෙනෙකු ප්‍රතිලාභ ලැබීය. තව ද, ව්‍යවසායකයින් 222 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ප්‍රාදේශීය මට්ටමේ ව්‍යවසායක සමිති ද පිහිටුවන ලදී.

### 23.2 ප්‍රාදේශීය මට්ටමේ මහ බැංකුව නියෝජනය කිරීම

ප්‍රාදේශීය කාර්යාල විසින් 2019 වසර තුළදී සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ගේ ගැටළු 101,366 කට අවශ්‍ය විසඳුම් ලබා දුන් අතර සමරු කාසි හා ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රකාශන අලෙවි කිරීම, දීප ව්‍යාප්ත දත්ත එකතු කිරීමේ මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම, මාතර හා අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල මගින් මුදල් කෞතුකාගාර පවත්වාගෙන යෑම ආදී විවිධ සේවා රැසක් සපයන ලදී. මීට අමතරව, පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය, ව්‍යාජ නෝට්ටු හඳුනාගැනීම, නීත්‍යානුකූල නොවන මූල්‍ය ආයතන, තහනම් මූල්‍ය යෝජනා ක්‍රම, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ, මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම, ගෙවීම් සහ පියවීම් පද්ධති සහ විදේශ විනිමය රෙගුලාසි ආදිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ද, සිසුන් හා ගුරුවරුන්ගේ දැනුම වර්ධනය වෙනුවෙන් අධ්‍යාපනික වැඩසටහන් ද පවත්වන ලදී. ඒ අනුව, වැඩසටහන් 103 ක් ප්‍රතිලාභීන් 22,001 දෙනෙකු ඉලක්ක කර ගනිමින් පවත්වන ලදී. එමෙන්ම, ප්‍රාදේශීය කාර්යාල විසින් 2019 ජනවාරි මාසයේ දී, Econ Icon Season IV ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනේ මූලික වටයේ තරග විභාගය ද ප්‍රාදේශීය මට්ටමින් පවත්වන ලදී. තව ද, ප්‍රාදේශීය කාර්යාල විසින් ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණ හා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳව සමීක්ෂණ ප්‍රාදේශීය වශයෙන් පැවැත්වීමට ද ක්‍රියාකාරී ලෙස සම්බන්ධ විය. මීට අමතරව, ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ප්‍රාදේශීය කළමනාකරුවන් සහ එහි නිලධාරීන් ප්‍රාදේශීය ලෙස පවත්වන ලද රැස්වීම්, සාකච්ඡා හා විශේෂ අවස්ථාවලට සහභාගී වන ලදී.

## 24. නිරාකරණ හා බලගැන්වීම්

මුදල් මණ්ඩලය විසින් 2017 ජුනි 16 දින පැවැති එහි අංක 21/2017 දරන රැස්වීමේදී තීරණය කරන ලදුව, නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුවට අනුබද්ධව පැවැති බලගැන්වීම් ඒකකය වැඩිදියුණු කරමින්, 2018.01.01 දින සිට බලාත්මක වන පරිදි නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. එහිදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ තිබූ තැන්පතු රක්ෂණ ඒකකය ද නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලදී.

නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු වනුයේ අර්බුදයන්ට මුහුණ දෙන මූල්‍ය ආයතනවල ගැටළු නිරාකරණය කිරීම, මූල්‍ය ආයතනවල නිලධාරීන් විසින් බැංකු පනතේ සහ මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන සහ වෙනත් අදාළ රෙගුලාසි සහ විධානයන් උල්ලංඝනය කිරීම, තහනම් යෝජනා ක්‍රම සහ අනවසර මූල්‍ය තැන්පතු ගැනීම් යනාදිය සම්බන්ධව විමර්ශන පැවැත්වීම ආදියයි. මෙකී අරමුණු ඉටු කර ගැනීම උදෙසා දෙපාර්තමේන්තුව තුළ නිරාකරණ කටයුතු අංශය, බලගැන්වීම් සහ නඩු කටයුතු අංශය, විශේෂ විමර්ශන අංශය, තැන්පතු රක්ෂණ සහ පාලන අංශය වශයෙන් අංශයන් ස්ථාපිත කර තිබේ.

### 24.1 අර්බුදයන්ට මුහුණ දුන් මූල්‍ය ආයතන සම්බන්ධ නිරාකරණ කටයුතු

නියාමනය කෙරෙන මූල්‍ය ආයතනවල නිරාකරණ කටයුතු පිළිබඳ පුළුල් ප්‍රතිපත්ති රාමුවක් මේ වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව මගින් සකස් කෙරෙමින් පවතින අතර එමගින් සියලු මූල්‍ය ආයතන සම්බන්ධ පැහැදිලි නෛතික බලගැන්වීමක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දෙන ආකාරයේ නිරාකරණ යාන්ත්‍රණයක් නිර්මාණය වෙනු ඇත. නිරාකරණ බලාධිකාරය සහ එය සතු නිරාකරණ කටයුතු සම්බන්ධ බලතල සඳහන් කරනු ලැබ ඇති, පවත්නා නියාමන ක්‍රියාවලිය පසුබිම් කර ගනිමින් ඒකී නිරාකරණ ප්‍රතිපත්තිය සකස් කෙරෙනු ඇත. මේ වන විට, බලපත්‍රලාභී බැංකු, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂටත්, බැංකු නොවන මූලය ආයතන, බැංකු නොවන මූලය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂටත් වශයෙන්, නිරාකරණ බලතල සියල්ලම පාහේ පැවරී ඇත්තේ අදාළ නියාමන අධිකාරීන් වෙතය.

### 24.2 තහනම් මූල්‍ය යෝජනා ක්‍රම සහ අනවසර තැන්පතු රැස් කිරීමේ මූල්‍ය ආයතන සම්බන්ධ බලගැන්වීම් කටයුතු සහ විශේෂ විමර්ශන

නීතිමය බලගැන්වීම් කාර්යයන් සිදු වනුයේ පවත්නා නෛතික විධිවිධානවලට අනුකූලව ස්ථාපිත කර ඇති මුදල් මණ්ඩලයේ අනුමත මෙහෙයුම් පටිපාටීන් ඇතුළු අභ්‍යන්තර සැලසුම් යටතේය. ඒ අනුව අනවසර මුදල් ව්‍යාපාරවලට අදාළ විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 42(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ද, තහනම් යෝජනා ක්‍රම සම්බන්ධ විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා 1988 අංක 30 දරන බැංකු පනතේ 83 ඇ වගන්තියේ විධිවිධාන යටතේ අධිපතිතුමා විසින් ද, නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, බලයලත් නිලධාරීන් වශයෙන් පත් කරනු ලැබේ.

ඒ අනුව සැක සහිත තහනම් යෝජනා ක්‍රම හතරක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරන ලද අතර ඒ අතරින් විමර්ශන දෙකකට අදාළ වාර්තා සහ නිගමන, නඩු පැවරීමේ කටයුතු උදෙසා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. තව ද නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ සහය ඇතිව, පිළිවෙලින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් නිම කරන ලද විමර්ශන දෙකකට සම්බන්ධ වාර්තා ද ඉදිරි පියවර සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර තිබේ.

අනවසර තැන්පතු රැස්කිරීමේ මුදල් ව්‍යාපාරයක් පවත්වා ගෙන ගිය ආයතනයක් සම්බන්ධව සිදු කළ විමර්ශනයකින් පසු, එම ආයතනයට එරෙහිව නීතිමය පියවර ගනු ලැබිණි. මුදල් මණ්ඩලයේ නියෝගයන්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් ද එම ආයතනයට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට ද නියමිතය. එම ආයතනයේ එක් අධ්‍යක්ෂවරයෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර අධිකරණ නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර විමර්ශන සිදු කෙරේ.

නිරාකරණ ක්‍රියාමාර්ගයක් වශයෙන් බලගැන්වීම් හා නඩු කටයුතු අංශය විසින් දිවයින පුරා නිරන්තරයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරන අතර ග්‍රාමීය ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීමත්, ඔවුන්ට තහනම් යෝජනා ක්‍රම සහ නීති විරෝධී තැන්පතු ලබා ගැනීම යනාදි වංචනික ක්‍රියා සම්බන්ධයෙන් අවබෝධයක් ලබා දීමත් එම වැඩසටහන් මගින් අරමුණු කෙරේ. නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව රටේ විවිධ ප්‍රදේශවල රජයේ නිලධාරීන්, පාසැල් සිසුන් සහ ආරක්ෂක අංශවල සාමාජිකයින් උදෙසා 2019 වර්ෂයේ පවත්වනු ලැබූ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව 26 කි.

**II-31 සංඛ්‍යා සටහන**

**දැනුම්වත් කිරීමේ වැඩසටහන්**

| ඉලක්කගත කණ්ඩායම | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| රජයේ නිලධාරීන් | 19 | 2,508 |
| පාසල් සිසු සිසුවියන් | 05 | 401 |
| ආරක්ෂක අංශ නිලධාරීන් | 02 | 150 |
| **මුළු ගණන** | **26** | **3,059** |

### 24.3 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම

2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන සංඛ්‍යාව 74 ක් වූ අතර එහි අරමුදල රුපියල් බිලියන 62.03 (විගණනයට පෙර) විය. එදිනටම, අරමුදල විසින් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති මුදල සහ ද්‍රවශීලතා උපකාරක පහසුකම යටතේ එක් සාමාජික ආයතනයක් වෙත 2014 වසරේදී ලබා දුන් ණය මුදල පිළිවෙලින් රුපියල් බිලියන 65.4 සහ 1.9 වේ. යෝජනා ක්‍රමයට අදාළ විශේෂ මූල්‍ය තොරතුරු පහත වගුවෙහි දැක්වේ.

**II-32 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ අරමුදල් පිළිබඳ දත්ත**

| අයිතමය | අගය (රුපියල් මිලියන) | |
|---|---|---|
| | 2018.12.31 දිනට | 2019.12.31* දිනට |
| අරමුදලේ ප්‍රමාණය | 51,875 | 62,030 |
| මුළු ආදායම | 14,024 | 15,830 |
| මුළු වියදම | (3,470) | (1,210) |
| වාර්ෂික ලාභය (බදුවලට පෙර) | 10,554 | 14,620 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන | 49,844 | 65,452 |
| ණය සහ ලැබිය යුතු මුදල් (වෙන්කිරීම්වලට පසු) | 1,672 | 1,346 |
| අනෙකුත් විස්තීරණ ආදායම් සංචිත | (1,528) | 2,663 |

* අපේක්ෂිත

(i) ආසන්නතම මූල්‍ය වර්ෂය අවසානයේදී ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය සියයට 14 ක් හෝ ඊට වැඩියෙන් පවත්වා ගන්නා බලපත්‍රලාභී බැංකු, සිය සුදුසුකම් ලත් මුළු තැන්පතුවලින් සියයට 0.1 ක වාරිකයක් ද, අනෙකුත් සියලු බැංකු සියයට 0.125 ක වාරිකයක් ද ගෙවිය යුතු වේ. බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා අදාළ වන වාර්ෂික වාරික අනුපාතය වනුයේ සියයට 0.15 කි. සාමාජික ආයතන වෙතින් 2019 වසරේදී ලැබුණු වාරික ගෙවීම් සහ දඩ මුදල්වල එකතුව රුපියල් බිලියන 9.2 කි.

(ii) 2018 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි එක් ආයතනයක එක් තැන්පතුකරුවෙකු සඳහා වන තැන්පතු රක්ෂණ ආවරණය රුපියල් 600,000 ක් වේ.

### 24.4 අර්බුදයන්ට මුහුණ දුන් මුදල් සමාගම්වල තැන්පතුකරුවන්ට වන්දි මුදල් ගෙවීම

අර්බුදයන්ට මුහුණ දුන් සාමාජික ආයතන තුනක් වන සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් සහ ෆිනෑන්ස් පීඑල්සී, ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් සහ ටී.කේ.එස් ෆිනෑන්ස් වෙත නිකුත් කරන ලද බලපත්‍ර, පිළිවෙළින් 2018.03.05, 2018.07.25 සහ 19.09.2019 යන දිනයන්හි සිට බලාත්මක වන පරිදි අවලංගු කිරීමට මුදල් මණ්ඩල අනුමැතිය ලැබුණු අතර ඒ අනුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය සම්බන්ධ රෙගුලාසි යටතේ සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් සහ ෆිනෑන්ස් පීඑල්සී ආයතනයේ සහ ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් තැන්පතුකරුවන්ට වන්දි මුදල් ගෙවීම පිළිවෙළින් 2018.08.27 සහ 25.01.2019 දිනයන්හි ආරම්භ කරන ලදී. තැන්පතු රක්ෂණ ඒකකය යටතේ වන්දි මුදල් ගෙවීම සඳහා මෙම වර්ෂයේදී "RED Claims System" නිර්මාණය කර, හඳුන්වා දී ඇත. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මගින් සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් සහ ෆිනෑන්ස් පීඑල්සී ආයතනයේ තැන්පත්කරුවන් 3,024 ක් සහ ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් තැන්පත්කරුවන් 2,309 ක් සඳහා පිළිවෙළින් රු. මිලියන 1,271.40 ක මුදලක් සහ රුපියල් මිලියන 947.35 ක් මේ වන විට ගෙවා අවසන් කර ඇත. 2020 ජනවාරි අග වන විට ටී.කේ.එස් ෆයිනෑන්ස් වෙනුවෙන්ද වන්දි මුදල් ගෙවීම ආරම්භ කර ඇත.

## 25. අවදානම් කළමනාකරණ

මහ බැංකුව සිය ප්‍රතිපත්ති අරමුණු ඉෂ්ඨ කිරීමේ දී මූල්‍යමය හා මූල්‍යමය නොවන යන දෙවර්ගයේම විවිධ අවදානම්වලට මුහුණ දෙනු ලැබේ. මෙම කවර හෝ අවදානමක් සිදු වීම මගින් මහ බැංකුවක මූල්‍ය තත්ත්වයට හා කීර්ති නාමයට සිදු විය හැකි බලපෑම අතිමහත් බැවින් නිසි ලෙස නිර්මාණය කරන ලද අවදානම් කළමනාකරණ රාමුවක් තිබීම මහ බැංකුවකට ඉතා වැදගත් වේ.

අවදානම් කළමනාකරණ රාමුවට සමගාමීව, මහ බැංකුව පුරාම අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රතිපත්ති දක්වමින් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශයක් සකස් කිරීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙම ක්‍රියාවලියේ දී, මහ බැංකුව අවදානම් කළමනාකරණයට අදාළ පිළිගත් ප්‍රමිතීන් හා

මාර්ගෝපදේශ අනුගමනය කරමින් විවිධ පාර්ශ්ව සඳහා අවදානම් හිමිකාරිත්වය හා කළමනාකරණයට අදාළව පැහැදිලි වගකීම් පවරන ලදී.

### 25.1 මූල්‍ය නොවන අවදානම

සමස්තයක් ලෙස මහ බැංකුවට බලපාන ප්‍රධාන මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීම සඳහා මහ බැංකුවේ කළමනාකාරිත්වය අතර වාර්ෂික අවදානම් සමීක්ෂණයක් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල මහ බැංකුවේ මෙහෙයුම් අවදානම් වර්ගීකරණය සංශෝධනය කිරීමට උපයෝගී කරගනු ලැබූ අතර මෙම ආයතනයට බලපාන මූලික මෙහෙයුම් අවදානම් වර්ග සඳහා ප්‍රමුඛතාවන් ලබාදීමට තවදුරටත් එමගින් කළමනාකාරිත්වයේ ඉහළ අවධානයක් සඳහා යොමු කිරීමට ද සහාය වේ.

බැංකුව තුළ අවදානම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සහ බාහිර සම්පත් දායකයින් අවශ්‍ය පරිදි යොදා ගනිමින් වසර පුරාම විවිධ අවස්ථාවල දී මහ බැංකුවේ කාර්ය මණ්ඩලය සඳහා අවදානම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ කාර්ය ශක්තිමත් කිරීමේ අරමුණින් 2019 වර්ෂය තුළ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ලෝක බැංකුවේ මෙහෙයුම් අවදානම් කණ්ඩායම සමග සමීපව කටයුතු කළ අතර මෙමගින් දැනට පවතින අවදානම් යහපාලන ව්‍යුහය හා මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීමේ රාමුව සමාලෝචනය කරන ලදී. මෙහෙයුම් අවදානම් ලේඛණය, අවදානම් ශ්‍රේණිගත කිරීම සහ මූල්‍ය නොවන අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම හා වාර්තා කිරීමට අදාළ නිශ්චිත පියවර කිහිපයකට අදාළ කටයුතු අවසන් කර ගැනීමට ලෝක බැංකුව සහාය දක්වන ලදී. එමෙන්ම මහ බැංකුවේ තෝරාගත් තියමු කාර්යයන්හි මෙහෙයුම් අවදානම් තක්සේරු කිරීමක් ලෝක බැංකුව විසින් සිදු කළ අතර මහ බැංකුවේ සියලුම ප්‍රධාන කාර්ය මණ්ඩලය සඳහා පුහුණු කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලදී.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව අනෙකුත් දෙපාර්තමේන්තුවල අවදානම් ලේඛණ පිළියෙළ කිරීමට මෙන්ම මෙම පැතුරුම් පත (Excel) පදනම් කරගත් අවදානම් ලේඛණ ආකෘතිය අදියර වශයෙන් තවදුරටත් විධිමත් කිරීමට ද පහසුකම් සලසන ලදී. මෙම ක්‍රියාවලිය අවසන් වූ පසු මෙමගින් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුමය කටයුතු පිළිබඳව ඉතා දැනුවත් වූ අවදානම් පිළිබඳ සවිඥානිකව තීරණ ගැනීමට හැකි වේ.

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවෙහි (ITD) සහාය ඇතිව අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව (RMD) විසින් 2019 ඔක්තෝබර් මස පළමුවන දින ස්වයංක්‍රීය සිදුවීම් වාර්තාකරන පද්ධතියක් ක්‍රියාත්මක කරන ලද අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවය කරන සියලු මට්ටම්වල කාර්ය මණ්ඩලයට භාවිතා කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත. මෙම ක්‍රමවේදය මගින් සිදුවීම් වාර්තා කිරීම දිරිගැන්වීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම, සිදු විය හැකි සිදුවීම් හා අවදානම් ප්‍රවණතා හඳුනාගැනීම සහ අවදානම් අවම කිරීමේ පියවර වැඩිදියුණු කිරීම සහ කරුණු සාක්ෂාත් කරගනිමින් කේන්ද්‍රගත සිදුවීම් දත්ත ගබඩාවක් ගොඩනැගීමට ඉඩ හසර සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 25.2 මූල්‍ය අවදානම

දෙවන පෙළ ආරක්ෂක ක්‍රමවේද ක්‍රියාත්මක කරමින්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ස්වාධීනව මූල්‍ය අවදානම් අධීක්ෂණය, විශ්ලේෂණය, ඇගයීම හා වාර්තා කිරීම සහ මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිත ආයෝජන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් ජාත්‍යන්තර සංචිත (International Reserve - IR), මහ බැංකුවේ අභ්‍යන්තර ආයෝජන අරමුදල් (Internal Investment Fund - IIF) හා රජය වෙනුවෙන් නියෝජිත සේවයක් සලසමින් කළමනාකරණය කරනු ලබන සේවක අර්ථසාධන අරමුදල් (Employees Provident Fund - EPF) යන සංචිතයන්ට අදාළ අවදානම් කළමනාකරණය සඳහා පනවා ඇති මාර්ගෝපදේශවලට අනුකූල වීම සහතික කරයි.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ දී මෙම සංචිත ත්‍රිත්වය සඳහා උපායමාර්ගික වත්කම් වෙන් කිරීමේ ප්‍රකාශ (Strategic Asset Allocation - SAA) සහ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශ (Investment Policy Statement - IPS) සකස් කරන ලදී. තවද, මෙම සංචිතවලට අදාළ අවදානම් පරාමිතීන් සකස් කරමින්, එම අරමුදල් සඳහා ආයෝජන මාර්ගෝපදේශය (Investment Guidelines - IG) එළිදැක්වීමට කටයුතු කරමින් පවතී. අවදානම් දර්ශක නිරන්තරයෙන්ම විශ්ලේෂණය කිරීමෙන් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙළඳපොළ අවදානම් හා ණය අවදානම අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි. ඉහත සඳහන් කරුණුවලට අමතරව ජාත්‍යන්තර සංචිත, මහ බැංකුවේ අභ්‍යන්තර ආයෝජන අරමුදල හා සේවක අර්ථසාධක අරමුදල සඳහා, අදාළ වන උපායමාර්ගික වත්කම් වෙන්කිරීමේ ප්‍රකාශ, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශ, ආයෝජන මාර්ගෝපදේශ හා ප්‍රතිපාර්ශවීය ණය අවදානම් කළමනාකරණය මාර්ගෝපදේශ (Counterparty Credit Risk Management Guidelines - CCRMG) යන ලේඛන මගින් පනවා ඇති සීමා හා රාමුවලට අනුකූලව මෙම සංචිත ත්‍රිත්වය කළමනාකරණය වේදැයි අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන් අධීක්ෂණය කෙරේ. මෙම සියලු අවදානම් තක්සේරු කිරීම් හා හඳුනාගත් විෂමතාවයන් විදේශ සංචිත අධීක්ෂණ කමිටුව (International Reserve Investment Oversight Committee - IRIOC), අභ්‍යන්තර ආයෝජන අධීක්ෂණ කමිටුව (Internal Investment Oversight Committee - IIOC) සහ සේවක අර්ථසාධක අරමුදල් ආයෝජන අධීක්ෂණ කමිටුව (EPF Investment Oversight Committee - EIOC) වැනි මාසික ආයෝජන කමිටු (IOCS) වලට ඉදිරිපත් කරනු ලබයි. තවද, මුදල් මණ්ඩලයෙහි අනුමැතිය සඳහා අදාළ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ නිර්දේශ කිරීමට අමතරව ආයේජන අධීක්ෂණ කමිටු මගින් ඉස්මතු කරන ලද ප්‍රධාන අවදානම් සාධක හා අනෙකුත් විෂමතා මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව (Board Risk Oversight Committee - BROC) වෙත වාර්තා කිරීමත්, මුදල් මණ්ඩලය වෙත වාර්තා කිරීමත් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් කාර්තුමය වශයෙන් සිදු කරනු ලබයි.

## 26. ලේකම් දෙපාර්තමේන්තුව

ලේකම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භයේදීම ප්‍රතිෂ්ඨාපිත දෙපාර්තමේන්තු අතරින් එකකි. එමගින් සිදු කෙරෙන කාර්යයන් අතරින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත ආයතනික පරිපාලන කටයුතු සිදු කිරීම, ප්‍රසම්පාදන කළමනාකරණය, විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම, විදේශ අධ්‍යයන කටයුතු හා විදේශ පුහුණු සංචාර සම්බන්ධයෙන් පහසුකම් සැලසීම, බැහැර කිරීම් කළමනාකරණය කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩලයේ කටයුතු සිදු කිරීම, අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය හා සන්ධාන සේවා සපයා දීම සහ නිවාඩු රීති ක්‍රියාත්මක කිරීම ප්‍රධාන වේ.

### (අ) සමස්ත ආයතනික පරිපාලනය

බැංකුවේ සමස්ත ආයතනික පරිපාලනය, පාලන රෙගුලාසි, වගවීම, අවදානම් කළමනාකරණය සහ වෙනත් ප්‍රධාන යහපාලන ගුණාංගවලට අනුකූලව කර ගෙන යන ලදී. ලේකම් දෙපාර්තමේන්තුව විසින් බැංකුවේ දේපළ සම්බන්ධයෙන් සමීක්ෂණ පවත්වා ඇති විය හැකි අවදානම් හඳුනාගෙන බැංකුවේ සියලුම දේපළ සඳහා පූර්ණ රක්ෂණ ආවරණයක් පසු ගිය වසර තුළදී ද ලබා ගන්නා ලදී. ලේකම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන තැපැල් කළමනාකරණ සේවාව මගින් එන සහ යන ලිපි සම්බන්ධයෙන් අවශ්‍ය පහසුකම් සලසන ලදී. බැංකුවේ ලිපිද්‍රව්‍ය කළමනාකරණය කාර්යක්ෂමව සහ පිරිමැසුම්දායක ලෙස කර ගෙන යන ලද අතර බැංකුව වෙනුවෙන් උත්සව සංවිධානය කිරීම ද ලේකම් දෙපාර්තමේන්තුවේ තවත් වැදගත් කාර්යභාරයක් විය. තවද, වර්ෂය තුළ බැංකුව සඳහා සේවා සපයන ආයතන සමග මුදල් මණ්ඩලය වෙනුවෙන් මහ බැංකුවේ ලේකම් විසින් ගිවිසුම්වලට එළඹෙන ලදී. ඊට අමතරව බැංකුවේ වෘත්තීය සංගම් හා වෙනත් සමිති සංවිධානවලට සපයනු ලබන සේවාවලට අදාළ කටයුතු ද සිදු කරන ලදී. ප්‍රසිද්ධ නිවේදන, සේවා නියුක්තියන් අතර පොදු විද්‍යුත් ලිපි සංසරණය කිරීම, යනාදිය සඳහා අනුමැතිය ලබා දීම ද මහ බැංකුවේ ලේකම් විසින් ඉටු කරන ලද අනිකුත් කාර්යයන්ට අයත්ය.

### (ආ) ප්‍රසම්පාදන කළමනාකරණය

ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකු අත්පොතෙහි දක්වා ඇති ප්‍රසම්පාදන පටිපාටියට අනුකූලව 2019 වර්ෂය තුළදී ලේකම් දෙපාර්තමේන්තුව මගින් ටෙන්ඩර් පටිපාටිය මෙන්ම ටෙන්ඩර් නොවන ක්‍රමවේද යටතේ ද අදාළ මූල්‍ය සීමාවන්ට අනුගත වන පරිදි භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කරන ලදී. මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික අයවැය පදනම් කරගෙන 2019 වර්ෂය සඳහා පිළියෙළ කරන ලද ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන කටයුතු කර ගෙන යන ලදී. ලෝක බැංකුව විසින් ක්‍රියාත්මක කරන මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය සඳහා ද ලේකම් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කරන ලදී.

### (ඇ) විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම

දෙදහස් තුන්සීයකට අධික ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් වෙනුවෙන් මහ බැංකු විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය යටතේ අදාළ ගෙවීම් කටයුතු සහ ඊට අදාළ ලිපි ලේඛන කටයුතු ලේකම් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කර ගෙන යන ලදී. ඒ අනුව, විශ්‍රාම පාරිතෝෂික හා පරිවර්තිත විශ්‍රාම වැටුප් ගෙවීම, අර්ථසාධක අරමුදල් මුදා හැරීම සහ ජීවන සහතික අර්ධ වාර්ෂිකව ලබා ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකු අත්පොතේ දක්වා ඇති නීති රීතිවලට යටත්ව මාසික විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනත්දරු අරමුදල්, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල් ගෙවීම ලේකම් දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදී.

### (ඈ) මහ බැංකු සේවා නියුක්තයන්ගේ විදේශ අධ්‍යයන කටයුතු හා පුහුණු සංචාර සඳහා පහසුකම් සැලසීම

සේවා නියුක්තයන්ගේ පශ්චාත් උපාධි කටයුතු, කෙටි කාලීන විදේශ පුහුණු සංචාර සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ රාජකාරි විදේශ ගමන් සඳහා ලේකම් දෙපාර්තමේන්තුව විසින් 2019 වසර තුළදී ද පහසුකම් සලසන ලදී. මේ සම්බන්ධයෙන් ලේකම් දෙපාර්තාමේන්තුව විසින් විශ්ව විද්‍යාලවලට, වෙනත් පුහුණු ආයතනවලට සහ රාජකාරිමය වශයෙන් විදේශගත වූ සේවා නියුක්තයන්ට අදාළ ගෙවීම් කටයුතු සිදු කරන ලදී. මීට අමතරව, විදේශගත වන සේවා නියුක්තයන් සඳහා වීසා ලබා ගැනීමට හැකි වනු පිණිස වීසා ලිපි හා අර්ථසාධක අරමුදල් ශේෂය තහවුරු කිරීමේ ලිපි නිකුත් කිරීම, ගුවන් ටිකට් පත් මිල දී ගැනීම සහ රක්ෂණ ආවරණ ලබා දීම මගින් ලේකම් දෙපාර්තමේන්තුව විදෙස්ගත වන කාර්ය මණ්ඩලය සඳහා සහාය වන ලදී.

### (ඉ) සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කිරීම

2019 වර්ෂය තුළදී යල්පිනූ, අබලන් වූ, සේවාකරණය කළ නොහැකි සහ අලුත්වැඩියා කළ නොහැකි කාර්යාලයීය උපකරණ, ලී බඩු සහ වෙනත් ස්ථාවර වත්කම් බැහැර කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කරන ලදී. බැංකුවේ එවැනි වත්කම් සමීක්ෂණය කිරීම සහ සමීක්ෂණ මණ්ඩලය මගින් ලබා දුන් නිර්දේශ අනුව ඒවා බැහැර කිරීම, බැහැර කිරීම් කළමනාකරණ ක්‍රියාවලියට අයත් විය.

## 27. ආරක්ෂක සේවා

අදාළ වර්ෂය තුළදී, ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකු සේවකයින්ට, එහි අමුත්තන්ට, දේපළවලට සහ මුදල් ප්‍රවාහනය සඳහා ආරක්ෂාව සැපයීමේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන ලද අතර පහත සාරාංශගත කර ඇති පරිදි එහි ක්‍රියා පද්ධති වැඩිදියුණු කිරීමේ හා සේවකයන් පුහුණු කිරීමේ කාර්යයන්හී ද නියැලුණි.

### 27.1 පද්ධති වැඩි දියුණු කිරීම

වර්ෂය තුළදී, මහ බැංකු මූලස්ථානයේ හා මහ බැංකුවට අයත් අනෙකුත් සියලු පිටස්තර පරිශ්‍ර තුළ ස්ථාපිත කර තිබූ සියලු ගිනි නිවීමේ උපකරණයන්හි ක්‍රියාකාරී යෝග්‍යතාවය නිරන්තර පරීක්ෂාවට ලක් කිරීම, නඩත්තු කිරීම හා ප්‍රතිස්ථාපනය

සිදු කරන ලදී. කොළඹ මහ නගර සභාවේ ගිනි නිවන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකු ගොඩනැගිල්ලේ ගිනි නිවාරණ පද්ධතියේ ක්‍රමවත් බව තහවුරු කර ගැනීම සඳහා ගිනි ආරක්ෂක විගණනයන් කරන ලදී. 2019 වර්ෂය අවසානයේ ඇනලොග් ආරක්ෂක කැමරා පද්ධතිය ඩිජිටල් කැමරා පද්ධතියක් ලෙස ප්‍රතිස්ථාපනය කිරීමට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් ක්‍රියාත්මක විය. ගෙවීම් සහ පියවීම් හා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද සියලුම රාජකාරි අඛණ්ඩව පවත්වාගෙන යෑමේ පුහුණු කටයුතු සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහභාගිවීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

### 27.2 පුහුණුවීම්

**(අ) ගිනි අනතුරු වැළැක්වීම, ගිනි නිවීම සහ ප්‍රථමාධාර වැඩසටහන්**

මහ බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවලින් තෝරා ගන්නා ලද ගිනි අනතුරු ආරක්ෂන නිලධාරීන් සඳහා කොළඹ මහ නගර සභාවේ ගිනි නිවීම් දෙපාර්තමේන්තුව, ශාන්ත ජෝන් ගිලන් රථ සේවාව සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව ගිනි වැළැක්වීම, ගිනි නිවීම, ප්‍රථමාධාර සහ ආපදා කළමනාකරණ පිළිබඳව දින දෙකක පෘථුල වැඩසටහනක් 2019 නොවැම්බර් මාසයේ දී පවත්වන ලදී. මීට අමතරව, 2019 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ සමස්ත සේවා නියුක්තිකයින් උදෙසා ගිනි නිවීමේ සහ ගිනි අනතුරු සරඹ පෙරහුරුවක් ද පවත්වන ලදී.

**(ආ) කුසලතාවයන් හා දක්ෂතාවයන් ඔප්නැංවීම**

ආරක්ෂක නිලධාරීන්ගේ කුසලතාවය වැඩිදියුණු කිරීම සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යාපනික වැඩසටහන් කිහිපයක් ද පිළියෙළ කරන ලදී. මෙම අධ්‍යයන වැඩසටහන් ආරක්ෂක, තොරතුරු තාක්ෂණය සහ පාරිභෝගික සම්බන්ධතා ආදී ප්‍රධාන අංශ ආවරණය කරන ලදී.

**(ඇ) අවි පරිහරණය සහ ජීව වෙඩි පුහුණුව**

ශ්‍රී ලංකා යුද හමුදාවේ සහය ඇතිව සියලුම ආරක්ෂක නිලධාරීන් සඳහා අවි පරිහරණය සහ ජීව වෙඩි පුහුණුවක් වර්ෂයේ අවසාන කාර්තුවේදී ලබා දෙන ලදී.

**(ඈ) නව බඳවා ගැනීම්**

2019 වර්ෂයේද පුහුණු ආරක්ෂක නිලධාරීන් නව දෙනෙක් බඳවාගත් අතර ආරක්ෂක රාජකාරීන් පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී.

### 27.3 පරීක්ෂා කිරීමේ කටයුතු

2019 වර්ෂය තුළදී, ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මහ බැංකු මූලස්ථානයට පැමිණි අමුත්තන් 99400 ක් සහ මුදල් පෙට්ටි 42004 ක් හුවමාරුවේ දී පරීක්ෂාවට ලක් කිරීම හා පහසුකම් සලසා දීම සිදු කර ඇත.

## 28. කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ

කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව (කා.සේ.ක.දෙ.) සුභසාධන පහසුකම් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ප්‍රතිලාභීන් වෙත ලබා දීම මෙම වසර තුළදී අඛණ්ඩව සිදු කරන ලදී. කාර්යමණ්ඩල නිවාස (උකස්) ණය සැපයීම, අර්ථසාධක අරමුදල් ණය ක්‍රමය සහ කාර්යමණ්ඩල සුභසාධන ණය ක්‍රමය යටතේ ණය ලබා දීම, සේවා දායක වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම, වෛද්‍ය මධ්‍යස්ථාන පහසුකම් සහ ආපනශාලා පහසුකම් සැපයීම මෙම සේවාවන්වලට අයත් විය. 2019 වසර අවසානයේදී සේවානියුක්තයන්, විශ්‍රාමිකයන්, වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා ලියාපදිංචි යැපෙන්නන්ගෙන් සමන්විත වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 10,700 ක් පමණ විය.

2019 වසර තුළදී, කා.සේ.ක. දෙපාර්තමේන්තුව විසින් නිවාස ණය (273), අර්ථසාධක අරමුදල් ණය (1014), වාහන ණය (197), පරිගණක ණය (03), කාර්යමණ්ඩල සුභසාධන ණය ක්‍රමය (ආ) කාණ්ඩය (188) කාර්යමණ්ඩල සුභසාධන ණය ක්‍රමය (ඇ) කාණ්ඩය (73) ලෙස මුළු ණය 1,748 ක් ප්‍රදානය කරන ලදී. ණය අධීක්ෂණ ක්‍රමය මගින් වඩාත් කාර්යක්ෂමව සේවා නියුක්තයන්ට ණය ලබා දීම අධීක්ෂණය කිරීමට හැකි විය.

ඉඩම් මිල සහ ඉදිකිරීම් පිරිවැය ඉහළ යෑම සැලකිල්ලට ගනිමින් නිවාස සඳහා අනුමත කරනු ලබන උපරිම ණය ප්‍රමාණය රු. 7,500,000/- දක්වා 2019.03.01 දින සිට වැඩි කරන ලදී. එමෙන්ම, නිවාස අළුත්වැඩියා කිරීම සහ නිවසෙහි ඉඩපහසුකම් පුළුල් කිරීම සඳහා අනුමත කරනු ලබන ණය ප්‍රමාණද ඒ සමඟ වැඩි කරන ලදී.

ආපනශාලා මෙහෙයුම් ඵලදායීතාව සහ පිරිවැය කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් 2019.09.01 දින සිට ආපනශාලාව බාහිර පාර්ශ්වයක් මගින් ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගන්නා ලදී.

වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි සියලුම ප්‍රතිලාභීන්ගේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීමට කා.සේ.ක. දෙපාර්තමේන්තුව විසින් නොකඩවා කටයුතු කරන ලදී. පසුගිය වසරට සාපේක්ෂව 2019 වර්ෂයේ දී ප්‍රතිපූරණය කරන ලද මුළු වෛද්‍ය වියදම් ප්‍රමාණය සියයට දොළහකින් ඉහළ යන ලදී. මුදල් මණ්ඩලයේ අනුමැතිය මත වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වන වෛද්‍ය වියදම් හිමිකම්පෑම් සීමාවන් 2019.03.01 දින සිට බලපැවැත්වෙන පරිදි වැඩි කරන ලදී. වෛද්‍ය මධ්‍යස්ථානය මගින් බාහිර පාර්ශ්වයක් හරහා සපයනු ලබන වෛද්‍ය පහසුකම්, මහ බැංකු සේවා නියුක්තයන් වෙත කාර්යාල වේලාවන් තුළදී සපයන ලදී. සාධාරණ මිල ගණන් යටතේ වෛද්‍ය පරීක්ෂණ සහ රසායනාගාර සේවා පහසුකම් වෛද්‍ය මධ්‍යස්ථානය තුළින් සිදු කිරීමට ද පියවර ගන්නා ලදී. "පුරස්ථි ග්‍රන්ථිය ආශ්‍රිත රෝගවලින් මිදෙන්නට ඔබට හැකිද?", "නවීන ලෝකය තුළ නිරෝගිමත් දිවි පැවැත්මක් සඳහා කෙතරම්දුරට ඔබ සූදානම්ද?", "ආහාර පිළිබඳ මිථ්‍යාවන් සහ විශ්වාස ගැන දැනගන්න" සහ "ආතතියෙන් මිදුණු සුවපත් මනසකින් ගොඩ නගමු සාර්ථක දිවියක්" යන මාතෘකාවන් යටතේ සේවා නියුක්තයන් දැනුවත් කිරීමේ සෞඛ්‍ය වැඩසටහන් හතරක් සළකා බලන වසර තුළදී කා.සේ.ක. දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන ලදී.

# 29. සංඛ්‍යාන

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව සිය මෙහෙයුම් කටයුතු ඵලදායී ලෙස අඛණ්ඩව සිදු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු වන "ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගැනීම" සහ "මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම" සඳහා දායකත්වය සපයන ලදී. ඒ අනුව 2019 වර්ෂයේ දී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ප්‍රධාන කටයුතු අතරට, ප්‍රාථමික හා ද්විතීයික ප්‍රභවයන්ගෙන් දත්ත හා තොරතුරු රැස් කිරීම; ව්‍යාපාර මත පිළිබඳ, දේපළ මිල සහ වැටුප් ප්‍රමාණ දර්ශක සම්පාදනය කිරීම; කෙටි කාලීන උද්ධමනය සහ දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීම; ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය සහ පළාත් දළ දේශීය නිෂ්පාදිතය වැනි ප්‍රාදේශීය සංඛ්‍යාන සම්පාදනය කිරීම; දත්ත සංචිතය, ප්‍රකාශන, වාර්තා හා පුවත්පත් නිවේදන මගින් කාලීනව හා විධිමත් ලෙස තොරතුරු බෙදා හැරීම හා දැනුම් හුවමාරු කටයුතුවල නිරත වීම ඇතුළත් වේ.

2019 වර්ෂයේ දී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ගෝලීය වශයෙන් අනෙකුත් මහ බැංකුවලට අනුකූලව යමින්, සාම්ප්‍රදායික ප්‍රවේශයන් වැඩිදියුණු කිරීමේ හා ඌනපූරණය කිරීමේ අරමුණ ඇතිව, විසල් දත්ත (big data), යන්ත්‍ර ඉගෙනුම් (machine learning) සහ දත්ත දෘශ්‍යකරණය (data visualisation) වැනි උසස් තාක්ෂණයන් භාවිතා කිරීමේ ප්‍රයත්නයන්හි නියැලෙමින්, නව ඉදිරි පියවරක් සනිටුහන් කරන ලදී. විසල් දත්තවල එක් අංගයක් ලෙස සැලකෙන අන්තර්ජාල දත්ත, මෙම වර්ෂය තුළ ප්‍රයෝජනවත් දර්ශක කිහිපයක් සම්පාදනය කිරීම සඳහා යොදා ගන්නා ලදී. මේ අනුව දේපළ වෙළඳාමට සම්බන්ධ වෙබ් අඩවිවලින් ලබාගත් මිල දත්ත ඇසුරින් දේපළ මිල දර්ශකයක් සම්පාදනය කිරීම ද, ආනයනික භාණ්ඩවල මිලට විනිමය අනුපාතිකය වෙනස් වීමෙන් ඇතිවන බලපෑම විමසා බැලීමට සුපිරි වෙළඳසැල්වල වෙබ් අඩවිවලින් ලබාගත් මිල දත්ත ඇසුරින් දර්ශකයක් සම්පාදනය කිරීම ද සිදු කරන ලදී. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් උද්ධමන පුරෝකථන තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා යන්ත්‍ර ඉගෙනුම් ක්‍රම අත්හදා බැලීම සිදු කරන ලදී. මීට අමතරව, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව සිය විශ්ලේෂණයන් සන්නිවේදනය කිරීමේ දී, ඒවායේ අන්තර්ගතය පහසුවෙන් ග්‍රහණය කරගැනීමට හැකිවන ලෙස, අන්තර් ක්‍රියාකාරී පුවරු (interactive dashboards) භාවිතය ද ආරම්භ කරන ලදී.

## 29.1 සමීක්ෂණ හා වෙනත් මූලාශ්‍ර මගින් දත්ත රැස් කිරීම

### (අ) ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණ

ආර්ථික කටයුතුවල ප්‍රවණතාව හඳුනාගැනීමේ දී වැදගත් වන ප්‍රධාන දර්ශකවල දැනට පවත්නා තත්ත්වය සහ අපේක්ෂිත ඉදිරි වර්ධන පිළිබඳව ව්‍යාපාරික මතය පිළිබිඹු කරන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය (Business Outlook Survey - BOS) 2019 වසරේ දී ද කෙටි කාලීන වෙළඳපොළ ප්‍රවණතා අධීක්ෂණය කිරීම සඳහා කාර්තුමය පදනමින් අඛණ්ඩව සිදු කරන ලදී. ආර්ථිකයේ කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන ප්‍රධාන ආර්ථික කටයුතු ආවරණය වන පරිදි තෝරාගත් මහා පරිමාණ ව්‍යාපාර ඒකක මෙම සමීක්ෂණයේ ඉලක්කගත සංගහනය විය.

දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීමේ දී වැදගත් වන ආර්ථික ක්‍රියාකාරකම්හි වෙනස්වීම් තත්කාලීනව ලබාදෙන පූර්ව දැනුම්දීමේ දර්ශක ලෙස භාවිතා කරනු ලබන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක (Purchasing Managers' Index - PMI) සමීක්ෂණ, නිෂ්පාදන, සේවා හා ඉදිකිරීම් කටයුතු ආවරණය වන පරිදි මාසිකව සිදු කරන ලදී. නිෂ්පාදන සහ සේවා කටයුතුවලට අදාළ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයන්හි ඉලක්කගත සංගහනය වන්නේ බස්නාහිර පළාත කේන්ද්‍රකොටගත් මහා පරිමාණ ව්‍යාපාර ඒකකයන්ය. මේ අතර, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (Construction Industry Development Authority - CIDA) ලියාපදිංචි වී ඇති ආයතන අතුරින් තෝරාගනු ලැබූ ප්‍රධාන ඉදිකිරීම් ආයතන ආවරණය කරමින්, ඉදිකිරීම් අංශය සඳහා වූ සමීක්ෂණය සිදු කරන ලදී. පර්යේෂකයන්, ආර්ථික විශ්ලේෂකයන්, ව්‍යාපාර ක්ෂේත්‍රයේ විශේෂඥයන් සහ ව්‍යාපාර පිළිබඳ තීරණගන්නන් හට ද රටේ ආර්ථික තත්ත්වය පිළිබඳව මනා අවබෝධයක් ලබාගැනීම සඳහා මෙම දර්ශක උපයෝගී කරගත හැකිය.

ණය වෙළඳපොළේ ඉල්ලුම සහ සැපයුම පිළිබඳ ප්‍රවණතා අධ්‍යයනය කිරීමේ අරමුණින් ණය තත්ත්වය පිළිබඳ සමීක්ෂණ 2019 වසර තුළදී ද අඛණ්ඩව සිදු කරන ලදී. ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය සැලකීමේ දී, බස්නාහිර පළාත තුළ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවලින් ආවරණය වන පළාත් තුළ ක්‍රියාත්මකව පවතින සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ඒකක, සමීක්ෂණයේ ඉලක්කගත සංගහනය විය. මෙම සමීක්ෂණය අර්ධ වාර්ෂික පදනමින් සිදු කරන ලද අතර, එහි ප්‍රතිඵල, ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී සැලකිල්ලට ගැනීම සඳහා යොමු කරන ලදී. ණය වෙළඳපොළෙහි මෑතකාලීන ප්‍රවණතා සහ ඉදිරි අපේක්ෂා පිළිබඳ තොරතුරු ලබාගැනීමේ අරමුණෙන් යුක්තව සැලසුම් කරන ලද ණය සැපයුම පිළිබඳ සමීක්ෂණය මගින් සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු ආවරණය කරන ලදී. 2019 වසර තුළදී මෙම සමීක්ෂණය තවදුරටත් වැඩිදියුණු කර කාර්තුමය පදනමෙන් සිදු කරන ලදී. එම සමීක්ෂණයෙහි ප්‍රතිඵල මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියෙහි දී භාවිතා කිරීම සඳහා වාර්තා කරන ලද අතර, එම දත්ත බාහිර පරිශීලකයන්ගේ ප්‍රයෝජනය උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

සිල්ලර වෙළඳාම් අංශයෙහි ප්‍රවණතා හඳුනාගැනීමේ අරමුණ ඇතිව සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සාමාන්‍ය සිල්ලර වෙළඳ ආයතන මෙන්ම සුපිරි වෙළඳසැල් කාණ්ඩය ද ආවරණය කරමින් වෙන් වෙන්ව සමීක්ෂණ දෙකක් පවත්වන ලදී. සාමාන්‍ය සිල්ලර වෙළඳ කටයුතුවලට අදාළ විකුණුම් පරිමා දත්ත පිළිබිඹු කෙරෙන දර්ශකයක් සකස් කිරීම සඳහා දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ මගින් ආවරණය කෙරෙන සිල්ලර වෙළඳ ආයතන පදනම් කර ගනිමින් 2019 වසරේ දී සිල්ලර වෙළඳාම් විකුණුම් පරිමා සමීක්ෂණය ආරම්භ කරන ලදී. තවද, නවීන සිල්ලර වෙළඳාම් කටයුතුවල ප්‍රවණතා හඳුනාගැනීමේ අරමුණෙන්, සුපිරි වෙළඳසැල්හි සිල්ලර වෙළඳාම් කටයුතු පිළිබඳ සමීක්ෂණය 2019 වසර

තුළදී කාර්තුමය පදනමෙන් අඛණ්ඩව සිදු කරන ලද අතර, මෙම සමීක්ෂණය මගින් රැස් කරන ලද දත්ත භාවිතා කරමින් කාර්තුමය පදනමෙන් සුපිරි වෙළඳසැල් විකුණුම් පිරිවැය දර්ශකය ගණනය කරන ලදී.

ශ්‍රී ලංකාවේ සහාධිපත්‍ය වෙළඳපොළෙහි ප්‍රවණතා අධ්‍යයනය කිරීම අරමුණු කොටගෙන එම වෙළෙඳපොළ ගනුදෙනු පිළිබඳව ප්‍රාථමික දත්ත ලබාගැනීම සඳහා 2019 වර්ෂයේ දී ද කාර්තුමය පදනම මත සහාධිපත්‍ය වෙළඳපොළ සමීක්ෂණය අඛණ්ඩව පවත්වන ලදී. මෙම සමීක්ෂණයට ප්‍රධාන සහාධිපත්‍ය ඉදිකරන්නන් සහභාගි වූ අතර, සහාධිපත්‍ය දේපළවල තත්‍ය විකුණුම් මිල, ඉල්ලුම, මිල වෙනස්වීම් සඳහා බලපාන හේතු, දැනට පවතින හා ඉදිරියේ දී ඉදිකිරීමට බලාපොරොත්තු වන නිවාස ඒකක ප්‍රමාණය, එක් එක් ව්‍යාපෘතිවල දැනට වෙන් කරවාගෙන ඇති නිවාස ඒකක ප්‍රමාණය, නිවාස ගැනුම්කරුවන්ගේ තොරතුරු සහ සහාධිපත්‍ය ඉදිකරන්නන්ගේ වෙළඳපොළ පිළිබඳ ඉදිරි දැක්ම යන දත්ත එක්රැස් කර ගන්නා ලදී. ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග තීරණය කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට මෙම සමීක්ෂණය උපයෝගී වේ.

**(ආ) උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය**

තෝරාගත් ආර්ථික නියෝජිත කාණ්ඩවල, එනම් ආයතනික අංශයේ සහ ගෘහස්ථ අංශයේ වත්මන් සහ අනාගත උද්ධමන අපේක්ෂා පිළිබඳ දත්ත හා තොරතුරු රැස් කිරීම සඳහා උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය 2019 වසරේ දී ද මාසිකව පවත්වන ලද අතර, ගෘහස්ථ අංශයට අදාළ උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ හරහා ජාතික මට්ටම දක්වා පුළුල් කිරීමට ද කටයුතු කරන ලදී. මෙම සමීක්ෂණ සිදු කරන අවස්ථාවන්හි දී පවත්වන ලද දැනුම්වත් කිරීමේ සැසි, ආර්ථික නියෝජිතයන්ගේ උද්ධමනය පිළිබඳ දැනුම්වත්භාවය වැඩි කිරීමට සහ එමගින් ඔවුන්ගේ උද්ධමන අපේක්ෂා මනා ලෙස පාලනය කිරීමට දායක විය.

**(ඇ) දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ**

2018 වසරේ දී ආරම්භ කරන ලද ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් දත්ත රැස් කිරීමේ දීප ව්‍යාප්ත වැඩපිළිවෙළ, ගුරු සමීක්ෂකවරුන් 53 කගේ සහභාගිත්වයෙන් 2019 වසරේ දී ද අඛණ්ඩව පවත්වන ලද අතර, ඒ හරහා ජාතික පාරිභෝගික මිල දර්ශකයට සමාන භාණ්ඩ පැසක සිල්ලර මිල ගණන්, කෘෂිකාර්මික භාණ්ඩ හා ගොඩනැගිලි ද්‍රව්‍යවල නිෂ්පාදකයාගේ මිල; අවිධිමත් අංශයේ සේවකයන්ගේ දෛනික වැටුප්, උද්ධමන අපේක්ෂා සහ තෝරාගත් භාණ්ඩවල සිල්ලර විකුණුම් පරිමා රැස් කළ අතර, එමගින් අභ්‍යන්තර ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය සඳහා යෙදවුම් ලබාදීමට හැකි විය. දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ මගින් ලබාගන්නා දත්තවල අඩුපාඩු මගහරවා ගෙන ඒවායේ ගුණාත්මකභාවය තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින්, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මහ බැංකු ප්‍රාදේශීය කාර්යාලවල සහාය ඇතිව දත්ත රැස් කිරීමේ මධ්‍යස්ථාන සහ දත්ත සමීක්ෂකවරුන් පිළිබඳ අවශ්‍ය අවස්ථාවන්හි එතැන් අධීක්ෂණ මෙන්ම විතැන් අධීක්ෂණ සිදු කරන ලදී. දත්ත සමීක්ෂකවරුන් විසින් දත්ත රැස් කිරීමේ දී සිදු කරනු ලබන පොදු අඩුපාඩු පිළිබඳව ඔවුන්ව දැනුම්වත් කිරීම සහ දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාවලියේ දී ඔවුන් මුහුණ දෙන ගැටලු මගහරවා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ දී ප්‍රාදේශීය සම්මන්ත්‍රණ තුනක් පවත්වන ලදී. මීට අමතරව, දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාවලියේ දී දත්ත සමීක්ෂකවරුන් මුහුණ දෙන ගැටලුවලට විසඳුම් ලබාදීම සඳහා 2019 වසරේ දී විද්‍යුත් සන්නිවේදන ක්‍රමවේදයක් ද හඳුන්වා දෙන ලදී.

සතිපතා, මාසිකව සහ කාර්තුමය පදනම මත රැස් කරන ලද එම දත්ත සහ තොරතුරු, මිල විචලන සහ උද්ධමනය පුරෝකථනය කිරීම; ආර්ථික ප්‍රතිපත්තිවල වෙනස්කම් මගින් මිල මත ඇති කරන බලපෑම් ඇගයීම; මිල සහ වැටුප්වල ඍතුමය සහ ප්‍රාදේශීය වෙනස්කම් විශ්ලේෂණය කිරීම; පළාත්බද දළ දේශීය නිෂ්පාදිතය සහ ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කිරීම; සහ දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීම සඳහා භාවිතා කරන ලදී.

මීට අමතරව, පිටකොටුව වෙළඳපොළ, මරඳගහමුල සහල් වෙළඳපොළ, දඹුල්ල හා නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථාන සහ මීගමුව හා පැලියගොඩ මාළු වෙළඳසැල් යන ස්ථානයන්ගෙන් තොග හා සිල්ලර මිල ගණන් දෛනිකව සහ සතිපතා රැස් කිරීම සඳහා ගුරුවරුන් නොවන දත්ත සමීක්ෂකවරුන්ගේ සේවය දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ යටතේ ලබාගන්නා ලදී. මෙම ප්‍රධාන වෙළඳපොළවලින් රැස් කරනු ලබන තොරතුරු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල විචලනයන් පිළිබඳව කළමනාකාරීත්වය දැනුම්වත් කිරීම සඳහා මෙන්ම පුරෝකථන සිදු කිරීම සඳහා උපයෝගී කර ගනු ලබයි. තවද, මෙම මිල දත්ත විශ්ලේෂණය කොට සාරාංශ වශයෙන් සකසනු ලබන දෛනික මිල වාර්තාවක් ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ දිනපතා ප්‍රකාශයට පත් කරන ලදී.

**(ඈ) ශ්‍රම බලකායේ තොරතුරු සහ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ අනෙකුත් දත්ත සපයන ආයතනවලින් ලබාගත් දත්ත හා තොරතුරු මගින් සේවා නියුක්තිය, සේවා වියුක්තිය, විදේශ සේවා නියුක්තිය, කම්කරු සබඳතා, වැඩ වර්ජන සහ ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් සමස්ත වෙළඳපොළ දත්ත විශ්ලේෂණ සිදු කිරීමට සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. රාජ්‍ය අංශයේ සේවා නියුක්තියේ වර්ධන සොයා බැලීම සඳහා, රාජ්‍ය අංශයේ සියලුම ආයතන ආවරණය කරමින් සේවා නියුක්තිය පිළිබඳව සමීක්ෂණය වාර්ෂිකව පවත්වන ලදී.

**(ඉ) අවශ්‍යතාව මත සිදු කරන ලද සමීක්ෂණ**

ඉහත සඳහන් පරිදි අඛණ්ඩව සිදු කරනු ලබන සාමාන්‍ය සමීක්ෂණවලට අමතරව, ආර්ථිකය කෙරෙහි හෝ මහ බැංකුව ආශ්‍රිත කටයුතු කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි හදිසි අනපේක්ෂිත සිදුවීම්/ප්‍රවණතා පිළිබඳ තොරතුරු ලබාගැනීමේ අරමුණෙන්, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය අවස්ථාවල දී විවිධ සමීක්ෂණ පවත්වනු ලැබේ.

ඒ අනුව, 2019 වසර තුළදැ ආර්ථිකයේ පැවති අනපේක්ෂිත තත්ත්වවලින් ඇති වූ ආර්ථික බලපෑම පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා අවශ්‍යතාව අනුව සැලසුම් කළ සමීක්ෂණ කිහිපයක්ම සිදු කරන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව තවත් මහ බැංකු 20 ක් සමග එකතු වී "මිල නියම කිරීමේ උපායමාර්ග සහ මිල වෙනස්වීම් සිදුවන වාර ගණන" පිළිබඳව ගෝලීය වශයෙන් පවත්වන ලද සමීක්ෂණයක් සඳහා දායක වූ අතර, එහිදී ලෝකය පුරා සමස්තයක් ලෙස මිල වෙනස්වීම්වල පවත්නා මන්දගාමිත්වය පැහැදිලි කිරීම සඳහා යොදා ගන්නා මිල සිද්ධාන්තවල වලංගුභාවය පරීක්ෂාවට ලක් කරන ලදී.

## 29.2 දර්ශක සම්පාදනය

### (අ) ව්‍යාපාර මත පිළිබඳ දර්ශක

ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙහි ප්‍රතිඵල පදනම් කොට ගෙන, ව්‍යාපාර තත්ත්වය, ලාභදායීත්වය, පුහුණු ශ්‍රම සුලබතාවය, විකුණුම්, ඉල්ලුම් සහ ධාරිතා උපයෝජනය යන ව්‍යාපාර මත පිළිබිඹු කරන උප දර්ශක සකස් කරන ලදී. මෙම උප දර්ශක මගින් ගත වූ කාර්තුවේ ප්‍රවණතා හා ඉදිරි කාර්තුවේ අපේක්ෂා පිළිබඳ තොරතුරු දැක්වේ. මෙම තොරතුරු ආර්ථික වර්ධනය පිළිබඳ පුරෝකථන සැකසීමේ දී සැලකිල්ලට ගන්නා ලදී. තවද, අදාළ සමීක්ෂණ ප්‍රතිඵල ප්‍රතිපත්ති සම්පාදනයේ දී සලකා බැලීම සඳහා මුදල් ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කරන ලදී. එමෙන්ම, ප්‍රධාන දර්ශකවල සමස්ත ප්‍රවණතා මහජනතාවගේ දැන ගැනීම පිණිස කාර්තුමය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ පළ කරන ලදී.

නව ඇණවුම්, නිෂ්පාදිතය, සේවා නියුක්තිය, ඇණවුමක් සැපැයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය සහ ගැනුම් තොග යන උපදර්ශක සහිතව නිෂ්පාදන කටයුතුවලට අදාළ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයත්, නව ව්‍යාපාර කටයුතු, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය, නිම කිරීමට නියමිත ප්‍රධාන කාර්යයන් සහ ව්‍යාපාර ක්‍රියාකාරකම් සම්බන්ධ ඉදිරි අපේක්ෂා යන උප දර්ශක සහිතව සේවා කටයුතුවලට අදාළ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයත් මාසික ප්‍රවණතා නිරූපණය වන පරිදි ගණනය කරන ලදී. මෙම සමීක්ෂණවල ප්‍රතිඵල මගින් ආර්ථිකයේ කෙටිකාලීන ප්‍රවණතා පිළිබඳව තත්කාලීන දත්ත ලබාගන්නා ලදී. මෙම දත්ත දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථන ක්‍රියාවලිය සඳහා යොදා ගත් අතර, තොරතුරු මත පදනම් වූ තීරණ ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති කමිටුවට වාර්තා කරන ලදී. තවද, මහජනතාවගේ දැන ගැනීම පිණිස පුවත්පත් නිවේදන මගින් මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රසිද්ධ කරන ලදී. ඉදිකිරීම් කටයුතුවලට අදාළ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණය ද පවත්වන ලද අතර, එම දත්ත මහ බැංකුවේ අභ්‍යන්තර ආර්ථික දත්ත විශ්ලේෂණ කටයුතු සඳහා යොදා ගන්නා ලදී.

### (ආ) දේපළ මිල දර්ශක

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ දී කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මධ්‍යස්ථාන 82 ක් ආවරණය වන පරිදි ඉඩම් මිල දර්ශකය (පාදක කාලපරිච්ඡේදය: 2017 පළමු භාගය) අර්ධ වාර්ෂික පදනමින් සම්පාදනය කොට ප්‍රකාශයට පත් කරන ලදී. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ඉඩමක පර්චසයක් සඳහා ඇස්තමේන්තු කරන ලද වටිනාකම උපයෝගී කර ගනිමින් නේවාසික, වාණිජ සහ කාර්මික ඉඩම් සඳහා උප දර්ශක තුනක් ද වෙන් වෙන් වශයෙන් සම්පාදනය කරන ලදී.

මීට අමතරව, 2016 වර්ෂයේ සිට විශ්ලේෂණ කටයුතු සඳහා භාවිතා කිරීමට සහාධිපත්‍ය අංශය ආවරණය වන පරිදි නේවාසික ඉඩම් මිල දර්ශක මාසික සහ කාර්තුමය පදනමෙන් සම්පාදනය කරන ලදී. මෙහි දී මාසික දර්ශකය සම්පාදනය කිරීම සඳහා දේපළ වෙළඳාම් වෙබ් අඩවිවල සඳහන් වෙළඳ දැන්වීම් තොරතුරු යොදා ගන්නා ලද අතර, සහාධිපත්‍ය වෙළඳපොළ පිළිබඳ සමීක්ෂණය මගින් ලබාගත් විකුණුම් මිල ගණන් හා තොරතුරු භාවිතයෙන් කාර්තුමය දර්ශකය සම්පාදනය කරන ලදී. මෙම දර්ශක ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ මිල වෙනස්වීම් අධීක්ෂණය කිරීමට උපකාරී වේ. 2019 වසරේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණ සහාය ද සහිතව දර්ශක සම්පාදන ක්‍රියාවලියේ වැඩිදියුණු කිරීම් සිදු කරන ලද අතර, ඉදිරියේ දී මෙම දර්ශක ප්‍රකාශයට පත් කිරීමට සංඛ්‍යාන දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටියි.

### (ඇ) වැටුප් ප්‍රමාණ දර්ශක

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය, විධිමත් පෞද්ගලික සහ අවිධිමත් පෞද්ගලික යන අංශ ආවරණය වන වැටුප් ප්‍රමාණ දර්ශක සම්පාදනය කරනු ලබන අතර, ආර්ථිකයේ වැටුප් සහ වේතනවල විචලන තක්සේරු කිරීම සඳහා ඒවා යොදා ගනු ලබයි. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2016 පෙබරවාරි 25 වන දින නිකුත් කරන ලද අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් පරිදි නිශ්චිත වෘත්තීන්හි ආරම්භක වැටුප් කේත අනුව 2019 වසරේ දී රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ පදනම් වර්ෂය 2016 (2012 වෙනුවට) ලෙස වෙනස් කරන ලදී. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2016 නොවැම්බර් මස පවත්වන ලද රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ රැකියා නියුක්තිය සම්බන්ධ සංගණනයෙන් පදනම් වර්ෂයට අදාළ දත්ත ලබාගන්නා ලදී. වරින් වර නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛ මත පදනම්ව රාජ්‍ය අංශයේ නාමික සහ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක සම්පාදනය කරන ලදී. කම්කරු දෙපාර්තමේන්තුව විසින් සකස් කරන පඩි පාලක සභාවල සේවකයන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශක මත පදනම්ව විධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක සම්පාදනය කරන ලදී. දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ මගින් ලබාගන්නා ලද දත්ත පදනම් කරගෙන අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය සම්පාදනය කිරීම මගින් අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් විචලන විශ්ලේෂණය කරන ලදී.

## 29.3 කෙටිකාලීන උද්ධමනය සහ දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් උද්ධමනය සහ ආර්ථික වර්ධන වේගය සම්බන්ධ කෙටිකාලීන පුරෝකථන සහ අදාළ අනෙකුත් විශ්ලේෂණ සිදු කරමින් "පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය" සඳහා අඛණ්ඩව දායක වන ලදී. විවිධ මූලාශ්‍රවලින් ලබාගත් දත්ත භාවිතයෙන් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සංඛ්‍යාන ආකෘති මෙන්ම දර්ශක පදනම් කරගත් පුරෝකථන සිදු කරයි. 2019 වසර තුළදී ද මෙම පුරෝකථන මුදල් ප්‍රතිපත්ති

සම්පාදන ක්‍රියාවලියේ දී විශ්ලේෂණයට සහ සාකච්ඡාවට ලක් කළ අතර, අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා මුදල් මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයට සහ ජාතික පාරිභෝගික මිල දර්ශකයට අදාළ කෙටි කාලීන උද්ධමන පුරෝකථන සිදු කිරීම සඳහා මෑත කාලීන මිල ප්‍රවණතා, වෙළඳපොළ ප්‍රවණතා හා සම්බන්ධ අපේක්ෂිත මිල විචලන සහ ආර්ථිකමිතික ක්‍රමවේද පදනම් කර ගන්නා ලදී. උද්ධමන පුරෝකථන වැඩිදියුණු කිරීම සඳහා සැපයුම සහ ඉල්ලුම යන දෙඅංශයෙන්ම උද්ධමනය මත ඇතිවන බලපෑම් පෙන්නුම් කරනු ලබන නව විචල්‍ය පිළිබඳව සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන් අධ්‍යයනය කරන ලදී. තවද, දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සමීක්ෂණ ප්‍රතිඵලවලින් පිළිබිඹු වන යෙදවුම් සහ නිමැවුම්වල මිල ප්‍රවණතා පදනම් කරගෙන උද්ධමන පුරෝකථන නිරන්තරයෙන් යාවත්කාලීන කරනු ලැබිණි. එමෙන්ම, උද්ධමන පුරෝකථන දෝෂ අවම කිරීම සඳහා දෛනික මිල ගණන් භාවිතා කරමින් නව ක්‍රමවේදයක් 2019 වසරේ දී හඳුන්වා දෙන ලදී. ඒ අනුව, පවත්නා පුරෝකථන ක්‍රමය අඛණ්ඩව වැඩිදියුණු කිරීමට ගන්නා ලද තවත් එක් පියවරක් ලෙස නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල දෛනික මිල ගණන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ උද්ධමන පුරෝකථනය වැඩිදියුණු කිරීම සඳහා භාවිතා කරන ලදී.

දළ දේශීය නිෂ්පාදිතයේ කෙටිකාලීන වර්ධනය පුරෝකථනය සඳහා ආර්ථික දර්ශක පදනම් කරගත් ක්‍රමවේද මෙන්ම සංඛ්‍යාන ආකෘති පදනම් කරගත් ක්‍රමවේද ද භාවිතා කරනු ලැබීය. දර්ශක පදනම් කරගත් පුරෝකථන ක්‍රියාවලියේ දී, ඉදිරි ආර්ථික ක්‍රියාකාරකම් පිළිබිඹු කරන දර්ශක, සමීක්ෂණවල ප්‍රතිඵල සහ ආර්ථික කටයුතුවලට අදාළ අනෙකුත් ප්‍රාථමික සහ ද්විතීයික තොරතුරු මෙන්ම විශේෂඥ මතය ද සැලකිල්ලට ගන්නා ලදී. මෙයට අමතරව, කාර්තුමය දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීම සඳහා සංඛ්‍යාන ආකෘති මත පදනම් වූ ක්‍රමවේදයන් ද භාවිතා කරන ලදී.

## 29.4 ප්‍රාදේශීය සංඛ්‍යාන සම්පාදනය කිරීම

### (අ) ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය

2019 වසරේ දී ද සමස්ත ශ්‍රී ලංකාවේ සහ එක් එක් පළාත්වල සෞභාග්‍ය තත්ත්වය මැන බැලීම සඳහා ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් අඛණ්ඩව සිදු කරන ලදී. නියෝජනාත්මක විචල්‍ය 43 ක් භාවිතයෙන් මනිනු ලබන ආර්ථික හා ව්‍යාපාර පරිසරය, ජන ජීවිතයේ යහ පැවැත්ම සහ සමාජ-ආර්ථික යටිතල පහසුකම් යන උපදර්ශක තුනකින් මෙම දර්ශකය සමන්විත වේ. සෞභාග්‍යතා දර්ශක අගයන් ජාතික මට්ටමින් සහ පළාත් මට්ටමින් වෙන වෙනම සම්පාදනය කෙරේ. විවිධ පළාත්වල ගැටලු විසඳීම සඳහා සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීමේ දී පළාත් අතර ඇති විෂමතා හඳුනා ගැනීමට පළාත් බලධාරීන්ට සහ අනෙකුත් ප්‍රතිපත්ති සම්පාදකයින්ට මෙය වැදගත් දර්ශකයක් වේ. තවද, පළාත් මට්ටමින් ඉලක්ක සැකසීමට සහ ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිවල ඵලදායීතාව තක්සේරු කිරීමට මෙම දර්ශකය හා එහි උප දර්ශක භාවිත කළ හැකිය.

### (ආ) පළාත් දළ දේශීය නිෂ්පාදිතය

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් පළාත් කෘෂිකාර්මික නිෂ්පාදන, කර්මාන්ත ක්‍රියාකාරකම් සහ සේවාවන්හි වටිනාකම්වලට අදාළ උචිත පළාත් දර්ශක භාවිතා කරමින් ව්‍යුත්පන්න කරන ලද ප්‍රාදේශීය අනුපාත අනුව ජාතික දළ දේශීය නිෂ්පාදිතයේ අගයන් පළාත්වලට බෙදා වෙන් කරමින්, නාමික පළාත් දළ දේශීය නිෂ්පාදිතය සම්පාදනය කිරීම 2019 වසරේ දී ද සිදු කරන ලදී. ඒ අනුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු නිකුත් කිරීමෙන් පසු, 2018 වර්ෂය සඳහා වන පළාත් දළ දේශීය නිෂ්පාදිතය සම්පාදනය කර 2019 සැප්තැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. ඒ ඒ පළාත් මගින් ජාතික දළ දේශීය නිෂ්පාදිතය සඳහා ලබාදෙන දායකත්වය පිළිබඳව දර්ශකයක් සපයමින් එක් එක් පළාත්වල ආර්ථික කටයුතු මැනීමට සහ සංසන්දනය කිරීමට යොදා ගත හැකි බැවින්, කේන්ද්‍රගත සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමට ප්‍රාදේශීය වශයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමේ ක්‍රියාවලියේ දී මෙම ඇස්තමේන්තු පදනම් කරගනු ලැබේ.

## 29.5 සංඛ්‍යාන තොරතුරු බෙදා හැරීම

කාලීනව සහ නිතිපතා දත්ත සහ තොරතුරු බෙදා හැරීම සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරයක් වන අතර, මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික යන මාධ්‍ය ඔස්සේ 2019 වර්ෂයේ දී ද අඛණ්ඩව එම කටයුතු සිදු කරන ලදී. ඒ අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම සංඛ්‍යාන ප්‍රකාශන ද්විත්වය වන "ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2019 - XLI වෙළුම" අගෝස්තු මාසයේ දී ද, "ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික දත්ත 2019 - XLII වෙළුම" සැප්තැම්බර් මාසයේ දී ද භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත් කරන ලදී. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු වාර්තාවේ සහ මෑතකාලීන ආර්ථික ප්‍රවණතා ප්‍රකාශනයෙහි පරිච්ඡේද දෙකක් සම්පාදනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ මාසික විවරණිකාව සඳහා දත්ත ලබාදීම ද අඛණ්ඩව සිදු කරන ලදී. තෝරාගත් පාරිභෝගික අයිතමවල දෛනික මිල වාර්තා සහ සතිපතා හා මාස්පතා සකසනු ලබන ආර්ථික දර්ශක වසර මුළුල්ලේම නියමිත කාලසීමාවන්වල දී ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී. එපමණක් නොව, අවශ්‍ය අවස්ථාවන්හි දී පුවත්පත් නිවේදන හරහා මහජනතාවට විවිධාකාර තොරතුරු බෙදා හැරීම ද දැනුම හුවමාරු කරගැනීමේ කටයුතු ද සිදු කරන ලදී.

තවද, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්ත සංචිතය (Data Library) හරහා ආර්ථික පර්යේෂණ සහ අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන, ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ බාහිර ආයතන කිහිපයකින් එක්රැස් කර ගන්නා ලද ආර්ථික හා මූල්‍ය දත්ත රාශියක් මහජන පරිශීලනයට බෙදා හරින ලදී. 2019 වර්ෂයේ දී දත්ත සංචිතයේ තාක්ෂණික පහසුකම් මෙන්ම අතුරු මුහුණත් පිරිසැලසුම (visual layout) වැඩිදියුණු කරන ලද අතර, ඒ පිළිබඳව පුවත්පත් හරහා මහජනතාව දැනුම්වත් කිරීමට ද කටයුතු කරන ලදී.

# 30. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත හා 2016 අංක 06 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනත අනුව පිළිවෙළින් බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් හා බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් නියාමනය හා අධීක්ෂණය කිරීමේ බලය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇත. මීට අමතරව 2009 අංක 1 දරන සංශෝධිත ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග හා 2009 අංක 1 දරන සංශෝධිත දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග යටතේ ප්‍රාථමික අලෙවිකාර සමාගම් අධීක්ෂණයද බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කරයි.

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කාර්යයන් යටතට බලපත්‍රලාභී සමාගම්වල ව්‍යවස්ථාපිත පරීක්ෂණ හා අඛණ්ඩව සුපරීක්ෂණ සිදු කිරීම ඇතුළත් වන අතර නියාමන කාර්යයන් යටතට විචක්ෂණ නියාමනයන් ක්‍රියාත්මක කිරීම, නියාමන අනුමැතීන් ලබා දීම සහ ආයතන විසින් අවසරයකින් තොරව පවත්වාගෙන යනු ලබන මුදල් ව්‍යාපාර පිළිබඳ විමර්ශනය කිරීම ඇතුළත් වේ. මීට අමතරව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ආයතනවල ශක්‍යතා වැඩිදියුණු කිරීම, අධිකරණ කාර්යයන් සඳහා පහසුකම් සැලසීම සහ මහජන පැමිණිලි සඳහා මැදිහත්වීම වැනි වෙනත් විවිධ කාර්යයන් වලද නිරත වේ.

2019 වසර අවසානය වන විට; බලපත්‍රලාභී මුදල් සමාගම් 42 ක්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 4 ක්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් 3 ක් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් 8 ක් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් වේ. මීට අමතරව විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 4 ද ඇතුළත්ව ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ සමාගම් 61 ක් සඳහා කල්බදු මූල්‍යකරණ පනත යටතේ බලපත්‍ර නිකුත් කර ඇත. වර්තමානයේ බලපත්‍රලාභී වාණිජ බැංකු 7ක් ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස පත් කර ඇත. ඉහතින් සඳහන් කළ බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් හා ප්‍රාථමික අලෙවිකාර සමාගම් හි නාමලේඛනය මෙම පරිච්ඡේදය අවසානයේ දක්වා ඇත. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2019 වසරේදී සිදු කරන ලද ප්‍රධාන කාර්යයන් පහතින් සාරාංශ කර දක්වා ඇත.

## 30.1 ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග නිකුත් කිරීම.

2019 වසරේදී නිකුත් කරන ලද විචක්ෂණ නියාමනයන් මෙම වාර්තාවේ තුන්වෙනි කොටසෙහි දක්වා ඇත. ප්‍රධාන විචක්ෂණ නියමයන්හි සාරාංශයක් පහතින් දක්වා ඇත.

(අ) බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වලට සුරැකුම් සහිත තැන්පතු හැර අනෙකුත් තැන්පතු භාර ගැනීම සීමා කිරීම සඳහා තැන්පතු මත විධානයක් නිකුත් කරන ලදී.

(ආ) බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා අයකරන අසාධාරණ පොලී අනුපාතවලින් ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අරමුණ පෙරදැරිව "ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා උපරිම පොලී අනුපාතය" යනුවෙන් විධානයක් නිකුත් කරන ලදී.

(ඇ) තැන්පතු මත ඉහළ මූර්ත පොලී අනුපාත හා ණය නිෂ්පාදිත මත ඉහළ පොලී අනුපාත සැලකිල්ලට ගනිමින් සහ මූල්‍ය පද්ධතිය හරහා සම්ප්‍රේෂණය වන මුදල් ප්‍රතිපත්ති ශක්තිමත් කිරීමේ හා කඩිනම් කිරීමේ අවශ්‍යතාව සහ බලපත්‍රලාභී මුදල් සමාගම් ලබාදෙන ණය සඳහා පොලී අනුපාතය අඩු කිරීම සඳහා සහ එමගින් මූර්ත ආර්ථිකය සඳහා ණය ප්‍රවාහ වර්ධනය කිරීමේ අරමුණින් "තැන්පතු හා ණය උපකරණවලට ගෙවිය යුතු උපරිම පොලී අනුපාතයන්" යනුවෙන් විධානයක් නිකුත් කරන ලදී.

(ඈ) 2019 අප්‍රේල් 21 වන දින සිදු වූ ඛේදනීය පාස්කු ඉරිදා ප්‍රහාරය හේතුවෙන් සංචාරක ව්‍යාපාරයට අත්වූ හානිකර බලපෑම සැලකිල්ලට ගනිමින් සංචාරක ව්‍යාපාරයේ නිරත සහන බලාපොරොත්තු වන පුද්ගලයන්ට හා ආයතනවලට සහන සැලසීමේ අරමුණින් "සංචාරක ව්‍යාපාරය සඳහා සහන ලබාදීම" නමින් චක්‍රලේඛයක් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කිරීම සිදු කර ඇත.

(ඉ) බලපත්‍රලාභී මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීමේදී හිමිකම් පෑම්වල ප්‍රමුඛතාව සම්බන්ධයෙන් 2019 අංක 1 දරන (මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීමේදී හිමිකම් පෑම් වල ප්‍රමුඛතාව) සම්බන්ධයෙන් වන නියෝගය නිකුත් කරන ලදී.

(ඊ) බලපත්‍රලාභී මුදල් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය කොටස් හිමිකාරීත්වය මත පදනම් වීම, සාංගමික යහපාලනය ශක්තිමත් කිරීම, යෝග්‍ය කාර්යයන් පැවරීම, සාමූහික තීරණ ගැනීමේ ක්‍රියාවලිය හා අභ්‍යන්තර පාලනයන් ඇති කිරීම යන අරමුණු ඇතිව බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා "හිමිකාරීත්ව සීමා හඳුන්වාදීම" නමින් තොරතුරු විමසුම් පත්‍රිකාවක් නිකුත් කිරීමට කටයුතු සිදුකරන ලදී.

(උ) 2019 අයවැය යෝජනා ක්‍රමය අනුව සැහැල්ලු ට්‍රක්රථ සඳහා වටිනාකම මත ණය අනුපාතය වැඩි කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා පවතින වටිනාකම මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීමට කටයුතු කරන ලදී.

(ඌ) ශ්‍රී ලංකාව තුළ පවතින ක්ෂුද්‍ර මූල්‍ය හා ණය දීමේ ව්‍යාපාර නියාමනයට හා අධීක්ෂණයට නියාමන අධිකාරියක් ස්ථාපිත කිරීමේ අදහස ඇතිව මුදල් අමාත්‍යාංශය හා එක්ව යෝජිත ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරී පනත සකස් කිරීම හා නීති ප්‍රතිපාදනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට මුදල් අමාත්‍යාංශයට යොමු කිරීම සිදු කර ඇත.

(එ) බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා නිකුත් කර ඇති නිශ්චල දේපල තක්සේරු කිරීමේ විධානය; තක්සේරුකරුවන්ගේ යෝග්‍යතාවය සඳහා නිර්ණායකයන් සහ තක්සේරු කිරීමේ වාර ගණන වෙනස් කර සංශෝධනය කරන ලදී.

(ඒ) අලෙවිකාර සෘජු සහභාගීකරුවන්ගේ නිර්ලේඛන භාණ්ඩාගාර බැඳුම්කර සහ නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු පිළිබඳ විධානයක් නිකුත් කරන ලදී. දවස ඇතුළත ද්‍රවශීලතා ගනුදෙනු සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ විවට වෙළඳපොළ කටයුතු යටතේ සිදුකරනු ලබන ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු හා නිත්‍ය පහසුකම යටතේ සිදු කරනු ලබන ගනුදෙනු හැර අලෙවිකාර සෘජු සහභාගිකරුවන් විසින් නිර්ලේඛන භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත් මත සිදුකරනු ලබන සියලු ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු සඳහා මෙම විධානයන් අදාළ වේ.

## 30.2 බලපත්‍රලාභී ආයතන අධීක්ෂණය

(අ) ව්‍යවස්ථාපිත පරීක්ෂණ පැවැත්වීම

(i) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2019 වසරේදී බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ව්‍යවස්ථාපිත පරීක්ෂණ 20 ක් සිදු කරන ලදී. කාර්යක්ෂමතාව අවම වීම, ආයතන යහපාලනයේ ගැටලු, ණය හා අත්තිකාරම් වර්ගීකරණයේ දෝෂ, ණය අලාභ සඳහා ප්‍රමාණවත් නොවන වෙන් කිරීම, අවදානම් කළමනාකරණ රාමුවේ දුර්වලතා, අභ්‍යන්තර විගණනයේ සහ කාර්යයන්ගේ අනුකූලතා ගැටලු, නියාමන අවශ්‍යතාව සපුරා ගැනීමට ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සම්බන්ධ සැලසුම් නොමැති වීම සහ ව්‍යාපාර ආකෘතීන් හරහා පැන නගින තිරසාරභාවය සම්බන්ධ ගැටලු මෙකී පරීක්ෂණවල ප්‍රධාන සොයා ගැනීම් විය.

(ii) මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රියාකාරී සැලසුම් සහ පෙර වර්ෂයට අදාළ පරීක්ෂණ 18 ක නිර්දේශ ඇතුළත්ව ව්‍යවස්ථාපිත පරීක්ෂණ 23 ක නිර්දේශයන් සහ අදාළ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල අවධානය සඳහා දැනුම් දෙන ලදී. අදාළ සමාගම් විසින් එකඟ වූ කාල රාමුව තුළ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම අඛණ්ඩ සුපරීක්ෂණය සිදුකරන අංශයේ අධීක්ෂණයට ලක් විය.

(iii) නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ් සමාගම සම්බන්ධයෙන් සිදු කරන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණයේ සහ විමර්ශනයේ සොයා ගැනීම් සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ අවධානය යොමු වූ අතර එහි ව්‍යාපාර මෙහෙයුම් හා කාර්යයන් 2019 මැයි 31 දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලයක් දක්වා අත්හිටුවන ලදී. නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ් සමාගමට ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස ව්‍යාපාර හා කාර්යයන් කිරීමට අදාළ අත්හිටුවීමේ නියෝගය 2019 නොවැම්බර් 30 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලදී. තවදුරටත් අධීක්ෂණ ක්‍රියාමාර්ගයක් ලෙස, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් ආයතනයේ සහ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී ආයතනයේ ප්‍රාථමික අලෙවිකාර ඒකකයේ ව්‍යාපාර කටයුතු සඳහා කළ අත්හිටුවීම තවත් මාස 6 ක කාලයක් (පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් ආයතනය 2020 ජනවාරි 5 දින සිට බලපැවැත්වෙන පරිදි සහ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී ආයතනයේ අලෙවිකාර ඒකකය 2020 පෙබරවාරි 15 දින සිට බලපැවැත්වෙන පරිදි) සඳහා දීර්ඝ කරන ලදී.

(ආ) අඛණ්ඩ සුපරීක්ෂණ සිදු කිරීම.

(i) සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, ඔවුන් විසින් ජාලගත දත්ත සම්ප්‍රේෂණ පද්ධතිය හරහා කාලාවර්තිතව ඉදිරිපත් කරනු ලබන මූල්‍ය තොරතුරු පදනම් කරගෙන සහ විගණන වාර්තා කළමනාකරණ ලිපි, බාහිර ශ්‍රේණිගත කිරීම් සහ පුවත්පත් වාර්තා ආදිය ඇතුළත් වෙනත් මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම මගින් අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී. මෙම සමාලෝචනයන් මගින් පූර්ව අනතුරු කල්තියා හඳුනා ගැනීමේ දර්ශකයන් සහ අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය හරහා ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව, ණය අලාභ වෙන් කිරීම්, ආයතනික යහපාලනය සහ අවදානම් කළමනාකරණය යන අංශයන්ගෙන් බලපත්‍රලාභී මුදල් සමාගම්වල, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල ඇති විය හැකි අවධානම හඳුනාගනී.

(ii) අධීක්ෂණ කටයුතුවලදී හෙළිදරව් වූ ගැටලුවල ඇති ප්‍රමුඛතාවය සහ බරපතලභාවය පිළිබඳ ඇගයීම පදනම් කොටගෙන එම ගැටලු නියම කරන ලද කාල රාමුවක් තුළ නිවැරදි කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලැබේ. තව ද, මෙම අංශයේ ඇති වන නව වර්ධනයන් සම්බන්ධව ඉහළ කළමනාකාරීත්වය දැනුවත් කිරීම සඳහා එහි කාර්යසාධනය මුදල් මණ්ඩලය වෙත නිරන්තරයෙන් වාර්තා කරන ලදී.

(iii) බලපත්‍රලාභී මුදල් සමාගම්වලට අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතා නියමයන් හා අනුකූලවීමට අපොහොසත් වූ අවස්ථාවන්හිදී බැංකු නොවන

මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, තැන්පතු, ණය දීම හා ණය ලබා ගැනීම මත සීමාවන් පනවනු ලබයි.

(iv) සියලුම බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්, ඔවුන් විසින් ලබාදෙන මූල්‍ය තොරතුරු පදනම් කරගෙන සහ විගණන වාර්තා, කළමනාකරණ ලිපි, බාහිර ශ්‍රේණිගත කිරීම් සහ පුවත් පත් වාර්තා ආදිය ඇතුළත් වෙනත් මූල්‍ය තොරතුරු සමාලෝචනයන් මගින් අඛණ්ඩ සුපරීක්ෂණයක් සිදු කරන ලදී.

(v) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා ණය සාධන පත්‍ර නිකුත් කිරීමට, කොටස් ප්‍රාග්ධනය වැඩි කිරීමට, නව ආයෝජකයන් හරහා ප්‍රාග්ධනය ආයෝජනයට, සාංගමික ව්‍යවස්ථාවලීන් සංශෝධනය කිරීමට, පාලිත සමාගම් පිහිටුවීමට, ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සඳහා බාහිර සේවාවන් ලබා ගැනීමට, නව අධ්‍යක්ෂවරුන් සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන් පත් කිරීමට, සමාගමේ ව්‍යාපාර නාමය වෙනස් කිරීමට, ලියාපදිංචි ලිපිනයන් වෙනස් කිරීමට, ව්‍යාපාර ස්ථාන වෙනස් කිරීමට, ව්‍යාපාර හිමිකම මාරු කිරීමට සහ නව ශාඛාවන් විවෘත කිරීමට නියාමන අනුමැතීන් ලබා දෙන ලදී.

(vi) බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධව ප්‍රධාන වශයෙන්ම ගනුදෙනුවලදී පාරිභෝගිකයන්ට සිදුවන අකටයුතුකම් සහ අදාළ සමාගම් සමඟ එළඹී ඇති ගනුදෙනු සඳහා සහන ඉල්ලීම් සම්බන්ධයෙන් මහජනතාවගෙන් ඉදිරිපත් වූ පැමිණිලි විශාල ප්‍රමාණයක් නිරාකරණය කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව මැදිහත් විය.

**(ඇ) දුර්වල බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා අර්බුද නිරාකරණය කිරීමේ ක්‍රියාමාර්ග**

2019 වර්ෂය තුළ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලික ඉලක්කය වූයේ පසුගිය වසර කිහිපය පුරා දිගුකාලීන ද්‍රවශීලතා අර්බුදයන්ට ලක් වී ඇති බුන්වත් සමාගම්වල ගැටලු නිරාකරණය කිරීමයි.

(i) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ් සමාගම වෙත නිකුත් කර තිබූ බලපත්‍රය අවලංගු කළ අතර ඈවර කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

(ii) තැන්පතු, ණය දීම සහ ණය ගැනීම් මත සීමාවන් පැනවීම ඇතුළත්ව නියාමන ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාවට නංවන ලදී. දුර්වල මූල්‍ය තත්ත්වයක් සහිත වූ සමාගමක ව්‍යාපාර කටයුතු කළමනාකරණය සඳහා කළමනාකරණ මණ්ඩලයක් පත් කිරීම දෙපාර්තමේන්තුව සිදු කරන ලදී. තවත් දුර්වල මූල්‍ය තත්ත්වයක් සහිත වූ සමාගමක වත්කම් බැහැර කිරීම මගින් නැවත තැන්පතුවලින් කොටසක් ගෙවීම සඳහා පහසුකම් සැලසීම ද දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. තවදුරටත් මූල්‍ය තත්ත්වය දුර්වල වූ සමාගමක අභ්‍යන්තරයෙන් ජනනය වූ අරමුදල් භාවිතයෙන් තැන්පතුවලින් කොටසක් නැවත ගෙවීම ද සිදු කෙරුණි.

(iii) මීට අමතරව, මෙම සමාගම්වල වැරදිකාර පාර්ශ්වයන්ට ඔවුන්ගේ කටයුතු හේතුවෙන් අදාළ සමාගම්වලට සිදු වූ පාඩුව අයකර ගැනීම සඳහා ඔවුන්ගේ විදේශ ගමන් බලපත්‍රය පරිරෝධනය කිරීම, පෞද්ගලික බැංකු ගිණුම් තහනම් කිරීම වැනි නියාමන ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවන ලදී.

(iv) ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයන්ට අනුකූලව මෙම සමාගම්වල ප්‍රතිව්‍යුහගත කිරීමේ/යථා තත්ත්වයට පත් කිරීමේ සැලසුම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල, ඉහළ කළමනාකාරීත්වය සහ බාහිර විගණකවරුන් සමඟ නිරන්තරයෙන් රැස්වීම් පවත්වන ලදී.

(v) වෙබ් අඩවි, පුවත්පත්වල පල කරන මූල්‍ය ප්‍රකාශන සහ ලිපි සහ මහජනතාව තැන්පතු හා ණය සඳහා පොළඹවන දැන්වීම් සහ අනෙකුත් ප්‍රකාශන වැනි විවිධ ප්‍රකාශනයන්හි, නියාමන ක්‍රියාමාර්ග පිළිබඳ අනාවරණය කිරීමට සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් කටයුතු කළ යුතුය.

(vi) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සමාගම් පහක නම් සහ ගනු ලැබූ නියාමන සීමා කිරීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ සහ 2018 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ අනාවරණය කරන ලදී.

(vii) සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී සමාගමට බලපත්‍රය අහෝසි කිරීමේ නිවේදනයක් නිකුත් කරන ලදී. කෙසේ වෙතත් ඉන් පසුව මුදල් මණ්ඩලයේ තීරණය අනුව සමාගම විසින් යෝජනා කරන ලද ප්‍රාග්ධනය වර්ධනය කිරීමේ සැලැස්ම ක්‍රියාවට නැංවීමට සමාගමට අවස්ථාවක් ලබා දෙන ලදී.

(viii) ද ෆිනෑන්ස් පීඑල්සී සමාගමේ බරපතල මූල්‍ය තත්ත්වය සලකා බලමින් මුදල් ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා නිකුත් කර තිබූ බලපත්‍රය අහෝසි කිරීමේ නිවේදනයක් නිකුත් කරන ලදී. ප්‍රාග්ධනය ගෙන ඒමට අවශ්‍ය අරමුදල් විශ්වසනීය තහවුරුවක් සමඟින් කැමැත්ත පලකිරීමේ ලියවිලි මෙන්ම ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සැලැස්මක් ඉදිරිපත් කිරීමට ඕනෑම විශ්වසනීය ආයෝජකයෙකුට අවස්ථාව සලසන ලදී.

(ix) කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිවස්ට් කැපිටල් ලිමිටඩ් සමාගම වෙත නිකුත් කර තිබූ බලපත්‍රය අවලංගු කල අතර ඒකාබද්ධ කිරීමේ වැඩසටහන යටතේ එම සමාගම වෙනත් බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින් අත්පත් කර ගන්නා ලදී.

**(ඇ) මහජනයා දැනුම්වත්කිරීම් සහ බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ශක්‍යතා වැඩිදියුණු කිරීම.**

(i) **ශක්‍යතාව වැඩිදියුණු කිරීම**

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දක්ෂතා/ නිපුණතා වැඩි දියුණු කිරීමේ අරමුණින් ව්‍යවහාරාත්මක පරීක්ෂණ, බාසල් ප්‍රතිපත්ති, ආතති පරීක්ෂාව, ආයතනික යහපාලනය සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවල අවශ්‍යතා වැනි අංශයන් ඔස්සේ පැවැති දේශීය හා විදේශීය පුහුණු වැඩමුළු සඳහා නිලධාරීන් සහභාගි වන ලදී. දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් තවදුරටත් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු විද්‍යා පියසෙහි සහ වෙනත් බාහිර ආයතනයන් හි පැවැති පුහුණු වැඩමුළු සඳහා සම්පත් දායකත්වය ලබාදෙන ලදී.

(ii) **බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ වෙනත් සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ පැවති රැස්වීම්.**

ආර්ථිකමය කරුණු සහ නියාමන වර්ධනයන් සම්බන්ධ අදහස් හුවමාරු කර ගැනීම සඳහා අවස්ථාවන් සැලසීමේ පරමාර්ථයෙන් මහ බැංකු අධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් සමඟ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රැස්වීම් 4 ක් පවත්වන ලදී. මීට අමතරව දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට සහ ඒවා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ සමාගම්, බාහිර විගණකරුවන් සහ ජාත්‍යන්තර සංවිධානවල නියෝජිතයන් සමඟ අඛණ්ඩව රැස්වීම් පවත්වන ලදී.

(iii) **මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන්**

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා නිරාකරණ හා බලගැන්වීමේ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව වැනි වෙනත් දෙපාර්තමේන්තු වෙතින් ලද ඉල්ලීම් අනුව අවශ්‍ය විට ඒ සඳහා දායකත්වය ලබා දෙන ලදී.

මුදල් ණයට දීම, ණය උපකරණ හරහා තැන්පතු රැස් කිරීම සහ නියාමනයට යටත් නොවන ආයතන පවත්වාගෙන යන වංචනික කටයුතු සම්බන්ධව 2019 වර්ෂයේ දෙවන භාගයේදී මහජනතාව දැනුම්වත් කිරීමේ අරමුණ ඇතිව පුවත්පත් නිවේදන නිකුත් කරන ලදී. තවදුරටත්, අනෙකුත් සංවිධානවල ඉල්ලීම මත බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී විය.

## 30.3 අනවසර මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ඇති නීතිමය කාර්යයන් සඳහා පහසුකම් සැපයීම

**(අ) ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනය**

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අනුමත කරන ලද ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනයේ ආරක්ෂිත තැන්පත්කරුවන්ට තැන්පතු ආපසු ගෙවීමේ ක්‍රමවේදය අනුව, එම සමාගමේ ආරක්ෂිත තැන්පත්කරුවන්ට තැන්පතු ආපසු ගෙවීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

**(ආ) අනවසර මූල්‍ය ආයතනවලට එරෙහිව ගන්නා ලද ක්‍රියාමාර්ග**

ද ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි ප්‍රොපර්ටි ඩිවලොපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් සහ එෆ් ඇන්ඩ් ජී රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් ආයතනයන්හි තැන්පත්කරුවන් විසින් ගොනු කරන ලද නඩු කටයුතු සඳහා 2015 වර්ෂයේ සිට 2019 වර්ෂයේ නඩුව අවසන් වන තෙක්ම බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව පහසුකම් සපයන ලදී. තවද, අනවසර මුදල් ව්‍යාපාර සම්බන්ධයෙන් පවතින නඩු කටයුතු සඳහා අධිකරණය නියම කළ පරිදි බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සාක්ෂි ලබා දීම සිදු කරන ලදී.

## ඇමුණුම II -4

## බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නියාමනය වන මූල්‍ය ආයතන

(2019 වර්ෂය අවසානයට)

| | බලපත්‍රලාභී මුදල් සමාගම් |
|---|---|
| 1 | අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී |
| 2 | අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ් |
| 3 | ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී |
| 4 | ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී |
| 5 | ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් (අ) |
| 6 | එච්එන්බී ෆිනෑන්ස් ලිමිටඩ් (පෙර එච්එන්බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්) |
| 7 | එල්බී ෆිනෑන්ස් පීඑල්සී |
| 8 | එල්ඕඑල්සී ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී (පෙර බ්‍රැක් ලංකා ෆිනෑන්ස් පීඑල්සී) |
| 9 | එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී |
| 10 | එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී |
| 11 | ඒඑම්ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී |
| 12 | ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී |
| 13 | ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී |
| 14 | කැන්රිච් ෆිනෑන්ස් පීඑල්සී |
| 15 | කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී |
| 16 | කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී |
| 17 | ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී |
| 18 | ඩයලොග් ෆිනෑන්ස් පීඑල්සී (පෙර කලම්බො ට්‍රස්ට් ෆිනෑන්ස් පීඑල්සී) |
| 19 | ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී (ආ) |
| 20 | නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී |
| 21 | පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී |
| 22 | පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී |
| 23 | ප්‍රයිම් ෆිනෑන්ස් පීඑල්සී |
| 24 | බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී |
| 25 | මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී |
| 26 | මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී |
| 27 | මල්ටි ෆිනෑන්ස් පීඑල්සී |
| 28 | යූබී ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ් |
| 29 | රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් |
| 30 | ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් ලිමිටඩ් (පෙර සිටි ෆිනෑන්ස් කෝපරේෂන් ලිමිටඩ්) |
| 31 | වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී |
| 32 | සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ් |
| 33 | ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී (අ) |
| 34 | සියපත ෆිනෑන්ස් පීඑල්සී |
| 35 | සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී |
| 36 | සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී (ඇ) |
| 37 | සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී |
| 38 | සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී |
| 39 | සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී |
| 40 | සෙරන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ් |
| 41 | සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී |
| 42 | ෆින්ට්‍රෙක්ස් ෆිනෑන්ස් ලිමිටඩ් (පෙර මෙල්ස්ටා රීගල් ෆිනෑන්ස් ලිමිටඩ්) |

### ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන

| (අ) බලපත්‍රලාභී වාණිජ බැංකු | | (ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු | |
|---|---|---|---|
| 1 | අමානා බැන්ක් පීඑල්සී | 1 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව |
| 2 | එම්සීබී බැන්ක් ලිමිටඩ් | 2 | ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව |
| 3 | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | 3 | සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී |
| 4 | ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී | | |
| 5 | නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී | (ඇ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් | |
| 6 | නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී | 1 | ඇසෙට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ් |
| 7 | පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී | 2 | එස්එම්බී ලීසිං පීඑල්සී |
| 8 | යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී | 3 | කෝපරේටිව් ලීසිං කම්පැනි ලිමිටඩ් |
| 9 | ලංකා බැංකුව | 4 | යුනිසන්ස් කැපිටල් ලීසිං ලිමිටඩ් |
| 10 | සම්පත් බැන්ක් පීඑල්සී | | |
| 11 | සෙලාන් බැන්ක් පීඑල්සී | (ඈ) ඉහත සඳහන් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් | |
| 12 | හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී | | |

### බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්

| | | | |
|---|---|---|---|
| 1 | දුම්බර මයික්‍රො ක්‍රෙඩිට් ලිමිටඩ් | 3 | ලක් ජය මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ් |
| 2 | බෙරන්ඩිනා මයික්‍රො ඉන්වෙස්ට්මන්ට්ස් කම්පැනි ලිමිටඩ් | | |

### ප්‍රාථමික අලෙවිකරුවන්

| | | | |
|---|---|---|---|
| 1 | ඇකියුටි සෙකියුරිටීස් ලිමිටඩ් | 9 | මහජන බැංකුව |
| 2 | එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් | 10 | යුනියන් බැන්ක් ඔෆ් කලම්බූ පීඑල්සී |
| 3 | එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී (ඇ) | 11 | ලංකා බැංකුව |
| 4 | කැපිටල් එලයන්ස් ලිමිටඩ් | 12 | වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් |
| 5 | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | 13 | සම්පත් බැන්ක් පීඑල්සී |
| 6 | නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ් (ඉ) | 14 | සෙලාන් බැන්ක් පීඑල්සී |
| 7 | පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් (ඊ) | 15 | ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පීඑල්සී |
| 8 | පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (උ) | | |

(අ) මෙම සමාගම් මත 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව තැන්පතු භාර ගැනිම අත්හිටුවීම ද ඇතුළත්ව සීමා කිරීම් පනවා ඇත.
(ආ) මෙම සමාගම මත 2011 අංක 42 දනර මුදල් ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව තැන්පතු භාර ගැනීම අත්හිටුවීම ද ඇතුළත්ව සීමා කිරීම් පනවා ඇත. තවදුරටත් සමාගමේ බරපතල මූල්‍ය තත්ත්වය සලකා බලමින් මුදල් ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා නිකුත් කර තිබූ බලපත්‍රය අහෝසි කිරීමේ නිවේදනයක් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන ලදී. ප්‍රාග්ධනය ගෙන ඒමට අවශ්‍ය අරමුදල් විශ්වසනීය තහවුරුවක් සමගින් කැමැත්ත පල කිරීමේ ලියවිලි මෙන්ම ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සැලැස්මක් ඉදිරිපත් කිරීමට ඕනෑම විශ්වාසනීය ආයෝජකයෙකුට ඉඩ සලසන ලදී.
(ඇ) මෙම සමාගම වෙත 2011 අංත 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රය අහෝසි කිරීමේ නිවේදනයක් නිකුත් කරන ලදී. කෙසේ වෙතත් මෙම සමාගම විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන යටතේ විරෝධතා යොමු කර ඇති අතර ඒ සමඟ ප්‍රාග්ධන වර්ධනය කිරීමේ සැලසුමක් ද ඉදිරිපත් කර ඇත. මුදල් මණ්ඩලය විසින් මෙම සමාගම මගින් ඉදිරිපත් කර ඇති යෝජිත ප්‍රාග්ධනය වර්ධනය කිරීමේ සැලැස්ම සහ තැන්පතුකරුවන්ගේ යහපැවැත්ම සලකා බලමින් සමාගම විසින් යෝජිත ප්‍රාග්ධනය වර්ධනය කිරීමේ සැලැස්ම ක්‍රියාවට නැංවීමට අවස්ථාව ලබා දීමට තීරණය කරන ලදී.
(ඈ) 2017.07.24 දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික වෙන්දේසිය සඳහා සහභාගී වීම වළක්වා ඇත.
(ඉ) 2019.05.31 දින සිට බලපැවැත්වෙන පරිදි මාස 6 ක කාල සීමාවක් සඳහා ව්‍යාපාර මෙහෙයුම් හා කාර්යයන් අත්හිටුවන ලද අතර 2019.11.30 දින සිට බලපැවැත්වෙන පරිදි එම නියෝගය අවලංගු කරන ලදී.
(ඊ) 2020.01.05 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාථමික අලෙවිකරණ ව්‍යාපාර හා මෙහෙයුම් කටයුතු කරගෙන යාම මාස 6 ක කාලයක් සඳහා අත්හිටුවන ලදී.
(උ) 2020.02.15 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාථමික අලෙවිකරණ ව්‍යාපාර හා මෙහෙයුම් කටයුතු කරගෙන යාම මාස 6 ක කාලයක් සඳහා අත්හිටුවන ලදී.

# 31. පුහුණු හා සංවර්ධන

මහ බැංකුවේ මානව ප්‍රාග්ධන සංවර්ධනයෙහිලා එළැඹෙන අවශ්‍යතා සපුරාලීමට පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම, එම අවශ්‍යතාවන් සපුරාලීම සඳහා උපාය මාර්ග සකස් කිරීම, වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, බැංකුවේ කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ දේශීය/විදේශීය කෙටි කාලීන පුහුණු අවස්ථා සලසා දීම යන කාර්යයන් පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි. මෙයට අමතරව බැංකුවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් අතර දැනුම හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම ද පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරේ.

### 31.1 පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු

2019 වසර තුළදී ඕස්ට්‍රේලියාවේ සහ එක්සත් රාජධානියේ ඉහළ පෙළේ විශ්වවිද්‍යාලයන්හි ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් 3 දෙනෙකුටද, විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධිය හැදෑරීම සඳහා තවත් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් 5 දෙනෙකුට ද පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසා දෙන ලදී. මේ අතරතුර අර්ධ කාලීන පදනමින් දේශීය විශ්වවිද්‍යාලයන්හි ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හට හා විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධි ආරම්භ කිරීමට තවත් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙකුට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අවස්ථාව සලසා දෙන ලදී.

තවද, සිය ආචාර්ය උපාධිය සම්පූර්ණ කළ එක් අයෙකු සහ විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධි සම්පූර්ණ කළ තවත් 7 දෙනෙකු ද වශයෙන් පශ්චාත් උපාධි සම්පූර්ණ කළ නිලධාරීන් 8 දෙනෙකු 2019 වසර තුළදී රාජකාරිය සඳහා නැවත වාර්තා කළහ. මහ බැංකුවේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2015 - 2019 කාලය තුළ සිය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලද/අවසන් කරන ලද නිලධාරීන් සංඛ්‍යාව සංඛ්‍යා සටහන II-33 හි දැක්වේ.

### 31.2 කෙටි කාලීන පුහුණු අවස්ථා

2018 වර්ෂයේ අග භාගයේදී කරන ලද වාර්ෂික නිපුණතා සමීක්ෂණයෙහිදී හඳුනා ගන්නා ලද නිපුණතා අඩු පාඩු සම්පූර්ණ කිරීමේ අරමුණ ඇතිව පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව මහ බැංකුවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත කෙටි කාලීන දේශීය හා විදේශීය පුහුණු අවස්ථා 1532 ක් සලසා දෙන ලදී.

#### 31.2.1 කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථා

2019 වසර තුළදී පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව ඉහළ පෙළේ විදේශ පුහුණු ආයතන සහ විදේශ මහ බැංකු විසින් පවත්වන පුහුණු වැඩසටහන්, වැඩමුළු, සම්මන්ත්‍රණ, සමුළු, අධ්‍යයන වැඩසටහන් සහ රැස්වීම් ආදී වූ කෙටි කාලීන විදේශ පුහුණු සඳහා සහභාගීවීමට මහ බැංකු නිලධාරීන්හට පහසුකම් සපයන ලදී. ඒ අනුව, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව මහ බැංකුවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථා 392 ක් සඳහා සහ එක්සත් රාජධානිය, සිංගප්පූරුව, තායිලන්තය, ඉන්දුනීසියාව, ඉන්දියාව, මැලේසියාව සහ දකුණු කොරියාව යන රටවල පැවති අධ්‍යයන වැඩසටහන් 09 ක් සඳහා පහසුකම් සපයන ලදී. එසේම, විදේශ වැඩසටහන් සඳහා සම්පත් දායකයින් ලෙස එක්වීමට මහ බැංකු නිලධාරීන් 3 දෙනෙකු හට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සපයන ලදී. මීට අමතරව, පුහුණු හා සංවර්ධන කටයුතු පිළිබඳව වූ

**II-33 සංඛ්‍යා සටහන**

**මහ බැංකුවේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ලබා දුන් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු**

| සුදුසුකම | 2015 | | 2016 | | 2017 | | 2018 | | 2019 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ |
| ආචාර්ය උපාධිය | 3 | 5 | 5 | 2 | 3 | 3 | 8 | 1 | 4 | 1 |
| විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධිය | 19 | 21 | 24 | 11 | 19 | 18 | 8 | 14 | 7 | 7 |

තීරණ ගැනීම සඳහා පුහුණු කමිටු රැස්වීම් 18 ක් පැවැත්වීම සඳහා පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සපයන ලදී. 2019 වසර තුළ මහ බැංකු නිලධාරීන් පුහුණු කටයුතු සඳහා යොමු කරන ලද මහ බැංකු අතර එංගලන්ත බැංකුව, ඇමෙරිකානු ෆෙඩරල් සංචිත බැංකුව, ස්විස් ජාතික බැංකුව, මොන්ට්‍රියල් බැංකුව, ජර්මන් ෆෙඩරල් බැංකුව (Deutsche Budesbank), ප්‍රංශ මහ බැංකුව, යුක්රේන් ජාතික බැංකුව, කොරියානු බැංකුව, සිංගප්පූරු මූල්‍ය අධිකාරිය, මැලේසියානු ජාතික බැංකුව, තායිලන්ත බැංකුව, පිලිපීන මහ බැංකුව (Bangko Central ng Pilipinas), ඉන්දුනීසියානු බැංකුව, මාලදිවයින් මූල්‍ය අධිකාරිය, ඉන්දියානු සංචිත බැංකුව, පකිස්ථානු රාජ්‍ය බැංකුව, නේපාල් රාස්ත්‍ර බැංකුව, භූතාන් රාජකීය මූල්‍ය අධිකාරිය සහ කැම්බෝඩියානු ජාතික මහ බැංකුව වේ. මීට අමතරව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, දකුණු හා නැගෙනහිර ආසියානු රටවල මහ බැංකු පුහුණු මධ්‍යස්ථානය (SEACEN), ජාත්‍යන්තර පියවීම් බැංකුව (BIS), ඇතුළු ජාත්‍යන්තර මූල්‍ය ආයතන, පර්යේෂණ ආයතන සහ පුහුණු ආයතන විසින් ලබා දුන් කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථා සඳහා ද මහ බැංකුවේ කාර්ය මණ්ඩලය සහභාගී විය.

මහ බැංකු නිලධාරීන් හට කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථාවන් ලබා දෙන අතරතුර පුහුණු වැඩසටහන් හරහා ලබා ගත් දැනුම හා කුසලතාවන් මහ බැංකු මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීමට භාවිත කරන බව සහතික කිරීමට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. මේ සඳහා පශ්චාත් පුහුණු අධීක්ෂණය සඳහා වන පුහුණු අනු කමිටු රැස්වීම් සඳහා පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී. 2018 වසර තුළදී පුහුණු අනු කමිටුවෙහි රැස්වීම් වාර 10 ක් කෙටි කාලීන විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් සඳහා පැවැත් වූ අතර ඒ අනුව, මහ බැංකු ප්‍රකාශනයන්හි පලකිරීම සඳහා වූ ලිපි, පර්යේෂණ ලිපි, ඉදිරිපත් කිරීම්, පද්ධති හා ක්‍රියාපටිපාටි වැඩිදියුණු කිරීම් සඳහා වූ යෝජනා සහ සංකල්ප පත්‍රිකා යනාදිය ඇතුළත්ව පැවරුම් 262 ක් නියම කරන ලදී.

### 31.2.2 කෙටි කාලීන දේශීය පුහුණු අවස්ථා

වසර තුළදී, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව, බැංකු විදු පියසෙහි සහ වෙනත් ඉහළ පෙළේ දේශීය පුහුණු ආයතනයන්හි දී පවත්වන ලද පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු වැනි කෙටි කාලීන පුහුණු අවස්ථා 958 ක් බැංකුවේ කාර්ය මණ්ඩලය වෙත සලසා දෙන ලදී. මෙම පුහුණු වැඩසටහන් ප්‍රධාන වශයෙන් ආර්ථික විද්‍යාව, සංඛ්‍යාන විද්‍යාව, ගිණුම්කරණය, බැංකුකරණය, තොරතුරු තාක්ෂණය, නීතිය, විගණනය, අරමුදල් කළමනාකරණය, අවදානම් කළමනාකරණය, ලේකම් කටයුතු, මානව සම්පත් කළමනාකරණය, බැංකු හා මූල්‍ය ආයතන අධීක්ෂණය, මූල්‍ය වෙළඳපොළ, විදේශ විනිමය, ව්‍යවහාර මුදල් සහ ප්‍රාදේශීය සංවර්ධනය යන අංශවලට අයත් විය. වසර තුළදී, බැංකු විදු පියස මගින් පැවැත් වූ පුහුණු වැඩසටහන් 44 ක් සඳහා නිලධාරීන් 400 ක් සහභාගී වූ අතර අනෙකුත් පුහුණු ආයතන මගින් පැවැත් වූ පුහුණු වැඩසටහන් 105 ක් සඳහා නිලධාරීන් 558 ක් සහභාගී විය. මීට අමතරව, 2019 සඳහා වූ කොරියානු බැංකු දැනුම බෙදා ගැනීමේ ව්‍යාපෘතියේ දේශීය වැඩසටහන් පැවැත්වීමට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව පහසුකම් සලසන ලදී.

## 31.3 දැනුම හුවමාරුව

පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව, පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවලින් පසුව සේවයට වාර්තා කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්හට සිය අධ්‍යයනයන් මහ බැංකු කාර්ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා පහසුකම් සලසන ලදී. තවද, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ආරාධිත දේශකයින් ගේ සහභාගීත්වයෙන් මෙන්ම ආචාර්ය උපාධිලත් මහ බැංකු නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ද ආර්ථික සංසද සංවිධානය කරන ලදී. බැංකුවේ මෙහෙයුම් කටයුතුවලට ප්‍රයෝජනවත් වන වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට මහ බැංකු නිලධාරීන් උනන්දු කිරීම සඳහා වන ක්‍රියාමාර්ගයක් වූ වරලත් මූල්‍ය විශ්ලේෂක සුදුසුකම ලබා ගැනීම සඳහා වන මහ බැංකු අනුග්‍රාහක වැඩසටහන පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව මෙම වසරේ ද ක්‍රියාත්මක කරනු ලැබීය.

## 31.4 ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

විශ්ලේෂණයට යටත් වන අවුරුද්ද තුළ, “විදේශයන්හි පවත්වන කෙටිකාලීන විදේශ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, සමුළු, රැස්වීම්, සංසද, වැඩමුළු, දැනුම ලබා ගැනීමේ වැඩසටහන්, අධ්‍යයන වැඩසටහන් යනාදිය සඳහා මහ බැංකු නිලධාරීන් තෝරා ගැනීමේ පිළිවෙත” යන චක්‍රලේඛය ඇතුළු චක්‍ර ලේඛන කීපයක් පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු නිලධාරීන් හට ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කර ගැනීම සඳහා නිකුත් කරන ලදී.